179 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 179 - இல. 8
**Volume 179 - No. 8**

2008 නොවැම්බර් 26 වන බදාදා
2008 நவம்பர் 26, புதன்கிழமை
**Wednesday, 26th November, 2008**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
**OFFICIAL REPORT**

(අශෝධිත පිටපත/பிழை திருத்தப்படாதது/**Uncorrected**)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

2008 වර්ෂ අවසාන පරීක්ෂණය :
අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

විසර්ජන පනත් කෙටුම්පත, 2009 - [පහළොස් වන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 152, 282 (වාරිමාර්ග හා ජල කළමනාකරණ); ශීර්ෂ 153, 286 - 288 (ඉඩම් හා ඉඩම් සංවර්ධන) ; ශීර්ෂ 118, 281, 285, 289 (කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා)] - කාරක සභාවේදී සලකා බලන ලදී

කල් තැබීමේ යෝජනාව :
නිල ඇඳුම් රෙදි මිල දී ගැනීමේ දී සිදුව ඇති මූල්‍ය අක්‍රමිකතා

---

# பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

2008 ஆண்டிறுதிப் பரீட்சை :
கல்வி அமைச்சரினது கூற்று

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2009 : [ஒதுக்கப்பட்ட பதினைந்தாம் நாள்] :
[தலைப்புகள் 152, 282 (நீர்ப்பாசனத்துறை, நீர் முகாமைத்துவம்); தலைப்புகள் 153, 286 - 288 (காணி, காணி அபிவிருத்தி): தலைப்புகள் 118, 281, 285, 289 (கமத்தொழில் அபிவிருத்தி கமநல சேவைகள்)] – குழுவில் ஆராயப்பட்டது.

ஒத்திவைப்புப் பிரேரணை :
சீருடைத்துணிகள் கொள்வனவிலான நிதிசார் முறைகேடுகள்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

YEAR END TEST 2008 :
Statement by Minister of Education

APPROPRIATION BILL, 2009 – [FIFTEENTH ALLOTTED DAY] :
Considered in Committee – [Heads 152, 282 (Irrigation and Water Management); Heads 153, 286-288 (Land and Land Development); Heads 118, 281, 285, 289 (Agricultural Development and Agrarian Services)]

ADJOURNMENT MOTION :
Financial Irregularities in Purchasing Uniform Materials

2 — PL 00003562 — 1,600 — (2009/01)

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**2008 නොවැම්බර් 26 වන බදාදා**
2008 நவம்பர் 26, புதன்கிழமை
*Wednesday, 26th November, 2008*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு டபிள்யூ. ஜே. எம். லொக்குபண்டார] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9.30 a.m.* MR. SPEAKER [ THE HON. W. J. M. LOKUBANDARA] in the Chair.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(1) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලද නියමයන් 04ක්;

(2) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගනන ප්‍රමිති පනතේ 31 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් නිශ්චිත ව්‍යාපාර මත පැන වූ සෙස් බද්ද ඉවත් කිරීම සම්බන්ධයෙන් පනවන ලද නියමයන්; සහ

(3) (52 වන අධිකාරය වන) සුරා බදු ආඥා පනතේ 22 (1) වගන්තිය යටතේ සුරා බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලද නියමයන් 04ක් (අංක 903, 904, 905 සහ 906 දරන සුරාබදු නිවේදන ) - [අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සී. පී. ඩී. බණ්ඩාරනායක මහතා - පැමිණ නැත.
ගරු අබ්දුල් බයිස් කමර්ඩීන් මහතා - පැමිණ නැත.
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

# ඛනිජ තෙල් නිෂ්පාදන : බදු
## பெற்றோலிய உற்பத்திகள் : வரிகள்
## PETROLEUM PRODUCTS : TAXES

0028/'08

01.**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය — (2) :

(අ) (i) 2004 අප්‍රේල් මස 02 වැනි දින සිට මේ දක්වා කාලය තුළ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, උදුන් තෙල් හා ගුවන් යානා ඉන්ධන වල මිල වැඩිවූ දින කවරේද;

(ii) පෙට්‍රල් සඳහා එකතු කළ අගය මත බද්දෙහි (වැට්) ප්‍රතිශතය කොපමණද;

(iii) ලීටරයක් සඳහා ඉහත අගය කොපමණද;
යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය සඳහා එක් එක් ඛනිජ තෙල් නිෂ්පාදනය වෙනුවෙන් අය කළ සම්පූර්ණ බදු ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ආදායම භාවිතා කර ඇත්තේ කවර කටයුත්තක් සඳහාද;

(iii) සියලුම බදු වර්ග අහෝසි කළහොත්, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, උදුන්තෙල් හා ගුවන් යානා ඉන්ධනවල මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බදු වැඩි කිරීම මගින් මාර්ගවල තත්ත්වය දියුණු කිරීමට බලාපොරොත්තු වූ බවත්;

(ii) බදු පැනවීමෙන් පසුව මාර්ගවල තත්ත්වය තවත් අයහපත් වී ඇති බවත්;
එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම් එවැනි බදු පැනවීමේ අරමුණ කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

பெற்றோலியம், பெற்றோலியவள அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) 2004 ஆம் ஆண்டு ஏப்பிறல் 2 ஆம் திகதி முதல் இற்றைவரை பெற்றோல், டீசல், மண்ணெண்ணெய், உலை எண்ணெய், விமான எரிபொருள் ஆகியவற்றின் விலைகள் அதிகரிக்கப்பட்ட திகதிகளையும்,

(ii) பெற்றோலுக்கான சேர் பெறுமதி வரி நூற்றுவீதத்தையும்,

(iii) லீற்றர் ஒன்றுக்கு மேற்குறிப்பிட்ட பெறுமதியையும்
அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) ஒவ்வொரு பெற்றோலிய உற்பத்திக்குமான 2006 ஆம் ஆண்டுக்கான மொத்த வரிகளையும்,

(ii) இவ்வருமானம் பயன்படுத்தப்பட்ட நோக்கத்தையும்,

(iii) எல்லா வரிகளும் நீக்கப்படுமாயின் பெற்றோல், டீசல், மண்ணெண்ணெய், உலை எண்ணெய், விமான எரிபொருள் ஆகியவற்றின் விலை என்னவாக இருக்கும் என்பதையும்
அவர் கூறுவாரா?

(இ) (i) வரிகளின் அதிகரிப்பு, வீதிகளை மேம்படுத்துவதற்காக உத்தேசிக்கப்பட்டது என்பதையும்,

(ii) வரிகள் விதிக்கப்பட்டதன் பின்னர் வீதிகள் மோசமடைந்துள்ளன என்பதையும்
அவர் ஏற்றுக்கொள்வாரா?

(ஈ) அவ்வாறெனின், அத்தகைய வரிகளின் நோக்கம் என்ன?

(உ) இன்றேல், ஏன்?

[ගරු රවි කරුණානායක මහතා]

asked the Minister of Petroleum and Petroleum Resources Development, :

(*a*) Will he inform this House,—

(i) the dates that the prices of petrol, diesel, kerosene oil, furnace oil and aviation fuel were increased from 2nd April, 2004 to date;

(ii) the VAT percentage for Petrol; and

(iii) the above value per liter?

(*b*) Will he state,—

(i) the total taxes for each petroleum product for the year 2006;

(ii) the purpose that this revenue has been used for; and

(iii) if all taxes are eliminated, what would be the price of petrol, diesel kerosene oil, furnace oil and aviation fuel?

(*c*) Will he admit,—

(i) that increase in taxes were supposed to be uplifted the roads; and

(ii) after the taxes had been imposed the roads have got worse?

(*d*) if it is so, what is the purpose of such taxes?

(e) if not why ?

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා (ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - பெற்றோலியம், பெற்றோலிய வள அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A. H. M. Fowzie-Minister of Petroleum and Petroleum Resources Development)

ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් නිසා මම එය **සභාගත*** කරනවා. ගරු මන්ත්‍රීතුමාට මොනවා හෝ අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා නම් අහන්න පුළුවන්.

***සභා මේසය මත තබන ලද පිළිතුර***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled*

(අ) (i) ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි මිල සංශෝධනය - 2004.04.02 සිට 2008.06.17 දක්වා

| | | *පෙට්‍රල්* | | *භූමිතෙල්* | | *ඩීසල්* | | | | *දැව්තෙල්* | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| *වසර* | *වෙනස් කළ දිනය* | *90 ඔක්ටේන්* (රු.) | *95 ඔක්ටේන්* (රු.) | *සුපිරි භූමිතෙල්* (රු.) | *කාර්මික භූමිතෙල්* (රු.) | *සුපිරි ඩීසල්* (රු.) | *ඔටෝ ඩීසල්* (රු.) | *500 සී.එස්.ටී.* | *800 සී.එස්.ටී.* | *1000 සී.එස්.ටී.* | *1500 සී.එස්.ටී.* | *2000 සී.එස්.ටී.* | *3500 සී.එස්.ටී.* |
| 2004 | 2004.04.02 දින සිට පැවැති මිල ගණන් | 57.00 | 60.00 | 25.50 | 27.80 | 37.30 | 32.00 | 25.80 | 24.70 | 24.20 | 23.30 | 22.30 | 21.00 |
| 2004 | ජූලි 24 | 65.00 | 68.00 | - | - | - | - | - | - | - | - | - | - |
| 2004 | අගෝ. 14 | 68.00 | 71.00 | - | - | 41.30 | 36.00 | 26.30 | 25.20 | 24.70 | 24.30 | 23.20 | 22.00 |
| 2004 | සැප්තැ. 25 | 70.00 | 73.00 | - | - | 49.30 | 44.00 | - | - | - | - | - | - |
| 2004 | ඔක්තෝ. 01 | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2005 | මැයි 05 | 74.00 | 77.00 | 28.50 | 30.80 | 51.30 | 46.00 | 31.70 | 30.30 | 29.10 | 28.30 | 27.60 | 26.00 |
| 2005 | මැයි 16 | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2005 | ජූනි 06 | 80.00 | 83.00 | 30.50 | 32.80 | 55.30 | 50.00 | 33.30 | 32.80 | 31.40 | 30.30 | 29.60 | 28.00 |
| 2006 | අප්‍රේල් 16 | 88.00 | 91.00 | 38.50 | 40.80 | 63.30 | 58.00 | 41.30 | 40.80 | 39.40 | 38.30 | 37.60 | 36.00 |
| 2006 | ජූනි 11 | 93.00 | 96.00 | 43.50 | 45.80 | 66.30 | 61.00 | 46.30 | 45.80 | 44.40 | 43.30 | 42.60 | 41.00 |
| 2006 | අගෝස්. 02 | 96.00 | 99.00 | 45.50 | 47.80 | 69.30 | 64.00 | 48.30 | 47.80 | 46.40 | 45.30 | 44.60 | 43.00 |
| 2006 | සැප්තැ. 05 | 101.00 | 104.00 | 48.00 | 50.30 | 72.30 | 67.00 | 50.30 | 49.80 | 48.40 | 47.30 | 46.60 | 45.00 |
| 2006 | සැප්තැ. 28 | 99.00 | 102.00 | - | - | 69.80 | 64.50 | - | - | - | - | - | - |
| 2006 | ඔක්තෝ. 06 | 97.00 | 100.00 | - | - | 67.30 | 62.00 | 48.30 | 47.80 | 46.40 | 45.30 | 44.60 | 43.00 |
| 2006 | ඔක්තෝ. 26 | 92.00 | 95.00 | - | - | 65.30 | 60.00 | 46.30 | 45.80 | 44.40 | 43.30 | 42.60 | 41.00 |
| 2006 | දෙසැම්. 26 | - | - | - | 58.30 | - | - | - | - | - | - | - | - |
| 2007 | ජනවාරි 01 | - | - | - | - | - | - | - | 39.90 | 38.70 | 37.70 | - | 35.65 |
| 2007 | ජනවාරි 05 | 97.00 | 100.00 | - | - | - | - | - | - | - | - | - | - |
| 2007 | මාර්තු 30 | 104.00 | 107.00 | - | - | - | - | - | - | - | - | - | - |
| 2007 | අප්‍රේල් 19 | - | - | 50.00 | 60.30 | 68.30 | 63.00 | 43.30 | 42.90 | 41.70 | 40.70 | - | - |
| 2007 | අප්‍රේල් 28 | 105.00 | 108.00 | - | - | 70.30 | 65.00 | - | - | - | - | - | - |
| 2007 | මැයි 12 | 106.00 | 109.00 | 51.00 | 61.30 | 72.30 | 67.00 | 46.30 | 45.90 | 44.70 | 43.70 | - | 38.65 |
| 2007 | ජූනි 30 | 111.00 | 114.00 | 67.00 | 68.00 | 76.30 | 71.00 | 50.30 | 49.90 | 48.70 | 47.70 | - | 42.65 |
| 2007 | ජූලි 29 | 117.00 | 120.00 | 68.00 | 69.30 | 80.30 | 75.00 | 54.30 | 53.90 | 52.70 | 51.70 | - | 46.65 |
| 2008 | ජනවාරි 13 | 127.00 | 130.00 | 70.00 | 75.00 | 85.30 | 80.00 | - | 63.90 | - | 61.70 | - | 56.65 |
| 2008 | මැයි 25 | 157.00 | 170.00 | 80.00 | 85.00 | 125.30 | 110.00 | - | 73.90 | - | 71.70 | - | 66.65 |

ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි මිල සංශෝධනය - ගුවන් යානා ඉන්ධන තෙල්

| *වසර* | *බලපැවැත්වෙන දිනය* | *ගැලුමකට මිල (ඇ. ඩො.)* |
|---|---|---|
| 2004 | මැයි 05 | 1.31 |
| 2004 | ජුනි 05 | 1.43 |
| 2004 | ජූලි 05 | 1.46 |
| 2004 | අගෝස්තු 05 | 1.48 |
| 2004 | සැප්තැම්බර් 05 | 1.57 |
| 2004 | ඔක්තෝබර් 05 | 1.62 |
| 2004 | නොවැම්බර් 05 | 1.78 |
| 2004 | දෙසැම්බර් 05 | 1.69 |
| 2005 | ජනවාරි 05 | 1.62 |
| 2005 | පෙබරවාරි 05 | 1.55 |
| 2005 | මාර්තු 05 | 1.63 |
| 2005 | අප්‍රේල් 05 | 1.91 |
| 2005 | මැයි 05 | 2.03 |
| 2005 | ජුනි 05 | 2.12 |
| 2005 | ජූලි 05 | 2.21 |
| 2005 | අගෝස්තු 05 | 2.42 |
| 2005 | සැප්තැම්බර් 05 | 2.45 |
| 2005 | ඔක්තෝබර් 05 | 2.36 |
| 2005 | නොවැම්බර් 05 | 2.20 |
| 2005 | දෙසැම්බර් 05 | 2.12 |
| 2006 | ජනවාරි 05 | 2.01 |
| 2006 | පෙබරවාරි | 2.16 |
| 2006 | මාර්තු 05 | 2.11 |
| 2006 | අප්‍රේල් 05 | 2.13 |
| 2006 | මැයි 05 | 2.35 |
| 2006 | ජුනි 05 | 2.36 |
| 2006 | ජූලි 05 | 2.38 |
| 2006 | අගෝස්තු 05 | 2.42 |
| 2006 | සැප්තැම්බර් 05 | 2.46 |
| 2006 | ඔක්තෝබර් 05 | 2.25 |
| 2006 | නොවැම්බර් 05 | 2.09 |
| 2006 | දෙසැම්බර් 05 | 2.05 |
| 2007 | ජනවාරි 05 | 2.17 |
| 2007 | පෙබරවාරි 05 | 1.99 |
| 2007 | මාර්තු 05 | 2.04 |
| 2007 | අප්‍රේල් 05 | 2.12 |
| 2007 | මැයි 05 | 2.26 |
| 2007 | ජුනි 05 | 2.29 |
| 2007 | ජූලි 05 | 2.32 |
| 2007 | අගෝස්තු 05 | 2.41 |
| 2007 | සැප්තැම්බර් 05 | 2.34 |
| 2007 | ඔක්තෝබර් 05 | 2.50 |
| 2007 | නොවැම්බර් 05 | 2.89 |
| 2007 | දෙසැම්බර් 05 | 2.89 |

(ii) පෙට්‍රල් සඳහා වැට් ප්‍රතිශතය :-

| 2007.12.31 | 2008.01.01 |
|---|---|
| 15% | 5% |

(iii)

| 2007.12.31 | 2008.01.01 |
|---|---|
| රු. 15.26 | රු. 5.57 |

(ආ) (i) 2006 වර්ෂය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන වෙනුවෙන් අය කළ සම්පූර්ණ බදු ප්‍රමාණය :-

| නිෂ්පාදනය | පෙට්‍රල් | ඩීසල් | භූමිතෙල් | දැවි තෙල් | වෙනත් නිෂ්පාදන |
|---|---|---|---|---|---|
| බද්ද (රු. මිලියන) | 16,146 | 5,750 | 390 | 5,747 | 1,426 |

(ii) සියලුම බදු ආදායම මහා භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත :

(iii) 2006 වර්ෂය සඳහා සියලුම බදු අහෝසි කළහොත් ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල :

| නිෂ්පාදනය | පෙට්‍රල් | ඩීසල් | භූමිතෙල් | දැවි තෙල් |
|---|---|---|---|---|
| මිල රුපියල් (ලීටරයකට) | 53.95 | 55.17 | 51.23 | 37.61 |

(ආ) (i) මම නොදනිමි. මෙය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට අයත් විෂය කරුණකි.

(ii) මම නොදනිමි. මෙය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට අයත් විෂය කරුණකි.

(ඇ) මම නොදනිමි. මෙය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට අයත් විෂය කරුණකි.

(ඉ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමා, ප්‍රශ්න නම් තියෙනවා. ඒවා ඔබතුමාගෙන් අහන එක තමයි තියෙන ප්‍රශ්නය. ඔබතුමාගේ මුහුණ බලා ගෙන කනට ගහන්න මම කැමැති නැහැ.

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

නැහැ, නැහැ. ප්‍රශ්නයක් නැහැ. ඕනෑම ප්‍රශ්නයක් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම එක ප්‍රශ්නයක් අහන්නම්. නමුත් ඒකට ලැබෙන උත්තරය මොකක්ද කියලා මම දන්නවා. ආණ්ඩුව මේ තෙල් මිල අඩු කරන්නේ නැත්තේ ඇයි? දැන් වියදම රුපියල් 35ක් වෙන කොට, තෙල් මිල අඩු කරන්න බැරි ඇයි?

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

මේ මිල ක්‍රියාත්මක වන්නේ ලබන මාසයේ සිට බවත් තමුන්නාන්සේ දැන ගන්න ඕනෑ. මේ මිලට තෙල් ගෙන්වන නැව් එන්නේ ලබන මාසයේයි. එතකොට ඒ මාසයේ ඉඳලා තමයි ගණන් හදන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේත් ටැක්ස් දම්මා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් දැමූ ටැක්ස් එක සියයට 64ක්, තෙල් ලීටරයක මිල රුපියල් 54ක් ව තියෙද්දී සියයට 64ක් ටැක්ස් දැම්මා. අපේ ආණ්ඩුව තෙල් ලීටරයක මිල රුපියල් 142ක්ව තියෙද්දී දාලා තිබෙන ටැක්ස් එක සියයට 54යි. මේ ටැක්ස් දමන්නේ මේ රටේ ජනතාවට දෙන්න තිබෙන යටිතල පහසුකම් සියල්ලම දෙන්නයි. ඕනෑම රටක තෙල් මිලට ටැක්ස් දමලායි ඒ රටේ ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන්නේ. මේක අලුත් දෙයක් නොවෙයි. මිල අඩු වන කොට අඩු කරන්නට ඕනෑය කියා තමුන්නාන්සේලා කියනවා. නමුත් මිල වැඩි වෙච්ච වෙලාවේ අප වැඩි කළේ නැහැ. ජනවාරි මාසයේ සිට මැයි මාසය දක්වා අපට බිලියන 11ක් පාඩුයි කියන එක මතක තියා ගන්න. මිල වැඩි වුණාය කියා තෙල් මිල වැඩි කළේ නැහැ. නමුත් පාඩු වුනාය කියා අඩු නොකර ඉන්නේ නැහැ. ජනාධිපතිතුමා අඩු කළා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා ඉල්ලන් කන්න හදනවා.

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

නැහැ, ප්‍රශ්නයක් නැහැ. ඕනෑම ප්‍රශ්නයක් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කරුණාකරලා ආණ්ඩුව මේ කාරණය පිළිගන්නට අවශ්‍යයි. ඔබතුමන්ලා කෝටි පන්දාහක් උපයනවා, මාසයකට පෙට්‍රල් ලීටර් මිලියන 40ක් විකුණලා. මේ වාගේ කළුකඩ ව්‍යාපාරයක් ගෙන යන්න එපා ගරු ඇමතිතුමනි.

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

අප නොවෙයි. ඒක කරන්නේ. ඒක ටැක්ස්. මා කිව්වානේ, ටැක්ස් කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ටැක්ස් කියන්නේ ප්‍රභාකරන්ගේ ඒවාද?

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

ටැක්ස් නැතිව බැහැ රටක් පාලනය කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ටැක්ස් කියන්නේ ප්‍රභාකරන්ගේ ඒවා ද?

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

ටැක්ස් නැතිව පාලනය කරන්න බැහැ. ටැක්ස් වලින් තමයි, ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන්නේ කියා මා දැන් තමුන්නාන්සේට කිව්වේ. ඒ කියන්නේ පාරවල් හදන්න ඕනෑ; ආරෝග්‍යශාලා හදන්න ඕනෑ; පාසල් හදන්න ඕනෑ. රක්ෂාවල් දෙන්න ඕනෑ මේවාට කොයින් ද සල්ලි? තමුන්නාන්සේලා කිසිම දෙයක් නොකර -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දෙයියෝ සාක්කි, දෙයියෝ නොවෙයි. කථානායකතුමා සාක්කි.

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

ගරු කථානායකතුමනි, මේ ගොල්ලන් කිසිම දෙයක් කරන්නේ නැතිව, ටැක්ස් එක වැඩි කළා සියයට 64ට. පාරවල් හැදුවේ නැහැ. ගෙවල් හැදුවේ නැහැ. පාසල් හැදුවේ නැහැ. ආරෝග්‍යශාලා හැදුවේ නැහැ. රස්සාවල් දුන්නේ නැහැ. මේ මොනවාවත් කරන්නේ නැතිව ටැක්ස් එක සියයට 64ට ඉහළ දැම්මා. අපි මේවා සේරම හදලා තමයි සියයට 54ට ටැක්ස් එක දාලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය. ගරු අබ්දුල් කාදර් මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් අහන්නේ දෙ වැනි අතුරු ප්‍රශ්නයයි. තුන්වැනි අතුරු ප්‍රශ්නය මා අපේ මුස්ලිම් නායකතුමාට දෙනවා. ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී කරුණාකර ඔබතුමා තිබෙන නම රැක ගෙන ආණ්ඩුවේ තිබෙන පව් ආණ්ඩුවට තියා ගන්න කියන්න [බාධා කිරීම්] ඔබතුමන්ලාගේ හෙන්චයියලාට තමයි ලෝක බැංකුවේ ප්ලග් ගලවන්න ගිහිල්ලා දැන් ෂොක් එක වැදිලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඔබතුමන්ලා තමයි ජනතාවට පණිවිඩයක් දුන්නේ "ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වන කොට අපි වැඩි කරන්නේ නැහැ: අපේ මුස්ලිම් අරාබි යාළුවෝ තුළින් අපි අඩු කරනවා'ය කියලා. ඔබතුමන්ලා දහහතර වතාවක් තෙල් මිල වැඩි කරලා තිබෙනවා. අපේ කාලයේ මුළු කාලාන්තරය තුළම වැඩි වුණේ රුපියල් අටකිනුයි.

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

නැහැ, නැහැ. - [බාධා කිරීම්] ඔබතුමන්ලාගේ කාලයේ -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉතින් මේ අවස්ථාවේදී අසත්‍ය කියන්නේ නැතිව තෙල් ලීටරය රුපියල් හතළිහට දෙන්න පුළුවන්කම තිබෙන අවස්ථාවේදී, ඔබතුමන්ලා රුපියල් 60ක ලාභයකුත් තියා ගෙන - [බාධා කිරීම්]

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

ඔබතුමන්ලාගේ කාලයේ - [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තෙල් ලීටරය රුපියල් අසූ පහට අඩුව විකුණන්නේ නැත්නම් ආණ්ඩුව ඉල්ලා අස් වෙන්න ඕනෑය කියා මා මේ අවස්ථාවේදී කියනවා. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An hon. Member)

හරි, හරි. ඒක හොඳයි. - [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ෆවුසි ඇමතිතුමා ඉන්න. අනෙක් ගෝල බාලයෝ ටිකයි ගෙදර යන්න ඕනෑ. ඔබතුමන්ලා කෝටි පන්දහසක් පාවිච්චි කරන්නේ ඇමතිවරු 110 රකින්නයි. ගරු කථානායකතුමනි, මේක හරි අපරාධයක් නේද? ඔබතුමාගේ බදුල්ල ප්‍රදේශයටත් තෙල් විකුණන්නේ මේ මිලටයි.

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)

මේ ලාභය ගන්න - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය. - [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය මා අපේ මුස්ලිම් නායකතුමාට දෙනවා.

**ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ. ஆ. எம். அப்துல் காதர்)
(The Hon. A. R. M. Abdul Kader)
ගරු ඇමතිතුමනි, තුන් වැනි අතුරු ප්‍රශ්නය හැටියට මම තමුන්නාන්සේගෙන් අහන්නේ, මට ආරංචියක් ලැබුණා ආණ්ඩුව පැත්තේ මුස්ලිම් මැති ඇමතිවරුන් තමුන්නාන්සේ මේ වතාවේ මක්කමට එක්ක ගෙන යනවාය කියා. ඒ list එකට මගේ නමත් දමා ගන්න පුළුවන්ද? - [බාධා කිරීම්]

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)
එතුමා අහන්නේ අදාළ නැති ප්‍රශ්නයක් ගරු කථානායකතුමනි.

**ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ. ஆர். எம். அப்துல் காதர்)
(The Hon. A. R. M. Abdul Kader)
ඒ list එකට මගේ නමත් දමා ගන්න පුළුවන්ද - [බාධා කිරීම්]

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி)
(The Hon. A. H. M. Fowzie)
ඒන්න, එන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, ඒ උත්තරයෙන් මා සෑහීමකට පත් වන්නේ නැහැ. ඉතින් ඒ උත්තරය කිව්ව නිසා මා පිළිගන්නම්. හෙජින්වලින් - [බාධා කිරීමක්] මහ බැංකුව - [බාධා කිරීමක්] ඔබතුමන්ලා කරලා තිබෙන පාප කර්මය.ඉතින් ඔබතුමන්ලා මේක භාර ගන්නේ ඇයි? ඊයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස් වූ අවස්ථාවේදී පෙනුණා. ආණ්ඩුව පිළිගෙන තිබෙන බව; කැබිනට් මණ්ඩලය එය අනුමත කර තිබෙන බව මේක දැන් ඔබතුමන්ලා හෙජින්වලට දමන්නට එපා.

## නව මුදල් නෝට්ටු මුද්‍රණය : පිරිවැය
### புதிய நாணயத் தாள்களை அச்சிடுதல் : செலவு
### PRINTING OF NEW CURRENCY NOTES : COST

0085/'08

2. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2004 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ —
- (i) වෙළෙඳපොළට නිකුත් කරන ලද නව මුළු මුදල් නෝට්ටු ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;
- (ii) වෙළෙඳපොළෙන් ඉවත් කර ගන්නා ලද ව්‍යාජ ලෙස සකස් කළ හා හොර මුදල් නෝට්ටු ප්‍රමාණය කොපමණද;
- (iii) මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට වැය වූ පිරිවැය කොපමණද;
- (iv) මුද්‍රණය කර ඇති මුදල් නෝට්ටු සඳහා වැය වූ පිරිවැය වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වෙළෙඳ පොළට මුදල් නිකුත් කරන ලද්දේ කුමන ආර්ථික විද්‍යාත්මක පදනම (උදා: වත්කම් + නව වසරේ වර්ධනය) මතද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா :

(அ) 2004 ஆம் ஆண்டு முதல் இற்றைவரையில்,—
- (i) சந்தைக்கு விநியோகிக்கப்பட்ட மொத்த புதிய நாணயம் எவ்வளவு என்பதை மாதாந்த அடிப்படையிலும்,
- (ii) சந்தையிலிருந்து கைப்பற்றப்பட்ட போலி அல்லது கள்ள நாணயங்களின் தொகை எவ்வளவு என்பதையும்,
- (iii) நாணயத்தாள்களை அச்சிடுவதற்கான செலவு எவ்வளவு என்பதையும்,
- (iv) பணத்தை அச்சிடுவதற்கான செலவு எவ்வளவு என்பதை வருடாந்த அடிப்படையிலும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) எவ்வகையான பொருளாதார (உதாரணம் : சொத்துக்கள் + அடுத்த வருடத்திற்கான வளர்ச்சி) அடிப்படையின் கீழ் பணம் சந்தைக்கு விடுவிக்கப்பட்டது என்பதை அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(*a*) Will he inform this House from 2004 to date,—
- (i) the total amount of new currency issued to the market on per month basis;
- (ii) the amount of forged currency or counterfeit notes withdrawn from the market;
- (iii) the cost of printing of the money notes; and
- (iv) the cost of money being printed on a per year basis?

(b) Will he state the economic basis (e.g. Assets+Next Year's Growth) on which the money has been released to the market?

(*c*) If not, why?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும், நிதி திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapititya—Minister of State Revenue and Finace and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වෙළෙඳ පොළට නිකුත් කරන නව මුදල් නෝට්ටු ප්‍රමාණය (මාසික පදනමින්) ඇමුණුම 1හි 1 වන වගුවේ දැක්වේ.
- (ii) වෙළෙඳ පොළින් ඉවත් කර ගන්නා ලද ව්‍යාජ ලෙස සකස් කළ හොර මුදල් නෝට්ටු ප්‍රමාණය ඇමුණුම 1හි 2 වගුවේ දැක්වේ.
- (iii) නව මුදල් නෝට්ටු ප්‍රමාණය මුද්‍රණය කිරීමට වැය වූ පිරිවැය ඇමුණුම 1හි 3 වන වගුවේ දැක්වේ.
- (iv) මුද්‍රණය කර ඇති මුදල් නෝට්ටු සඳහා වැය වූ පිරිවැය (වාර්ෂික පදනමින්) ඇමුණුම 1හි 3 වන වගුවේ දැක්වේ.

ඇමුණුම 1 **සභාගත*** කරමි.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා ]

(ආ) ආර්ථිකයේ මූර්ත වර්ධනය (මූර්ත ගනුදෙනු ප්‍රමාණය) සහ දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනය මත මුදල් සඳහා මහ ජනතාවගේ ඉල්ලුම තීරණය වේ. ආර්ථිකයෙහි සුමට ක්‍රියාකාරිත්වය සඳහා හිඟයකින් තොරව මුදල් සැපයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය භාරයයි.

මුදල් අච්චු ගැසීම පිළිබඳ වැඩි තොරතුරු සඳහන් 2007 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ 16.1 වැනි විශේෂ සටහන මේ සමඟ තිබෙනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා එය ඇමුණුම 2 වශයෙන් **සභාගත*** කරනවා. මා මේ සටහන ඊයේත් හැන්සාඩ්ගත කළා. ඊයෙත් මේ හා සමාන ප්‍රශ්නයක් ඔබතුමා අසා තිබුණා.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම –1

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்:*
*Annexes tabled* :

Table –1

**THE VOLUME AND VALUE OF NEW NOTES ISSUED IN TO CIRCULATION DURING 2004-2006**

| | Number of notes (In thousand pieces) | | | | | Value (Rs. mn) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Month | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
| January | 7896 | 10350 | 10258 | 10596 | 7437 | 775.04 | 2322.47 | 510.39 | 3104.17 | 268.72 |
| February | 7395 | 9866 | 13175 | 14323 | 10025 | 1343.5 | 2265.18 | 2235.61 | 5168.73 | 779.6 |
| March | 35476 | 34670 | 41382 | 26575 | 28873 | 9102.74 | 11662.71 | 12715.35 | 9302.67 | 10133.72 |
| April | 9616 | 27954 | 34385 | 34911 | 25350 | 848.26 | 11956.04 | 10694.91 | 14373.13 | 9916.09 |
| May | 4751 | 8141 | 11451 | 4079 | 5413 | 156.69 | 328.38 | 505.4 | 168.88 | 211.28 |
| June | 2524 | 6385 | 8938 | 3674 | 3007 | 103.71 | 260.4 | 278.58 | 119.06 | 100.55 |
| July | 6453 | 7460 | 9637 | 3337 | 2178 | 368.56 | 242.3 | 382.96 | 117.07 | 59.26 |
| August | 10245 | 10191 | 9524 | 6124 | 3641 | 1901.52 | 465.63 | 387.86 | 367.51 | 120.46 |
| September | 13428 | 11059 | 14141 | 15720 | 9808 | 3172.55 | 627.23 | 566.39 | 2275.62 | 779.71 |
| October | 14772 | 19239 | 19848 | 9515 | 0 | 2180.94 | 889.22 | 3860.903 | 431.89 | 0 |
| November | 16066 | 7628 | 13551 | 9319 | 0 | 3775.06 | 549.14 | 4882.05 | 408.02 | 0 |
| December | 20241 | 20289 | 18178 | 12953 | 0 | 4943.15 | 6133.96 | 9513.69 | 683.27 | 0 |
| **Total** | **148863** | **173682** | **204468** | **151126** | **95732** | **28671.72** | **37702.66** | **46534.09** | **36881.02** | **22369.39** |

**NEW NOTES ISSUED IN TO CIRCULATION MONTHLY (RS.MN)**

| 2,004 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20/- | 10/- | TOTAL (RS.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 384 | 108 | 3 | 170 | 45 | 37 | 28 | 775 |
| FEB | 0 | 952 | 206 | 0 | 85 | 36 | 40 | 25 | 1,344 |
| MAR | 0 | 2,851 | 5,497 | 69 | 332 | 174 | 71 | 109 | 9,103 |
| APR | 0 | 167 | 253 | 13 | 318 | 51 | 0 | 47 | 848 |
| MAY | 0 | 0 | 0 | 7 | 55 | 66 | 0 | 28 | 157 |
| JUN | 0 | 1 | 0 | 0 | 54 | 22 | 23 | 4 | 104 |
| JUL | 0 | 31 | 0 | 8 | 211 | 58 | 60 | 1 | 369 |
| AUG | 0 | 1,463 | 44 | 3 | 278 | 40 | 45 | 28 | 1,902 |
| SEP | 0 | 2,630 | 8 | 0 | 380 | 74 | 52 | 29 | 3,173 |
| OCT | 0 | 1,502 | 34 | 0 | 436 | 115 | 59 | 36 | 2,181 |
| NOV | 0 | 3,077 | 28 | 0 | 467 | 110 | 66 | 28 | 3,775 |
| DEC | 0 | 3,584 | 632 | 1 | 493 | 112 | 79 | 43 | 4,943 |
| TOTAL PIECES | 0 | 16,642 | 6,807 | 103 | 3,279 | 903 | 532 | 407 | 28,672 |

| 2,005 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20/- | 10/- | TOTAL (RS.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 1,976 | 3 | 1 | 180 | 89 | 50 | 23 | 2,322 |
| FEB | 0 | 1,968 | 9 | 2 | 160 | 54 | 42 | 31 | 2,265 |
| MAR | 0 | 8,213 | 2,492 | 33 | 573 | 177 | 110 | 65 | 11,663 |
| APR | 0 | 9,550 | 1,750 | 16 | 390 | 133 | 69 | 48 | 11,956 |
| MAY | 0 | 0 | 0 | 4 | 174 | 84 | 38 | 28 | 328 |
| JUN | 0 | 2 | 0 | 0 | 136 | 61 | 38 | 24 | 260 |
| JUL | 0 | 0 | 0 | 0 | 122 | 40 | 52 | 28 | 242 |
| AUG | 0 | 12 | 3 | 0 | 330 | 30 | 56 | 35 | 466 |
| SEP | 0 | 140 | 0 | 0 | 341 | 61 | 44 | 41 | 627 |
| OCT | 0 | 0 | 0 | 11 | 572 | 162 | 85 | 60 | 889 |
| NOV | 0 | 10 | 0 | 10 | 450 | 44 | 28 | 8 | 549 |
| DEC | 0 | 5,356 | 97 | 2 | 441 | 122 | 78 | 40 | 6,134 |
| TOTAL PIECES | 0 | 27,227 | 4,353 | 78 | 3,868 | 1,055 | 692 | 430 | 37,703 |

| 2006 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20- | 10/- | TOTAL (Rs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 12 | 18 | 1 | 335 | 70 | 41 | 34 | 510 |
| FEB | 0 | 1,650 | 1 | 0 | 440 | 67 | 41 | 37 | 2,236 |
| MAR | 0 | 9,500 | 1,836 | 1 | 954 | 220 | 124 | 80 | 12,715 |
| APR | 0 | 4,139 | 5,563 | 8 | 706 | 147 | 84 | 49 | 10,695 |
| MAY | 0 | 0 | 0 | 0 | 315 | 103 | 50 | 37 | 505 |
| JUN | 0 | 0 | 0 | 0 | 131 | 53 | 59 | 36 | 279 |
| JUL | 0 | 0 | 0 | 0 | 244 | 51 | 54 | 35 | 383 |
| AUG | 0 | 0 | 0 | 0 | 260 | 47 | 42 | 39 | 388 |
| SEP | 0 | 0 | 0 | 0 | 370 | 76 | 62 | 58 | 566 |
| OCT | 2,892 | 0 | 228 | 0 | 472 | 127 | 71 | 71 | 3,861 |
| NOV | 4,348 | 0 | 110 | 0 | 253 | 67 | 62 | 42 | 4,882 |
| DEC | 8,740 | 0 | 82 | 0 | 470 | 126 | 62 | 33 | 9,514 |
| TOTAL PIECES | 15,980 | 15,301 | 7,836 | 9 | 4,950 | 1,154 | 751 | 553 | 46,534 |

| 2007 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20- | 10/- | TOTAL (Rs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 2,692 | 0 | 0 | 0 | 255 | 89 | 38 | 30 | 3,104 |
| FEB | 4,508 | 0 | 28 | 0 | 458 | 94 | 50 | 30 | 5,169 |
| MAR | 8,070 | 0 | 220 | 0 | 672 | 172 | 98 | 70 | 9,303 |
| APR | 11,678 | 8 | 1,818 | 0 | 833 | 214 | 110 | 73 | 14,734 |
| MAY | 0 | 0 | 0 | 0 | 84 | 54 | 18 | 12 | 169 |
| JUN | 0 | 0 | 1 | 0 | 56 | 24 | 23 | 15 | 119 |
| JUL | 0 | 0 | 0 | 0 | 51 | 36 | 19 | 12 | 117 |
| AUG | 100 | 6 | 0 | 0 | 176 | 35 | 28 | 22 | 368 |
| SEP | 1,608 | 7 | 0 | 0 | 399 | 159 | 52 | 52 | 2,276 |
| OCT | 4 | 9 | 0 | 0 | 244 | 105 | 40 | 30 | 432 |
| NOV | 0 | 1 | 0 | 0 | 266 | 69 | 39 | 33 | 408 |
| DEC | 28 | 21 | 28 | 0 | 430 | 81 | 52 | 43 | 683 |
| TOTAL PIECES | 28,688 | 52 | 2,095 | 0 | 3,923 | 1,133 | 568 | 423 | 36,881 |

| 2008 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20- | 10/- | TOTAL (Rs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 0 | 0 | 0 | 146 | 50 | 45 | 27 | 269 |
| FEB | 2 | 121 | 200 | 0 | 343 | 43 | 38 | 33 | 780 |
| MAR | 5,156 | 2,655 | 1,190 | 0 | 841 | 162 | 68 | 62 | 10,134 |
| APR | 4,996 | 3,230 | 852 | 0 | 568 | 127 | 91 | 51 | 9,916 |
| MAY | 10 | 14 | 3 | 0 | 86 | 46 | 33 | 20 | 211 |
| JUN | 0 | 1 | 1 | 0 | 45 | 25 | 17 | 12 | 101 |
| JUL | 0 | 0 | 0 | 0 | 22 | 13 | 15 | 10 | 59 |
| AUG | 0 | 0 | 1 | 0 | 57 | 23 | 26 | 13 | 120 |
| SEP | 116 | 149 | 115 | 0 | 228 | 95 | 50 | 27 | 780 |
| OCT | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| NOV | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| DEC | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

NEW NOTES ISSUED TO CIRCULATION FROM 2004 TO 2008 (DENOMINATION WISE IN PIECES)

| 2004 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20- | 10/- | TOTAL (Rs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 384 | 215 | 14 | 1,704 | 902 | 1,847 | 2,830 | 7,896 |
| FEB | 0 | 952 | 412 | 0 | 852 | 713 | 1,999 | 2,467 | 7,395 |
| MAR | 0 | 2,851 | 10,993 | 344 | 3,321 | 3,475 | 3,567 | 10,925 | 35,476 |
| APR | 0 | 167 | 505 | 63 | 3,183 | 1,016 | 24 | 4,658 | 9,616 |
| MAY | 0 | 0 | 0 | 35 | 549 | 1,328 | 0 | 2,839 | 4,751 |
| JUN | 0 | 1 | 0 | 0 | 542 | 433 | 1,138 | 410 | 2,524 |
| JUL | 0 | 31 | 0 | 39 | 2,112 | 1,152 | 2,977 | 142 | 6,453 |
| AUG | 0 | 1,463 | 88 | 15 | 2,777 | 802 | 2,272 | 2,828 | 10,245 |
| SEP | 0 | 2,630 | 15 | 0 | 3,796 | 1,487 | 2,610 | 2,890 | 13,428 |
| OCT | 0 | 1,502 | 67 | 0 | 4,361 | 2,291 | 2,928 | 3,623 | 14,772 |
| NOV | 0 | 3,077 | 55 | 0 | 4,667 | 2,206 | 3,295 | 2,766 | 16,066 |
| DEC | 0 | 3,584 | 1,264 | 3 | 4,927 | 2,249 | 3,926 | 4,288 | 20,241 |
| TOTAL PIECES | 0 | 16,642 | 13,614 | 513 | 32,791 | 18,054 | 26,583 | 40,666 | 148,863 |

| 2005 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20- | 10/- | TOTAL (Rs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 1,976 | 6 | 5 | 1,804 | 1,785 | 2,508 | 2,266 | 10,350 |
| FEB | 0 | 1,968 | 17 | 10 | 1,595 | 1,080 | 2,122 | 3,074 | 9,866 |
| MAR | 0 | 8,213 | 4,983 | 165 | 5,726 | 3,541 | 5,514 | 6,528 | 34,670 |
| APR | 0 | 9,550 | 3,500 | 80 | 3,900 | 2,660 | 3,440 | 4,824 | 27,954 |
| MAY | 0 | 0 | 0 | 19 | 1,743 | 1,682 | 1,921 | 2,776 | 8,141 |
| JUN | 0 | 2 | 0 | 0 | 1,361 | 1,212 | 1,910 | 2,350 | 6,835 |
| JUL | 0 | 0 | 0 | 0 | 1,220 | 792 | 2,622 | 2,826 | 7,460 |
| AUG | 0 | 12 | 6 | 0 | 3,298 | 599 | 2,812 | 3,464 | 10,191 |
| SEP | 0 | 140 | 0 | 0 | 3,412 | 1,224 | 2,200 | 4,083 | 11,059 |
| OCT | 0 | 0 | 0 | 55 | 5,716 | 3,231 | 4,270 | 5,967 | 19,239 |
| NOV | 0 | 10 | 0 | 50 | 4,495 | 870 | 1,411 | 792 | 7,628 |
| DEC | 0 | 5,356 | 193 | 8 | 4,405 | 2,430 | 3,889 | 4,008 | 20,289 |
| TOTAL PIECES | 0 | 27,227 | 8,705 | 392 | 38,675 | 21,106 | 34,619 | 42,958 | 173,682 |

| 2,006 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20/- | 10/- | TOTAL (Pcs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 12 | 35 | 3 | 3,350 | 1,408 | 2,039 | 3,411 | 10,258 |
| FEB | 0 | 1,650 | 1 | 0 | 4,400 | 1,337 | 2,039 | 3,748 | 13,175 |
| MAR | 0 | 9,500 | 3,671 | 4 | 9,540 | 4,404 | 6,222 | 8,041 | 41,382 |
| APR | 0 | 4,139 | 11,125 | 40 | 7,060 | 2,931 | 4,196 | 4,894 | 34,385 |
| MAY | 0 | 0 | 0 | 0 | 3,150 | 2,056 | 2,515 | 3,730 | 11,451 |
| JUN | 0 | 0 | 0 | 0 | 1,310 | 1,050 | 2,930 | 3,648 | 8,938 |
| JUL | 0 | 0 | 0 | 0 | 2,436 | 1,014 | 2,679 | 3,508 | 9,637 |
| AUG | 0 | 0 | 0 | 0 | 2,604 | 934 | 2,090 | 3,896 | 9,524 |
| SEP | 0 | 0 | 0 | 0 | 3,700 | 1,527 | 3,090 | 5,824 | 14,141 |
| OCT | 1,446 | 0 | 455 | 0 | 4,719 | 2,542 | 3,554 | 7,132 | 19,848 |
| NOV | 2,174 | 0 | 220 | 0 | 2,531 | 1,347 | 3,081 | 4,198 | 13,551 |
| DEC | 4,370 | 0 | 164 | 0 | 4,702 | 2,523 | 3,115 | 3,304 | 18,178 |
| TOTAL PIECES | 7,990 | 15,301 | 15,671 | 47 | 49,502 | 23,073 | 37,550 | 55,334 | 204,468 |

| 2,007 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20/- | 10/- | TOTAL (Pcs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 1,346 | 0 | 0 | 0 | 2,548 | 1,788 | 1,883 | 3,031 | 10,596 |
| FEB | 2,254 | 0 | 56 | 0 | 4,581 | 1,882 | 2,503 | 3,047 | 14,323 |
| MAR | 4,035 | 0 | 440 | 0 | 6,719 | 3,449 | 4,900 | 7,032 | 26,575 |
| APR | 5,839 | 8 | 3,636 | 0 | 8,331 | 4,281 | 5,482 | 7,334 | 34,911 |
| MAY | 0 | 0 | 0 | 0 | 839 | 1,085 | 918 | 1,237 | 4,079 |
| JUN | 0 | 0 | 2 | 0 | 557 | 489 | 1,165 | 1,461 | 3,674 |
| JUL | 0 | 0 | 0 | 0 | 506 | 713 | 964 | 1,154 | 3,337 |
| AUG | 50 | 6 | 0 | 0 | 1,762 | 706 | 1,401 | 2,199 | 6,124 |
| SEP | 804 | 7 | 0 | 0 | 3,985 | 3,176 | 2,584 | 5,164 | 15,720 |
| OCT | 2 | 9 | 0 | 0 | 2,442 | 2,102 | 1,999 | 2,961 | 9,515 |
| NOV | 0 | 1 | 0 | 0 | 2,658 | 1,376 | 1,958 | 3,326 | 9,319 |
| DEC | 14 | 21 | 55 | 0 | 4,302 | 1,618 | 2,624 | 4,319 | 12,953 |
| TOTAL PIECES | 14,344 | 52 | 4,189 | 0 | 39,230 | 22,665 | 28,381 | 42,265 | 151,126 |

| 2,008 | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20/- | 10/- | TOTAL (Pcs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| JAN | 0 | 0 | 0 | 0 | 1,463 | 1,009 | 2,232 | 2,733 | 7,437 |
| FEB | 1 | 121 | 399 | 0 | 3,429 | 865 | 1,885 | 3,325 | 10,025 |
| MAR | 2,578 | 2,655 | 2,379 | 0 | 8,414 | 3,240 | 3,375 | 6,232 | 28,873 |
| APR | 2,498 | 3,230 | 1,704 | 0 | 5,683 | 2,549 | 4,548 | 5,138 | 25,350 |
| MAY | 5 | 14 | 6 | 0 | 859 | 912 | 1,661 | 1,956 | 5,413 |
| JUN | 0 | 1 | 1 | 0 | 448 | 500 | 868 | 1,189 | 3,007 |
| JUL | 0 | 0 | 0 | 0 | 222 | 250 | 750 | 956 | 2,178 |
| AUG | 0 | 0 | 2 | 0 | 570 | 466 | 1,313 | 1,290 | 3,641 |
| SEP | 58 | 149 | 229 | 0 | 2,282 | 1,907 | 2,483 | 2,700 | 9,808 |
| OCT | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| NOV | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| DEC | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| TOTAL PIECES | 5,140 | 6,170 | 4,720 | 0 | 23,370 | 11,698 | 19,115 | 25,519 | 95,732 |

THE VOLUME AND VALUE OF UNSERVICEABLE NOTESWITHDRWAN FROM CIRCULATION FOR DESTRUCTION DURING 2004-2008

| | Number of notes (In thousand pieces) | | | | | Value (Rs. mn.) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Month | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
| January | 775.0 | 2,322.5 | 510.4 | 3,104.2 | 268.7 | 280.4 | 1,337.3 | 2,551.0 | 2,029.2 | 443.2 |
| February | 1,343.5 | 2,265.2 | 2,235.6 | 5,168.7 | 779.6 | 4,924.9 | 1,184.4 | 1,942.6 | 1,490.2 | 784.3 |
| March | 9,102.7 | 11,662.7 | 12,715.4 | 9,302.7 | 10,133.7 | 1,011.3 | 1,326.8 | 1,864.5 | 2,141.5 | 630.3 |
| April | 848.3 | 11,956.0 | 10,694.9 | 14,734.1 | 9,916.1 | 793.0 | 1,951.0 | 3,382.7 | 1,456.3 | 770.3 |
| May | 156.7 | 328.4 | 505.4 | 168.9 | 211.3 | 3,028.7 | 2,179.1 | 3,178.2 | 1,065.2 | 1,200.3 |
| June | 103.7 | 260.4 | 278.6 | 119.1 | 100.6 | 2,404.8 | 1,858.4 | 2,692.9 | 877.2 | 742.7 |
| July | 368.6 | 242.3 | 383.0 | 117.1 | 59.3 | 2,061.6 | 1,908.6 | 1,838.7 | 501.0 | 1,082.1 |
| August | 1,901.5 | 465.6 | 387.9 | 367.5 | 120.5 | 2,134.9 | 1,663.4 | 1,920.5 | 584.0 | 1,975.3 |
| September | 3,172.6 | 627.2 | 566.4 | 2,275.6 | 779.7 | 1,794.3 | 1,992.4 | 1,416.2 | 398.6 | 1,929.3 |
| October | 2,180.9 | 889.2 | 3,860.9 | 431.9 | - | 1,317.0 | 1,786.8 | 1,505.1 | 653.6 | - |
| November | 3,775.1 | 549.1 | 4,882.1 | 408.0 | - | 1,351.2 | 2,045.5 | 1,710.5 | 679.6 | - |
| December | 4,943.2 | 6,134.0 | 9,513.7 | 683.3 | - | 1,672.7 | 1,836.7 | 1,671.5 | 617.8 | - |
| Total | 28,671.7 | 37,702.7 | 46,534.1 | 36,881.0 | 22,369.4 | 22,774.8 | 21,070.4 | 25,674.4 | 12,494.2 | 9,557.8 |

**Table 2**
**Counterfeit Notes Referred to the Central Bank (Volume (PCS)**
Denomination

| Year | 2000/- | 1000/- | 500/- | 200/- | 100/- | 50/- | 20/- | 10/- | TOTAL (Pcs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2004 | | 727 | 702 | 40 | 221 | 316 | 2 | 1 | 2,009 |
| 2005 | | 2,673 | 1,908 | 89 | 684 | 346 | 52 | 62 | 5,814 |
| 2006 | | 469 | 604 | 44 | 112 | 7 | 1 | 0 | 1,237 |
| 2007 | 68 | 464 | 473 | | 225 | 2 | | 1,232 | |
| 2008 up to September | | 163 | 967 | | 33 | 9 | | 1,172 | |
| Total (Pieces.) | 68 | 4,496 | 4,654 | 173 | 1,275 | 680 | 55 | 63 | 11,464 |

The above counterfeit notes have been referred to Central Bank of Sri Lanka by the CID for certificates under Section 59 of the Monetary Law Act.

**Table 3.**
**Cost of New Currency Notes Printed from 2004 - Sept. 2008**

| Year | Printing Cost. (Rs.) | Taxes (Rs.) | Total Cost (Rs.) |
|---|---|---|---|
| 2004 | 697,065,025 | 123,011,475 | 820,076,500 |
| 2005 | 1,134,328,675 | 170,149,301 | 1,304,477,976 |
| 2006 | 1,350,898,755 | 202,634,813 | 1,553,533,568 |
| 2007 | 109,278,975 | 16,391,846 | 125,670,821 |
| 2008 | 817,910,000 | 136,828,758 | 954,738,758 |
| Total | 4,109,481,430 | 649,016,193 | 4,758,497,623 |

**විශේෂ සටහන 16**

## මුදල් අච්චු ගැසීම - මූලධර්ම සහ ක්‍රියාවලිය

"මුදල් අච්චු ගැසීම" යන යෙදුම සාමාන්‍යයෙන්, නිශ්චිත කාලසීමාවක් තුළ මහ බැංකුව විසින් ආර්ථිකයට නිකුත් කරනු ලබන මුදල් ප්‍රමාණය නිරූපණය කිරීම සඳහා පුළුල් අර්ථයෙන් භාවිතා කෙරේ. කෙසේ වුවද, මෙම යෙදුම මෑත කාලයේ දී විවිධ අර්ථකථන සැපයීම පිණිස ලිහිල් ආකාරයෙන් උපයෝගී කරගනු දක්නට ලැබේ. ඒ අනුව, මුදල් අච්චු ගැසීම යන්නට මහ බැංකුව විසින් මුද්‍රණය කරන ලද කාසි සහ නෝට්ටු ප්‍රමාණය, සංසරණයෙහි පවත්නා මුදල් සහ නෝට්ටුවල වෙනස්වීම මෙන්ම මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ණය ප්‍රමාණය යනාදී විවිධ අර්ථකථන දක්නට ලැබෙන අතර, ඇතැම් වැරදි අර්ථ කථන තුළින් මහජනතාව තුළ දිගින් දිගටම ව්‍යාකූලතා හා වැරදි අවබෝධ ඇති වී තිබේ. එහෙයින්, එබඳු වැරදි අවබෝධ දුරු කරලීම පිණිස මෙම ලිපිය තුළින් මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්වල සංයුතිය, මුදල් නිකුත් කිරීමේ දී පදනම් කරගන්නා මූලධර්ම සහ එහි ක්‍රියාවලිය මෙන්ම මෑත වර්ෂවල මහ බැංකුව විසින් නිකුත් කරන ලද සත්‍ය මුදල් ප්‍රමාණය පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කෙරේ.

මහ බැංකුව විසින් ආර්ථිකයට නිකුත් කරනු ලබන මුදල්,"සංචිත", "පදනම්" හෝ "අධි බලැති" මුදල් යනුවෙන් හැඳින්වේ. ඊට හේතුව, සංචිත මුදල් මත පදනම් වී ගුණක ක්‍රියාවලිය හරහා ණය සහ තැන්පතු බිහිකිරීම තුළින් වාණිජ බැංකුවලට තව තවත් මුදල් මැවිය හැකි හෙයිනි. සංචිත මුදල් නිකුත් කිරීමේ වගකීම ඇති එකම අධිකාරිය වන්නේ මහ බැංකුවයි. මහ බැංකුවේ සේප්පු තුළ ටංකනය කරන ලද කාසි සහ මුද්‍රණය කරන ලද නෝට්ටු තොග තිබුණත්, ඒවා මහ ජනතාවගේ අයිතියට පත්වන තුරු "මුදල්" ලෙස නොසැලකේ.

සංචිත මුදල් සමන්විත වන්නේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන කාසි සහ නෝට්ටු, වාණිජ බැංකු සහ රාජ්‍ය නියෝජිතායතන විසින් මහ බැංකුවේ පවත්වා ගනු ලබන තැන්පතුවලිනි. මේවා මහ බැංකුවේ වගකීම් ලෙස මහ බැංකු ශේෂ පත්‍රයේ සඳහන් වේ. ගිණුම්කරණ මූලධර්මවලට අනුව, මෙම වගකීම් මහ බැංකු ශේෂ පත්‍රයේ පවත්නා වත්කම්වලින් ආවරණය විය යුතුව ඇත. ඒ අනුව, මහ බැංකුව විසින් "සංචිත මුදල් නිකුත් කිරීම" හෝ "මුදල් අච්චු ගැසීම" සිදු කරනු ලබන්නේ මූලධර්ම මත පදනම්ව වත්කම් අත්පත් කර ගැනීම තුළිනි.

මහ බැංකුව විසින් ආර්ථිකයට සංචිත මුදල් නිකුත් කරනු ලබන ක්‍රම දෙකක් පවතී. එනම් (i) ශුද්ධ දේශීය වත්කම් අත් කර ගැනීම සහ (ii) ශුද්ධ විදේශීය වත්කම් අත්කර ගැනීමයි.

මහ බැංකුව විසින් දේශීය වත්කම් අත්කර ගැනීම සිදුවන්නේ රජයට සහ/හෝ වාණිජ බැංකුවලට ණය සැපයීම තුළිනි. මුදල් නීති පනතේ සඳහන් වන ආකාරයට,

රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට දහයෑ
සමාන ප්‍රමාණයක් දක්වා මහ බැංකුව රජය වේ
තාවකාලික අත්තිකාරම් වශයෙන් සපයයි. ඊට අමතර
බැංකු ක්‍රමය තුළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම
අදාළ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් කටයුතුවල කොටස
වශයෙන් ද මහ බැංකුවට රාජ්‍ය සුරැකුම්පත් එනම්, ප්‍රධ
වශයෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම තුළින් රැ
වෙත ණය සැපයිය හැකිය.

රජය මහ බැංකුවේ තැන්පතු ද පවත්වා ගනී. ඉ
සඳහන් කළ ණය ගැනීම් සහ තැන්පතු අතර වෙනස "රැ
වෙත සපයනු ලබන ශුද්ධ ණය" වශයෙන් හැඳින්වේ
අතර, ඉන් නිරූපණය වන්නේ රජය වෙත නිකුත් ක
ලද ශුද්ධ මුදල් ප්‍රමාණයයි. ඒ ආකාරයට ම, අවසාන ණ
සපයන්නා ලෙස හෝ විවට වෙළෙඳපොළ කටයුතු යටර
ද්‍රවශීලතා කළමනාකරණය කිරීම සඳහා මහ බැංකු
විසින් වාණිජ බැංකුවලට ණය සැපයීම මගින් ද ආර්ථික
මුදල් නිකුත් කළ හැකිය. රජය වෙත සපයනු ලබන ශු
ණය සහ වාණිජ බැංකු වෙත සපයනු ලබන ණය ද
දෙකෙහි එකතුවට මහ බැංකුවේ අනෙකුත් දේශීය වත්
හා වගකීම් ගළපන ලද විට ලැබෙන අගය "ශුද්ධ දේ
වත්කම්" ලෙස හැඳින්වේ.

මහ බැංකුව විදේශීය වත්කම් අත්කර ගන්
රජය සමග සිදුකරනු ලබන ගනුදෙනු හෝ දේශීය වි
විනිමය වෙළෙඳපොළෙහි සිදුකරන කටයුතු තුළි
රජයේ බැංකුකරු ලෙස මහ බැංකුව, විදේශ විනි
ණය හෝ ප්‍රදාන තුළින් රජයට ලැබෙන විදේශ විනි
මිල දී ගනු ලබන අතර, ඊට සමාන රුපියල් ප්‍රමාණ
නිකුත් කරයි. එමෙන්ම, රජයේ විදේශ ණය ආ
ගෙවීම් සහ පොලී වාරික ගෙවීම සඳහා මහ බැං
රජය වෙත විදේශ විනිමය අලෙවි කරයි. මීට අමතර
විදේශ විනිමය අනුපාතය අධික ලෙස උච්චාවචන
වීම සමනය කිරීම සඳහා මහ බැංකුව දේශීය වි
විනිමය වෙළෙඳපොළ තුළ ක්‍රියාකාරීව සහභාගි වේ
විනිමය අධි සැපයුමක් පවතින අවස්ථාවල අතිරික්
අවශෝෂණය කිරීම මගින් හෝ වෙළෙඳපොළ තුළ විශ
විනිමය හිඟයක් පවතින විට විදේශ විනිමය නිකුත් කි
මගින් එය සිදුකරයි. මහ බැංකුව විසින් විදේශ විනි
මිල දී ගැනීම (අවශෝෂණය) සහ විදේශ විනිමය අලෙ
කිරීම (නිකුත් කිරීම) අතර වෙනස හේතුකොට ගෙන ම
බැංකුවේ විදේශීය වත්කම් වෙනස් වන අතර, එය "ශු
විදේශීය වත්කම්" ලෙස හැඳින්වේ. ශුද්ධ විදේශීය වත්
වෙනස්වීම සංචිත මුදල් වෙනස්වීම සඳහා බලපායි.

නිශ්චිත කාල සීමාවක් (සාමාන්‍යයෙන් වසරක්) ඇ
ආර්ථිකයට නිකුත් කරනු ලබන මුදල් ප්‍රමාණය තීරණ
කරනු ලබන්නේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ඉලක
තුළිනි. වර්තමානයේ මහ බැංකුව මුදල් සමස්ත ඉලක

කිරීමේ රාමුවක් අනුගමනය කරයි. මෙම ප්‍රතිපත්ති රාමුව තුළ අවසාන අරමුණ වන මිල ස්ථායීතාව ළඟාකර ගනු ලබන්නේ මුදල් ගුණකය හරහා සංචිත මුදල් සැපයුම සමග සම්බන්ධ වී ඇති ආර්ථිකයේ පවත්නා මුළු මුදල් ප්‍රමාණය, එනම් පුළුල් මුදල් සැපයුමේ වෙනස්කම් සිදුකිරීම තුළිනි. ඒ අනුව, සංචිත මුදල්, මුදල් ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය ලෙස ද පුළුල් මුදල් අතරමැදි ඉලක්කය ලෙස ද ක්‍රියාකරනු ලබයි.

මුදල් ඉලක්ක සකස් කරනු ලබන්නේ ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශවල අපේක්ෂිත සංවර්ධනයන් සැලකිල්ලට ගනු ලබන මුදල් වැඩසටහනක් තුළිනි. මුදල් වැඩසටහනෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ අදාළ වසර තුළ දී මහ බැංකුව විසින් ආර්ථිකයට නිකුත් කළ යුතු නව මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමයි. සාමාන්‍යයෙන්, මෙම නව මුදල් නිකුතුව, ආර්ථිකය හෝ වෙළෙඳපොළවල් මත කිසිදු පීඩනයක් ඇති නොකරන පරිදි ආර්ථික ක්‍රියාකාරකම්හි අපේක්ෂිත ප්‍රසාරණය සඳහා ප්‍රමාණවත් විය යුතු වේ. ඒ අනුව, නව මුදල් නිකුතුවේ හෝ සංචිත මුදල්වල වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ නාමික වර්ධනයට සමාන විය යුතුය. එනම්, නිමැවුමේ අපේක්ෂිත වර්ධනය හා මිල මට්ටම් වෙනස්වීමේ අපේක්ෂිත අනුපාතිකය ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් විය යුතු ය.

මෙම සැලසුම්ගත මුදල් නිකුතුව සම්පූර්ණයෙන්ම පෙර සඳහන් කළ ශුද්ධ දේශීය වත්කම් සහ ශුද්ධ විදේශීය වත්කම්වල වෙනස්වීම තුළින් ආවරණය විය යුතු ය (වි.ස. 16.1 සංඛ්‍යා සටහන). යම් වර්ෂයක් තුළ නිකුත් කිරීමට අපේක්ෂිත නව මුදල් ප්‍රමාණය ඉලක්කගත මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා, අපේක්ෂිත මට්ටමට වඩා ශුද්ධ දේශීය වත්කම් ඉහළ යන විට ඊට අනුරූපව ශුද්ධ විදේශීය වත්කම් අඩුවිය යුතු අතර, ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යන විට ඊට අනුරූපව ශුද්ධ දේශීය වත්කම් අඩුවිය යුතුය.

නිදසුනක් වශයෙන්, විදේශ විනිමය ලැබීම් ඉහළ යාම හේතුවෙන් විදේශ විනිමය වෙළෙඳපොළ බෙහෙවින් ද්‍රවශීල වන අවස්ථාවක, එනම් විදේශ විනිමය සැපයුම ඉහළ මට්ටමක පවතින විට, විනිමය අනුපාතය දැඩි ලෙස උච්චාවචනය වීම වැළැක්වීම සඳහා විදේශ විනිමය මිල දී ගැනීමට මහ බැංකුවට සිදුවේ. එවිට, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යයි. එසේම මහ බැංකුව විදේශ විනිමය මිල දී ගන්නා විට, ඊට සමාන රුපියල් ප්‍රමාණයක් නිකුත් කිරීමට සිදු වන අතර, එමගින් නව මුදල් ප්‍රමාණය හෙවත් වෙළෙඳපොළ ද්‍රවශීලතාව ඉහළ යයි. මෙම නව මුදල් හෝ ද්‍රවශීලතාව අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතින විට මහ බැංකුව තමන් සතු රජයේ සුරැකුම්පත් උපයෝගී කර ගනිමින් විවට වෙළෙඳපොළ කටයුතුවල නිරත වේ. එසේ කිරීමෙන්, අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගනු ලබන අතර, එමගින් සංචිත මුදල් ඉලක්කගත මට්ටමේ පවත්වා ගනී. මහ බැංකුවේ මෙම ක්‍රියාමාර්ග තුළින් ශුද්ධ විදේශීය වත්කම් වැඩිවීමට අනුරූපීව ශුද්ධ දේශීය වත්කම් අඩුවීම සිදුවේ. එනම්, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් දැරීම් ප්‍රමාණය අඩු වන අතර, එමගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය පහළ යයි.

මේ ආකාරයට ම, මහ බැංකුව විසින් රජයට තාවකාලික අත්තිකාරම් සපයන විට හෝ මහා භාණ්ඩාගාරය වෙත මහ බැංකුවේ වාර්ෂික ලාභ ප්‍රේෂණය කරන විට ආර්ථිකයට නව මුදල් නිකුත් කිරීමක් සිදුවේ. එවැනි තත්ත්වයක දී වෙළෙඳපොළ ද්‍රවශීලතාව අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ ගොස් සංචිත මුදල් ඉලක්ක හා නොගැළපෙන මට්ටමක පවතින විට විවට වෙළෙඳපොළ කටයුතු තුළින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කළ යුතු

වි.ස. 16.1 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රය

රුපියල් බිලියන

| | 2002 දෙසැ | 2003 දෙසැ | 2004 දෙසැ | 2005 දෙසැ | 2006 දෙසැ | 2007 දෙසැ |
|---|---|---|---|---|---|---|
| වගකීම් (භාවිතාව) | | | | | | |
| සංචිත මුදල් | 126.4 | 141.4 | 171.0 | 197.9 | 239.9 | 264.4 |
| සංසරණයේ පවත්නා කාසි සහ නෝට්ටු | 88.3 | 98.8 | 115.9 | 132.4 | 157.2 | 173.4 |
| වාණිජ බැංකු තැන්පතු | 38.1 | 42.6 | 55.1 | 65.5 | 82.6 | 91.1 |
| රාජ්‍ය නියෝජිතායතන තැන්පතු | ... | ... | ... | ... | ... | ... |
| වත්කම් (ප්‍රභවය) | | | | | | |
| ශුද්ධ විදේශීය වත්කම් | 117.4 | 164.6 | 151.7 | 196.9 | 229.9 | 292.9 |
| ශුද්ධ දේශීය වත්කම් | 9.0 | -23.1 | 19.3 | 1.0 | 10.0 | -28.5 |
| රජය වෙත සපයන ලද ශුද්ධ ණය | 70.9 | 42.1 | 108.1 | 74.4 | 112.9 | 101.1 |
| රජය වෙත සපයන ලද ණය | 71.1 | 42.7 | 108.7 | 75.3 | 114.3 | 102.5 |
| තාවකාලික අත්තිකාරම් | 31.0 | 31.2 | 34.8 | 39.7 | 49.0 | 60.7 |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර | 40.1 | 11.5 | 73.9 | 35.6 | 65.3 | 41.8 |
| අඩුකළා : රජයේ තැන්පතු | 0.2 | 0.6 | 0.5 | 0.9 | 1.3 | 1.4 |
| වාණිජ බැංකු වෙත සපයන ලද ණය | ... | ... | ... | 2.5 | 2.5 | 2.1 |
| වෙනත් අයිතම (ශුද්ධ) | -61.9 | -65.3 | -88.9 | -75.9 | -105.4 | -131.7 |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරට අදාළ ඇමුණුම් සභාගත කළ නිසා අපට කියන්න පුළුවන්ද එන අවුරුද්දේ දළ දේශීය වර්ධනය කීයක් වෙයිද කියන එක? මොකද මේ අවුරුද්දට මුදල් වශයෙන් ඒකෙන් යම් ප්‍රතිශතයක් ලබා ගන්නවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු මන්ත්‍රීතුමනි, මා ඊයේත් එය සභාගත කළා. අදත් ඒ සටහන්, -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඊයේ පැහැදිලි කර නැහැ. ඊයේ ගෙදර ගිහින් තමයි මට ඒ වාර්තාව කියවන්න පුළුවන් වුණේ. ඒකේ ඒ සම්බන්ධව කිසි සේත්ම නැහැ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු ඒ සටහන මා අදත් ගෙනාවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා, දමලා නැති දේවල් ගැන.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අසත්‍ය ප්‍රකාශ කළාට මට අසත්‍ය ප්‍රකාශ කරන්න කිසි අවශ්‍යතාවක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් වර්ධන වේගය කියන්න, කථා කරන්නේ නැතිව?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමාටයි අසත්‍ය ප්‍රකාශ කරන්න වෙලා තිබෙන්නේ, ඔබතුමන්ලාගේ බොරු වහ ගන්න. මේ සටහන ඉතා පැහැදිලිව ඔබතුමාට නැවතත් කියවන්න මා පිටු අංකයත් එක්ක කියන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියවලා මම තේරුම් අරගෙනයි තිබෙන්නේ. ඔබතුමාට මෙතැන උත්තර දෙන්න බැරි නිසා මා ඊයේ ගෙදර අර ගෙන ගිහින් කියවලායි තිබෙන්නේ. ඒකේ කිසි සේත්ම දළ දේශීය නිෂ්පාදනයක් ගැන සඳහන් වෙලා නැහැ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු මන්ත්‍රීතුමනි, බලන්න 2007 මහ බැංකු වාර්තාවේ, -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් කියන්න දළ දේශීය නිෂ්පාදනය එන අවුරුද්දේ කීයද කියලා?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
166 වැනි පිටුව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එන අවුරුද්දේ වර්ධන වේගය කියන්න බැරිද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
166 වැනි පිටුව. හැම වර්ෂයකම දළ ආර්ථික වර්ධනය සහ ආර්ථික අවධමනය කියන දෙක එකතු කරලා ඒ එන ප්‍රමාණයට තමයි අප නව මුදල් නිකුත් කිරීම් සඳහා සූදානම් වන්නේ. අපේ ඉලක්කවල යම් කිසි වෙනසක් වුණොත් අප ඊළඟ වර්ෂයේ ඒ මුදල් නිකුත් කිරීම වෙනස් කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි මම අහන්නේ. මම ඒක දන්නවා. දැන් සියලුම රටවල වර්ධන වේගය අඩු කර ගෙන යන නිසා ලංකාවේ වර්ධන වේගය අඩුද, වැඩි කරනවාද කියන එක තමයි මා අහන්නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
සියයට හයක වර්ධන වේගයක් ලබන වසරේත් පවත්වා ගෙන යන්න බලාපොරොත්තු වනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එන අවුරුද්දේ සියයට හයක?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔව්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙන් එන අවුරුද්දෙන් කීයක් මේ අවුරුද්දට සපයා තිබෙනවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ලබන අවුරුද්දේ වර්ධන වේගය සහ අවධමනය එක්ක සපයන්නේ ලබන අවුරුද්දට මුදල් ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා දන්නේ නැහැ නේ. එන අවුරුද්දෙන් මේ අවුරුද්දට පාවිච්චි කරන්න පුළුවන්. ආණ්ඩුවට අවසරයක් තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අපට අවශ්‍ය වුණොත් පාවිච්චි කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකෙන් කොයි තරම් ප්‍රමාණයක් අරගෙන තිබෙනවාද කියන එක විතරයි මා අහන්නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අප මේ අවුරුදු දෙකම තුලනාත්මකවයි යන්නේ. අප 2007දී සියයට අටක ආර්ථික වර්ධනයක් ගැන හිතලා මුදල් නිකුත් කළා. අප එය 2008දී තුලනය කළා. ඒ වාගේම තමයි 2009 දීත්. තවම 2008 වර්ෂය සම්පූර්ණයෙන්ම නිම වෙලා නැහැ. යම් ප්‍රමාණයක් වැඩි වුණොත් අප එය තුලනය කරනවා. එය මහ බැංකුව හැම වර්ෂයකම කරනවා. ආණ්ඩුවට අවශ්‍ය විධියට මුදල් නිකුත් කිරීමක් මහ බැංකුව කරන්නේ නැහැ. ඔබතුමා මේ පුන පුනා ඉල්ලන්න් හදන්නේ ඒ පිළිතුර නේ. මහ බැංකුව හැම විටම මුදල්නිකුත් කරන්නේ මේ නිශ්චිත දත්තයනුත් සමඟයි ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට නිශ්චිත ඉලක්කයක් නැති නිසා නිශ්චිත දත්ත නැහැ.. මහ බැංකුවෙන් මේ අවුරුද්දේ රුපියල් කෝටි 9,000ක් පාවිච්චි කර තිබෙනවා. රජයේ වාණිජ බැංකු දෙකෙන්, ඒ කියන්නේ ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් රුපියල් කෝටි තුන්දහස් අටසියයක් අර ගෙන තිබෙනවා. එන අවුරුද්දට අදාළ දළ දේශීය නිෂ්පාදනයෙන් කොතරම් ප්‍රමාණයක් අර ගෙන තිබෙනවාද කියන ප්‍රශ්නයට පිළිතුර විතරයි ඉල්ලන්නේ. මා සෘජුව අහන්නේ එයයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මේ අවුරුද්දේ මුළු පාවිච්චිය කොහොමද කියන්නේ ? මේ අවුරුද්දේ තවත් මාස දෙකක් ගත කරන්න තිබෙනවා. ඒනිසා, - [බාධා කිරීමක් ]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි, බොහොම ස්තුතියි. ඒ ගැන අහලා වැඩක් නැහැ ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන් වන ප්‍රශ්නය අහනවා ගරු කතානායකතුමනි. මේ වගේ නියෝජ්‍ය මුදල් ඇමති කෙනෙකුට ඇවිල්ලා මේ වගේ උත්තර දෙන්න පුළුවන්ද ?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමා හැමදාම එකම ප්‍රශ්නය නේ අහන්නේ. ඔබතුමාගේ තිබෙන බංකොළොත්භාවය නේ පෙනෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන් වැනි ප්‍රශ්නය අහනවා ගරු කථානායකතුමනි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ඊයේ ඇහුවෙත් මේ ප්‍රශ්නයමයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට අහන්න ප්‍රශ්න නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි ප්‍රශ්නය

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
චමල් රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යාංශය භාර ගන්න.

## මහ බැංකුව: ප්‍රධාන කාර්යයන්
### மத்திய வங்கி : பிரதான செயற்பாடிகள்
CENTRAL BANK : MAIN FUNCTIONS

0087/'08

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) මහ බැංකුව දේශපාලන බලපෑම් වලින් තොරවූ ආයතනයක් ද?

(ii) අද දින වන විට රටේ මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද

(iii) එම ණය ප්‍රමාණයේ මුල් මුදල සහ පොලිය වෙන් වෙන් වශයෙන් සහ 1948, 1955, 1956, 1977, 2001, 2004 සහ 2007 වර්ෂ සඳහා ගෙවිය යුතුව තිබූ මුළු මුදල කොපමණ ද ;

යන්න එතුමා සඳහන්කරන්නෙහිද?

(ඇ) (i) රජය විසින් ගෙවීමට ඇති මුදල් පියවීම සඳහා මහ බැංකුව විසින් මුද්‍රණය කර වෙළෙඳ පොළට නිකුත් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණ ද ;

(ii) 1995 සිට අද දක්වා වූ සෑම වර්ෂයකදීම සැප්තැම්බර් මස 30 වැනි දින වන විට භාණ්ඩාගාර ගිණුමෙන් මහජන බැංකුවට සහ ලංකා බැංකුවට ගෙවීමට තිබූ මුදල් ප්‍රමාණය කොපමණ ද ;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

நிதி. திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா :

(அ) இலங்கை மத்திய வங்கியின் பிரதான செயற்பாடுகள் என்ன என்பதை அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) (i) மத்திய வங்கியானது அரசியல் தலையீடு அற்ற நிறுவனமா என்பதையும்,

(ii) நாட்டின் உள்நாட்டு மற்றும் வெளிநாட்டுக் கடன்களை இன்றுள்ளவாறு தனித்தனியாகவும்,

[ගරු රවි කරුණානායක මහතා]

(iii) முதல் மற்றும் வட்டி ஆகிய ஆக்கக்கூறுகளை தனித்தனியாகவும் மற்றும் 1948, 1955, 1956, 1977, 2001, 2004, 2007 ஆகிய ஆண்டுகளில் மொத்தமாக செலுத்தப்பட வேண்டிய தொகை எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(இ) (i) அரசாங்கத்தின் நிலுவைகளை செலுத்துவதற்கென மத்திய வங்கியினால் அச்சிடப்பட்டு சந்தைக்கு விடப்பட்ட பணத்தொகையின் அளவு எவ்வளவு என்பதையும்,

(ii) 1995 ஆம் ஆண்டு முதல் இன்றுவரை ஒவ்வொரு வருடமும் செத்தெம்பர் 30 ஆம் திகதியிலுள்ளவாறு மக்கள் வங்கிக்கும், இலங்கை வங்கிக்கும் திறைசேரியின் கணக்கிலுள்ள நிலுவை எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

0087/'08

asked the Minister of Finance and Planning, :

(*a*) Will he inform this House the main functions of the Central Bank?

(*b*) Will he state,—

(i) whether the Central Bank is a politically free institution;

(ii) the total local and foreign debt of the country as of today, separately; and

(iii) the capital and interest component separately, and the total payable for the years 1948, 1955, 1956, 1977, 2001, 2004 and 2007?

(*c*) Will he also state,—

(i) the amount of money been printed by the Central Bank and put into the market to meet the Government outstanding; and

(ii) the Treasury account outstanding with People's Bank and Bank of Ceylon from 1995 to-date as at 30th September of each year?

(*d*) If not, why?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)

ගරු කථානායකතුමනි, ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන්

(i) මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

(ii) ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය කිරීම

(iii) මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම

(iv) බැංකු මූල්‍ය සමාගම්, කල්බදු සමාගම් හා රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන්ට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය සැපයීම

(v) මහ බැංකුවේ පියවීම් ගිණුම් පවත්වා ගනිමින් මූල්‍ය ආයතන (වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන්ට) වෙත නිශ්කාෂණ සහ පියවීම් පහසුකම් සැපයීම

(vi) රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු හා රාජ්‍ය මූල්‍ය නියෝජිත ලෙස කටයුතු කිරීම

මීට අමතරව, මහ බැංකුව පහත සඳහන් නියෝජිත කාර්යයන් ද සිදු කරනු ලබයි.

(i) රාජ්‍ය ණය කළමනාකරණය.

(ii) විදේශ විනිමය පාලන කටයුතු කළමනාකරණය කිරීම.

(iii) ආධාර ලබාදෙන ආයතන හා රජය වෙනුවෙන් ක්ෂුද්‍ර මූල්‍ය හා සංවර්ධන ණය යෝජනා ක්‍රමයන්හි ප්‍රධාන නියෝජිත ලෙස කටයුතු කිරීම.

(iv) සේවක අර්ථසාධක අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීම.

(ආ) (i) ඔව්, ශ්‍රී ලංකා මහ බැං කුව, රාජ්‍ය තන්ත්‍රය තුළ ඇති අර්ධ වශයෙන් ස්වාධීන ආයතනයක් වන අතර එහි මුදල් මණ්ඩලයට මූල්‍යමය හා මෙහෙයුම් කටයුතු පිළිබඳ සම්පූර්ණ ස්වාධීනත්වය ඇත.

(ii) *2008 අගෝස්තු අවසානයට* *රුපියල් දශ ලක්ෂ*

| | |
|---|---|
| විදේශීය ණය | 1,385,036 |
| දේශීය ණය | 1,916,161 |

(iii) අදාළ තොරතුරු සංඛ්‍යා සටහන 1හි දක්වා ඇත.

සංඛ්‍යා සටහන 1
රජයේ ණය සේවාකරණ ගෙවීම්

රුපියල් දශලක්ෂ

| *වර්ෂය* | *වර්ෂය ගෙවීම්* | *පොලී ගෙවීම* | *මුළු ණය සේවාකරණ ගෙවීම්* |
|---|---|---|---|
| 1948 | ලැ. නො. | ලැ. නො. | 32 |
| 1955 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| 1956 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| 1977 | 947 | 947 | 1,894 |
| 2001 | 84,765 | 94,307 | 179,072 |
| 2004 | 180,781 | 119,783 | 300,564 |
| 2007 | 317,833 | 182,681 | 500,514 |

මූලය- ශ්‍රී ලංකා මහ බැංකුව

ලැ.නො.- ලැබී නොමැත

(ඇ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව, රජයේ ණය පියවීමේ අවශ්‍යතාව සඳහා මුදල් මුද්‍රණය නොකරයි. මුදල්, එනම් ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි, මහ බැංකුව විසින් නිකුත් කරන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකු අවශ්‍යතාවන් සපුරාලීමට වන අතර, බැංකු විසින් මෙම මුදල් නෝට්ටු හා කාසි සඳහා ඉල්ලුම් කරනුයේ සිය ගනු දෙනුකරුවන්ගේ මුදල් අවශ්‍යතාවන් සපුරාලීම සඳහාය.

(ii) අදාළ තොරතුරු සංඛ්‍යා සටහන 2 හි දක්වා ඇත.

**සංඛ්‍යා සටහන 2- භාණ්ඩාගාර ගිණුමෙන් රාජ්‍ය බැංකු වෙත නොගෙවා ඇති ණය ප්‍රමාණය (සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 30 වන දිනට)**

රුපියල් දශ ලක්ෂ

| *වර්ෂය* | *ලංකා බැංකුව* | *මහජන බැංකුව* | *එකතුව* |
|---|---|---|---|
| 1995 | | | 454.2 |
| 1996 | 1.6 | 32.2 | 33.8 |
| 1997 | 1,577.0 | 11.3 | 1,588.3 |
| 1998 | 1,641.9 | 438.2 | 2080.1 |
| 1999 | 1,174.4 | 3,658.0 | 4832.4 |
| 2000 | 10,834.3 | 2,7311.9 | 13,566.2 |
| 2001 | 10,991.4 | 14,501.3 | 25,492.7 |
| 2002 | 888.5 | 4,675.3 | 5563.8 |
| 2003 | 0.3 | 610.5 | 610.8 |
| 2004 | 0.8 | 859.0 | 859.8 |
| 2005 | 4,533.0 | 6,179.7 | 10,712.7 |
| 2006 | 2,388.5 | 9,129.7 | 11,517.8 |
| 2007 | 18,115.4 | 5,552.1 | 23,667.5 |
| 2008 | 29,084.8 | 13,469.8 | 42,554.6 |

මූලයන් : ලංකා බැංකුව හා මහජන බැංකුව

(ඈ) පැන නොනඟී

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ පළමුවන අතුරු ප්‍රශ්නය නොවෙයි, ගරු කථානායකතුමනි. මෙකේ (ආ) (iii) යටතේ 2004 සහ 2007 අවුරුද්දේ අග වන විට ණය බරතාව කොපමණද කියා වාර්තා කරන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
ඔබතුමා අහන්නේ බැංකු අයිරාවද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, the capital and interest component ඒ කියන්නේ සම්පූර්ණ ණය ප්‍රමාණය සහ පොලී ප්‍රමාණයයි; ණය බරතාවයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
ණය වාරික ගෙවීම 2004 දී රුපියල් මිලියන 180, 781යි; 2007 දී රුපියල් මිලියන 317,833යි. පොලිය 2004 දී රුපියල් මිලියන 119,783යි; 2007 දී 182,681යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
(ඇ) (i) හා (ii) පිළිතුර කිව්වේ නැහැ නේද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
කිව්වා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පළමු වන අතුරු ප්‍රශ්නය මා අහනවා. මහ බැංකුවේ කාර්ය භාරය වශයෙන් ප්‍රධාන කරුණු පහකුත්, අතුරු කරුණු හතරකුත් පෙන්වූවා. ඒකේ එක කරුණක් තමයි, ණය බරතාව සම්බන්ධයෙන් රජය වෙනුවෙන් කටයුතු කිරීම. මෙක සම්පූර්ණයෙන් අසාර්ථක වෙලා තිබෙනවාය කියන එක ඇමතිතුමා පිළිගන්නේ නැද්ද? 2004 රුපියල් කෝටි 178,000ක් තිබුණු එක, අවුරුදු තුනකින් රුපියල් කෝටි 3,41,000 දක්වා සියයට සියයකින් වැඩි වෙලා තිබෙනවා. එවැනි කඩා වැටීමක් තිබෙනවා. නිදහස ලබපු දවසේ ඉඳන් 2007 වනකම් ගන්න පුළුවන් සම්පූර්ණ ණය බරතාව කෝටි 178,000 නම් අවුරුදු තුනකින් මේක සියයට සියයක් වැඩි වෙන්න ඉඩ දෙන්නේ කොහොමද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතා සාවද්‍ය කරුණක්. මේක අපි පුන පුනා මේ සභාවට පැහැදිලි කරනවා. ගරු කථානායකතුමනි, ණය ගැනීම කියන්නේ හැම වෙලාවකම නිරපේක්ෂව සලකා බැලිය යුතු කරුණක් නොවෙයි. සාපේක්ෂවයි ඒක සලකා බැලිය යුත්තේ. රටේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂවයි රටක ණය ගැන අප සලකා බැලිය යුත්තේ. පුද්ගලයකු වශයෙන් බැලුවත් ඔහුගේ එදිනෙදා පවතින වත්කම් ප්‍රමාණය අනුවයි ඔහුගේ එදා පවතින ණය ගැන අපි සලකා බැලිය යුත්තේ. ඒ අනුව මෙතුමන්ලා 2004 දී අපට රජය බාර දෙන කොට මේ රටේදළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 105ක් ණයයි. අද අපි යුද්ධයත් කරලා, මේ රටේ සංවර්ධනයත් කරලා, සුබසාධනයත් කරලා සියයට 85යි දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය තිබෙන්නේ. ඒ නිසා අපි රටක් හැටියට ඉතාමත් හොඳින් ණය කළමනාකරණය කරලා තිබෙනවා. නම් වශයෙන් මා සඳහන් කරන්නේ නැහැ, අද ලෝකයේ දියුනු රටවල් 5ක් 6ක් ණය ගෙවා ගන්න බැරුව හිර වෙලා ඉන්න අවස්ථාවක අපි මේ අභියෝගත් එක්ක මේ ගමන යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, බොහොම ස්තුතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි නිරපේක්ෂයි, සාපේක්ෂයි කිව්වාට සිම්බාබ්වේ රටත් සියයට දාහක විතර උද්ධමනයක් තියා ගෙන ඔය කතාවම කිය කියා ඉන්නවා. අද අපි එකක් කියනවා. අවුරුදු තුනක් ඇතුළත ණයබරතාව සියයට සියයකින් වැඩි වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව පිළි අරගෙන තිබෙනවා යම් දේවල් පැත්තකට දමලා උද්ධමනය සියයට 30 ඉඳලා සියයට 24ට 25ට අඩු කරලා පෙන්වා තිබෙන බව. වැඩ කරන ඔබේත්, අපේත් EPF, ETF සල්ලි පාවිච්චි කරලා සියයට 10 පොලියක් තමයි ගෙවන්නේ. සෘණ ලැබීමක් negative return එකක්- තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් මහ බැංකුව මොනවාද කරන්නේ? මේවා කාගේවත් සල්ලි නොවෙයි ජනතාවගේ සල්ලි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
මහ බැංකුව හැම දාමත් නිශ්චිත පොලී අනුපාතයක් පවත්වා ගෙන යනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා අද ETF එක ගැන බොහොම කනගාටුවෙන් කතා කරනවා. නමුත් ඔබතුමන්ලාගේ කාලයේදී ETF එකත් පෞද්ගලීකරණය කරන්නයි සූදානම් වුණේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තමන් නොදන්නා දේවල් ගැන උදේ පාන්දර මේ පාර්ලිමේන්තුවේදී අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
මේක සාමාන්‍යයෙන් මෙතුමා සුපුරුදු පරිදි කරන විවේචනයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැම එකම එක්සත් ජාතික පක්ෂය, - [බාධා කිරීමක්] කරුණාකරලා ආණ්ඩුවෙන් ඉවත් වෙන්න. අපි පෙන්වන්නම් කොහොමද කරන්නේ කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
රජය වග කීමෙන් මේ කාරණාව ඉෂ්ට කරනවා, ගරු කථානායකතුමනි, ලෝක පොලී අනුපාතයනුත් සමඟ

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැම එකම යූඑන්පී එකට. ලෝකයේ කොහේ හරි පොල් ගෙඩියක් වැටුණත් යූඑන්පී එකට.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අද ඔබතුමන්ලා නිකම් ළිං මැඩි ප්‍රශ්න අහන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි අපි ළිඳේ ඉන්න ගෙම්බො තමයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ලෝකයේ ඇති වෙලා තිබෙන සියලු තත්ත්වයනුත් එක්ක මේ විධියේ මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගෙන යනවාය කියන එක මම වග කීමෙන් කියනවා. ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි ළිඳේ ඉන්න ගෙම්බොලු. මේ ගොල්ලන් කිඹුල් පැටව්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
4 වැනි ප්‍රශ්නය - ගරු රණවීර පතිරණ මහතා, එතුමා නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන් වැනි අතුරු ප්‍රශ්නය අහනවා. එහෙම ලෙහෙසියෙන් මහ හැරලා යන්න දෙන්න බැහැ. ආර්ථිකය කඩා වැටිලා. මේ ආණ්ඩුව කඩා ගෙන වට්ටන්නේ කොහොමද කියලා පෙන්වන්න අපට වග කීමක් තිබෙනවා. මහ බැංකුව තමයි, ෆවුසි ඇමතිතුමාට [බාධා කිරීමක්] මහ බැංකුව තමයි අනුබල දීලා තිබෙන්නේ. ඊයේ කෝප් කමිටුවට ආපු අසන්ත ද මෙල් මහත්මයා කියලා තිබෙනවා. යූඑස් ඩොලර්ස් මිලියන 350ක අලාභයක් ලබා තිබෙනවා කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ඒක මේ ප්‍රශ්නයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා වෙනම අහනවා නම් මම සූදානම් උත්තර දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. මහ බැංකුවේ වගකීම. මේක පැහැර හරින්න බැහැ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මහ බැංකුවේ සියල්ලටම උත්තර දෙන්න මෙතැන බැහැ. ඔබතුමා අහලා තිබෙන්නේ වෙනත් කාරණාවක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාම කිව්වා මහ බැංකුවේ කටයුතු මොනවාද කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මහ බැංකුවේ සියල්ලටම උත්තර දෙන්න මම මේ අවස්ථාවේ - [බාධා කිරීමක්] ඒක කෝප් එකේ සාකච්ඡා වන කාරණයක් ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේකට කෝප් එක ඕනෑ නැහැ. කෝප් එක පැත්තක තියන්න කෝ [බාධා කිරීම්] කෝප් එක කිව්වාම බය වුණා. කෝප් එක ඕනෑ නැහැ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අහන්න ප්‍රශ්නයක් නැතුව අසරණ වෙලා. මොකක් හරි ප්‍රශ්නයක් අහන්න තමයි දැන් සූදානම. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හෙජින් සම්බන්ධයෙන් මහ බැංකුව, - [බාධා කිරීමක්] යූඑස් ඩොලර්ස් මිලියන -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා උත්තර දෙන්නේ නැහැ ඒකට [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා බොහොම ඕනෑකමින් ප්‍රශ්නය ඇහුවා. ඩොලර් මිලියන 350ක් මහ බැංකුවෙන් වෙන් කර තිබෙනවා. ඒවාට වග කියන්නේ කවුද? මුදල් ඇමතිද? නියෝජ්‍ය මුදල් ඇමති ද? ලේකම් ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න සියල්ලටම තව මිනිත්තු 10යි තිබෙන්නේ. [බාධා කිරීමක්] අදාළ වන්නේ නැහැ කියා එතුමා පිළිතුරු දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ නැති වන්නේ කොහොමද?

## බලවේග පේෂකර්ම සේවකයෝ : විශ්‍රාම වැටුප් හිමිකම

### மின்தறி நெசவுத் தொழில் ஊழியர்கள் : ஓய்வூதிய உரித்து

POWERLOOM TEXTILE EMPLOYEES : PENSION RIGHTS

0303/'08

7. **ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිස්ස අත්තනායක මහතා විසින් 1999 වසරේදී අසන ලද ප්‍රශ්නයකට එවකට පේෂකර්ම අමාත්‍යවරයා විසින් දෙන ලද පිළිතුරෙහි, ගාල්ල හා අනුරාධපුරය හැර සෙසු බලවේග පේෂකර්ම ව්‍යාපාර දහයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් හිමිකම නැතැයි සඳහන් කොට තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2003 වසර දක්වාම විශ්‍රාම වැටුප් හිමිකම නැතැයි සැලකූ බලවේග පේෂකර්ම සේවකයන් 800 කට 2003.01.01 දින සිට විශ්‍රාම වැටුප් හිමිකම ලැබුණු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) නීතිපතිතුමාගේ අංක ඊ 423/2002 දරන 2003.02.07 දිනැති ලිපියෙන් දස වසරක සේවා කාලය නැති බලවේග පේෂකර්ම සේවකයන් කිසිවෙකු විශ්‍රාම නොගන්වන ලෙස පේෂකර්ම අධ්‍යක්ෂිකාවට උපදෙස් දී තිබුණේද;

(ii) ඉතිරි සේවකයන්ද විශ්‍රාම ගැන්වීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/IV/2/1/66 දරන 2003.03.10 දිනැති උපදෙස් සහ, සමාංක දරන 2003.05.19 දිනැති ලිපිය උපයෝගී කර නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) ගාල්ල හා අනුරාධපුර පේෂකර්ම ව්‍යාපාරවල දස වසරක සේවය නොතිබූ අය විශ්‍රාම ගැන්වූ ආකාරයට ලේවැල්ල, පොල්ගොල්ල ඇතුළු අනෙකුත් බලවේග ව්‍යාපාර දහයෙහි සේවකයන්ද විශ්‍රාම නොගැන්වීමෙන් උල්ලංඝනය වූ හිමිකම් යළි ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

கைத்தொழில் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) பாராளுமன்ற உறுப்பினர் கௌரவ திஸ்ஸ அத்தநாயக்க வினால் 1999 ஆம் ஆண்டில் கேட்கப்பட்ட ஒரு கேள்விக்கு அப்போதைய நெசவுத் தொழில் அமைச்சரால் வழங்கப் பட்ட பதிலில், காலி மற்றும் அநுராதபுரத்தைத் தவிர ஏனைய பத்து மின்தறி நெசவுத்தொழில் முயற்சிகளின் ஊழியர்களுக்கு ஓய்வூதிய உரித்துக்கிடையாதென குறிப் பிடப்பட்டுள்ளதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப் பாரா?

(ஆ) 2003 ஆம் ஆண்டு வரை ஓய்வூதிய உரித்துக் கிடையாதெனக் கருதப்பட்ட மின்தறி நெசவுத்தொழில் ஊழியர்கள் 800 பேருக்கு 2003.01.01 ஆம் திகதி யிலிருந்து ஓய்வூதிய உரித்துக்கிடைத்ததென்பதை அவர் அறிவாரா?

(இ) (i) சட்டமா அதிபரின் இலக்கம் ஈ 423/2002 மற்றும் 2003.02.07 ஆம் திகதிய கடிதத்தின் மூலம் பத்து வருட சேவைக்காலத்தை கொண்டிராத மின்தறி நெசவுத் தொழில் ஊழியர்கள் எவரையும் ஓய்வுபெறச் செய்ய வேண்டாமென நெசவுத்தொழில் பணிப்பாளருக்கு அறிவுரை வழங்கப்பட்டிருந்ததா,

(ii) எஞ்சியுள்ள ஊழியர்களை ஓய்வுபெறச் செய்வதற்கு தாபனப் பணிப்பாளர் நாயகத்தின் ஆ/iv/2/1/66 ஆம் இலக்க, 2003.03.10 ஆம் திகதிய அறிவுரைகள் மற்றும் அதே இலக்கத்தைக் கொண்ட 2003.05.19 ஆம் திகதிய கடிதத்தைப் பயன்படுத்தாதிருப்பதற்கான காரணம் யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) காலி மற்றும் அநுராதபுர நெசவுத்தொழில் முயற்சிகளில் பத்துவருட சேவைக் காலத்தைக் கொண்டிராதவர்களை ஓய்வுபெறச் செய்வதைப் போன்று லேவெல்ல, பொல் கொல்ல உட்பட ஏனைய பத்து மின்தறி நெசவுத்தொழில் துறைகளின் ஊழியர்களை ஓய்வுபெறச் செய்யாததன் மூலம் மீறப்பட்டுள்ள, உரிமைகளை மீண்டும் பெற்றுக் கொடுப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Industrial Development, :

(*a*) Will he inform this House, whether it has been mentioned in the answer given by the then Minister of Textiles in response to a question asked by Hon. Tissa Attanayake, M.P. in 1999 that the employees of the ten power loom textile industries except for such industries at Galle and Anuradhapura are not entitled to pension rights?

(*b*) Is he aware that 800 employees of the powerloom textile sector who were treated as persons who did not have pension rights up to the year 2003, received pension rights from 01.01.2003?

(*c*) Will he submit to this House,—

(i) whether Directress (textiles), had been advised to the effect that any employee in the powerloom textile industry who has not completed 10 years service should not be sent on retirement by the letter of the Attorney General bearing No. E 423/2002 and dated 07.02.2003; and

(ii) the reasons for not making use of the directive bearing No. ආ/iv/2/1/66 and dated 10.03.2003 and the letter bearing the same number and dated 19.05.2003 issued by the Director General Establishments for sending the remaining employees on retirement?

(*d*) Will he take necessary steps to grant the employees of the ten powerloom textile industries including Lewella and Polgolla with the entitlements that were violated by not sending them on retirement in the same way in which the persons who had not completed ten years service at Galle and Anuradhapura textile industries were sent on retirement?

(*e*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சர்ரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Urban Development and Sacred Area Development and Chief Government Whip)

ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් තමයි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් දීලා තිබෙනවා. කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) නැත.

(ආ) ඔව්.
පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව තිබූ බලවේග ව්‍යාපාරවල සේවය කරන ලද යන්ත්‍ර සේවිකා සහ කැඳ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට පත් කර ඇත්තේ 1984 වර්ෂයේ සිට වේ. එම තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට පත් කිරීමට පෙර, එනම් 1980-82 කාලය තුළ පෞද්ගලික අංශයට විකුණන ලද බලවේග ව්‍යාපාරවල එම තනතුරුවල වසර 10කට වඩා වැඩි කාලයක් සේවය කරන ලද යන්ත්‍ර සේවිකාවියන්ට සහ කැඳ යන්ත්‍ර ක්‍රියාකරුවන්ටද, නීතිපතිගේ 2003.02.07 දිනැති ලිපියේ උපදෙස් පරිදි හා ව්‍යාපාර සංවර්ධන, කර්මාන්ත ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන

ගරු අමාත්‍යතුමාගේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක : 04/0040/108/003 හා 2004.01.12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2004 මාර්තු 24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළැඹි තීරණය අනුව එකී තනතුරුවල අවම වශයෙන් වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිණි නම් 2003.01.01 දින සිට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව 800කට ආසන්න සංඛ්‍යාවකට විශ්‍රාම වැටුප් ලබා දී ඇත.

(ඈ) (i) නීතිපතිතුමාගේ අංක ඊ 423/2002 දරන 2003.02.07 දිනැති ලිපියේ එවැනි උපදෙසක් ලබා දී නොමැත.

(ii) මෙම අයට විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා වරින් වර අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර ඇති අතර ඒවා ප්‍රතික්ෂේප වී ඇත.

(ඇ) ගාල්ල සහ අනුරාධපුර පේෂකර්ම ව්‍යාපාරවල දස වසරක සේවා කාලය නොතිබූ අය විශ්‍රාම ගැන්වූ ආකාරයට 1980-82 කාලය තුළ විකුණන ලද ආයතනවල සේවකයින් විශ්‍රාම ගැන්වීම පිළිබඳ ඇති වූ නීතිමය බාධා සහ ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ප්‍රතික්ෂේප වීම හේතුවෙන් එම විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීමට මේ වන තෙක් ගත් උත්සාහයන් ව්‍යර්ථ වී ඇත.

(ඉ) අදාළ නොවේ.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ඇමතිතුමනි, (ආ) කොටසට පිළිතුර කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එය දීර්ඝ පිළිතුරක්. ඔබතුමාට ඕනෑ නම් මම පිළිතුර කියවන්නම්.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
කියවන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
(ආ) ඔව්.

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව තිබූ බලවේග ව්‍යාපාරවල සේවය කරන ලද යන්ත්‍ර සේවිකා සහ කෑඳ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට පත් කර ඇත්තේ 1984 වර්ෂයේ සිට වේ. එම තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට පත් කිරීමට පෙර, එනම් 1980-82 කාලය තුළ පෞද්ගලික අංශයට විකුණන ලද බලවේග ව්‍යාපාරවල එම තනතුරුවල වසර 10කට වඩා වැඩි කාලයක් සේවය කරන ලද යන්ත්‍ර සේවිකාවියන්ට සහ කෑඳ යන්ත්‍ර ක්‍රියාකරුවන්ටද, නීතිපතිගේ 2003.02.07 දිනැති ලිපියේ උපදෙස් පරිදි හා ව්‍යාපාර සංවර්ධන, කර්මාන්ත ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන ගරු අමාත්‍යතුමාගේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක : 04/0040/108/003 හා 2004.01.12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2004 මාර්තු 24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළැඹි තීරණය අනුව එකී තනතුරුවල අවම වශයෙන් වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිණි නම් 2003.01.01 දින සිට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව 800කට ආසන්න සංඛ්‍යාවකට විශ්‍රාම වැටුප් ලබා දී ඇත.

නොලැබුණු කෙනකු ඉන්නවා නම් ඔබතුමා විස්තර ඉදිරිපත් කරන්න.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
හොඳයි.

## වලස්මුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය : අඳ ගොවීන් සහ කුඹුරු

### வலஸ்முல்ல கமநல சேவை நிலைய அதிகாரப்பிரதேசம் : குத்தகை விவராயிகள் மற்றும் வயல்கள்

### WALASMULLA AGRARIAN SERVICE CENTRE AREA : TENANT FARMERS AND PADDY LANDS

0472/'08

9. **ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටී නම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මිය යාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටලු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටලු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

கமத்தொழில் அபிவிருத்தி, கமநல சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) 2007 ஆம் ஆண்டு திசெம்பர் 31 ஆம் திகதியன்று உள்ளவாறு அம்பாந்தோட்டை மாவட்டத்தில் வலஸ்முல்ல கமநல சேவை நிலைய அதிகார பிரதேசத்தில் உள்ள வயல்களின் அளவு எத்தனை ஏக்கர்,

(ii) அவற்றிற்கிடையில் பெரிய நீர்ப்பாசனம், சிறிய நீர்ப்பாசனம், மானாவாரி என்றவகையில் பாசனம் பெறும் நிலத்தின் அளவு வெவ்வேறாக எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2007 ஆம் ஆண்டு திசெம்பர் 31 ஆம் திகதியன்று உள்ளவாறு சம்பந்தப்பட்ட அதிகார பிரதேசத்தில் கமத்தொழில் செய்கின்ற குத்தகை விவசாயிகளின் எண்ணிக்கையும் பயிர் செய்யப்படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு,

(ii) காணி உரிமையுடைய விவசாயிகளின் எண்ணிக்கையும், பயிர் செய்யப் படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு,

(iii) அது தவிர வேறு விவசாயிகள் இருப்பின் அவ்விவசாயிகளின் எண்ணிக் கையும் பயிர் செய்யப்படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(இ) (i) 2000 ஆம் ஆண்டின் கமநல அபிவிருத்திச் சட்டம் நடைமுறைப்படுத்தப்பட்டதன் பின்னர் 2007.12.31 வரையிலான காலப்பகுதியில் குத்தகை விவசாயி இறந்து போனதன் காரணமாக காணி உரிமையாளருக்கும் பின்னுரிமையாளருக்கும் இடையில் தோன்றியுள்ள பிணக்குகளின் எண்ணிக்கை எவ்வளவு,

(ii) கமநல சேவை உதவி ஆணையாளருக்கு சம்பந்தப்பட்ட அதிகாரப் பிரதேசத்திலிருந்து அறிவிக்கப்பட்டுள்ள குத்தகை விவசாயிகளின் பிணக்குகளின் எண்ணிக்கை எவ்வளவு,

(iii) குத்தகை விவசாய உரிமை பெற்ற பின்னுரிமையாளர்களின் எண்ணிக்கை எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agricultural Development and Agrarian Services:

(*a*) Will he inform this House,—

(i) the number of acres of paddy lands in the Walasmulla Agrarian Service Centre area in the Hambantota District as at 31.12.2007; and

(ii) separately, the extent of land identified as falling into the categories of major irrigated, minor irrigated and rain fed, out of the number of acres of paddy lands mentioned in the answer for (a) (i) above?

(*b*) Will he submit to this House,—

(i) the number of tenant farmers engaged in paddy farming in the relevant area as at 31.12.2007 and the number of acres of paddy lands cultivated by them;

(ii) the number of farmers who have their own paddy lands and the number of acres of paddy lands cultivated by them; and

(iii) if there are any other types of farmers other than the two types of farmers mentioned above, their number and the number of acres of paddy lands cultivated by them?

(*c*) Will he state,—

(i) the number of disputes that have arisen between the land owner and the successor owing to the death of the tenant farmer during the period up to 31.12.2007, since implementation of the Agrarian Development Act in the year 2000;

(ii) the number of disputes of tenant farmers that have been reported to the Assistant Commissioner of Agrarian Services from the relevant area; and

(iii) the number of successors who have been accorded the rights of tenant farmers?

(*d*) If not, why?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - கமத்தொழில் அபிவிருத்தி, கமநல சேவைகள் அமைச்சர் )
(The Hon. Maithripala Sirisena - Minister of Agricultural Development and Agrarian Services)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) 2007.12.31 දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය - 2,937කි.

(ii) මහ වාරි මාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය - 892
සුළු වාරි මාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය - 1,080
වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය - 965

(ආ) (i) කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන් සංඛ්‍යාව - 1,482
වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය - 1,255

(ii) ඉඩම් හිමි ගොවීන් සංඛ්‍යාව - 2,490
වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය - 1,682

(iii) වෙනත් ගොවීන් සංඛ්‍යාව - නැත
වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය - නැත

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මිය යාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර ගැටලු පැන නැඟී නැත.

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත වාර්තා වී ඇති අඳ ගොවි ගැටලු සංඛ්‍යාව - 06කි.

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් නැත.

(ඈ) අදාළ නොවේ.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

ගරු ඇමතිතුමනි, නව වන ප්‍රශ්නයේ (ඇ) (iii) කොටසට පමණක් පිළිතුර කියවන්න.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

අඳ ගොවි අයිතිවාසිකම් පිළිබඳවද?

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

ඔව්. අනුප්‍රාප්තිකයන් ගණන.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

"අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් නැත." කියලායි තිබෙන්නේ. ඔබතුමා මට කලින් දන්වා තිබූ ප්‍රශ්නය ගැන ඔබතුමාගේ ඉල්ලීම අනුව සොයා බලා මම කටයුතු කරනවා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
මම ඔබතුමාට කිව්වේ උනාව, ගෝනගමුව, තිස්සමහාරාම, අන්දරවීර ආරච්චිගේ ප්‍රේමරත්න ගැනයි. ඒකේ තිබෙන්නේ, වී වගා ණය කපා හැරීම,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකේ විස්තරය හරි. නම කිව්වා, ඇමතිතුමා දන්නවා. නැවත ඒ විස්තරයම කිය කියා ඉන්නේ මොකටද? දැන් අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
ගරු කථානායකතුමනි, මේ ලියවිල්ලක් තිබෙනවා,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, ඇමතිතුමා පිළිගත්තා. එතුමා ඒක දන්නවා කිව්වා. ඉතින් ආයෙත් - [බාධා කිරීමක්]

## ප්‍රීමා ආයතනයට ලබා දුන් තිරිඟු පිටි සහනාධාර : විස්තර
### பிறிமா நிறுவனத்துக்கு வழங்கப்பட்ட கோதுமை மானியம் : விபரம்
WHEAT FLOUR SUBSIDY TO PRIMA COMPANY : DETAILS

0525/'08

10. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ප්‍රීමා ආයතනය වෙත තිරිඟු පිටි සඳහා රජය විසින් සහනාධාරයක් ලබා දී තිබේද;

(ii) එසේ නම් පිටි කිලෝග්‍රෑමයක් සඳහා අදාළ සහනාධාරය කොපමණද;

(iii) එම සහනාධාරය ලබාදීමට කටයුතු කළේ කවදා සිටද;

(iv) එය අත් හිටු වූයේ කවදාද;

(v) එම කාලය තුළ එක් එක් වර්ෂය සඳහා සහනාධාර ලෙස ලබා දෙන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් වර්ෂය සඳහා නියමිත සහනාධාර මුදල්, ප්‍රීමා සමාගම වෙත ලබා දෙන ලද දිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) பிறிமா நிறுவனத்திற்கு கோதுமை மாவின் பொருட்டு அரசாங்கத்தினால் மானியம் வழங்கப்பட்டுள்ளதா,

(ii) ஆமெனில், ஒரு கிலோ மாவிற்கான மானியத்தொகை எவ்வளவு,

(iii) மேற்படி மானியத்தை வழங்குவதற்கு எப்போதிருந்து நடவடிக்கை எடுக்கப்பட்டது,

(iv) இது எப்போது நிறுத்தப்பட்டது,

(v) மேற்படி காலத்தினுள் ஒவ்வொரு ஆண்டின் பொருட்டும் மானியமாக வழங்கப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி ஒவ்வொரு ஆண்டிற்குமான மானியத் தொகைகள் பிறிமா கம்பனிக்கு வழங்கப்பட்ட திகதிகள் யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning,:

(*a*) Will he inform this House,—

(i) whether Prima Company has been granted any subsidy for wheat flour by the Government;

(ii) if so, the subsidy granted for one kilogram of wheat flour;

(iii) the date from which arrangements were made to grant the aforesaid subsidy;

(iv) the date on which it was suspended; and

(v) separately, the amount of money given as subsidy in each year during that period?

(*b*) Will he submit to this House the dates on which due subsidy was made available to Prima Company in relation to each year?

(*c*) If not, why?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ප්‍රීමා ආයතනය වෙත තිරිඟු පිටි සඳහා රජය විසින් සහනාධාරයක් ලබා දී තිබිණි.

(ii) පිටි කිලෝ ග්‍රෑමයක් සඳහා අදාළ සහනාධාරය පහත දක්වා ඇත.

වගුව 1 : පිටි කිලෝග්‍රෑමයක් සඳහා අදාළ සහනාධාරය

| වසර | දිනය | කිලෝග්‍රෑමයක් සඳහා සහනාධාරය (රු.) |
|---|---|---|
| 2001 | 2001.08.20 | 5.09 |
| | 2001.10.13 | 4.94 |
| | 2001.12.27 | 1.94 |
| 2002 | 2002.01.01 | 1.94 |
| | 2002.02.21 | - |
| | 2002.07.06 | 1.50 |
| | 2002.11.01 | - |
| 2003 | 2003.01.01 | - |
| | 2003.12.31 | - |
| 2004 | 2004.01.01 | 3.50 |
| 2005 | 2005.01.01 | 7.50 |
| | 2005.03.01 | - |

2005.03.01 දින සිට තිරිඟු පිටි සහනාධාරය නවතා ඇත.

(iii) 2001.08.20 දින සිට.

(iv) 2005.03.01 දින සිට අදාළ සහනාධාරය අත් හිටුවන ලදී.

(v) අදාළ කාල තුළ එක් එක් වර්ෂය සඳහා සහනාධාර ලෙස ලබා දෙන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් පහත දක්වා ඇත.

වගුව 2 : තිරිඟු පිටි සහනාධාර ගෙවීම්

| *වසර* | *දිනය* | *ගෙවන ලද සහනාධාරය (රු.)* | *එක් එක් වසර ඇතුළත ගෙවන ලද මුළු සහනාධාරය (රු.)* |
|---|---|---|---|
| 2001 | 2001.09.03 | 355,486,950 | |
| | 2001.10.10 | 706,185,605 | - |
| 2001 මුළු එකතුව | | | 1,061,672,555 |
| 2002 | 2002.10.10 | 236,232,847 | |
| 2002 මුළු එකතුව | | | 236,232,847 |
| | - | - | - |
| 2004 | 2004.03.09 | 330,098.750 | |
| | 2004.03.31 | 50,000,000 | |
| | 2004.04.23 | 100,000,000 | - |
| | 2004.04.30 | 96,831,705 | - |
| 2004 මුළු එකතුව | | | 576,930,455 |
| 2006 | 2006.02.15 | 500,000,000 | |
| 2006 මුළු එකතුව | | | 500,000,000 |
| 2008 | 2008.05.02 | 1,000,000,000 | |
| * 2008 මුළු එකතුව | | | 1,000,000,000 |

ජීවන වියදම අඩු කර මහජනතාවට සහනයක් සැලසීමේ අවශ්‍යතාව සැළකිල්ලට ගනිමින්, රජය හා ප්‍රීමා සමාගම අතර එළඹුණු ගිවිසුමේ සඳහන් මිල සූත්‍රයේ ආකාරයට 2004 ජනවාරි මස තීරණය වූ මිල සහ එවකට වෙළඳපොළ මිල අතර වෙනස වූ පිටි කිලෝවකට රු. 3.50ක සහනාධාරයක් ලෙස ගෙවීමට රජය එකඟ විය. එහෙත් තිරිඟු පිටි සඳහා ජාත්‍යන්තර මිල ගණන් වල වෙනස්වීම් අනුව තිරිඟු පිටි සඳහා වැඩි අගයක් ලබා දිය යුතු බවත්, ඒ අනුව සහනාධාරය පිටි කිලෝවකට රු. 3.50 නොව රු. 7.50ක් විය යුතු බවත් ප්‍රීමා සමාගම 2004 අප්‍රේල් මස දන්වන ලදී. රජය මෙම අගය පිළි නොගත් බැවින් නිලධාරී මට්ටමින්, අමාත්‍යවරුන්ගේ මට්ටමින් සහ එවකට කැබිනට් අමාත්‍ය ධූර හෙබ වූ ලක්ෂ්මන් කදිර්ගාමර්, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ සරත් අමුණුගම යන ගරු අමාත්‍යවරුන්ගෙන් සමන්විත කැබිනට් අනුකමිටු මට්ටමින් සාකච්ඡා වට කිහිපයක් ප්‍රීමා සමාගම හා රජයේ නියෝජිතයන් අතර පැවැත් වූ නමුදු එකඟතාවකට එළඹීමට නොහැකි විය. ගිවිසුමේ සඳහන් ආකාරයට 2004 සහනාධාරය සම්බන්ධව බේරුම්කාර මණ්ඩලයකට ප්‍රීමා සමාගම තම ප්‍රශ්නය ඉදිරිපත් කරන ලදී. එම මණ්ඩලයේ අතුරු නියෝගයකට අනුව රජය විසින් පිළිගන්නා ලද පිටි කිලෝවකට රුපියල් 3.50 බැගින් සහනාධාරය පදනම් කර ගෙන ගෙවීම් කරන ලෙස 2008 ජනවාරි මස දී දන්වා ඇත. ඒ අනුව 2004 අදාළ සහනාධාරයේ කොටසක් ලෙස රුපියල් මිලයන 1,000ක් 2008 මැයි මස ගෙවන ලදී. 2004 පෙබරවාරි සිට 2005 පෙබරවාරි දක්වා පිටි සහනාධාරය ලෙස තවත් රුපියල් බිලියන 1.8ක් ගෙවීමට ඇත.

(ආ) එම එක් එක් වර්ෂය සඳහා නියමිත සහනාධාර මුදල්, ප්‍රීමා සමාගම වෙත ලබා දෙන ලද දිනයන්, ඉහත වගුව 2හි දෙ වන තීරයේ දක්වා ඇත.

(ඇ) අදාළ නැත.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට සහනාධාරය ඉවත් කළේ කවදාද? ගරු ඇමතිතුමා?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya
සහනාධාරය ඉවත් කළේ 2005.03.01 වන දින සිටයි. ගරු මන්ත්‍රීතුමනි, මේ ගෙවන්න තිබුණු මුදල් පමණයි. ඉන් පස්සේ අපි ශතයක්වත් ගෙවලා නැහැ. අපිට හිඟයක් ගෙවන්න තිබුණා. මේ ගෙවා තිබෙනනේ ඒ හිඟ මුදල. නැතිව 2005.03.01 දිනෙන් පස්සේ අපි ශතයක්වත් ඔවුන්ට සහනාධාර දුන්නේ නැහැ. [බාධා කිරීමක්] ප්‍රීමා එක ගැන උනන්දු වන මන්ත්‍රීවරයකු කෑ ගහනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හිඟ මුදල කොහොමද ඔබතුමා ලබා දී තිබෙන්නේ? මට නැවත කියන්න. තවත් කෝටි 50ක් දීලා තිබෙනවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya
කෝටි 50ක් 2006 දී ලබා දී තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
2006 දී ප්‍රීමා ආයතනයට එතෙක් ලබා දිය යුතුව තිබුණු සහනාධාරයෙන් කෝටි 50ක් ලබා දීලා තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya
සහනාධාර දෙන සමයේ දී රජය විසින් ලබා දිය යුතු හිඟ මුදල.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
2008?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya
2008 වර්ෂයේ දීලා තිබෙනවා කෝටි 100ක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රීමා එකට?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඊළඟට පැන නගින අතුරු ප්‍රශ්නය මේකයි. ඉඩම් හා ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව සතුව කෝට්ටේ තිබුණු ඉඩමක් මුදල් අමාත්‍යාංශයේ නිර්දේශය මත අක්කරය රුපියල් 50ක් වැනි බදු මුදලකට ප්‍රීමා ආයතනයට ලබා දී තිබෙනවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව සොයා බලා කියන්න පුළුවන්. [බාධා කිරීම්] එය මේ ප්‍රශ්නයට අදාල කරුණක් හැටියට අසා තිබුණේ නැහැ. ගරු මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය අසා තිබුණා නම් මට ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න තිබුණා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අදාළ අමාත්‍යාංශයෙන් තමයි ඒක නිදහස් කර තිබෙන්නේ. නමුත් මුදල් අමාත්‍යාංශයෙන් නිර්දේශය ලබා දී තිබෙනවා. ප්‍රීමා ආයතනයට අක්කරයක් රුපියල් 50ක බදු මුදලකට - කෝටිටේ ඉතාමත් මිල අධික ස්ථානයක ඉඩම් අක්කරයකට රුපියල් 50 ගණනේ - ලබා දෙන්නය කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya

සොයා බලා කියන්න පුළුවන්. හැබැයි ගරු කථානායකතුමනි, අපි 2005.03.01න් පස්සේ කිසිම අවස්ථාවක පිටි සඳහා සහනාධාරක් දීලා නැහැ. ඒ නිසාම වර්ෂයෙන් වර්ෂයට - 2007 ඉඳලා 2008 දක්වා බැලුවොත් - මේ රටේ මිනිසුන්ගේ පිටි පාරිභෝජනය සියයට 40කින් අඩු වෙලා තිබෙනවා. ඒක අපි යම් කිසි ආඩම්බරයකින් මේ සභාවට කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තව අතුරු ප්‍රශ්න අහන්න තියෙනවාද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඊළඟ අතුරු ප්‍රශ්නය මේකයි. ප්‍රීමා ආයතනයට දිය යුතු සහනාධාර හිඟයක් තිබිලා තිබෙනවා. මෙතුමා කියන පරිදි ඒ හිඟය තමයි දුන්නේ. එතකොට ඒ හිඟය ලබා දෙන කොට විශේෂයෙන්ම ඒ කාලය සඳහා ඔබතුමා යම් පොලියක් ගෙවලා තිබෙනවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya

නැහැ, කිසි සේත්ම අපි පොලී ගෙවලා නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පොලී ගෙවලා නැහැ?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya

නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

වෙනත් අතුරු ප්‍රශ්න නැහැ. ඊළඟට 11 වන ප්‍රශ්නය. ගරු තිලකරත්න විතානාච්චි මහතා

## නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : බෙදා දුන් ඉඩම්

**நாகொட பிரதேச செயலாளர் பிரிவு : பகிர்ந்தளிக்கப்பட்ட காணிகள்**

NAGODA DIVISIONAL SECRETARY'S DIVISION : LANDS DISTRIBUTED

0637/'08

11. **ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ගාල්ල, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොතලාවල කොටලපද්දලගම, නො.02 කොටසේ සහ අක්කර 80 ප්‍රදේශ ආවරණය වන, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් හා රජයට පවරා ගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් 2007 දෙසැම්බර් මාසය වන විට බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ඉඩම් ලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) එම ඉඩම් ලාභීන් අදාළ ඉඩම්වල පදිංචි වී හෝ භුක්තියේ සිටින්නේ ද;

(ii) තමාට ලැබුණු ඉඩම් කොටස වෙනත් අයකුට පවරා හෝ නීත්‍යානුකූල නොවන අයුරින් විකුණා ඇත්නම් ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එසේ නම් ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) රජයෙන් නොමිලේ ඉඩම් ලබා ගැනීමෙන් පසු ඒවා විකුණා නැවත රජයේ ඉඩම් අනවසරයෙන් අත් පත් කර ගැනීම මෙම ප්‍රදේශවල බහුලව සිදු වන බැවින් රජයට අයත් ඉඩම් රැක ගැනීම සඳහා මායිම් සලකුණු කර අවශ්‍ය පියවර ගැනීම කොපමණ කාල සීමාවක් තුළ සිදු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

காணி, காணி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) காலி, நாகொட பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ளதும் கொத்தலாவல கொட்டல பத்தலகம, "இலக்கம் 02 பிரிவில்" 80 ஏக்கர் பிரதேசத்தை உள்ளடக்கியதும் காணி சீர்திருத்த ஆணைக்குழு விற்குச் சொந்தமானதும் அரசாங்கத்தினால் சுவீகரிக் கப்பட்டதுமான காணியின் பரப்பளவு எவ்வளவு,

(ii) இதில் 2007 ஆம் ஆண்டு திசெம்பர் மாதம் வரை பகிர்ந்தளிக்கப்பட்ட காணியின் பரப்பளவு எவ்வளவு,

(iii) மேற்படி காணி பெறுநர்களின் பெயர், முகவரி மற்றும் வழங்கப்பட்டுள்ள காணியின் அளவு யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி காணி பெறுநர்கள் குறித்த காணிகளில் வசிக்கின்றார்களா அல்லது அனுபவிப்பு உரிமையைக் கொண்டுள்ளார்களா,

(ii) தமக்குக் கிடைத்த காணியை இன்னொருவருக்கு ஒப்படைத்துள்ள அல்லது சட்டரீதியற்ற விதத்தில் விற்பனை செய்துள்ளவர்களின் பெயர், முகவரி யாது,

(iii) அவ்வாறெனில், அது தொடர்பாக மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கை யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) அரசாங்கத்திலிருந்து இலவசமாகக் காணிகளைப் பெற்றுக் கொண்டதன் பின்னர் அவற்றை விற்பனை செய்து விட்டு மீண்டும் அரச காணிகளை அத்துமீறிக் கைப்பற்றுதல் மேற்படி பிரதேசங்களில் தாராளமாக நடைபெறுவதன் காரணத்தினால், அரசாங்கத்திற்குச் சொந்தமான காணிகளைப் பாதுகாக்கும் பொருட்டு எல்லைகளை அடையாளமிட தேவையான நடவடிக்கைகள் எவ்வளவு காலத்தினுள் மேற்கொள்ளப்படும் என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Land and Land Development:

(*a*) Will he inform this House,—

(i) the extent of lands that belong to the Land Reform Commission and which have been taken over by the Government including the areas of "Division No.2" and '80 acres' at Kotalapaddalagama, Kothalawala in Nagoda Divisional Secretary's Division in Galle;

(ii) the extent of lands that have been distributed by December 2007, out of the aforesaid lands; and

(iii) the names and addresses of the recipients of these lands and the extent of lands given to each of them?

(*b*) Will he submit to this House,—

(i) whether the aforesaid recipients are residing in the aforesaid lands or whether they are in possession of those lands;

(ii) if the portion of land received by any person, has been transferred or sold in an illegal manner to some other person, the names and addresses of persons who have done so; and

(iii) if so, the steps that have been taken in this regard?

(*c*) Will he state the period of time within which the necessary steps will be taken to protect the Government lands by demarcating their boundaries as the selling of lands received free of charge from the Government and acquiring the Government lands in an unauthorized manner subsequently takes place in these areas frequently?

(*d*) If not, why?

**ගරු ජීවන් කුමාරණතුංග මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Jeewan Kumaranatunga - Minister of Land and Land Development)

ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් නිසා මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

*Answer tabled:*

(අ) (i) ගැටලුවෙන් විමසා ඇති පරිදි ඉහත කී ප්‍රදේශවල;
රජයට පවරා ගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 31.411කි.
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගත් ඉඩම් ප්‍රමාණය අක්කර 3,486 රූඩ් 2
පර්චස් 18 ක් වන අතර එය පහත පරිදි බව වාර්තා කර ඇත.

| *ඉඩමේ නම* | *පැවරී ඇති ප්‍රමාණය* |
|---|---|
| හෝමදොල වත්ත | අක්කර 1927 රූඩ්0 පර්චස් 16 |
| අපර් හෝමදොල | අක්කර 754 රූඩ් 0 පර්චස් 16 |
| නෙලු ඇල මූකලාන (හෝමදොල වත්තේ කොටස) | අක්කර 35 රූඩ් 2 පර්චස් 24 |
| හෝමදොල මූකලාන | අක්කර 769 රූඩ් 3 පර්චස් 02 |
| එකතුව | අක්කර 3,486 රූඩ් 2 පර්චස් 18 |

(ii) රජයට පවරා ගෙන ඇති ඉඩම්වලින් බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 48 රූඩ් 01 පර්චස් 25
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගෙන ඇති ඉඩම්වලින් බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 2,313 රූඩ් 0 පර්චස් 35.54කි.

(iii) රජයට අයත් ඉඩම්වලට අදාළ බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය සහ නම් ඇමුණුමෙහි දක්වා ඇති අතර ලිපිනයන්, ඉඩම් ප්‍රමාණයන් එහි සඳහන් නොවේ.
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ලබා දී ඇති ආයතන, පුද්ගලයන්ගේ නම්, ලිපින සහ ඉඩම් ප්‍රමාණය පහත පරිදි බව වාර්තා කර ඇත.

| *ආයතනය/පුද්ගලයාගේ* | *ලිපිනය* | *පැවරීම් කර ඇති ප්‍රමාණය* |
|---|---|---|
| රාජ්‍ය වැවිලි සංස්ථාව | | අක්. 1,909 රූඩ් 03 පර්. 30 |
| නාගොඩ ප්‍රාදේශීය ලේකම් | | අක්. 82 රූඩ් 02 පර් 30 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | | අක්. 259 රූඩ්. 03 පර්. 0.0 |
| ඩිලාන් කීර්ති පෙරේරා මහතා | නො. 5/ඒ, නාගහවත්ත පෙදෙස, අම්බලන්වත්ත, ගාල්ල. | අක්. 50 රූඩ්. 0 පර්. 0.0 |
| බේබි සිංඤෝ මහතා | හෝමදොල හන්දිය | අක්. 09 රූඩ්. 03 පර්. 34 |
| හිරනායා රණසිංහ මිය | නො. 11/189, බාන්වැල්දූව වත්ත, අම්බලන්වත්ත, කරාපිටිය. | අක්. 0 රූඩ්. 0 පර්. 25.54 |
| රංජිත් හේවාවිතාන මහතා | ගෝනදෙණිය උඩුගම | අක්. 0 රූඩ්. 02 පර්. 36 |

(ආ) (i) ඔව්.

(ii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පවරා දී ඇති ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පවරා දීම් සිදු කර නොමැති බව වාර්තා කර ඇත. එහෙත් රජයට පවරා ගත් ඉඩම්වලින් බෙදා දුන් ඉඩම් කට්ටි ලාභීන් අතරින් එන්. ජී. ජයසේන මහතා සහ පී. කේ. සරත් මහතා ඔවුන්ගේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් අන්සතු කර ඇති බව වාර්තා වී ඇත.

(iii) ඉඩම් සංවර්ධන ආඥාපනත ප්‍රකාරව සැලසී ඇති ප්‍රතිපාදනයන් යටතේ එකී ඉඩම් අවලංගු කිරීමට අදාළ පියවරයන් නාගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ගනිමින් පවතී.

(ඇ) කාල සීමාවක් නිශ්චය කළ නොහැකිය.

(ඈ) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බෙදා දෙන ලද ඉඩම් කට්ටි වෙනුවෙන් දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා මැන ගල් දැමීමට මැනුම් නියෝග යැවීමෙන් අනතුරුව ඉඩම් කැබලි 17ක් සඳහා දැනටමත් මැනුම් කටයුතු සිදු කර ඇත. පාලන බලඅධිකාරි දෙදෙනෙකුගේ (ප්‍රාදේශීය ලේකම් හා මැනුම් අධිකාරි) එකඟත්වය මත හා ඉදිරි සැලසුම් මත, තාක්ෂණික හා භෞතික සම්පත් ධාරිතාව උපයෝගී කර ගැනීමේ හැකියාව හා මැනුම් කටයුතුවලදී බලපාන සීමිත පිරිස් බලය ද මත මෙම කාර්යය ඉටු කිරීමට සිදු වන බැවින් ඒ සඳහා නිශ්චිත කාල වකවානුවක් දැක්වීම අපහසුය.

( [illegible] )

අක්කර 20 ඉඩම් කච්චේරිය

උඩුගම නැගෙනහිර

01. කොඩාගොඩ ආදරගේ පියසිලි මිය 426661799 V.
02. තැලැගොට ගේවගේ සුනිල් රංජිත් මයා 701124057 V.
03. උඩුගම ගමගේ ප්‍රියන්ත මයා 712203650 V.
04. උඩුගම සමගේ චන්ද්‍රසිරි මයා 650583957 V.
05. සෝමසිරි වසවත්තගේ මයා 670313310 V.
06. උඩුගම ගමගේ සුමින්ද්‍රා මයා 502250877 V.
07. සුනිල් සමරවීර මයා 602771687 V.
08. කාලගිල විතානගේ සුනිතා කාන්ති මිය 765144230 V.
09. සුදු දේවගේ ගාමිනී මයා 650523628 V.
10. කාපෙ පතිරණගේ ධර්මසිරි මයා 660042512 V.
11. පිටිගල විතානගේ වසන්තා මිය 778471701 V.
12. මාපලගම ගමගේ ජේමගේ සුමනසිරි මයා [illegible] ඇත.
13. උඩුගම විතානගේ ජයන්ත කුමාර මයා 692420993 V.
14. ධර්මසිරි පතිරත්න මයා 623313514 V.
15. මිගොඩ ගමගේ අශෝකා මිය 718303966 V.
16. ගෝනගල විතානගේ චන්ද්‍රකාන්ති මිය [illegible] 35643034
17. වලිදු පරණ ලීලා නිසිරානි මිය 847201215 V.
18. වලිදු පරණ ගමගේ උපසේන මයා 511863775 V.
19. පතිරත්න සිරිසේන මයා 413630223 V.
20. පරණ ගාමිනී දේවානිනාරණ මයා [illegible]
21. [illegible] පුෂ්පා ලේකමාලි මිය 817314376 V.
22. [illegible] මිය [illegible]
23. [illegible] මිය 783483980 V.
24. [illegible] මිය 656901500 V.
25. [illegible] මයා 790704991 V.
26. [illegible] මිය 555302851 V.
27. [illegible] මයා 720733684 V.
28. [illegible] ආචාරිගේ රංජිත් මයා [illegible]
29. [illegible] පල්ලිය කුරුගේ නිහාල් මයා [illegible]
30. [illegible] චන්ද්‍රසේන මයා 712422220 V.
31. [illegible] මිය 562945202 V.
32. [illegible] ගේවගේ සෝමසිරි මයා [illegible]

උඩුගම දකුණ

33. රංචගොඩ ලියනගේ චිල්ටිනි චන්ද්‍රිකා මිය 755352330 V.
34. උඩුකිටිගේ සුධර්මසිරි මයා 802954980 V.
35. දෙහිගොඩගේ ජගත් ප්‍රයන්ත මයා 761542125 V.
36. වලදී ආරච්චි කංකානම්ගේ රේණුකා මිය 755753734 V.
37. අරුකා පන්ති පත්මිනී මිය 667872820 V.
38. පියඹලාගොඩ ගමගේ පුෂ්ප කාන්ති මිය 665240509 V.
39. ඇපගේ ජයසිංහ මයා [illegible]
40. පිටුවල කංකානම්ගේ ශාලිකා මිය 720031970 V.
41. [illegible] ගමගේ සිල්වින් මිය [illegible]
42. කෝරලේගොඩ විතානගේ සුදන්ති මිය [illegible] 730830[illegible]
43. පොඩි කංකානම්ගේ සුරන්තිකා මිය 545561735 V.
44. [illegible] මහගමගේ [illegible] මයා 433461442 V.
45. ඇපාගේ ප්‍රේමවතී මිය [illegible]

උඩුගම බටහිර

46. ගලබඩ ලියනගේ ප්‍රියානි මල්ලිකා මිය [illegible] 681V
47. ගලගම්නායනගේ රුවින් කාමිනී මයා 790873947 V.
48. පේලතිලි ආරච්චිගේ කරුණාතිලක මයා 803570434 V.
49. පේලතිලි ආරච්චිගේ උදයරත්න මයා 722032616 V.
50. ශේඛා වෛද්‍යගේ චන්ද්‍රසිරි මයා 811694428 V.
51. අඟගොඩ විතානගේ ජයතිස්ස මයා 571262614 V.
52. රවීන්ද්‍ර වල්ලව වීර කලුආරච්චි මයා 770403359 V.
53. පෝරම්බ ලියනගේ සුනිල් මයා 621114794V
54. [illegible]විලවත්ත නවගේ ආනන්ද මයා [illegible]
55. කාරියවසම් ලොකු ගමගේ ප්‍රේමතිපාල මයා 612574642 V.
56. කිරිගස්පෙ පල්ලිය ගුරුගේ සිරිපුමත මයා 723134315 V.
57. උඩුගම ගමගේ රුවින් ප්‍රදීප් මයා 853464295 V.
58. හෙටිකන්ද පල්ලිය ගුරුගේ කාන්ති මිය 758071952 V.
59. යමරංසිංහ පල්ගස්පෙ අරුණ් [illegible] මයා 820661217 V.

උඩුගම වසම

60. හිරිඹුරුගොඩගේ තිලකරත්න මයා 523104188 V.
61. දඩැල්ල ලකුබෝදරගේ උපාලි මයා [illegible]
62. හිත්දෙනියගේ කුසුමාවතී මිය 576580024 V.
63. අබේසිංහ ජයතිලක තිලකරත්න මයා 562532617 V.
64. පිලාන විතානගේ කාලනී මිය 725623992 V.
65. පෝරම්බ බටගොඩ කංකානම්ගේ නන්දා හෙට්ටි ආරච්චි මිය 6475615[illegible]

66. අරබෑගොඩ ලොකු ගමගෙ සඳදාස අමරදාස මයා 730041624 V.

67. අරබෑගොඩ ලොකු ගමගේ සුමනසිරි මයා

68. කුරුපනාවි පුස්සවිලගේ ප්‍රේමලාල් රත්නසිරි මයා 660300309 V.

69. අරබෑගොඩ ලොකු ගමගේ සුනිල් රංජිත් මයා 680383464 V.

70. පින්මුල්ල ගමගේ චන්ද්‍රසිරි මයා 640511346 V.

71. සුනිල් ජයවර්ධන මයා 402511664 V.

හෝමදොල වසම

72. කෙලිඹඩ පල්ලිය කුරුගේ ආනන්ද ඇති AB

73. සබරදීපුව ගම ආරච්චිගේ චන්ද්‍රදාස මයා ශ්‍රී.ලං. සමාජවාදී පක්ෂය.

74. හෙට්ටි ආරච්චිගේ අජිත් ප්‍රියන්ත මයා. උන්නත්න සම්මේලනය ශ්‍රී.ලං. මු.නා.

75. අත්මිවත ආචාරිගේ ලාල් ප්‍රියන්ත මයා 741373742 V.

76. ලොකු කාරංගොඩගේ ශ්‍රියානි මිය 738323807 V.

77. මීගහ කංකානම්ගේ සුදත් සුපිරූ නිර්මල මයා 732470042 V.

78. කදු ආරච්චිගේ දයාල් මයා. 560510659 V

79. කුරුපනාවි පුස්සවිලගේ ආනන්ද සෙනරත් ධර්මසිරි මයා 700231224 V.

80. වැලගොඩ පතිරණගේ දොන් සිරිල් ශාන්ත මයා 810805846 V.

81. තොටුවේ කංකානම්ගේ රංජිත් මයා. 603574184 V.

82. පුස්සවිලගේ අසුර නිත්සිරි මයා. 721183297 V

83. බෙලන්තොට සාලි පාල් මුත්තු මයා 492686857 V.

අලුත් වත්ත

84. විනෝද විතානගේ ඇල්පිටිය මයා. 640661879 V.

85. අවුලන විතානගේ පිටිපොල මයා 481780405 V.

86. එ. ගුණසේන මිය AB. 825584897 දීප ලෙස කුසල්නල් වලට

87. ජී.පී.ජයසේන මයා 440491111 V.

88. සී.ජේ. සිරිල් මයා 692794362 V.

89. පී.ජේ.සමන් මයා 672443504 V.

90. ඩී.ජී.ජී. සිරිල් මයා 693381509 V.

91. ඇපා කංකානම්ගේ පුංචිබණ්ඩා මයා - 4216230581 V.

92. ඇපා කංකානම්ගේ ශ්‍රියානි මිය 797353027 V.

93. පී.ඒ.සිපුලිත් සෝමා මිය :ID නැත 423391273V

94. ඩී.ජේ.චන්ද්‍රවති මිය. 486893370 V.

95. ගනංගොඩ ඇටවිගේ සුදත් ශාන්ත මයා 753482266 V.

96. කොස්ගලහේවගේ නාලින්ද මයා 721591905 V.

97. සමින්ද ප්‍රියන්තගේ චොහාන් මයා 770575028 V.

98. පිහාගොඩ ජාලත්ගේ සුදත් ජයලත් මයා 762350238 V.

99. අඩැල්ල ලෙනබෝරගේ ප්‍රදීප් රුවින් කුමාර මයා 800324653 V.

100. පල්ලිය කුරුගේ ශාන්ත මයා 683643742 V.

101. කොඩිකනොනම්ගේ සෝමිරත්න මයා 610064051 V.
102. පල්ලියගුරුගේ මෙලනි සද්දේහිගේ ජාතක මයා 740792679 V.
103. අබේරත්න විතානගේ දිල්කා ප්‍රියදර්ශනී මිය ජා. හැ. අංකය නැත
104. බෝපෙ ගමගේ නිහාල් සිසිර ශාන්ත මයා 741441401 V.
105. විජ්මුල්ල ගමගේ පියසිරි මයා [illegible]
106. උපුල් විතානාච්චි මයා 640713798 V.
107. ජමරිණු නිලමට සෙනසිරත්න මයා 607023301 V.
108. නුරැප්පු ආරච්චිගේ රෝහිණි මිය 597533861 V.
109. හිමිදුම ලියනගේ සුමිත් මයා 732961712 V.
110. තුසෙවීතා සමිති ගුණසේන මයා AB.
111. උඩලමත්ත ගමගේ ධර්මප්‍රිය මයා 741511886 V.
112. කෙල්ලපුර විතානගේ දිජි කුමාර මයා AB [illegible]
113. ගුරුසිංහ ආරච්චිගේ සමන්තිකා මිය AB 398510762V
114. ජේරත ටුර ධම්ගේ කුමාරා නිල්ලුකි මිය ID නැත. 666710940V
115. කරුණා දේවගේ ප්‍රියා සිල්වියා මිය 675823987 V.

ක. ගේ. පියදාස
ප්‍රාදේශීය ලේකම් - කාගොව

[illegible]


00092

ගම : ....[illegible]....  අ.ග.පි අංකය: ..5..

පත්තුව හෝ කෝරළේ: ..........  දිස්ත්‍රික්කය: ..ගා..

මධ්‍යම පංතියේ ශ්‍රී ලාංකිකයින්ට/ඉඩම් හිමි ගොවීන්ට, ඉඩම්දීමේ ක්‍රම ... ගසා බෙදා වෙන් කර, ගැමියෙදි වට මායිම් පෙන්වා දුන් බිම් කැබෙල්ල ... ලැබුණු බව ... මෙයින් ... කැමැත්ත දෙමි.

| අනු ක්‍රමික අංකය | බිම් කට්ටි අංකය | කට්ටිකරුගේ නම | ඉඩමේ නම | ප්‍රමාණය | භාරදුන් දිනය | කට්ටිකරුගේ අත්සන හෝ වම් ඇඟිලි සලකුණ |
|---|---|---|---|---|---|---|
| 01 | BL | [illegible] | | | | |
| 02 | BD | [illegible] | | | | [illegible] |
| 03 | AA A | [illegible] | | | | [illegible] |
| 04 | AM | [illegible] | | | | [illegible] |
| 05 | AL | [illegible] | | | | [illegible] |
| 06 | BU | [illegible] | | | | manorma |
| 07 | AA | [illegible] | | | | [illegible] |
| 08 | AD | [illegible] | | | | [illegible] |
| 09 | BN ½ | [illegible] | | | | [illegible] |
| 10 | AW ½ | [illegible] | | | | [illegible] |
| 11 | AN | [illegible] | | | | [illegible] |
| 12 | AX 2/2 | [illegible] | | | | [illegible] |
| 13 | BH | [illegible] | | | | [illegible] |
| 14 | AJ | [illegible] | | | | [illegible] |
| 15 | AZ | [illegible] | | | | Kumudu |
| 16 | AB | [illegible] | | | | [illegible] |
| 17 | D | [illegible] | | | | [illegible] |
| 18 | E | [illegible] | | | | [illegible] |
| 19 | BK | [illegible] | | | | [illegible] |
| 20 | AC | [illegible] | | | | [illegible] |
| 21 | AE | [illegible] | | | | [illegible] |
| 22 | AH | [illegible] | | | | [illegible] |
| 23 | AF GA | [illegible] | | | | [illegible] |
| 24 | BP | [illegible] | | | | [illegible] |
| 25 | BE | [illegible] | | | | [illegible] |
| 26 | AY | [illegible] | | | | [illegible] |
| 27 | BC | [illegible] | | | | [illegible] |
| 28 | AU | [illegible] | | | | [illegible] |
| 29 | P | [illegible] | | | | [illegible] |
| 30 | M | [illegible] | | | | [illegible] |
| 31 | BM | [illegible] | | | | [illegible] |

: .....උඩුගම......... ............ අ.ග.පි අංකය: ..528........

පත්තුව හෝ කෝරළේ: ...... ............... දිස්ත්‍රික්කය: ..ගාල්ල......

මධ්‍යම පන්තියේ ශ්‍රී ලාංකිකයින්ට/ඉඩම් සිටි ගොවීන්ට, ඉඩම්දීමේ ක්‍රමයට අනුව ගල් වළලා/ කුඤ්ඤ ගසා බෙදා වෙන් කර, භූමියේදී මට මායිම් පෙන්වා දුන් බිම් කැබැල්ල ගැනීමට මම මෙයින් කැමැත්ත දෙමි.

| අනු ක්‍රමික අංකය | බිම් කට්ටි අංකය | කට්ටිකරුගේ නම | ඉඩමේ නම | ප්‍රමාණය | භාරදුන් දිනය | කට්ටිකරුගේ අත්සන හෝ වමත් ඇඟිලි සලකුණ |
|---|---|---|---|---|---|---|
| 32 | (J) | එච්. එච්. ජී. පුෂ්පා ලතාංගනී | | | | [illegible] |
| 33 | C | ගුණසිංහ උදිත සම්පත් | | | | [illegible] |
| 34 | Y EZ 1/1 | රමේෂ් අනුරා විජේසිංහ | | | | [illegible] |
| 35 | AP | යූ. ජී. අනිල් ධම්මික | | | | [illegible] |
| 36 | K | යූ. ජී. නිශාන්ත | | | | [illegible] |
| 37 | F | යූ. ජී. ප්‍රියන්ත | | | | [illegible] |
| 38 | Z | ජී. ජී. නාමල් චන්දන | | | | [illegible] |
| 39 | AK | ඩබ්. ජී. ජානක ප්‍රදීප් කුමාර | | | | [illegible] |
| ~~40~~ | | ~~එච්. ජී. ටී.~~ | | | | [illegible] |
| 40 | AS | එච්. එච්. ජී. ප්‍රියංගා | | | | [illegible] |
| 41 | B | ජී. ජී. ඩී. චන්ද්‍රා දිසානායක | | | | [illegible] |
| 42 | X G | ඒ. එච්. ජී. පුෂ්පා ගොඩගේ | | | | [illegible] |
| 43 | AY | පී. එච්. රත්නායක | | | | [illegible] |
| 44 | L | ජී. ජී. විජේපාල | | | | [illegible] |
| 45 | AT 1/2 | යූ. වී. තරංග අමරසිරි | | | | [illegible] |
| 46 | AT | එම්. පී. ධර්මසේන ගමගේ | | | | [illegible] |
| 47 | AK | ඒ. පී. ගොඩගේ අමරසිරි | | | | [illegible] |
| 48 | AR | එච්. ජී. බන්දුසිරි | | | | [illegible] |
| 49 | A Z 1/2 | ලතා නානායක්කාරගේ | | | | [illegible] |
| 50 | AN | එන්. පී. කුමාරගේ | | | | [illegible] |
| 51 | AS | යූ. ජී. රත්නසිරි | | | | [illegible] |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු ඇමතිතුමනි, මෙම ප්‍රශ්නයේ (ඇ) කොටසට දී ඇති පිළිතුර මා දැන ගන්න කැමැතියි.

**ගරු ජීවන් කුමාරණතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon Jeewan Kumaranatunga )
(ඇ) කාල සීමාවක් නිශ්චය කළ නොහැකිය.

(ඈ) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බෙදා දෙන ලද ඉඩම් කට්ටි වෙනුවෙන් දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා මැන ගල් දැමීමට මැනුම් නියෝග යැවීමෙන් අනතුරුව ඉඩම් කැබලි 17ක් සඳහා දැනටමත් මැනුම් කටයුතු සිදු කර ඇත. පාලන බල අධිකාරි දෙදෙනෙකුගේ (ප්‍රාදේශීය ලේකම් හා මැනුම් අධිකාරි) එකඟත්වය මත හා ඉදිරි සැලසුම් මත, තාක්ෂණික හා භෞතික සම්පත් ධාරිතාව උපයෝගී කර ගැනීමේ හැකියාව හා මැනුම් කටයුතුවලදී බලපාන සීමිත පිරිස් බලය ද මත මෙම කාර්යය ඉටු කිරීමට සිදු වන බැවින් ඒ සඳහා නිශ්චිත කාල වකවානුවක් දැක්වීම අපහසුය.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මේකයි. ඉඩම් අමාත්‍යාංශයෙන් දිගින් දිගටම ඉඩම් ලබා දීම සිදු කරනවා. ඔවුන් මේ ඉඩම් අලෙවි කරමින් නැවත නැවතත් ඉඩම් ලබා ගැනීම සිදු කරනවා. ඒක වළක්වන්න තමයි ඔබතුමාට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේත්. ඒ සඳහා පියවර ගන්නවාද කියන එකයි අහන්නේ.

**ගරු ජීවන් කුමාරණතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon Jeewan Kumaranatunga )
ගරු මන්ත්‍රීතුමා ඉඩම් ලබා දීම ඉඩම් අමාත්‍යාංශය මඟින් නොවෙයි කරන්නේ. මේවා පළාත් සභාවල එකඟත්වය ඇතිවයි කරන්නේ. පළාත් සභාවලින් අනුමතිය ලබා දෙනවා. ඉඩම් පනතට අනුවයි අප කටයුතු කර තිබෙන්නේ. අප හිතුමතේ ඉඩම් ලබා දීමක් කර නැහැ.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට මා ඇසූ ප්‍රශ්නය පැහැදිලි නැති බවයි පෙනී යන්නේ. ඉඩම් ලබා ගත්තාට පස්සේ ඒවා නොයෙක් ආකාරයෙන් අන්සතු කර නැවතත් දිගින් දිගටම ඉඩම් ලබා ගන්නවා. ඉඩම් අමාත්‍යාංශය තමයි අවසාන ඔප්පු ලබා දීම සිදු කරන්නේ.

**ගරු ජීවන් කුමාරණතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon Jeewan Kumaranatunga )
ඔව්. අවසාන අනුමතිය. හැබැයි, හිතුමතේ අපට ඉඩම් අහිමි කරන්න බැහැ. අහිමි කරන්නේ නැහැ. ඔබතුමා කරුණු ඇතිව කිව්වොත් අපට අවශ්‍ය පිළිතුර ලබා දෙන්න පුළුවන්.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
මා එම කාරණය ඉදිරිපත් කරන්නම්.

**ගරු ජීවන් කුමාරණතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon Jeewan Kumaranatunga )
මෙහි විස්තර ඇතිව තිබෙනවා. ඔබතුමාට බලා ගන්න පුළුවන්.

## ගව ඝාතනය වැළැක්වීම : පියවර
## பசுக்கள் கொல்லப்படுவதைத் தடுத்தல் : நடவடிக்கை
## PREVENTION OF CATTLE SLAUGHTER : STEPS TAKEN

0703/’08

14. **ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මහා පරිමාණයෙන් සිදු වන ගව ඝාතන හේතු කොටගෙන දේශීය කිරි නිෂ්පාදනය පහත වැටීමේ සහ ගවයින් වඳ වීමේ තර්ජනයකට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) 1990 දශකයේ මුල් භාගයේ රජරට සහ වයඹ වියළි කලාපවල එක් රැළක ගවයින් දෙතුන් සියයක් සිටි අතර එම ගවයින් මස් සඳහා විකිණීම නිසා කිරි නිෂ්පාදනය විශාල ලෙස පහත වැටී ඇති බව එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) (i) ගව ඝාතනය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා පියවර ගෙන තිබේ ද;

(ii) එසේ නම් ඒ කවරේද;

(iii) පශු සම්පත් අංශයද විනාශ වීමට හේතු වී ඇති මේ මහා විනාශය වැළැක්වීම සඳහා ජාතික මට්ටමින් දැඩි ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කරන්නේද;

(iv) පාර්ලිමේන්තුව මඟින් කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගෙන නීත්‍යානුකූලව ගව ඝාතනය වැළැක්වීම සඳහා පියවර ගන්නේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

கால்நடைவளர்ப்பு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) பெருமளவில் பசுக்கள் இறைச்சிக்காக கொல்லப்படுவதால் உள்நாட்டு பால் உற்பத்தி வீழ்ச்சியடையும் அபாயமும் பசுக்கள் அழிவடையும் அபாயமும் தோன்றியுள்ளதென் பதை அவர் அறிவாரா?

(ஆ) 1990 ஆம் தசாப்தத்தின் முன்னரைப் பகுதியில் ரஜரட்ட மற்றும் வடமேல் உலர் வலயங்களில் ஒரு மந்தையில் இருநூறு முதல் முந்நூறு பசுக்கள்வரை இருந்ததுடன் அவை இறைச்சிக்காக விற்கப்பட்டதன் விளைவாக பால் உற்பத்தியின் அளவு குறைவடைந்துள்ளது என்பதைஅவர் அறிவாரா?

(இ) (i) பசுக்கள் கொல்லப்படுவதை தடுப்பதற்கு அல்லது குறைப்பதற்கு நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) ஆமெனில், அவை யாவையென்பதையும்,

(iii) கால்நடைத்துறை அழிவடைய வழிசமைத்துள்ள இப் பேரழிவினை தடுப்பதற்கு தேசிய மட்டத்தில் நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்,

(iv) பாராளுமன்றக் குழுவொன்றை நியமித்து அறிக்கை யொன்றைப் பெற்று பசுக்கள் கொல்லப்படுவதை சட்டரீதியாக தடைசெய்வதற்கு நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Livestock Development :

(*a*) Is he aware that the local milk production has dropped and the cattle have faced with the threat of extinction as a result of mass -scale slaughtering of cattle?

(*b*) Will he admit the fact that in early 1990's a herd in the North Central Province and the dry zone of the North Western Province consisted of two or three hundred cattle and as a result of selling those cattle for meat the milk production has dropped drastically?

(*c*) Will he inform this House,—

(i) whether steps have been taken to prevent or minimize slaughtering of cattle;

(ii) if steps have been taken what they are;

(iii) whether action will be taken to adopt rigid measures on a national - scale to prevent this massive destruction which has resulted in the destruction of the livestock industry; and

(iv) whether steps will be taken to prevent slaughtering of cattle legally after obtaining a report of a Committee appointed by the Parliament?

(*d*) If not, why?

**ගරු සී. බී. රත්නායක මහතා (පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - கால்நடை வளர்ப்பு அபிவிருத்தி அமைச்சர்)

(The Hon. C. B. Rathnayake-Minister of Livestock Development)

(අ) ගව ඝාතනය මෙරට ගව ගහනයේ වර්ධනය අඩු වීමට හේතුවක් වුවත්, දේශීය කිරි නිෂ්පාදනය පහත වැටීමට එමඟින් දැඩි බලපෑමක් කර නොමැත. 2002 දී මිලියන 1.138ක් වූ ගව සම්පත 2007 දී මිලියන 1.222 දක්වා වර්ධනය වී ඇත. 2002 දී දෙලක්ෂ අසූදෙදහක් (2,82,000) වූ මී ගව සම්පත, 2007දී තුන්ලක්ෂ දහඅටදහසක් (3,18,000) වී ඇත. (ජන හා සංඛ්‍යා ලේඛන දත්තයන් අනුව)

(ආ) ඉහත (අ) පිළිතුර අනුව පැන නොනඟී. මෙවැනි ගව රැළවල සිටිනුයේ ඉතා අඩු කිරි ඵලදාවක් සහිත දේශීය සතුන් බැවින් කිරි නිෂ්පාදනය පහත වැටීමට දැඩි බලපෑමක් ඇති නොවේ. 2006දී ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 196ක් වූ අතර 2007 අවසානයේ දී කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 202ක් දක්වා වර්ධනය වී ඇත. දැනට මෙරට කිරි අවශ්‍යතාවෙන් 27%ක් දේශීයව නිෂ්පාදනය කරනු ලැබේ.

(ඇ) (i) ඔව්.

(ii) 1958 අංක 29 දරන සත්ව පනත මඟින් ගවයින් අනවසරයෙන් ප්‍රවාහනය කිරීම හෝ ඝාතනය කිරීම සඳහා පනවා තිබූ දඩය වන රු. 25,000, රු. 50,000.00 දක්වා වැඩි කිරීමට හා මාස 02ක සිර දඬුවම වසර 03ක් දක්වා වැඩි කිරීමට නීතිපතිතුමාගේද අනුමැතිය අනුව පනත සංශෝධනය කර ගැසට් කිරීමට කටයුතු කර ඇත.

1953 අංක 48 දරන සෝ ඝාතක පනත දැනටමත් සංශෝධනය කර ඇති අතර, එමඟින් අනවසරයෙන් කිරි ගවයෙකු හෝ ගැබ්බර සතකු ඝාතනය කළහොත් දඩය රු. 50.00 (පනහක) සිට රු. 50,000.00 (පනස්දාහක්) දක්වාද, මසක සිර දඬුවම වසර 03ක උපරිමයකට යටත්ව වැඩි කර ඇත.

(iii) ඔව්. නීත්‍යානුකූල නොවන ගව ඝාතනය නැවැත්වීම සඳහා සියළුම පාර්ශ්වයන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර, මෙම අමාත්‍යාංශය පොලිස් දෙපාර්තමේන්තුව සමඟ නිරතුරුවම සම්බන්ධීකරණය වෙමින් කටයුතු කර ගෙන යනු ලැබේ.

(iv) මේ සඳහා අවශ්‍යතාවක් පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)

(The Hon. Gamini Jayawickrama Perera)

ගරු ඇමතිතුමනි, ගව ඝාතනය වැළැක්වීමට පනතක් ගේනවාය කියා ඔබතුමා අපට කම්ටුවේදී කිව්වා.

**ගරු සී. බී. රත්නායක මහතා**

(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)

(The Hon. C. B. Rathnayake)

අප පනත් කෙටුම්පත සකස් කර තිබෙනවා. ඉදිරියේදී - [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)

(The Hon. Gamini Jayawickrama Perera)

මොකටද පනත් කෙටුම්පතක් ගේන්නේ හරක් ඝාතනයක් නැතිනම්? ගව ඝාතනයක් මේ රටේ නැහැයි කියන තත්ත්වයට සංඛ්‍යා ලේඛන තිබෙනවා නම් පනත් කෙටුම්පතක් ගේන්න ඕනෑ නැහැ. ඔබතුමා දැන් කිව්වා, එළ ගවයන් සහ මී ගවයන් යන දෙ වර්ගයේම ඝාතනවල වැඩි වීමක් වෙලා තිබෙනවාය කියා. එහෙම නම් මොකටද, මේ පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ. ගරු සභාපතිතුමනි, මෙතුමා කියන විධියට ගව ඝාතන වැඩි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම කථා කරන්නේ භූගෝලීය,-

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

වැඩි වෙලා තිබෙන නිසා නේන්නම් පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ. අඩ වෙලා නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)

(The Hon. Gamini Jayawickrama Perera)

අඩු වෙලා නැහැ තමයි. නමුත් ගරු කථානායකතුමනි, මේ ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමාත් දන්නවා, මම දිසා ඇමති විධියට හිටපු ඒ කාලයේ මම ගව ගම්මාන ඇති කළා. ඒ ඇති කිරීම තුළ අද ඒ ගම්මානවල හරක් [බාධා කිරීමක්] ඔබතුමා නැහැයි කියා කියනවා නම්, මේ විධියට [බාධා කිරීමක්]

**ගරු සී. බී. රත්නායක මහතා**

(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)

(The Hon. C. B. Rathnayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය රටේ නැති වෙලා නැහැනේ. මේ ප්‍රශ්නය නැති කරනවාට එතුමා අකමැතිද? [බාධා කිරීමක්] රටේ සිදු වන මෙවැනි දේවල් නැති කරනවාට ඔබතුමා අකමැතිද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)

(The Hon. Gamini Jayawickrama Perera)

මොකක්ද?

**ගරු සී. බී. රත්නායක මහතා**

(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)

(The Hon. C. B. Rathnayake)

මේ ගව ඝාතන නැති කරනවාට ඔබතුමා අකැමැතිද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මගේ ප්‍රශ්නය මේකයි.

**ගරු සී. බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C. B. Rathnayake)
නැහැ, නැහැ. මේ කාරණයට උත්තරයක් දෙන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගව ඝාතනය වැඩි වුණොත් තමයි හරක් අඩු වෙන්නේ. මම කියන එක හරිද, වැරදිද කියන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඝාතනය වැඩි වෙලා කියලා නේ කියන්නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඝාතනය වැඩි වුණා නම් හරක් අඩු වෙනවා. හරි නේ, ගණන් අනුව 'අ' යන්න 'ආ' යන්න,- [බාධා කිරීම්] එකයි, එකයි එකතු කළාම එකයි කිව්වා වාගේ,- [බාධා කිරීම්]

**ගරු සී. බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C. B. Rathnayake)
ගරු කථානායකතුමනි, 2007 ඉඳලා මෙහි වර්ධනයක් වෙලා තිබෙනවාය කියන එක තමයි අපි ප්‍රකාශ කරන්නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඉතින් ඒ වාගේ එකක් කියන්නේ,- [බාධා කිරීම්] ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට බොහොම ගරු කරනවා. ඔබතුමා බොහොම අවංකව පශු සම්පත් දියුණු කරන්න හදනවා. ඒක නිසා අනුව 'අ' යන්න 'ආ' යන්න එකයි කිව්වාට හරි යන්නේ නැහැ. ඔබතුමා වහෙන් ඔරෝ කථා කරන්න එපා. [බාධා කිරීම්]

**ගරු සී. බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C. B. Rathnayake)
එකයි බින්දුවයි එකයි කියලායි කියන්නේ. [බාධා කිරීම්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගව ඝාතනය කිරීම සම්බන්ධයෙන් ඔබතුමා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න. මට දෙන්න දිස්ත්‍රික්ක අනුව. අද ඔබතුමායි, මහාචාර්ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමායි කියනවා කිරි නිෂ්පාදනය කරනවාය, කිරි හරක් ඇති කරනවාය, හෝමෝන ක්‍රමයෙන් කිරි නිෂ්පාදනය වැඩි කරනවාය කියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් පෙ. ව. 10.02යි. අතුරු ප්‍රශ්න,-

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එහෙමද? ගරු කථානායකතුමනි, මමයි කථා කරන්න ඉන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථා කරන්න අදාළ අමාත්‍යාංශය යටතේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මටයි කථා කරන්න තිබෙන්නේ. මමයි ආරම්භ කරන්නේ, කෘෂිකර්ම සංවර්ධන හා ගොවි ජන සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය. ගරු ඇමතිතුමනි, ඔබතුමා බොහොම දැහැමි කෙනෙක්. ඔබතුමා මේ ගැන හිතලා ක්‍රියා කරන්න. මට කියන්න තිබෙන්නේ. එපමණයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය ඒක ද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මොකක්ද ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය ඒකද ? එතුමා නීති ගෙනෙන කොට ඔබතුමා විරුද්ධයි ද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
අතුරු ප්‍රශ්නය ඒක තමයි. මම කියන්නේ එතුමාගේ ඥානය පහළ වෙලා මේකට පනත් කෙටුම්පතක් ගෙනැල්ලා නීතිමය හෝ [බාධා කිරීම්] මේ රටේ නැත්නම් පිට රටින් හෝ හරක් ටිකක් ගෙන්වලා කවන්න ඕනෑ කට්ටියට කවාපුවාවේ. නමුත් අපේ ගව සම්පත ආරක්ෂා කර ගන්නය කියන එකයි මගේ ඉල්ලීම [බාධා කිරීම්]

**ගරු සී. බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C. B. Rathnayake)
බොහොම ස්තුතියි, තමුන්නාන්සේගේ සහයෝගය ලබා දීම ගැන.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකට ස්තුති කළා. තව අතුරු ප්‍රශ්න තිබෙනවා ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරක් මරනවාට ලක්ෂයක දඩයක් ගහනවා. මිනිස්සු උස්සන්න, ජන මාධ්‍යවේදීන් උස්සන්න සුදු වෑන් වලින් එනවා. ඒකට මේ ආණ්ඩුව තුළින් ඇති කර තිබෙන දඩය මොකක්ද,

**ගරු සී. බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C. B. Rathnayake)
ගරු කථානායකතුමනි, ඒක අදාළ නොවේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා පැහැදිලි කළා, ගව ඝාතනය නිසා කිරි නිෂ්පාදනය අඩු වීමට බලපෑමක් වෙලා නැහැයි කියලා.

දළ වශයෙන් උත්තරය හැටියට තිබුණේ ඒක. නමුත් අය වැය කථාවේදී ගරු මුදල් අමාත්‍යතුමා - ජනාධිපතිතුමා - ඉදිරිපත් කළා, මිලියන 100ක් වෙන් කරනවාය කියා. මොකද, කිරි නිෂ්පාදනය අඩු වීමට බලපාන ප්‍රධාන හේතුවක් හැටියට ගව ඝාතනය සිද්ධ වෙනවා, ඒක වළක්වන්න ඕනෑය කියලා. ඒ උත්තරයයි, ඔබතුමා දුන් උත්තරයයි අතර පරස්පරයක් නැද්ද ?

**ගරු සී. බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C. B. Rathnayake)

මන්ත්‍රීතුමනි, මේ රටේ කිරි අවශ්‍යතාව වැඩි කර ගැනීම සඳහා තමයි ඒ දේ කරන්නට සූදානම් වන්නේ. මේ රටේ කිරි අවශ්‍යතාව අනුව කිරි නිෂ්පාදනය තිබෙන්නේ සියයට 5යි. ඒ නිසා සියයට 5ක් තමයි ඉල්ලුම අනුව සැපයුම තිබෙන්නේ. නමුත් අපි මේක දැන් සියයට 50ක් දක්වා වර්ධනය කරගන්නට ඕනෑ. සියයට 50ක් දක්වා වර්ධනය කර ගැනීම සඳහා ක්‍රමවේදයන් අවශ්‍ය වෙනවා. ඒ ක්‍රමවේදයන් සඳහා තමයි මුදල් ප්‍රතිපාදන වෙන්කර ගන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා අය වැය කථාව නැවත කියවන්න. එහි ඉතාම පැහැදිලිව තිබෙනවා, ගව ඝාතනය වැළැක්වීම සඳහා අදාළ ආයතනවලට,-

**ගරු සී. බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C. B. Rathnayake)

එය මේ රටෙන් සම්පූර්ණයෙන් තුරන් කිරීම සඳහා අප උත්සාහයක යෙදෙනවා.

## ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා : නිල නිවස

### நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் அமைச்சர் : உத்தியோகபூர்வ வசிப்பிடம்

MINISTER OF ENGINEERING AND CONSTRUCTION SERVICES : OFFICIAL RESIDENCE

0242/'08

4. **ගරු විජිත රණවීර මහතා (ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு விஜித ரணவீர - மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண - சார்பாக)
(The Hon. Vijitha Ranaweera - on be half of - The Hon. R. P. A. Ranaweera Pathirana)

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) (i) ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපළක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිත කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் (அமைச்சரவை) அமைச்சருக்கு உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) ஆமெனில், அது அரசாங்க உடமையா என்பதையும்,

(iii) அரசாங்க உடமை இல்லையெனில், எந்த அடிப்படையில் அவ்விடுதி வழங்கப்பட்டுள்ள தென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டி ருப்பின், அது 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் திருத்தப்பட்டு அல்லது மேம்படுத்தப் பட்டுள்ளதா என்பதையும்,

(ii) திருத்தப்பட்டிருப்பின், மேற்படி ஒவ்வொரு ஆண்டிலும் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்,

(iii) மேற்படி விடுதியின் பாவனைக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் அரசாங்கச் செலவில் தளபாடங்கள் அல்லது வேறு உபகரணங்கள் கொள்வனவு செய்யப்பட்டுள்ளதா என்பதையும்,

(iv) ஆமெனில், செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்

அவர் வெவ்வேறாக இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி உத்தியோகபூர்வ விடுதிக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் பயன்படுத்தப்பட்டுள்ள மின்சாரம் மற்றும் நீர் அலகுகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்,

(ii) மேற்படி ஒவ்வொரு ஆண்டிலும் ஒவ்வொரு மாதமும் அரசாங்கத்தினால் செலவிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු විජිත රණවීර මහතා]

asked the Minister of Construction and Engineering Services, -:

(*a*) Will he inform this House,—

(i) whether an official residence has been provided for the Minister of Construction and Engineering Services (Cabinet);

(ii) if so, whether it is a property owned by the State; and

(iii) if it is not owned by the State, the basis on which it has been allocated?

(*b*) Will he submit to this House separately,—

(i) if an official residence has been allocated, whether it has been repaired or upgraded during the years 2005, 2006 and 2007;

(ii) if it has been repaired, the amount of money spent in each year for that purpose;

(iii) whether furniture or any other equipment for the use of the aforesaid official residence, has been purchased at Government expense during the years 2005, 2006 and 2007; and

(iv) if so, the amount spent on them?

(*c*) Will he state,—

(i) separately, the number of units of electricity and water that have been used at this official residence during each month of the years 2005, 2006 and 2007; and

(ii) the amount of money spent by the relevant Ministry for electricity and water used at the above mentioned official residence in each month of the aforesaid years?

(*d*) If not, why?

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා (ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன - நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne—Minister of Construction and Engineering Services)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled*

(අ) (i) ලබා දී තිබේ.
(ii) ඔව්.
(iii) පැන නොනඟී.

(ආ) (i) පැන නොනඟී.
(ii) පැන නොනඟී.
(iii) නැත.
(iv) පැන නොනඟී.

(ඇ) (i) නැත.
(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

## ක්‍රීඩා කටයුතු අමාත්‍යතුමා : නිල නිවස
### விளையாட்டுத்துறை, அமைச்சர் : உத்தியோகபூர்வ வசிப்பிடம்
MINISTER OF SPORTS : OFFICIAL RESIDENCE

0263/'08

4. **ගරු විජිත රණවීර මහතා (ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා** වෙනුවට**)**
(மாண்புமிகு விஜித ரணவீர - மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண - சார்பாக)
(The Hon. Vijitha Ranaweera - on be half of - The Hon. R. P. A. Ranaweera Pathirana)

ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,— (1) :

(අ) (i) ක්‍රීඩා කටයුතු (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපළක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිත කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මඟින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை, பொதுப் பொழுதுபோக்கு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) விளையாட்டுத்துறை (அமைச்சரவை அந்தஸ்தற்ற) அமைச்சருக்கு உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) ஆமெனில், அது அரசாங்க உடமையா என்பதையும்,

(iii) அரசாங்க உடமை இல்லையெனில், எந்த அடிப்படையில் அவ்விடுதி வழங்கப்பட்டுள்ளதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டி ருப்பின், அது 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் திருத்தப்பட்டு அல்லது மேம்படுத்தப் பட்டுள்ளதா என்பதையும்,

(ii) திருத்தப்பட்டிருப்பின், மேற்படி ஒவ்வொரு ஆண்டிலும் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்,

(iii) மேற்படி விடுதியின் பாவனைக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் அரசாங்கச் செலவில் தளபாடங்கள் அல்லது வேறு உபகரணங்கள் கொள் வனவு செய்யப்பட்டுள்ளதா என்பதையும்,

(iv) ஆமெனில், செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்

அவர் வெவ்வேறாக இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி உத்தியோகபூர்வ விடுதிக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் பயன்படுத்தப்பட்டுள்ள மின்சாரம் மற்றும் நீர் அலகுகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்,

(ii) மேற்படி ஒவ்வொரு ஆண்டிலும் ஒவ்வொரு மாதமும் அரசாங்கத்தினால் செலவிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sports and Public Recreation, :

(a) Will he inform this House,—

(i) whether an official residence has been provided for the Minister of Sports (non Cabinet);

(ii) if so, whether it is a property owned by the State; and

(iii) if it is not owned by the State, the basis on which it has been allocated?

(*b*) Will he submit to this House separately,—

(i) if an official residence has been allocated, whether it has been repaired or upgraded during the years 2005, 2006 and 2007;

(ii) if it has been repaired, the amount of money spent in each year for that purpose;

(iii) whether furniture or any other equipment for the use of the aforesaid official residence, has been purchased at Government expense during the years 2005, 2006 and 2007; and

(iv) if so, the amount spent on them?

(*c*) Will he state,—

(i) separately, the number of units of electricity and water that have been used at this official residence during each month of the years 2005, 2006 and 2007; and

(ii) the amount of money spent by the relevant Ministry for electricity and water used at the above mentioned official residence in each month of the aforesaid years?

(*d*) If not, why?

**ගරු ගාමිණී ලොකුගේ මහතා (ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - விளையாட்டுத்துறை, பொதுப் பொழுதுபோக்கு அலுவல்கள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Sports and Public Recreation)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**සභා මේසය මත තබන ලද පිළිතුර :*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled :*

(අ) (i) ඔව්.
(ii) නැත.
(iii) කුලී පදනම මත ලබා දී තිබේ.

(ආ) (i) නැත.
(ii) අදාළ නොවේ.
(iii) ඔව්.
(iv) 2005 - නැත, 2006 - 365,080/-, 2007 නැත

(ඇ) (i) අදාළ නොවේ.
(ii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

## සමුපකාර අමාත්‍යතුමා : නිල නිවස
**கூட்டுறவுத்துறை அமைச்சர் : உத்தியோகபூர்வ வசிப்பிடம்**
MINISTER OF CO-OPERATIVES : OFFICIAL RESIDENCE

0264/’08

6. **ගරු විජිත රණවීර මහතා (ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා** වෙනුවට**)**
(மாண்புமிகு விஜித ரணவீர - மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண - சார்பாக)
(The Hon. Vijitha Ranaweera on behalf of The Hon. R. P. A. Ranaweera Pathirana)

වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය — (1):

(අ) (i) සමුපකාර (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම් එය රජය සතු දේපළක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම් එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැය කළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහ භාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම් ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිත කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු විජිත රණවීර මහතා]

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මඟින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

வர்த்தகம், சந்தைப்படுத்தல் அபிவிருத்தி, கூட்டுறவுத்துறை, நுகர்வோர் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) கூட்டுறவுத்துறை (அமைச்சரவை அந்தஸ்தற்ற) அமைச்சருக்கு உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) ஆமெனில், அது அரசாங்க உடமையா என்பதையும்,

(iii) அரசாங்க உடமை இல்லையெனில், எந்த அடிப்படை யில் அவ்விடுதி வழங்கப்பட்டுள்ளதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டிருப் பின், அது 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டு களில் திருத்தப்பட்டு அல்லது மேம்படுத்தப்பட் டுள்ளதா என்பதையும்,

(ii) திருத்தப்பட்டிருப்பின், மேற்படி ஒவ்வொரு ஆண்டிலும் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்,

(iii) மேற்படி விடுதியின் பாவனைக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் அரசாங்கச் செலவில் தளபாடங்கள் அல்லது வேறு உபகரணங்கள் கொள் வனவு செய்யப்பட்டுள்ளதா என்பதையும்,

(iv) ஆமெனில், செலவிடப்பட்டுள்ள தொகை எவ்வள வென்பதையும்

அவர் வெவ்வேறாக இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி உத்தியோகபூர்வ விடுதிக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் பயன்படுத்தப் பட்டுள்ள மின்சாரம் மற்றும் நீர் அலகுகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்,

(ii) மேற்படி ஒவ்வொரு ஆண்டிலும் ஒவ்வொரு மாதமும் அரசாங்கத்தினால் செலவிடப்பட்ட தொகை எவ்வள வென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Marketing Development, Co-operatives and Consumer Services :

(*a*) Will he inform this House,—

(i) whether an official residence has been provided for the Minister of Co-operatives (non Cabinet);

(ii) if so, whether it is a property owned by the State; and

(iii) if it is not owned by the State, the basis on which it has been allocated?

(*b*) Will he submit to this House separately,—

(i) if an official residence has been allocated, whether it has been repaired or upgraded during the years 2005, 2006 and 2007;

(ii) if it has been repaired, the amount of money spent in each year for that purpose;

(iii) whether furniture or any other equipment for the use of the aforesaid official residence, has been purchased at Government expense during the years 2005, 2006 and 2007; and

(iv) if so, the amount spent on them?

(*c*) Will he state,—

(i) separately, the number of units of electricity and water that have been used at this official residence during each month of the years 2005, 2006 and 2007; and

(ii) the amount of money spent by the relevant Ministry for electricity and water used at the above mentioned official residence in each month of the aforesaid years?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ***සභාගත** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) ඔව්.( 2005 නොවැම්බර් සිට 2007 මැයි දක්වා)
(ii) රජය සතු දේපළක් නොවේ.
(iii) 1996.09.25 දිනැති කැබිනට් අනුමැතිය අනුව සහ 2006.11.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2006 හි සඳහන් පරිදි.

(ආ) (i) නැත.
(ii) ඉහත (ආ) (i) පැන නොනඟී.
(iii) නැත.
(iv) ඉහත (ආ) (iii) අනුව පැන නොනඟී.

(ඇ) (i) ආ (i) හි සඳහන් කාලය තුළ අදාළ නිවසේ ජල හා විදුලි ඒකක සම්බන්ධ තොරතුරු අමාත්‍යාංශය සතුව නොමැත.
(ii) ඇමුණුම මෙහි දක්වා ඇත.

(ඈ) අදාළ නොවේ.

ඇමුණුම

| *ගරු සමුපකාර අමාත්‍යතුමාගේ නිවාසය සඳහා ගෙවන ලද ජල බිල්පත් පිළිබඳ ගෙවීම්* | | *ගරු සමුපකාර අමාත්‍යතුමාගේ නිවාසය සඳහා ගෙවන ලද විදුලිය බිල්පත් පිළිබඳ ගෙවීම්* | |
|---|---|---|---|
| *අදාල කාල සීමාව* | *ගෙවූ මුදල (රු.)* | *අදාළ කාල සීමාව* | *ගෙවූ මුදල (රු.)* |
| 2006.01.01 සිට 2006.02.09 | 11,645.63 | 2006.01.07 සිට 2006.02.07 | 16,234.50 |
| 2006.02.09 සිට 2006.03.11 | | 2006.02.07 සිට 2006.03.08 | 14,906.25 |
| 2006.03.11 සිට 2006.04.08 | 4,947.50 | 2006.03.08 සිට 2006.04.08 | 18,474.75 |
| 2006.04.08 සිට 2006.05.11 | 4,369.03 | 2006.04.08 සිට 2006.05.08 | 15,754.75 |
| 2006.05.11 සිට 2006.06.14 | 6,934.13 | 2006.05.08 සිට 2006.06.08 | 17,517.25 |
| 2006.06.14 සිට 2006.07.13 | 5,362.50 | 2006.06.08 සිට 2006.07.07 | 18,225.75 |

| *ගරු සමුපකාර අමාත්‍යතුමාගේ නිවාසය සඳහා ගෙවන ලද ජල බිල්පත් පිළිබඳ ගෙවීම්* | | *ගරු සමුපකාර අමාත්‍යතුමාගේ නිවාසය සඳහා ගෙවන ලද විදුලිය බිල්පත් පිළිබඳ ගෙවීම්* | |
|---|---|---|---|
| *අදාල කාල සීමාව* | *ගෙවූ මුදල (රු.)* | *අදාළ කාල සීමාව* | *ගෙවූ මුදල (රු.)* |
| 2006.07.13 සිට 2006.08.13 | 4,457.75 | 2006.07.07 සිට 2006.08.07 | 17,239.00 |
| 2006.08.13 සිට 2006.09.13 | 8,417.75 | 2006.08.07 සිට 2006.09.07 | 15,258.50 |
| 2006.09.13 සිට 2006.10.14 | 7,015.25 | 2006.09.07 සිට 2006.10.08 | 23,099.00 |
| 2006.10.14 සිට 2006.11.11 | 7,095.00 | 2006.10.08 සිට 2006.11.08 | 19,756.75 |
| 2006.11.11 සිට 2006.12.11 | 6,892.25 | 2006.11.08 සිට 2006.12.08 | 25,501.75 |
| 2006.12.12 සිට 2007.01.13 | 8,414.83 | 2006.12.08 සිට 2007.01.07 | 24,105.50 |
| 2007.02.15 සිට 2007.03.15 | 4,867.50 | 2007.01.07 සිට 2007.02.07 | 22,162.00 |
| 2007.03.15 සිට 2007.04.12 | 4,785.00 | 2007.02.07 සිට 2007.03.08 | 21,753.50 |
| 2007.04.12 සිට 2007.05.15 | 5,327.63 | 2007.03.08 සිට 2007.04.07 | 25,119.75 |
| 2007.05.15 සිට 2007.06.12 | 4,310.50 | 2007.04.07 සිට 2007.05.08 | 23,609.25 |
| එකතුව | 94,842.25 | එකතුව | 318,718.25 |

## ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය : බඳවා ගැනීම්

### தேசத்தைக் கட்டியெழுப்புதல், தோட்ட உட்கட்டமைப்பு அமைச்சு : ஆட்சேர்ப்புகள்

MINISTRY OF NATION BUILDING AND ESTATE INFRASTRUCTURE DEVELOPMENT : RECRUITMENTS

0407/'08

8. **ගරු පී. වීරකුමාර දිසානායක මහතා (ගරු අචල ජාගොඩගේ මහතා** වෙනුවට**)**

(மாண்புமிகு பீ. வீரகுமார திஸாநாயக்க - மாண்புமிகு அச்சல ஜாகொடகே - சார்பாக)

(The Hon. P. Weerakumara Dissanayake - on behalf of - The Hon. Achala Jagodage)

ජාතිය ගොඩනැඟීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය—(2):

(අ) 2007 වර්ෂය තුළ ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

தேசத்தைக் கட்டியெழுப்புதல், தோட்ட உட்கட்டமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2007 ஆம் ஆண்டில் தேசத்தைக் கட்டியெழுப்புதல், தோட்ட உட்கட்டமைப்பு அமைச்சிற்கு அல்லது அதன் கீழுள்ள திணைக்களங்கள், கூட்டுத்தாபனங்கள் அல்லது வேறு நிறுவனங்களுக்கு புதிதாக ஆட்சேர்ப்பு செய்யப்பட்டுள்ளதா என்பதை அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) (i) ஆமெனில், மேற்படி ஒவ்வொரு நிறுவனத்திற்கும் ஆட்சேர்ப்பு செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்,

(ii) ஒவ்வொரு பதவிக்கும் ஆட்சேர்ப்பு செய்யப்பட்டவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்,

(iii) இவர்களில், சேவையில் நிரந்தரமாக்கப்பட்டவர்களின் எண்ணிக்கை மற்றும் பட்டதாரிகளின் எண்ணிக்கை ஆகியவற்றை வெவ்வேறாகவும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Nation Building and Estate Infrastructure Development:

(*a*) Will he inform this House whether a new batch of employees has been recruited, for the Ministry of Nation Building and Estate Infrastructure Development or Departments, Corporations or other institutions that come under it in the year 2007?

(*b*) Will he submit to this House,—

(i) separately, the number that has been recruited for each institution if such a batch has been recruited;

(ii) separately, the number that has been recruited for each post; and

(iii) separately, the number that has been confirmed in service and the number of graduates out of the aforesaid batch of employees?

(*c*) If not, why?

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**

( மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - மக்கள் தோட்டமுகாமை, அபிவிருத்திப் பிரதி அமைச்சர்)

(The Hon. Susantha Punchinilame - Minister of Nation Building)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட வினா :*
*Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i)

| *ආයතනය* | *බඳවා ගෙන ඇති සංඛ්‍යාව* |
|---|---|
| ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය | 05 |
| උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 01 |
| ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය | 19 |

| *ආයතනය* | *බඳවා ගෙන ඇති සංඛ්‍යාව* |
|---|---|
| (ii) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය | |
| අභ්‍යන්තර විගණක තනතුර | 01 (ස්ථිර) |
| කලාප කළමනාකාර තනතුර | 02 (කොන්ත්‍රාත්) |
| කාර්මික නිලධාරි | 01 (කොන්ත්‍රාත්) |
| ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුර | 01 (ස්ථිර) |
| උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | |
| සංචාරක බංගලා භාරකරු | 01 (මාස 06ක කාල සීමවකට අනියම් පදනමින් බඳවා ගෙන ඇත.) |
| ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය | |
| අධ්‍යක්ෂ සංවර්ධන | 01 (කොන්ත්‍රාත්) |
| ගණකාධිකාරි | 01 |
| ඉංජිනේරු | 01 (ස්ථිර) |
| සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 (ස්ථිර) |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 01 (ස්ථිර) |
| ගිණුම් සහකාර | 01 (ස්ථිර) |
| කාර්යාල කාර්ය සහායක | 01 (ස්ථිර) |
| කම්කරු | 02 (ස්ථිර) |
| ලිපිකරු | 01 (ස්ථිර) |
| කාර්මික නිලධාරි | 04 (ස්ථිර) |
| පරිපාලන නිලධාරි | 01 (කොන්ත්‍රාත්) |
| සංවර්ධන සහකාර | 02 (ස්ථිර) |
| රියැදුරු | 02 (ස්ථිර) |

(කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති සේවක සංඛ්‍යාව අනුව)

(iii) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය

| | | |
|---|---|---|
| ස්ථිර කර ඇති සංඛ්‍යාව | | 02 |
| අභ්‍යාන්තර විගණක තනතුර | 01 | |
| ව්‍යාපෘති සම්බන්ධිකාරක තනතුර | 01 | |
| උපාධිධාරීන් සංඛ්‍යාව | 04 | |
| අභ්‍යන්තර විගණක | 01 | |
| කලාප කළමනාකරු | 02 | |
| ව්‍යාපෘති සම්බන්ධීකාරක | 01 | |

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| ස්ථිර කර ඇති සංඛ්‍යාව | නැත. |
| උපාධිධාරීන් සංඛ්‍යාව | නැත. |

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| ස්ථිර කර ඇති සංඛ්‍යාව | 10 |
| උපාධිධාරින් සංඛ්‍යාව | 07 |

(ඇ) පැන නොනඟී.

## ජාතික ගොවිජන පොළ හා ප්‍රදර්ශනය : ගොවිජන වාසනා ලොතරැයිය

### தேசிய கமக்காரர்க்கள் சந்தை மற்றும் கண்காட்சி : கொவிஜன வாசனா லொத்தர்

### JATHIKA GOVIJANA POLA AND EXHIBITION GOVIJANA WASANA LOTTERY

0650/'08

12. **ගරු විජිත රණවීර මහතා (ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා වෙනුවට)**

(மாண்புமிகு விஜித ரணவீர - மாண்புமிகு எம். டி. நாமல் கருணாரத்ன- சார்பாக)

(The Hon. Vijitha Ranaweera - on behalf of - The Hon. M. D. Namal Karunaratne)

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය, —(2) :

(අ) ගොවි ජනතාව නඟා සිටු වීමේ ව්‍යාපෘතියක් ලෙස පැවැත් වූ "ජාතික ගොවිජන පොළ" සහ ප්‍රදර්ශනයේ ස්වභාවය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ජාතික ගොවිජන පොළ හා ප්‍රදර්ශනය පැවැත් වූ ස්ථාන කවරේද;

(ii) එම එක් එක් ගොවිජන පොළ හා ප්‍රදර්ශන පැවැත්වීම සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එක් එක් ගොවිජන පොළ හා ප්‍රදර්ශනය මඟින් ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පොළ හා ප්‍රදර්ශනයට සමගාමීව "ගොවිජන වාසනා" නමින් ලොතරැයි පතක් මුද්‍රණය කර අලෙවි කළේද;

(ii) එම ලොතරැයි අලෙවියෙන් ලද ආදායම කොපමණද;

(iii) එම ලොතරැයිය මඟින් ලබාදෙන ත්‍යාගයන්හි වටිනාකම ජයග්‍රාහී ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ත්‍යාග භාණ්ඩ හෝ ත්‍යාග මුදල් අදාළ ජයග්‍රාහකයිනට ලබා දී තිබේද;

(v) නොඑසේ නම් එම ත්‍යාග භාණ්ඩ හෝ ත්‍යාග මුදල් ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

கமத்தொழில் அபிவிருத்தி, கமநல சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) விவசாயிகளை மேம்படுத்தும் கருத்திட்டம் என்ற வகையில் நடத்தப்பட்ட "தேசிய கமக்காரர்கள் சந்தை" மற்றும் கண்காட்சி ஆகியவற்றின் தன்மை யாதென்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) அத்தேசிய கமக்காரர்கள் சந்தையும் கண்காட்சியும் நடத்தப்பட்ட இடம் யாது,

(ii) ஒவ்வொரு கமக்காரர்கள் சந்தையையும் கண்காட்சியையும் நடத்துவதற்குச் செலவான பணம் எவ்வளவு,

(iii) ஒவ்வொரு கமக்காரர்கள் சந்தை மற்றும் கண்காட்சி ஆகியவற்றின் மூலம் கிடைத்த இலாபம் அல்லது அடைந்த நட்டம் எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்குறிப்பிட்ட சந்தை மற்றும் கண்காட்சி ஆகியவற்றோடு இணைந்ததாக "கொவிஜன வாசனா" என்ற பெயரில் லொத்தர் சீட்டொன்று அச்சிடப்பட்டு விற்பனை செய்யப்பட்டதா,

(ii) அந்த லொத்தர் விற்பனையின் மூலம் கிடைத்த வருமானம் எவ்வளவு,

(iii) அந்த லொத்தர் மூலம் வழங்கப்படுகின்ற பரிசுகளின் பெறுமதி வெற்றி பெற்ற இடங்களின் பிரகாரம் வெவ்வேறாக எவ்வளவு,

(iv) இப்பரிசுப் பொருட்கள் அல்லது பரிசுப் பணம் சம்பந்தப்பட்ட வெற்றியாளர் களுக்கு வழங்கப்பட்டுள்ளதா,

(v) இன்றேல், அப்பரிசுப் பொருட்களை அல்லது பரிசுப் பணத்தை வழங்குவதற் காக எடுக்கப்படும் நடவடிக்கை யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agricultural Development and Agrarian Services :

(*a*) Will he inform this House the nature of the 'Jathika Govijana Pola' (National Agrarian Fair) and Exhibition which was held as a project to upgrade the farming community?

(*b*) Will he inform this House,—

(i) the places where the aforesaid 'Jathika Govijana Pola' and Exhibition were held;

(ii) the amount of money spent on holding each Govijana Pola and Exhibition; and;

(iii) the profit or loss made from each Govijana Pola and Exhibition?

(*c*) Will he state,—

(i) whether a lottery under the name of 'Govijana Wasana' was printed and sold concurrently with the aforesaid Govijana Pola and Exhibition;

(ii) the income received from the sale of the aforesaid lotteries;

(iii) separately, the value of the prizes that were offered by the aforesaid lottery with their corresponding places in the order in which, they were offered;

(iv) whether these prizes or prize money have been given to the relevant winners; and

(v) if they have not been given, the steps that will be taken to give the aforesaid prizes or prize money?

(*d*) If not, why?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
* *சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
* *Answer tabled :*

(අ) ජාතික ගොවිජන පොළ හා ප්‍රදර්ශනය ගොවි ප්‍රජාව සහ මහජනතාව කෘෂිකර්ම කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කිරීම, සේවා සැපයීම හා නව තාක්ෂණ ක්‍රම හඳුන්වා දී ඔවුන් කෘෂිකර්මයට එලදායී ලෙස නැඹුරු කිරීමට දිරි දීම, ගොවි ශක්ති වැඩසටහන යටතේ සහනදායි මිලට ට්‍රැක්ටර් ලබා දීම, කෘෂි උපකරණ සහ පැළ බෙදා දීම, ගොවීන්ට තම නිෂ්පාදන එම ප්‍රදර්ශන භූමියේ අලෙවි කිරීමට සැලැස්වීම තුළින් ඔවුන් දිරි ගැන්වීම සහ ගොවිතැන් සම්බන්ධව ප්‍රබෝධයක් ඇති කිරීම අරමුණු කොට ගෙන පැවැත්වූ වැඩසටහනක් වන අතර එමගින් කිසිදු ලාභයක් ඉපැයීමේ අරමුණින් තොරව පැවැත්වූ එකකි.

(ආ) (i) ඇඹිලිපිටිය මහවැලි ක්‍රීඩාංගණය, කළුතර නගර සභා ක්‍රීඩාංගණය, සහ කුරුණෑගල මාලිගාපිටිය ක්‍රීඩාංගණය.

(ii) ඇඹිලිපිටිය, කළුතර, සහ කුරුණෑගල පැවැත් වූ ගොවිජන පොළ සහ ප්‍රදර්ශනය සඳහා පිළිවෙළින් රු. 8,056,374.33, රු. 4,518,206.52 හා රු. 3,237,969.00 ක මුදලක් වැය කර ඇත.

(iii) ගොවිජන වාසනා නමින් අලෙවි කළ ලොතරැයි පත් සඳහා අනුග්‍රාහක පදනම මත ත්‍යාග ලබා දීමේ පදනමින් ඇඹිලිපිටියේ දී පැවැත් වූ ගොවිජන පොළ සහ ප්‍රදර්ශනයෙන් රු. 500,933.67ක ලාභයක්ද, කළුතර සහ කුරුණෑගලදී පැවැත් වූ ගොවිජන පොළ හා ප්‍රදර්ශනයෙන් රු. 2,572,491.52 හා 869,122.00 ක පාඩුවක්ද මූල්‍යමය වශයෙන් සිදු වී ඇත.

(ඇ) (i) ඔව්.

(ii) රු. 8,240,422.00

(iii)

| *ගොවිජන පොළ හා ප්‍රදර්ශනය* | *ත්‍යාගය* | | *දළ වටිනාකම රු.* |
|---|---|---|---|
| ඇඹිලිපිටිය | ප්‍රථම ත්‍යාගය | -05 | 2,300,000 |
| | දෙවන ත්‍යාගය | -10 | 100,000 |
| | තෙවන ත්‍යාගය | -10 | 95,000 |
| කලුතර | ප්‍රථම ත්‍යාගය | -03 | 345,000 |
| | දෙවන ත්‍යාගය | -05 | 50,000 |
| | තෙවන ත්‍යාගය | -10 | 95,000 |
| | සැනසිලි ත්‍යාග | -50 | 30,000 |
| කුරුණෑගල | ප්‍රථම ත්‍යාගය | -01 | 900,000 |
| | දෙවන ත්‍යාගය | -01 | 60,000 |
| | තෙවන ත්‍යාගය | -05 | 575,000 |
| | සිව්වන ත්‍යාගය | -05 | 50,000 |
| | පස්වන ත්‍යාගය | -10 | 95,000 |
| | සැනසිලි ත්‍යාග | -50 | 30,000 |

(iv) ඇඹිලිපිටියේ පැවති ගොවිජන පොළ හා ප්‍රදර්ශනයට සමගාමීව දිනුම් අදින ලද ගොවිජන වාසනා ලොතරැයියට අදාළ 02 වන හා 03 වන ස්ථානයට අයත් ත්‍යාග භාණ්ඩ ඉදිරිපත් වූ ජයග්‍රාහකයින්ට ලබා දී ඇත.

(v) ත්‍යාග ලබා දීමට එකඟ වූ සමාගම් එම කාර්යය ඉටු කර නැත.

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 13—0667/'08-(2), ගරු සමන්සිරි හේරත් මහතා.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு பீ. வீரகுமார திஸாநாயக்க)
(The Hon. P. Weerakumara Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු සමන්සිරි හේරත් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කෝට්ටේගොඩ තැපැල් කාර්යාල භූමිය : අධිකරණ තීන්දු

### கோட்டேகொட அஞ்சல் அலுவலகக் காணி : நீதிமன்றத் தீர்ப்பு

KOTTEGODA POST OFFICE LAND : COURTS JUDGMENTS AND POLICE COMPLAINTS

0709/'08

13. **ගරු විජිත රණවීර මහතා (ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு விஜித சணவீர - மாண்புமிகு எம். எம். பேமசிரி மானகே - சார்பாக)
(The Hon. Vijitha Ranaweera - on behalf of - The Hon. M. M. Pemasiri Manage)

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) කෝට්ටේගොඩ තැපැල් කාර්යාලය පිහිටි භූමිය සම්බන්ධයෙන් පැවැති නඩු විභාගවලදී අධිකරණ තුනකින් ලබා දුන් තීන්දු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

[ගරු විජිත රණවීර මහතා]

(ආ) (i) තැපැල් කාර්යාල භූමිය වටා ඉදිකර තිබූ තාප්පය 2008.06.29 වැනි ඉරිදා දින කඩා දමා භූමියෙන් කොටසක් යම් පුද්ගලයෙකුට ලබා දී තිබේද;

(ii) එම පුද්ගලයාගේ නම, ලිපිනය හා තනතුර කවරේද;

(iii) එම පුද්ගලයාට විධිමත් අනුමතියක් ලබා දී නොමැති නම් තැපැල් කාර්යාල දේපළට හානි සිදු කිරීම සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තුව මගින් පොලීසියට පැමිණිලි කර තිබේද;

(iv) එසේ නම් ඒ කවර පොලීසිය වෙතද;

(v) අදාළ පැමිණිල්ල කළේ කවර අයෙකු විසින්ද;

(vi) පැමිණිලි කළ දිනය, වේලාව සහ පැමිණිලි අංකය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම මහජන දේපළට හානි සිදු කර අත් පත් කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික පියවර ගන්නේද;

(ii) එසේ නම් ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

தபால், தொலைத்தொடர்புகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) கோட்டேகொட அஞ்சல் அலுவலகம் அமைந்துள்ள காணி தொடர்பில் நடைபெற்ற வழக்கு விசாரணைகளின் போது மூன்று நீதிமன்றங்களால் வழங்கப்பட்ட தீர்ப்புகள் யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அஞ்சல் அலுவலகத்தின் காணியைச் சுற்றிலும் அமைக்கப்பட்டிருந்த மதில் 2008.06.29 ஆம் திகதி ஞாயிற்றுக்கிழமை உடைக்கப்பட்டு காணியில் ஒரு பகுதி எவரேனும் ஒருவருக்கு வழங்கப்பட்டுள்ளதா,

(ii) அந்நபரின் பெயர், முகவரி மற்றும் பதவி யாது,

(iii) அந்நபருக்கு முறையான ஒரு அனுமதி வழங்கப்படாதிருப்பின் அஞ்சல் அலுவலகச் சொத்துக்குச் சேதம் விளைவித்தமை தொடர்பில் குறித்த திணைக்களத்தால் பொலிசுக்கு முறைப்பாடு செய்யப்பட்டுள்ளதா,

(iv) ஆமெனில், அது எந்தப் பொலிசுக்கு,

(v) குறித்த முறைப்பாடு யாரால் செய்யப்பட்டது,

(vi) முறைப்பாடு செய்யப்பட்ட திகதி, நேரம் மற்றும் முறைப்பாட்டு இலக்கம் யாது,

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி பொதுச் சொத்துக்குச் சேதம் விளைவித்து, கைப்பற்றியுள்ளமை தொடர்பில் தேவையான சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா,

(ii) ஆமெனில், அது எக் காலகட்டத்தினுள்

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Posts and Telecommunication, :

(*a*) Will he inform this House of the judgments given by three courts of law at the hearings of cases regarding the land where Kottegoda post office is located?

(*b*) Will he state,—

(i) whether the wall which had been built around the post office premises was demolished on Sunday the 29th of June 2008 and a portion of the land has been given to a certain person;

(ii) the name, address and the post of the person mentioned above;

(iii) if that person has not been granted proper approval, whether a complaint has been lodged with the police by the relevant department with regard to damaging the property of the post office;

(iv) if so, the police station where the complaint has been lodged;

(v) the name of the person who has lodged the relevant complaint; and

(vi) the date on which the aforesaid complaint was lodged, the time at which it was lodged and the number of the complaint?

(*c*) Will he state,—

(i) whether necessary legal action will be taken with regard to the act of taking possession of the aforesaid public property after causing damage to it; and

(ii) if so, the time frame it will be done?

(*d*) If not, why?

**ගරු මහින්ද විජේසේකර මහතා (විශේෂ ව්‍යාපෘති අමාත්‍යතුමා සහ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த விஜேசேகர - விசேட கருத்திட்டங்கள் அமைச்சரும் தபால், தொலைத்தொடர்புகள் அமைச்சரும்)

(The Hon. Mahinda Wijesekara - Minister of Special Project and Minister of Posts and Telecommunication)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled :*

(අ) ඔව්.

(01) මාතර මහේස්ත්‍රාත් අධිකරණය
නඩු අංක : - 53557 - 2001.02.28
වගඋත්තරකරු - නිමලා බුද්ධිමතී පෙරේරා, ආතර් විජේසූරිය
පෙත්සම්කරු - දික්වැල්ල ප්‍රාදේශීය ලේකම්

ප්‍රාදේශීය ලේකම් වෙත පාර ලබා දීමට දෙ වන වග උත්තරකරු එකඟ වී ඇත. ඒ අනුව අදාළ පාර භාර ගැනීමට ප්‍රාදේශීය ලේකම් වරයාට අවසර දෙන ලදී.

(02) මාතර මහේස්ත්‍රාත් අධිකරණය
නඩු අංක : - 51113 - 2001.11.20
වගඋත්තරකරු - නිමලා බුද්ධිමතී හේමසිරි පෙරේරා, කුමාරසිරි එදිරිවීර විජේසූරිය,
ආතර් එදිරිවීර විජේසූරිය
පැමිණිලිකරු - පොලිස් ස්ථානාධිපති, දික්වැල්ල

දෙ වන වග උත්තරකරුට මෙම නඩුවට අදාළ විධය වස්තුවේ බිම් කොටස් මාර්ග අයිතියට හිමිකම් නොමැති බවත්, එසේම එකී ඉඩම සම්බන්ධව හතර වන වග උත්තරකරුට ඇති නිරවුල් භුක්තියට සිදු විය හැකි සියලු බාධා මෙයින් තහනම් කෙරේ.

(03) දකුණු පළාත් බද මහාධිකරණය
නඩු අංක : - ප්‍රති/98/2000 - 2001.11.28
පැමිණිලිකරු - නිමලා බුද්ධිමතී පෙරේරා,කුමාරසිරි එදිරිවීර විජේසූරිය,
ආතර් එදිරිවීර විජේසූරිය
වග උත්තරකරු - පොලිස් ස්ථානාධිපති, දික්වැල්ල

පෙත්සම්කරු විසින් අංක 51113 දරන නඩුවේ 2000.06.05 දින දෙන ලද නියෝගය ප්‍රතිශෝධනය කර ඉවත් කිරීමට කරන ලද ඉල්ලීම සඳහා අවසර දෙමින් මහේස්ත්‍රාත්තුමා විසින් එම දිනයේ කරන ලද නියෝගය ගාස්තු රහිතව අවලංගු කරන ලදී.

(04) මාතර පළාත් බද මහාධිකරණය
නඩු අංක : - මහාධිකරණ ප්‍රති/90/03— 2004. 09. 24

පෙත්සම්කරුගේ (කුමාරසිරි එදිරිවීර විජේසූරියගේ) ඉල්ලීමට අදාළ ප්‍රතිශෝධන පත්‍රය ගාස්තු නොමැතිව නිෂ්ප්‍රභ කරන ලදී.

(ආ) (i) භූමියේ කොටසක් ලබා දී නොමැති අතර, තාප්පය ඉදි කිරිම නිසා වැසී තිබූ පාර ලබා දී ඇත. එය ප්‍රතිපත්ති තීන්දුවක් වන අතර, අධිකරණය මඟින් ලබා දී ඇති තින්දුවලින් ප්‍රතිපත්ති තීරණ ගැනිම වළක්වා නැත. යමෙකු මෙම ප්‍රතිපත්ති තීරණයට විරුද්ධ වන්නේ නම් අධිකරණ නියෝගයක් ලබා ගැනීමට අවස්ථාව තිබේ.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) අදාළ නොවේ.

(v) නොදනී.

(vi) නොදනී.

(ඇ) (i) මහජන දේපළකට හානි සිදු කර නොමැත.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අපේ එකඟතාව පරිදි ආර්. පී. ඒ. රණවීර මන්ත්‍රීතුමා විසින් 2008 නොවැම්බර් මස 10 වන දින අසන ලද 0224/'08 හා ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් 2008 නොවැම්බර් 17 වන දින අසන ලද 0050/'08 දරන ප්‍රශ්න දෙකට පිළිතුරු මේ අවස්ථාවේදී සභාගත කරනවා.

## විදේශ කටයුතු අමාත්‍යතුමා : නිල නිවස
### வெளிநாட்டலுவல்கள் அமைச்சர் : உத்தியோகபூர்வ வசிப்பிடம்
### MINISTER OF FOREIGN AFFAIRS : OFFICIAL RESIDENCE

0224/'08

2. **ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)
(The Hon. R. P. A. Ranaweera Pathirana)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) විදේශ කටයුතු (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම් එය රජය සතු දේපළක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම් එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහ භාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම් ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිත කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මඟින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) வெளிநாட்டலுவல்கள் (அமைச்சரவை) அமைச்சருக்கு உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) ஆமெனில், அது அரசாங்க உடமையா என்பதையும்,

(iii) அரசாங்க உடமை இல்லையெனில், எந்த அடிப்படையில் அவ்விடுதி வழங்கப்பட்டுள்ளதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டிருப்பின், அது 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் திருத்தப்பட்டு அல்லது மேம்படுத்தப்பட்டுள்ளதா என்பதையும்,

(ii) திருத்தப்பட்டிருப்பின் மேற்படி ஒவ்வொரு ஆண்டிலும் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்,

(iii) மேற்படி விடுதியின் பாவனைக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் அரசாங்கச் செலவில் தளபாடங்கள் அல்லது வேறு உபகரணங்கள் கொள்வனவு செய்யப்பட்டுள்ளதா என்பதையும்,

(iv) ஆமெனில், செலவிடப்பட்டுள்ள தொகை எவ்வள வென்பதையும்

அவர் வெவ்வேறாக இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி உத்தியோகபூர்வ விடுதிக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் பயன்படுத்தப்பட்டுள்ள மின்சாரம் மற்றும் நீர் அலகுகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்,

(ii) மேற்படி ஒவ்வொரு ஆண்டிலும் ஒவ்வொரு மாதமும் அரசாங்கத்தினால் செலவிடப்பட்ட தொகை எவ்வள வென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(*a*) Will he inform this House,—

(i) whether an official residence has been provided for the Minister of Foreign Affairs (Cabinet) ;

(ii) if so, whether it is a property owned by the State; and

(iii) if it is not owned by the State, the basis on which it has been allocated?

[ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා]

(*b*) Will he submit to this House separately—

(i) if an official residence has been allocated, whether it has been repaired or upgraded during the years 2005, 2006 and 2007 ;

(ii) if it has been repaired, the amount of money spent in each year for that purpose;

(iii) whether furniture or any other equipment for the use of the aforesaid official residence, has been purchased at Government expense during the years 2005, 2006 and 2007; and

(iv) if so, the amount spent on them;

(*c*) Will he state-

(i) separately, the number of units of electricity and water that have been used at this official residence during each month of the years 2005, 2006 and 2007; and

(ii) the amount of money spent by the relevant Ministry for electricity and water used at the above mentioned official residence in each month of the aforesaid years?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්. එය රජයට අයත් වේ.

(iii) පැන නොනඟී.

(ආ) (i) ඔව්. 2007 වර්ෂයේදී එය අලුත්වැඩියා කර තිබේ. 2005 වසරේ සිට විවිධ විදේශ අමාත්‍යවරුන් හතර (04) දෙනෙක් එම තනතුරට පත්ව ඇති අතර, ඔවුන් විසින් නිල නිවාස හතර (04) ක් භාවිත කර ඇත.

(ii) එක් එක් වර්ෂයේදී සිදු කළ අලුත්වැඩියා කටයුතු සඳහා පිරිවැය පහත පරිදිය:
2005 - නැත.
2006 - නැත.
2007 - රු. 2,965,374.28

(iii) ඔව්, 2007 වර්ෂ තුළදී මිල දී ගැනීම් සිදු කර තිබේ.

(iv) ලී බඩු හා වෙනත් උපකරණ සඳහා වියදම් කළ මුදල දැක්වේ:
2005 - නැත.
2006 - නැත.
2007 - රු. 1,391,700.00

(ඇ) (i) 2005, 2006 සහ 2007 යන වසරවල එක් එක් මාසය තුල පරිභෝජනය කළ විදුලි හා ජල ඒකක සංඛ්‍යාව ඇතුළත් උපලේඛනයක් මේ සමඟ අමුණා ඇත. (කරුණාකර ඇමුණුම 1 බලන්න) විදුලි හා ජල පරිභෝජනය ඉහළ මට්ටමක පැවැතීම හේතුව 75 දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය ආරක්ෂක අංශයේ හා විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන්ගෙන් සැදුම් ලත් ආරක්ෂක බල ඇණියක් සේවයෙහි යොදවා තිබීම බව සඳහන් කළ යුතුය.

(ii) කරුණාකර ඇමුණුම 2 බලන්න.

(ඈ) පැන නොනඟී.

ඇමුණුම 1

**විදුලිය හා ජල පරිභෝජන ඒකක (2005 - 2007)**

**විදුලිය**

**2005**

| **කාල සීමාව** | **ඒකක** |
|---|---|
| 01.01.2005-31.02.2005 | විස්තර නොමැත. |

| 2006 | | 2007 | |
|---|---|---|---|
| **කාල සීමාව** | **ඒකක** | **කාල සීමාව** | **ඒකක** |
| 22.12.2005 - 20.01.2006 | 4266 | 16.02.2007 - 20.03.2007 | 2815 |
| 20.01.2006 - 17.02.2006 | 5037 | 20.03.2007 - 22.04.2007 | 3678 |
| 17.02.2006 - 22.03.2006 | 4952 | 22.04.2007 - 23.05.2007 | 3820 |
| 22.03.2006 - 22.04.2006 | 5253 | 23.05.2007 - 16.06.2007 | 2646 |
| 25.04.2006 - 25.05.2006 | 5000 | 16.06.2007 - 20.07.2007 | 3471 |
| 25.05.2006 - 20.06.2006 | 3976 | 20.07.2007 -14.08.2007 | 3291 |
| 20.06.2006 - 18.07.2006 | 4253 | 14.08.2007 - 16.09.2007 | 1644 |
| 19.07.2006 - 21.08.2006 | 7499 | 14.08.2007 - 18.09.2007 | 6692 |
| 22.08.2006 - 19.09.2006 | 4456 | 18.09.2007 - 19.10.2007 | 5315 |
| 19.09.2006 - 20.10.2006 | 4373 | 19.10.2007 - 19.11.2007 | 6582 |
| 20.10.2006 - 17.11.2006 | 3802 | 19.11.2007 - 22.12.2007 | 6061 |
| 17.11.2006 - 19.12.2006 | 5305 | 22.12.2007 - 17.01.2008 | 5139 |

**ජලය**

**2005**

| **කාලසීමාව** | **ඒකක** |
|---|---|
| 01.01.2005 - 31.02.2005 | විස්තර නොමැත. |

| **2006** | | **2007** | |
|---|---|---|---|
| **කාලසීමාව** | **ඒකක** | **කාලසීමාව** | **ඒකක** |
| 2006.01.01-2006-12.31 | විස්තර නොමැත. | 28.02.2007 - 03.04.2007 | විස්තර නොමැත. |
| | | 03.04.2007 - 07.05.2007 | විස්තර නොමැත. |
| | | 07.06.2007 - 30.07.2007 | විස්තර නොමැත. |
| | | 07.06.2007 - 30.07.2007 | විස්තර නොමැත. |
| | | 24.08.2007 - 27.09.2007 | 367 |
| | | 27.09.2007 - 26.10.2007 | 392 |
| | | 26.10.2007 - 20.12.2007 | විස්තර නොමැත. |
| | | 20.12.2007 - 24.01.2008 | 569 |

විදුලිය හා ජල පරිභෝජන වියදම් (2005 - 2007)

විදුලිය

2005

| කාල සීමාව | වියදම් (රු.) |
|---|---|
| 29.12.2004 - 27.01.2005 | 101,391.00 |
| 27.01.2005 - 20.02.2005 | 98766.60 |
| 24.02.2005 - 24.03.2005 | 97497.80 |
| 24.03.2005 - 21.04.2005 | 109937.60 |
| 01.05.2005 - 31.05.2005 | 142947.80 |
| 01.06.2005 - 30.06.2005 | 26463.43 |
| 01.07.2005 - 24.08.2005 | 101822.00 |
| 25.08.2005 - 29.09.2005 | 78987.00 |
| 25.11.2005 - 18.12.2005 | 158599.98 |

2006

| කාල සීමාව | වියදම් (රු.) |
|---|---|
| 22.12.2005 - 20.01.2006 | 75,806.85 |
| 20.01.2006 - 17.02.2006 | 89,875.00 |
| 17.02.2006 - 22.03.2006 | 88,272.85 |
| 22.03.2006 - 22.04.2006 | 93,681.99 |

| කාල සීමාව | වියදම් (රු.) |
|---|---|
| 25.04.2006 - 25.05.2006 | 89,325.10 |
| 25.05.2006 - 20.06.2006 | 70,959.14 |
| 20.06.2006 - 18.07.2006 | 76,113.67 |
| 19.07.2006 - 21.08.2006 | |
| 22.08.2006 - 19.09.2006 | 213,960.18 |
| 19.09.2006 - 20.10.2006 | |
| 20.10.2006 - 17.11.2006 | 315,828.04 |
| 17.11.2006 - 19.12.2006 | |

2007

| කාල සීමාව | වියදම් (රු.) |
|---|---|
| 16.02.2007 - 20.03.2007 | 64,758.96 |
| 20.03.2007 - 22.04.2007 | 85,189.92 |
| 22.04.2007 - 23.05.2007 | 88,711.68 |
| 23.05.2007 - 16.06.2007 | 61,334.88 |
| 16.06.2007 - 20.07.2007 | 80,783.76 |
| 20.07.2007 - 14.08.2007 | 76.586.16 |
| 14.08.2007 - 16.09.2007 | 36,862.08 |
| 14.08.2007 - 18.09.2007 | 156,654.00 |
| 18.09.2007 - 19.10.2007 | 124,232.88 |
| 19.10.2007 - 19.11.2007 | 154,336.80 |
| 19.11.2007 - 22.12.2007 | 141.810.00 |
| 22.12.2007 - 17.01.2008 | 120,420.72 |

ජලය

2005

| කාල සීමාව | වියදම් (රු.) |
|---|---|
| 2004.12.29. - 2005.02.08 | 7125.68 |
| 2004.12.29 - 2005.02.08 | 17,615.90 |
| 2005.02.08 - 2005.02.26 | 8940.25 |
| 2005.02.08 - 2005.02.26 | 8890.75 |
| 2005.02.26 - 2005.04.01 | 14,880.20 |
| 2005.02.26 - 2005.04.01 | 13,296.20 |
| 2005.04.07 - 2005.05.05 | 35,227.50 |
| 2005.04.07 - 2005.05.05 | 5940.00 |
| 2005.05.05 - 2005.06.09 | 18,013.76 |
| 2005 May - 2005 Aug | 18,038.70 |
| 2005 May - 2005 Aug | 69,778.66 |

2006

| කාල සීමාව | වියදම් (රු.) |
|---|---|
| වියදම් දරා නොමැත. | |

2005

| කාල සීමාව | වියදම් (රු.) |
|---|---|
| 28.02.2007 - 03.04.2007 | 759.00 |
| 03.04.2007 - 07.05.2007 | |
| 07.06.2007 - 30.07.2007 | 384.00 |
| 07.06.2007 - 30.07.2007 | 430.00 |
| 24.08.2007 - 27.09.2007 | 36,520.13 |
| 27.09.2007 - 26.10.2007 | 35,514.00 |
| 26.10.2007 - 20.12.2007 | 81,462.00 |
| 20.12.2007 - 24.01.2008 | 67.499.00 |

# විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ලේකම්තුමා : විදේශ සංචාර

**வெளிநாட்டலுவல்கள் அமைச்சர் மற்றும் செயலாளர் : வெளிநாட்டு விஜயங்கள்**

MINISTER OF FOREIGN AFFAIRS AND SECRETARY : FOREIGN VISITS

0050/08

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) (i) ගරු අමාත්‍යතුමා සහ ඔහුගේ ලේකම්වරයා ඔවුන් විදේශ කටයුතු අමාත්‍යධුරයේ සහ ලේකම් ධුරයේ වැඩ භාර ගත් දා සිට සංචාරය කර ඇති රටවල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ එම සංචාරවලදී ඔවුන් මුණ ගැසී ඇති පුද්ගලයින්ගේ නම් සහ තනතුරු කවරේද;

(iii) එම සංචාර සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සංචාරවලදී ලබා ගත් වාසි සහාගත තත්ත්වයන් පිළිබඳ වාර්තාවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම එකිනෙක සංචාරයට වැය වූ වියදම කොපමණද

(ii) ඔවුන් කැටුව ගිය පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) ඒ කැටුව යැම්වලට හේතු ද සමඟින් ඔවුන් නිසා වැය වූ මුදල කොපමණද;

(iv) අමාත්‍යතුමා සහ ඔහුගේ ලේකම්වරයා එක විට රටින් බැහැරව නොසිටිය යුතු යැයි ජනාධිපතිතුමා විසින් නියෝගයක් පනවා තිබේද;

(v) මෙය අවස්ථා ගණනාවකදීම කඩකර නැතිද ;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) (i) වත්මන් අමාත්‍යතුමාට පෙර සිටි විදේශ අමාත්‍යතුමාගේ නම කුමක්ද;

(ii) එතුමා අමාත්‍යධුරය භාරගත් දිනයත්, එතුමා විසින් සිදු කළ විදේශ සංචාර සංඛ්‍යාවත්, ඊට වැය වූ මුදලත් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

வெளிநாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) வெளிநாட்டு அமைச்சராகப் பதவியேற்றதிலிருந்து அமைச்சரும் அவரது செயலாளரும் விஜயம் செய்த நாடுகளின் எண்ணிக்கையையும்,

(ii) தமது விஜயங்களின் போது, அவர்கள் சந்தித்துப் பேசிய ஆட்களின் பெயர்களையும் பதவிகளையும்,

(iii) அத்தகைய விஜயங்களுக்கான காரணங்களையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) அத்தகைய விஜயங்களின் சாதனைகள் பற்றிய அறிக்கை யொன்றை அவர் சபாபீடத்தில் சமர்ப்பிப்பாரா?

(இ) (i) ஒவ்வொரு விஜயத்தின் போதும் ஏற்பட்ட செலவினத்தையும்,

(ii) அவர்களுடன் சென்றவர்களின் பெயர்களையும்,

(iii) அவர்களினால் ஏற்பட்ட செலவினையும், அவர்கள் கூட்டிச் செல்லப்பட்டதன் காரணத்தையும்,

[ගරු රවි කරුණානායක මහතා]

(iv) ஒரே நேரத்தில் அமைச்சரும் செயலாளரும் நாட்டுக்கு வெளியே செல்லக் கூடாது என சனாதிபதி கட்டளையிட்டிருந்தாரா என்பதையும்,

(v) இது பல தடவைகளில் மீறப்படவில்லையா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) தற்போதைய அமைச்சருக்கு முந்திய வெளிநாட்டு அலுவல்கள் அமைச்சரின் பெயர் என்ன என்பதையும்,

(ii) அவர் பதவி ஏற்ற திகதியையும், அவர் மேற்கொண்ட வெளிநாட்டு விஜயங்களின் எண்ணிக்கையை அவற்றுடன் தொடர்புடைய செலவினங்களுடன்

அவர் தெரிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs :

(a)Will he inform this House-

(i) the number of countries that the Minister and his Secretary visited since they assumed office as Minister of Foreign Affairs and Secretary respectively:

(ii) the names and the designations of the persons they had met during their visits: and

(iii) the reasons for such visits?

(b) Will he table a report on achievements of such visits?

(c) Will he state-

(i) the cost incurred for each visit:

(ii) the names of the persons accompanied with them:

(iii) the cost incurred on them along with the reasons for such accompany:

(iv) whether the President had ordered that the Minister and his Secretary should not be out of the country at the same time: and

(v) whether this had not been flouted many times over?

(d) Will he also state-

(i) the name of the Minister of Foreign Affairs prior to the present Minister; and

(ii) the date he had assumed office and the number of overseas visits he had made along with the cost related to them?

(e) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled*

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යවරයා සංචාරය කළ රටවල් ගණන 21
විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සංචාරය කළ රටවල් ගණන 16

(ii) එවැනි සංචාරවලදී ඔවුන් සමඟ රැස්වීම් පැවැත්වූ අතිවිශේෂ පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම පිළිවෙළින් i වැනි ඇමුණුමෙහි හා ii වැනි ඇමුණුමෙහි දැක්වේ.

(iii) ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සම්බන්ධතා අනුව ඇති නිල වගකීම් නිසා විදේශ කටයුතු අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නිල මට්ටමින් මෙම රැස්වීම්වලට සහභාගි විය යුතු වූ හෙයින් මෙම සංචාරයන් නොවැලක්විය හැකි විය.

(ආ) මෙම සංචාර මගින් ලබා ඇති ආර්ථික හා දේශපාලන ප්‍රතිලාභ පිළිබඳ වාර්තා iii වැනි හා iv වැනි ඇමුණුම්වල ඇත.

(ඇ) (i) අමාත්‍යතුමාගේ සහ ලේකම්වරයාගේ සංචාරයේ වියදම් පිළිබඳ උපලේඛනය v වැනි ඇමුණුමෙහි හා vi වැනි ඇමුණුමෙහි දැක්වේ.

(ii) ඩී. ඩී. ඒ. වීරසිංහ මහතා (මාධ්‍ය ලේකම්) එස්. ජී. ඊ. සී. ප්‍රනාන්දු මහතා (පෞද්ගලික ආරක්ෂක නිලධාරි) පී.සී. ද සිල්වා මහතා (පෞද්ගලික ආරක්ෂක නිලධාරි) නිශාන්ත ද සිල්වා මහතා (පෞද්ගලික ආරක්ෂක නිලධාරි) සහ සී. ෆොන්සේකා මහතා (සම්බන්ධීකරණ ලේකම්) යන පිරිස මාරුවෙන් මාරුවට අමාත්‍යතුමන් කැටුව ගියහ.

(iii) ඇමැතිතුමන් කැටුව ගිය පිරිස සම්බන්ධයෙන් වූ පිරිවැය රු. 8,592.216/- කි. ඔවුන් සහභාගි කරවා ගන්නා ලද්දේ ආරක්ෂක හේතුන් මත හා තොරතුරු බෙදා හැරීම් සඳහා වේ.

(iv) එවැනි නියෝගයක් නොමැත.

(v) පැන නොනඟී.

(ඈ) (i) වර්තමාන අමාත්‍යවරයාට පෙර විදේශ කටයුතු භාර අමාත්‍යධුරය දරන ලද්දේ ගරු මංගල සමරවීර මහතාය.

(ii) තනතුර භාර ගත් දිනය ,2005 නොවැම්බර් 24
විදේශ සංචාර ගණන : 16
සංචාර සඳහා වැයවූ මුළු වියදම : රු. 7,432.245/-

(ඉ) පැන නොනඟී.

**ඇමුණුම 1**

***සභා මේසය මත තබන ලද ඇමුණුම :**
* *சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
* *Annexure tabled :*

**විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාරවලදී මුණ ගැසී ඇති පුද්ගලයන්ගේ නම් සහ තනතුරු**

| *සංචාරය කරන ලද රටවල්* | *නම සහ තනතුර* |
|---|---|
| ජර්මනිය-බර්ලින් | ගරු ෆ්‍රෑන්ක් වෝල්ටර් ස්ටෙයින්මෙයිර්, විදේශ කටයුතු අමාත්‍ය<br>පීටර් අල්ටමයිර්, රාජ්‍ය පාර්ලිමේන්තු ලේකම්<br>ගරු රුප්‍රව් පොලොන්ස් මහතා, සභාපති විදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු සභාව<br>තිලෝ හෙප් මහතා, සභාපති ආර්ථික සහයෝගීතා හා සංවර්ධන පිළිබඳ පාර්ලිමේන්තු සභාව<br>ජෝශප් වින්කලර් මහතා, සභාපති දකුණු ආසියානු පාර්ලිමේන්තු කණ්ඩායම |
| මාලදිවයින | අතිගරු මවුමූං අබ්දුල් ගයුම් මහත් ජනාධිපති<br>ජනාධිපති ආර්යාව |
| චීනය | අතිගරු ජනාධිපති චීන මහජන ජනරජය<br>උප ආණ්ඩුකාර සොන් සාන් මහතා |
| දිල්ලි | 14 වන සාර්ක් සමුළුව<br>සාර්ක් රාජ්‍යයන්හි විදේශ අමාත්‍යවරුන්<br>අතිගරු ආචාර්ය මන්මෝහන් සිං ඉන්දීය අගමැති<br>14 වන සාර්ක් සමුළුවේ සභාපති<br>සාර්ක් සාමාජික රාජ්‍යයන්හි ආණ්ඩු ප්‍රධානීන් |

| සංචාරය කරන ලද රටවල් | නම සහ තනතුර |
|---|---|
| එක්සත් රාජධානිය | ගරු මාග්‍රට් බෙකට් මහත්මිය, පාර්ලිමේන්තු මන්ත්‍රී පොදු රාජ්‍ය හා විදේශ කටයුතු රාජ්‍ය ලේකම්<br>ගරු ගැරුත් තොමස් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ජාත්‍යන්තර සංවර්ධන රාජ්‍ය ලේකම්<br>ගරු පෝල් මර්ෆි මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ආරක්ෂක හා බුද්ධි අංශය පාර්ලිමේන්තු කමිටු, සභාපති<br>ගරු ස්ටීවන් ටිම්ස් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී භාණ්ඩාගාර ප්‍රධාන ලේකම්<br>ගරු ඩොනල්ඩ් සී. මැකිනම් මහතා, පොදු රාජ්‍ය සංගමයේ මහ ලේකම් |
| ඉතාලිය | අතිගරු මැසිමෝ ඩී ඇලෙමා මහතා, විදේශ කටයුතු අමාත්‍ය<br>අතිගරු ගුලියානෝ අමාටෝ මහතා, ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය<br>අතිගරු ගුලායෝ අන්ඩ්‍රෙට්ටි මහතා, සෙනෙට් සභික |
| ග්‍රීසිය | ගරු දොරා බකයන්නෙ මහත්මිය, විදේශ කටයුතු අමාත්‍ය<br>ගරු එව්රිපිඩ් ස්ටයිලියනඩිස් මහතා, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය |
| කුවේට් | අතිගරු අල් සබා අමීර් මහතා, කුවේට් රාජ්‍යයේ රජතුමා<br>අතිගරු ෂයික් නසාර් අල් මොහොමඩ් අල් අහමඩ් අල් ජබීර් අල් සබා මහතා, අග්‍රාමාත්‍ය<br>අබ්දුල් වහාබ් අල් බෙඩාර් මහතා, මුදල් අධ්‍යක්ෂ ජනරාල්<br>අතිගරු අලී අල් ඥානිම් මහතා, වාණිජ හා කර්මාන්ත සභාපති |
| ඉරානය | අතිරු මහමුඩ් අහමජිනේජාඩ් මහතා, ඉරාන ජනාධිපති<br>අතිගරු ෂෙයික් නසාර් අල් මොහොමඩ් අල් අහමඩ් අල් ජබා අල් සබා මහතා, අග්‍රාමාත්‍ය<br>අතිගරු ෂයික් මොහොමඩ් සබා අල් ෂලීම් අල් සබා මහතා, නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා විදේශ කටයුතු අමාත්‍ය<br>අතිගරු ඩොවුඩ් ඩැනේස් ජැපරි මහතා, මුදල් හා ආර්ථික අමාත්‍ය<br>අතිගරු හුඩඩ් අඩෙල් මහතා, පාර්ලිමේන්තුවේ ඉස්ලාම් උපදේශක කාරක සභාවේ කථානායක |
| තායිලන්තය | ගරු සමක් සුන්දරවෙජ් මහතා, අග්‍රාමාත්‍ය<br>ගරු නොප්පාඩන් පැට්ටමා මහතා, විදේශ කටයුතු අමාත්‍ය<br>ගරු සොම්කෙයට් අනුරාස් මහතා, නියෝජ්‍ය සභාපති වෙළඳ මණ්ඩලය |
| සිංගප්පූරුව | ගරු අදම් ඉන්ග්‍රම් මහතා, රාජ්‍ය සන්නද්ධ බල අමාත්‍ය<br>ගරු ඒ කේ අන්තනි මහතා, ඉන්දීය ආරක්ෂක අමාත්‍ය<br>ජෙනරාල් විනායි පට්ටිය කුල් මහතා, තායිලන්ත ආරක්ෂක අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්<br>ජෙනරාල් යිශාන් චුල් හග් මහතා, පකිස්තානයේ මාණ්ඩලික ප්‍රධානීන්ගේ සභාපති |
| ජපානය | යරිකෝ කොරිකි මහත්මිය, අග්‍රාමාත්‍ය විශේෂ උපදේශිකා<br>තානාපති අකියෝ සුදා මහතා, ජාත්‍යන්තර ත්‍රස්තවාදයට එරෙහි සංවිධානයේ ප්‍රධානී<br>ගරු ෆුමියෝ කුමා මහතා, හිටපු ආරක්ෂක අමාත්‍ය<br>ගරු තාරෝ අසෝ මහතා, විදේශ කටයුතු අමාත්‍ය (වර්තමානයේ අග්‍රාමාත්‍ය)<br>ආණ්ඩුකාර කියුසුක් සිනොසාවා මහතා |
| නේපාලය | ගරු සහනා ප්‍රදන් මහතා, නේපාල් විදේශ කටයුතු අමාත්‍ය |
| මියන්මාරය | අතිගරු බ්‍රිගේඩියර් ජනරාල් තුරා මින්ට් මැනුග් |

| සංචාරය කරන ලද රටවල් | නම සහ තනතුර |
|---|---|
| (යන්ගුන්) | මහතා, ආගමික කටයුතු අමාත්‍ය<br>අතිගරු මේජර් ජනරාල් තෙයින් අන්ග් මහතා, වන සංරක්ෂණ අමාත්‍ය<br>අතිගරු මේජර් ජනරාල් සෝ නයිග් මහතා, හෝටල් හා සංචාරක අමාත්‍ය<br>අතිගරු හියා ටන් මහතා, මුදල් හා ආදායම් අමාත්‍ය<br>අතිගරු බ්‍රිගේඩියර් ජනරාල් ටිං නයින් තෙයින් මහතා, වාණිජ කටයුතු අමාත්‍ය |
| ඩකා | ඉෆ්තිකා චවුදු මහතා, බංගලාදේශයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය උපදේශක |
| ලිබියාව | අතිගරු අල් බැකිඩැඩී අලි අල් මොහොමදි මහතා, අග්‍රාමාත්‍ය<br>අතිගරු මොහොමඩ් සෙයෙල්ලා මහතා, වැඩ බලන විදේශ කටයුතු අමාත්‍ය<br>අතිගරු මොහොමඩ් අලි අල් හවැස් මහතා, මුදල් හා විදේශ ආයෝජන අමාත්‍ය<br>අතිගරු අලි අබ්දුල් අසීස් අල් අසවි මහතා, ආර්ථික වෙළඳ හා ආයෝජන අමාත්‍ය |
| මැලේසියා | ගරු සයිඩ් හමීඩ් අල් බාර් මහතා, විදේශ කටයුතු අමාත්‍ය<br>ගරු ඩාටෝ ශ්‍රී මොහොමඩ් නජීබ් තුන් මහතා, නියෝජ්‍ය අග්‍රාමාත්‍ය<br>ප්‍රංශයේ ගරු බ්‍රයිස් හෝටෙෆියුක්ස් මහතා, ආගමන හා විගමන ජාතික අනන්‍යතාව අමාත්‍ය<br>ගරු රිචර්ඩ් බාර්ක මහතා, නවසීලන්තයේ අභ්‍යන්තර කටයුතු අමාත්‍ය |
| බෙල්ජියම | අතිගරු හර්මන් වැන් රොම්පි මහතා, කථානායක<br>අතිගරු කැරල් ද ගුජ් මහතා, විදේශ කටයුතු අමාත්‍ය<br>බෙල්ජියමේ අස්ට්‍රික් කුමරු<br>බෙනිටා පෙරෝ වෝල්ඩ්නර් මහත්මිය, විදේශ සම්පත් කොමසාරිස්<br>ඇන්ටෝනියෝ කැවාකෝ මහතා, අධ්‍යක්ෂ ජනරාල් යුරෝපා මානුෂිකවාදී කාර්යාලය |
| ප්‍රංශය | ආචාර්ය බර්නාඩ් කොච්නර් මහතා, විදේශ හා යුරෝපා කටයුතු අමාත්‍ය<br>ක්‍රිස්ටියන් එස්ටොසි මහතා, අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්<br>ඇක්ෂල් පොනියෝටොස්කි මහතා, ජාතික සභාවේ විදේශ කටයුතු පිළිබඳ සභාපති<br>අලියන් රොඩොඩ් හිටපු ජනාධිපති |
| ජර්මනිය | වෝල්කර් චුෆ් මහතා, යුරෝපා කටයුතු මහ රාජ්‍ය අමාත්‍ය |
| බෙල්ජියම් | අතිගරු හර්මන් වැන් රොම්පි මහතා, කථානායක<br>අතිගරු කැරල් ද ගුජ් මහතා, විදේශ කටයුතු අමාත්‍ය<br>බෙල්ජියමේ අස්ට්‍රික් කුමරු<br>බෙනිටා පෙරෝ වෝල්ඩ්නර් මහත්මිය, විදේශ සම්පත් කොමසාරිස්<br>ඇන්ටෝනියෝ කැවාකෝ මහතා, අධ්‍යක්ෂ ජනරාල් යුරෝපා මානුෂිකවාදි කාර්යාලය |
| නිව්යෝක් | ජී. ස්කොට් නිච්ෂන් මහතා, ප්‍රධාන විධායක නිලධාරි යේමනය<br>ප්‍රනාබ් මුකර්ජී මහතා, ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය<br>අතිගරු ඔලෆර් ගිම්ෂන් මහතා, අයිස්ලන්තයේ ජනාධිපති<br>ජොසිට් ෂිරාන් මහත්මිය, විධායක අධ්‍යක්ෂ ලෝක ආහාර සංවිධානය<br>අතිගරු මොහොමඩ් අහමඩිනජාඩ් මහතා, ඉරාන ජනාධිපති<br>අතිගරු මොහොමඩ් අබ්බාස් මහතා, පලස්තීන ජනාධිපති<br>කමල් ඩාවිස් මහතා, එක්සත් ජාතීන්ගේ සංවර්ධන සංවිධානයේ පරිපාලන නිලධාරි<br>නිකොලොස් බර්නස් මහතා, ඇමෙරිකාවේ |

| *සංචාරය කරන ලද රටවල්* | *නම සහ තනතුර* |
| --- | --- |
| නිව්යෝක් | දේශපාලන කටයුතු සහායක ලේකම්<br>අතිගරු බැන් කී මූං මහතා, එක්සත් ජාතීන්ගේ මහලේකම්<br>රධිකා කුමාරස්වාමි මහත්මිය, යුද්ධයෙන් අවතැන් වූ දරුවන් පිළිබඳ කටයුතු කරන එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරිය<br>ගරු ලෝරන්ස් ගොන්සි මහතා, මෝල්ටා අග්‍රාමාත්‍ය<br>එරික් සෝල්හයිම් මහතා, ජාත්‍යන්තර සංවර්ධන අමාත්‍ය නෝර්වේ<br>අතිගරු අබ්දිල්ලා එම් අල් කාටිල් මහතා, ජෝර්දානයේ විදේශ කටයුතු අමාත්‍ය<br>රිචඩ් බවුචර් මහතා, ඇමෙරිකානු සහකාර රාජ්‍ය දෙපාර්තමේන්තු ලේකම්<br>ෂා ෂෙන්ක්ග් මහතා, එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු සඳහා උප මහලේකම්<br>රාෂ් එම් කාන් මහතා, පාකිස්තානයේ විදේශ ලේකම්<br>අතිගරු සෝන්ග් මින් සූන් මහතා, විදේශ කටයුතු හා වෙළඳ අමාත්‍ය, කොරියන්. |
| ඉන්දියා | ජනාධිපති හා අගමැති |
| මාලදිවයින | අතිගරු මවුමූං අබ්දුල් ගයූම් මහතා, ජනාධිපති<br>ගරු අබ්දුල්ලා ෂහිඩ් මහතා, විදේශ කටයුතු අමාත්‍ය |
| එක්සත් රාජධානිය | ගරු ලෝඩ් මැලෝච් බවුන්ස් මහතා, විදේශ කටයුතු හා පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය අමාත්‍ය ජෙප්රි ක්ලින්ටන් බ්‍රවුන් මහතා, විදේශ හා වෙළඳ කටයුතු පිළිබඳ උප අමාත්‍ය මයිකල් මෝර් මහතා, නියෝජ්‍ය විදේශ අමාත්‍ය ලන්ඩනයේ පකිස්තාන මහ කොමසාරිස් |
| උගන්ඩා | ගරු ප්‍රනාබ් මුකර්ජි මහතා, ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු සයිනුල් අබ්දුන් බින් මොහොමඩ් රසීඩ් මහතා, සිංගප්පූරු ජේ්‍යෂ්ඨ රාජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය ඉප්තිකා චවුද්‍ර මහතා, බංගලාදේශයේ ජේ්‍යෂ්ඨ රාජ්‍ය උපදේශක, ගරු එරාටෝ කොසකු මාකුලිස් මහතා, සයිප්‍රස් හි විදේශ කටයුතු අමාත්‍ය |
| ඉන්දියා/ජපානය | ගරු ඔසමුවුනෝ මහතා, නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය, ගරු ඔසිකෝ කොමුරෝ මහතා, විදේශ කටයුතු අමාත්‍ය සඩ්සුකී එඩ මහතා, ගරු ටොට්සුරෝ යැනෝ මහතා සහ ගරු අකිරා ගුන්ජි මහතා, අතිගරු යසුරෝ පොකුඩා අගමැති |
| චීනය/ලන්ඩනය | අතිගරු ටාන්ග් ඩොන්ංලී මහතා, නියෝජ්‍ය නගරාධිපති ආර්ථික කටයුතු හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ, අතිගරු සොග් සාන් මහතා, නියෝජ්‍ය ආණ්ඩුකාර සොප්ලැන්ග් පළාතේ. ජූ ශින් හිමි සන්ගායි බෞද්ධ විහාරයේ අධිපති |
| සිංගප්පූරුව | අතිගරු ටියෝ චී හියන් මහතා, ආරක්ෂක අමාත්‍ය අතිගරු ජෝර්ජ් යේ මහතා, විදේශ කටයුතු අමාත්‍ය කාලිඩ් බින් සුල්ටන් බින් අබ්දුල් අසීස් අල් සවුඩ් කුමරු. ආරක්ෂක හා ගුවන් සේවා සහකාර අමාත්‍ය, බ්‍රිගේඩියර් ජනරාල් ජිමී ටැන් මහතා, ආරක්ෂක ආයතනයේ කොමදෝරු |
| එක්සත් රාජධානිය | අතිගරු ඩේවිඩ් මිලිබෑන්ඩ් මහතා, විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය ලේකම් ගරු සාරි කමලේස් සර්මා මහතා, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් ගරු ලෝඩ් මැලෝච් බවුන්ස් මහතා, විදේශ කටයුතු හා පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය අමාත්‍ය ගරු පෝල් මර්පි මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ආරක්ෂක හා බුද්ධි අංශය පාර්ලිමේන්තු කමිටු සභාපති, ගරු ටෝනි මැක්නියුල්ටි මහතා, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය එක්සත් ජනපද පාර්ලිමේන්තු සාමාජිකයන්, එඩ්වඩ් ඩාවෙයි මහතා, නියෝජ්‍ය විදේශ කටයුතු ප්‍රකාශක ගරු ස්ටීවන් ටිම්ස් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී භාණ්ඩාගාර ප්‍රධාන ලේකම් |
| ජර්මනිය/බර්ලින් | ගරු ෆෑන්ක් වෝල්ටර් ස්ටෙයින්මෙයිර් මහතා, විදේශ කටයුතු අමාත්‍ය පීටර් අල්ටමයර් මහතා, |

| *සංචාරය කරන ලද රටවල්* | *නම සහ තනතුර* |
| --- | --- |
| | රාජ්‍ය පාර්ලිමේන්තු ලේකම්, ගරු රුප්‍රච් පොලොන්ස් මහතා, සභාපති විදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු සභාව තිලෝ හෙප් මහතා, සභාපති ආර්ථික සහයෝගීතා හා සංවර්ධන පිළිබඳ පාර්ලිමේන්තු සභාව ජෝශප් වින්කලර් මහතා, සභාපති දකුණු ආසියානු පාර්ලිමේන්තු කණ්ඩායම |
| චීනය | චීන විදේශ කටයුතු අමාත්‍යාංශ නිලධාරින් |
| එක්සත් රාජධානිය | ගරු මාග්‍රට් බොකට් මහත්මිය. පාර්ලිමේන්තු මන්ත්‍රී පොදු රාජ්‍ය හා විදේශ කටයුතු රාජ්‍ය ලේකම් ගරු ගැරුත් තෝමස් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ජාත්‍යන්තර සංවර්ධන රාජ්‍ය ලේකම් ගරු පෝල් මර්පි මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ආරක්ෂක හා බුද්ධි අංශය පාර්ලිමේන්තු කමිටු සභාපති ජෙප්ර් ක්ලින්ටන් බ්‍රවුන් මහතා, විදේශ හා වෙළෙඳ කටයුතු පිළිබඳ උප අමාත්‍ය ගරු ස්ටීවන් ටිම්ස් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී භාණ්ඩාගාර ප්‍රධාන ලේකම්, ගරු ඩොනල්ඩ් සී මැකිනම් මහතා, පොදු රාජ්‍ය සංගමයේ මහ ලේකම් |
| ජර්මනිය - බර්ලින් | රොන්හර්ඩ් සොල්ලිබර්බර්ඩ් මහතා, රාජ්‍ය ආරක්ෂක ලේකම් විදේශ කටයුතු අමාත්‍යාංශය රිච් ස්ටේටර් මහතා, රාජ්‍ය ලේකම් ආර්ථික සහයෝගීතා හා සංවර්ධන අමාත්‍යාංශය, රොල්ෆ නිකල් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විදේශ ප්‍රතිපත්ති කාර්යාලය |
| ඔිස්ට්‍රියා | ඒ. මයිර් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සංවර්ධන සහයෝගීතා දෙපාර්තමේන්තුව වයිසර් මහතා, සහ සිල්විියා මකා මහත්මිය, මුදල් අමාත්‍යාංශය, එෆ් බවුමන්න. නියෝජ්‍ය අධයක්ෂ ජනරාල් එක්සත් ජාතීන්ගේ කාර්යාලය, කේ යමකොල්ලෙ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආසියා පැසිපික් කලාපය |
| චෙක් ජනරජය | බොස්ෆා මහතා, දේශපාලන කටයුතු හා විදේශ කටයුතු අමාත්‍ය |
| මියන්මාරය(යන්ගුන්) | අතිගරු ලෙෆ්ටිනන් ජනරාල් දින් සින් මහතා, වැඩබලන අග්‍රාමාත්‍ය, අතිගරු බ්‍රිගේඩියර් ජනරාල් තුරා මින්ට්. ආගමික කටයුතු අමාත්‍ය, අතිගරු මේජර් ජනරාල් තෙයින් අන්ග්, වන සංරක්ෂණ අමාත්‍ය, අතිගරු මේජර් ජනරාල් සෝනයිග් මහතා, හෝටල් හා සංචාරක අමාත්‍ය, අතිගරු හියා ටන් මහතා, මුදල් හා ආදායම් අමාත්‍ය, අතිගරු බ්‍රිගේඩියර් ජනරාල් ටිං නයින් තෙයින්, වාණිජ කටයුතු අමාත්‍ය |
| ඊශ්‍රායලය | රුත් කොහොනෆ් මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආසියා පැසිපික් අංශය, ඊශ්‍රායල් විදේශ කටයුතු අමාත්‍යාංශය, ආරොන් අබ්රෝමෝවිච්, ඊශ්‍රායල් විදේශ කටයුතු ලේකම්, ආචාර්ය ලෝරන්ස් වින්බසම් මහතා, විශ්ලේෂණ අධ්‍යක්ෂ හිම් ඩීවොන් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තොරතුරු මධ්‍යස්ථානය යිරෝන් යිට්සන් මහතා, නියෝජ්‍ය ප්‍රධානි විදේශ ප්‍රතිපත්ති පිළිබඳ ජාතික ආරක්ෂක කොමිසම |
| නිව්යෝර්ක් | ප්‍රනාබ් මුකර්ජි මහතා, ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය, අතිගරු ඔලෆර් ගිම්ෂන් මහතා, අයිස්ලන්තයේ ජනාධිපති ජොසිටි ෂිරාන් මහත්මිය, විධායක් අධ්‍යක්ෂ ලෝක ආහාර සංවිධානය, අතිගරු මොහොමඩ් අහමඩිනජාඩ් මහතා. ඉරාන ජනාධිපති, අතිගරු මොහොමඩ් අබ්බාස් මහතා, පලස්තීන ජනාධිපති කමල් ඩාවිස් මහතා, එක්සත් ජාතීන්ගේ සංවර්ධන සංවිධානයේ පරිපාලන නිලධාරී නිකොලොස් බර්නස් මහතා, ඇමෙරිකාවේ දේශපාලන කටයුතු සහායක ලේකම් අතිගරු බැන් කී මූං මහතා, එක්සත් ජාතීන්ගේ මහලේකම් විශේෂ නියෝජිතවරිය, ගරු ලෝරන්ස් ගොන්සි මහතා, මෝල්ටා අග්‍රාමාත්‍ය, එරික් සෝල්හයිම් මහතා, ජාත්‍යන්තර සංවර්ධන අමාත්‍ය නෝර්වේ, අතිගරු අබ්දිල්ලා එම් අල් කාටිල්, ජෝර්දානයේ විදේශ කටයුතු අමාත්‍ය, අතිගරු ජෝනස් ග්‍රහර් ස්ටෝ |

| සංචාරය කරන ලද රටවල් | නම සහ තනතුර |
|---|---|
| | මහතා, ජෝර්දානයේ විදේශ කටයුතු අමාත්‍ය, අගරු මල්ලොච් බ්‍රවුන් මහතා අප්‍රිකාව සඳහා එක්සත් රාජධානි අමාත්‍ය රිචඩ් බවුචර් මහතා, ඇමෙරිකානු සහකාර රාජ්‍ය දෙපාර්තමේන්තු ලේකම් ෂා ෂෙන්ක්ග් මහතා, එක්සත් ජාතීන්ගේ ආර්ථික සමාජ කටයුතු සඳහා උපමහ ලේකම් අතිගරු බෘනෝ සිටොක්නෝ ලිගර්ටා, විදේශ කටයුතු අමාත්‍ය කොස්ටරිකා රාෂ් එම් කාන් මහතා, පාකිස්තානයේ විදේශ ලේකම් අතිගරු සෝන්ග් මින් සුන්, විදේශ කටයුතු හා වෙළෙඳ අමාත්‍ය කොරියන් ආචාර්ය ඉෆ්තිකාර් අමහඩ් කෞහරි මහතා, බංගලාදේශ විදේශ කටයුතු උපදේශක අතිගරු සොල්ෂෝ ලූස් නූනාස් අමෝරිම් මහතා, බ්‍රසලස් විදේශ කටයුතු අමාත්‍ය අතිගරු නිකොසශේනා සී දල්මිණි ෂූමා, දකුණු අප්‍රිකානු විදේශ කටයුතු අමාත්‍ය, අතිගරු කරියොස් මොරලැස් ටොරොන්කෝසා මහතා, ඩොමිනිකා ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය, සර් ජෝන් හොල්මිස් මහතා, හදිසි අවස්ථා සම්බන්ධීකරණ උප මහලේකම් අතිගරු ෆේලිප් පෙරස් රෝකියු මහතා, කියුබා විදේශ කටයුතු අමාත්‍ය, ඊශ්‍රායලයේ උප අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍ය, අතිගරු සහනා ප්‍රධාන්, නේපාල විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ශෂන් විරජුඩා, ඉන්දුනීසියා විදේශ කටයුතු අමාත්‍ය |
| චෙක් ජනරජය | ටී පජාර්, පළමු නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය, එම් හේචොර්කා, වෙළෙඳ හා කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය පී බර්තස්කයි, සභාපති චෙක් රාජ්‍ය හා ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමය |
| ක්‍රොඒසියාව | ආචාර්ය අයි ටොමික් මහතා, ද්විපාර්ශ්වික සහයෝගිතා පිළිබඳ සහකාර අමාත්‍ය එන් පලිකාරික් මහතා, යුරෝපා සංගමය සහ යුරෝපා සහයෝගිතාව පිළිබඳ සහකාර අමාත්‍ය එම් රොබෝටෙග් මහතා, රාජ්‍ය ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය ජේ කෙල්සේවික් මහතා, අමාත්‍ය කාර්යාල ප්‍රධානී |
| සෙල්විනියා | එම්. සින්කෝවික් මහතා, රාජ්‍ය ලේකම් විදේශ කටයුතු අමාත්‍යාංශය, බී බෙන්කෝ මහතා, අධ්‍යක්ෂ ජනරාල් යුරෝපා කටයුතු සහ ද්විපාර්ශ්වික කටයුතු පිළිබඳ ටී මැන්සින් මහතා,, අප්‍රිකා ආසියා සහ පැසිපික් අංශය ප්‍රධානී ජේ පර්මෝජ් , කළමනාකරු යුරෝපා, සහ ආසියා සහයෝගිතා සංගමය බී බෙල්ෂික්, අධ්‍යක්ෂ අප්‍රිකා ආසියා සහ පැසිපික් අංශයේ |
| උගන්ඩා | ගරු ප්‍රතාබ් මුකර්ජී මහතා, ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය, ගරු සයිනුල් අබ්දුන් බින් මොහොමඩ් රසීඩ් මහතා, සිංගප්පූරු ජ්‍යෙෂ්ඨ විදේශ කටයුතු අමාත්‍ය, ඉප්තිකා චවුද්‍රි මහතා, බංගලාදේශයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය උපදේශක ගරු එරාටෝ කොසකු මාකුලිස් මහතා, සයිප්‍රස්හි විදේශ කටයුතු අමාත්‍ය |
| ඉරානය | අතිගරු එම්නස් අයතොල්ලා සෙයියාඩ් අලි අහමිනයි, ඉරානයේ ප්‍රධාන පාලක අතිගරු මහමුඩ් අහමජිනේජාඩ් මහතා, ඉරාන ජනාධිපති |
| එංගලන්තය | ඔක්ස්පර්ඩ් සංගමය |
| රුසියාව | ඇලෙක්සි බොරොඩාකින් මහතා, නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය, වී මික්හාහලෝ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (දෙවන ආසියා සංවර්ධන සංගමය)ඒ ලිස්ටෝ පඩිච් මහතා, අධ්‍යක්ෂ (දෙවන ආසියා සංවර්ධන සංගමය) යොලෙනා යුඩීවා මහත්මිය ලේකම් (දෙවන ආසියා සංවර්ධන සංගමය) එල්මා කම්ච් මහතා, සාමාන්‍යාධිකාරී (පෝර්ට් බිස්නස් ව්‍යාපෘතිය) මිහෝල් ටිචිච්, ප්‍රධාන ආරක්ෂක ආයෝජන සංවර්ධන ආයතනය, ඇලෙක්සැන්ඩර් ප්ලෝච් නියෝජ්‍ය ප්‍රධානී - ජාත්‍යන්තර සංවර්ධන සංගමය |
| යුක්රේනිය | ඕ ඕ හොරින් මහතා , නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය, පී. එම්. කොලොස් මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ඉසෙඩ්. බී. ඔලික් මහතා, පළමු ලේකම් (කාර්මික හා ආරක්ෂක සංස්ථාව) අයි. වී. ඇන්ඩ්‍රෝ සෙන්කො, අධ්‍යක්ෂ (අභ්‍යන්තර සහයෝගිතා) නටාල්යා ඊ බොයිට් සුක් මහත්මිය, නියෝජ්‍ය ආර්ථික කටයුතු අමාත්‍ය, තාරාස් චෙමොයිල්, ප්‍රධාන පාර්ලිමේන්තු කණ්ඩායම |
| බෙල්ජියම් | ටොමාසෝ කොසිවසාකි මහතා, ප්‍රධාන කාර්ය සාධක නිලධාරී එක්සැවියා ඩිමොලින් මහතා වැඩ බලන මහ ලේකම් විදේශ කටයුතු අමාත්‍ය, ජාවෝ අගුවාර් මචාඩෝ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් බාහිර සම්බන්ධතා යුරෝපා කොමිසම ගැරත් එවන්ස් මහතා, සභාපති ජාත්‍යන්තර ගැටලු පිළිබඳ සලකා බැලීමේ කණ්ඩායම |

*ඇමුණුම III*

**2007 වර්ෂයේ දී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා යෙදුන විදේශ සංචාරවල ආර්ථික කටයුතු සඳහා කළ ගමන් බිමන්,**

2007 පෙබරවාරි 28 දින සිට මාර්තු 03 දින දක්වා කාලය තුළ අතිගරු ජනාධිපතිතුමා මහජන චීන සමූහාණ්ඩුවේ කළ සංචාරය

* අතිගරු ජනාධිපතිතුමා මහජන චීන සමූහාණ්ඩුවේ කළ සංචාරයේදී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා නියෝජිත පිරිසට අයත් විය.

* මෙම සංචාරයේදී සාමාජිකයින් 70 දෙනෙකුගේ ව්‍යාපාරික නියෝජිත පිරිසක් අතිගරු ජනාධිපතිතුමාට එක් වූහ.

* චීනයේ ව්‍යාපාරික නායකයින් විශාල සංඛ්‍යාවක සහභාගීත්වයෙන් බීජිං, ෂැන්හයි සහ ගුවන්ෂෝ යන නගරවලදී ආර්ථික සංසද පවත්වන ලදී.

* සංචාරයේදී අත්සන් කරන ලද ගිවිසුම් පහත සඳහන් වේ.

1. ආර්ථික හා කාර්මික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම

2. ඉදිකිරීම් අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම

3. නගරාන්තර මිත්‍ර සම්බන්ධතා ඇති කිරීම සම්බන්ධයෙන් ගුවන්ෂෝ නගරය හා හම්බන්තොට දිස්ත්‍රික්කය අතර ගිවිසුම.

4. චීනයේ වාණිජ අමාත්‍යාංශයේ ආයෝජන ප්‍රවර්ධන ඒජන්සිය හා ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය අතර ආයෝජන ප්‍රවර්ධන සහයෝගිතාව ද්විපාර්ශ්විකව ඇති කිරීමේ අවබෝධතා ගිවිසුම.

5. චීනයේ චිත්‍රපට කාර්යාංශය හා ශ්‍රී ලංකාවේ ජාතික චිත්‍රපට සංස්ථාව අතර චිත්‍රපට කර්මාන්තයේදී සහයෝගය ඇති කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම.

6. අක්ෂි ස්වච්ඡ පරිත්‍යාග කිරීමේ කටයුතු හා චීනයේ රතුකුරුස සංගමයේ ශ්‍රී ලංකාවේ අක්ෂිදාන සංගමයත් අතර සහයෝගිතා වර්ධනය, කාර්මික හා තාක්ෂණික හුවමාරුකර ගැනීම් පිළිබඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම.

7. චීනයේ කෘෂිකාර්මික යාන්ත්‍රිකකරණ විද්‍යාව පිළිබඳ අභ්‍යාස ආයතනයත් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් අතර අවබෝධතා ගිවිසුම.

8. චීනයේ බීජිං හි විදේශ අධ්‍යයන විශ්ව විද්‍යාලයත් ශ්‍රී ලංකාවේ කැලණි විශ්ව විද්‍යාලයත්, අතර අධ්‍යාපනික හුවමාරුව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

අතිගරු ජනාධිපතිතුමා 2007 මැයි 21-22 දිනවල ක්වේට්හී කළ සංචාරය

* අතිගරු ජනාධිපතිතුමා ක්වේට්හි කළ සංචාරය සඳහා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා ද සහභාගී විය.

*මෙම සංචාරයේදී ශ්‍රී ලංකාව සහ ක්වේට් රාජ්‍යය පහත සඳහන් ගිවිසුම් දෙකට අත්සන් තැබූහ.

* සංස්කෘතික, මාධ්‍ය, අධ්‍යාපන, විද්‍යාව හා කාර්මික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

* වරදකරුවන් වූ සිරකරුවන් හුවමාරු කර ගැනීම පිළිබඳ ගිවිසුම

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

* විවිධාකාරයේ වැරදි කිරීම නිසාත්, සේවා ගිවිසුම් කඩකිරීම නිසාත් ක්වේට් රාජ්‍යයෙන් නෙරපනු ලැබූ සිරදඬුවම් වලට යටත් වී සිටින ශ්‍රී ලාංකික කම්කරුවන්ට, වරදකරුවන් වූ සිරකරුවන් හුවමාරු කර ගැනීම පිළිබඳ ගිවිසුම යටතේ පොදු සමා කාලයක් සඳහා හිමිකම් ලැබී ඇති අතර එම කාලය තුළ ඔවුන්ට ආපසු ශ්‍රී ලංකාවට පැමිණිය හැකිව තිබේ. මෙයට පෙර මෙවැනි ශ්‍රී ලාංකික කම්කරුවන් ආපසු සිය රටට ගෙන්වා ගැනීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක වියදමක් දැරීමට ශ්‍රී ලංකාවට සිදුවිය. එහෙයින් මෙම ගිවිසුමෙන් විශාල යහපතක් සිදු වී තිබේ.

* අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන ද්විපාර්ශ්වික හා කලාපීය කරුණු සම්බන්ධයෙන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාත් අල්ෂබා අමීර් රජතුමාත් අතර සුහද සාකච්ඡා වටයක් පැවැත්වුන අතර එම සාකච්ඡා වලදී වැඩි අවධානය යොමු වූයේ ක්වේට් රාජ්‍යයෙන් නෙරපනු ලැබ සිටින ශ්‍රී ලාංකික කම්කරුවන් කෙරෙහිය. මෙම ශ්‍රී ලාංකිකයින්ට කුවේට් රාජ්‍යයෙහි ආර්ථික වශයෙන් වඩාත් සාධනීය වූත්, වාසිදායක වූත් රැකියා අවස්ථා සලසා දීමෙහිලා ඇති ඉඩකඩ පිළිබඳව ඔවුහු අදහස් හුවමාරු කර ගත්හ. ඔවුන්ට මුහුණ පාන්නට සිදුව ඇති ප්‍රශ්න ගැනද ඒවා කඩිනමින් විසඳා ගැනීමෙහිලා ඇති ඉඩ ප්‍රස්ථා ගැනද සාකච්ඡා කෙරින. ක්වේට් රාජ්‍යයෙන් ශ්‍රී ලංකාවෙහි ආයෝජනයන් කිරීම ගැන ද නායකයෝ සාකච්ඡා කළහ.

* අතිගරු ජනාධිපතිතුමා පැවැත්වූ සාකච්ඡා වලදී එතුමා වීරවිල ගුවන් තොටුපල ව්‍යාපෘතිය හා මොරගහකන්ද ව්‍යාපෘතිය සඳහා ක්වේට් රාජ්‍යයෙන් අරමුදල් ආධාර ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකාවෙහි තෙල් පිරිපහදුවක් ස්ථාපනය කිරීම සඳහා ක්වේට් රාජ්‍යයෙන් ආධාර ලබා ගැනීම සම්බන්ධයෙන් ද සාකච්ඡා පැවැත්වින.

* ක්වේට් වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේදී ව්‍යාපාරික හා ආයෝජන සංසදයක් පැවැත්වුන අතර අතිගරු ජනාධිපතිතුමා සහ අමාත්‍යවරුන් ගණනාවක් එම සංසදයට සහභාගි වූහ. ක්වේට්හි ව්‍යාපාරිකයෝ සහ ආයෝජකයෝද එම සංසදයට සහභාගි වූහ.

* සාමාජිකයින් 25 දෙනෙකුගෙන් පමණ සමන්විත වූ ව්‍යාපාරික නියෝජිත පිරිසක් මෙම සංචාරයේදී අතිගරු ජනාධිපතිතුමාට එක් වූහ.

* ආයෝජනයන් කිරීම හා මිනිස් සම්පත් සැපයුමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ගිවිසුම් ඇතිකර ගැනීමත් ඒවා අන්‍යෝන්‍ය වශයෙන් ආරක්ෂා කිරීමත් ගැන සළකා බැලීමට දෙපාර්ශ්වය අතර එකඟතාවක් ඇති විය.

* අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ ක්වේට් මුදලේ අධ්‍යක්ෂ ජනරාල් අබ්දුල් වහාබ් අල්-බේඩර් මහතා, වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපති අතිගරු අලි අල් සානීම් මහතා, ජාතික මන්ත්‍රණ සභාවේ කථානායක අතිගරු ජසිම් මොහොමඩ් අලි කොරාෆි මහතා, ක්වේට් රාජ්‍යයේ අග්‍රාමාත්‍ය අතිගරු ෂයික් නසාර් අල් මොහොමඩ් අල් අහමඩ් අල් ජබීර් අල්ෂබා මහතා, ක්වේට් රාජ්‍යයේ අමීර් අතිගරු ෂෙයික් සභා අල් අහමඩ් අල්ජබීර් අල්ෂබා කුවේට් රාජ්‍යයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය, විදේශ කටයතු අමාත්‍ය හා තෙල් අමාත්‍ය අතිගරු ෂෙයික් ආචාර්ය මොහොමඩ් ෂබා අල් සලීම්, අල්ෂබා මහතා සංචාරයේදී හමු වූ සම්භාවනීය පුද්ගලයින් අතර වූහ. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2007 ජුනි 26 සිට 29 දින දක්වා කාලය තුළ ජපානයේ කළ සංචාරය

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාරයට පහත සඳහන් ඉහළ පෙළේ ව්‍යාපාරික නියෝජිත පිරිස එක් විය. කොළඹ නෞකාගාරයේ නියෝජ්‍ය සභාපති සරත් ද කොස්තා මහතා, ශ්‍රී ලංකා ටෙලිකොම් ප්‍රධාන විධායක නිලධාරි ෂොකි තලකාෂි මහතා, ශ්‍රී ලංකා ටෙලිකොම් අධ්‍යක්ෂ, ඩබ්. ඩබ්. බී. සුමිත් විජේසිංහ මහතා, සීමිත ඒබීසී ෂිපිං (පෞද්ගලික) සමාගමේ සභාපති, ජෝන් ශිහාන් දිසානායක මහතා, සීමිත ඒබීසී ෂිපිං (පෞද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ඩී.එන්. ඩබ්ලිව්. තලගල මහතා,

* ජපානයේ ව්‍යාපාරික පිරිස් වල රැස්වීම් සංවිධානය කොට ඔවුන් මුණ ගැසීමට ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පිරිස් වලට අවස්ථාව සලසා දෙන ලදී.

* ජපානයේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයින්ගේ ආයෝජකයින්ගේ සහ ශ්‍රී ලංකා ව්‍යාපාරික නියෝජිත පිරිසගේ සහභාගිත්වයෙන්, ජපන් ශ්‍රී ලංකා සහයෝගිතා කමිටුව විසින් දිවා භෝජන සංග්‍රහයක් සහිත රැස්වීමක් පවත්වන ලදී. මේ අවස්ථාවේ දී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා ප්‍රධාන දේශනය පැවැත්වීය. ශ්‍රී ලංකා ආර්ථිකයෙහි තත්වය සහ ආයෝජන අවස්ථා පිළිබඳව අන්‍යෝන්‍ය සාකච්ඡා ඇති විය. 1979 දී පිහිටුවන ලද ජපන්-ශ්‍රී ලංකා ව්‍යාපාරික සහයෝගිතා කමිටුව ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රථම ද්විපාර්ශ්වික ව්‍යාපාරික මණ්ඩලය වේ.

* විදේශ ඇමතිතුමාගේ විදේශ සංචාරය නිමිති කොට ගෙන ජුනි 26 වැනි දින ශ්‍රී ලංකා ව්‍යාපාරික සහ ආයෝජන සංසදයක් පවත්වන ලදී. මෙම අවස්ථාවේදී සංවිධාන කටයුතු කරන ලද්දේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා ජපානයේ තිබෙන ශ්‍රී ලංකා ව්‍යාපාරික සභාව මගිනි.

ජපන් තේ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ හා මහලේකම් ටොෂිතේරු ටොරි මහතා, ශ්‍රී ලංකා ටෙලිකොම්, ප්‍රධාන විධායක නිළධාරි ෂොජි තකහෂි මහතා, කොළඹ නෞකාංගනයේ නියෝජ්‍ය සභාපති සරත් ද කොස්තා මහතා ඇතුළු ශ්‍රී ලංකික හා වෙනත් ආරාධිතයින්ගේ ඉදිරිපත් කිරීම් මෙම අවස්ථාවට ඇතුළත් විය. විදේශ අමාත්‍යතුමා විශේෂ දේශනය පැවැත්විය. ජපන්-ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ සභාපති, ජපන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභික (අමාත්‍ය මණ්ඩලයේ හිටපු ප්‍රධාන ලේකම් සහ ජපන් අග්‍රාමාත්‍ය) ගරු යසුවො ලූ කුඩා මහතා ද මේ අවස්ථාවේ දී කථා කළේය. ව්‍යාපාරිකයින් විශාල සංඛ්‍යාවක්, සංගම් ගණනාවක නියෝජිතයින් සහ ජපන් ආයෝජකයින් විශාල සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සහභාගී වූහ. ඉදිරිපත් කිරීම් වලින් අනතුරුව ප්‍රශ්නෝත්තර වැඩ සටහනක් පැවැත්විණ.

ශ්‍රී ලංකාවේ වෙරළ ආරක්ෂක පුහුණු පහසුකම් සැලසීමේ ආයතනයක් පිහිටු වීම හා වෙරළාරක්ෂකයින් පුහුණු කිරීම.

වෙරළ ආරක්ෂක කටයුතු පුහුණු කිරීමේ ආයතනයක් ශ්‍රී ලංකාවෙහි පිහිටුවීම සඳහා ජපානයෙන් ආධාර ඉල්ලා සිටින ලදුව, මූලික පියවරක් වශයෙන් ශ්‍රී ලංකාවේ පුහුණු කිරීමේ ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා අනුව වෙරල ආරක්ෂකයින් පුහුණු කරදීමට ජපන් පාර්ශ්වයේ එකඟත්වය පළ විය. තවද, ජපානයේ වෙරල ආරක්ෂක කටයුතු පිළිබඳ විෂය භාරව සිටින

අමාත්‍යාංශය වන ජපානයේ ඉඩම්, යටිතල පහසුකම් හා ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ මෙම කාරණය ගැන සාකච්ඡා කරන බව දැනුම් දෙන ලදී.

* ජපානයේ වෙරළාසන්න ස්වයං ආරක්ෂක බලකායන්ට ඉන්ධන හා ජලය ලබාගැනීම් ආදිය සඳහා ශ්‍රී ලංකාවේ වරායවල පහසුකම් සලසා දීමට ශ්‍රී ලංකාවේ එකඟත්වය පල විය.

* එල්ටීටීඊය ඇතුළු ත්‍රස්තවාදී කණ්ඩායම් පිළිබඳ තොරතුරු බෙදාහදා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ජපානයේ සහාය පැතීය.

* ජපානයේ විදුලි බලාගාරයක් (මෙගාවොට් 30ක තාප බලාගාරයක්) ඉදි කිරීම සඳහාත් පරිපූරක වෛද්‍ය සේවා නිලධාරීන් පුහුණු කිරීමේදී තාක්ෂණික ආධාර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ජපානයේ සහාය පැතීය.

* ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි මට්ටමින් පුරා විද්‍යාව අධ්‍යනය කිරීම සඳහා ජපන් ශිෂ්‍යයින් දෙදෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනැමීමට ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා කැමැත්ත පළ කළේය.

* 2008 දී ශ්‍රී ලංකා සංස්කෘතික උරුමය පිළිබඳ ප්‍රදර්ශනය ජපානයේදී පැවැත්වීමට නියම කර ගැනීම ගැන ජපන් රජයේ ප්‍රසාදය පළ විය. එම ප්‍රදර්ශනය සඳහා සහාය ලබා දීමට ද ජපන් රජයේ ප්‍රතිඥාව ලැබුණි.

* ශ්‍රී ලංකාවේ ගුවන් නැව් ගොඩබෑම සඳහා නරීමා ගුවන් තොටු පලේ අමතර ගොඩබෑම් ස්ථාන ලබා දෙන ලෙස ගරු විදේශ අමාත්‍යවරයා ඉල්ලීමක් කළේය. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගමනාන්තයට ඔබ්බෙන් වූ ස්ථානයකදී හෝ ගමනාන්තයට මෙපිටින් වූ ස්ථානයකදී හෝ මගීන් නංවාගැනීමේ හා ගොඩබෑමේ පස් වන නිදහස් අයිතිය ශ්‍රී ලංකාව විසින් ජපානයට පිරිනමන ලදී.

* ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන ජාලයක නියෝජිතයන් හමුවී ඔවුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු සපයන ලදී.

* මෙම සංචාරයේදී ජේබීඅයිසී ප්‍රධානියා හමුවී ශ්‍රී ලංකාවට ජපානයෙන් ලබාදෙන විදේශීය සංවර්ධනාධාර පෙර නොවූ විරූ ප්‍රමාණයකින් වැඩි කිරීම ගැන ජපන් රජයට ස්තූති කරන ලදී. (ජපන් යෙන් බිලියන 39)

* ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා මෙම සංචාරයේදී ජපානයේ විදේශ අමාත්‍ය (වර්තමාන අග්‍රාමාත්‍ය) ගරු ටාරෝ අසෝ මහතාත්, ආරක්ෂක අමාත්‍ය ගරු ෆ්‍යුමියෝ ක්‍යුමා මහතා, අග්‍රාමාත්‍යවරයාගේ ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂ උපදේශිකා යෝරිකො කොයිකේ ආර්යාව, ජේබීඅයිසී ප්‍රධාන ජපන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජික කෝසු කේ සිනෝසාවා මහතා, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ ජපන් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සභික ගරු තදසි ඉනුෂුකා මහතා, හිටපු අග්‍රාමාත්‍ය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභික සහ ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ සභාපති ගරු යෂුඩෝ ෆුකුඩා මහතා සහ වෙනත් සම්භාවනීය පුද්ගලයින් හමුවිය.

**ශ්‍රී ලංකා මියන්මාර් ඒකාබද්ධ කොමිසමේ 1 වන රැස්වීම - 2008 ජුලි 10-11**

* ශ්‍රී ලංකා මියන්මාර් ඒකාබද්ධ කොමිසමේ 1 වැනි රැස්වීම 2007 ජුලි 10-11 දිනවල මියන්මාර් හි නේපයි ටෝ නගරයේදී පවත්වන ලදී.

* ආගමික සංචාරක කටයුතු පිළිබඳව උනන්දුව ඇති කිරීම, ආගමික ආයතන විශ්ව විද්‍යාල අතර සම්බන්ධතා ඇති කිරීම, නියෝජිත පිරිස් හුවමාරු කර ගැනීම, භික්ෂූන් වහන්සේලාට හා වෙනත් අයට අධ්‍යාපන අවස්ථා සළසාදීම, අඩු වියදම් වන්දනා ගමන් පහසුකම් සළසාදීම ඇතුළුව ආගමික හා සංස්කෘතික බැඳීම් ශක්තිමත් කිරීමේ හැකියාවන් ගැන නියෝජිත පිරිස් සාකච්ඡා කළහ.

* ත්‍රස්තවාදය තුළින් එල්ල වී ඇති ගෝලීය තර්ජනය ගැන දෙපාර්ශ්වය විසින් සලකා බලන ලද අතර ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය ජාවාරම, නීතිවිරෝධී අවි ප්‍රවාහණය, ත්‍රස්තවාදය දේශසීමා ඉක්මවා යාම සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමෙන් ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් සහයෝගීව කටයුතු කිරීමට දෙපාර්ශ්වය එකඟත්වයකට එළඹින. සියලුම ආකාරයේ ත්‍රස්තවාදී කටයුතු හෙලා දකින මියන්මාරය එල්ටීටීඊ ත්‍රස්තවාදය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන් සම්බන්ධයෙන් නොඅඩුව සහයෝගය ලබා දෙන බවට සහතික විය.

* වෙළඳාම, ආයෝජන කටයුතු හා සංචාරක කටයුතු සම්බන්ධයෙන් පවතින ද්විපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට දෙපාර්ශ්වය අතර එකඟත්වයක් ඇති විය. ශ්‍රී ලංකා අපනයනකරුවන්ට මුහුණ පාන්නට සිදුව ඇති අපහසුතා සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කොට එම අපහසුතා මඟ හරවන ලෙස ශ්‍රී ලංකා නියෝජිත පිරිස විසින් මියන්මාරයෙන් ඉල්ලා සිටින ලදී.

* වැවිලි කර්මාන්ත අංශයෙහිලා ශ්‍රී ලාංකිකයින් සතුව ඇති විශේෂ කුසලතා ඒත්තුගත් මියන්මාර් නියෝජිත පිරිස මියන්මාරයේ තේ, රබර්, පොල් වතු ඇතුළු වැවිලි කර්මාන්ත අංශයේ ආයෝජනයන් කරන ලෙස ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින්ගෙන් ඉල්ලීමක් කළහ.

මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ලබා ගන්නා ලෙස ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් දිරි ගැන්වීමෙහිලා කටයුතු කිරීමට ශ්‍රී ලංකා නියෝජිත පිරිස එකඟ විය. සේවා සැපයුම, ආගන්තුක සත්කාරය හා තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් තාක්ෂණික සහයෝගය දිගටම සලසාදෙන බවට ශ්‍රී ලංකා දූත පිරිස සහතික විය.

වැඩ බලන අග්‍රාමාත්‍ය, රාජ්‍ය සාමය හා සංවර්ධන සභා පිළිබඳ ලේකම්, ලෙෆ්ටිනන්ට් ජනරාල් අතිගරු තෙන් ෂේන් මහතා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය අතිගරු බ්‍රිගේඩියර් ජෙනරාල් තුරාමයින්ට් මවුන් මහතා, වන සංවර්ධන අමාත්‍ය, අතිගරු මේජර් ජනරාල් තේන් අවුන් මහතා, හෝටල් සංචාරක කටයුතු අමාත්‍ය අතිගරු මේජර් ජනරාල් සෝයි නසීන් මහතා, මුදල් හා ආදායම් පිළිබඳ ගරු මේජර් ජෙනරල් හ්ලා තුන් මහතා, සහ වාණිජ කටයුතු අමාත්‍ය අතිගරු බ්‍රිගේඩියර් ජෙනරාල් ටින් තයින් තේන් මහතා යන අය සමඟ විදේශ කටයුතු අමාත්‍ය, ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්වීය.

ආර්ථික කටයුතු අංශයේ නිලධාරිනි,
ආර්ථික කටයුතු අංශයේ අධ්‍යක්ෂිකා
සරෝජා සිරිසේන මිය.

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2007 අගෝස්තු 12-14 දින වල ලිබියාවේ කළ සංචාරය

* ඛනිජ සම්පත් අමාත්‍ය ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයින් පිරිසක් සමඟ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා ලිබියාවේ සංචාරයක නිරත විය.

* මෙම සංචාරයේදී ඔහු ලිබියාවේ අග්‍රාමාත්‍යවරයා, වෙළඳ හා ආයෝජන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා, මුදල් අමාත්‍යවරයා සහ වැඩබලන විදේශ කටයුතු අමාත්‍යවරයා හමුවී සාකච්ඡා පැවැත්වීය.

* මෙම සංචාරයේදී සාමාජිකයන් හයදෙනෙකුගේ ඉහළ මට්ටමේ ව්‍යාපාරික නියෝජිත පිරිසක් ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාට එක්වූහ.

* ලිබියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද ව්‍යාපාරික සංසදයට විශාල පිරිසක් සහභාගි විය. ඉංජිනේරු කර්මාන්තය, ආගන්තුක සත්කාරය, ඉදිකිරීම්, සෞඛ්‍ය සහ ගුවන් සේවය යන ක්ෂේත්‍රවල සංවර්ධන වැඩ කටයුතු සඳහා 100,000ක කම්කරු පිරිසක් අවශ්‍ය බව අග්‍රාමාත්‍ය මහ්වුදී මහතා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාට පැවසීය. ලිබියාවට ශ්‍රමිකයින් සැපයීමේ කාර්ය දෙරට බලධාරීන්ගේ සැලකිල්ලට ලක්විය යුතු යැයි ලිබියානු අග්‍රාමාත්‍යවරයා නිර්දේශ කළේය.

* ලිබියන්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමක් පිහිටුවා ගැනීමට යෝජනා විය. ශ්‍රී ලංකාව මඟින් සලකා බලනු පිණිස ලිබියන් පාර්ශ්වය විසින් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී.

* ලිබියානු ශිෂ්‍යයින්ට පුරාවිද්‍යාව පිළිබඳ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට එකඟත්වය පළවිය. පුරාවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ සන්ධානයක් අත්සන් කිරීමටත් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව පිළිබඳ කරුණු ඊට ඇතුළත් කිරීමටත් ලිබියන් පාර්ශ්වයෙන් යෝජනා විය.

**හින්දුස්ථාන් නායකත්වය ආරම්භ කිරීමේ වැදගත් සාකච්ඡාවට සහභාගී වීම සඳහා අතිගරු ජනාධිපතිතුමා 2007 ඔක්තෝම්බර් මාසයේදී නවදිල්ලියේ කළ සංචාරය**

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ජනාධිපතිතුමා සමඟ මෙම සංචාරයට සහභාගි වූහ. හින්දුස්ථාන නායකත්ව සමුළුව ප්‍රථම වරට පවත්වන ලද්දේ 2003 වර්ෂයේදීය. දැන් පවත්වනු ලබනනේ පස් වැනි සමුළුවයි. රාජ්‍ය නායකයින්/ආණ්ඩු ප්‍රධානීන්, සංස්ථා ප්‍රධානීන්, නොබෙල් ත්‍යාග ලාභීන් ඇතුළු ප්‍රධාන දේශපාලනඥයින් මෙම උසස් සමුළුව ඇමතූවන් අතර විය. මෙම දෙදින සමුළුවේ ප්‍රධානීන් අතර අතිගරු ජනාධිපතිතුමා ද විය.

* සිරිතක් වශයෙන් වෙනත් කරුණු අතර ශ්‍රී ලංකවේ නව ප්‍රවණතා පිළිබඳව දැනුවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා සහ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ඉන්දියානු දේශපාලන නායකයින් නවදිල්ලියේදී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා බැහැ දුටුවේය.

* ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2007 ඔක්තෝබර් 16 වැනි දින විදේශ වාර්තාකරුවන්ගේ සමාජ ශාලාවේදී පුවත්පත් සාකච්ඡාවට සහභාගි විය.

* දේශීය හා විදේශීය විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන් 60-65කට වැඩි සංඛ්‍යාවක් පුවත්පත් සාකච්ඡාවට සහභාගි වූහ.

**පොදු රාජ්‍ය මණ්ඩලීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට සහභාගි වීම සඳහා අතිගරු ජනාධිපතිතුමා 2007 නොවැම්බර් 23 දින සිට 25 වැනි දින දක්වා උගන්ඩාවේ කම්පාලා නගරයේ කළ සංචාරය.**

* ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, ජනාධිපති ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, කෙන්යාවේ සහ එක්සත් රාජධානියේ සිටින ශ්‍රී ලංකා තානාපතිවරු අතිගරු ජනාධිපතිතුමා සමග මෙම සංචාරයට සහභාගි වූහ. ආර්ථික කටයුතු අංශයේ නිලධාරියෙක් සහ සන්ධාන අංශයේ නිලධාරියෙක් කලින් එනම්, 2007 නොවැම්බර් 13 වැනි දින කම්පාලා නුවරට ගොස් අවශ්‍ය ඉඩකඩ පහසුකම්, සංදේශ කටයුතු ප්‍රවාහන පහසුකම් ආදිය මෙන්ම විශේෂයෙන්ම ද්විපාර්ශ්වික රැස්වීම් සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු සම්පාදනය කළහ.

* අතිගරු ජනාධිපතිතුමා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සමග ආණ්ඩු ප්‍රධානීන්/රාජ්‍ය නායකයින් විශාල සංඛ්‍යාවක් හමුවීමට මෙම සංචාරය උපයෝගී කර ගත්තේය.

* ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා ඉන්දියාව, සිංගප්පූරුව, මැලේසියාව සහ සයිප්‍රස් ඇතුළු රටවල් ගණනාවක විදේශ අමාත්‍යවරුන් සමග ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්විය.

* ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය සංවර්ධනය කිරීම සඳහා ආධාර සපයා දෙන ලෙස ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා ලිබියාවෙන් ඉල්ලා සිටියේය. තාර (Bitunmen) සැපයීමෙන් තම රට අසල් වැසි අප්‍රිකානු රටවලට ආධාර කරන බව ලිබියානු පාර්ශ්වය දැන්වීය. ප්‍රදාන පදනමක් මත ශ්‍රී ලංකාවට තාර හෙවත් ගල් කිල සපයන ලෙස ශ්‍රී ලාංකික පාර්ශ්වය ලිබියාවෙන් ඉල්ලා සිටියේය.

* දෙරට අතර ඒකාබද්ධ කෘෂිකාර්මික සහයෝගිතා ගිවිසුමකට එළඹීමට යෝජනා විය. යූරියා පොහොර සපයා ගැනීමෙහි ලා වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණපා ඇති අපහසුකම් ඉස්මතු වූ අතර ප්‍රදානයක් වශයෙන් හෝ පහසුකම් ණයක් වශයෙන් හෝ යූරියා පොහොර ලිබියාවෙන් ලබා ගැනීමේ හැකියාවක් තිබේදැයි විමසන ලදී.

* ලිබියාව සමග ආයෝජන ප්‍රවර්ධන හා ආරක්ෂණය පිළිබඳ ගිවිසුමක් ඇති කර ගැනීම ගැන සාකච්ඡා කරන ලදුව එකඟත්වයකට එළඹින. දෙවරක් බදු අය කිරීමෙන් වැළකීමේ ගිවිසුමක් ගැන ද සාකච්ඡා කෙරිණ.

* නැගෙනහිර පළාතේ ගමනාගමනයට මහෝපකාරී වන ත්‍රිකුණාමල - හබරණ මාර්ගය සඳහා ආධාර ලබා දෙන ලෙස ලිබියන් රජයෙන් ඉල්ලීමක් කරන ලදී.

* සපුගස්කන්ද තෙල් පිරිපහදුව ව්‍යාප්ත කිරිම සඳහා සම්බන්ධ වන ලෙස ඛනිජ තෙල් හා ඛනිජ සම්පත් අමාත්‍යවරයා ලිබියන් රජයෙන් ඉල්ලිමක් කළේය.

* නැගෙනහිර පළාතේ ජීවත් වන සුනාමියෙන් හා යුද ගැටුම් වලින් පීඩාවට පත් පවුල් වලට නිවාස පහසු කම් සළසා දීමෙහි ලා ආධාර ලබා දිය හැකිදැයි ලිබියන් රජයෙන් විමසන ලදී.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

* ශ්‍රී ලංකාව ළඟදීම තෙල් ගවේෂණ කටයුතු වල නිරත වන හෙයින් ඒ සම්බන්ධයෙන් සහාය සහ තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර තෙල් ගවේෂණ කටයුතු සඳහා ප්‍රදේශ වෙන් කරවා ගැනීමේ විශේෂ උනන්දුවක් ලිබියාව දක්වන බවත් මෙම කාරණයේ දී දෙරට අතර බද්ධ ව්‍යාපාර ඇති කර ගත හැකි බවත් ලිබියන් අගමැති මහමුද් මහතා පැවසීය. නොමිලේ තාක්ෂණික විශේෂඥතාව හා උපදෙස් ලබා දීමට කැමැත්ත පළ කල ඔහු එම සහාය සළසා දිය හැකි දැයි සොයා බැලීම සඳහා ළඟදීම ලිබියානු විශේෂඥ කණ්ඩායමක් එවන බව දන්වා සිටියේය.

* දෙරට අතර සෘජු ගුවන් සේවා සම්බන්ධතාවල හිඟයත් තිබෙන බව හෙළි වූ අතර එම පහසුකම් සළසා ගැනීමට දෙපාර්ශ්වය අතර එකඟතාවක් ඇති විය. ට්‍රිපෝලි ගුවන් තොටුපොළෙහි ශ්‍රීලංකා ගුවන් යානා සඳහා ගොඩබෑමේ අයිතිවාසිකම් වහාම සකසා දිය හැකි බවට ලිබියානු අග්‍රාමාත්‍යවරයා කැමැත්ත පළ කළේය.

* ආනයන හා අපනයන අංශවල සහයෝගය ඇතිව හා පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් ශ්‍රී ලංකා - ලිබියන් ව්‍යාපාරික මණ්ඩලයක් පිහිටුවීමට එකඟත්වයකට එළඹිණ.

* ලිබියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලයත් ලංකා වාණිජ මණ්ඩලයත් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

ආර්ථික කටයුතු අංශයේ නිලධාරීන්, සිකිලා ප්‍රේමවර්ධන මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂිකා, ආර්ථික කටයුතු අංශය

* ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලීය අමාත්‍ය මණ්ඩලයේ ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙක් වන හෙයින්, එම කණ්ඩායමේ රැස්වීම් සඳහා ගරු විදේශ අමාත්‍යවරයා සහභාගී විය. එහි පැවැති සාකච්ඡා වලදී ප්‍රබල ලෙස සාකච්ඡාවට බඳුන් වූයේ මතභේදයට තුඩු දී තිබෙන පාකිස්ථානයේ ගැටළුව පිළිබඳවය. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු ශ්‍රී ලංකා නියෝජිත පිරිස පොදු රාජ්‍ය මණ්ඩලයෙන් පාකිස්ථානයේ සාමාජිකත්වය අත් හිටුවීම කෙරෙහි දැඩි ලෙස විරෝධය පළ කළේය.

* බොහෝ විට, පොදු රාජ්‍ය මණ්ඩලීය අමාත්‍ය මණ්ඩල ක්‍රියාකාරී කණ්ඩායම සඳහා තුන්වැනි වතාවටත් පත් වුණ එකම රට ශ්‍රී ලංකාව විය හැකිය.

**ඉරාන ඉස්ලාමීය ජනරජයේ අතිගරු ජනාධිපතිවරයා 2007 නොවැම්බර් 26 - 28 කාලයේදී සිදු කළ සංචාරය**

* අතිගරු ජනාධිපතිවරයාගේ නියෝජිත කණ්ඩායමට ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ද ඇතුළත් විය.

* අතිගරු ජනාධිපතිවරයාගේ මෙම සංචාරයේදී සාමාජිකයන් 29 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් ද පැමිණියේය.

* ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව මහත් වූ උනන්දුවක් දක්වන ලද ඉහල පෙළේ ඉරාන ව්‍යාපාරිකයන් 150 කට ආසන්න සංඛ්‍යාවකගේ සහභාගිත්වය ඇතිව 2007 නොවැම්බර් 26 වැනි දින ටෙහෙරානයේ දී ශ්‍රී ලංකා ආයෝජන හා ව්‍යාපාරික සංසදය පවත්වන ලදී.

* 2007 නොවැම්බර් 27 වැනි දින ශ්‍රී ලංකා ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම් සඳහා ඉරාන ව්‍යාපාරිකයන් එකිනෙකා අතර සාකච්ඡා පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කරන ලදී.

* ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමේ ගමන් වියදම් හා නවාතැන් පහසුකම් සඳහා වන පිරිවැය එම නියෝජිත කණ්ඩායම විසින්ම දරන ලදී.

* මෙම සංචාරය අතරවාරයේදී පහත සඳහන් ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් සඳහා අත්සන් තබන ලදී. මීට අමතරව, බණිජ තෙල් මිලදී ගැනීම සඳහා ආසන්න වශයෙන් ඇ. ඩො. මිලියන 700 ක් වටිනා පොළී රහිත ණය පහසුකමක් මාස හතරක කාලයක් සඳහා ලබා දීමට ද ඉරානය එකඟ විය.

1. ශ්‍රී ලංකාව හා ඉරානය අතර සමුද්‍රික වෙළෙඳ කටයුතු පිළිබඳ ගිවිසුම
2. රේගු නීති නිසි ලෙස යොදවා ගැනීම සඳහා හා රේගු කටයුතු වලදී සිදුවන වැරදි වැළැක්වීම, විමර්ශනය කිරීම සහ මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකාව හා ඉරානය අතර අන්‍යෝන්‍ය පරිපාලන සහාය පිළිබඳ ද්විපාර්ශ්වික ගිවිසුම.
3. ශ්‍රී ලංකාවේ උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම (ඇ. ඩො. මිලියන 450)
4. ශ්‍රී ලංකාවේ තෙල් පිරිපහදු ධාරිතාව වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඉරාන ඉස්ලාමීය ජනරජය අතර අවබෝධතා ගිවිසුම (ඇ. ඩො. මිලියන 750)
5. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනසන්නිවේදන හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා ඉරාන ඉස්ලාමීය ජනරජයේ ගුවන් විදුලි මධ්‍යස්ථානය අතර මාධ්‍ය සහයෝගිතාව සඳහා අවබෝධතා ගිවිසුම.
6. මූල්‍ය හා තාක්ෂණික සහයෝගිතාව සඳහා පහසුකම් සැලසීම පිළිබඳ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ඉරාන ඉස්ලාමීය රාජ්‍යයේ මොස්ටාසාෆාන් පදනම අතර අවබෝධතා ගිවිසුම
7. ශ්‍රී ලංකාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩල බලමණ්ඩලය සහ ඉරාන වාණිජ කර්මාන්ත සහ පතල් මණ්ඩල අතර අවබෝධතා ගිවිසුම
8. ශ්‍රී ලංකාවේ ජාතික වාණිජ මණ්ඩලය හා ඉරානයේ වාණිජ කර්මාන්ත හා පතල් බලමණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම.

**සපුගස්කන්ද තෙල් පිරිපහදුව වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම.**

* සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ දැනට පවතින තෙල් පිරිපහදු ධාරිතාව දියුණු කිරීම සඳහා (දිනකට බැරල් 50,000 ක සිට දිනකට බැරල් 100,000 දක්වා) සපුගස්කන්ද තෙල් පිරිපහදුව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව හා ඉරානය අතර ගිවිසුමකට 2008 අගෝස්තු මසදී අත්සන් තබන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ අතිගරු ජනාධිපතිතුමා 2007 නොවැම්බර් මස ඉරානයේ සිදුකළ සංචාරයේදී ඉරාන ජනාධිපතිවරයා සමඟ පැවැති සාකච්ඡා වලින් අනතුරුවය.

* ඉරාන පාර්ශ්වය තෙල් පිරිපහදුව වැඩි දියුණු කිරීම සඳහා සහ එහි නවීකරණ කටයුතු සඳහා ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) හරහා මූල්‍ය ආධාර ලබාදෙමින් සිටියි. ඉරාන හා ශ්‍රී ලංකා තාක්ෂණ ශිල්පී කන්ඩායම් දෙකක් විසින් මේ දිනවල මෙම වාණිජයම කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හා සම්බන්ධ වැඩ කටයුතු සිදුකරනු ලබමින් සිටී.

**උමා ඔය බහු සංවර්ධන ව්‍යාපෘතිය**

* උමා ඔය ජල විදුලි හා වාරිමාර්ග ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආධාර ඉරාන රජය සපයා තිබේ. මෙම බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ගිණිකොණදිග වියළි කලාපයේ ගොඩබිම් හෙක්ටයාර් 5000ක ගොඩබිම් ප්‍රමාණයක් සඳහා ජලය සපයනු ඇති අතර මෙ.වො. 100ක විදුලි බලයක් උපදවන ජල විදුලි බලාගාරයක් ඉදිකරනු ඇත.

* ඇ. ඩො. මිලියන 450ක් පමණ වටිනාකමකින් යුත් මෙම ව්‍යාපෘතිය හා අදාල වන අවබෝධතා ගිවිසුම, අතිගරු ජනාධිපතිතුමා 2007 නොවැම්බර් මස ඉරානයේ සිදුකළ සංචාරයේදී ටෙහෙරානයේදී අත්සන් කරන ලදී.

* ඉරාන රජය, ඇ.ඩො. මිලියන 450ක මූල්‍යාධාර ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) හරහා ලබාදීමට එකඟ වී තිබේ. මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සැපයීම පිළිබඳ ගිවිසුමට 2008 අප්‍රේල් මස 28 වැනි දින අත්සන් තබන ලදී.

බොර තෙල් මිලදී ගැනීම සඳහා ඉරාන ණය පහසුකම

* බනිජ තෙල් මිලදී ගැනීම සඳහා පොළී රහිත ණය පහසුකම්, මාස හතරක් සඳහා ලබා දීමට ඉරාන රජය එකඟ වී ඇත. සහනදායී පදනම මත මාස හතරක කාලසීමාවක් දක්වා වර්තමානයේ ලබා දෙන පහසුකම තව මාස 3ක අමතර කාල සීමාවක් දක්වා ලබා දීමටද ඉරාන රජය එකඟ වීම. මෙම පහසුකම ලද්දේ අතිගරු ජනාධිපතිතුමා 2007 නොවැම්බර් මාසයේදී ඉරානයේ සිදුකළ සංචාරය අතරවාරයේදී ඉරාන ජනාධිපතිවරයා සමඟ පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙනි.

**ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කිරීම සඳහා ඉරානයේ මොස්ටාසාෆාන් පදනම**

* මූල්‍ය හා තාක්ෂණික සහයෝගිතාව සඳහා පහසුකම් සැලසීම පිළිබඳ ඉරානයේ මොස්ටාසාෆාන් පදනම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමකට අතිගරු ජනාධිපතිතුමාගේ සංචාරය අතර වාරයේදී අත්සන් තබන ලදී.

**වෙළඳ සම්බන්ධතා**

* දෙරට අතර ඉහළම ද්විපාර්ශ්වික වෙළඳ පිරිවැටුමක් වාර්තා කරමින් ඉරානය හා ශ්‍රී ලංකාව අතර සමස්ථ ද්විපාර්ශ්වික වෙළඳ පිරිවැටුම 2007 වර්ෂයේදී ඇ.ඩො. මිලියන 902.1 දක්වා වැඩිකර තිබේ. 2006 වර්ෂයේදී මෙය ඇ.ඩො. මිලියන 810.5ක් ලෙස වාර්තා විය.

* අතිගරු ජනාධිපතිතුමා සිය ධූරයේ රාජකාරී භාර ගත් දා සිට ඉරානය හා ශ්‍රී ලංකාව අතර සම්බන්ධතා වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දෙරට අතර සම්බන්ධතා වැඩිවීම මෙමගින් පිළිඹිබු වේ. එතුමා 2007 නොවැම්බර් මස ඉරානයේ සිදුකළ සංචාරය මෙම කර්තව්‍යයන් මුදුන් පමුණුවා ගැනීමකි.

ආර්ථික කටයුතු අංශයෙන් නිලධාරින්
ආර්ථික කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් අහමඩ් ඒ. ජවාඩ් මහතා සහ එම අංශයේ සහකාර අධ්‍යක්ෂ නිලූක කදුරුගමුව මහතා.
අතිගරු ජනාධිපතිතුමාගේ ජපාන සංචාරය - 2007 දෙසැම්බර් 8 - 11

* අතිගරු ජනාධිපතිතුමා ජපානයේ සිදුකළ සංචාරයට ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාද සහභාගි විය.

* සෘජු විදේශ ආයෝජන සිදුකිරීම සඳහා සුදුසු රටක් ලෙස ශ්‍රී ලංකාවේ අති යහපත් වාතාවරණය ප්‍රක්ෂේපණය කිරීම සඳහා ටෝකියෝ නුවර ඉම්පීරියල් හෝටලයේදී අතිසාර්ථක ව්‍යාපාරික හා ආයෝජන සංසදයක් පවත්වන ලදී. මෙම අවස්ථාවට අනාගතයේදී ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන ජපන් ජාතික ආයෝජකයන් 260ක් සහභාගි වූහ. මෙම සංසදයේ මූලික දේශනය විදේශ අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම මහතා විසින් සිදුකරන ලද අතර ජපානයේ උප විදේශ අමාත්‍ය ඔසාමු නො මහතා ද දේශනයක් පැවැත්විය. මෙම අවස්ථාවට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාද සහභාගි විය.

* අතිගරු ජනාධිපතිවරයා සමඟ මෙම සංචාරයට එක්වූ සාමාජිකයන් 45දෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් සඳහා ඉරාන ව්‍යාපාරිකයන් සමඟ වෙන් වෙන් වශයෙන් ව්‍යාපාරික රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. ඔවුන්ගේ සංචාරය සඳහා සම්පාදන කටයුතු මෙම අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශය ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව සැළසූ අතර ජනාධිපතිවරයා සමඟ මීට සහභාගි වූ ව්‍යාපාරිකයෝ සිය ගුවන් ගමන් වියදම් හා ගුවන් පහසුකම් සඳහා වියදම් දැරූහ.

* ජපානයේ ශ්‍රී ලංකා තානාපති වරයා විසින් ව්‍යාපාරිකයන් සඳහා පවත්වන ලද දිවාභෝජන සංග්‍රහයක දී ජපානයේ හා ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය ද ප්‍රමුඛයන් 50 කට පමණ ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් කථාබස්කිරීමට හා අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාවක් ලැබිණ. මෙම අවස්ථාවේ දී විවිධ ප්‍රශ්න ඇසීම සඳහා හා පිළිතුරු සැපයීම සඳහා සැසිවාරයක් පවත්වන ලද අතර මෙහිදී විදේශ අමාත්‍ය බෝගොල්ලාගම මහතා ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන් සමඟ එක්ව නගන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීය.

* එල්. එන්. ජී. පහසුකමක් ඇතිකරලීම සඳහා මෙම සංචාරය අතරවාරයේදී විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා ජපාන බැංකුව (JBIC) අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව, ඉහත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමට ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා ජපාන බැංකුව ජපන් යෙන් මිලියන 820ක් සඳහා ණය පහසුකමක් ලබා දුනි. මෙම දිනවල විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය මෙම ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම සඳහා සුදුසු උපදේශකවරයෙක් සොයාගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි.

* මෙම සංචාරය අතරවාරයේදී පළාත් පාලන බලධාරීන්ගේ හැකියාව වර්ධනය කිරීම උදෙසා සහ උතුරු හා නැඟෙනහිර පළාත් පුනරුත්ථාපනය කිරීම හා නැවත ගොඩනැගීම උදෙසා ශ්‍රී ලංකා රජයට සහාය ලබා දීම සම්බන්ධයෙන් ජපාන රජය සළකා බලන බව දැනුම් දුන්නාය. අග්‍රාමාත්‍ය ෆුකුඩ මහතා අතිගරු ජනාධිපතිතුමා සමඟ පැවති සාක්ච්ඡාවලදී නැඟෙනහිර පළාතේ ජන කොටස් තුනම නියෝජනය වන පරිදි ඊළඟ තුන් අවුරුදු කාලයේදී තරුණ තරුණියන් 500 කට ආරාධනා කිරීමට ජපානය සැලසුම් කරන බව දැනුම් දුන්නේය.

* වාරිකව සාකච්ඡා පවත්වා ශ්‍රී ලංකාවේ ජපන් ආයෝජන සිදුකිරීම තව දුරටත් ප්‍රවර්ධන කිරීම සඳහා ව්‍යාපාරික වාතාවරණය වැඩි දියුණු කිරීම අරමුණු කරගන්නා රාජ්‍ය - පෞද්ගලික ඒකාබද්ධ සංසදයක් පිහිටුවීමට ද දෙපාර්ශ්වය එකඟ විය.

* වරාය, ගුවන්තොටුපල, විදුලි සංදේශ, මංමාවත් හා විදුලි බල සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් ක්ෂේත්‍ර ඇතුළත් වන ආර්ථික යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශ සංවර්ධන සහාය අඛණ්ඩව ලබා දීම ජපන් රජයේ ඇති ඇපකැප වීම ඒ රජය ප්‍රකාශ කළාය.

* 2008 වර්ෂය සඳහා ජපානයෙන් යෙන් බිලියන 1.9ක් ලබාදීම පිළිබඳව විදේශ අමාත්‍ය කොමුරා මහතා මෙම සංචාරයේ දී ප්‍රකාශ කළාය. එල්. එන්. ජී. ව්‍යාපෘතිය, මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති කීපයක් සඳහා සහ වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවත් ශ්‍රමිකයන් සඳහා ජාත්‍යන්තර රෝහල සහ හෙදියන් සඳහා පාසැලක් ස්ථාපනය කිරීම සඳහා ද සහාය ඉල්ලා සිටින ලදී.

* නම්කරන ලද ශ්‍රී ලාංකික ගුවන් සේවාවල යානා ගොඩබැස්සවීම සඳහා නියමිත ස්ථාන වැඩිකරන මෙන් ජනාධිපතිතුමා කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින්, නරිටා හා හනේඩා ගුවන්තොටුපළවල්වල ඉඩකඩ අවසන් වී තිබෙන නිසා ජපානයේ පිහිටි අනෙකුත් ගුවන්තොටුපලවල ශ්‍රී ලංකාවෙන් පැමිණෙන අතිරේක ගුවන්යානා සඳහා ඉඩකඩ ලබා දී තිබෙන බව ජපාන පාර්ශ්වය දැනුම් දුන්නේය.

ආර්ථික කටයුතු අංශයේ නිලධාරින්,
ආර්ථික කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් අහමඩ් ඒ. ජවාඩ් මහතා

**ඇමුණුම IV**

**2007 වර්ෂයේදී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් සිදු කරන ලද සංචාරවල දේශපාලන පැතිකඩ.**
**ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා චීනයේ කළ සංචාරය.**
**කාල සීමාව : පෙබරවාරි මස 27 සිට මාර්තු මස 04 දක්වා.**
**සංචාරයේ අරමුණු :**

බීජිං, සැන්හයි හා ගුවන්ග් යූ හි පැවැත් වූ 05 වැනි සංවත්සර සැමැරුම් සඳහා අතිගරු ජනාධිපතිතුමන් සමඟ සහභාගි විය. සංචාරය අතරවාරයේ දී අතිගරු ජනාධිපතිතුමන් චීන ජනාධිපති හූ ජින්ටා ඕ හා අග්‍රාමාත්‍ය වෙන් ජියාබෝ සමඟ දීර්ඝ සාකච්ඡා පැවැත්වූයේය.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් මූලික පියවර තබන ලදුව කෘෂිකර්ම, අධ්‍යාපන, සංස්කෘතික හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ අංශ පිළිබඳ වූ සහයෝගිතා ගිවිසුම් අටක් රාජ්‍ය නිල සංචාරය තුළදී විදේශ අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ රේඛීය නියෝජිතායතන හා චීනය අතර අත්සන් කෙරිණ. මෙම ගිවිසුම් අත්සන් තැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් කළ අංශ සම්බන්ධයෙන් මූලික මට්ටමේ ප්‍රායෝගික සහයෝගිතාව ස්ථාපනය කර තිබේ. චීන රජය විසින් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට ලබා දෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 80 සිට 104 දක්වා වැඩි කර තිබේ. බීජිං විදේශ අධ්‍යාපන විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය හා කැළණිය විශ්ව විද්‍යාලය අතර ද දෙරටේ සහෝදර පාසල් සම්බන්ධ කරමින් ද ශිෂ්‍ය ශිෂ්‍යාවන් හුවමාරු වැඩසටහන් ආරම්භ කර තිබේ. එහි මුල් පියවරක් වශයෙන් මිත්‍රත්වය හා අධ්‍යාපන හුවමාරු ප්‍රවර්ධනය කිරීමට හා සංස්කෘතික සබඳතා වැඩි දියුනු කිරීම සඳහා බීජිං හි 80 වේ උසස් පාසල සමඟ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය සම්බන්ධ කර තිබේ.

සංස්කෘතික පර්යේෂණ හා තාක්ෂනය වර්ධනය කිරීම සඳහා කෘෂිකර්ම සහයෝගීතා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කළ කෘෂිකර්ම යාන්ත්‍රිකරණ විද්‍යාව සඳහා චීන අධ්‍යාපන පීඨයෙන් ඉහළ මට්ටමේ නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කළේය.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බෞද්ධ කලාපය තුළ බෞද්ධ ස්තූපයක් හා චීන සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීමට විදේශ කටයුතු අමාත්‍යවරයා චීන රජයේ සහාය විශේෂයෙන් පැතුවේය. මෙම ව්‍යාපෘතිය පිළිබඳ වැඩිදුර සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

කාල සීමාව : 2007 දෙසැම්බර් 19 සිට 22 දක්වා

සංචාරයේ අරමුණු : 2007 දෙසැම්බර් 20 වැනි දින ෂැන්හයි කොන්සල් කාර්යාලය විවෘත කිරීමට සහභාගි වීම.

විවෘත කිරීමේ උළෙලට සමගාමීව ෂැන්හයි හි ආර්ථික කටයුතු හා ජාත්‍යන්තර සබඳතා විෂය භාර නියෝජ්‍ය අමාත්‍ය මැන්ග් එඩ්න්ජී මැතිතුමන් සමඟ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ආර්ථික සහයෝගීතාව ඇති කළ හැකි අංශ පිළිබඳ ඵලදායි සාකච්ඡා පැවැත්වූයේය. හම්බන්තොට වරාය සංවර්ධනය කරනුයේ චීන රජයේ සහය මත වන හෙයින් දෙරට අතර වඩා වැඩි ආර්ථික සහයෝගීතාවන් ඇති කරනු සඳහා ෂැන්හයි වරාය හා හම්බන්තොට වරාය අතර සබඳතා ඇති කිරීමට ගරු විදේශ අමාත්‍යවරයා යෝජනා කළේය. මෙම සංචාරය අතරවාරයේ දී ගරු අමාත්‍යතුමා හොන්ඩ් සූ ප්‍රදේශයේ සංචාරය කළ අතර සෙප්ලැන්ග් ප්‍රාන්තයේ උප ආණ්ඩුකාර සොන්ග් ෂාන් මහතා ද හමු විය. වඩා සමීප සමාජ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා හැන්ග්ෂූ නගරය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සමඟ සහෝදර නගරයක් බවට පත් කිරීමේ යෝජනාව මෙම සාකච්ඡාවලදී විශේෂයෙන් සඳහන් කෙරිණ.

ෂැන්හායි හි පව්ව වර්ණ බෞද්ධ විහාරයේ ප්‍රධාන සංඝනායක හා චීන බෞද්ධ සංගමයේ උප සභාපති පූජ්‍ය ආචර්ය ජු මින්ග් මහතා ද සමඟ රැස්වීමක් පැවැත්වූයේය. ශ්‍රී ලංකාවේ සංචාරයක නිරතවන මෙන් ආචාර්ය ජු මින්ග් මහතා වෙත ආරාධනයක් කළ විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ බෞද්ධ කලාපයක් ඇති කිරීම සඳහා ඔහුගේ සහාය අයැද සිටියේය.

ඉහත සංචාරයේ ප්‍රතිඵලයක් වශයෙන් සෙජියැන් ප්‍රාන්තයේ උප ආණ්ඩුකාර සොන්ග් ෂාන් මැතිතුමාගේ නායකත්වය යටතේ වූ තොරතුරු කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උප ප්‍රධානි සෙන්ග් හැමොචින්, විදේශ කටයුතු උප අධ්‍යක්ෂ ෂෙන්ග් බෝ, ආර්ථික හා වෙළඳ උප ප්‍රධානි චෙන්ග් රූංන්ග් සහ බින්ග්ප්ලැන්ග් දිස්ත්‍රික්කයේ ප්‍රධානි සැන්ග් ජෙන්ග්, සෙජියැන්ග් මහජන

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

රජයේ ප්‍රධානි සූ ජුන් යන මහත්වරුන්ගේ සහ යැන්ග් ජින්ග් මහත්මියගෙන් ද සමන්විත නියෝජිත කණ්ඩායමක් 2008 අප්‍රේල් මස 17-19 දිනවල මෙරට සංචාරය කළහ.

2007 දෙසැම්බර් මස හැන්ග්සු නගරයේ විදේශ කටයුතු ගරු අමාත්‍යතුමා සිදු කළ සංචාරයේ දී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරය හා හැන්ග්සු නගරය සහෝදර නගර බවට පත් කිරීමේ කාර්ය මුදුන්පත් විය.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරාධිපතිවරයාගේ නායකත්වය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා හැන්ග්සු අතර සහෝදර නගර ස්ථාපනය කිරීමේ ගිවිසුමට අත්සන් තැබීම සඳහා නියෝජිත කණ්ඩායමක් සෙජියැන් ප්‍රාන්තයෙහි සංචාරය කළේය.

වෙළඳ හා ආර්ථික සහයෝගිතාවක් ඇතිකිරීමේ අංශය සම්බන්ධයෙන් ගත්කල නැගෙනහිර චීනය ප්‍රාන්ත සමඟ දැනටමත් සමීප සබඳතා ඇතිවෙමින් පවතී. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය හා ජාත්‍යන්තර වෙළඳාමේ ප්‍රවර්ධනය කිරීමේ චීන මණ්ඩලයේ ෂියැන්ග් සු, ෆුජියැන්ග්, හියුමන් හා අන්හුයි ප්‍රාන්තවල ඇති උප කාර්යාල සමග සහයෝගිතා ගිවිසුම් හතරක් අත්සන් තබනු ලැබිණ. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ චීන මණ්ඩලයේ වෙබ් අඩවි බොහෝමයක ශ්‍රී ලංකාවේ ආයෝජන කිරීම පිළිබඳ විස්තර පළ කර තිබේ. ආයෝජන හා වෙළඳාම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ෂැන්හයි නුවර ශ්‍රී ලංකා කාර්යාලයක් විවෘත කර තිබේ. ෂැන්ග්හයි නුවර සිට සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් යුත් ආයෝජන නියෝජිත කණ්ඩායමක් ෂැන්හයි නුවර සිට සාකච්ඡා සඳහා ශ්‍රී ලංකාවට මේ වන විටත් පැමිණ ඇති අතර අනාගතයේදී සහයෝගිතා ව්‍යාපාර ඇති කිරීම සඳහා සාකච්ඡා පවත්වමින් සිටී. 2008 ජුනි සිට සැප්තැම්බර් දක්වා චීන වෙළඳ අංශයේ සිට ශ්‍රී ලංකාවට දැනුවත් වීම සඳහා වූ සංචාර 05ක් දැනටමත් සංවිධානය කර තිබේ. නුවර එළිය හා යොන්ක්සු (හුනාන් ප්‍රාන්තයේ) එකතු කරමින් හා බෙන්තොට හා යැන්ග් චෙන්ග් (ජියැන්ග්සු ප්‍රාන්තයේ) එකතු කරමින් සහෝදර නගර සඳහා තවත් ගිවිසුම් දෙකකට අත්සන් තැබිණ.

2008 සැප්තැම්බර් 28-27 දක්වා දිනවල ෂැන්හයි හි උප නගරාධිපති අයි බාඕජුන් මහතා ඉහළ මට්ටමේ නියෝජිත පිරිසක් සමඟ ශ්‍රී ලංකාවේ සංචාරය කළේය. ඔහු වෙළඳ හා ආයෝජන සංවර්ධනය සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ශ්‍රී ලංකාව සමඟ පවත්නා සබඳතා ශක්තිමත් කිරීම සඳහා කොළඹ නගරාධිපති සහ ආයෝජන කටයතු අමාත්‍යවරයා හා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් ද හමු වූයේය.

**කාල සීමාව :**
**2008 අප්‍රේල් 09-12 දක්වා**

**සංචාරයේ අරමුණු :**

බොආඕ සංසදය සඳහා සහභාගිවීමට අතිගරු ජනාධිපතිතුමන් චීනයේ හයිනන් හි කළ සංචාරයට සහභාගි විය. බොආඕ සංසදය නව ශතවර්සය තුළ දී ආසියාවේ අනාගතය හැඩගසා ගැනීමට උපකාර වන, කලාපීය හා ජාත්‍යාන්තර ගැටළු සාකච්ඡා කිරීම සඳහා වන බුද්ධිමතුන්ගේ වේදිකාවක් ලෙස සැළකේ. මෙය අඩු වැඩි වශයෙන් ලෝක ආර්ථික සංසදය සමඟ සැසඳේ. විදේශ අමාත්‍යවරයා බොආඕ හි කළ සංචාරය අතරවාරර්යේ දී අතිගරු, ජනාධිපතිතුමා හා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම හා ජනාධිපති හු ජින්ටාඕ මහතාත් අතර ද්විපාර්ශ්වික රැස්වීමක් පවත්වනු ලැබිණ. එහි දී විදේශ කටයුතු අමාත්‍යතුමා සහ චීනයේ විදේශ කටයුතු අමාත්‍යතුමා අතර ආර්ථික සංවර්ධනය හා ආරක්ෂාව පිළිබඳ වැදගත් තොරතුරු සාකච්ඡා විය.

සහාය මත ශ්‍රී ලංකාව තුළ ආරම්භ කර ඇති යටිතල පහසුකම් සැළසීමේ ව්‍යාපෘති කඩිනම් කිරීම පිළිබඳ විශේෂයෙන් සඳහන් කෙරිණ. ගරු විදේශ අමාත්‍යතුමා පකිස්ථාන විදේශ අමාත්‍යතුමා සමග ද්විපාර්ශ්වික හමුවක් ද පැවැත්වූයේය.

**ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ජපාන සංචාරය : 2007 ජුනි 26 - 29 දිනවල**

**සංචාරය සඳහා හේතු :**

ජපාන විදේශ අමාත්‍යාංශය මඟින් කළ ආරාධනයකට අනුව සංචාරය සිදු කෙරිණ. විදේශ අමාත්‍ය ධූරයේ වැඩ භාර ගැනීමෙන් පසු ගරු විදේශ කටයුතු ඇමතිතුමා ජපානයේ කළ පළමු සංචාරය මෙය වේ. ජපාන රජය සාමාන්‍යයෙන් එහි මිත්‍ර රටවල නව විදේශ අමාත්‍යවරුන්ට, ශුභාශිංසන හුවමාරු කර ගැනීම සඳහා සහ ද්විපාර්ශ්වික වශයෙන් වැදගත් වන කරුණු සාකච්ඡා කිරීම සඳහා එරට සංචාරවල නිරත වන මෙන් ආරාධනය කරයි.

**සංචාරයේ අරමුණු :**

ශ්‍රී ලංකාව සහ ජපානය අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සංචාරය මහත් සේ උපකාර විය.

ජපානය ශ්‍රී ලංකාවට වැඩි වශයෙන්ම ආධාර කරන රට වන අතර එය සුනාමි නැවත ඉදිකිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සඳහා විශාල දායකත්වයක් දැරුවාය. (වර්තමානයේ, ශ්‍රී ලංකාව ලද සමස්ත ද්විපාර්ශ්වික ආධාර වලින් 60%ක් ජපාන 'OAD' වලින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවට ගලා ආ සමස්ථ ආධාරවලින් 40% කට සමාන වේ. ජපානය ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම ආයෝජනය කරන රටක් ද වේ. (මේ වන විට ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ ශ්‍රී ලංකාව තුළ ඇති සෘජු ආයෝජන සංඛ්‍යාව 55කට වැඩි වේ. 2007 වර්ෂයේ දත්ත අනුව මෙම අයෝජන මඟින් සෘජු රැකියා අවස්ථා 13,400 කට වඩා වැඩි ප්‍රමාණයක් සළසා ඇත.)

ජපානය, සම සභාපතිත්වය දරමින් ශ්‍රී ලංකා සාම ක්‍රියාදාමය තුළ විශාල කාර්යභාරයක් ඉටු කරයි. ජපානය HGEP හි ප්‍රමුඛතා කාර්යභාරයක් ද ඉටු කරයි. උතුරු නැගෙනහිර ඇතුළුව ශ්‍රී ලංකාව තුළ මානුෂික මෙහෙවර වල නිරත වන ජපාන රාජ්‍ය නොවන සංවිධාන සැළකිය යුතු ප්‍රමාණයක් ඇත.

ඉහත 1 හි සඳහන් කල පරිදි ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා ජපානය හා ශ්‍රී ලංකාව අතර අනාගත දේශපාලන, ආර්ථික හා සංස්කෘතික සහයෝගීතාව ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳ, දේශපාලන, මාධ්‍ය, ව්‍යාපාර, රාජ්‍ය නොවන සංවිධාන හා අධ්‍යාපනායතන ඇතුළු ජපන් සමාජයේ විශාල කොටසක් සමග ද එරට වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමග ද සාකච්ඡා පැවැත්වූයේය.

සංචාරය අතරවාරයේ දී ගරු අමාත්‍යතුමා වෙන් වෙන් අවස්ථාවලදී මාධ්‍ය හා අධ්‍යාපනායතන ඇමතුවේය. ත්‍රස්තවාදය මර්ධනය කිරීම සඳහාත් රටේ අර්බුදය සම්බන්ධයෙන් තිරසාර දේශපාලන විසඳුමක් ඇතිකර ගැනීම සඳහා රජය දරන ප්‍රයත්න පිළිබඳව ගරු විදේශ අමාත්‍යවරයා ඔවුන්ට පැහැදිලි අවබෝධයක් ඇතිවන අයුරින් කරුණු පැහැදිලි කළේය.

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ පහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් වැඩිදුර කටයුතු කළ යුතු බවට ජපාන රජයේ අවධානය යොමු විය.

- ජපානයේ එල්.ටී.ටී.ඊ. යට අයත් වත්කම් ඇතොත් ඒවා අත්හිටුවීම.
- එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගැනීම.
- ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ජපාන OAD වැඩි කිරීම.
- ශ්‍රී ලංකාවේ වෙරළාරක්ෂක පුහුණු ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා ජපාන ආධාර.
- ශ්‍රී ලංකා උරුමය පිළිබඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම (මෙම ප්‍රදර්ශනය දැනට ටෝකියෝ ජාතික කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනය කෙරෙමින් පවතින අතර කෞතුකාගාර අධිකාරීන් පවසන අන්දමට මෙම ප්‍රදර්ශනය නැරඹීම සඳහා දිනපතා විශාල පිරිසක් පැමිණේ. ජපන් ශ්‍රී ලංකා සම්බන්ධතා ආරම්භ වූ තැන් සිට මෙතෙක් පවත්වන ලද විශාලතම ප්‍රදර්ශනය මෙයයි. මෙම ප්‍රදර්ශනය මගින් පෙර නොවූ විරූ අයුරින් ජපානයෙහි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවී තිබේ. මෙම ප්‍රතිරූපය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධියට බෙහෙවින් ම ඉවහල් වී තිබේ.

  ශ්‍රී ලංකාවේ මානව හිතවාදී කටයුතුවල නිරත ජපන් රාජ්‍ය නොවන සංවිධාන සමග ද ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සාකච්ඡා පවත්වා යම් යම් සැක දුරු කර ප්‍රශ්න ද විසඳා ඇත.

  උතුරු නැගෙනහිර පළාත්වල අභ්‍යන්තර ව අවතැන් වී සිටින පුද්ගලයින් නැවත පදිංචි කරවීමේ කටයුතු පහසු වන පරිදි බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු ඇතුළු පහළම මට්ටමේ මිනිස් ආරක්ෂාව සළසන කටයුතු සඳහා යෙන් 370 ක ආධාර ප්‍රදානය කිරීමට ගෙන ඇති තීරණය ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහ හිටපු ජපන් විදේශ අමාත්‍යතුමා අතර පැවති සාකච්ඡාවේදී ජපන් පාර්ශ්වයෙන් ප්‍රකාශයට පත් විය. මෙම වර්ෂය තුළ දී මෙම ව්‍යාපෘතිය සඳහා සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයාට හා ජාත්‍යන්තර රතුකුරුස හමුදාවට ඇමරිකන් ඩොලර් මිලියනයක් පිරිනැමීමට එකඟත්වය පළ විය.

**ගරු විදේශ ඇමතිතුමා 2007 දෙසැම්බර් 08 සිට 11 දක්වා කාලය තුළ ජපානයේ කළ සංචාරය.**

I සංචාරයේ යෙදීමට හේතුව ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සංචාරයෙහි යෙදුනේ අතිගරු ජනාධිපතිතුමා සමඟය.

II සංචාරයෙන් පසු ලැබූ ප්‍රතිඵල

* අතිගරු ජනාධිපතිතුමාගේ සංචාරයේදී ගරු විදේශ කටයුතු ඇමතිතුමා නියෝජිත පිරිසේ සාමාජිකයකු විය.
* ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ව්‍යාපාරික හා ආයෝජන සංසදයන් 2007 දෙසැම්බර් 11 වැනි දින පැවැත්වීම සඳහා සංවිධානය කොට තිබුණි.

* 2007 දෙසැම්බර් 11 වැනි දින ඉඩම්, යටිතල පහසුකම් ප්‍රවාහන හා සංචාරක කටයුතු අමාත්‍ය ගරු මෙට්සු සෝ ෆුයූෂබා මහතා හමුවිය.
* කෘෂිකර්ම, වන විද්‍යා හා ධීවර අමාත්‍ය ගරු මසටොසි වකබයෂි මහතා හමුවිය.

**මියන්මාරයේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය : 2007 ජූනි 10 වන දින.**

1.(අ)(i) ගරු අමාත්‍යවරයා හා ඔහුගේ ලේකම්වරයා මියන්මාරයේ සිදුකළ සංචාර සංඛ්‍යාව

ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ විදේශ කටයුතු ලේකම්වරයා මියන්මාරයට එක් වතාවක් පමණක් සංචාරය කර තිබේ.

(අ)(ii) ඔවුන් කළ සංචාර අතරවාරයේ දී හමුවී තිබූ පුද්ගලයන්ගේ නම් හා තනතුරු නාම.

මියන්මාර් සමූහාණ්ඩුවේ අග්‍රාමාත්‍ය අතිගරු ජනරාල් කෙයින් සෙයින් මහතා ජාතික ක්‍රමසම්පාදන ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා, වාණිජ අමාත්‍යවරයා සහ ආගමික කටයුතු අමාත්‍යවරයා ද මෙම රැස්වීමට සහභාගී වූහ.

(අ)(iii) මෙවැනි සංචාර සඳහා හේතු

මියන්මාර් එක්සත් රාජ්‍යයත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිය සමාජවාදී ජනරජයත් අතර ද්විපාර්ශ්වික සම්බන්ධතා පිළිබඳ ප්‍රථම ඒකාබද්ධ කොමිසම අත්සන් කිරීමට (2007 ජූලි 10 සිට 11 දක්වා)

ඉහත සඳහන් රැස්වීමට සහභාගීවීම සඳහා ගරු අමාත්‍යතුමා සහ පිරිස මියන්මාරයට ගියේ මියන් මාර් එක්සත් රාජධානියේ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් කරන ලද ආරාධනය අනුවය.

**1. (ආ) සංචාරයෙන් ඉටුකරගත් අරමුණු**

මෙම සංචාරය හේතු කොටගෙන මියන්මාර්හි අතිගරු යූනේන් සේන් මහතා 55 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් සමග 2007 අගෝස්තු 27-28 දිනවල ප්‍රථමවරට ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර එමගින් දෙරට අතර ද්විපාර්ශ්වික සම්බන්ධතා වැඩිදියුණු කරගත හැකි විය.

**ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2008 ජූනි 11 දින තායිලන්තයේ නිතර වූ චාරිකාව.**

1. (ආ) සංචාරයෙන් ලැබූ ප්‍රතිඵල

ද්විපාර්ශ්වික - දෙරට අතර එතෙක් පැවැති ද්විපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කරගන්නා ලදී.

සංස්කෘතික - සියළුම රටවල් නියෝජනය කරමින් ශ්‍රී ලංකාවෙහි බෞද්ධ විහාරස්ථානයක් ඉදි කිරීමට පියවර ගන්නා ලදී.

වෙළඳ/ආර්ථික - තායි වෙළඳ මණ්ඩලයේ, මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපර කමිටුවේ සභාපති, තායි මැණික් හා ස්වර්ණාභරණ වෙළඳුන්ගේ සංගමයේ සභාපති එවායි අස්සරස කොන් මහතා හමුවීම ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පැවති සහයෝගීතාව වර්ධනය වීමට හේතු විය.

ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින් තුන් දෙනෙකුට ව්‍යාපාරික/වෙළඳ කටයුතු සඳහා අවස්ථාව උදාවිය.

සහල් සැපයීමට තායි රාජ්‍යයේ කැමැත්ත පළවිය. ඕනෑම වෙලාවක ශ්‍රී ලංකාවට සහල් සැපයීමට තායි රජය සූදානම්ය . සත්ව ආහාර නිපදවීමේ මෝල් සහ සතුන් බෝ කිරීමේ ස්ථාන කෙරෙහි අවධාරණය කරමින් සත්ව පාලන අංශයේ ව්‍යාපාරික අවස්ථා තිබේදැයි සීපී කණ්ඩායම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය සමග කටයුතු කිරීමට බලාපොරොත්තු වෙයි.

**ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2007 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 01 දින දක්වා කාලය තුළ මැලේසියාවේ කළ සංචාරය.**

මැලේසියාවේ විදේශ කටයුතු අමාත්‍ය, ගරු සයිඩහමීඩ් අල්බාර් මහතා, නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා ආරක්ෂක අමාත්‍ය ගරු ඩාටෝ ශ්‍රී මොහොමඩ් නජීබ් තුන් හා ජී අබ්දුල් රසාක් මහතා හා වැඩ ඇමති ගරු ඩාටෝ සෙරි එස් සාමි වෙල්ලු මහතා සමග ගරු ශ්‍රී ලංකා විදේශ අමාත්‍යතුමා රැස්වීම් පැවැත්විය. ශ්‍රී ලංකා ඕඅයිසී නිරීක්ෂණ තත්ත්වය අපේක්ෂා කරන බව මෙම රැස්වීමේ දී සඳහන් කළ ගරු විදේහ අමාත්‍යතුමා ඒ සඳහා මැලේසියාවේ සහාය ඉල්ලා සිටියේය. නියෝජ්‍ය අග්‍රාමාත්‍යතුමා සමග පවත්වන ලද රැස්වීමේදී ආරක්ෂාව සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගීව කටයුතු කිරීම ගැන විශේෂයෙන් සාකච්ඡා කරන ලදී. වැඩ අමාත්‍යතුමා සමග කළ සාකච්ඡා වලදී නැගෙනහිර පළාතේ සංවර්ධන ව්‍යාපෘති සඳහා මැලේසියාවේ සහය අපේක්ෂා කළ අතර අධිවේගී මාර්ග ඉදිකිරීම් හා අඩු ආදායම් ලබන්නන්ගේ නිවාස ව්‍යාපෘතිවලදී මැලේසියානු කොන්ත්‍රාත්කරුවන් යෙදවීම ගැන කථා කරන ලදී.

තවද ගරු විදේශ අමාත්‍යතුමා ප්‍රංශයේ ආගමන විගමන, ජාතික අනන්‍යතාව හා සංවර්ධන සහයෝගිතාව පිළිබඳව අමාත්‍ය, ගරු බ්‍රයිස් හෝටෙෆියුක්ස් මහතාත්, නවසීලන්තයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු රිචඩ් බාර්කර් මහතාත් හමු වී සාකච්ඡා පැවැත්වීය. කාලාලම්පූර් හි ගත කළ කාලය තුළදී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා රොයිටර් හා අල්-ජසීරා මාධ්‍ය ආයතන සමඟ මාධ්‍ය සාකච්ඡාවලට සහභාගි විය.

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ තායිලන්ත චාරිකාව - 2007 සහ 2008

(අ) i ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සිංගප්පූර් චාරිකා - 2007 සහ 2008
2007 ජූනි ....................... ෂන්ග්‍රි ලා සංවාදය
2008 පෙබරවාරි........................ සිංගප්පූරුවේ ගුවන් යාත්‍රා සංදර්ශනය
2008 ජූනි............... ෂන්ග්‍රි ලා සංවාදය
2008 ජූලි....................... ඒසියාන් කලාපීය සංසදය

ii සිදුවීම්, පවත්වන ලද ද්විපාර්ශවික රැස්වීම්, සංචාර සඳහා හේතු සහභාගි වූ නිළධාරීන් හා එක් එක් සංචාරය පිළිබඳ වියදම් පහත සඳහන් වේ. අවශ්‍ය වූ කල්හී සිංගප්පූරුවේ දී ආගන්තුක සත්කාර කරන ලදී.

**1. ෂන්ග්‍රි ලා ද්විපාර්ශවික රැස්වීම 2007 ජූනි.**

පවත්වන ලද ද්විපාර්ශවික රැස්වීම් පහත සඳහන් වේ.

1. එක්සත් රාජධානියේ සන්නද්ධ හමුදා සඳහා රාජ්‍ය අමාත්‍ය, ඇඩම් ඉන්ග්‍රම් මහතා.
2. ඉන්දියාවේ ආරක්ෂක අමාත්‍ය, ඒ.කේ. ඇන්තනී මහතා.
3. තායිලන්තයේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ජනරාල් විනායි පට්ටියකුල් මහතා.
4. කාම්බෝජියාවේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා ජාතික ආරක්ෂක අමාත්‍ය ජනරාල් ටී. බන්හ් මහතා.
5. පකිස්ථානයේ මාණ්ඩලික ප්‍රධානීන්ගේ ඒකාබද්ධ කමිටුවේ සභාපති ජනරාල් එස්හාන් උල් හක් මහතා.
6. ඉන්දුනීසියාවේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය මහාචාර්ය ජුවොනෝ සුදර්සනෝ මහතා.
7. වියට්නාමයේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි ලුතිනන් ජනරාල් ගුයෙන් ඩක් සෝට් මහතා.
8. ප්‍රංශයේ ජාතික ආරක්ෂාව පිළිබඳ මහ ලේකම් ශ්‍රීමත් පෙටර් රිකට්ස් මහතා.
9. චීනයේ මහජන විමුක්ති හමුදාවේ මාණ්ඩලික ජනරාල්වරුන්ගේ නියෝජ්‍ය ජනරාල්, ජනරාල් ෂැන්ග් කුයින්ෂ්යෙන්ග් මහතා.
10. ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස් මහතා.
11. සිංගප්පූරුවේ විදේශ කටයුතු අමාත්‍ය ජෝර්ජ් යේ මහතා.
12. සිංගප්පූරුවේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ටියෝ ටි ගෙයන් මහතා.

**2. සිංගප්පූරු ගුවන් සංදර්ශනය - 2008 පෙබරවාරි**

අදාළ නියෝජිත කණ්ඩායම්වල නායකයන් සමඟ ද්විපාර්ශවික රැස්වීම් පවත්වන ලදී.

1. සිංගප්පූරුවේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය අතිගරු ටියෝ චී හින් මහතා.
2. සිංගප්පූරුවේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ජෝර්ජ් ඉයෝ මහතා.
3. සවුදි අරාබි රාජධානියේ රාජ්‍ය ආරක්ෂක හා හමුදා කටයුතු සඳහා ගුවන්සේවා සහකාර අමාත්‍ය හලිඩ් බින් සුල්තාන් බින් අබ්දුල් අඩ්ස් අල් සඋද කුමරා.
4. සිංගප්පූරුවේ සප්ට් හමුදා ආයතනයේ ආරක්ෂක නිළධාරී බ්‍රිගේඩියර් ජනරාල් ජිම් ටැන් මහතා. සමඟ (අදාළ නියෝජිත කණ්ඩායම්වල නායකයන් සමඟ) ද්විපාර්ශවික රැස්වීම් පවත්වන ලදී.

**කාරණය :** සිංගප්පූරු ගුවන් සංදර්ශනය 2008 සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම් නායකත්වය ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ඉසුලුවේය.

**3. ෂැන්ග්‍රිලා සංවාදය 2008**

1. ඉන්දියාවේ රාජ්‍ය ආරක්ෂාව සඳහා රාජ්‍ය අමාත්‍ය එම්. එම්. පලාම් රාජු මහතා.
2. චීනයේ, මහජන විමුක්ති හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි ලුතිනන් ජනරාල් සියොටියන් මහතා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

3. බංග්ලාදේශයේ විදේශ කටයුතු (විදේශ අමාත්‍යවරයා) සඳහා උපදේශක ආචාර්ය ඉන්හෙකර් අහමඩ් චොව්ධුරි මහතා.
4. පාකිස්ථානයේ මාණ්ඩලික ප්‍රධානීන්ගේ කමිටුවේ සභාපති ටැරික් මජීඩ් මහතා.
5. මැලේසියාවේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ගි මොහඩ් නජීවේ බින් ටන් හජී අබ්දුල් රසාක් මහතා.
6. සිංගප්පූරුවේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය අතිගරු ටියෝ චි හියජ් මහතා
   සමඟ (අදාළ නියෝජිත කණ්ඩායම්වල නායකයන් සමඟ) ද්විපාර්ශවික රැස්වීම.

**කාරණය :** ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, ෂැන්ග්‍රිලා සංවාදය සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකයා විය.

**4. ආසියන් කලාපීය සංසදය 2008**

1. මියන්මාරයේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු යූ. නියාන් වින් මහතා.
2. ලාඕසයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා විදේශ කටයුතු අමාත්‍ය අතිගරු කොන්ගියොජ් සිසොයුලින් මහතා.
3. කොරියානු ජනරජයේ විදේශ කටයුතු හා වෙළඳ අමාත්‍ය අතිගරු යූ. මියන්ග් හවාන් මහතා.
4. ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ස්ටෙෆන් ස්මිත් මහතා.
5. පිලිපීනයේ විදේශ කටයුතු ලේකම් ගරු ඇල්බෙර්ටෝ ජී. රොමියොලෝ මහතා. (විදේශ අමාත්‍ය)
6. චීනයේ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු යැන්ග් ජෙට් මහතා.
7. වියට්නාමයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා විදේශ කටයුතු අමාත්‍ය අතිගරු හාම් ජියා හියොම් මහතා.
8. ඉන්දුනීසියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය නසන් විජ්ජුඩා මහතා සමඟ ද්විපාර්ශවික රැස්වීම්.

**කාරණය :** ආසියන් කලාපීය සංසදය සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානියා.

ඇමුණුම V

විදේශ ගමන් සඳහා දරන ලද වියදම් (විදේශ කටයුතු අමාත්‍යතුමා)

| | *සංචාරය කළ රටවල්* | *විදේශ ගමන් සඳහා දරන ලද වියදම් (රු.)* |
|---|---|---|
| 1 | ජර්මනිය / ඉන්දියාව | 783,828.00 |
| 2 | පාකිස්ථානය | 504,372.00 |
| 3 | චීනය | 386,941.00 |
| 4 | එක්සත් රාජධානිය | 5,121,385.00 |
| 5 | ඇමරිකාව / ඉන්දියාව | 2,104,903.00 |
| 6 | ඉන්දියාව | 128,694.00 |
| 7 | ඉතාලිය | 323,023.00 |
| 8 | ක්වේට් | 131,659.00 |
| 9 | ඉරානය | 1,030,719.00 |
| 10 | සිංගප්පූරුව / උතුරු කොරියාව | 949,611.00 |
| 11 | ජපානය | 2,831,205.00 |
| 12 | ඉන්දියාව / මියන්මාරය | 963,746.00 |
| 13 | බංගලාදේශය / ඉතාලිය | 2,196,256.00 |
| 14 | පිලිපීනය | 692,044.00 |
| 15 | ලිබියාව | 730,264.00 |
| 16 | මලයාසියාව | 158,694.00 |
| 17 | ප්‍රංශය / බෙල්ජියම / ජර්මනිය / ඇමරිකාව | 5,564,956.00 |
| 18 | එක්සත් රාජධානිය / ඇමරිකාව | 10,499,118.00 |
| 19 | ඉන්දියාව | 128,047.00 |
| 20 | ඉන්දියාව | 43,402.00 |
| 21 | මාලදිවයින | 40,529.00 |
| 22 | එක්සත් රාජධානිය | 431,387.00 |
| 23 | උගන්ඩාව | 297,575.00 |
| 24 | ඉන්දියාව / ජපානය | 347,397.00 |
| 25 | චීනය / එක්සත් රාජධානිය | 1,019,186.00 |

ඇමුණුම vi

විදේශ ගමන් සඳහා දරන ලද වියදම් (විදේශ කටයුතු ලේකම්)

| | *සංචාරය කළ රටවල්* | *විදේශ ගමන් සඳහා දරන ලද වියදම් (රු.)* |
|---|---|---|
| 1 | ඉන්දියාව | 154,203.00 |
| 2 | ඉන්දියාව / මාලදිවයින / චීනය | 496,880.00 |
| 3 | චීනය | 376,639.00 |
| 4 | එක්සත් රාජධානිය (ගුවන් ගාස්තු හැර) | 25,600.00 |

| | *සංචාරය කළ රටවල්* | *විදේශ ගමන් සඳහා දරන ලද වියදම් (රු)* |
|---|---|---|
| 5 | ඇමෙරිකාව / ජර්මනිය | 388,285.00 |
| 6 | ඉන්දියාව | 134,276.00 |
| 7 | කැරබියන් දූපත් (බාර්බර්ඩෝස්) | 611,649.00 |
| 8 | සිංගප්පූරුව | 173,191.00 |
| 9 | ස්විට්සර්ලන්තය | 407,094.00 |
| 10 | මියන්මාරය / මලයාසියාව | 194,246.00 |
| 11 | පාකිස්තානය | 200,601.00 |
| 12 | ඊශ්‍රාලය | 265,526.00 |
| 13 | ඇමෙරිකාව | 1,203,235.00 |
| 14 | ඉන්දියාව / ජර්මනිය | 129,000.00 |
| 15 | චෙක් ජනරජය | 185,964.00 |
| 16 | උගන්ඩාව / ඉරානය | 188,108.00 |
| 17 | ඉන්දියාව | 138,122.00 |

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව මා ඔබතුමාගේ අවධානයට යොමු කරන්නට කැමැතියි. අපේ සාමාන්‍ය සිරිතක් තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ අපි කථා කරන කොට යම් කිසි බාධා කිරිමක් කරන්නට සිදු වෙනවා නම්, ඒ කථිකයාගෙන් අවසර අරගෙන තමයි අපි එය කරන්නේ. ඒ වාගේම මේ ප්‍රශ්න අසන අවස්ථාවලදී අපි යම් පැහැදිලි කර ගැනීම් කරනවා. නමුත් මේ පාර්ලිමේන්තුවේ කථා කරන කොට දැන් දිගටම මේ බාධා කිරීම් සිදු වෙනවා. එය ඉතාම පහළ තත්ත්වයට වැටිලා තිබෙනවා. මේ සියලුම අය නොවෙයි, සමහර මන්ත්‍රීවරුන් පහළ තත්ත්වයකට වැටිලා කටයුතු කරනවා. මේ බාධා කිරීම් කර ගෙන යන සමහර අවස්ථාවලදී මූලාසනයෙනුත් ඒ පිළිබඳව කිසි විරෝධයක් මතු වන්නේ නැහැ. ඒක කනගාටුදායක තත්ත්වයක් කියලා මා හිතනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමැතියි. හරියට මේ බාධා කිරීම් සඳහා අවසර දීලා වාගේ තමයි මේ කටයුත්ත කරගෙන යන්නේ. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. එදා යම් කිසි බාධා කිරීම් සිදු වුනු අවස්ථාවේදී එතුමා එය නතර කළා. ඒක තමයි වන්න ඕනෑ. නමුත් එහෙම වන්නේ නැහැ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මම දෙපාර්ශ්වයේම ප්‍රධාන සංවිධායකවරුන්ගේ අවධානයට ලක් කරනවා. ඒ මන්ත්‍රීවරුත් ඒක මූලාසනයේ අවධානයට ලක් කරවන්න ඕනෑ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඒ සම්ප්‍රදායට පිට අපේ පැත්තෙනුත් වනවා නම් ඒකට මම වග කියන්න ඕනෑ [බාධා කිරීමක්] දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මොනවාද කියන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මාත් එකඟ වනවා ගරු කථානායකතුමනි, මූලාසනයෙනුත් යම් කිසි මෙහෙයවීමක් කෙරෙන්න ඕනෑ. ඔබතුමා මූලාසනයේ ඉන්න විට එක පාලනයක් තිබෙනවා. මුළු සභාවම මූලාසනයෙන් දෙන නියෝගය පිළිගන්නවා. එතුමා කියන දෙය අප සැලකිල්ලට ගත යුතුයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මූලාසනයේ නියෝජ්‍ය කථානායකතුමා හෝ නියෝජ්‍ය කාරක සභාපතිතුමා හෝ සභාපති මණ්ඩලයේ වෙනත් මන්ත්‍රීවරයකු හෝ

කවරකු හිටියත්, සභාව මෙහෙය වීම පිළිබඳව ඔහුට සම්පූර්ණයෙන්ම ස්ථාවර නියෝගවලින් බලය තිබෙනවා. ඒක මම නැවතත් මතක් කරන්න කැමැතියි. ඒ වාගේම මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරු කරුණාකර මූලාසනයේ අවධානය යොමු කරවන්න.

දැන් අපි ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ ප්‍රකාශයට සවන් දෙමු.

## 2008 වර්ෂ අවසාන පරීක්ෂණය : අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

### ஆண்டிறுதிப் பரீட்சை 2008 : கல்வி அமைச்சரினது கூற்று

### YEAR END TEST 2008 : STATEMENT BY MINISTER OF EDUCATION

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)

(The Hon. A. D. Susil Premajayantha - Minister of Education)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. 2008 වර්ෂයේ පාසල්වල වාර අවසාන පරීක්ෂණය සම්බන්ධයෙන් විද්‍යුත් නාලිකා කීපයක්ම මෙන්ම මුද්‍රිත මාධ්‍යයෙනුත් යම් යම් කරුණු අනාවරණය කර තිබුණා. ඒ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කළ යුතුය කියා මා අදහස් කළා. ඒ නිසා මා මේ අවස්ථාවේදී මේ ප්‍රකාශය කරනවා.

මෙම වසරට පෙර, පාසල් වාර පරීක්ෂණ හා වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වූයේ ඒ ඒ පළාත්, පාසල්, කලාප හෝ පාසල් මට්ටමින් ප්‍රශ්න පත්‍ර ලබා දීම මඟිනි.

මෙම ප්‍රශ්න පත්‍රවල ගුණාත්මකභාවය, වලංගුභාවය හා නිවරදාතාව පිළිබඳ නිරතුරුව පැමිණිලි ලැබෙමින් තිබුණු අතර පසු ගිය වර්ෂයේ අය වැය විවාදයේදී අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් විසින් ද එම ප්‍රශ්නය මතු කරන ලදි. විවිධ මාධ්‍ය මඟින්ද මේ පිළිබඳ ප්‍රකාශයන් කෙරිණි.

මෙම තත්ත්වයට පිළියම් යෙදීමට අදහස් කළ අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල සහභාගිත්වයද ලබා ගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ 2008 පළමු වාර පරීක්ෂණයේදී පළාත් දෙකකද, දෙ වැනි වාරයේදී පළාත් හතරකද නියාමන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි. 2008 වර්ෂාවසාන පරීක්ෂණයේදී 6, 7, 10, 11. ශ්‍රේණි සඳහා පාසල්වල ඉගැන්වෙන හර විෂයන් හයක් සඳහා පළාත් නවයෙහිම සම්පත් දායකයන්ගේ සහභාගිත්වය ලබා ගෙන පොදු ප්‍රශ්න පත්‍ර සකස් කරන ලදුව, එය මුද්‍රණය කර පාසල්වලට බෙදා හැරීමටද, විභාගයක රහස්‍යභාවය රැකෙන පරිදි විධිමත් ලෙස වර්ෂාවසාන පරීක්ෂණය සංවිධානය කර පැවැත්වීම සඳහා ද පළාත් බලධාරීන්ට ප්‍රශ්න පත්‍ර අඩංගු සංයුක්ත තැටි බෙදා හරින ලදී. වර්ෂාවසාන පරීක්ෂණය පැවැත්වෙන අතරතුර නියමිත ප්‍රශ්න පත්‍රයේ දිනයට පෙර එම ප්‍රශ්න පත්‍රයට සමාන වන ආකෘතියක් උපකාරක පන්තියක භාවිත කළ බවට විද්‍යුත් මාධ්‍යයක් මඟින් පෙන්වා දෙන ලදි. මේ සම්බන්ධයෙන් කඩිනම් අවධානය යොමු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරින් මඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර එමඟින්ද පරීක්ෂණ පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. ඒවායේ වාර්තා ලැබුණු වහාම කිසියම් අක්‍රමිකතාවක් හෝ දූෂණයක් සිදුව ඇත්නම් ඒ පිළිබඳව වග කිව යුතු නිලධාරීන්ට හා පිටස්තර පුද්ගලයන්ට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු යොදා ඇත. මෙම තෙ වැනි වාර පරීක්ෂණයේ හර විෂයන් හයක් සඳහා 6, 7, 10, 11ශ්‍රේණි සඳහා එක් එක් පළාතෙන් පෙනී සිටීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව හා වැය වන මුදල් සඳහන් ලේඛනය මේ සමඟ සභාගත කරන්නට මා බලාපොරොත්තු වෙනවා. මෙම වර්ෂ අවසාන පරීක්ෂණය සඳහා පෙනී සිටීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව දහතුන් ලක්ෂ පනස්දහස් තුන්සිය හැත්තෑපහකි. ඔවුන්ට ප්‍රශ්න පත්‍ර ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලට රුපියල් දශලක්ෂ 67.5ක මුදල් ද ලබා දී තිබේ. ඒ අනුව මේ ප්‍රශ්න පත්‍ර සඳහා දරුවන්ගෙන් මුදල් අය කිරීමක් අවශ්‍ය වන්නේ නැහැ.

මෙසේ පළාත් සහ මට්ටමින් වාර පරීක්ෂණ පැවැත්වීම සඳහා අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන සලසා දී ගුණාත්මකභාවයෙන් යුතු ප්‍රශ්න පත්‍ර ලබා දීමට අමාත්‍යාංශය මැදිහත් වූයේ නිශ්චිත කාල සීමාවක් තුළදී සෑම පාසලකම විෂය නිර්දේශය උගන්වා අවසන් කර, සිසුන්ගේ සාධන මට්ටම ඉහළ මට්ටමකින් හා දිවයිනේ සෑම පාසලකම සමාන උසස් අධ්‍යාපන මට්ටමක් පවත්වා ගනිමින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු ගර ගෙනය. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් මෙයට පූර්න සහයෝගය ලබා දෙනු ඇතැයිද, ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය සුරැකෙන පරිදි මනා සුපරීක්ෂණයක් පවත්වා ගනිමින් වාර පරීක්ෂණ සංවිධානය කරනු ඇතැයිද, පරීක්ෂණ අවසානයේ ඇගැයීම් කටයුතු මැනවින් ඉටු කර දරුවන්ට ප්‍රගති වාර්තා ලබා දෙනු ඇතැයිද අපි විසින් අපේක්ෂා කරන ලදී. එසේ අපේක්ෂා කරන ලද වගකීම මැනවින් ඉටු කිරීම පළාත් අධ්‍යාපන බලධාරීන්ගේ යුතුකමක් බවද මෙහිලා ප්‍රකාශ කළ යුතුව තිබේ.

ඒ වාගේම විද්‍යුත් මාධ්‍ය මඟින් පෙන්වා දෙන ලද බස්නාහිර පළාතේ මීගමුව අධ්‍යාපන කලාපයේ ප්‍රශ්න පත්‍ර බෙදා හැරීමේ මධ්‍යස්ථානය වූ බෝල්වලාන මධ්‍යස්ථානය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විමර්ශනය මඟින් කරුණු හෙළි වී ඇති ආකාරයට එහි දුර්වලතා හා අවිධිමත්භාවය නිරීක්ෂණය කර ඇත. ඒ අනුව ඒ මධ්‍යස්ථාන භාරව සිටි නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා එයට බලය තිබෙන්නා වූ බස්නාහිර පළාතේ අධ්‍යාපන බලධාරීන්ට අද දිනයේදී මෙය යොමු කර තිබෙනවා. ඒ වගේම පොලිසියේ පරීක්ෂණ අවසන් වූ වහාම පිටස්තර පුද්ගලයන්ට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කරනවා.

ඊයේ ගරු මන්ත්‍රීතුමා මගේ අවධානය යොමු කළා, ගලේවෙල කලාපයේ සිදු වූ ප්‍රමාදයක් සම්බන්ධයෙන්. ඒ පිළිබඳව වාර්තාවක් අද පුවත් පත්වල පළ වී තිබෙනවා. මධ්‍යම පළාතේ, ගලේවෙල කලාපයේ ප්‍රශ්න පත්‍ර වාහනයකින් ගෙන යාමේදී ඇති වී තිබෙන ප්‍රමාදයක් තමයි එතැන සිදු වෙලා තිබෙන්නේ. දැන් ඔබතුමන්ට පැහැදිලි වනවා ඇති, මේ කටයුත්ත පළාත් කලාප මට්ටමින් විධිමත්ව සිදු කර වීම සඳහා තමයි, අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයක් කරලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ කියලා. අපි සල්ලිත් දුන්නා, පළාත්වලට. ඒ ඒ පළාත්වලට මුදල් දුන්නු ප්‍රමාණය පිළිබඳ ලේඛනය හැන්සාඩ් ගත කිරීම සඳහා මා *සභාගත කරනවා.

පළාත් බලධාරීන්ගේ යුතුකම තමයි, මනා අධීක්ෂණයකින් සහ නිරීක්ෂණයකින් මේක කරන එක. මෙහිදී මතක තබා ගන්න ඕනෑ, මේකට විභාග දෙපාර්තමේන්තුව කිසිම සම්බන්ධයක් නැහැයි කියන එක ගරු කථානායකතුමනි, වෙන දාට පාසල් මට්ටමින් තමයි වාර පරීක්ෂණ පවත්වන්නේ. රෝනියෝ - Cyclostyle - කරලා තමයි ප්‍රශ්න පත්‍ර දෙන්නේ. ඒ වෙනුවට මේක විධිමත් කරන්නයි අපි සහයෝගය දුන්නේ. මේ වාර පරීක්ෂණයකින් ළමයකු උසස් කරන්නේත් නැහැ; අසමත් කරන්නේත් නැහැ. මෙතැනදී කරන්නේ වර්ෂයක් තුළදී හෝ වාරයක් තුළදී උගන්වපු දේ ඒ දරුවන් ධාරණය කර ගත්තාද, ඉගෙන ගත්තාද කියන කාරණය පරීක්ෂා කිරීමක්. ඒ නිසා මට විශ්වාසයි, රජයේ පාසලක කිසිම ගුරුවරයෙක් තමන් උගන්වපු දරුවකුට ප්‍රශ්න පත්‍රය කලින් දෙන්නේ නැහැයි කියලා. ඒක මට හොඳටම විශ්වාසයි. නමුත් මේක කරලා තිබෙන්නේ පෞද්ගලික බාහිර උපකාරක පන්තියකට ගුරුවරයෙක්. එහෙම කරනවා නම් මේ අය මෙවැනි පුද්ගලයකුට, —

---

* *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔහුට හම්බ වුණේ කොහොමද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
බෝලවලාන මධ්‍යස්ථානයේ අවිධිමත්භාවය නිසා එතැනින් ප්‍රශ්න පත්‍රයක් කවුරුන් හෝ දීලා තිබෙනවා. ඒක තමයි විමර්ශනයෙන් හෙළි වන්නේ. ඒකට අදාළ පුද්ගලයන් නීතියේ රැහැනට හසු කර ගන්න අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ පිළිබඳව ප්‍රකාශයක් කිරීම ගැන. බෝලවලාන මධ්‍යස්ථානයෙන් ප්‍රශ්න පත්‍ර ගෙන යන tuition ගුරුවරයා එකක් නොවෙයි, කිහිපයක් —

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
විද්‍යුත් මාධ්‍යයෙන් පෙන්වා දුන්නේ එකයි. නමුත් ඒකේ සම්පූර්ණ වාර්තාව දැන් මා අතේ තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා කිව්වේ, එකක් නොවෙයි කියලායි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මා දන්නවා, ඔබතුමා කියන කාරණය. ඒ වාර්තාව මා අතේ තිබෙනවා. මේ වන කොට බස්නාහිර පළාත් බලධාරීන්ට දැනුම් දුන්නා, මේ මධ්‍යස්ථානයේ සිටින අයට විරුද්ධව වහාම විනයානුකූලව පියවර ගන්න කියලා. රද්දොළුව පොලීසියට දැනුම් දීලා තිබෙනවා, සාක්ෂි සටහන් කර ගෙන ඒ පරීක්ෂණ අවසන් වුනු වහාම නීත්‍යානුකූල පියවර ගන්නය කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති. උතුරු මැද පළාත් සභාවේ ප්‍රශ්න පත්‍ර පිළිබඳව මීට කලින් ප්‍රශ්නයක් මතු වුණු වෙලාවේ ඔබතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා, පළාත් සභා කේන්ද්‍රගත කර ගෙන මෙම වාර විභාග නැවත පවත්වනවා වෙනුවට, මධ්‍යම ආණ්ඩුවේ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි ඒවා පවත්වන්නේ; ඒ නිසා මෙවැනි දෙයක් සිදු වෙන්න තිබෙන ඉඩ කඩ අහුරනවාය කියලා. හැබැයි දැන් එක එක විධියට දිගින් දිගටම මේක සිදු වෙමින් යනවා. එක අවස්ථාවකදී පළාත් සභාවේ වැරදි ප්‍රශ්න පත්‍ර මුද්‍රණය වෙලා තිබුණා. ප්‍රශ්න පත්තරවල අනික් පැත්තේ ප්‍රශ්න තිබුණේ නැති අවස්ථා තිබුණා. දැන් මතුවෙලා තිබෙන ප්‍රශ්නය තමයි ප්‍රශ්න පත්‍රය පිටතට ගිහින් තිබෙන එක.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
බෙදා හැරීමේ දී ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. එතකොට දැන් තිබෙන ප්‍රශ්නය තමයි මොනම හෝ විභාගයක් පැවැත්වීමේදී ළමයින් තුළ ඒ පිළිබඳව තිබෙන සාධාරණත්වයත්, ඒ පිළිබඳව තිබෙන විශ්වාසනීයත්වයත් ක්‍රමානුකූලව බිඳෙමින් යනවාය කියන එක. එක විටක ප්‍රවාහනයේදී ඒක බිඳෙනවා. තව විටෙක ප්‍රශ්න පත්‍ර පිටතට ගිහිල්ලා. තව විටෙක ප්‍රශ්න පත්තර වැරදියට මුද්‍රණය වෙලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පැත්තෙන් වගකීමක් තිබෙනවා ළමයින් ගැන කල්පනා කරලා මේක ඉතාමත් ඉක්මනින් නිවැරදි කරන්න.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔබතුමන්ලා ඔය මතු කරන ප්‍රශ්නය තමයි පසුගිය වාර පරීක්ෂණයේදී උතුරුමැද පළාතේ ප්‍රශ්න පත්තර 12 ක තිබුණු වැරදි සම්බන්ධයෙන් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
උතුරු මැද සහ ඌව.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒවා පළාත් මට්ටමෙන් හදපු ඒවායි. ගරු කථානායකතුමනි, 6 වසර සිට 11 වසර දක්වා ළමයින් දහතුන් ලක්ෂයක් මේ වාර පරීක්ෂණවලට පෙනී සිටිනවා. වාර පරීක්ෂණයක් කියන්නේ ළමයින් සමත් කරන හෝ අසමත් කරන විභාගයක් නොවෙයි. ඒක, වාරයක් අවසානයේදී ළමයාගේ සාධන මට්ටම පරීක්ෂා කිරීමක්. මෙතැනදී අපි මැදිහත් වෙලා දුන්නු දේ, ඒ ආකාරයෙන් පවත්වන්න, පළාත් බලධාරීන් දැන ගන්න ඕනෑ. රට පුරා එක තැනකින් ළමයින් දහතුන් ලක්ෂයකට ප්‍රශ්න පත්‍ර බෙදා හරින්න අමාත්‍යාංශයට බැහැ නේ. වෙනදා පළාත් මට්ටමෙන් තමයි මේවා කරන්නේ. මේ වතාවේ එය කිරීමේදී ප්‍රවාහනයේදී සහ බෙදා හැරීමේ දී තමයි ප්‍රශ්න මතු වෙලා තිබෙන්නේ. ඒක පොදු එකක්. ප්‍රශ්න පත්‍රයේ ගුණාත්මකභාවය ගැන නොවෙයි ගැටලුව තිබෙන්නේ.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ගරු ඇමතිතුමනි, ඔබතුමාම පිළිගත්තා වාහනයක් නැති නිසා ප්‍රශ්න පත්‍ර ටික ගිහිල්ලා නැහැ කියා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මම පිළිගත්තා නොවෙයි. මම කිව්වේ පත්තරේ තිබුණු එක.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ඇත්ත කතාව තමයි පත්තරේ තිබුණේ. නමුත් ඒ පැය ගණනවත් ළමයින්ට දීලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පරීක්ෂා කරලා පියවර ගන්නවා නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මේක මධ්‍යම පළාතේ, ගලේවෙල කලාපයේ වෙලා තිබෙන සිද්ධියක්. මම ප්‍රධාන ඇමතිතුමාට වහාම දැනුම් දුන්නා කරුණාකරලා මේ ගැන අධීක්ෂණය කරලා මේක හරියට කරවා ගන්නය කියා.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
එතකොට දැන් ඒ ළමයින්ට මොකද වෙන්නේ ?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
අපි ඒක දැනුම් දුන්නා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඉතා වැදගත් කාරණයක් ගැන නේ සාකච්ඡා කළේ. දැන් අපි කාරක සභා අවස්ථාවට යොමු වෙමු.

***සභාමේසය මත තබන ලද ලේඛනය :**
**சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று:*
** Statement tabled :*

2008 වර්ෂය සඳහා පාසල පදනම් කරගත් ඇගයීම් හා වාර පරීක්ෂණ ඒකාබද්ධ කිරීමේ නියාමක ව්‍යාපෘතිය යටතේ වාර පාරීක්ෂණ පැවැත්වීම. (තෙවන වාර පරීක්ෂණය)

| | පළාත | 6 ශ්‍රේණිය ශිෂ්‍ය සංඛ්‍යාව | 7 ශ්‍රේණිය ශිෂ්‍ය සංඛ්‍යාව | 10 ශ්‍රේණිය ශිෂ්‍ය සංඛ්‍යාව | 11 ශ්‍රේණිය ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු එකතුව | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 1. | බස්නාහිර | 90,141 | 90,779 | 84,695 | 86,695 | 352,310 | 17,615,500 |
| 2. | වයඹ | 39,515 | 39,305 | 37,085 | 39,085 | 154,990 | 7,749,500 |
| 3. | දකුණ | 38,683 | 41,064 | 40,329 | 44,212 | 164,288 | 8,214,400 |
| 4. | මධ්‍යම | 43,749 | 43,077 | 41,931 | 43,093 | 171,850 | 8,592,500 |
| 5. | සබරගමුව | 30,904 | 31,235 | 31,629 | 34,664 | 128,432 | 6,421,600 |
| 6. | ඌව | 23,745 | 24,255 | 22,400 | 24,400 | 94,800 | 4,740,000 |
| 7. | උතුරු මැද | 19,708 | 20,621 | 21,706 | 22,706 | 84,741 | 4,237,050 |
| 8. | උතුර | 20,274 | 20,694 | 19,314 | 20,314 | 80,596 | 4,029,800 |
| 9. | නැගෙනහිර | 32,404 | 32,215 | 27,332 | 26,417 | 118,368 | 5,918,400 |
| | එකතුව | 339,123 | 343,245 | 326,421 | 341,586 | 1,350,375 | 67,518,750 |

# විසර්ජන පනත් කෙටුම්පත, 2009
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2009
## APPROPRIATION BILL, 2009

කාරක සභාවේදී තවදුරටත් සලකා බලනලදී. [ප්‍රගතිය නොවැම්බර් 25]
[කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி : நவம்பர் 25]
[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]
Considered further in Committee - [Progress: 25th November]
[Mr. SPEAKER in the Chair.]

152 වන ශීර්ෂය.- වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 6,53,00,000

தலைப்பு 152 - நீர்ப்பாசனத்துறை, நீர்முகாமைத்துவ அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 6,53,00,000

HEAD 152.- MINISTER OF IRRIGATION AND WATER MANAGEMENT
Programme 01.- Operational Activities.- Recurrent Expenditure, Rs. 65,300,000

153 වන ශීර්ෂය.- ඉඩම් හා සංවර්ධන අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 10,96,38,000

தலைப்பு 153 - காணி, காணி அபிவிருத்தி அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 10,96,38,000

HEAD 153.- MINISTER OF LAND AND LAND DEVELOPMENT

Programme 01.- Operational Activities.- Recurrent Expenditure, Rs. 109,638,000

118 වන ශීර්ෂය.- කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 25,77,05,000

தலைப்பு 118 - இடர் முகாமைத்துவ, மனித உரிமைகள் அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 1. - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 25,77,05,000

HEAD 118.- MINISTER AGRICULTURAL DEVELOPMENT AND AGRARIAN SERVICES

Programme 01.- Operational Activities.- Recurrent Expenditure, Rs. 257,705,000

[පූ. භා. 10.18]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු සභාපතිතුමනි, " 2009 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවෙහි අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 152, 282, 153, 286-288 දක්වාත්, 118, 281, 285, 289 යන වැය ශීර්ෂයන්ගෙන් එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම හා මූලධන වියදම රුපියල් 10කින් කපා හැරිය යුතු ය"යි මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, යෝජනා කළා, ගරු සභාපතිතුමනි, මම යෝජනාව කළා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි, දැන් ඉතින් කතා කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔබතුමාගේ අනුමැතියක් නැතිව බැහැ නේ. ඔබතුමා තමයි පුටුවේ ඉන්න රජ්ජුරුවෝ. අනුමැතියක් එන තෙක් මා බලා ගෙන සිටියා.

ගරු සභාපතිතුමනි, අද ඉතාමත් වැදගත් දිනයක්. අපේ රටේ ජීවනාලිය ලෙස සලකන්නේ මොකක්ද? ජීවනාලිය ලෙස වාරි රාජ්‍යයක් සමඟ කෘෂි රාජ්‍යයක් කියන සංකල්පය තිබෙනවා. බුදු රජාණන් වහන්සේ දේශනා කළ පරිදි දැහැමි ලෙස පොළොවෙන් හම්බ කරන සංකල්පය තිබෙන්නේ ලෝකයේ රටවල් අතරින් ලංකාවෙයි. අද, වාරිමාර්ග හා ජල කළමනාකරණ, ඉඩම් හා ඉඩම් සංවර්ධන කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා කියන අමාත්‍යාංශවල වැය ශීර්ෂ යටතේ කථා කරන්නට මට විනාඩි 40ක කාලයක් ලැබී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ ශරීරයේ ලේවලට බද්ධ වෙලා අපේ ජීවනාලිය ලෙස තිබෙන මේ අමාත්‍යාංශ ගැන මා කථා කරන්නට කැමතියි. ගරු සභාපතිතුමනි, චින්තනය කියන එක, එක එක විධියට එනවා. චින්තනය එක එක ජාතියෙන්, එක එක දේවල් මවමවා පෙන්වනවා. එක්සත් ජාතික පක්ෂය, රජයක් විධියට නම් එහෙම අවේ නැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය භාරව සිටියා; සෞඛ්‍ය අමාත්‍යාංශය භාරව සිටියා; නොයෙකුත් අමාත්‍යාංශ භාරව සිටියා. එක්සත් ජාතික පක්ෂයේ අපි ආවේ සංවර්ධන සැලසුම් එක්කයි. 1994 දී එක්සත් ජාතික පක්ෂය පරදවලා සැබෑ වෙනසක් කරන්නට තමුන්නාන්සේලා පාලන බලය ගත්තා. අවුරුදු 14කින් දෙකයි අපි බලයේ හිටියේ. අපේ වත්මන් මහ ලේකම්තුමා, එදා මහ ලේකම් විධියට සිටිද්දී හිටපු ජනාධිපතිනිය සහතික කරලා මේ ගරු සභාවට ලියුමක් එව්වා. ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා එය ප්‍රකාශ කළා. බහුතරයක් තිබෙන තාක් පාර්ලිමේන්තුව විසුරු වන්නේ නැහැයි කියලා එතුමිය කිව්වා. එහෙම කිව්වාට ඒ හිටපු ජනාධිපතිනිය ඉතාම නින්දිත, ලැජ්ජා නැති, ජනාධිපති තනතුර කිළුටු කරන, දූෂණය කරන විධියට විසුරුවා හැරීමක් කළා. අද එතුමියට පහර වදින්නේ අපෙන් නොවෙයි. අද එතුමියට පහර වදින්නේ පාලක පක්ෂයෙන්මයි; ගෝල බාලයින්ගෙන්මයි. ඒක දිට්ඨධම්ම වේදනීය කර්මය විධියට එනවා. ඒක අපි කවුරුත් ඉගෙන ගන්න ඕනෑ. අපි සදා කල් දේශපාලන බලයේ ඉන්නේ නැහැ.

මේ අවුරුදු 14න් 12ක් තුළ මගේ මිත්‍ර ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා විධියට හිටියා; මහවැලි ඇමතිවරයා විධියට හිටියා; ඉඩම් ඇමතිවරයා විධියට හිටියා; පරිසර ඇමතිවරයා විධියට හිටියා.

විමල් රාජපක්ෂ මැතිතුමාට මම බොහොම ආදරෙයි. ඔබතුමා මහණ වුණා නම් රත්රන් හාමුදුරු නමක් වෙනවා. ඔබතුමාට මම බොහොම ගරු කරනවා. මගේ ඒ තරම් ගෞරවයක් ආදරයක් ඔබතුමාට තිබෙනවා. මම ඇත්ත කියන්නේ . මගේ හදවතේ තිබෙන දේ වචනවලින් ඔබතුමාට කියන්න බැහැ. ඒ ඔබතුමා තුළ තිබෙන හොඳ මහත්මා ගතිගුණ නිසායි. නමුත් අඩු දේවල් ටික මම පෙන්වනවා.

ගරු සභාපතිතුමනි, චන්ද්‍රිකා චින්තන, මහින්ද චින්තන කියා කස කසා පම්පෝරි ගහන්නේ 1994 ඉඳලායි. තමුන්නාන්සේලා අවුරුදු 12ක් රට පාලනය කළා. මහවැලි සංවර්ධන අමාත්‍යවරයා ලෙසත්, ආර්ථිකයේ ජීවනාලියට පන්දු ගහපු කෙනෙක් මගේ මිත්‍ර හිටපු මහවැලි සංවර්ධන ඇමතිතුමා. දැන් මොනවාද වෙන්නේ? මහින්ද චින්තන වැඩ පිළිවෙළේදී මෛත්‍රී වගා චින්තන ගැනත් කථා කරනවා. දැන් ඇමතිතුමා මට කථා කරන්නේ මෛත්‍රී චින්තන ගැන. ඒ මහින්ද චින්තන නොවෙයි. ඔබතුමා නේ බෝට්ටුව තල්ලු කරන් ඉන්නේ. මම ඔබතුමා නග්ගන්න ගිහිල්ලා ඔබතුමා කැපෙයිද දන්නේ නැහැ. ඒ ගැනත් මට භයක් තිබෙනවා. ඒ නිසා මම වැඩිය කියන්නේ නැහැ. ඔබතුමාට පසුව ඒ ටික කනට කොඳුරලා මම කියන්නම්.

ගරු සභාපතිතුමනි, වාරිමාර්ග හා කෘෂිකර්මය ගැන එදා අය වැය විවාදයේ කථා කරද්දී මම ටිකක් කනගාටු වුණා. මේ කෘෂිකර්මය ක්ෂේත්‍රයට එදා එක්සත් ජාතික පක්ෂය මොනවාද කෙරුවේ කියලා ඇහුවා. වාරිමාර්ග සම්බන්ධයෙන් කෙරුවේ මොනවාද කියලා ඇහුවා. මේ රටට කෙරුවේ මොනවාද කියලා ඇසුවා. ඒ ගැන මට හරි කනගාටුයි. ඒ මොකද, පන්ති කාමරයේ දී ගුරුවරයෙක් විධියටත්, ප්‍රේක්ෂකයෙක් විධියටත් එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය ගැන මම පොඩ්ඩක් මතක් කර දෙන්න ඕනෑ. මොකද, මහමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා පොළොන්නරුවේ පදිංචි කෙරුවේ ඔබතුමාගේ තාත්තාද සීයද දන්නේ නැහැ. සීයද?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
තාත්තා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
බොහොම ආඩම්බරයි. මෙතුමා ගොවි පුත්‍රයෙක්. එක්සත් ජාතික පක්ෂයෙන් හැදුන වැඩුන ගොවි පුත්‍රයෙක් අද මේ වාගේ ප්‍රබල ඇමතිවරයෙක් වෙලා ඉන්නේ නිදහස් අධ්‍යාපන සංකල්පය ගෙනාපු - චින්තනය ගෙනාපු - සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නියෝජනය කළ එක්සත් ජාතික පක්ෂයට පින් සිදු වෙන්නයි. ඔබතුමා වාගේ කෙනෙක් අද මේ තනතුරේ ඉඳීම ගැන අපි බොහොම ආඩම්බර වෙනවා. මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා කියන්නේ අනාගතය පෙනිලා අවුරුදු 50ක් 100ක් ඉස්සරහ බලලා කටයුතු කරපු නායකයෙක්; මහා පරාක්‍රමබාහු නැවත උප්පත්තියක් ලබා මේ රට ඉදිරියට ගෙන යන්න පැමිණි නායකයෙක්. සුද්දන්ගේ පාලනය යටතේ අවුරුදු 800ක් කැළෑ වෙලා වල් බිහි වුණු තැන්වල ඔබතුමාගේ ඒ පරම්පරාව පදිංචි කර තමයි අද ඒ තත්ත්වයට ආවේ. ඒ ගැන මම පොඩ්ඩක් කථා කරනවා. සුද්දා වැව් බැඳි රාජ්‍යයේ වැව් විනාශ කරලා, කෘෂි ආර්ථිකය විනාශ කරලා පැවැති එම යුගය නැවත වාරි කෘෂි ආර්ථිකයක් සහිත සමාජයක් බවට පත් කළේ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා. එතුමා දෙවියෙක් විධියට සලකන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුව ඉස්සරහ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමාගේ පිළිරුවක් හදන්න ඕනෑ. ඒ ශ්‍රේෂ්ඨ උත්තමයාට ආණ්ඩුවක්, පක්ෂයක් නැහැ. විමල් රාජපක්ෂ මැතිතුමනි, මල්ලීට - ජනාධිපතිතුමාට - මෙය ගිහිල්ලා කියන්න. එම කටයුත්තේදී පක්ෂයක් නොවෙයි අවශ්‍යව තිබෙන්නේ. මේ රටේ පිදිය යුත්තාට අපි පුදන්න ඕනෑ. මම නම් කළුද, කහද, රතුද, කොළද කියා බලන්නේ නැහැ; ජාතියක් වර්ගයක් බලන්නේ නැහැ; ආගමක් බලන්නේ නැහැ.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ඒ යෝජනාව බොහොම වැදගත්.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
බොහොම ස්තුතියි. ඔබතුමන්ලා ඒ පිළිබඳව ක්‍රියා කරන්න. ඒක හරි යනවා. මෙහි තිබෙන ජලාශය ඉස්සරහ ඒක හදන්න. අපේ කථානායකතුමා උතුම් වැඩක් කළා. බෝධියක් රෝපණය කරලා හැම දාම වඳිනවා. ඒක හොඳ වැඩක්. මම හරි ආඩම්බරයි. ඔබතුමාගේ අනුමැතිය මත අපේ විමල් රාජපක්ෂ මැතිතුමා ඒක ක්‍රියාත්මක කරන්න. ඒක ජාතියක් එකමුතු කරන සදානුස්මරණීය සංකේතයක් වෙනවා.

ගරු සභාපතිතුමනි, පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය වැව, අල්ලකන්තලේ, සේරුවිල, දක්වාත්, පදවිය, පාවක්කුළම දක්වාත්, යෝධ වැව, මිනිපේ ව්‍යාපාරය, අවුරුදු අටසීයකට වැඩි කාලයක් වල් බිහි වූ ගල්ඔය ව්‍යාපාරය වාගේ ව්‍යාපාර අලුතෙන් හදලා ජනතාව එහි පදිංචි කෙරෙව්වා. ඒ වායේ කාක්කෝ වාගේ මදුරුවෝ ඇවිත් අපේ සිංහල ජාතිය නැති කරනවායි කියලා ආචාර්ය එන්. එම්. පෙරේරා මැතිතුමා එදා කිව්වා. දකුණු ඉන්දියාවෙන් දෙමළ ජනතාව කම්කරුවන් වශයෙන් ගෙනැත් තේ වතුවල දැම්මා වාගේ කරන්නයි යෝජනා කළේ. ඩී. එස්. සේනානායක මැතිතුමා මහා ශ්‍රේෂ්ඨ දේවියෙක්; මහා ශ්‍රේෂ්ඨ උත්තමයෙක්. එතුමා ඒ ස්ථාවරත්වය ගෙන ගිය නිසායි අද රුහුණේත්, වෙල්ලස්සේත්, ඌවේත්, උතුරු මැදත්, උතුරු නැගෙනහිරත් ජාති, ආගම්, කුල භේද බලන්නේ නැතිව ඒ සංකල්පය ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා එතුමා මහත් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්.

ගරු සභාපතිතුමනි, අපේ කෘෂිකර්ම ඇමතිතුමා ගැන මම ඉතා ආඩම්බර වෙනවා. එතුමා කිව්වා, එතුමාගේ පියා දකුණු පළාත දියුණු කළායි කියලා. එදා කෘෂිකර්ම ඇමති විධියට එතුමා කළ වැඩ ගැන අපි ආඩම්බර වෙනවා. ඊට පසුව මහවැලිය ආරම්භ කළා. කවුද, මහවැලිය කළේ? මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමාගේ සිහිනය වූ පොල්ගොල්ල ව්‍යාපෘතියට එතුමාගේ පුතා වන ඩඩ්ලි සේනානායක මැතිතුමා මුල්ගල තැබුවා. එහි වැඩ ආරම්භ කළා.

සමහරු හඳෙන් හාල් ගෙනැත් දෙනවා කිව්වා, ඒ නිසා ජනතාව ඒ අයට ඡන්දය දුන්නා. හැබැයි හාල් හඳෙනුත් නැහැ. හාල් පොලු, මිරිස් පොලු තිබුණා. සාක්ටාර මාක් සහිත එලෝ මෙලෝ පෙනෙන ඇඳුම් හැඳුණා. 1970 - 77 යුගයේ. ගරු සභාපතිතුමනි, මතකයි නේ, අපි එකට ගිහින් කථා පවත්වපු හැටි? ඒ, එලෝ මෙලෝ පෙනෙන යුගයේ වුන දේවල්.

ඩඩ්ලි සේනානායක මැතිතුමා එදා අගමැති විධියට පොල්ගොල්ල ව්‍යාපෘතිය යම්තම් පටන් ගත්තා. පසුව පොල්ගොල්ල ව්‍යාපෘතිය විවෘත කළා. ඊට පස්සේ මහවැලි කියන පෙට්ටියට ඇණ ගහලා, අවුරුදු හත යන තෙක් එහෙමම තිබ්බා. අවුරුදු හතක බලයක් අර ගෙන ව්‍යවස්ථාවත් වෙනස් කළා. ඒ අවුරුදු හත ජනතාවට තිත්ත වුණා; එපා වුණා. ඔය ඇමතිතුමන්ලා එහෙම එදා වාගේ නීති පොලු දමන්න එපා. දැම්මොත් කෙළ වෙනවා. නැවත පොලු දමන්න ගියොත් එහෙම මොන යුද්ධය දිනුවත් ජනතාව තීරණයක් ගනියි. ජනතාවට ඉක්මනින් අමතක වෙනවා; මතකය තාවකාලිකයි. අපේ අයට මාසයෙන් අමතක වෙනවා. ඊට පස්සේ එන්නේ බඩගින්න; බොක්සිං ගහන එක. බඩේ බොක්සිං ගහද්දී අර කළ ඒවා ඔක්කොම අමතක වෙනවා. එතකොට යුඑන්පී එක නැඟිටලා එනවා. බලය කියන එක තාවකාලිකයි. බලය කියන එක ගැන අපි කවුරුත් දැන ගන්න ඕනැ. නිලධාරිනුත් දැන ගන්න ඕනැ. දේශපාලකයොත් දැන ගන්න ඕනැ. කවුරුත් දැන ගන්න ඕනැ. විපක්ෂයේත් එහෙමයි. ඒක මම කියනවා. ඩී. එස්. සේනානායක මැතිඳුන් වාගේ ශ්‍රේෂ්ඨ ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා අවුරුදු 32ක් මට ඉන්න බැහැ කිව්වා. එදත් අද වාගේ භාණ්ඩාගාරය හිස්. ඊටත් වඩා දරුණුව තිබුණු යුගයක ගාමිණී දිසානායක කියන තරුණයා මහවැලි ව්‍යාපාරය භාරව පත් කළා. අවුරුදු 8න් ඉවර කරනවා කිව්වාම හිනා වුණා. අද මේ විදුලිය තිබෙන්නේත් ඒ නිසායි. අපි දැන් සිටින මේ ගොඩනැඟිල්ල, මේ උත්තම ගොඩනැඟිල්ල ඉදි කළේත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා. මඩ ගොඩක පාර්ලිමේන්තුවක් හදනවා කියා එදා එතුමාට හිනා වුණා. එදා විපක්ෂයේ අය කථා කළ හැටි මතකයි නේ. ගරු සභාපතිතුමනි. නමුත් නායකයෙක් කියන්නේ අනුන් කියන විධියට, බෙරය ගහන විධියට නටන්න ආව කෙනෙක් නොවෙයි. නායකයෙක් කියන්නේ තමන්ගේ දර්ශනයත් චින්තනයත් ක්‍රියාත්මක කරලා නොසෙල්වී ප්‍රතිඵල දෙන කෙනකුටයි. ඒකයි මේ රටට ඕනැ කරන්නේ. අපේ ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා මහා විශ්වකර්මයෙක් විධියට නොසෙල්වුණු සිහිනයක් විධියට ඒක ඉෂ්ට කළා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 1994 මැතිවරණයේදී කිව්වා, "1977ට ඉස්සෙල්ලා මගේ අම්මාගේ කාලයේ මාතලේ පෝසිලේන් එක විතරයි තිබුණේ, නමුත් යුඑන්පී එක ඒ වෙනස කළා, නිදහස් ආර්ථිකය, පෞද්ගලික අංශය ගෙනාවා" කියලා. එතුමියම ඒවාම කිව්වා. අපි ආඩම්බර වෙනවා. හොඳ දෙයට හොඳයි කියනවා. එහෙම කරලා පවුල් ලක්ෂ 3ක් පදිංචි කරලා ඔබතුමා ඇමති වශයෙන් තවම බැබළෙන මහවැලි අමාත්‍යාංශය, මුළු ලංකාව බැබළ වූ මහවැලිය ගෙනාවේ එක්සත් ජාතික පක්ෂයයි. මේ රටේ වැඩක් කළා නම් කළේ එක්සත් ජාතික පක්ෂයයි. වාරි, කෘෂි, ජනපද වාගේම ආර්ථිකය දියුණු වන, සමාජය දියුණු වන ක්‍රම වේදයන්, නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය ක්‍රමය ආදී මේ හැම දෙයකම සියයට 80ක්ම ගෙනැල්ලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයයි. මම අභියෝග කරනවා. අපේ පක්ෂයෙන් ගිය පී. දයාරත්න ඇමතිතුමා මෙතන සිටියා. ගරු සභාපතිතුමනි, නිදහස් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හදන්න කියා රනිල් වික්‍රමසිංහ රජයේ අවුරුදු දෙකේදී දයාරත්න ඇමතිතුමාට කිව්වා. හැදුවා. මේ රජයට මම අභියෝග කරනවා, ඒක ක්‍රියාත්මක කරන්න කියලා.

ආණ්ඩු පක්ෂය පැත්තේ මගේ මිත්‍රයෙක් ඉන්නවා. එතුමාගේ ඔළුව විතරක් -ටිකක්- පෙනෙනවා. ඒ, කවුද? ඒ, පොළොන්නරුවේ සූරියආරච්චි මැතිතුමා වාගෙයි. ඔය පැත්තේ වැඩි කල් ඉන්නේ නැහැ නේ. මේ පැත්තට එනවා නේ. [බාධා කිරීමක්] අසත්‍යයක්. මට හමු වුණාම කියන්නේ වෙන දෙයක් නේ. කමක් නැහැ. ඔහොම කියන්න. ඔබතුමා බේරෙන්න කියන්න. [බාධා කිරීමක්] නැහැ. නැහැ. දැන් නොකිව්වාට කමක් නැහැ. මම අවුස්සන්නේ නැහැ. ඔබතුමා ඔහොම ඉන්න. පෞද්ගලිකව පස්සේ හෙමිහිට කනට කොඳුරා කියන්න.

ගරු සභාපතිතුමනි, නිදහස් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සම්බන්ධව Cabinet paper එකක් තිබෙනවාය කියා මම ඔබතුමාට කියනවා. හිටපු සෞඛ්‍ය ඇමතිතුමා වන පී. දයාරත්න මැතිතුමා මෙතැන ඉන්නවා. අද මිනිසුන්ට ජීවත් වන්න බැහැ. බෙහෙත් ගණන්. ඉස්පිරිතාලයේ යන්න බැහැ. මම දේශීය වෛද්‍ය ඇමතිතුමාට කිව්වා, තත්ත්ව පාලනයක් කරන්නය කියලා. ඒ වෙලාවේ ගරු සභාපතිතුමනි, ඔබතුමා සිටියේ නැහැ. අරිෂ්ටවල සියයට 18ක් 20ක් විතර alcohol තියෙනවා. ඒක නිසා cirrhosis හැදෙන්න ඉඩ තියෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාට මම ආදරෙයි. මම ඔබතුමාට සපෝට් කරනවා. X-ray unit එකක් ගෙනෙන්න [බාධා කිරීමක්] මම මේ ඔබතුමාට නොවෙයි කියන්නේ. හදිසි වෙන්න එපා. පොඩ්ඩක් ඔහොම ඉන්න කෝ. බොරැල්ල ආයුර්වේද රෝහලේ X-ray unit එකක් නැහැ. X-ray unit එකක් ගෙනැත් දමන්න. ඇටකටු කැඩිලා, ප්‍රතිකාර ගන්න ආයුර්වේදයට එන අය සඳහා X-ray unit එකක් ගෙනැත් දමන්න. ඔබතුමාත් හිටියානේ එතැන X-ray unit එකක් නැහැ. මම එදා එම රෝහලට ගියා. හරි කනගාටුයි [බාධා කිරීමක්]

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Indigenous Medicine)

තමුන්නාන්සේට අරගෙන දෙන්න තිබුණා නේ. දහහත් අවුරුද්දක් සිටියා නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මෙතුමා අසරණයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සභාපති නිමල් සිරිපාල ද සිල්වා, - [බාධා කිරීමක්] මේ ඉන්නේ. [බාධා කිරීමක්] අනේ ඔබතුමා වාඩි වෙන්න කෝ. තරහ වෙන්න එපා. ඔබතුමාට ආදරේට නේ කියන්නේ [බාධා කිරීමක්] අයියෝ තරහ වෙන්න එපා. ගරු සභාපතිතුමනි, අවුරුදු 32ක් ඒ දැවැන්ත කටයුත්ත කරලා, - [බාධා කිරීමක්] මගේ කාලය ගත වන නිසා මම ඒවාට උත්තර කියන්න යන්නේ නැහැ. [බාධා කිරීමක්] සහල් සේරු දෙක, - [බාධා කිරීමක්] ගරු සභාපතිතුමනි, මේ රටේ දැවැන්ත සංවර්ධනයක් කරන වෙලාවේ ඒකට කවුරුවත් නිගරු කරන්න හොඳ නැහැ. මේ ආණ්ඩුව හොඳ දෙයක් කරන කොට අපි ඒකට

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

හොඳයි කියන්න ඕනෑ. කවුරු හෝ හොඳ දෙයක් කළානම් ඒකට අපි හොඳයි කියන්න ඕනෑ. හොඳ දේවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ රටේ කරුමය මොකක්ද? අර ඉන්දියාව වගේ නොවෙයි. මේ රටේ කරුමය මොකක්ද? ආණ්ඩුවේ කවුරු හෝ ඇමතිවරයෙක් හොඳ දෙයක් කරන්න යනවා නම් වෙනත් ඇමතිවරයෙක් ඇවිල්ලා ඒක වෙනස් කරනවා. ජාතික සැලැස්මක් පළාත් සැලැස්මක්, ප්‍රාදේශීය සැලැස්මක්, කෘෂි සැලැස්මක් ක්‍රියාත්මක කරන්න ඕනෑ, පාට බලලා නොවෙයි. ඉන්දියාවේ නිලධාරින් නැමෙන්නේ නැහැ. අන්න ඒකයි ඉන්දියාව දියුණු වන්නේ. අපේ නිලධාරින් තොප්පිය මාරු කරනවා; එහෙයි ගානවා; ඇමතිවරයා සන්තෝෂ කරන්න සැලසුම වෙනස් කරනවා. රටට කෙළ වෙනවා. ඇමතිතුමාව රවට්ටනවා, නිලධාරින් ඇමති වෙනවා. නැත්නම් පියුන් ඒක කරන්න හදනවා. තොප්පිය මාරු කරනවා. මම දිසා ඇමතිවරයා හැටියට කටයුතු කරන කොට මේක හොඳට දැක්කා. මම නිලධාරීන්ට හොඳට ටොක්ක ඇන්නා. මමයි, ඩී. බී. වෙලගෙදර මැතිතුමාවයි ඔය විධියට භේද කරන්න හැදුවා. ඒ කාලේ - දිසා ඇමති කාලේ - මම කොල්ලා නේ. එතුමා ජ්‍යෝෂ්ඨ කෙනා. ඒ කාලේ මම නිලධාරීන්ට ටොක්ක ඇන්න. [බාධා කිරීමක්] දැනුත් එහෙම තමයි. කොල්ලාවාගේ තමයි වැඩ. තවමත් වැඩ එහෙමයි. හොඳට වැඩ කරන්න පුළුවන්. ඔබතුමාට වඩා මට කාර්යශූරත්වය තියෙනවා; හැම දේම තියෙනවා. හැබැයි මෙතුමා මට වඩා දක්ෂ කෙනෙක් [බාධා කිරීමක්] මම දන්නේ නැහැ. ඇමතිතුමාමත් හිනා වෙනවා.

ගරු සභාපතිතුමනි, "එත් ගමක් - එක් වගාවක්" සංකල්පය බලන්න. අනේ සභාපතිතුමනි, ඒ ගැන හරි සතුටුයි. හොඳ දේ මම අගය කරනවා. ජනාධිපතිතුමාගේ අය වැය ප්‍රකාශය බලන්න. තේ, රබර්, පොල් කියන වැවිලි තුන තියෙනවා නේ. Large-scale cultivation in one area. ලොකු පළාතක එක වගාවක් තියෙනවා. අපේ රටේ කරුමය මොකක්ද? මෙන්න මේ වගේ මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන සැලසුම් තුළ බෝග වගා කිරීම කන්නයෙන් කන්නය සිදු වෙන්න පුළුවන්. ඒ විධියේ සැලසුමක් නැහැ. මම දිසා ඇමතිවරයා හැටියටත්, ප්‍රධාන ඇමතිවරයා හැටියටත් "එක වගාවක් එක පළාතක" කියන කෘෂි සංකල්පය ගෙනාවා; කර්මාන්ත ගෙනාවා; ගෘහ කර්මාන්ත ගෙනාව; දේශීය නිෂ්පාදනයන් කළා. මේ තියෙන්නේ මම ප්‍රධාන ඇමතිවරයා හැටියට කටයුතු කරන කොට ගහපු brochure එක. ගරු සභාපතිතුමනි. මේ තිබෙන්නේ. "One area - One product" කියන එක. මම වාරිමාර්ග ඇමතිවරයා හැටියට ඉන්න කොටත් මම එස්. බී. දිසානායක මැතිතුමාට කිව්වා, "එස්බී අපි එක්කහු වෙමු" කියලා. මොකද, මේ එටේ ජීවනාලිය වන්නේ මහවැලි අංශයයි, වාරි අංශයයි. අපි සැලසුම් හැදුවා ගරු ඇමතිතුමා, ඇඹිලිපිටියේ JICA project එක තුළ මම වාරියපොළට අඹ පැළ 2,000ක් යැව්වා. ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමා යන්න හොඳ අඹ පැළ ඒවාට කියන්නේ මල්වානේ අඹ කියලා. "Underground" කියලයි කිව්වේ. පැළ 2,000ක් එහාට යවලා පැළ කෙරෙව්වා. ඒ අඹ පිට රට පටවන්නත් පුළුවන්. මම අඹ ගම්මාන ඇති කළා. රත්නායක මැතිතුමා අද සිටියා නම් එතුමා ඒ විස්තර දන්නවා. මා ළඟ සිටිය ලේකම් තමයි අද අධ්‍යක්ෂක වෙලා ඉන්නේ. අඹ ගම්මාන, දෙහි ගම්මාන, දොඩම් ගම්මාන, පශු ගම්මාන, ඖෂධ ගම්මාන ඇති කළා. අපි ඒ විධියට ගම්මාන ඇති කළා. මේ සංකල්පය සාර්ථක වෙන්න නම් භූගෝලීය විධියට තියෙන දේශගුණය සහ මිනිස් සම්පත්වල දක්ෂකම් යන මේ සෑම දෙයක්ම යොදා ගන්නට ඕනෑ. අන්න ඒක නිසා මම ආඩම්බර වෙනවා. අපේ ඇමතිතුමා ඔබතුමන්ලා "එක් ගමක් - එක් වගාවක්" කියද්දී මම අහන්නේ මේකයි.

රජයට අනුබද්ධ පක්ෂයක් වන හෙළ උරුමය දුම් වැටි පාලනයක් කරන්න යෝජනාවක් ගෙනාවා. දේශීය වෛද්‍ය අමාත්‍යතුමාත් දන්නවා. නමුත් 1970 - 77 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ පාලන කාලයේ දී රජයේ භාණ්ඩාගාරයට සල්ලි නැතිව, සවසට Ceylon Tobacco Company Limited එකට යනවා. යන්නේ කවුද? භාණ්ඩාගාර නිලධාරීන් යන්නේ. ඇයි යන්නේ? භාණ්ඩාගාරයට සල්ලි නැති නිසා. ගිහින් එහි තිබෙන සල්ලි ටික අරගෙන එනවා. මෙය ඇත්තක්. මා අසත්‍යයක් කියනවා නම් සොයා බලන්න. ඒ සල්ලි ටිකෙනුයි එදා රට ගෙන ගියේ. අදත් දුම්කොළ සංස්ථාවයි ලංකාවේ ආර්ථිකයට විශාල වශයෙන් දායක වන්නේ.

" CTC major contributor to Government revenue"

The "Financial Times" of the "Daily Mirror" dated 18th November, 2008 states, I quote :

"Ceylon Tobacco company (CTC) stated that Government levies from the tobacco industry have grown from Rs. 29.5 billion during the 9 months ended September 30, 2007 Rs. To Rs. 34.3 billion during the same period in 2008"

ඒ කියන්නේ කෘෂි ආර්ථිකයේ අද දුම්කොළ වගාව ප්‍රධාන තැනක් ගන්නවා. සිගරට් බීම පාලනය කරන්න පනතකුත් ගෙනාවා. කාඩ් බෝඩ් එකකුත් දමා තිබෙනවා. "අනිච්චාවත සංඛාරා" හදවත පෙනහළු දිය වෙන්න කෘෂි අංශයේ වගා කරන දුම්කොළ බීම වැඩි වී තිබෙන බවයි, මේ බදු ආදායමෙන් පෙන්වන්නේ කියන එක මා කියනවා. මා නොවෙයි මේ කියන්නේ සංඛ්‍යා ලේඛනවලින් කියන්නේ.

ගරු සභාපතිතුමනි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය වී. ඕ. ජී. දයාරත්න මහතා ඇතුළු මහාචාර්යවරු පිරිසක් සමීක්ෂණයක් කළා. මොකක්ද කළ සමීක්ෂණය? ඇයි මේ ජීවන වියදම වැඩි වන්නේ කියන එක ගැනයි සමීක්ෂණය කළේ අපේ දේශීය වී වලට මේ ප්‍රශ්නය තිබෙන්නේ ඇයි? ඔවුන්ගේ සමීක්ෂණයේ ප්‍රතිඵල දැක්වෙන ලිපියේ පිටු ඔක්කෝම අවශ්‍ය නම් මා දෙන්නම්. ඒ සමීක්ෂණයෙන් හෙළි වී තිබුණේ මොකක්ද? ප්‍රශ්න ඇති වීමට හේතුව වශයෙන් තිබුණේ රජය අනවශ්‍ය ලෙස ඇඟිලි ගැසීමයි. දේශපාලනීකරණය කර තිබීමයි. විද්වතුන් කණ්ඩායමකගේ පරීක්ෂණයක් සම්බන්ධයෙන් පත්තරයේ දැක්වෙන දෙයක් ගැනයි මා මේ කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, තිරිඟු පිටි තහනම් කරන්න ඕනෑ. ඇත්ත. තිරිඟු පිටි තහනම් කර අපේ දේශීය නිෂ්පාදන වැඩි කරන්නට ඕනෑ. නමුත් වී නිෂ්පාදනය වැඩි වෙන්නේ නැතිව, එක වරටම ඒවා තහනම් කළ ගමන් ජීවන වියදම් වැඩි වෙනවා. අපට නම් කමක් නැහැ. අප කොහොම හරි කාලා ජීවත් වෙනවා. අහිංසක මිනිස්සු, නගර බද ජනයා, වතු කම්කරුවෝ මොකද කරන්නේ? වතු කම්කරුවන්ට වෙනම සහනයක් දැන් දෙනවාද? නගර බදව ඉන්න අයට සහනයක් දෙනවාද? රජයේ සේවකයන්ට සහනයක් දෙනවාද? මේ දෙකම එකට යන වැඩ පිළිවෙළක් හදලා දීර්ඝ කාලීන විධියට බදු සහන දී මේවා අවුරුදු තුනකින් තහනම් කරනවාය කියා හෝ සැලසුම හදන්න ඕනෑ. එහෙම ඒවා සිදු වෙලා නැහැ. ඒකයි මෙහෙම වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මා අද ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. මා එදා ප්‍රශ්නයක් අහද්දී මෙතැන දී ඔබතුමා කිව්වා, සියයට සියයක් සහල් පිටි වලින් පාන් හදනවායි කියා. ගරු ඇමතිතුමනි, එහෙම පාන් හදනවා ද? තවම හදන්නේ නැහැ නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. "නිපුන" ගරු ඇමතිතුමා තවම සියයට සියයක් තනිකරම හාල් පිටි වලින් පාන් හදන්න බැහැ නෙ.

**ගරු සිරිපාල ගම්ලත් මහතා (ගොවිජන සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சிறிபால கமலத் - கமநல சேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. Siripala Gamlath - Deputy Minister of Agrarian Services)

සියයට සියයක් නොවෙයි. [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)

(The Hon. Gamini Jayawickrama Perera)

සියයට සියයක් බැහැ. හරි.මා ඔබතුමන්ලාව විවේචනය කරනවා නොවෙයි. ගරු සභාපතිතුමනි, මා කොරියාවට ගියා ඔබතුමා දන්නවා. මා Asia pacific parliamentarians' union එකේ මහ ලේකම් විධියට APPCED එකේ Workshop එකකට

කොරියාවට ගියා. එහි දී කොරියන් ජාතිකයෙක් මා ලාංකිකයෙක් බව දැන ගෙන, "සර් එන්න සර්ව හාල් මෝලකට එක්ක ගෙන යන්නම්'' කියා මාව හාල් මෝලකට එක්ක ගෙන ගියා. මා ඒක බලන්න ගියා. මා දවසක් ඒකට ගත කළා. එහිදී මේ කොරියන් ජාතිකයා මට දුන් ඒ සහල් සාම්පල් ටික මම ගෙනාවා. නමුත් ආරක්ෂක හේතූන් මත මේ සභාවට ගේන්න බැරි වුණා. සමරජීව ඉන්ස්පෙක්ටර් මහත්මයා ළඟ ඒවා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මා මේ ඇමතිවරුන්ට දොස් කියනවා නොවෙයි. මේ කොරියන් ජාතිකයා ලංකාවට හය සැරයක් ඇවිත් තිබෙනවා. ඔහුට මේ ගැන කලකිරිලා තිත්ත වෙලා තිබෙනවා. මොකද? අර දේශපාලකයෝ කට්ටියක් - කවුද කියා මා දන්නේ නැහැ - "මෙහෙ ආයෝජනය කරන්න, ඔබ මේකෙන් කොච්චර commission දෙනවා ද'' කියා ඒ කොරියන් ජාතිකයාගෙන් ඇහුවාලු. මටම ලැජ්ජා හිතුණා. කවුද කියා මා දන්නේ නැහැ.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
අපව නම් හම්බවෙලා නැහැ. [බාධා කිරීම්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
නැහැ. නැහැ. ඔය කට්ටිය නොවෙයි. ඔබතුමා නම් මා කෙළින්ම කියනවා. ඔබතුමා නොවෙයි. කවුරු හෝ කට්ටියක් හම්බ වෙන්න ගිහින් තිබෙනවා. He said, "The Ministers of your country whom I met asked for a commission.'' He said that they asked, "How much are you going to give us if we allow you to invest in Sri Lanka?'' ගරු අමතිතුමනි, මා විස්තර දෙන්නම්. අන්න පල්ලෙහා හාල් පිටි ටික තිබෙනවා. සියයට සියයක් හාල් පිටිවලින් හැදූ දේවල් American bases වලට දෙනවා. ඒ කොරියන් කාරයාගේ හාල් පිටියි කෙළින්ම American bases වලටත් දෙන්නේ. අද තනිකරම හාල් පිටිවලින් පාන් හදනවා. කේක් හදනවා. හැම දෙයම හදනවා. රජයත් ඒකට අත දී තිබෙනවා. රජයත් ඒකට සහනයක් දී තිබෙනවා. ඇයි? අර හාල්වලින් පිටි හදද්දී පිට රටින් තිරිඟු පිටි ගේන්නේ නැහැ. විදේශ විනිමය ඉතිරි වෙනවා, කොරියාවේ. ඊළඟට ගොවියාට තරගකාරි ක්‍රමයට මිල වැඩි වෙනවා. අන්න ගොවියාට ලැබෙන සහනය. ගරු ඇමතිතුමනි, මේ කොරියන්කාරයා මට කිව්වේ මොකක්ද දන්නවා ද? ඔහු මට කිව්වේ, Why are you asking me to come to Sri Lanka? කියලායි. I said, "Because this will help the farmer, the prices will go up with the increasing demand'' Then he said, "You are the only politician who asked me to come there for the sake of the people.'' What happened was what I referred to earlier. I do not want to repeat that again. මම ඊයේ IT Institute එකේ Director, Dr. Mubarak එක්ක කථා කළා. එතුමා කියනවා පාන් හදන්න සියයට විස්සක් පාන් පිටිවලට සියයට හැත්තෑවක් හාල් පිටි දමනවාය කියා. මම සාම්පල් ගෙනාව. මම ඒකෙන් කොළ කැඳ බිව්වා. සුප් වාගේ හදලා මට එතැනින් දුන්නා. මාව ෆැක්ටරියේ ඇතුළට එක්ක ගෙන ගියා. අපි මේ තාක්ෂණය ගෙනෙන්න ඕනෑ. එතකොට අපේ ගොවියාට ඉල්ලුම වැඩි වෙනවා. තරඟකාරි ක්‍රමයක් ඇති වෙනවා. අපේ සල්ලි බිලියන ගනනක් තිරිඟු පිටිවලට යන එක නවතිනවා. මෙන්න මේවා අපි ගමට හඳුන්වා දෙමු. මේ තාක්ෂණය ගමට ගෙන එමු. මම කථා කරන්නේ රට දිහා බලලායි. මම මේ දේශපාලනයක් ගැන කථා කරනවා නොවෙයි. මම ඔබතුමන්ලාව විවේචනය කරනවා නොවෙයි. මේ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක්. ඒකයි මම මෙහෙම කථා කරන්නේ. අප නිදහස ලබා අවුරුදු හැටක් ගත වෙලාත් අපි තවම එකිනෙකාගේ පිට කසා ගන්නවා. අහිංසක මිනිහා එන්න එන්නම වළට වැටෙනවා. මෙන්න මේකයි තිබෙන තත්ත්වය ගරු සභාපතිතුමනි, ඒ තාක්ෂණය පිළිබඳ විස්තර මම ඕනෑ වේලාවක තමුන්නාන්සේලාට දෙන්න සූදානම්.

ඊළඟට ගරු සභාපතිතුමනි, අපේ වෙළඳ පොළේ තිබෙන අර්බුද ගැන මම කතා කරන්න ඕනෑ. විවේචනය කරනවා විතරක්ම නොවෙයි. මම කථා කරන්නේ අර්ථවත් විධියටයි. වාරි අංශය දියුණු කිරීම් ගැන මම වැඩිය කථා කරන්නේ නැහැ. මොකද, වාරි අංශයට වඩා කෘෂි අංශය දියුණු කළේ නැත්නම් රටට අනාගතයක් නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා. ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය සභාපතිතුමා [ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு இரா. சந்திரசேகர்] தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. SPEAKER left the Chair, and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES (THE HON. RAMALINGAM CHANDRASEKAR) took the Chair.*

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ වී වගා කරන බිම් හෙක්ටෙයාර අට ලක්ෂ අනූ දහසක් අපි වී මෙට්‍රික් ටොන් තිස්ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ගන්නවා. අද බිත්තර වී නිෂ්පාදනය ගැන කථා කිරීමේදී මම බොහොම කනගාටු වෙනවා. බිත්තර වී නිෂ්පදනය සඳහා පෞද්ගලික අංශයේත් ප්‍රමුඛතාවෙන් මහවැලි කලාපවල ගොවීන්ද, අතුළුව, මේ සම්බන්ධයෙන් කටයුතු කරන අනෙක් සියලුම ගොවීන් සමඟ රාජ්‍ය අංශයේත් මැදිහත් වීමෙන් මීට වඩා විධිමත්ව බීජ වී නිෂ්පාදනය වැඩි කරන වැඩ පිළිවෙළක් දෙපාර්තමේන්තු තුළ ඇති වෙන්න ඕනෑ. ගොවියාගේ තත්ත්ව පාලනයක් එක්ක ගොවි සමාගම් ඇති කරලා හෝ ගොවි යායවල් ඇති කරලා හෝ මේ ගැන ක්‍රියා කරන්න ඕනෑ. එය මා විශේෂයෙන් කියන්න කැමැතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද තිබෙන රජයේ ගොවි පර්යේෂණ අංශ ගැන මා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවා. අහපු ප්‍රශ්නය මොකක්ද? රජයේ ගොවි පර්යේෂණ මධ්‍යස්ථාන කීයක් තිබෙනවාද, අප පිට රටින් ගෙනෙන බීජ වර්ග මොනවාද, කොච්චර ප්‍රමාණයක මිලකට ද, කොයි රටවලින්ද ගේන්නේ, අපේ රටේ මොනවාද පර්යේෂණ කරලා නිෂ්පාදනය කරන්නේ කියලා ඇසුවා. ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලැබී තිබෙනවා, පිටු හයක, අටක පමණ වාර්තාවක්. මහ මාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා තමයි මුලින්ම ගොවි පර්යේෂණ මධ්‍යස්ථාන ඇති කළේ; ගොවි පොළවල් ඇති කළේ. අද මේ පර්යේෂණ මධ්‍යස්ථානවල කටයුතු සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සතුටු වන ගමන්ම ඊට වඩා අසතුටට පත් වෙනවා. කෙටි සහ දීර්ඝ කාලීන වශයෙන් මට ලැබී තිබෙනවා වාර්තාවන් කිහිපයක්. උද්‍යාන බෝග පරීක්ෂණ වාර්තා, සහල් පරීක්ෂණ වාර්තා මේ ඔක්කෝම මා ගාව තිබෙනවා. අපේ යූඑන්පී රජය කාලයේ මම ප්‍රධාන ඇමති විධියට පත් වෙලා ඉන්න විට එක වතාවක් - මම මේ නිලධාරීන්ගේ රැවටීම් ගැනයි කියන්නේ -. අපේ පළාත් කෘෂිකර්ම නිලධාරියාට මම කිව්වා. එවකට අපේ රජයේ හිටපු කෘෂිකර්ම ඇමතිතුමා හම්බ වෙන්න ඕනෑය කියා. එහෙම කියලා මම එතුමා හමු වෙන්න ආවා. එහිදී ම කරුණු පෙන්වූවා. මේ පර්යේෂණ සාර්ථක වෙන්න නම් මේ පර්යේෂණ සම්බන්ධයෙන් මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑය කියා මම පෙන්වා දුන්නා. මම එහෙම කරුණු පෙන්වා දෙද්දී, නිළධාරි මහත්වරුන් ඇමතිතුමාට බටර් ගාලා වෙනත් දෙයක් පෙන්වූවා. මම අපේ නිලධාරීන්ට කිව්වා. "අපි යමු, වැඩක් නැහැ''ය කියලා. මෙන්න මේකයි තිත්ත ඇත්ත. ආනමඩුවේ තමයි ඒ වෙලාවේ හොඳම grapes තිබුණේ. ඩොක්ටර් එඩ් හේරත් තමයි ඒ වෙලාවේ හිටියේ. මේ මනුෂ්‍යයාව Director කළා පරිපාලනයේ. ගරු ඇමතිතුමනි, මම එක්ක කියන්නම්. නිලධාරීන්ට උසස්වීම් දෙන්න. දක්ෂ නිලධාරීන් ලංකාවේ ඉන්නවා. මේ නිලධාරියාට උසස්වීම් දෙන ගමන් ඒ පර්යේෂණ අංශයේ

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

විශේෂඥයකු විධියට ඔහුට ඒ අංශයේම ක්‍රියා කරන්න දෙන්න. ඔහුට ඒ අංශයම භාර දෙන්න. පොත්වල කඩදාසිවලට පමණක් සිරකර තබන්නට එපා. අපේ ලංකාවේ පර්යේෂණවල තිබෙන මෙන්න මේ තත්තවය පිළිබඳව හරි කනගාටුයි. ලජ්ජයි. ඇමතිතුමනි, හදවතට තට්ටු කරලා බලන්න. චමල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන්ද? අපේ ඇමතිතුමාට පුළුවන්ද? ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් මා අහන්න කැමැතියි. අද අපි පිට රටින් ගෙනැල්ලායි දෙළුම් ගෙඩියක් කන්නේ. මට කියන්න අද අපේ රටට අලුතින් හඳුන්වා දී තිබෙන අඹ වර්ගයක් ගැන. ඔබතුමන්ලා නැඟිටලා මට කියන්න. මොනවාද තිබෙන්නේ? ඇමතිතුමනි, මා වයඹ ප්‍රධාන ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ වාරියපොළ සිටියා, පින්තු කියලා නිලධාරියෙක්. අර මා කිව්වේ අඹ වර්ගයක් ගැන. පේරාදෙණියේ රුපියල් 10ට කර්තකොළොම්බාන් අඹ ගෙඩියක් විකුණද්දී අනඩර්ග්‍රවුන්ඩ් කියන වර්ගයේ අඹ ගෙඩියක් පේරාදෙණියේ මාර්කට් එකේ වෙළෙන්දෝ රුපියල් 13ට විකුණුවා. මේ මනුෂ්‍යයා සොයා ගෙන ගිහිල්ල බලද්දි ඒ අඹ වාරියපොළ නිකම් අහම්බෙන් හැදිච්ච මල්වානේ අඹ කියන එක හඳුනා ගත්තා. අමාත්‍යාංශයට ඒ අඹ ගෙඩියක් ගෙනැල්ල මට කන්න දීලා ඇහුවා, "සර්. මේ ජාතිය දන්නවාද" කියලා. මම කිව්වා. "දන්නේ නැහැ" කියලා, "කොහෙද තියෙන්නේ?" කියලා ඇහුවාම, "වාරියපොළ" කියලා කිව්වා. මම ගිහිල්ලා බැලුවා. අද  නිෂ්පාදන ඔක්කොම නැවතිලා. මම මේ ඇත්ත කියන්නේ.

ඇමතිතුමනි, මේ පර්යේෂණ මධ්‍යස්ථානවලට මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන ඉලක්ක දැඩි විධියට දෙන්න. මෙන්න මේ බෝග වර්ග පර්යේෂණ මධ්‍යස්ථානයක් අපිට ඕනෑ.  මා ළඟ තිබෙනවා, පිට රටින් ගෙන්වන බීජ වර්ග පිළිබඳව සංඛ්‍යා ලේඛනයක්. මේ ගැන මා කනගාටු වෙනවා. මේවා සියයට 85ක් අපේ රටේ හදන්නට පුළුවන්. අපි අපේම පිට කහ ගන්න එපා. දේශපාලනඥයන් හැටියට අපි යනවා, එනවා. දියුණු තාක්ෂණයත් එක්ක බීජ වර්ග නිෂ්පාදනය කරන්නට මේ රටේ අනාගත පරම්පරාව පුහුණු කරන්නට ඕනෑ. මේ රටේ අපි පිට රටට වහල් වෙලා සිටිය යුතු නැහැ. ජනාධිපතිතුමාගේ "අපි වවමු — රට නඟමු" කියන සංකල්පය හරි යන්නට නම් අපි ඒ විධියට කටයුතු කරන්නට ඕනෑ. මම වැඳලා ඉල්ලන්නේ මෙයයි. පර්යේෂණ අංශය සාර්ථක නැත්නම් අපි එහෙම්මම ඉවරයි. සිංගප්පූරුව අපිට වඩා දියුණුයි. එහි නොයෙකුත් බෝග වර්ග හදනවා. තායිලන්තය, මැලේසියාව වැනි රටවලට ගිහිල්ලා බලපුවාම අපිට අපි ගැනම ලජ්ජා වන්නට සිදු වෙනවා. මා වේදනාවෙන් යුතුවයි මේ කථා කරන්නේ. මේ රවටන වැඩ පිළිවෙළ අපි නවත්වන්නට ඕනෑ. ඇමතිතුමනි, පර්යේෂණ අංශයේ මේ තිබෙන සංඛ්‍යා ලේඛණ ඔබතුමාවත් දැකලා නැතිව ඇති. මේ තිබෙන පිට රටින් ගෙන්වන බෝග වර්ග පිළිබඳ සංඛ්‍යාලේඛනය ඔබතුමාටවත් දීලා නැහැ කියලායි මා හිතන්නේ. අරන් බලන්න, ඇමතිතුමනි. මේ පිළිබඳව මා බොහොම ලජ්ජා වනවා. ඇයි, අපිට මේවා හදන්න බැරිවද? පර්යේෂණ මධ්‍යස්ථාන මහා සංඛ්‍යාවක් තිබෙනවා. මම පුදුම වුණා. ඒ පර්යේෂණ මධ්‍යස්ථානවලින් කෙරෙන්නේ මොනවාද? ඒ කෙරෙන කාර්ය මදි. ඒ නිසා මා ඒ ගැන එහෙම කියනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟට දඹුල්ල වෙළෙඳ මධ්‍යස්ථානය ගැන අපි කථා කරමු. මහවැලියට පින් සිදු වන්නට, යූඑන්පී එකට පින් සිදු වන්නට වාරි ක්‍රම ඇති වුණා. නමුත් මොනවාද කරන්නේ? Dozers වලින්, loaders වලින් එක වර තක්කාලි ගෙනැල්ලා හැලුවා. ඇයි? තක්කාලි කිලෝව රුපියල් දෙසිය පණහට ගියා. අනේ! රජරට සිටින අපේ ඇමතිතුමාත් දන්නවා ඇති. එතකොට ලංකාවේ ඔක්කොම ගොවියෝ තක්කාලි වවන්න පටන් ගත්තා. අනිච්චාවත සංඛාරා! ඇයි? Monitor කරලා guide කරන්න කියන්නේ නැහැ. National operations room එකකින් කියන්නේ නැහැ, අහවල් පළාතේ, අහවල් කලාපයේ, අහවල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙපමණ හෙක්ටයාර් ප්‍රමාණයක් වවන්නය කියලා. එහෙම සීමා කිරීමක් කළේ නැහැ. ඒ කිසිම දෙයක් නැහැ. මිරිස් කිලෝව රුපියල් 300ට මිල ඉහළ ගිහින් තිබුණා. එතකොට ලංකාවේ ගොවියෝ ඔක්කොම මිරිස් වවනවා. මොකද වෙන්නේ? ඉන් පසුව මිරිස් කුණු කොල්ලයට දෙන්න සිදු වෙනවා. ඉතිරි ටික කුණු බක්කියට දමනවා. අනේ දෙයියනේ! පසු ගිය නත්තල් කාලයේ  අර අහිංසක ගොවීන්ගේ තක්කාලි loaders වලින් ගෙන  ගිහිල්ලා අහකට හැලුවා. රතු ලූනුත් එහෙමයි. අන්න ඒ ගැන දැන් article එකක් තිබෙනවා. විකුණා ගන්න බැරිව දිවි නසා ගන්නවා. කවුද වරද කරන්නේ? අපියි, මේ දේශපාලකයෝ. මමයි, එස්. බී. දිසානායක මැතිතුමායි national operations room එකක් ඇති කරන්න සූදානම් වුණා. ඒ නිලධාරින් අද මේ ගරු සභාවේ නිලධාරින්ගේ කුටියේ සිටිනවා. දැන් ඔබතුමාගේ පිට කහන මට හිතවත්ව සිටි නිලධාරින් දැන් මේ ගරු සභාවේ නිලධාරින්ගේ කුටියේ සිටිනවා. මහවැලියේ කටයුතු කළ නිලධාරිනුත් එතැන සිටිනවා. වාරි අංශයේ කටයුතු කරන අයත් සිටිනවා. කෘෂි අංශයේ කටයුතු කරන අයත් සිටිනවා. ඇමතිවරු රවටන්න හදන්න එපාය කියලා මා ඒ නිලධාරින්ට කියනවා. තමුන්නාන්සේලාගේ හදවතට තට්ටු කරලා බලන්නය කියලා මා ඒ නිලධාරින්ට කියනවා. මාර්ගය පෙන්වන්න එස්. බී. දිසානායක මැතිතුමාත් එක්ක මා සැලසුම් හැදුවා. national operations room එකක් හැදුවා. මා එස්. බී. දිසානායකට කිව්වා, "එස්. බී, මුළු වාරි ජනපදවල හදවත තිබෙන්නේ අපි ළඟයි. අපි එකතු වෙමු. පළාත් සභා එකතු වෙමු" කියලා. රතු ලූනු කොච්චර ප්‍රමාණයක් පිට රටින් ගෙන්වනවාද කියලා අපි බැලුවා. අපේ කල්පිටිය වැනි පළාත් වෙන්න පුළුවන්, යාපනය වෙන්නට පුළුවන්, ඒ ප්‍රදේශවල සාම වැඩ පිළිවෙළත් එක්ක යම් හෙක්ටයාර් ප්‍රමාණයක් ඒවා වවන්න සීමා කරමු, කාලපයට උපදෙස් දෙමු කියලා මා කිව්වා. වී, රතු ලූනු, අර්තාපල්, ලූනු, මිරිස්, හැම ජාතියක්ම සැලසුම් සහගතව වවන්නට ගොවියාට මාර්ගය පෙන්වූවා. අවුරුදු 60ක් ගිහිල්ලත් අප තවම එක තැන ඉන්නේ. අපේ අසරණ ගොවීන්ට බණින්න එපා. ඔවුන් අනාථ වෙලා. උතුරේ වන්න පුළුවන්, දකුණේ වන්න පුළුවන්. නැඟෙනහිර වන්න පුළුවන්. අපි කියලා නැහැ උඹලාගේ පළාතේ උඹලා මීට වඩා වවන්න එපාය කියා. අර මිනිසුන් ගොයම්වලට ගහන්න ගෙනාපු බෙහෙත් බොනවා කියන එක පුදුමයක්ද? තිත්ත ඇත්තක් මම මේ කථා කරන්නේ. තමුන්නාන්සේලාට ඕනෑ නම් ඒක කරන විධියත් මා කියා දෙන්නම්. සමහර නිලධාරින්ගේ හිත් රිදෙන්න පුළුවන්. නිලධාරින් සන්තෝෂ කරන්න නොවෙයි අපි ඉන්නේ; දේශපාලකයන් සන්තෝෂ කරන්න නොවෙයි ඉන්නේ. අපට ඉන්දියාව ඕනෑ නැහැ. අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වෙලා  හිටපු කාලයේ වරක් චීනයට ගියා. එහේ ගියාම ඒ තිබෙන යෝධ dam එක දැක්කා. ලෝකයේ තිබෙන දිගම එක; කාලෝමීටර් 1,000ක් දිගයි. ඊ ළඟ සතියේ දකුණු ඉන්දියාවට ගියා. එතුමා දවස් දෙකෙන් මාව, ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා, එච්. ජී. පී. නෙල්සන් මැතිතුමා ඇතුළු නිලධාරින් කැඳෙව්වා. අපව කැඳවලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මොකක්ද කිව්වේ? "There is going to be a water crisis in Sri Lanka" කියා කිව්වා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதிச் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon.  Gamini Jayawickrama Perera)

මට නම් පැය එකහමාරක්වත් ඕනෑ. වාරි කර්මාන්තය ගැන කථා කරන්න තවම ලැස්ති වුණේවත් නැහැ. මම තව විනාඩි පහකින් අවසන් කරන්නම්.

එතුමාට මා කිව්වා, " No there will not be a water crisis in Sri Lanka. There are 103 rivers", කියා. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට මගේ කථාවට හිනහ යනවා වාගේ; මගේ කථාව ඉක්මනින් ඉවර වෙනවාට එතුමා හරි ආසයි වාගේ.

කාබනික පොහොර ගන්න. මාකඳුරේ තිබෙනවා කිව්වා - [බාධා කිරීමක්] ඇමතිතුමනි, මේ ගැන ගොවි සංවිධාන - [බාධා කිරීමක්] මගේ කාලය අවසන් වීගෙන එන නිසා මා වාරි කර්මාන්තය ගැන කථා කරන්නම්.

ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා ඉතාමත්ම හොඳ වැඩ පිළිවෙළක් ගෙන යනවා. වල් පැළෑටි නාශක බෙහෙත් කියා ලෝකයේ එපාම කරපු බෙහෙත් ටික ගේනවා මෙහාට, මේක

dumping yard එකක් කියලා හිතලා. මේවා ගැන තත්ත්ව පාලනයක් කරලා අනුමත කරන ඒවා විතරක් ගෙන්වන්න දෙන්න අනෙක් ඒවා තහනම් කරන්න. කෘෂිකර්මය ගන්න ඇමතිතුමනි. මම එක කාරණයක් කියන්නම්. ලංකාවේ ඉතාම ශුෂ්ක ප්‍රදේශ තමයි ගල්ගමුව, යාපහුව කියන්නේ. වතුර දුන්නේ නැත්නම් මොකුත් කරන්න බැහැ. නිලධාරින් තමුන්නාන්සේට කිව්වා උස්සාන ක්‍රමයෙන් කරන්න බැහැය කියා. හැබැයි මම ඔය නිලධාරින් කවදා හෝ අල්ලා ගන්නවා. කරන හැටිත් උගන්වලා, කරවන හැටිත් මම පෙන්වනවා. අවුරුදු එක හමාරක් යනවා කියපු කුඩාගල්අමුණ ව්‍යාපාරය මාස තුනෙන් කරලා පෙන්වපු මිනිහෙක් මම. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කාලයේ කිරි වෙහෙරේ නායක හාමුදුරුවන්ට කිව්වා, හාමුදුරුවනේ, මේකට අවුරුදු එකහමාරක් යනවා කියා. මම කිව්වා "නැහැ සර්, මේක මම මාස තුනෙන් කරනවා" කියා. ඔය සැලසුම් හැදීමේදී ඒවාට හවුල් වුණු කෙනෙක් මම. ගල්ගමුව, යාපහුව ප්‍රදේශවල හැදුණු, වැඩුණු නිලධාරින් එතැන ඉන්නවා. එහේ හැදිලා, එහේ කිරි බීපු එහේ පොත පත කියවපු නිලධාරිනුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉන්නවා. මම අමතක කරන්නේ නැහැ ඒ නිලධාරීන්ට කවදා හෝ මම ඒ වැඩ ටික කරවලා පෙන්වනවා. ගරු ඇමතිවරුනි, ඔබතුමන්ලා දෙදෙනා කරුණාකර මේ ගැන පියවරක් ගන්න. යාපහුවට, ගල්ගමුවට ඔය දෙකින් එකකින් වතුර ලැබුණේ නැත්නම් මොකද වෙන්නේ? මේ ඉතාම ශුෂ්ක ප්‍රදේශ. එහෙම නම් දැදුරු ඔය දිගේ මුහුදු වතුර අරගෙන desalinate කරලා දෙන්න වෙනවා ඔබතුමන්ලාට. ඒ අහිංසක ජනතාවට සදා කල් මුද්දර පොතක් දෙන්නද යන්නේ? ගල්ගමුව, යාපහුව ප්‍රදේශවල වැව් 2,000ක් විතර තිබෙනවා. මම අහනවා, ඔබතුමන්ලාගෙන්. මේවාට රැවටෙන්න එපා. ප්‍රශ්නය විසඳන්න මාර්ගයක් බලන්න. නිලධාරින් ගියත් මම නම් ප්‍රශ්නය විසඳන්න මාර්ගය හොයා ගෙන යනවා. ඒකයි නායකත්වය කියන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதிச் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තව විනාඩියකින් අවසන් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා අද වැව් හැදීම නැවැත්තුවාද? අද ගමේ වැව හදන්නේ නැහැ. දැන් ජල සම්පත් මණ්ඩලය වතුර බෝතල් කරන්න හදනවා. මොකටද බෝතල් කරන්නේ? ඒ අය ඉන්නේ underground water supply ගැන බලන්න. මේ වෙලාවේ ඔබතුමන්ලා මේ වැව් හැදීමත් ගම්වලට ගෙන යන්න. මුහුදෙන් වැලි ගන්නවා. අන්න ඒක බලලා නවත්වන්න. අද වයඹ පළාතේ මුහුදේ මැෂින් දමා ගෙන වැලි ගන්නවා. ඇමතිතුමනි, මම circular එකක් හදලා තිබෙනවා. ඔබ නිලධාරින් දන්නවා. අප අඩියක්වත් තිබ්බේ නැති ඒ කිරි මැටි පස් තට්ටුව පායන කාලෙට පුපුරනවා. වැහි කාලෙට කොන්ක්‍රීට් එක වාගේ වහනවා. මෙන්න මේකේ තමයි වතුර තට්ටුව හිටින්නේ. දැන් මේ බිස්නස් කරන්න, වැලි ගන්න මේවා ඔක්කොම අහකට තල්ලු කරනවා. අන්න කටුපොත දිහාත් කරනවා. බතලෙගොඩින් පර්යේෂණ කරලා සහතික කරලාද දෙන්නේ කියා මා දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, කරුණාකර මේවාට පියවර ගන්න. ගොවිජන සේවා එක අයිති පළාත් සභාවටද මහ ආණ්ඩුවටද කියා මා දන්නේ නැහැ. ඔබතුමාගේ විෂය ගැන මා වැඩිය කථා කරන්නේ නැහැ. ඒක ගැන කාරක සභාවේදී හෝ කථා කරන්න මට පුළුවන්. නමුත් කෘෂිකර්මය අපේ රටේ හදවත නිසා ඒ ගැන කථා කරන්න ඕනෑ තරම් දේවල් තිබෙනවා. නමුත් මට කාලය මදි. තව පැය භාගයක් තිබුණා නම් ඇති. මට නියමිත කාලය අවසන් නිසා දැන් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதிச் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
බොහොම ස්තුතියි. ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමා.

[පූ. භා. 10.56]

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன, நீர் முகாமைத்துவ அமைச்சரும் துறைமுகங்கள், விமானச் சேவைகள் அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa-Minister of Irrigation and Water Management and Minister of Ports and Aviation)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හිතවත් ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. මා එතුමාගේ කථාවට ඇහුම් කන් දුන්නා. එතුමා අද ඉදිරිපත් කරපු කරුණු බොහොමයක්ම පසු ගිය අය වැය විවාදයේදීත් ඉදිරිපත් කළා. එතුමා කරපු යම් යම් යෝජනා ක්‍රියාත්මක කරන්න අපි උත්සාහ කරනවා. ඒ වාගේම මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමාගේ වාරි මාර්ග වැඩ පිළිවෙළ අපි ඉතාම අගය කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම ඔබතුමා පොල්ගොල්ල පිළිබඳව කථා කළා. මට මතක හැටියට නම් හිටපු වාරිමාර්ග අමාත්‍ය දිවංගත ගරු මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමාගේ කාලයේදියි—1970 දී -එහි වැඩ ආරම්භ කළේ. බෝවතැන්න ව්‍යාපාරයත් ආරම්භ කරලා, ඒ ජලය අනුරාධපුරයට සහ පොළොන්නරුවටත් 1977ට ඉස්සෙල්ලා අර ගෙන ගියා. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමනි, මා හිතන්නේ තමුන්නාන්සේ ඒ ටික කිව්වේ නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මා කිව්වා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
කිව්වාද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මා කිව්වා "සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කළා. ඊට පස්සේ නැවතුණා" කියා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
1977 වන කොට බෝවතැන්න හරස් කරලා එතුමන්ලාට ජාලයක් දුන්නා. බෝවතැන්නෙන් වතුර ගෙන ගියා. චින්තනය ගැන දැන් කථා කළා නේ. ඒ හින්දා මමත් පොඩ්ඩක් චින්තනය ගැන කථා කරන්න උත්සාහ කරන්නම්.

ශ්‍රී ලාංකීය ජාතික ආර්ථිකය "මහින්ද චින්තන" ප්‍රතිපත්ති සමුදාය ගුරු කොට ගනිමින් තම දිශානතිය ගැඹුරු පරිවර්තනයකට ලක් කර ගැනීමේ ගමන් මඟ, සිවු වන ගවු කණුව පසු කරන මේ මොහොත ඉතිහාසයේ වැදගත් පරිච්ඡේදයක් ඇරඹී වග අවධාරණය කරන්නට කැමතියි. ජාතික ආර්ථිකයේ දේශීය දායකත්වය කුළු ගැන්වූ, දිරි ගැන්වූ අප රජයේ පිළිවෙත තුළින් අවධාරණය කරන සිහිනය යථාර්ථයක් බවට පෙරළනු පිණිස ද අප අමාත්‍යාංශයේ දැක්ම ද, මෙහෙවර ද, මේ උත්තරීතර සභාවේ ගැඹුරු කථිකාවන්ට ලක් විය යුතු යැයි මම විශ්වාස කරමි. අතීතයේ අපට ජාතියක් ලෙස විශිෂ්ටයන් බවට දින මුද්‍රාව අපට උරුම කර දුන්නේ අපේ වාරි තාක්ෂණයයි. එක් පසෙකින් බෞද්ධ දර්ශනය හා එහි ආභාසයන් අප පිරිපුන් ජාතියක් බවට පෙරළද්දී අනෙක් පස අප බර දරා උන්නේ ලක් බිම දසත පැතිරුණු වාරි පද්ධතියයි. එහෙයින්ම අපේ සංස්කෘතිය වාරි සංස්කෘතියක් විය. එහි සරල අරුත් ගැන්වීම වූ "වැවයි දාගැබයි -ගමයි පන්සලයි" යන වැකිය මේ පැයේ දී ද වලංගු සත්‍යයක් බව අවිවාදිතය.

[ගරු චමල් රාජපක්ෂ මහතා]

ශ්‍රී ලංකීය දේශය සරු සාරවත් කර වන, ජීවත් කර වන, පෝෂණය කර වන අපේ වාරි පද්ධතිය තවත් සිය වස් ගණනාවක් රැක ගන්නට අපගේ රජය අතිශය ධෛර්ය සම්පන්නව කැපව සිටිනා බව ද අවධාරණය කරන්නේ වග කීමෙනි. වගාවන් සඳහාද, පෞද්ගලික පරිහරණය පිණිස ද වශයෙන් අපේ ජීවිතය හා බැඳී පවතින ජලයේ අයිතිය ශ්‍රී ලංකීය ජාතියෙන් බැහැර නොකිරීමේ දැඩි වූ ද, තිර වූද අදිටන ද "මහින්ද චින්තන" ප්‍රතිපත්ති සමුදායෙන් සහතික කර ඇති බවද යළිත් මේ ගරු සභාවට අවධාරණය කරමි.

රජයේ ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙළ අනුව මේ අය වැය ලේඛනයේ සමස්ත පරමාර්ථ අතරින්, අපේ අමාත්‍යාංශයට එනම් වාරිමාර්ග හා ජල සම්පත් ක්ෂේත්‍රයේ දායකත්වයට සෘජුව බලපාන ප්‍රධාන කරුණු කිහිපයක් මා පළමුව ප්‍රකාශ කිරීමට කැමතියි. දේශීය ආර්ථිකයේ වර්ධන වේගය දැන් පවතින මට්ටමින් අඛණ්ඩව පවත්වා ගෙන යමින් එය සියයට අටකින් නුදුරු කාලයේදී ඉහල නැංවීමටත් දස අවුරුදු සංවර්ධන සීමාවේදී එය සියයට 9, 10 මට්ටම දක්වා ඉහළ තලයකට පත් කිරීමටත් අපේ අලුත් ශ්‍රී ලංකාවක් කරා දැක්ම, දර්ශනය බව ප්‍රකාශ කර තිබෙනවා. ඊට මේ ක්ෂේත්‍රයේ දායකත්වය විශාල වශයෙන් අවශ්‍ය වෙනවා. මේ ප්‍රයත්නයේදී නොයෙක් බාධක හා මූලධන ආයෝජනය පිළිබඳ ප්‍රශ්න තිබුණත් අඛණ්ඩත්වය රැක ගනිමින්, ගම නැඟුම, කෘෂිකාර්මික කටයුතු, පශු සම්පත් වැනි අංශවලට අනුබල හා ආධාර සපයන වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධනය ඇතුළු වෙනත් යටිතල පහසුකම් හා ඉදි කිරීම් සඳහා මෙම අය වැයෙන් විශාල වශයෙන් මුදල් වෙන් කොට තිබෙන බව තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. රන්දොර-ප්‍රවේශය මෙම සංකල්පයයි.

රටේ ආරක්ෂාව තහවුරු කරන ගමන්, දූරදර්ශී සංවර්ධන අය වැයක් ලෙස නොනවත්වා යන ගමනක් මෙම අය වැය තුළින් පිළිබිඹු වෙනවා.

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තිරසාර බව පවත්වා ගැනීම, රටේ ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම වැනි අරමුණු උදෙසා අපේ ආයෝජන පිළිවෙතෙහි ප්‍රමුඛතාව ලබා දී තිබෙනවා. ඒ අනුව අය වැය සකස් කර තිබෙනවා.

මෙහිදී වාරිමාර්ග හා බහුකාර්ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මගේ අමාත්‍යාංශයට පැවරෙන්නේ විශාල වග කීමක්. මුල් අවුරුදු කිහිපය තුළ එම සංවර්ධන කටයුතු හා ඉදි කිරීම්, සැලසුම් වේගවත් කිරීමට අවශ්‍යයි.

එසේම මා ප්‍රකාශ කරන්නට කැමැතියි, අපේ වාරිමාර්ග ක්ෂේත්‍රය තුළ කරන ඉදි කිරීම් කටයුතුවලදී ඒ ඒ ප්‍රදේශවල උපයෝගී කර ගන්නා ඉදි කිරීම් ක්‍රමවේදය තුළින් වැඩි ප්‍රමාණයක් එහි ජනතාවට රැකියා අවස්ථා උපද වන බව. මවු ආර, වෙහෙරගල වැනි ව්‍යාපෘතිවලදී අප ලත් අත් දැකීම් ඉදිරියට ගෙන යනවා. එනම්, ව්‍යාපෘති කාලය තුළ පිරිමින් හා කාන්තාවන් 2,000ක්, 3,000ක් පිරිසකට ජීවනෝපාය සඳහා රැකියා අවස්ථා ලබා දී, එක් පවුලකට රුපියල් 12,000 සිට රුපියල් 15,000 දක්වා මාසික ආදායමක් ලබා ගන්නට ඉඩ සැලැස්වීම අපේ ජයග්‍රහණවලින් එකක් බව සතුටින් ප්‍රකාශ කර සිටිනවා.

මීළඟට අපේ අමාත්‍යාංශය හා මෙම ජාතික අය වැයෙහි පරමාර්ථ හා උපාය මාර්ගවලට සෘජුව සම්බන්ධ වන තවත් කරුණක්, දෙකක් මගේ සිහියට නැඟෙනවා. ගෝලීය ආර්ථිකයේ අස්ථායීතාව මත ආහාර ද්‍රව්‍යවල මිල විචල්‍ය යන බව අප දන්නා කරුණක්. එය ඉහළ යනවා. එසේම කාලගුණ විපර්යාසවලින් එම ආහාර නිෂ්පාදනයට බලපෑම් ඇති කෙරෙනවා. මෙයින් අපේ රටේ දේශීය ආර්ථිකයට සංවර්ධන ඉලක්කවලට ඇති වන අහිතකර බලපෑම් අවම කිරීමටත් අප වග බලා ගත යුතුයි. එසේ කළ හැක්කේ ආනයන ආදේශකය සඳහා දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමෙන් පමණක් බව අප වටහා ගෙන තිබෙනවා. මේ සඳහා වාරිමාර්ග අංශවලින් විශාල වැඩ කොටසක් කිරීමට දායකත්වයක් ලබා දිය යුතුව තිබෙනවා. මනා ජල කළමනාකරණය හා සැලසුම්කරණය තුළින් වගා කෙරෙන බිම් ප්‍රමාණය වැඩි කිරීමටත්, වාරිමාර්ග ඉඩම්වල නිෂ්පාදනය ශක්තිමත් කිරීමත් අවශ්‍යයි.

එම නිසා රටේ ආහාර නිෂ්පාදන ශක්තිය පුළුල් කිරීමේදී, වාරිමාර්ග හා ජල කළමනාකරණ අංශ ක්‍රමානුකූලව වර්ධනය කිරීම, එසේම මූල්‍ය ආයෝජන ඊට සරිලන මට්ටමින් පවත්වා ගැනීම, ග්‍රාමීය ආර්ථිකයේ දායකත්වය හා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ සමතුලිතතාව රැක ගැනීම, මෙම ජාතික මෙහෙවරට සම්මාදම් වීමේදී ආයෝජනය ඉහළ මට්ටමකට නංවා එහි ප්‍රතිලාභ රට පුරා බෙදී යන සේ මෙම ක්ෂේත්‍රය හැසිර වීම ආදී නියාමකයන් අපට අනිවාර්යයෙන්ම අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉහත සඳහන් පදනම මත පිහිටා අප ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳවත්, මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳවත් වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මා මෙය අවස්ථාව කර ගන්නවා.

අපේ රජය ගමන් ගන්නා මාර්ගය වන " මහින්ද චින්තන", "අලුත් ශ්‍රී ලංකාවක් කරා", " කෙතට අරුණ" යන ප්‍රකාශන පරිදි වාරිමාර්ග හා ජල සම්පත් ක්ෂේත්‍රයට හිමි වන්නේ සුවිසල් මෙහෙවරක්. ජල හිඟයෙන්, ඉඩම් හිඟයෙන් පීඩා විඳින ගොවි ජනයාට සේවය කිරීමත්, රටේ වටිනා ස්වාභාවික සම්පතක් වන ජල සම්පත ආරක්ෂා කර ඉන් තිරසාර අන්දමින් නිසි ඵල ප්‍රයෝජන ලබා ගැනීමත්, ජාතික වාරිමාර්ග සැලැස්මක් පදිරි ක්‍රියා කොට ප්‍රධාන ගංගා නිම්න සංවර්ධනය, වැව් අමුණු ඉදි කිරීම, ජල මාර්ග සම්බන්ධ කර දිවයිනේ වියළි ප්‍රදේශ - උතුර, දකුණ භේදයකින් තොරව - හරිත ගැන්වීමත් අපේ වගකීම් භාරයයි.

මෙම ගමන කෙටි කාලීන හා දීර්ඝ කාලීන වශයෙන් සැලසුම් සහගතව යා යුත්තක්. ඉක්මන් ප්‍රතිඵල ලැබෙන කෙටි කාලීන වැඩ මෙන්ම, වඩා ශක්තිමත් යටිතල පහසුකම් සහිත මහා පරිමාණ ව්‍යාපෘති හා වැඩ සටහන්, විශාල ජලාශ, අන්තර් නිම්න හැරවුම් තවත් ශත වර්ෂ ගණනාවකට ඔරොත්තු දෙන පරිදි නිර්මාණය කළ යුතුව තිබෙනවා. මෙහිදී සඳහන් කළ යුතු තවත් විශේෂ කරුණු කිහිපයක් තිබෙනවා. එනම් තෙත් කලාපයේ කුඹුරු ඉඩම්වලින් නිෂ්පාදනය වැඩි කිරීමටත්, ගංවතුර පාලනය හා ජලාපවහන පද්ධතිය වැඩි දියුණු කිරීමටත් කටයුතු කිරීම අපෙන් ඉටු විය යුතු කාර්යයයි. නිතර ගංවතුර තර්ජනවලට ලක් වන රත්නපුර හා කළු ගඟ පහළ මිටියාවත ප්‍රදේශ සඳහා ස්ථිර වැඩ පිළිවෙළක් ස්වල්ප කලකින්ම ආරම්භ කිරීමට අපි කටයුතු යොදමින් සිටිනවා. එසේම තෙත් කලාපයේ වාරිමාර්ග ව්‍යාපාර තුළ ඇති පුරන් වී ගිය කුඹුරුවල ජලය බැස යෑම හා වාරිමාර්ග ප්‍රශ්න විසඳා නැවත අස්වද්දන්නටත් අප බලාපොරොත්තු වනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් නිල්වලා ද්‍රෝණියේ කිරල කැලේ වාරි ව්‍යාපෘතියේ කුඹුරු ඉඩම් අක්කර 5,000ක් පමණ ජලය බැස යෑමේ දුර්වලතාව නිසා පසෙහි ආම්ලිකතාව වැඩි වී පුරන් ඉඩම් බවට පත්ව තිබුණු අතර එයින් අක්කර 1,200ක් පමණ මේ වර්ෂයේදී රුපියල් මිලියන තුනක පමණ වියදමින් ජල බස්නා ඇළ මාර්ග ප්‍රකෘතිමත් කර 2008 යල් කන්නයේ වගා කිරීමට සැලැස්සුවා. එයින් ඉතා සාර්ථක අස්වැන්නක් ලැබුණු අතර අලුත් සහල් මංගල්‍යයක්ද උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට බැරි වුණා මේක කර ගන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මොකක්ද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
නිල්වලා ගඟ ව්‍යාපෘතියේ පුරන් වෙච්ච කුඹුරු -

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

කාලය තිබුණා නම් මම කියනවා. ගරු ඇමතිතුමනි, නිල්වලා ගඟ වාගේම වැදගත් දෙයක් තමයි ඕලන්ද ඇළ. ඒක මාතර ඉඳලා පුත්තලමට එනවා. අද කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් අක්කර 30,000ක් ගොඩ වෙලා තිබෙනවා. මම නෙදර්ලන්ත වාරිමාර්ග ඇමතිතුමියට ඒ වෙලාවේ වාර්තාවක් හදා දුන්නා. ඒ ඇළ සුද්ධ කරලා හැදුවොත් ගංවතුරින් වළකිනවා. අක්කර ලක්ෂයක් විතර වගා කරන්න පුළුවන් වෙනවා. සංචාරක අංශය, වෙළෙඳ අංශය දියුණු කරන්න පුළුවන් වෙනවා. ඔබතුමා කරුණාකරලා ඒ ව්‍යාපෘතිය ගන්න. ගංවතුර ගැලීමෙන් දකුණ බේරා ගන්න පුළුවන් ව්‍යාපෘතියක් ඒක.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, අපේ අවධානය ඒ ගැන යොමු වෙලා තිබෙනවා. පුත්තලමේ ඉඳලා මාතරට එන කොට පුරන් වෙච්ච ඉඩම් අක්කර 80,000ක් පමණ තිබෙනවා. ඒ ගැන අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. අපි දැන් නිල්වලා ගඟෙන් පටන් ගත්තා. ඊළඟ අවුරුද්දේ ඔබතුමා කියන ඔය කාරණයට ප්‍රමුඛතාව දීලා කටයුතු කරන්නම්. තමුන්නාන්සේට බැරි වෙච්ච දේවල් අපි කරනවා නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඔහොම කිව්වාට අපට අවුරුදු දෙකක් බලය දීලා උදුරා ගත්තා නේ. අපට තව අවුරුදු දෙකක් දුන්නා නම් අපි වැඩේ දීලා. ඔබතුමන්ලා අපට කළේ අවුරුදු දෙකක් දීලා, මේ සහෝදරයොත් එක්ක සන්ධානගත වෙලා - [බාධා කිරීමක්] අවුරුදු දෙකක් දුන්නා නම් අපි මේ සේරම වැඩ ටික කරලා පෙන්වනවා. [ බාධා කිරීම්]

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ ගමේ දැදුරුඔය ව්‍යාපෘතියත් කරලා දෙන්නම්. අපේ අවධානය යොමු වෙලා තිබෙන තවත් විෂයයක් තමයි ජලයේ පවිත්‍රතාව රැකීම. ජල මාර්ග අපවිත්‍ර වීම වැළැක්වීම, වෙනත් ආයතන සමඟ බද්ධ වී ජල මූලාශ්‍ර රැක ගැනීම ඇතුළු ජලයේ ගුණාත්මකභාවයද රැක ගැනීම සම්බන්ධ කටයුතු වලටද අපි විශාල වශයෙන් ළඟදීම සම්බන්ධ වෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதிச் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

ගරු ඇමතිතුමනි, තව විනාඩියකින් ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

පළමු කොට වාරිමාර්ග ව්‍යාපාර තුළ ඇළවල්වලට අපද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය ආදී අහිතකර දේ එක්වීම වැළැක්වීමට ගොවි සංවිධාන හා එක්ව කටයුතු කිරීම ගැන අවධානය යොමු වෙනවා. මට තව මිනිත්තු කීයක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதிச் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

දැන් ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කතාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி :*
*Rest of the speech tabled* :

අපේ අමාත්‍යාංශයේ ආදර්ශ පාඨය වන නිල් දියවර කෙත්යායට නමින් හඳුන්වා දී ඇත්තේ මේ සියලු අරමුණු හා ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ ප්‍රවේශයක්. එම ආදර්ශ පාඨය ගුරුහරුකම් කොට ගැනීම.

**පසුගිය වසරේ වැඩ සටහන් ප්‍රගතිය හා ඉදිරි ගමන**

මේ අවස්ථාවේ දී පසු වූ කාල පරිච්ඡේදය තුළ අප විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳවත්, 2008 වර්ෂයේ ප්‍රගතිය ගැනත් ප්‍රකාශ කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

දස අවුරුදු සැලැස්ම තුළ බලාපොරොත්තු වන ඉලක්කය කරා යෑමට මේ වන විට (2006 - 2008) අපි හොඳ ආරම්භයක් ලබා තිබෙනවා. 2008 අග වන විට සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරන අතර ඉදිරි කාලයේ දී 2016 දක්වා වඩා වේගයෙන් යෑමට පසු බිම් සකස් කර තිබෙනවා.

2008 දී මුළු ආයෝජන රු. මිලියන 2,800 තරම් වෙනව. 2009 දී අප ආරම්භ කර ඇති උමාඔය ව්‍යාපාරය වැනි බහුකාර්ය යෝජනාවලට මුල පිරීම ඇතුළුව එය රු. 10,800ක් වැනි ඉහළ තලයකට නංවනවා.

ඉදිකිරීම් සම්බන්ධ අප ඉදිරියේ අභියෝග රැසක් තිබෙනවා. ඊට මුහුණ දීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ශක්තිය හා හැකියාව මගේ අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන තුළ තිබෙන බව විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කර සිටිනවා.

**නිෂ්පාදන දායකත්වය**

අප පසු කළ වසර (2008) තුළ මගේ අමාත්‍යාංශය යටතේ ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග කළමනාකරණ අංශය මඟින් මෙහෙයවන ලද අන්තර් - පළාත් වාරිමාර්ග ව්‍යාපාරවල හෙක්ටයාර් 2,82,200 තරම් ප්‍රමාණයකට ජල පහසුකම් සපයා නිෂ්පාදනයට සහාය දී තියෙනවා.

| | ***ඉඩම් (හෙක්ටයාර්)*** | ***වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)*** |
|---|---|---|
| 2007/08 මහ කන්නය | 2,43.613 | 10,32,924 |
| 2008 යල කන්නය | 2,35,330 | 9,63,357 |

මෙය විශාල නිෂ්පාදන දායකත්වයක් බව තමුන්නාන්සේලා අවිවාදයෙන් පිළිගන්නවා ඇති. එසේම 2007 වර්ෂය හා සසඳන විට මෙහි 9.65%ක ප්‍රතිශතයක වැඩි වීමක් බව පෙන්නුම් කරනවා. මෙය රටේ ජාතික වී නිෂ්පාදනයෙන් 52% ප්‍රමාණයක්, එනම් විශාල ප්‍රතිශතයක්. ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම පිණිස අපේ දායකත්වය කෙබඳු දැයි මින් වටහා ගත හැකියි.

දැනට වාරි පහසුකම් සලසා ඇති ඉඩම්වලින් ලබා ගන්නා හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 4.8 සිට 4.95 දක්වා වූ ප්‍රමාණ අස්වැන්න ඉදිරි වසර කිහිපය තුළ මෙට්‍රික් ටොන් 6 දක්වා මට්ටමකට ඉහළ නැංවීම අපේ දැක්මයි. එම ඉලක්කය කරා යෑමට විධිමත් ජල කළමනාකරණය, ඒකාබද්ධ ප්‍රවේශය, ගොවි සංවිධාන සහභාගිත්වය, තාක්ෂණ දියුණු කිරීම් ඇතුළු විවිධ යෙදවුම් අප විසින් මෙහෙය වනු ලබන විශේෂ ව්‍යාපෘතිවලින් බලාපොරොත්තු වෙනවා.

[ගරු චමල් රාජපක්ෂ මහතා]

**සටහන**

මෙම සංඛ්‍යා ලේඛන මහවැලි ප්‍රදේශ හැරුණු විට, අනෙකුත් අන්තර පළාත් වාරිමාර්ග ව්‍යාපාර ඇසුරෙනි.

මීළඟට අපේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව අනෙකුත් ආයතනවලින් නිම කරන ලද ප්‍රධාන වැඩ කොටස් ගැන වචන ස්වල්පයක් කීමට බලාපොරොත්තු වෙනවා.

1. **මැණික් ගඟ හැරවීමේ** වෙහෙරගල ජලාශය දැනට නිම වෙමින් පවතිනවා. එහි ප්‍රතිඵල දැනටමත් ලැබී ලුණුගම්වෙහෙර ජලාශයට විශාල ජල කඳක් ගලා එවීමට සලස්වා තිබෙනවා.

2. **දැඳුරු ඔය** ජලාශයේ ඉදිකිරීම් කටයුතු දැන් ක්‍රමවත්ව කෙරී ගෙන යනවා. මෙය 2010 වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වෙනවා.

3. **රඹුක්කන් ඔය** ජලාශය අම්පාර දිස්ත්‍රික්කයේ මෑත කාලයේ දී අරඹන ලද විශාලතම වාරිමාර්ග ව්‍යාපාරයයි. මෙහි පස් බැම්ම, වාන, සොරොව්ව දැන් ඉදි කෙරෙමින් පවතිනවා.

4. **කැකිරිඔබඩ** (හම්බන්තොට දිස්ත්‍රික්කය) වැමැඩිල්ල (මාතලේ) ජලාශවල වැඩ කටයුතු 2009 මුල් භාගයේ දී අවසන් කරනවා.

5. එසේම ජල කළමනාකරණය සඳහා බොහෝ ප්‍රදේශවල පුනරුත්ථාපන කටයුතු, මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග වැඩ සහ විශේෂ ව්‍යාපාර හරහා උතුරු - නැඟෙනහිර ප්‍රදේශවල විශාල ව්‍යාපෘති 4ක්ද පුනරුත්ථාපනය සඳහා හවුල් වී සිටිනවා. ඒවා යෝධ වැව, අල්ලේ. රුගුම් සහ කරවාහු වැනි ව්‍යාපාර. මීට මොරවැව, කිරම්පල්වේන, පේර්ආරු ආදී ව්‍යාපාර ද ඇතුළත්. පළාත් සභා සහ වෙනත් අමාත්‍යාංශ යටතේ ඇති ප්‍රතිපාදනවලින් කුඩා වාරිමාර්ග බොහෝමයකට වාර්මාර්ග දෙපාර්තමේන්තුව මඟින් සැලසුම්, ඉදි කිරීම් වැනි සේවා සපයා තිබෙනවා.

**අප විසින් ක්‍රියාත්මක කෙරෙමින් පවතින විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන්**

වාරි පුබුදුව - අනුරාධපුර, කුරුණෑගල, මාතලේ හා උතුරු නැඟෙනහිර වාරිමාර්ග පුනරුත්ථාපනය ගොවි සංවිධාන ශක්තිමත් කිරීම, ආදායම උත්පාදනය ඇතුළත් වෙනවා.

ගල්ඔය නවෝදය - නැඟෙනහිර පුබුදමු වැඩසටහනට සමගාමීව යනවා

වාරිමාර්ග කළමනාකරණය සඳහා මධ්‍යම සම්බන්ධීකරණ කමිටුව - ප්‍රතිස්ථාපනය කර තිබෙනවා.

නිල් දියවර කෙත්යායට - වාරිමාර්ග ශිෂ්ටාචාරය හැදෑරීම හා එම උරුමය සුරැකීම.

මෙම වැඩසටහන් සාර්ථකව ඉදිරියට ගෙන යනවා.

මීළඟට අප විසින් ආරම්භ කරනු ලබන අළුත් විශාල ව්‍යාපාර ගැන වචන ටිකක් ප්‍රකාශ කිරීමට මා අවස්ථාව ලබා ගන්නම්.

**1. උමා ඔය බහුකාර්ය යෝජනා ක්‍රමය**

මෙය මෑත කාලයේ ආරම්භ කෙරුණු විශාලතම ව්‍යාපෘතිවලින් එකක්. මෙ. වො. 100කට අධික විදුලි බලය ජනනය කිරීම හා හම්බන්තොට, මොණරාගල වැනි දිස්ත්‍රික්කවල හෙක්ටයාර 5,000කට පමණ අමතර ජලය සැපයීමත් මින් කෙරෙනවා. කලක් තිස්සේ ශක්‍යතා අධ්‍යයන කෙරී තිබුණත්, ඉස්ලාමීය ඉරාණ ජනරජයේ ආධාර ද සහිතව සාර්ථකව මෙය ආරම්භ කිරීමට හැකි වීම අපේ විශාල ජයග්‍රහණයක්.

උමා ඔයේ වැඩිපුර ජලය අපේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියට යොදා ගැනීමට මේ ව්‍යාපෘතියෙන් ඉඩ සැලසෙනවා. විශාල ඉදි කිරීම් කටයුතු කිරීමට තිබෙනවා. ජලාශ 2ක්, උමං මාර්ග, විදුලි බලාගාරය හා ජල මාර්ග ඊට ඇතුළත්. වසර 5කින් පමණ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට නියමිතයි. රන්දොර- සංකල්පය පරිදි මහා පරිමාණයේ යටිතල පහසුකම් ඇති කිරීමේ සන්ධිස්ථානායක් ලෙස මෙම ව්‍යාපාරය හැඳින්විය හැකියි.

**සටහන :-**

1. ඉරාන පරාබ් සමාගම සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් කටයුතු අවසාන කරමින් පවතිනවා.
2. පාරිසරික අධ්‍යයන, සැලසුම්, මූලික වැඩ කටයුතු 2009 දී කර ගෙන යැමට නියමිතයි.

**අනෙකුත් විශාල ව්‍යාපෘති යෝජනා**

මීළඟට අප නුදුරු අනාගතයේ දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන විශාල ව්‍යාපෘති කිහිපයක් සඳහන් කිරීම අවශ්‍යයි.

මීට යාන් ඔය ජලාශය, හැඩ ඔය ජලාශය, රත්නපුර ජලාශය හෝ විකල්ප යෝජනා, ගිං-නිල්වලා හැරවුම, මුන්දෙනි ආරු හා මල්වතුඔය ජලාශ සංවර්ධනය ඇතුළත්.

බහුකාර්ය සඳහා වන මෙම යෝජනා පිළිබඳව දස අවුරුදු සංවර්ධන රාමුව තුළ ශකයතා අධ්‍යයන, විමර්ශන ආදිය නිම කොට ස්ථිර නිගමනවලට එළඹ, පිළිවෙළින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. දිවයිනේ ජල සම්පත් උපරිම අන්දමින් සංවර්ධනය කිරීමේ සැලැස්මේ දී, මෙම ව්‍යාපෘතිවලට නිසි ප්‍රමුඛතාව ලබා දීම අපේ ප්‍රතිපත්තියයි.

**සටහන් :-**

හැඩ ඔය ජලාශය— අවසන් තීරණ ගත යුතුව තිබේ.

මොණරාගල ප්‍රදේශයේ ඉඩම් ජලාශයට යටවීම පිළිබඳ ප්‍රශ්නය ගැන එකඟතාවට පැමිණීමට ඇත.

ඉන් අපහසුවට පත්වන ජනයාට, පිළිගත හැකි විකල්ප ප්‍රතිලාභ ලබා දීම සඳහා කුඹුක්කන් ඔය ජලය ආශ්‍රිතව නව ප්‍රදේශ සංවර්ධනය කොට, ජලය සැපයීමට යෝජනාවත් පිළිබඳව සොයා බැලීමට තිබෙනවා.

අපේ මේ සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන මගේ අමාත්‍යාංශය අයත් ආයතන ගැනත් මෙහිදී යමක් කිව යුතුයි.

**1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

මේ වැඩ සටහන්වල විශාල කාර්ය භාරයක් උසුලන පැරණි, එසේම වාරිමාර්ග ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුදු ඉංජිනේරුවරුන් රාශියක් සිටින ආයතනයක් බව තමුන්නාන්සේලා දන්නවා. අපේ සමස්ත ක්‍රියාවලියට විවිධ අංශවලින් විශාල ලෙස දායක වෙනවා.

මෙහි අනාගත කාර්ය භාරය තවත් පුළුල් කොට, සංවර්ධන ප්‍රයත්නයට වැඩියෙන් දායකත්වයක් ලබා ගැනීමට එහි ඉදි කිරීම් හා තාක්ෂණික විශේෂඥ සේවා අංශවලින් බලාපොරොත්තු ඇති කර ගත හැකියි.

**2. වාරිමාර්ග කළමනාකරණ අංශය**

අමාත්‍යාංශයට අනුබද්ධ මෙම අංශයෙන් වාර්මාර්ග බල ප්‍රදේශ 53ක හෙක්ටයාර් 1,66,000ක නිෂ්පාදනය සඳහා මෙහෙයුම් කටයුතු කෙරෙනවා. ගොවි සංවිධානවල ශක්තිය වර්ධනය කිරීම, කළමනාකරණයට සහභාගි කර ගැනීම, කෘෂි නිෂ්පාදනය දැනුම හා කුසලතා වර්ධනයේ යෙදීම ආදී කටයුතුවලින් ධනාත්මක ලෙස හිතකර පරිසරයක් ව්‍යාපාර තුළ ඇති කර තිබෙනවා.

**3. ජල සම්පත් මණ්ඩලය**

1964දී ස්ථාපනය කරන ලද මෙම මණ්ඩලය පසු ගිය කාලවලදී වැඩි අවධානය යොමු කර ඇත්තේ භූගත ජලය පිළිබඳවයි. දත්ත හා තොරතුරු රැස් කිරීම, විමර්ශන හා ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පර්යේෂණ ඇතුළු විවිධ වැඩ කටයුතුවල නිරත වෙනවා. මුල් අරමුණුවලට සරිලන සේ ජල සම්පත් වර්ධනය පිළිබඳ කාර්ය භාරය පුළුල් කර, සංස්ථා සැලැස්මක් පරිදි ඉදිරි කාලයේ වැඩ කටයුතු සම්පාදනය කිරීමට දැන් පියවර අරන් තිබෙනවා. අනාගතයේ ජල සම්පත් ආරක්ෂා කිරීම, පවිත්‍රතාව රැකීම වැනි අභියෝගවලට මුහුණ දීමට ප්‍රබල රාජ්‍ය ආයතනයක් බවට පත් කිරීම ඉදිරි දැක්මයි.

**4. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය**

දේශයේ ස්ථිරසාර සංවර්ධනය උදෙසා වග කීමෙන් යුත් ඉංජිනේරු උපදේශක සේවා සැපයීමට 1973දී ස්ථාපනය කරන ලද මෙම කාර්යාංශය මගේ අමාත්‍යාංශයට සම්බන්ධ වී එම මෙහෙවරෙහි අඛණ්ඩව යෙදී සිටිනවා.

ප්‍රවාහන, වෙනත් යටිතල පහසුකම්, වරාය හා වෙරළ, ගොඩනැඟිලි, සෞඛ්‍ය, පරිසර වැනි අංශ පිළිබඳව රාජ්‍ය හා පෞද්ගලික අංශයට වටිනා සේවයක් සලසා දෙනවා.

සිවිල්, විදුලි, යාන්ත්‍රික, ගෘහ නිර්මාණ, පරිගණක වැනි අංශවලින් දේශීය ආයතන හා අමාත්‍යාංශ 24කටත්, අන්තර්ජාතික සබඳතා මඟින් අපේ රටට තවත් අංශයකිනුත් කීර්තියක් ලබා දීමටත් මෙම සේවා දායකත්වය මහෝපකාරි වෙනවා. මාල දිවයින හා අප්‍රිකානු රාජ්‍යයන් ද ක්වා තම සේවා ව්‍යාප්ත කර තිබෙනවා.

ඒ සඳහා විදේශීය ඉදිකිරීම් හා උපදේශක සේවා සඳහා අංශයක් ආරම්භ කළා.

ගොවි ජන හදවත ගැඹුරින් වටහා ගනිමින් ඔවුන් සමඟ ජීවත් වෙමින් ඔවුන් උදෙසාම කැප වී මෙම අමාත්‍යාංශයේ වැඩි බරක් තම දෙවුර මත තබා ගත් ගරු ජයතිස්ස රණවීර අමාත්‍යතුමා වෙත මාගේ ඉහළම ගෞරවයද, ස්තුතියද, පුද කරනවා.

තමා උපයා ගත් මහා ධනය වූ ප්‍රායෝගික දැනුම සම්භාරය නොමසුරුව වැය කරමින් අමාත්‍යාංශය මෙහෙයවන ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය සහ අප අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවල ප්‍රධානීන් හා සියළු කාර්ය මණ්ඩලය මාගේ ගෞරව පූර්වක ස්තුතියට පාත්‍ර වී තිබෙනවා. දේශීය ධනයට නිසි සාධාරණයක් ඉටු කරමින් එය අපේ නඩත්තුවටම වැය කළ දේශීය ඥානය

හා කැපවීම නොවන්නට අපේ ඉලක්කය මෙසේ පහසුවෙන් ජය ගනු නොහැකි වනබව ඔවුන්ට කරනා ගෞරවයක් සේ සලකා මම මෙහි අවධාරණය කරමි. මාගේ මෙන්ම සමස්ත ජාතියේ ගෞරවය ද ඔවුන්ට හිමි විය යුතුය.

නුදුරු දිනයක නිදහස් කර ගන්නා උතුරු බිමෙහි ජීවත් වන සහෝදර දමිළ ජනතාවගේ වියළි, කර්කශ, දිවිය සාරවත් කරන්නට රන් දියවරද, කැටුව ගංගා නිම්න ඔස්සේ නැ ගමනක් යන්නට අපි සැවොම එක්වෙමු යන අධිෂ්ඨානය මේ උත්තරීතර සභාව හමුවේ තබමින් මම නිහඬ වෙමි.

[மு.ப. 11.11]

### ගරු අන්නමලෛ නඩේසු සිවශක්ති මහතා
(மாண்புமிகு அண்ணாமலை நடேசு சிவசக்தி)
(The Hon. Annamalai Nadesu Sivasakthi)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்திலே பேசுவதற்குச் சந்தர்ப்பமளித்தமைக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். ஒரு காலத்திலே இலங்கையின் நெல் உற்பத்தியில் 26 சதவீதத்தை உற்பத்திசெய்த பிரதேசம்தான் எங்களுடைய வடக்கு-கிழக்குப் பிரதேசம். அதாவது, ‘நெற்களஞ்சியம்’ அல்லது ‘நெற்குதம்’ என்று சொல்லுமளவுக்குப் பாரியளவிலே நெல்லுற்பத்தி செய்து வந்த அந்த வடக்கு, கிழக்கு மாகாண விவசாயிகள் தற்போதைய சூழ்நிலையிலே, குறிப்பாக வன்னிப் பிரதேசத்திலே ஆரம்பிக்கப்பட்டிருக்கின்ற இராணுவ நடவடிக்கை காரணமாக பெரும் கஷ்டங்களையும், நெருக்கடி களையும் எதிர்நோக்கியிருக்கின்றார்கள். வன்னிப் பிரதேசத்திலே இருக்கின்ற பாரிய குளங்களான கட்டுக்கரைக்குளம், இரணைமடுக்குளம், அக்கராயன்குளம், புதுமுறிப்புக்குளம், வன்னேரிக்குளம், கரியநாகபடுவான் போன்ற குளங்களின் உதவியால் செய்கை பண்ணப்பட்டு வந்த பல்லாயிரக்கணக்கான ஏக்கர் விவசாய நிலங்களில் செய்கை பண்ண முடியாதவாறு அந்தப் பிரதேசத்திலிருந்து மக்கள் துரத்தியடிக்கப்பட்டிருக்கிறார்கள். இதனால் அந்த மக்கள் தாங்கள் தொடர்ச்சியாகச் செய்கை பண்ணிவந்த அந்த விவசாய நிலங்களைக் கைவிட்டிருக் கின்றார்கள். அதுமட்டுமல்லாமல், சில பகுதிகளிலே செய்கை பண்ணப்பட்டிருந்த வயல் நிலங்கள்கூட இடைநடுவிலே கைவிடப்பட்டிருக்கின்றன. குறிப்பாக முத்தையன்கட்டு, உடையார் கட்டு போன்ற பகுதிகளிலே விவசாயம் செய்கை பண்ணப்பட்டும் தற்போதைய போர் நெருக்கடி காரணமாக அந்தப் பகுதி மக்களுக்கு அந்த விவசாய உற்பத்திகளை முழுமையாகக் காப்பாற்றி எடுத்துக்கொள்ள முடியாமல் போய்விட்டது. இப்படிப் பாதிக்கப்பட்ட அந்தப் பிரதேசத்தைச் சேர்ந்த விவசாயிகளுக்கு ஏக்கர் ஒன்றுக்குப் பத்தாயிரம் ரூபாய் வீதம் நஷ்டஈடு வழங்க வேண்டுமென்று இந்த வேளையிலே நான் கௌரவ அமைச்சர் அவர்களிடம் ஒரு வேண்டுகோளை விடுக்கின்றேன். அதேபோன்று செய்கை பண்ணப்பட்ட வயல் காணிகளுக்கு இரண்டு மடங்கான நஷ்ட ஈட்டைக் கொடுப்பதனூடாகத்தான் உண்மையிலே அந்த விவசாயிகளை இப்படியான நெருக்கடிகளிலிருந்து காப்பாற்ற முடியுமென்று இந்த வேளையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த ஐம்பது வருட காலமாக வன்னிப் பிரதேசத்திலே இருக்கின்ற வாய்க்கால்கள், குளங்கள் என்பன புனரமைப்புச் செய்யப்படாமல் இருக்கின்றன. இதனால் பெருமளவிலே நீர் வீண் விரயமாகின்றது. அதுமட்டுமல்லாமல், நீர்த் தட்டுப்பாடுகூட ஏற்படுகின்றது. ஆகவே, இந்த வாய்க்கால்களைப் புனரமைப்புச் செய்வதற்கு சம்பந்தப்பட்ட அமைச்சு நடவடிக்கை எடுக்க வேண்டும். குறிப்பாக, கட்டுக்கரைக் குளத்திலிருந்து பத்து ஊட்டல் வாய்க்கால்கள் செல்கின்றன. இவை கிட்டத்தட்ட ஐம்பது கிலோ மீற்றர் தூரம் செல்கின்றன. பொருத்தமான இடங்களிலே கொங்கிறீட் போடப்பட்டு இந்த வாய்க்கால்களைப் புனரமைப்புச் செய்வதனூடாக நீர் வீண்விரயமாவதைத் தடுக்க முடியும். மன்னார் மாவட்டமானது முற்றுமுழுதாக கடும் வரட்சி நிலவும் ஒரு மாவட்டமாக இருக்கின்றபடியால் இந்த கட்டுக்கரைக் குளத்தின் நீரை நம்பித்தான் அங்கிருக்கின்ற விவசாயிகள் சுமார் முப்பதாயிரம் ஏக்கர் வயல் நிலங்களில் செய்கை பண்ணி வருகின்றார்கள். ஆனால், இந்த குளத்தின் வாய்க்கால்கள் புனரமைப்புச் செய்யப்படாமை மற்றும் பாதுகாப்பு நெருக்கடிகள் போன்ற குறைபாடுகள் காரணமாக, கடந்த இரண்டு வருடங்களாக பதினையாயிரம் ஏக்கர் நிலங்களில் மட்டும்தான் செய்கை பண்ணப்பட்டு வருகின்றது. அதனால், செய்கை பண்ணப்படாத வயல் நிலத்தில் ஒவ்வொரு ஏக்கருக்கும் தங்களுக்குக் கிடைக்க வேண்டிய வருமானத்தில் ஐம்பதாயிரம் ரூபாயை இழப்பதாகவும், மன்னார் மாவட்டத்திலே யுத்த நடவடிக்கை காரணமாகப் பெருந்தொகையான வயல்நிலங்கள் செய்கை பண்ணப்படாததால் இந்த ஆண்டு காலபோகத்தில் மட்டும் தங்களுக்குக் கிடைக்க வேண்டிய நிகர வருமானமான சுமார் எழுபத்தைந்து கோடி ரூபாயை இழந்திருப்பதாகவும் அங்கிருக்கின்ற விவசாயிகள் என்னிடம் சொல்லியிருக்கிறார்கள்.

மன்னார் மாவட்டத்திலே தேக்கம் அணைக்கட்டிலிருந்து கட்டுக்கரைக்குளம் வரையுள்ள கிட்டத்தட்ட 30 கிலோ மீற்றர் வாய்க்காலைப் புனரமைப்பதற்காக ஏற்கனவே நிதி ஒதுக்கப் பட்டிருந்தும்கூட கடந்த இரண்டு வருடங்களாக அந்தப் புனரமைப்பு வேலைகளை மேற்கொள்ள முடியவில்லை. அதனைப் புனரமைப்பதற்குக் குறித்த திணைக்கள அதிகாரிகளும் ஒப்பந்தக் காரர்களும் பல தடவைகள் முயற்சித்தபோதிலும் அது பலனளிக்காமல் அந்த வேலைகள் இடைநடுவிலே கைவிடப் பட்டன. காரணம் அந்தப் பிரதேசத்திலே பொலிஸார் பாதுகாப்புக் கடமைகளில் ஈடுபடுத்தப்பட்டிருக்கின்றமையாகும்.

அண்மையில் முசலிப் பிரதேச மக்கள் அங்கிருந்து முற்றுமுழுதாக வெளியேற்றப்பட்டிருக்கிறார்கள். இன்று அவர்களை அங்கு மீள்குடியேற்றம் செய்வதாக இருந்தால் முக்கியமாக அங்குள்ள அகத்திமுறிப்புக்குளம் மற்றும் விளாத்திக்குளம் போன்ற குளங்களின் வாய்க்கால்கள் புனரமைக்கப்பட வேண்டும். அவை புனரமைத்துக் கொடுக்கப்பட்டால்தான் அங்கு அவர்கள் தங்கள் வாழ்வாதார நடவடிக்கைகளில் ஈடுபட முடியும். அதேநேரம் குறிப்பாக முள்ளிக்குளப் பிரதேசத்திலே மேற்கொள்ளப்படுகின்ற இராணுவ நடவடிக்கையால், அங்கு வாய்க்கால் மற்றும் குளங்களைப் புனரமைப்பதற்காக ஏற்கனவே கொண்டுசெல்லப் பட்டிருந்த கனரக இயந்திரங்களை இன்று மீட்டெடுக்க முடியாதிருக்கின்றது.

மன்னார் மாவட்டத்தின் கட்டுக்கரைக்குளத்திலிருந்து தேவையான நீரைத் தேக்கிவைக்கும்பொருட்டு அமைக்கப்பட விருக்கின்ற தேக்கம் என்ற ஒரு புதிய அணைக்கட்டு, பறையனாலங்குளம் என்கின்ற ஓர் இடத்தில் அமைக்கப்பட இனங்காணப்பட்டிருக்கிறது. இந்தத் திட்டத்துக்கான அறிக்கையை மாவட்ட விவசாயத் திணைக்களம் சமர்ப்பித்திருந்தபோதிலும் இதுவரை காலமும் அதற்குரிய எந்த முயற்சியும் எடுக்கப்படவில்லை. இந்தப் புதிய நீர்த்தேக்கம் உருவாக்கப்படுமானால் அங்கு மேலும் பலர் விவசாய நடவடிக்கைகளை மேற்கொள்ள முடிவதுடன் வரட்சியையும் போக்க முடியும். அதுமட்டுமல்லாமல், கால்நடைகளின் குடிநீர்ப் பிரச்சினையையும் தீர்க்க முடியும். தற்பொழுது அங்கு சுமார் ஆறாயிரம் ஏக்கர் நிலத்திலேயே சிறுபோக நெற்செய்கை மேற்கொள்ளப்படுகின்றது. ஆனால், இந்தப் புதிய நீர்த்தேக்கம் நிர்மாணிக்கப்படுமாக இருந்தால் சுமார் இருபத்துநான்காயிரம் ஏக்கர் நிலத்திலே சிறுபோக நெற்செய்கையை மேற்கொள்ளக் கூடியதாக இருக்கும். ஆகவே, இந்த நிலைவரங்களைக் கவனத்தில்கொண்டு செயற்படுமாறு உங்களிடம் கேட்டுக் கொள்கின்றேன். 1965 ஆம் ஆண்டு UNDP மூலம் மகாவலி நீரை வடக்கிற்குத் திசைதிருப்புவதற்கான ஒரு திட்டம் தீட்டப்பட்டிருந்த போதிலும் அன்றிருந்த ஆட்சியாளர்கள் அரசியல் உள்நோக்கம் காரணமாக அதனைக் கைவிட்டார்கள். ஆகவே, இன்று மீண்டும் அந்தத் திட்டத்தை அங்கு அமுல்படுத்துமாறு கேட்டுக் கொள்கின்றேன். உண்மையிலே அதனூடாக அந்த விவசாயிகள் நன்மை பெறக்கூடிய வகையில் பல வசதிவாய்ப்புக்களை ஏற்படுத்த முடியும்.

தற்பொழுது பெய்துவருகின்ற கடும் மழையினால் ஏற்பட்டிருக்கின்ற வெள்ளம் காரணமாக அங்கு செய்கை பண்ணப்பட்டுள்ள பல விவசாய நிலங்கள் பாதிக்கப்

[ගරු අන්නමලෛ නඩේසු සිවශක්ති මහතා]

பட்டிருக்கின்றன. குறிப்பாக நானாட்டான் பிரதேசத்திலே உடைப்பெடுத்திருக்கின்ற சிறு குளங்களைத் திருத்தியமைக்க வேண்டும். இப்பொழுது மாந்தை மேற்கிலே புதிய குளம் ஒன்றை அமைப்பதற்கும் மாவட்ட விவசாயத் திணைக்களம் உரிய இடத்தை இனம்கண்டிருக்கின்றது. அதேநேரம் இலுப்பைக்கடவை நாயாற்றுவெளியிலே ஒரு குளத்தை அமைப்பதனூடாகவும் அங்கு நீரைத் தேக்கி வைக்க முடியும். எமது வன்னிப் பிரதேசத்தில் உள்ள பல சிறு குளங்கள் நீண்ட காலமாகப் புனரமைக்கப்படாத நிலையில் இருக்கின்றன. அங்குள்ள அதிகாரிகள் ஒரு வருடத்தில் 30 குளங்களைப் புனரமைப்புச் செய்வதற்குத் தயாரான நிலையில் இருக்கின்றபோதிலும், குறிப்பாக ஒரு வருடத்தில் பத்துக் குளங்கள் மாத்திரம்தான் புனரமைப்புச் செய்யப்பட அனுமதி வழங்கப் படுகிறது.

இன்று வன்னிப் பிரதேசத்திலே கமத்தொழில் திணைக்களங் களில் ஆளணிப் பற்றாக்குறை நிலவுகின்றது. குறிப்பாக, பொறியியலாளர்கள் மற்றும் தொழில்நுட்ப உத்தியோகத்தர்களுக்கு அங்கு பற்றாக்குறை காணப்படுகின்றது. அதுமட்டுமல்லாமல், அங்கு வாகனப் பற்றாக்குறையும் காணப்படுகின்றது. அதேபோன்று எங்களுடைய வவுனியா பிரதேசத்தில் உள்ள கமநல அபிவிருத்தித் திணைக்ளத்தில் காணப்படுகின்ற பல குறைபாடுகளைக் குறிப்பிட்டு, அவற்றை நிறைவேற்றித் தருமாறு அவர்கள் கோரியிருக்கின்றார்கள். குறிப்பாக கமநல அபிவிருத்தித் திணைக்களத்தில் ஆறு கமநல அபிவிருத்தி உத்தியோகத்தர்களும், ஆறு முகாமைத்துவ உதவியாளர்களும் தேவைப்படுவதாகக் குறிப்பிட்டுள்ளார்கள். இந்த விடயத்தைக் கவனத்தில் எடுத்து அவ்வுத்தியோகத்தர்களை நியமனம் செய்வதற்கான ஒழுங்குகளை மேற்கொள்ளவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அதுமட்டுமல்லாமல், இப்பொழுது இலங்கையின் தென் பகுதிகளிலுள்ள விவசாயிகளுக்கு மானிய அடிப்படையில் இரண்டு சில்லு உழவு இயந்திரங்கள், நான்குசில்லு உழவு இயந்திரங்கள், சூடு அடிக்கும் இயந்திரங்கள் உட்பட்ட மற்றும் பல விவசாய உபகரணங்களையும் வழங்குவதைப் போன்று எமது வன்னிப் பிரதேசத்திலே உள்ள விவசாயிகளுக்கும் அத்தகைய உபகரணங்களை மானிய அடிப்படையில் வழங்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். நீங்கள் யுத்தத்தைக் காரணங்காட்டி வன்னிப் பிரதேசத்திலுள்ள மக்களைப் புறக்கணிக்காது, நீங்கள் கூறுகின்ற 'மஹிந்த சிந்தனை'த் திட்டத்தின் பிரகாரம் தமிழ் மக்கள், சிங்கள மக்கள் என்ற வேறுபாடின்றி அனைவருக்கும் சம அளவில் அனைத்துப் பயன்களும் கிடைக்க வழிவகுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். எமது விவசாயிகள் கடந்த ஐம்பது வருட காலமாக எதிர்நோக்கியுள்ள பிரச்சினைகளுக்குத் தீர்வு காண வேண்டும். எமது பிரதேசத்திலுள்ள விவசாய நிலங்களுக்குச் செல்லும் பாதைகள் நீண்ட காலமாக புனரமைப்புச் செய்யப்படாத நிலையில் உள்ளன. ஆகவே, அவற்றையும் திருத்தியமைக்க வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, எமது மாவட்டத்திலுள்ள காணி, காணி அபிவிருத்தி சம்பந்தமான சில விடயங்களைக் குறிப்பிடலாமென நினைக்கின்றேன். குறிப்பாக வவுனியா, மன்னார் மாவட்டங்களிலுள்ள பல குடும்பத்தினர் கடந்த நாற்பது வருட காலமாக காணி அனுமதிப்பத்திரம் பெற முடியாத நிலையில் இருக்கின்றனர். இன்று காணி அனுமதிப்பத்திரம் மிகவும் அத்தியாவசிய தேவையுள்ள ஒன்றாக விளங்குகின்றது. காரணம், மீளக் குடியேறுவதாகவிருந்தாலும் சரி, தமது பிள்ளைகளுக்குத் திருமணம் செய்து கொடுக்கின்ற வேளையில் அந்தக் காணியைப் பங்கிட்டுப் பிள்ளைகளுக்குக் கொடுப்பதாகவிருந்தாலும் சரி, காணி அனுமதிப்பத்திரம் பெற்றுக்கொள்ளாததனால் அம்மக்கள் பல சிக்கல்களை எதிர்நோக்குகின்றனர். இதன் காரணமாக குடும்பங்களுக்கிடையே முரண்பாடுகளும் மனஸ்தாபங்களும் ஏற்படுகின்றன. அதுமட்டுமல்லாமல், காணி அனுமதிப்பத்திரத்தை வங்கியில் ஒப்படைத்து கடன் பெற்று தமது தொழிலை மேற்கொள்ள முடியாத நிலையில் மக்கள் பல சிக்கல்களை எதிர்நோக்கியிருக்கிறார்கள். குறிப்பாக எங்களுடைய வன்னிப் பிரதேசத்தில் 1995.06.15 க்கு முன்னர் அடாத்தாக காணிகளைப் பிடித்தவர்களுக்கு காணி அனுமதிப்பத்திரம் வழங்குகின்ற விடயம் சம்பந்தமாகச் சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். யுத்த நடவடிக்கை களின் காரணமாக பல்வேறு மாவட்டங்களிலுமிருந்து இடம்பெயர்ந்த மக்கள் வவுனியா மாவட்டத்துக்கு வந்து குடியேறியிருக்கிறார்கள். அதன் காரணமாக 1995 ஆம் ஆண்டுக்குப் பிற்பட்ட காலங்களில் காணிகளை வாங்கிக் குடியேறிய மக்களிடமிருந்து, electricity bill, தண்ணீர் bill, வாக்காளர் இடாப்புப் பதிவுகள் போன்ற பல ஆவணங்களைச் சமர்ப்பிக்கும்படி காணி அமைச்சு கோரியுள்ளதன் காரணமாக வவுனியாவிலே இராணுவக் கட்டுப்பாட்டுப் பகுதிகளில் மாத்திரம் பத்தாயிரத்துக்கு மேற்பட்ட குடும்பத்தினர் காணி அனுமதிப் பத்திரம் பெறுவதற்காக நீண்ட காலமாகக் காத்திருக்கிறார்கள். நாடு முழுவதும் உள்ள காணிகள் தொடர்பாகப் பொதுவான பல சட்டங்கள் இருக்கின்றபொழுதிலும், எங்களுடைய பிரதேசத்திலே உள்ள மக்கள் யுத்த நெருக்கடிகளினால் பாதிகப்பட்டு, இடம்பெயர்ந்து அல்லலபடுகின்ற நிலைமையைக் கவனத்தில் கொண்டு, அம்மக்களுக்கு காணி அனுமதிப்பத்திரம் வழங்குவது தொடர்பாக விசேட அனுமதியைப்பெற்று, இவ்விடயம் தொடர்பாகத் தீர்க்கமான ஒரு நடவடிக்கையை மேற்கொள்ள வேண்டுமெனக் காணி அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன். இதனூடாக, குடும்பங்களுக்கிடையே காணிகள் தொடர்பாக நிலவுகின்ற பல தகராறுகளுக்குத் தீர்வு காண முடியும்.

எங்களுடைய மாவட்டத்திலே இருக்கின்ற பல்வேறு பிரச்சினைகளைப் பற்றி நாங்கள் ஒவ்வொரு வருடமும் இந்த உயர்ந்த சபையிலே சுட்டிக்காட்டிக்கொண்டுதான் வருகின்றோம். ஆனால், அவை எல்லாமே ஏதோ ஒரு வகையிலே புறக்கணிக்கப்பட்டும் தட்டிக்கழக்கப்பட்டும்தான் வருகின்றன. யுத்தம் என்ற காரணத்தைக் காட்டி கடந்த முப்பது வருடங்களாக எங்களுடைய பகுதிகள் நாங்கள் குறிப்பிட்டதுபோன்று அபிவிருத்தி செய்யப்படாமல் இருக்கின்றன. யுத்தத்துக்கு முற்பட்ட காலத்திலேகூட அன்றைய அரசியல்வாதிகளும் அரசாங்கங்களும் அரசியல் காரணங்களுக்காக எங்களுடைய பகுதிகளிலே அபிவிருத்தித் திட்டங்களைப் புறக்கணித்திருக்கிறார்கள். ஆகவே, முழுமையான அபிவிருத்தியை நீங்கள் செய்வதாக இருந்தால் நிச்சயமாக நாட்டிலே சமாதானத்தை ஏற்படுத்தவேண்டும்; இந்த யுத்தத்தை நிறுத்தவேண்டும். நீங்கள் சொல்வதுபோன்று யுத்தம் நடைபெறுகின்ற காரணத்தினால் எங்களுடைய பகுதியிலே உங்களால் எதையும் செய்ய முடியாமல் இருக்கின்றதென்றால் இந்த யுத்தத்தை நிறுத்தி சமாதானத்தை ஏற்படுத்துங்கள்! அப்படியில்லையென்றால் தொடர்ச்சியாக எங்களுடைய பிரதேசத்திலிருக்கின்ற குறைகளையும், தேவைப்பாடுகளையும் நாங்கள் ஒரு தடவையல்ல, நூறு தடவை இந்த சபையிலே எடுத்துச் சொன்னாலும்கூட உங்களிடமிருந்து எதையுமே எதிர்பார்க்க முடியாது; எங்களுடைய மக்களும் அபிவிருத்திகளைக் காண மாட்டார்கள்.

இன்றைக்கு நீங்கள், 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உயம்' என்று சொல்கின்றீர்கள். ஆனால், நீங்கள் ஆரம்பித்த அந்த கிழக்கின் உதயத்தின்மூலம் இன்று கிழக்கு மாகாணத்திலே ஒவ்வொரு நாளும் என்ன நடைபெற்றுக்கொண்டிருக்கின்றதென்று பார்க்கக்கூடியதாக இருக்கின்றது. கிழக்கிலே பதற்றமும் பீதியும் நிறைந்த ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. கிழக்கு மாகாணத்திலிருக்கின்ற மக்கள் ஒவ்வொருநாளும் தங்களுடைய உயிரைக் கையிலே பிடித்துக்கொண்டிருக்கவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைவரம் ஏற்பட்டிருக்கின்றது. நேற்றும்கூட ஒரே குடும்பத்தைச் சேர்ந்த மூவரும் இன்னுமொருவருமாக நான்கு பேர் சுட்டுக்கொல்லப்பட்டிருக்கிறார்கள். இப்படியான 'கிழக்கின் உதயம்' போல், வடக்கிலே ஒரு வசந்தம் எங்களுக்குத் தேவையில்லை. அங்கிருக்கின்ற மக்கள் உண்மையாகவே ஒரு நிரந்தரமான சமாதானத்தைத்தான் விரும்புகின்றார்கள். ஆகவே, அரசாங்கம் காலத்தை நீட்டிக்கொண்டு செல்லாமல் வடக்கிலும், கிழக்கிலும் உள்ள மக்கள் மாத்திரமன்றி, முழு இலங்கையிலுமே இருக்கின்ற மூவின மக்களும் அச்சம், பீதியின்றி வாழக்கூடிய நிரந்தர சமாதானத்தை ஏற்படுத்த வேண்டும். அந்த சமாதானத்துக்கான சகல முயற்சிகளையும் அரசு எடுக்க வேண்டுமென்றும் கேட்டு, எனக்குப் பேசுவதற்கு வாய்ப்பளித்ததற்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[පූ. භා. 11.29]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - கமத்தொழில் அபிவிருத்தி, கமநல சேவைகள் அமைச்சர் )

(The Hon. Maithripala Sirisena - Minister of Agriculture Development and Agrarian Services)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2009 ඉදිරි වර්ෂය සඳහා අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ සාකච්ඡා වන මේ අවස්ථාවේදී කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විධියට කරුණු ඉදිරිපත් කරන්නට ලැබීම ගැන මම පළමුවෙන්ම සතුටු වෙනවා. මේ සාකච්ඡාව ආරම්භ වූ අවස්ථාවේ සිට විපක්ෂය වෙනුවෙන් අදහස් දැක් වූ ගරු ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම වන්නි ප්‍රදේශය නියෝජනය කරන ගරු සිවශක්ති මන්ත්‍රීතුමාටත් මම ස්තූතිවන්ත වෙනවා.

අපේ රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය තුළ දියුණුවක් ඇති කිරීමට වාරිමාර්ග සහ ඉඩම් අංශයෙන් විශාල දායකත්වයක් ලැබෙනවා. එය පොදු තත්ත්වයක්. ඒ නිසා අද දවසේ සාකච්ඡාවට ගැනෙන අපේ අමාත්‍යාංශය වාගේම වාරිමාර්ග හා ජල කළමනාකරණ ආමත්‍යතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලවලටත්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලවලටත් මම ස්තූතිවන්ත වෙනවා. මොකද, පසු ගිය තෙ වසරක කාලය තුළ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාල සීමාවේදී මේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රය විධියට ගෙන යන ලද පුළුල් ජාතික සංවර්ධන කාර්යයේදී අපි සියලු දෙනාම ඉතාමත් දැඩි සහෝදරත්වයකින් මිත්‍රශීලී කටයුතු කරලා වසර තුනක ප්‍රගතියක් මේ විෂය ක්ෂේත්‍රය තුළ පෙන්වන්නට අපට හැකියාව ලැබිලා තිබෙන නිසා, ඒ වාගේම 2009 වර්ෂය වාගේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාල සීමාවට සකස් කළ දස අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මේ ගනු ලබන මේ සියලු ක්‍රියා මාර්ගවල සාර්ථකත්වය අප බලාපොරොත්තු වෙනවා.

අප රටක් වශයෙන් කල්පනා කරන විට කෘෂි කාර්මික රටක් විධියට මේ රටේ සංවර්ධනය පිළිබඳව, මේ රටේ අනාගතය පිළිබඳව, මේ රටේ ජාතික ආර්ථිකය පිළිබඳව සම්පූර්ණයෙන්ම විශ්වාසය තැබිය හැක්කේ, බලාපොරොත්තු තැබිය හැක්කේ කෘෂි කාර්මික සංවර්ධනයක් තුළයි කියන එක අපි දැඩි ලෙස විශ්වාස කරන්නේ. ඒ නිසා අද අපට දේශීය වශයෙන් වාගේම විදේශීය වශයෙනුත් තිබෙන ආහාර අර්බුදය, ලෝක ආර්ථික අර්බුදය වැනි විවිධ අභියෝග හමුවේ මේ සියල්ලටම මේ විෂයය ක්ෂේත්‍රය තුළ අපේ රටේ අපි දෙන දායකත්වය, නායකත්වය සහ මඟ පෙන්වීමක් සමඟයි. ගරු නියෝජය සභාපතිතුමනි, මේ රටේ අනාගතය සම්බන්ධයෙන් අනාගත පරපුරට තබන්නට පුළුවන්කම තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාල සීමාව තුළ අපි දැඩි ලෙස විශ්වාස කරනවා, ලෝක ආර්ථික අර්බුදය, විදේශ ආහාර අර්බුද තිබුණත් ඒ අභියෝග සියල්ලම ජය අරගෙන අප රටේ සියලු දෙනාටම ඉදිරියට යන්නට පුළුවන්ය කියලා. විශේෂයෙන්ම පසු ගිය ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාවට ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනය වූ මහින්ද චින්තනයේ සඳහන් ආකාරයට " නිල්ල පිරුණු හෙටක් " කරා යන ගමනේදී විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ පරිවර්තනයත් විප්ලවයක් ඇති කිරීමේ පුළුල් ජාතික වැඩ පිළිවෙළ තුළ අද අපට පුළුවන් වෙලා තිබෙනවා, තෙ වසරක ප්‍රගතිය පිළිබඳව සතුටු වන්නට. ඒ වාගේම අනාගතය පිළිබඳව බලාපොරොත්තු සහගතව, අපේක්ෂා සහගතව, අධිෂ්ඨානශීලීව මේ වැඩ පිළිවෙළ අප ඉස්සරහට ගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දේශීය ආහාර නිෂ්පාදන ජාතික මෙහෙයුම වන "අපි වවමු-රට නඟමු" වැඩ සටහන අපි ආරම්භ කරලා පසු ගිය වර්ෂයේදී - වර්ෂයක කාලය තුළ - විශේෂයෙන්ම අපට පුළුවන් කම ලැබුණා, ඉතාමත් ඉහළ ප්‍රතිඵල ලබා ගැනීමට. අපට ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. අපට පුළුවන්කම ලැබුණා, ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් සකස් කරලා, 2007 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 03 වන දා අති ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයේදී ඒ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන්නට. විශේෂයෙන්ම දේශීය කර්මාන්තය වාගේම දේශීය ආහාර පිළිබඳව කථා කරන විටත් ඇති වන විවිධ ප්‍රශ්න, බාධාවන් සහ ගැටලුවලට විසඳුම් ලබා දෙමින්, විදේශ වෙළෙඳ පොළේ අපට බලපාන්නා වූ කාරණයන් හා තත්ත්වයන් වලට විසඳුම් ලබා ගැනීම සඳහා - ලෝකයේ ඇති වන ආහාර අර්බුදයට සාර්ථකව මුහුණ දීම සඳහා - මේ රටේ දෙකෝටියක් වූ ජනතාව අනාගතයේදී බඩගින්නේ නොතැබීම සඳහා මේ රට ආහාරවලින් ස්වයංපෝෂිත කිරීමට අද ගෙන යන වැඩ පිළිවෙළේ සාර්ථකත්වයක් තිබෙනවා.

විශේෂයෙන්ම ඒ සාර්ථකත්වය පිළිබඳව කථා කරන විට කියන්න තිබෙන්නේ මොකක්ද? වසර 2010 වන විට අප බලාපොරොත්තු වන ඉලක්කය සම්පූර්ණ කරන්න පුළුවන්ය කියන එක අපේ දැඩි විශ්වාසයයි. අපට මොන අභියෝග තිබුණත්, මොන විධියේ ගැටුම් සහ බාධාවන් තිබුණත් ඉදිරි වර්ෂ දෙක තුළ; වසර 2010 වන විට අපි බලාපොරොත්තු වන ආකාරයෙන් මේ රටට පිට රටින් ගෙන්වන, එහෙත් මේ රටේ වගා කළ හැකි ආහාර පිට රටින් ගෙන්වීම ඉතාමත්ම අවම ප්‍රමාණයක් කරලා - ඉතාමත්ම අඩු ප්‍රමාණයක් කරලා - අපට අවශ්‍ය ආහාර, ජනතාවට කන බොන දේවල් ටික නිෂ්පාදනය කර ගැනීමේ ඉලක්කයට යන්න පුළුවන්ය කියන එක පසු ගිය වර්ෂයේ අත් දැකීම්වලින් අපට කියන්න පුළුවන්. ඒ නිසා වසර 2010 වන විට ස්ථිර වශයෙන්ම මේ රට සහල් ප්‍රමුඛව අත්‍යවශ්‍ය ආහාර විශාල ප්‍රමාණයකින් සමෘද්ධිමත් කරන්නට මේ රටේ සියලු අංශවල සහයෝගය ලැබී තිබෙනවා. මේ වැඩ පිළිවෙළ ආරම්භ කළාට පසුව දේශපාලන පක්ෂ භේදයෙන් තොරව සියලු දෙනාගේම සහයෝගය අපට ලැබී තිබෙනවා; කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ නොවන අනෙකුත් ක්ෂේත්‍රවල සහයෝගයත් සම්පූර්ණයෙන්ම ලැබී තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ සියලු දෙනා, ඒ වාගේම අපේ රටේ සියලුම පළාත් සභාවල වැඩ කටයුතු කරන මහ ඇමතිතුමන්ලා ඇතුළු ඇමතිවරුන්, ප්‍රධාන වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික සියලුම ජනමාධ්‍ය ආයතන, දේශීය ආහාර නිෂ්පාදන ජාතික මෙහෙයුමේදී ලබා දෙන දායකත්වය, මඟ පෙන්වීම සහ විශේෂයෙන්ම විවේචන ඉදිරිපත් කරමින් ලබා දෙන සහයෝගය අප ඉතාමත්ම අගය කරන්නට ඕනෑ. ඒ තුළින් අපට විහාල වැඩ කොටසක් කරන්නට පුළුවන්කම ලැබී තිබෙනවා.

ඒ එක්කම අද අප සාකච්ඡාවට ගන්නා වැය ශීර්ෂ අතුරින් ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශයේ විෂය පථය ගත් විට ඒ වැය ශීර්ෂයන්ට, අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, පශ්චාත් අස්වනු පිළිබඳ තාක්ෂණ ආයතනය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, ගොවිජන සහ කෘෂි රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය, වී අලෙවි මණ්ඩලය, ජාතික පොහොර ලේකම් කාර්යාලය, සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, සීමාසහිත ලංකා පොහොර සමාගම කියන ආයතන ඇතුළත් වෙනවා.

මේ සම්බන්ධයෙන් කථා කරන විට 2009 වර්ෂයේ අපේ ඉලක්කගත වැඩ සටහන්වලින්, මහවැලි සංවර්ධන වැඩ සටහන යටතේ මොරගහකන්ද- කළු ගඟ ව්‍යාපෘතියේ මේ දක්වා තිබෙන ප්‍රගතිය සම්බන්ධයෙන් අපි ඉතාමත්ම සතුටු වෙනවා. පසු ගිය වර්ෂයේ ජනවාරි මාසයේ 25 වැනි දා මුල් ගල තබලා ආරම්භ කළ මේ වැඩ සටහන අද ඉතාමත්ම සාර්ථක අදියරක තිබෙනවා. 2007 වර්ෂයේ තමයි මේ වැඩ සටහන ආරම්භ කළේ. ගෙවී ගිය වර්ෂ දෙකක කාලය ගත්තාම පළමු වැනි වර්ෂයේ අපට ජාතික අය වැයවලින්, දේශීය මුදල්වලින් ලැබුණේ රුපියල් මිලියන 500ක පමණ මුදලක්. දෙ වන වර්ෂය-2008- ගත්තාම අපට රුපියල් මිලියන 1,500ක මුදලක් ලැබුණා. 2009 අය වැය යෝජනාවලින් මුදල් ඇමතිවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමා මොරගහකන්ද ජලාශ ව්‍යාපාරයේ කටයුතු සඳහා රුපියල් මිලියන 3,750ක් වෙන් කර තිබෙනවා. ඒ රුපියල් මිලියන 3,750ක මුදල වාගේම අපට මොරගහකන්ද ව්‍යාපාරය සඳහා ලබන වර්ෂයේ සවුදි රජයෙනුත් ඒ වාගේම ජපන් ජාත්‍යන්තර බැංකුවෙනුත් -ජයිකා ආයතනයෙනුත්-

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

මුදල් ලබා දීමට එකඟතාව පළ කර තිබෙනවා. ඒ නිසා මේ රටේ මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ තිබෙන විශාලතම කෘෂිකාර්මික සංවර්ධන යෝජනා ක්‍රමය ලෙස 2009 වර්ෂයේදී මොරගහකන්ද -කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ සුවිශාල වූ වැඩ කොටසක් කරන්නට පුළුවන්කම ලැබෙනවා. 2007 සහ 2008 වර්ෂ ගත්තාම, ඒ වර්ෂ දෙකේදීම අපට වෙන් කළ මුදල් ප්‍රමාණයට වඩා වැඩි වැඩ කොටසක් මොරගහකන්ද ව්‍යාපාරය තුළ අපි ඉටු කර තිබෙනවා. ඒ නිසා මහවැලි සංවර්ධන වැඩ සටහනේ දී මේ තුළින් ලැබෙන ආයකත්වය අපි කවුරුත් දන්නවා. උතුරු මැද ප්‍රදේශයේ ජනතාවට වාගේම නැගෙනහිර ප්‍රදේශයේ ජනතාවටත්, රටේ මධ්‍යම ප්‍රදේශයේ ජනතාවට වාගේම නැගෙනහිර ප්‍රදේශයේ ජනතාවටත්, රටේ මධ්‍යම ප්‍රදේශයේ ජනතාවටත් මේ ව්‍යාපෘතිය යටතේ සුවිශාල වූ වැඩ කොටසක් ඉටු වෙනවා. කෘෂි කාර්මික අංශය වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයට බලපාන පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා මේ ව්‍යාපෘතිය තුළ සැලසුම් ගණනාවක් තිබෙනවා. අපේ මිත්‍ර ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා මහවැලි සංවර්ධන ව්‍යාපාරය පිළිබඳව එතුමාගේ කථාවේදී සඳහන් කළා. මහවැලි සංවර්ධන ව්‍යාපාරය ගැන අපි කථා කරද්දී මෙහි උරුමය සහ අයිතිය කථා කරනවාට වැඩිය සියලු දෙනාට එහි ගෞරවය බෙදී යාම සාධාරණයි කියන එකයි මගේ විශ්වාසය වන්නේ. විශේෂයෙන්ම අද මම නියෝජනය කරන දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එදා සී. පී. ද සිල්වා ඇමතිතුමා තමයි මේ රටේ පළමු වන මහවැලි විෂය භාර ඇමතිවරයා වුණේ. ඒ වාගේම සී. පී. ද සිල්වා මැතිතුමා ආරම්භ කරපු අනුරාධපුර පොල්ගොල්ල අමුණේ වැඩ කටයුතු මෛත්‍රීපාල සේනානායක මැතිතුමා 1970 දී බණ්ඩාරනායක මැතිනියගේ නව රජය මඟින් ඉදිරියට ගෙන ගිහින් උතුරු මැද ජනතාවට මහවැලි ජලය ලබා දීම සඳහා පොල්ගොල්ල අමුණේ වැඩ කටයුතු අවසන් කරලා 1976 ජනවාරි මාසයේ 8 වන දා තමයි මහවැලි ගඟේ ජලය උතුරට හරවීමේ කටයුත්ත කළේ. ඒ වාගේම, -

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඇමතිතුමනි, තත්පරයක් දෙන්න. මොරගහකන්ද ජලාශයේ ජලයෙන් කොටසක් යාපහුව සහ ගල්ගමුවට දෙනවාද?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

අපි මේ වැඩ ටික කර ගෙන යන කොට බලමු. [බාධා කිරීමක්] පුළුවන් විධියට දෙන්නම්.

අපි බලාපොරොත්තු වන ඉලක්කත් එක්ක විශේෂයෙන්ම මොරගහකන්ද ජලාශය වෙනුවෙන් ඉදිරියේදී ලැබෙන දේශීය අරමුදල් වාගේම විදේශීය අරමුදල්වලින් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා. මහවැලි සංවර්ධන ව්‍යාපාරය පිළිබඳව කථා කරන විට මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. ගරු ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා මේ විෂය භාරව 2001 සිට 2004 කාලය තුළ සිටින විට ඔබතුමාත් දන්නේ නැතිව.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

අවුරුදු දෙකයි.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහවැලි අධිකාරිය වසා දැමීමේ කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා ඒක සම්මත වුණා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඒක අසත්‍යයක්.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ඒ කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. එදා මහවැලි අධිකාරිය වසා දැම්මා නම් අද මොරගහකන්ද ජලාශය කරන්න පුළුවන්කමක් නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

දවසක් මම හිටපු ලේකම් එලෙව්වා. අර විධියට කර තිබෙන්නේ ඒ ලේකම් සල්ලි ගන්නයි. මොකද, ඒ ලේකම් international funds වලින් සල්ලි ගත්තා. ඒවාට කඩදාසිත් හැදුවා. ඒක අසත්‍යයක්.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

කොහොම හරි කැබිනට් මණ්ඩලය ඒක අනුමත කර තිබුණා. ඊට පසුව අපි ඒ කැබිනට් පත්‍රිකාව 2004 දී සම්පූර්ණයෙන් අහෝසි කරලා නැවත මහවැලි අධිකාරිය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම නිසා තමයි අද මොරගහකන්ද ජලාශය වැනි මහා සංවර්ධන ව්‍යාපෘති කර ගෙන යන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ. ඒ තුළ මේ රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දේශීය කෘෂි ආර්ථිකය සම්බන්ධයෙන්, නිෂ්පාදනය සම්බන්ධයෙන් විශාල පරිවර්තනයක් ඇති වෙනවා කියා අපි විශ්වාස කරනවා.

මේ අමාත්‍යාංශය වශයෙන් ගත්තාම අපේ රටේ පොහොර භාවිත කිරීමේදී රසායනික පොහොර සඳහා අතිවිශාල මුදලක් වැය වන බව කියන්න ඕනෑ. විද්‍යාත්මක පසු බිම තුළ අපි දන්නා වූ ආකාරයට රසායනික පොහොර භාවිතය තුළ'ින් පසට හානියක් සිදු වෙනවා. ඒ වාගේම ආර්ථික වශයෙන් මෙයින් රටට දරන්නට සිදු වන බර ගැන බැලුවාම. 2008 වර්ෂයේ දී රසායනික පොහොර සඳහා අපිට රුපියල් මිලියන 40,000ක පමණ මුදලක් වැය වී තිබෙනවා. ලබන වර්ෂයේ පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 67,000ක පමණ මුදලක් වැය වෙනවා. නමුත් මේ පොහොර සහනාධාරය නොනවත්වා ඉදිරියට දෙනවා කියා අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව අය වැය යෝජනා තුළ සඳහන් කළා. ඒ ප්‍රතිඥාව අපි දීලා තිබෙනවා. ඒ වාගේම යම් යම් අඩුපාඩුකම් තිබුණත් ඒ කටයුතු මේ වන විටත් ඉතාමත් සාර්ථකව ඉටු කරනවා.

රටේ අනාගතය පිළිබඳව කල්පනා කරන විට මේ රටේ කාබනික පොහොර භාවිතය ප්‍රධාන වශයෙන්ම ක්‍රියාත්මක කළ යුතුයි. ඒක කවුරුත් දන්නවා. ඒනිසා 2008 වර්ෂයට අපි රුපියල් මිලියන 500ක් ඉල්ලා සිටියා. අපිට ඒ මුදල්වලින් යම් ප්‍රමාණයක් ලැබුණා. ඒ තුළ කාබනික පොහොර ව්‍යාපෘතිය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් රජය විධියට විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්කම ලැබුණා. රජයේ නිලධාරීන්, ගොවීන්, පාසල් දරුවන් ඉන් බාහිරව විවිධ ක්ෂේත්‍රවල අය මේ සඳහා පුහුණුවීම් කර දැනුවත් කර කාබනික පොහොර භාවිතය සහ නිෂ්පාදනය ගැන දැනුවත් කිරීම සම්බන්ධයෙන් පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. 2008 වර්ෂය ගත්තාම එහි ප්‍රගතියක් පෙන්නුම් කළා කියා අපිට සතුටු වෙන්න පුළුවන්.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඇමතිතුමනි, තත්පරයක් ගන්නම්.

මේ කාබනික පොහොර භාවිතය පිළිබඳ වැඩ පිළිවෙළ මම අනුමත කරනවා. වැට මාරා - වැටහිරියා - කියන ඒවා බොහෝ ලෙස ව්‍යාප්ත කරන්න පුළුවන්. ඇමතිතුමනි, මේ මුදල්වලින් මේවා ව්‍යාප්ත කරන්න. මේවා ගමේ ඉඩම්වල වැව්වාම කොළවලින් පොහොර ලැබෙනවා. ඒ කොළ සතුන්ට කන්න පුළුවන්. යූරියා, නයිට්‍රජන්, ඕගනික් ලබා ගන්න පුළුවන්. මේවා ගස් dendro power project එකට ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ගහේ මුල දර වශයෙන් යොදා ගන්න පුළුවන්.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ඒ නිසා තමයි කාබනික පොහොර සම්පූර්ණයෙන්ම ව්‍යාප්ත කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් දෙන්නේ. ඒ වාගේම අය වැය යෝජනා තුළ ගරු මුදල් ඇමතිතුමා, ජනාධිපතිතුමා එය සඳහන් කළා. කාබනික පොහොර භාවිතා කරන ගොවීන්ට රසායනික පොහොර ණයට ලබා දීමේ වැඩ පිළිවෙළ ලබන වර්ෂයේ ක්‍රියාත්මක කරන්න යෝජනා කර තිබෙනවා. විශේෂයෙන්ම ඒක කෙරෙන්නේ මුදල් ලබා ගැනීම නොවෙයි. ඒ වටිනාකමට රජයට වී ලබා ගැනීමේ ක්‍රමයක් වශයෙනුයි. ඒ තුළ විශේෂයෙන් බලාපොරොත්තු වුණේ එක පැත්තකින් රටේ කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කිරීම; භාවිතය වැඩි කිරීම; ගොවි ජනතාව ඒ සඳහා උනන්දු කිරීම; ඒ වාගේම රජයට අවශ්‍ය වී ප්‍රමාණයක් ලබා ගැනීමයි. මේ කියන කරුණු පදනම් කර ගෙන තමයි ඒ යෝජනාව ක්‍රියාත්මක කළේ. ඒක නිසා විශේෂයෙන්ම 2009 වර්ෂය විධියට ගත්තාම ඒ ජාතික සැලැස්ම අපි ඉතාමත්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමටයි බලාපොරොත්තු වන්නේ.

ඒත් එක්කම ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළා; කෘෂිකාර්මික පර්යේෂණ ගොවි පොළවල් පිළිබඳව. පර්යේෂණ ගොවි පොළවල් පිළිබඳව සඳහන් කරන විට අපි පැහැදිලිවම කියන්නට ඕනෑ, පර්යේෂණ ගොවි පොළවල්වල තත්ත්වය දුර්වල වෙලා තිබුණු බව. අපි පර්යේෂණ ගොවි පොළවල්වල තත්ත්වය උසස් කිරීම සඳහා සැලසුම් ගණනාවක් ක්‍රියාත්මක කළා. ඒ අනුව අද පර්යේෂණ ගොවි පොළවල්වල තාර්යක්ෂම තත්ත්වයක් තිබෙනවා. එතුමා කිව්වා වාගේ අඩු පාඩුකම් තිබෙන බව ඇත්ත. ඉදිරියේ දී අපි ඒ අඩු පාඩුකම් සකස් කර ගෙන පර්යේෂණ ගොවි පොළවල්වල තත්ත්වය මීට වඩා ශක්තිමත් කිරීමටයි බලාපොරොත්තු වන්නේ. මොකද, පර්යේෂණ අංශ ශක්තිමත් කරන්නේ නැති වුණොත් විශේෂයෙන්ම කෘෂිකාර්මික සංවර්ධනයේදී අපට ගැටලු රාශියක් ඇති වෙනවා. මේකෙදී අපි කවුරුත්. පිළිගන්නවා. පසු ගිය වසර 25ක 30ක අත් දැකීම් ගත්තාම මේ රටේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ කඩාවැටීමක් තිබෙන බව. කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ හිටපු නිලධාරීන් වෙනත් රැකියාවලට යෙදවීම, කෘෂිකර්ම ව්‍යාප්ති සේවයට තිබුණු සම්පත් වෙනස් කිරීම, රාජ්‍ය අංශයේ තිබුණු දේවල් පෞද්ගලික අංශයට අලෙවි කිරීම - විකිණීම - යන මේ කියන කරුණු තුළ ව්‍යාප්ති සේවයේ කඩා වැටීමක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් මාසයටම දවස් 10යි එළියට යන්නේ. අනික් දවස්වල office එකේ.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ඔව්. ඔය කියන්නේ,-

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ව්‍යාප්ති නිලධාරීන් යන්නේ දවස් 10යි.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

නැහැ, ඔය කියන්නේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරු.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ව්‍යාප්ති නිලධාරීන්.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ව්‍යාප්ති නිලධාරීන් සුළු ප්‍රමාණයයි ඉන්නේ. ඒ ගොල්ලන්ට විශාල වැඩ කොටසක් තිබෙනවා. ඒක නිසා අපි ලබන වර්ෂයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට වාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අලුතින් නිලධාරීන්, සේවකයින් රාශියක් බඳවා ගන්නට දැනටමත් අයදුම් පත් කැඳවා තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඒකාබද්ධතාවක් නැද්ද, වගා වැඩ පිළිවෙළේ?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

සම්පූර්ණ ඒකාබද්ධතාවයකින් වැඩ කරන්නේ. මම ඉතාම සතුටු වෙනවා. මොකද, පළාත් සභාව තමයි කෘෂිකර්ම ව්‍යාප්ති සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සම්පූර්ණ බලය දීලා තිබෙන තැන. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධන, පළාත් සභා. ඒක නිසා අපි කෘෂිකර්ම කටයුතුවලදී පළාත් සභාවල සිටින කෘෂිකර්ම ඇමතිවරුන් සහ ඒ නිලධාරීන් සමඟ කටයුතු කරලා තමයි මේ දියුණුව අපට ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒක නිසායි, මම මුලින්ම කථා කරන විට පළාත් සභාවල කෘෂිකර්ම ඇමතිවරුන්ට සහ ඒ නිලධාරීන්ට ස්තුති කළේ. මේ වැඩ පිළිවෙළේදී දී තිබෙන දායකත්වය සම්බන්ධයෙන්, ඒ වාගේම අපි ආරම්භ කළ, පසු ගිය කාලයේ වසා දමා තිබුණු වී අලෙවි මණ්ඩලය නැවත පිහිට වන්න අපට පුළුවන්කම ලැබුණා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

ගරු ඇමතිතුමනි, පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. පළාත් සභාවට අයිති මේ විෂයය පිළිබඳව පසු විපරමක් තමුන්නාන්සේලා අද වන තුරු කර තිබෙනවාද? ඒ කියන්නේ ඒක සාර්ථක ද අසාර්ථක ද කියලා.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

නැහැ, නැහැ. අඩු පාඩුකම් ඇති. නමුත් අපි කර තිබෙනවා. විශේෂයෙන් මම කියන්න ඕනෑ, පළාත් කෘෂිකර්ම ඇමතිවරුන්, නිලධාරීන්, අපේ අමාත්‍යාංශ නිලධාරීන් අඩුම වශයෙන් අපි මාස තුනකට වරක්වත් රැස් වෙන බව. අපි දෙ ගොල්ලෝම ඒක ජාතික වැඩ පිළිවෙළකින් යන්නේ. අපි මාස් පතා සාකච්ඡා කර කර ඉඳලා හරි යන්නේ නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මාස තුනක් කියන්නේ කන්නයක් ඉවරයි.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

මාස් පතා එකතු වෙලා තෙල් පෙට්‍රල් පුච්චන එක නොවෙයි තිබෙන්නේ. අපි මාස තුනකට වරක් හමු වුණාම හොඳටම ඇති.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඇමතිතුමා, ඔබතුමාගේ නිලධාරීන්ට කියන්න පළාතට යන්න කියලා. ඒ නිලධාරීන් කොළඹට එන්න නොවෙයි. මම මේ කියන්නේ ප්‍රධාන ඇමති කෙනෙක් විධියට වැඩ කරලා ලැබූ අත්දැකීම් තුළින්. ඒ අයට ඒ පළාතට යන්න කියන්න.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ඒ නිලධාරීන් යනවා. නමුත් මේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ තත්ත්වය තදින් බලපා තිබෙනවා. පළාත් සභාවලත්, ඒ වාගේම අපේ අමාත්‍යාංශයට අයිති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙත් නිලධාරීන්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ තත්ත්වය බලපා තිබෙනවා. ඒක නිසායි මම කිව්වේ ලබන වර්ෂයේ බඳවා ගැනීම් කරනවා. ඒ තුළ අපට මීට වඩා ඉස්සරහට යන්න පුළුවන්ය කියලා. ඒවාගේම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන 545ක් වැඩි දියුණු කිරීම සඳහා අපි කටයුතු කරනවා. අපේ වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් කරුණු ඉදිරිපත් කළා. ඒ ගැන මා එතුමාට ස්තුතිවන්ත. වෙනවා. විශේෂයෙන්ම අද නැගෙනහිර තියෙන සංවර්ධනය වාගේම දකුණේ තියෙන සංවර්ධනය වාගේම උතුරු ප්‍රදේශයේ සංවර්ධනයක් ලබන වර්ෂයේ ඉඳලා කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළත් කරන්නට රජය විදියට අපට පුළුවන්කමක් ලැබෙයි කියලා අපි තුළ දැඩි විශ්වාසයක් තිබෙනවා. අපට ඒ ප්‍රදේශවලට නිලධාරීන් යවන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. එවැනි අඩු පාඩුකම් තිබුණා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ තුළ අද අපේ ආරක්ෂක හමුදා ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරනවා. විශේෂයෙන්ම ආරක්ෂක හමුදා ජීවිත පරිත්‍යාගයෙන් කරන ඒ කාර්යය ජාතික විමුක්ති අරගලයක්ය කියලා අපට කියන්නට පුළුවන්. අප ඒ තුළ ලබා ගෙන තිබෙන ජයග්‍රහණත් එක්ක ලබන වර්ෂයේ ඉඳලා, අපේ රටේ නැගෙනහිර ප්‍රදේශයේ, දකුණු ප්‍රදේශයේ කරන සංවර්ධනය අනිවාර්යයෙන්ම අපට උතුරෙත් කරන්නට පුළුවන් වෙයි. ඒ නිසා මේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළත් ඒ තිබෙන අඩු පාඩුකම් සම්පූර්ණ කරලා ඒ කටයුතු ඉෂ්ට කරනවාය කියන එක මා විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ලබන වර්ෂයේ ගොවි ජන සංවර්ධන නව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. අද උදේ සභාව ආරම්භ වුණු වෙලාවේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් යම් යම් ප්‍රශ්න ඉදිරිපත් කළා. ගොවිජන සංවර්ධන පනතේ රෙගුලාසි; නීතිරීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තිබෙන අඩු පාඩුකම් ගැන, කෘෂි විනිශ්චය සභාවල ක්‍රියාකාරිත්වයක් නැතිකම ගැන, විශේෂයෙන්ම අද ගොවියා සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න ගැන ඔවුන් සඳහන්කර සිටියා. ඒක නිසා අපි සකස් කර තිබෙන නව පනත් කෙටුම්පත දැනට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවලා තිබෙනවා. එය ලැබුණාට පස්සේ නීතිපති දෙපාර්තමේන්තුවට යවලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා විශේෂයෙන්ම ලබන අප්‍රේල් මාසයට පෙර පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව හරහා නව ගොවිජන සංවර්ධන සංවර්ධන පනත් කෙටුම්පත මෙම සභාවට ඉදිරිපත් කිරීමටඅප බලාපොරොත්තු වෙනවා. ගොවිජන සංවර්ධන පනතේ තිබෙන අඩු පාඩුකම් රාශියක් ඒ තුළින් මහ හැරෙනවා. ඒක නිසා මේ රටේ ගොවි ජනතාවට කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ වඩාත් පුළුල් වූ කාර්යයක් ඉටු කරන්නට නව පනත යටතේ හැකියාවක් ලැබෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම අද තිබෙන ගොවිජන සංවර්ධන පනත අනුවත් - ඒ පනතේ දැනට තිබෙන බලතල අනුවත් -වගා නොකරන ඉඩම් වගා කිරීම සඳහා බලපෑම් කරන්නට, නීතිමය ක්‍රියා මාර්ග ගන්නට සම්පූර්ණ බලතල තිබෙනවා. මේ සම්බන්ධයෙන් අදාළ ගැසට් නිවේදනය අපි දැන් නිකුත් කරලා තිබෙනවා. මේ රටේ වගා කිරීමට සුදුසු ඉඩම් වගා කරන්නේ නැතිව තිබෙනවා නම්, එම ඉඩම් අන් අයට වගා කිරීම සඳහා දීමට මේ පනත යටතේ බලතල තිබෙනවා. විශේෂයෙන්ම 2009 වර්ෂයේ මේ දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුමත් එක්ක අපි බලාපොරොත්තු වන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා, යම් කිසි ඉඩමක් වගා කරන්නේ නැතිව තිබෙනවා නම් ඒ ඉඩම වගා කිරීම සඳහා වෙනත් අයට දීමට කටයුතු කරනවාය කියන එක අපි පැහැදිලිවම කියන්නට ඕනෑ. අද රාජ්‍ය අංශයේ වාගේම පෞද්ගලික අංශයේ ඉඩම් තිබෙනවා. ඒ වාගේම වතු අංශය ගත්තාම විහාල වතු තියෙන ඉඩම් හිමියන් ඒ සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය සංවර්ධනය කරන්නේ නැහැ. ඒ නිසා ඒ සියලු ඉඩම් වගා කටයුතු සඳහා භාවිත කරන්නටයි අපි බලාපොරොත්තු වන්නේ.

අපි මොරගහකන්ද ව්‍යාපාරයේ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව සඳහන් කළා. ලබන වර්සයේ වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 7,500ක් අපට ලැබිලා තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය, ඒ වාගේම විදුලිබල අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය ඒකාබද්ධව තමයි මේ වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ මේ වැඩසටහන යටතේ මහ වැව් 32ක් ප්‍රතිසංස්කරණය කෙරෙනවා. ඇළ වේලි සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කෙරෙනවා. ඒ වාගේම මේ යටතේ මධ්‍යම ප්‍රමාණයේ වැව් 48ක් ප්‍රතිසංස්කරණය කෙරෙනවා.

ඒ වාගේම මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ ඉහළ මහ ජලාශවල, වේලිවල තිබෙන අඩු පාඩු සකස් කරලා ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු කෙරෙනවා. ඒ වාගේම ඒ අවශ්‍ය නව තාක්ෂණික උපකරණ සවි කිරීමත් මේ ව්‍යාපෘතිය යටතේ කෙරෙනවා. විශේෂයෙන්ම මේ ව්‍යාපෘතිය මේ වර්ෂයේ අපි ආරම්භ කළා. පසු ගිය අගෝස්තු 14 වන දා පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රයෙන් තමයි අතිගරු ජනාධිපතිතුමා මේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කළේ. ඒ ආරම්භ කරපු වැඩසටහන යටතේ ලබන වර්ෂය තුළදී, විශේෂයෙන්ම ඒ ලැබිලා තිබෙන ප්‍රතිපාදනත් එක්ක කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව මේ රටේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ පුළුල් වැඩ කොටසක් කරන්නට අපට පුළුවන්කම ලැබෙනවා. අද මේ වැය ශීර්ෂය තුළ සාකච්ඡාවට භාජන වූ කරුණුත් සැලකිල්ලට අරගෙන ඉදිරියේදී අපි මේ ජාතික සංවර්ධනය තුළ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පැහැදිලි පරිවර්තනයක් ඇති කරනවා. එයින් නවෝදයක් ඇති වෙනවා. "දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම" වැඩ සටහන යටතේ අප බලාපොරොත්තු වුණු ඉලක්ක කරා අපට පැහැදිලිවම යන්නට පුළුවන්.

මට මේ කටයුතුවලදී සහයෝගය දුන් මගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සිට අමාත්‍යාංශයේ සියලු කාර්ය මණ්ඩලයටත්, ඒ වාගේම සියලුම ආයතනවල දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ඇතුළු ඒ සියලු කාර්ය මණ්ඩලවලටත්, ඒ වාගේම මේ රටේ ගොවි ජනතාව ප්‍රමුඛ සියලු දෙනාටත්, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛව සහයෝගය දක්වන අනෙකුත් සියලු අමාත්‍යාංශවලටත්, පළාත් සභාවලටත්, විපක්ෂයටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු එස්. කේ. සුබසිංහ මන්ත්‍රීතුමා.

[පූ. භා. 11. 54]

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය වැය විවාදය පුරාම දිගටම ආණ්ඩු පක්ෂයෙන් විරුද්ධ පක්ෂයට එල්ල කළ එක විවේචනයක් තමයි සාම්ප්‍රදායික ලෙස අය වැය විවේචනය කරනවාය කියන එක. විරුද්ධ පාර්ශ්වය හැම දාම කරනවා වාගේ සාම්ප්‍රදායික අය වැය විවේචනයක් කරන්නේ, එම විවේචන පදනම් විරහිතයි කියන එකයි ආණ්ඩුව පැත්තෙන් පසු ගිය දින කිහිපය පුරාම ප්‍රකාශයට පත් වුණේ. එහෙනම් මෙ වර අය වැය ගැන සලකා බලන විට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අය වැය ඇස්තමේන්තුව තුළ ඉදිරිපත් කර තිබෙන ප්‍රතිපාදන වෙන් කිරීම් ඇතුළු සියල්ලක්ම සොයා බලා හදාරා බැලීමෙනුත්, ඊළඟට පසු ගිය දිනවල මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2008 අවුරුද්දේ ප්‍රගතිය සහ 2009 වසරේ ඉලක්ක පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය ඉදිරිපත් කර තිබෙන තොරතුරු සියල්ලක්ම හැදෑරීමෙනුත් තමයි අපට විවේචන ඉදිරිපත් කරන්නට වෙලා තිබෙන්නේ; අය වැය පිළිබඳව විවරණයක් කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය ඉතා වැදගත් අමාත්‍යාංශයක්ය කියා අප හැමෝම කියනවා. රටේ නිෂ්පාදනයට අදාළ වුණු අමාත්‍යාංශ කිහිපය අතරින් ජාතික නිෂ්පාදනයේ අතිවිශාල පංගුවක් හිමි කර ගත් අමාත්‍යාංශයක් බවට මෙම අමාත්‍යාංශය පත් වී තිබෙනවා. ඒ හා සම්බන්ධ අනෙකුත් අමාත්‍යාංශ වන වාරිමාර්ග සහ ඉඩම් අමාත්‍යාංශ, කෘෂිකර්ම අමාත්‍යාංශයට උදවු කරන උපකාර කරන අනෙක් අමාත්‍යාංශ දෙකයි. එම නිසා අප කරන සාකච්ඡා බැලුවොත් හරි. ඉතා වැදගත් අමාත්‍යාංශ තුනක් තමයි අද මේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කරන්නේ. හැබැයි මේ අමාත්‍යාංශ තුනම සඳහා වෙන් කර ඇති මුදල් ගත්තොත් මේ සමස්ත අය වැයෙන් සියයට පහක්වත් වෙන් වී නැහැ. සමස්ත ජාතික අය වැයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට සියයට තුනයි දශම හතක් අටක් වන ප්‍රමාණයක් වෙන් කර තිබෙන්නේ. අනෙක් අමාත්‍යාංශ දෙකත් සමඟ මේ ඔක්කොම එකතු කළාම සියයට පහක්වත් වෙන් වන්නේ නැහැ. ඉතාම අඩු මුදලක් වෙන් කර තිබෙන්නේ. අප ඉතාම වැදගත්ය කිව්වාට මේ අය වැය තුළ මේ අමාත්‍යාංශවලට ඒ කියන ප්‍රමාණයේ වැදගත්කමක් හිමි කර දී නැහැ.

ඊළඟට විපක්ෂයේ සාම්ප්‍රදායික විවේචනය පිළිබඳව ආණ්ඩුවේ විවේචනයට අප තව යමක් කියන්නට ඕනෑ. විරුද්ධ පාර්ශ්වය මේ විවේචන ගොඩ නඟන්නේ; විපක්ෂයේ අනෙක් පක්ෂ කුමක් වුවත් ජනතා විමුක්ති පෙරමුණේ අප මේ අය වැයට විවේචන ගොඩ නගන්නේ අපේ රටේ ග්‍රාමීය ජනතාව සියයට හැත්තෑදෙකක් ජීවත් වන කෘෂිකාර්මික ගොවි ප්‍රදේශ තුළ තිබෙන ඇත්ත ප්‍රශ්න පදනම් කර ගෙනයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ග්‍රාමීය ගොවි පවුල් තුළ මන්ද පෝෂණය සියයට 40කට වඩා වැඩිය කියා සෞඛ්‍ය අමාත්‍යාංශය, ලෝක සෞඛ්‍ය සංවිධානය තමන්ගේ තොරතුරු ලේඛනවල කියනවා. ඒ විතරක් නොවෙයි රටට බත සපයන, රටට කන්නට දෙන මේ ගොවි ප්‍රදේශවල තරුණ ගොවි මව්වරුන්ගෙන් සියයට 40ක් රක්ත හීනතාවෙන් පෙළෙනවා. ඒ ඉපදෙන දරුවන්ගෙන් සියයට 40කට මන්ද පෝෂණය තිබෙනවා. ගොවි ප්‍රදේශවල මහා විද්‍යාලයක හෝ වේවා, කනිෂ්ඨ විද්‍යාලයක හෝ වේවා, කුඩා විද්‍යාලයක හෝ වේවා උදේ පැවැත්වෙන රැස්වීමේදී ළමයින්ගෙන් හත් අට දෙනෙක් ක්ලාන්තය දමා වැටෙනවා. විදුහල්පතිතුමාගේ නිවේදන ටික විනාඩි 10ක් හිට ගෙන අහගෙන ඉන්න බැරි තැනට ඇදගෙන වැටිලා තිබෙනවා. උදේ රැස්වීමේ දී ඇද ගෙන වැටෙන දරු පරපුරක් බිහි වෙලා තිබෙනවා. මේවා තමයි අවුරුදු ගණනක් තිස්සේ ඉදිරිපත් වෙච්ච අය වැය පිළිබඳ විවේචනවලට පදනම් වන්නේ. මේ අය වැයට විතරක් එල්ල වන විවේචනයක් නොවෙයි. මේ විවේචනවලට පදනම් වන්නේ ඇත්තටම මේ රටේ නිර්මාණය වෙලා තිබෙන තත්ත්වයයි. මේ තත්ත්වය වෙනස් වෙමින් තිබෙනවාද? මේ තත්ත්වය වෙනස් වෙමින් තිබීම පිළිබඳව මොනවා හෝ වාර්තා වෙනවාද? නැහැ. එසේ වාර්තා වන්නේ නැහැ. උදාහරණයක් හැටියට ගත්තොත් අපේ රටේ කෘෂිකර්ම භූමි පරිභෝජනය අඩු වෙමින් තිබෙනවා. අලුත් ඉඩම් අස්වැද්දීම ගැන නොවෙයි මා මේ කියන්නේ. ගොවි ජනතාව පාවිච්චි කරමින් තිබුණු ඉඩම්; පාවිච්චි කරමින් තිබුණු කෘෂි බිම් අත් හරිමින් තිබෙනවා. මේක ඉතා බරපතළ තත්ත්වයක්. මේක ඉතා බරපතළ තත්ත්වයක්. මේක ලෝකයේම තිබෙනවා. සාපේක්ෂව අපේ රටේත් තිබෙනවා. මගේ මතකය නිවැරදි නම් පසුගිය වසර කිහිපය තුළ සියයට දොළහකින් අඩු වෙලා තිබෙනවා. මේ පිළිබඳව සොයා බලන්න, මේ පිළිබඳව කටයුතු කරන්න ගරු කෘෂිකර්ම ඇමතිතුමාට, ගරු වාරිමාර්ග ඇමතිතුමාට වගකීම තිබෙනවා. මෙන්න මේවා තමයි වීමේ විවේචනයේ පදනම බවට පත් වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන කොට මේ අය වැය විවාදය තුළ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ අපි හැමෝම සාකච්ඡා කළා, ලෝක ආර්ථික අර්බුදය පිළිබඳව. දැවැන්ත ආර්ථික අර්බුදයක් ලෝක පරිමාණයෙන් ඇති වෙලා එහි බලපෑම අපට දැනෙමින් තිබෙනවා. විවිධ විධියට අපට දැනෙමින් තිබෙනවා. ඇතැම් කාරණාවලදී ඉතා නරක ලෙස, ඉතා බරපතළ ලෙස දැනෙමින් තිබෙනවා. සමහර කාරණාවලදී තාවකාලිකව මාසයකට, දෙකකට, තුනකට අපට යහපත් ලෙස බලපාමින් තිබෙනවා. දැන් මේ යහපත් කෑල්ල අල්ල ගෙන ආණ්ඩුව පැත්තෙන් සමහර ක්‍රියා මාර්ග ගනිමින් ඉන්නවා. හැබැයි අපට ලෝක ආර්ථික අර්බුදයේ ඉතා බරපතළ, නරක දේවල් ටිකකට මේ වසර තුළ මුහුණ දෙන්න සිද්ධ වනවා. වසරේ මුල් කාර්තුව තුළ අපි මේකෙන් බේරිලා ඉඳීවි. හැබැයි තේ කර්මාන්තය, රබර් කර්මාන්තය, පොල් කර්මාන්තය, කුරුඳු කර්මාන්තය ඇතුළු අපේ අපනයන කෘෂිකර්මය පදනම් කර ගත්ත භෝග වගාවන්වලට මේ අර්බුදය දැනටමත් ඇවිල්ලා. මේ කාර්තුවෙන් පසුව අපේ අනෙක් නිෂ්පාදන ක්ෂේත්‍රවලටත් මේ අර්බුදය පටන් ගනීවි.

දැන් මේ අර්බුදය ගැන කියන කොට අපට මතකයි, පසු ගිය අය වැය විවාදවල දී, හැම දාම ආණ්ඩු පක්ෂයේ වාඩි වෙන්න බලාපොරොත්තු වන සමහර මන්ත්‍රීවරු කියපු දේවල්. ඒ කියන්නේ ඒ අය හැම දාම ආණ්ඩු පක්ෂයේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණත් ආණ්ඩු පක්ෂයේ. එහෙම නැත්නම් පොදුජන එක්සත් පෙරමුණ, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවක් පිහිටෙව්වාත් ආණ්ඩු පක්ෂයේ. විශේෂයෙන් නම් කරලා කියන්න පුළුවන්. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා අපට - ජනතා විමුක්ති පෙරමුණට - "ගේ ගෙම්බෝ", "ළිං මැඩියෝ" කියලා නම් කරලායි, ගෝලීයකරණය තමයි වැඩකාරයා,, ගෝලීය ධනවාදය තමයි ලෝකය ජයග්‍රහණය කරමින් සියලු ප්‍රශ්න විසඳා ගෙන ඉස්සරහට යන්නේ කියලා කිව්වේ. නම් කරලා කියන්න පුළුවන්. දැන් මොකද, එතුමන්ලාට වෙලා තිබෙන්නේ? ගෝලීයකරණය වර්ණනා කරමින් ඒ පෙරහැර පිළිබඳව - ගෝලීය ධනවාදයේ පෙරහැර පිළිබඳව - විස්තර ප්‍රචාරයකුයි අපට ගෙනාවේ. "ඔන්න බෙර කාරයෝ එනවා, ඔන්න කස කාරයෝ එනවා, ඔන්න නැට්ටුවෝ එනවා, බලා ගෙන ඉන්න" ය කියලායි අපට කිව්වේ. දැන් එතුමන්ලාගේ කටවල්වලින් මොකක්ද කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ? තවම එතුමන්ලාගේ කටවල්වලට වචන ආවේ නැහැ. හැබැයි එතුමන්ලාගේ මහයාලාගේ කටවල්වලට දැන් වචන ඇවිල්ලා. දැන් ඇමෙරිකාවේ ලොක්කෝ, බ්‍රිතාන්‍යයේ ලොක්කෝ, ජර්මනියෝ නායකයෝ දැන් කියමින් ඉන්නවා වැඩේ වැරදිලාය කියලා. දැන් වැඩේ වැරදිලා ආපසු අඩු තරමින් කේන්ස් ගාවට යන්න වෙලාය තිබෙන්නේ කියලා කියනවා. රාජ්‍ය මැදිහත් කර ගන්න සිද්ධ වෙලා තිබෙනවාය කියලා කියනවා. රාජ්‍ය මැදිහත් වෙලා ආර්ථිකය පාලනය කරන්න සිද්ධ වෙලා තිබෙනවාය කියලා කියනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிசதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

ගරු මන්ත්‍රීතුමනි, නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු රේණුකා හේරත් මන්ත්‍රීතුමිය මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රේණුකා හේරත් මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரேணுகா ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair*, and THE HON. (MRS.) RENUKA HERATH *tool the Chair*

**ගරු එස්. කේ. සුභසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේවැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන වේලාවේ මම කියමින් සිටියේ, මේකට බලපාන ලෝක තත්ත්වය පිළිබඳවයි; අපේ රටේ අනාගතය තීරණය වන ලෝක තත්ත්වය පිළිබඳවයි. මේ මොහොතේ මේ ලෝක තත්ත්වය පිළිබඳව ලෝකෙට ලොක්කෝ ටික කථා කළාට, මීට අවුරුදු 150කට එහා 1848 දී අර ඓතිහාසික කොමියුනිස්ට් ප්‍රකාශනය ලියමින් කාල් මාක්ස් මොකක්ද මේ ගැන කිව්වේ? මා කැමැතියි, කාල් මාක්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශනයේ ඇතුළත් එක් කොටසක් උපුටා දක්වන්න. කාල් මාක්ස් කියන ඒ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයාව නම් කළා, මේ සහශ්‍රකයේ ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා ලෙස. මේ ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා මෙන්න මෙහෙම කියනවා :

"සිය පෞරාණික වූත්, පූජනීය වූත් ප්‍රාග් විනිශ්චයන් සහ මත සහිත පාෂාණ භූත යකඩ මළ බැඳුණු සියලු සබඳතාවන් විනාශ වී යන අතර, අලුතින් ඇති වන සියලු සබඳතාවන් අස්ථිකරණයට භාජනය වීමටත් පෙර ඒවා යල් පැන යයි. ඝන වූ හැම දෙයක්ම උණු වී වාතය බවට පෙරළෙයි. ශුද්ධ වූ හැම දෙයක්ම කෙලෙසෙන්නේය. අවසානයේ දී මිනිසාට තම ජීවන තත්ත්වයන් සහ තම වර්ගයා සමඟ ඇති අන්‍යෝන්‍ය සබඳතාවන් දෙස සන්සුන් සිතින් බැලීමට අත්‍යවශ්‍යතාවක් ඇති වේ."

අද ලෝක ධනපති ක්‍රමයට සිදු වෙලා තිබෙන්නේ මෙන්න මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ධනවාදය දේශනා කර ගෙන, ගෝලීයකරණය දේශනා කර ගෙන, ගෝලීය ආර්ථිකය පිළිබඳව මහා පුරාජේරු කථා කියපු ධනවාදී ආර්ථිකයේ ලොක්කන්ට සිදු වෙලා තිබෙනවා තමන් මෙතෙක් කාලයක් ගෙනාපු ආර්ථික ක්‍රමය තුළ  මොකක්ද සිදු වෙලා තිබෙන්නේ කියලා ආපසු සන්සුන් සිතින් හැරිලා බලන්නට සිදු වෙලා තිබෙනවා. අද තිබෙන සෑම ආර්ථික සම්මේලනයකදීම ඔවුන්ට පියවරෙන් පියවර අඩිය පස්සට ගෙන සාකච්ඡා කරන්නට සිදු වෙලා තිබෙනවා, තමන් මෙතෙක් කාලයක් ගත් ක්‍රියා මාර්ග වැරැදියි කියන එක පිළිබඳව. ඇයි ඒ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝකයේ කුමක් නිෂ්පාදනය කළත්, කොහොම නිෂ්පාදනය කළත් මේකේ පිරමීඩ් එකක් තිබෙනවා. මේ පිරමීඩයේ පදනමක් තිබෙනවා. මේ පදනමේ තමයි මහා දැවැන්ත පාරිභෝගිකයකු සිටින්නේ. මේ ආර්ථික පිරමීඩයේ පතුලේම තිබෙනවා. දැවැන්ත පදනමක්. ඒ තමයි ලෝක වාසී දුප්පත් ජනතාව. උඩ සිටින මිනිස්සු මොනවා හැදුවත්, හදලා වෙළෙඳ පොළට දැම්මත් මේ ලෝක වාසී දුප්පත් ජනතාව ඒක මිල දී ගත්තොත් විතරයි ඒ නිෂ්පාදන ක්‍රියාවලිය ඉස්සරහට දුවන්නේ. අද ලෝකයේ සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? අද ලෝකය පිළිගන්නේ මොකක්ද? අද ලෝකයේ සිදු වෙලා තිබෙන දෙය මේකයි. මෙන්න මේ මිල දී ගැනීමේ පිරමීඩ එකේ, පාරිභෝගික පිරමිඩ් එකේ පහළම, පතුලේම සිටින අර කෝටි සංඛ්‍යාත ජනතාවට මිල දී ගැනීමේ හැකියාවක් නැහැ. ඔවුන්ගේ මිල දී ගැනීමේ හැකියාව  බිඳ වැටිලායි තිබෙන්නේ. ඒ බිඳ වැටීම ඉස්සරහ මොකක්ද සිදු වෙලා තිබෙන්නේ?

පසු ගිය කාලයේ විවිධ ආර්ථික න්‍යායන් ඇවිල්ලා ආර්ථිකයන් පුම්බමින් සිටියා. ඇමෙරිකාවේ. ආර්ථිකය පුම්බමින් සිටියේ නිවාස වෙළෙඳ පොළවල්. නිවාසයක් හදන කොට ඒ නිවාසය වටේ කැරකැවෙන ආයතන ගොඩක් තිබෙනවා. ඒකෙන් ජීවත් වන ආයතන ගොඩක් තිබෙනවා. එක මුදල් ප්‍රවාහයයි වැය වන්නේ. ඒ මුදල් ප්‍රවාහයේ ප්‍රයෝජනය ගනිමින් රක්ෂණ සමාගම්, තැරැව්කරුවෝ, බැංකු, වෙනත් පහසුකම් සපයන්නෝ මේ එක ගේ වටේ කැරැකි, කැරැකි සිටිනවා. කෘතිම ආර්ථිකයක් නිර්මාණය වෙනවා. හැබැයි මේ කෘතිම ආර්ථිකය අවසාන වන්නේ ඒ ගෙය මිල දී ගන්නා පාරිභෝගිකයා මතයි. ඒ පාරිභෝගිකයාගේ හැකියාව මතයි. ඒ පාරිභෝගිකයාගේ හැකියාව බිඳ වැටුණාට පසුව සිදු වන්නේ මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? ඒ හැකියාව බිඳ වැටුණු ගමන් අර කෘත්‍රිමව නිර්මාණය වෙලා තිබුණු ආර්ථිකයේ අනෙක් අංග උපාංග සියල්ලම බිඳ වැටෙනවා. මේක තමයි අද ධනවාදී ලෝකය මුහුණු දෙමින් සිටින ඇත්ත තත්ත්වය. ඉතින් ඒ නිසා මෙන්න මේ මම කිව්ව අර මිල දී ගැනීමේ පිරමිඩයේ පහළම සිටින පුරවැසියාගේ ක්‍රය ශක්තිය බිඳ වැටුණායින් පසුව, මිල දී ගැනීමේ හැකියාව බිඳ වැටුණායින් පසුව ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා ගෙන වැටෙනවා, මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඉතින් ලෝකයේ සියයට 70ක් සිටින්නේ ග්‍රාමීය ජනතාවයි. අපේ රටේ සියයට 72ක් සිටින්නේ ග්‍රාමීය ගොවි ජනතාවයි. අර මිල දී ගැනීමේ පිරමීඩයේ පතුලේ ස්තරයේ සිටින මේ බහුතරයක් ජනතාව වන ගොවියාගේ, කම්කරුවාගේ, කුඩා කර්මාන්තකරුවාගේ මේ සියලු දෙනාගේම මිල දී ගැනීමේ හැකියාව බිඳ  වැටීමේ ප්‍රතිඵලයට අද අපි ලෝකය විධයට මුහුණ දෙමින් සිටිනවා.

1996 දී පවත්වපු ලෝක ආහාර සමුළුවේදී පිළිගෙන තිබෙනවා, නවීන කෘෂිකර්මයට, විශේෂයෙන්ම 1960 ගණන්වල ආපු හරිත විප්ලවය නමින් ඉදිරිපත් වුණු නවීන කෘෂිකර්මයට ලෝකයේ සාගින්න තුරන් කරන්නට බැරි වෙලා තිබෙනවාය කියන එක. තවදුරටත් ලෝකයේ වැඩ කරන ජනතාවට අවශ්‍ය කරන ආහාර නිෂ්පාදනය කරන්නට පුළුවන්කමක් නැහැයි කියාලා 1996 ලෝක ආහාර සමුළුවේ දී පිළිගෙන තිබෙනවා. ඒ කියන්නේ ආර්ථික න්‍යායන් කොච්චර ආවත් අවසානයේ පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා, රටේ නිපද වනු ලබන දේවල් ජනතාව අතරේ බෙදී යන්නේ නැත්නම් ගෝලීය ආර්ථිකයට එහෙම නැත්නම් මාග්‍රට් තැචර් මැතිනිය විශේෂයෙන්ම ලෝකයට අවධාරණය කරපු ඉදිරිපත් කරපු ආර්ථික න්‍යායට මේක කරන්න බැරි වෙලා තිබෙන බව. හැබැයි මේක ඇතුළේ ලංකාව සම්බන්ධයෙන් විශේෂයක් තිබෙනවා. වෙනත් රටවල විවිධ හේතු තිබෙනවා, කෘෂි කාර්මික නිෂ්පාදනය බිඳ වැටෙන්න. මා උදාහරණයක් කියන්නම්. කෙන්යාව ලෝකයට විශාල කෘෂි කාර්මික නිෂ්පාදනයක් දෙමින් හිටපු රටක්. එහි විශාල වශයෙන් අභ්‍යන්තර යුද ගැටුම් ඇති වුණා. මුළු කෙන්යාවේම කෘෂි කාර්මාන්තය කඩා වැටෙන තරමටම ගෝත්‍රවාදී යුද ගැටුම් මතු වුණා. ඒ නිසා කෙන්යාවේ කෘෂි කර්මාන්තය බිඳ වැටුණා, ජාතික නිෂ්පාදනය බිඳ වැටුණා. ඒ වාගේම, තවත් රටවල කෘෂි කාර්මික නිෂ්පාදනය ජීව ඉන්ධන භාවිතය සඳහා ගොදුරු කර ගනිමින් ඉන්නවා. ලෝකයේ බොහෝ රටවල අද කෘෂි කාර්මික වශයෙන් ධානය වර්ග වගා කරනවා. ඉරිඟු, තිරිඟු ආදී වශයෙන් එන මේ ධාන්‍ය නිෂ්පාදනය ජීව ඉන්ධන නිෂ්පාදනයට හසු කර ගනිමින් ඉන්නවා. මේ නිසා බොහෝ රටවල ආහාර සඳහා පාවිච්චි කිරීමට තිබෙන ආහාර ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. හැබැයි ලංකාව සම්බන්ධයෙන් මේ එකක්වත් සාධාරණ වන්නේ නැහැ. ලංකාව සම්බන්ධයෙන් තිබෙන්නේ සැලසුමක් නැතිකම, අකාර්යක්ෂමතාව, හිතා මතා වැඩ නොකිරීම වාගේ දේවල්.

අනෙක් අතට අද ලෝකයේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ආහාර හිඟයම පමණක් නොවෙයි. ආහාර හිඟයකුත් තිබෙනවා. හැබැයි ආහාර හිඟයම පමණක් නොවෙයි අද ලෝකයේ ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙන්නේ. නිපද වන ආහාර ටික පවා හරි හැටි බෙදී නොයෑමේ බරපතළ ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. නිපද වන දේ හරි හැටි බෙදා ගන්න බැරිකම පිළිබඳ ප්‍රශ්නය විසඳන්න කේන්ස්ටත් බැහැ, තැචර්ටත් බැහැ. ඒ දෙන්නාටම ඒක කරන්න බැහැ.

මේ අය වැය ජාතික ආර්ථිකය ගොඩ නඟන අය වැයක් කියා තමයි දිගටම කියවමින් ඉන්නේ. මස් රාත්තල ඉල්ලා ගෙන ගිය මහත්තයෙක් ඊයේ පෙරේදා රූපවාහිනියේ පෙනී ඉඳලා කියනවා, මේ අය වැය ජාතික ආර්ථිකය දෙසට මුහුණලා සිට ගෙන සිනා සෙන අය වැයක්ය කියා. දැන් එතුමන්ලාට සිද්ධ වෙලා තිබෙන්නේ අර වානාන්තරයේ සතුන්ගේ නායකයා තෑගි දෙන්න ආරාධනා කරලා තෑගි ගන්න ගිය වවුලාට වුණු දේයි. වවුලා කියා කියන්නේ පිල් මාරු කරන සතෙක්. මූලාසනාරූඪ ගරු මනිත්‍රීතුමියනි,වවුලා කියන සතාට තෑගි විධියට හම්බ වෙලා තිබෙන්නේ සරමක්. දැන් එතුමන්ලාට වෙලා තිබෙන්නේ වවුලාට සරම හම්බ වුණා වාගේ වැඩක්. දන්නවා නේ, වවුලාට සරම හම්බු වුණාම මොකද වන්නේ කියා. වවුලා කෑ ගහලා ඇඬුවා ලු, "අනේ මට මේක නම් එපාය" කියා. දැන් කියනවා, මේක ජාතික ආර්ථිකයට මුහුණ දාලා හිට ගෙන ඉන්න අය වැයක්ය කියා. ඇත්තටම ඒකද මේ අය වැය සම්බන්ධයෙන් විග්‍රහය? මා කැමැතියි-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසානයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
මට තව විනාඩි දහයක් ලැබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ කාගෙන්ද?

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
අපේ ජයන්ත විජේසේකර මන්ත්‍රීතුමා විනාඩි දහයක් දෙනවා කිව්වා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතුමා විනාඩි දහයක් දෙනවාද? හරි. එහෙම නම් කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු එස්. කේ. සුභසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
පැයක්? ඇති තරම් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An hon. Member)
ඔබතුමාට දර්ශනය පිළිබඳ පාඩමක් උගන්වන්න හිතිලා. [බාධා කිරීමක්]

**ගරු ජයන්ත විජේසේකර මහතා**
(மாண்புமிகு ஜயந்த விஜேசேகர)
(The Hon. Jayantha Wijesekara)
අනික් ඒවා ඔක්කෝම කඩා වැටිලා නේ.

**ගරු එස්. කේ. සුභසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
ඒ විවාදයට යන්න ඕනෑ නැහැ. අපි කථා කරමු. [බාධා කිරීමක්] ඉතින් රුසියාව ගියා නේ ඔබතුමන්ලා කියන ධනවාදී ක්‍රමයට. ඒකයි සිද්ධ වුණේ. ඒකයි අපි මේ කියන්නේ. අර තිබුණු ක්‍රමයට ගියා නම් වැඩේ යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමහරු මේකට ජාතික ආර්ථිකය පිළිගත්ත අය වැයක්ය කියා කිව්වාට අපට එහෙම කියන්න බැහැ. අපි මේ අය වැය ගැන මොකක්ද කියන්නේ? අපි කියනවා මෙන්න මෙහෙම. මේක හරියට මස් කඬේ මුදලාලිගේ ලොරිය වාගේ අය වැයක්. ජනාධිපතිතුමා මෙවර ඉදිරිපත් කරපු අය වැය මස් කඬේ මුදලාලිගේ ලොරිය වාගේ අය වැයක්. ඇයි ඒ? මස් කඬේ මුදලාලිගේ ලොරියේ ඉස්සරහ ගහලා තිබෙනවා "බුදු සරණයි" කියා. එහෙම නැත්නම් "දෙවි පිහිටයි" කියා. එහෙමත් නැත්නම් "ජය ශ්‍රී " කියා. "බුදු සරණයි" කියලා ඉස්සරහින් ගහ ගෙන මස් කඬේ මුදලාලිගේ ලොරිය යනවා. හැබැයි, ඇතුළේ කවුද යන්නේ? ඇතුළේ යන්නේ හොර හරක්. මේ අය වැය එහෙම අය වැයක්. ඇයි අපි එහෙම කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහෙම කියන්න හේතුව මේකයි. විශේෂයෙන්ම ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාටත් මේ ප්‍රශ්නය බලපානවා. මේ ප්‍රශ්නය පිළිබඳව අය වැය ඇස්තමේන්තුව තුළින් විග්‍රහ කරන්න පුළුවන්ද කියා මා දන්නේ නැහැ. ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කර තිබෙන ලිපි ලේඛන තුළින් මෙය විග්‍රහ කරන්න පුළුවන්ද කියා මට තේරෙන්නේ නැහැ. 2007 සහ 2008 වසර සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයට මුදල් වෙන් කිරීම සංසන්දනය කර බලන කොට 2008ට අදාළව වැඩි වීම සියයට 90යි. මේ අය වැය ඇස්තමේන්තුව අනුව, හැබැයි, මේ අය වැයෙන් ලොකු පියවරක් තබනවාය කියා ඔබතුමා කියද්දී, ලොකු පියවරක් තබනවාය කියා ජාතික පරිමාණයෙන් ලොකු ප්‍රචාරයක් දීලා තිබෙද්දී, එහෙම අවශ්‍යතාවකුත් ජාතික මට්ටමින් මතු වෙලා තිබෙද්දී ඔබතුමාගේ අමාත්‍යාංශයට මේ අය වැයෙන් වැඩි කර තිබෙන්නේ සියයට 10ක් විතරයි. ඒ කියන්නේ, 2008 ට සාපේක්ෂව 2009 දී වැඩි කර ඇති ප්‍රමාණය සියයට 10යි. හරිද?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
හරි.

**ගරු එස්. කේ. සුභසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික ආර්ථිකය ගොඩ නඟන අය වැයක් බවට මේ අය වැය පත් වන්නේ කොහොමද? ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යා ලේඛන මත මේක විග්‍රහ කරන්න බැහැ කියා මා කිව්වේ ඒකයි. මේක විග්‍රහකර ගන්න දේශපාලනයත් ඕනෑ වෙයි. මේ ආණ්ඩුව ඇතුළේ ක්‍රියාත්මක වන දේශපාලන ක්‍රියාදාමය පිළිබඳව සාකච්ඡාවක් මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට ඕනෑ වේවි. ඔබතුමා අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිතුමා. අප අතර දේශපාලන ගැටුම් තිබෙනවා. අපි අතරේ තිබෙන දේශපාලන ගැටුම් මොනවා වුණත් ඔබතුමාගේ අමාත්‍යාංශය රටේ ආර්ථිකය ගොඩ නඟන ඉතා බරපතල වගකීමක් තිබෙන ඉතා වැදගත් අමාත්‍යාංශයක්. හේම කුමාර නානායක්කාර මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා ආණ්ඩුව පැත්තට ගිහිල්ලා ලොකු වැඩ කොටසක් කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ. එතුමා එදා මන්ත්‍රීතුමා; අද ඇමතිතුමා. ලොකු වැඩ කොටසක් ඉටු කරන බලාපොරොත්තුවෙන් තමයි එතුමා ආණ්ඩුවට ගියේ. හැබැයි, දැන් ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කුමක් කිව්වත් මේ අය වැය ඇස්තමේන්තුව තුළ 2007 සහ 2008 වසර අතර ඇති සියයට අනුවක නැග්මට සාපේක්ෂව 2009 දී වැඩි කරලා තිබෙන්නේ සියයට 10යි. උද්ධමනයට සාපේක්ෂව ගත්තාම මේ වැඩි කිරීමත් වැඩි කිරීමක් නොවෙයි.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Hemakumara Nanayakkara-Minister of Agriculture)
ගරු මන්ත්‍රීතුමනි, කෙටි පැහැදිලි කිරීමකට අවසර දෙනවාද?

**ගරු එස්. කේ. සුභසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
හොඳයි, ගරු ඇමතිතුමනි,

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon. Hemakumara Nanayakkara)
ගරු මන්ත්‍රීතුමනි, 2008 අය වැයෙන් යෝධ වැඩි කිරීමක් කරලා, යෝධ සංවර්ධන කටයුත්තකට ඒ මුදල් යොදවා තිබෙනවා. ගිය වර වැඩි කළේ විශාල මුදල්. ඔබතුමන්ලා දන්නා ආකාරයට යුද්ධය පවතින රටක 2008 දී වෙන් කළ විශාල මුදලට අමතරව 2009 වර්ෂය සඳහා තවත් සියයට දහයක් එකතු කිරීම හොඳ නැද්ද, හොඳද?

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
ගරු හේමකුමාර නානායක්කාර ඇමතිතුමනි, ඒක හොඳයි. අපි කියන්නේ රටේ තිබෙන අභියෝගයට සාපේක්ෂව සහ අපේ රට තුළ සිද්ධ වෙලා තිබෙන උද්ධමනයට සාපේක්ෂව මේ සියයට දහය දැනෙන්නේවත් නැහැයි කියායි. මේක වැඩි වීමක් බවට පත් වන්නේ නැහැ. ලෝක ආර්ථිකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය මේකට බලපානවා. දේශීය වශයෙන් ඇති වෙලා තිබෙන උද්ධමනය මේකට බලපානවා.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)
ඔබතුමා කියන කාරණයේ එක පැත්තක් තිබෙනවා. මා කියන්නේ මේකයි. ගිය වර වී මෙට්‍රික් ටොන් මිලියන 3.8ක් නිෂ්පාදනය කළා. මේ සැරේ, - [බාධා කිරීමක්]

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
අපිට ඔය වාගේ හොඳ ලූනු කෑලි ටිකක්, හොඳ මිරිස් කෑලි ටිකක් හොයා ගන්න බැරි වන එකක් නැහැ මේ "ඔම්ලට්" එකේ. හැබැයි, "ඔම්ලට්" එකට දමලා තිබෙන බිත්තරය කුණු වෙච්ච එකක්. ඒකයි මේ කියන්නේ. ඔය වාගේ හොඳ ලූනු කෑලි, තක්කාලි කෑලි, මිරිස් කෑලි මේකේ ඇති. මා පිළිගන්නවා ඔබතුමා කියන එක. එහෙම ඒවා හොයා ගන්න පුළුවන්. එහෙම ඒවා මේකේ තිබෙනවා. හැබැයි මුළු "ඔම්ලට්" එකම හදලා තිබෙන්නේ කුණු වෙච්ච බිත්තරයකින්. ඒකයි ප්‍රශ්නය. මා ඒක කියනවා. මා ඒක ඔප්පු කරනවා.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)
හොඳයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
තොරතුරු ආශ්‍රිතව, සංඛ්‍යා ලේඛන ආශ්‍රිතව ඔප්පු කරනවා. "අපි වවමු - රට නඟමු" කියන නිෂ්පාදන ඉහළ නැංවීමේ වැඩ පිළිවෙළ ගනිමු. ගරු ඇමතිතුමා ඒ පිළිබඳව ලොකු බලාපොරොත්තුවකින් තමයි දැන් කථා කළේ. "අපි වවමු - රට නඟමු" වැඩ පිළිවෙළ පිළිබඳව 2008 ප්‍රගතිය හා 2009 වැඩසටහන යනුවෙන් ඉදිරි ඉලක්කය සහ බලාපොරොත්තුව සඳහන් කරමින් මේ පොතේ හතර වැනි පිටුවේ ඔබතුමන්ලා වගුවක් පෙන්නුම් කර තිබෙනවා. මේ වගුවෙන් මොකක්ද කියන්නේ? මේ වගුවේ කුරක්කන්, බී ලූනු, රතුලූනු, මුං ඇට, උඳු, රට කජු, සෝයාබෝංචි, මිරිස්, අර්තාපල් වැනි භෝග පිළිබඳව සඳහන් කර තිබෙනවා. ඒ භෝග වගා කිරීම සඳහා ඉලක්ක කළ භූමි ප්‍රමාණය ගැනයි ඒ වගුවෙන් කියන්නේ. භෝග වර්ග තුනකට අදාළව පමණයි ඒ ඉලක්ක සපුරා ගෙන තිබෙන්නේ. ඔබතුමා කියන විධියට වී බේරිලා තිබෙනවා. භෝග වර්ග තුනක් හැර අනික් සියලුම භෝග වර්ග නිෂ්පාදනය ආපස්සට ගිහින් තිබෙනවා. මේ වගුව අනුව, ඔබතුමාට ඕනෑ නම් මා මේ වගුව කියවන්නම්.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ආපස්සට ගිහින් නැහැ. ජාතික නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
මේ පොතේ තිබෙනවා. මා දන්නේ නැහැ. එහෙම නම් පොත වැරැදි ඇති.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පොත හරි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
පොත වැරැදි බව වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ පොතෙන් පෙන්වන්නම්. මේ පොත්වල ලොකු වැරැදි තිබෙනවා. මේ වගුවේ තිබෙන හැටියට අර්තාපල්වල ඉලක්කය හෙක්ටයාර් 3,808යි; ප්‍රගතිය හෙක්ටයාර් 2.137යි. මේ අවුරුද්දේ ඉතිරි මාසයේ ආයෙත් වවන්න කාලයක් නැහැ නේ. ඊළඟට තව උදාහරණයක් කියන්නම්. රට කජුවල ඉලක්කය හෙක්ටයාර් 5,075යි.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)
අර්තාපල්වල ප්‍රගතියක් තිබෙනවාද?

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
නැහැ නේ. මේ පොතේ තිබෙන විධියට ඉලක්කය හෙක්ටයාර් 3,808යි. නමුත් හෙක්ටයාර් 2,137යි වගා වෙලා තිබෙන්නේ.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)
ඒ කියන්නේ මුළු ප්‍රමාණය හෙක්ටයාර් 3,808න් -

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

දැන් මේ වගුවේම තිබෙනවා. අර්තාපල් සෘණ 31.55යි කියලා. මේ වගුවේ වීවලට ධන ලකුණ තිබෙනවා; බඩ ඉරිඟුවලට ධන ලකුණ තිබෙනවා. කව්පිවලට ධන ලකුණ තිබෙනවා; අනික් සියලුම භෝගවලට තිබෙන්නේ සෘණ ලකුණ.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)

ගරු මන්ත්‍රීතුමනි, මේකේ උත්සාහය මේක නේ. දසක තුනක්, හතරක් පුරා පිට රටින් කෑම ගෙනැවිත් කාපු සංස්කෘතිය වෙනස් කරලා -

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

ඒක හොඳයි. ඒක හරි. ඒකට අපි අත උස්සනවා නේ.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)

සමාවන්න. මා මේ කාරණය විතරයි කියන්නේ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

මට වෙලාව නැහැ.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon. Hemakumara Nanayakkara)

සමා වන්න. මා කෙටියෙන් මේ කාරණය කියන්නේ. බාධා කිරීමක් කරනවා නොවෙයි. ඒ තත්ත්වය වෙනස් කරලා වසර 2010 වන විට තෝරා ගත් භෝග වර්ග 36ක් ගෙන්වීම නවත්වන්න කටයුතු කරනවා. මේ සෘණ ලකුණ තිබෙන භෝග වර්ග ධන ලකුණට ගෙනෙන්න තමයි කටයුතු කරන්නේ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

ඔබතුමන්ලාගෙන් වෙලාව ටිකක් මට දෙනවාද?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon. Hemakumara Nanayakkara)

හා, හොඳයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

මා මේ පිළිබඳව ඊට වඩා කථා කරන්න යන්නේ නැහැ. ඒ සඳහා ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. මේ ඉදිරිපත්කර තිබෙන සංඛ්‍යා ලේඛන නිවැරදිද, නැද්ද කියන ප්‍රශ්නය වෙනම තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් අපට දැනෙන දේ තමයි, අපි අහන දේ, අපි ප්‍රචාරක වැඩ සටහන් තුළින් දකින දේ රටේ මහ පොළොවේ සිද්ධ වන්නේ නැහැයි කියන එක. "අපි වවමු-රට නඟමු" වැඩ පිළිවෙල පිළිබඳව ඇමතිතුමාගේ බලාපොරොත්තුව කුමක් වුණත්, ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව කුමක් වුණත් ඒ වැඩ පිළිවෙළ මහ පොළොවේ, බිමේ ශක්තිමත්ව ඉදිරියට යන්නේ නැහැ. ඒක ඉතා පැහැදිලියි. ඒ පිළිබඳව පසු විපරම් කිරීමේ අඩුවක් තිබෙනවාද කියා මා දන්නේ නැහැ. ඔබතුමන්ලා මේ පිළිබඳව ඉතා හොඳින් සොයා බලන්න. මේ වැඩ පිළිවෙළ තිබෙන්නේ ප්‍රචාරාත්මක වැඩ පිළිවෙළක් මිසක් ඉන් එහාට ගිය මහ පොළොව වැලඳ ගත්, ඒක ජයග්‍රහණය කරන, නැගිට්ටවන වැඩ පිළිවෙළක් නොවෙයි. ඒ පිළිබඳව බරපතළ විවේචනයක් අපට තිබෙනවා. අපි මේ පිළිබඳව ගම් මට්ටමින්, බිම්මට්ටමින් හා ගොවතු මට්ටමින් සොයා බැලුවා. මේ පිළිබඳව අපට තිබෙන අත් දැකීම් හොඳ එකක් නොවෙයි. ඒ නිසා ඔබතුමන්ලා මේ පිළිබඳව සොයා බලන්න.

ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතට සංශෝධන ලබන වසර මුලදී ගෙනෙනවාය කියලා. ඒකට ස්තුතියි. ඒ පිළිබඳව ක්‍රියා මාර්ග ගැනීම සම්බන්ධයෙන් අපේ ස්තුතිය පළ කරනවා. හැබැයි, ඒ අතරතුර ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ මොහොත වන විට මේ ගොවිජන සංවර්ධන පනතේ ඇතැම් වගන්ති, ඇතැම් රෙගුලාසි පදනම් කර ගෙන, විශේෂයෙන්ම අපේ චමල් රාජපක්ෂ මැතිතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඳ ගොවීන්ගේ අඳ ගොවිභාවය අහෝසි කරමින් ඉන්නවා.

අද උදේ අපේ විජිත රණවීර මන්ත්‍රීතුමා ඇසූ, "අනුප්‍රාප්තිකයන් පිළිගැනීම සිද්ධ වෙලා තිබෙන්නේ කොහොමද? කියන ප්‍රශ්නයට, "කිසිවෙක් නැහැ"යි කියා තමයි ඔබතුමාගේ පිළිතුර වුණේ. මේක තමයි, අද සිද්ධ වෙමින් තිබෙන්නේ. දැන් අනුප්‍රාප්තිකයන් පිළිගන්නේත් නැහැ. ඒක රාජකාරිමය වශයෙන් සටහන් කරන්නේත් නැහැ. ඒ වෙනුවට මොකක්ද කරන්නේ? ගරු ඇමතිතුමනි, ගොවිජන සංවර්ධන පනතේ වගන්ති පාවිච්චි කරමින් ලියුම් එවමින් ඉන්නවා. මීට පෙර අපි මේ කරුණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සාකච්ඡා කළා. අද ගොවියාගේ ඊළඟ පරම්පරාවට දැන් ලියුම් එවමින් ඉන්නවා. මව අඳ ගොවියා විදියට සිට මිය ගියා නම්, ඉඩම් හිමියා විසින් අනුප්‍රාප්තිකයාට ලියුම් එවමින් ඉන්නවා, "ඔබ කුඹුරෙන් ඉවත් වන්න" කියලා. දැන් අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඉතා ඉක්මනින් -මේ සඳහා අය වැය විවාද ඉවර වන තුරු ඉන්න ඕනෑ නැහැ. ගොවිජන සංවර්ධන පනතේ, -

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

මේ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම් යොමු කරන්න. ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ පරීක්ෂණ කමිටුවක් තිබෙනවා. ඒකට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. අමාත්‍යාංශයේත් ඊට අදාළ කමිටුවක් තිබෙනවා. අපි අවශ්‍ය සහන ලබා දෙනවා.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

හොඳයි. ඒ ගැන අවධානය යොමු කිරීම ගැන ස්තුතිවන්ත වනවා. ප්‍රශ්නය තිබෙන්නේ එතැන නොවෙයි. අපට වාර්තා වන තොරතුරු කිහිපය ඔබතුමාට එවන්න පුළුවන්. හැබැයි පොදුවේ ගත්තාම වාර්තා නොවන සිදු වීම් ගොඩක් තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ නියෝගයක් මඟින්-ගැසට් එකක් මඟින්-ගොවිජන සංවර්ධන පනතේ මෙන්න මේ නියෝගය ක්‍රියාත්මක වීම වහාම අත් හිටුවීම ක්‍රියා කරන්න කියායි. හෙට සිට වුණත් ඔබතුමාට ඒක කරන්න පුළුවන්. ඒ නිසා ඔබතුමාගේ ඒ නියෝගය ඉස්සරහට ගෙනෙන්න කියායි අපි කියන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වැඩිපුර ලබා දුන් විනාඩි දහයක් අවසානයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
හොඳයි. තව විනාඩි පහකින් අවසන් කරනවා. ආණ්ඩුවෙන් වෙලාව දෙනවා කිව්වා නේ, හේමකුමාර නානායක්කාර ඇමතිතුමා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හා, හොඳයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විනාඩියක් කතා කරන්න බලාපොරොත්තු වනවා. පසු ගිය හත් වන මාසයේ ජල කළමනාකරණ පනත පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් අනුමත වුණා. තවම ඒකේ අන්තර්ගතය එළියට දමලා නැහැ.හැබැයි තවම තිබෙන්නේ පරණ පනත් කෙටුම්පතමයි. මේ රටේ ජල සම්පත ගොවියාට අහිමි කරලා, පෞද්ගලික අංශයට බිලි දීම සඳහා, බහුජාතික සමාගම්වලට බිලි දීම සඳහා මූලික අඩිතාලම දමන ජල පනතම තමයි තවම තිබෙන්නේ. පසු ගිය හත් වන මාසයේ කැබිනට් මණ්ඩලයේදී සම්මත වෙච්ච පනත් කෙටුම්පත ඔබතුමාට පුළුවන් නම් උපදේශක කාරක සභාවටවත් ඉදිරිපත් කරන්න. ඊට පසුව අපට පුළුවන් වෙයි ඒක එහෙම නොවෙයි කියා පිළිගන්න. ඔබතුමා නැහැ කිව්වාට මට පිළිගන්න බැහැ. අලුත් පනතක් සම්පාදනය වුණේ නැහැ කියන එක තමයි අපේ අදහස. පරණ එකම ගෙනෙනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
විකුණනවා කියන එකද? එහෙම වන්නේ නැහැ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
ඒ සහතිකය අපට ඕනෑ ඔබතුමාගේ කටින් නොවෙයි. පනතකින් ඕනෑ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
පනතකින් දෙන්නම්. ඒ සහතිකය අපි පනතකින් දෙන්නම්.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
පනතකින් තමයි ඒ සහතිකය ඕනෑ. වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමනි, ඊළඟට මේ කරුණත් මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමනි, මින්නේරිය වැව අසල දැනට වනජීවී දෙපාර්තමේන්තුවෙන් ඉදි කිරීමක් කර ගෙන යනවා. මේවන විට ගොවි සංවිධාන විශාල වශයෙන් මේකට විරෝධතාව ප්‍රකාශ කර තිබෙනවා. වනජීවී දෙපාර්තමේන්තුව ඒ ගොඩනැඟිල්ලේ පළමු වන තට්ටුව හදා දැන් දෙ වන තට්ටුව හදනවා. ඒක සංචාරක ප්‍රදර්ශන පොළක් බවට පත් කරන්න බලාපොරොත්තු තිබෙනවා කියා තමයි එතුමන්ලා කියන්නේ. ඒකේ ප්‍රතිඵලය මොකක්ද? මේ වන විට මින්නේරිය වැවේ ධාරිතාව අක්කර අඩි 49,212යි. අක්කර අඩි 50,000ක් කියා අපි හිතමුකෝ. මේක වාන් මට්ටමට එන්න අක්කර අඩි 60,000ක් ඕනෑ. කවුඩුල්ලට, කන්තලේට වතුර ටික දෙන්න නම්, අඩුම තරමින් වානෙන් එළියට පළමු වතුර බින්දුව යන්න නම් අක්කර අඩි 60,000ක් ඕනෑ. හැබැයි දැන් තිබෙන්නේ අක්කර අඩි 49,000යි. පරාක්‍රම සමුද්‍රයේ නම් අක්කර අඩි 78,000ක් තිබෙනවා. කවුඩුල්ල වැවේ ධාරිතාව අක්කර අඩි 23,480යි. මෙ' කන්නයේ මෝසම් වැසි ලැබෙන නිසා කොහොම හරි ගොඩ යන්න පුළුවන් කියමු කෝ. වැවේ වතුර ඇළවල් දිගේ නොගියත් උඩින් වැටෙන වතුර ටිකෙන් මාසයක් දෙකක් දුවන්න පුළුවන් කියමු කෝ. හැබැයි ඊළඟ කන්නයට මොකක්ද වන්නේ? ඊළඟ කන්නය අනතුරේ. ඊළඟ යල් කන්නය අනතුරේ. මේක ඉතා බරපතළයි. ඒක සිතා ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම පොළොන්නරුව කලාපයේ මේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ කලාපයේ තිබෙන ජල ගැටුළුව විසඳා ගන්න මොකද කරන්න ඕනෑ? මොරගහකන්ද ජලශය හැදෙන්න ගොඩක් කල් යයි. මොරගහකන්ද ජලාශය හැදුණොත් හොඳයි. ඒකෙන් ප්‍රහ්නය විසඳන්න පුළුවන් නම් හොඳයි. ඒ වුණත් මොල්ලිඋල්පත වැව, පුවක්ගහඋල්පත වැව, බකමූනම් පතහ වැව, බෝගහ වැව, ඇලහැර අමුණ ආශ්‍රිතව තිබුණු පරණ ජලාශය ආදී වශයෙන් තිබෙන ඒවා මූලික කර ගෙන දැවැන්ත වාරිමාර්ග සංවර්ධනයක් කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ ප්‍රදේශවල මේ වැව් ටික ජල රැකුම් වැව්, සුරැකුම් වැව් විධියට හදලා ඒ යටතේ අලුතින් කුඹුරු වගා කරන්න නොවෙයි අපි කියන්නේ. තිබෙන කුඹුරු ටික වතුර දෙන්න වැඩ පිළිවෙළක් සලස්වන්න කියායි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

අම්පාර නාමල් ඔය වයාපාරයේ ජල හිඟය පියවා ගන්න අපි ඔබතුමාට යෝජනාවක් ඉදිරිපත් කළා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් ඉතා ඉහළ අනුග්‍රයක් දැක්වූවා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉතා හොඳින් ඒ කටයුත්තට එළැඹුණා. හැබැයි ගරු ඇමතිතුමනි, අපට ආරංචි විධියට මේ වන කොට ඒක කිසියම් තැනක හිර වෙලා තිබෙනවා. ඒ හිර වීම පන්නා දෙන ලෙසට අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. නාමල් ඔය ව්‍යාපාරයේ ගොවීන් දහ දුක් විඳිමින් ඉන්නවා. පසු ගිය දවස්වල මම ඒ ව්‍යාපාරයට ගියා. අතිවිශාල බරපතළ ප්‍රශ්නයකට ඒ ගොවීන් මුහුණ දීලා ඉන්නවා. විශේෂයෙන්ම ඒක නවත්වන පැත්තට තර්කය එන්නේ තවම කුඹරු නැති, තවම කුඹුරු වෙන් කරලා නැති, මුඩු බිමක් විධියට තිබෙන ප්‍රදේශයක් පෙන්වා පෙන්වා මේකට වතුර ඕනෑ හන්දා ඒක කරන්න දෙන්න බැහැ කියා කට්ටියක් කියන නිසායි. නාමල් ඔය ව්‍යාපාරයේ ඉන්න මිනිස්සු ගම්පහ, කොළඹ වැනි සශ්‍රික ප්‍රදේශවලින් මුලින් උදුරා ගෙනිහිල්ලායි නාමල් ඔය ව්‍යාපාරයේ නැවැත්වූවේ; පැළ කළේ. හැබැයි අද ඒ මිනිසුන්ට යන එන මං නැහැ. ඒ නිසා තවම කුඹුරු අස්වද්දලා නැති වයාපාරයකට වතුර දෙන එක නොවෙයි දැන් අපි කරන්නට ඕනෑකම තිබෙන්නේ. ගිහිල්ලා පැළ කරපු ඒවාට වතුර ටික දෙන එකයි පැළ කරපු වගාවට වතුර දෙන එකයි අපි දැන් කරන්නට ඕනෑ. ඒ නිසා නාමල් ඔය ව්‍යාපාරය, ප්‍රමුඛ ව්‍යාපාරයක් බවට පත් කිරීම සඳහා අවධානය යොමු කරන්නය කියා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අපේ ගරු ජයතිස්ස රණවීර ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. කෙසෙල්වලින් ලැබෙන ලාභය අඩු වීම පිළිබඳ ප්‍රශ්නය නිසා දැන් ඇඹිලිපිටිය ප්‍රදේශයේ ගොවීන් ක්‍රමානුකූලව කෙසෙල් වගාව අඩු කරමින් යනවා. අපි පොහොර සහනාධාරය ඉල්ලා සිටියා. තවම පොහොර සහනාධාර ලැබෙන පාටක් නැහැ. අපි කියන්නේ පොහොර සහනාධාරය දෙනවා නම් ඉතා හොඳයි කෙසෙල් වගාව ඒ ප්‍රදේශයට හඳුන්වා දුන්නේ - ගරු ජයතිස්ස රණවීර ඇමතිතුමනි, ඔබතුමා ඒකට සාක්ෂි දරාවි - ඒ ප්‍රදේශයේ තිබුණ ජල හිඟය නිසයි. මහවැලි ව්‍යාපාරය විසින් කෙසෙල් වගාව හඳුන්වා දුන්නේ ජල හිඟයට උත්තරයක් විධියටයි. හැබැයි, දැන් ඒ ජල හිඟයට උත්තරයක් නොමැතිව, අද ගොවීන් කෙසෙල් වගාව ඉවත් කරලා - ගොවීන් නොවෙයි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, කෘෂිකර්ම බලධාරීන්ම ඒ සඳහා යොමු කරමින් ඉන්නවා - ක්‍රමානුකූලව නැවතත් වී වගාවට යොමු වෙමින් ඉන්නවා. වී වගාවට යොමු වීමේ වැරැද්දක් නැහැ. ඒක හොඳයි

**ගරු ජයතිස්ස රණවීර මහතා (වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர_ நீர்ப்பாசனத்துறை அமைச்சர்)
(The Hon. Jayatissa Ranaweera-Minister of irrigation)
මම පැහැදිලි කරන්න ද?

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மரண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
හොඳයි. නමුත් මගේ කාලය

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
ගොවීන් වී වගාව අත් හැරියේ ජල හිඟය නිසා නොවෙයි. ඒ කාලයේ වී වගාව ආර්ථික වශයෙන් ලාභ නොතිබු නිසා තමයි කෙසෙල් වගාව කළේ. දැන් වී වගාව ආර්ථික වශයෙන් ලාභ නිසා ගොවි ජනතාව කැමැත්තෙන්ම වී වගාවට යනවා.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மரண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
නැහැ, එහෙම නම් ඇමතිතුමනි, පොළොන්නරුවටත් කෙසෙල් වගාව එන්න එපා යැ.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
නැහැ. පොළොන්නරුවට ලාභ වී වගාවයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மரண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
එහෙම නම් ඒ කාලයේ පොළොන්නරුවටත් වීවලින් පාඩුයි නේ. පාඩු වුණේ ඇඹිලිපිටියේ වීවලට විතරක් යැ. එහෙම කියන්න එපා.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
මහැවැලිය යටතේ අතුරු වගාවක් ලෙසයි. කෙසෙල් වගාව ඇඹිලිපිටියේ පටන් ගන්නේ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மரண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
මහවැලියෙන් යොමු කරපු ලිපිලේඛන අපි ළඟ තිබෙනවා.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
මම මහවැලි නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට සිටින කාලයේ අපි ඇඹිලිපිටියේ අතුරු වගාවක් විධියට කෙසෙල් වගාව පටන් ගත්තා. ඒක සාර්ථකව කළා.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மரண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
ජල හිඟය නිසා කෙසෙල් වගාවට යොමු වෙන්න කිව්ව ලිපි ලේඛන අපි ළඟ තිබෙනවා. නැත්නම් පොළොන්නරුව, අනුරාධපුරයේ ගොවීන්ටත් වී වගාව පාඩු වුණානේ.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
අදත් වී වගාව ලාභයි. ලාභ නිසා යොමු වෙලා තිබෙනවා.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மரண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
හැබැයි ඊහේ කෙසෙල් වගාවට යොමු කළේ නැහැ. එහෙන් කෙසෙල් මලක්වත් ආවේ නැහැ.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
ඇත්ත කථාව ඒකයි. එහෙම නැතිව කෙසෙල් වගාව පාඩු නිසා අයින් කරනවා නොවෙයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
ගරු ඇමතිතුමනි, උඩවලව ජලාශයේ ජල හිඟය විසඳීමට අවශ්‍ය කරන මැදිහත් වීම කරන්නය කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට වෙහෙරගල ජලාශ ව්‍යාපෘතිය පිළිබඳවත් කියන්න ඕනෑ. වෙහෙරගල ජලාශය පිළිබඳව මේ පොතේ තිබෙන්නේ අවුල් සහගත තොරතුරුයි. මේ පොතේ එක තැනක තිබෙනවා, වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 2,000යි කියලා. තවත් තැනක තිබෙනවා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 2,900යි කියලා. එක තැනක තිබෙනවා, භෞතික ප්‍රගතිය සියයට 20යි කියලා; තවත් තැනක තිබෙනවා, සියයට 90යි කියලා. අපි දන්නා විධියට නම් සියයට 90යි. මේ පොතේ තිබෙන සංඛ්‍යා දත්ත ඔස්සේ නම් අපට වෙහෙරගල ජලාශ ව්‍යාපෘතිය පිළිබඳව තීරණයට එන්න බැහැ. ඒ පිළිබඳව ඔබතුමා සොයා බලන්න.

ඊළඟට වාරි මාර්ග පුනරුත්ථාපනය සඳහා මුදල් වෙන් කර තිබෙනවාය කියලා ගරු ඇමතිතුමා කිව්වා. ඇස්තමේන්තු ඇතුළේ නම් අපට ඒ ගැන හරි හැටි සොයා ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අම්පාර දිස්ත්‍රික්කයේ සේනානායක සමුද්‍ර ව්‍යාපාරයේ, මින්නේරිය ව්‍යාපාරයේ එහෙම බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අවුරුදු තිහක හතළිහක කාලයක් තුළ වාරි මාර්ග පුනරුත්ථාපනය කරලා නැහැ; ප්‍රතිසංස්කරණය කරලා නැහැ. ඒක නිසා බරපතළ තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ අවධානය ඒ සඳහාත් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට, කැකිරිඔබඩ ජලාශ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය පිළිබඳව ඔබතුමාගේ කථාවේ දී යමක් කියාවිය කියා අපි බලාපොරොත්තු වුණා. නමුත් ඔබතුමාට කාලය මදි වූ නිසා ඒ පිළිබඳ තොරතුරු අපට ලැබුණේ නැහැ. අපි දන්නා ආකාරයට නම් සැලසුම්වලට අනුව ව්‍යාපෘතිය පමා වෙලයි තිබෙන්නේ. තිබුණු සැලසුම්වලට අනුව පමා වෙලයි තිබෙන්නේ. ඒක ඉක්මන් කරන්නත්, වර්තමාන ප්‍රගතිය පිළිබඳව යම් දළ අදහස් අපට ලබා ගන්නත් ඕනෑ.

ඉඩම් අමාත්‍යාංශය පිළිබඳවත් එක විනාඩියකින් කියන්නම්. ගරු ඉඩම් ඇමතිතුමා නම් මේ අවස්ථාවේ නැහැ. නමුත් නියෝජ්‍ය අමාත්‍යතුමා ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පළමු වැනි එක තමයි, ඉඩම් පනතට අදාළව සංශෝධනයක් පසු ගිය කාලයේ යෝජනා වුණා. විශේෂයෙන්ම තුන් වැනි උපලේඛනය විසින් ඇති කරන ලද ගැටලුවට - එනම් පවුලක වැඩිමහල් පිරිමි දරුවාට අම්මා හෝ තාත්තා විසින් ඉඩම් නොපැවරූ අවස්ථාවක අයිතිය ලබා දීම පිළිබඳ ප්‍රශ්නයට අදාළව ඉතා හොඳ සංශෝධනයක්

[ගරු එස්. කේ. සුබසිංහ මහතා]

නිර්මාණය වුණා. එදා අනුර දිසානායක මන්ත්‍රීතුමා ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ තමයි ඒ සංශෝධනය ගැන සාකච්ඡා කිරීම ආරම්භ වුණේ. ඊළඟට ගරු ජීවන් කුමාරණතුංග ඇමතිවරයා යටතේ එය අවසන් කර තිබෙනවා. ඒක ගේන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ නිසා ඉක්මනින් ඒ පනතට මේ සංශෝධනය ගේන්නය කියන ඉල්ලීම කරනවා.

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி - காணி, காணி அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. C. A. Suriyaarachchi-Deputy Minister of Land and Land Development)

ගරු මන්ත්‍රීතුමා, උපදේශක කාරක සභාවේ සාකච්ඡා කරලා කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමා හිටියේ නැහැ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)

වෙන්න ඇති. සමා වෙන්න. [බාධා කිරීමක්] එහේ නෙ. පොළොන්නරුවේ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)

හොඳයි. මම විනාඩියෙන් ඉවර කරනවා. අද විශේෂයෙන්ම ගොවි ජනපද ව්‍යාපාර තුළ ඉඩම් බෙදිය හැකි සීමාවක් තිබෙනවා. කුඹුරු ඉඩම් බෙදිය හැකි සීමාව අක්කර එකහමාරක් විධියට තිබෙනවා. දැන් මේක යල් පැන ගිය සංඛ්‍යාවක් . මේක පරණ ගණනක්. මේක අක්කරය දක්වා අඩු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මේ ඉඩම් බෙදී යාම අනුව ගොවි පවුල්වල ඉඩම් බෙදා ගැනීමේදී ඉතා විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. දැන් තාත්තාට බැහැ තමන්ගේ දරුවන්ට අක්කරයක ඉඩම් කෑල්ලක් හිමි කර දෙන්න. ඒ නිසා මේ පිළිබඳව සමාලෝචනය කර අක්කරයක ඉඩම් හිමිකමක් ලබා දෙන්න අවශ්‍ය මැදිහත් වීම කරන්න.

අනෙක් එක තමයි මම හැම දාම අහන ප්‍රශ්නය. නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා. හිඟුරක්ගොඩ ප්‍රදේශයේ ඉඩම් හිමිකම් පත්‍ර ලබා දෙන ව්‍යාපෘතියක් ගෙන යනවා. ඒක පමායි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳව මැදිහත් වෙලා ඒකේ තිබෙන දුෂ්කරතා මොනවාද කියා හොයලා බලලා,—

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)

තුන්දහස් ගණනක් හදලා තිබෙනවා. ගරු ජීවන් කුමාරණතුංග ඇමතිතුමයි, ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමයි, ගරු සිරිපාල ගම්ලත් ඇමතිතුමයි ඉන්නවා. අපි හිඟුරක්ගොඩ ලබන අවුරුද්දේ තමයි පටන් ගන්නේ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)

පටන් ගන්න නොවෙයි. පටන් ගත්ත එකක් තිබෙනවා නේ.

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)

ඔව්.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)

ග්‍රාම නිලධාරි කොට්ඨාස හතරක.

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)

ඔව්.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)

සාමපුර, ජයපුර, බෝපුර, උල්කටුපොත. මේ හතරේ ඉඩම් හිමිකම් පත්‍ර ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් ගෙන ගිහිල්ලා තමයි දැන් සියල්ල කර තිබෙන්නේ. භූමියේ කරන්න ඕනෑ දේවල් කර තිබෙනවා. දැන් කාර්යාලයේ වැඩ කටයුතු ටික විතරයි තිබෙන්නේ. එතැන දුෂ්කරතා ටිකක් තිබෙනවා. නිලධාරීන් නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිලධාරීන් සපයලා මොකක් හරි විශේෂ වැඩ පිළිවෙළක් යොදලා ඒ වැඩය ඉවර වෙනකම් "යුනිට්" එකක් සපයලා හෝ මේක විසඳා දෙන්න කියා ඉල්ලනවා. මේක අපේ දිස්ත්‍රික්කයේ ප්‍රශ්නය. ඔබතුමාගේ ආසනයේ ප්‍රශ්නය. ඒ නිසා මේකට මැදිහත් වෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)

ඒ කටයුත්ත ළඟදීම කරනවා.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)

හොඳයි. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මී ළඟට ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමා ඔබතුමාට තිබෙන්නේ විනාඩි 10යි.

[ අ. භා. 12. 36]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Minister of Nation Building)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මේ රටේ වැදගත්ම අමාත්‍යාංශ තුනක ඉදිරි වර්ෂයේ දී කරන්න වූ කාරණා පිළිබඳවයි අද අපි කථා කරන්නේ. විශේෂයෙන්ම ටීඑන්ඒ එකේ ගරු අන්නමලෛ නඩේසු සිවශක්ති මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා, මන්නාරම, වවුනියා දිස්ත්‍රික්කවල සමහර වාරිමාර්ග ක්‍රමත්, ඒ වාගේම උතුරු පළාත් සභාවට අයිති වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැව් පිළිබඳ කටයුතුත් ඉදිරි කාල සීමාවලදී කර දෙන්න කියා. මම හිතන විධියට ගරු වාරිමාර්ග ඇමතිතුමා ලබන වර්ෂයේ දී එම කටයුතු කරන්න සූදානම් කර තිබෙන බව ප්‍රකාශ කර තිබෙනවා.

ඒ වාගේම අපේ ත්‍රිවිධ හමුදාවේ වීරෝදාර රණවිරුවෝ නැගෙනහිර පළාත මුදා ගත්තාම පසුව මේ වන විට විශාල බිම් ප්‍රමාණයක වගා කටයුතු අවුරුදු 20 ගණනකට පසුව කෙරෙමින් පවතිනවා. උතුරේත් කොටි ත්‍රස්තවාදීන් අත්පත් කර ගෙන තිබුණු මන්නාරම, වවුනියාව, මුලතිව්, වාගේ ප්‍රදේශ මුදා ගත්තායින් පසුව ඒ ප්‍රදේශවල සිටින අහිංසක ද්‍රවිඩ ජනතාව, ඒ වාගේම, අනෙකුත් ජනතාව වෙනුවෙන් රජය ඒ ප්‍රදේශ සංවර්ධනය කරන්න සූදානමින් ඉන්නවා. ඒ වාගේම අපේ ගරු සුබසිංහ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ - එතුමා පුනපුනා කියා සිටියේ - මෙවර අය වැයෙන් කෘෂිකර්මාන්තයට, වාරි කර්මාන්තයට වෙන් කර තිබෙන්නා වූ මුදල් ඉතාමත්ම ස්වල්පයක් බවයි. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඒ අමාත්‍යාංශවලට ලැබුණු මුදල සුළු ප්‍රමාණයක් හැටියට සැලකුවත් උතුරේ විශාල යුධ මෙහෙයුමක් කරන අවස්ථාවක් මේ. ත්‍රස්තවාදය නැති කර ඒ පළාතේ අහිංසක ජනතාව මුදා ගැනීම සඳහා කටයුතු කරන අතරේ රජය ඉදිරි වර්ෂය සඳහා මේ සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කර තිබෙන බව ඔබතුමාත් දන්නවා. අතිගරු ජනාධිපතිතුමා යටතේ තිබෙන්නා වූ ජාතිය ගොඩ නැගීමේ අමාත්‍යාංශයේ ව්‍යාපෘතිවලින් ඒ වැව් හැදීමටත්, වාරිමාර්ග කටයුතුවලටත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒවා මේ පොත්වල සටහන් වෙලා නැහැ. ඒ ගණන් මිනුම් බලන කොට සියයට 10 ප්‍රමාණයට වඩා වැඩි මුදලක් ඇතැයි කියා මම හිතනවා.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

මම අය වැය ඇස්තමේන්තු අනුව තමයි කරුණු ඉදිරිපත් කළේ. සියයට 10යි ගිය අවුරුද්දට සාපේක්ෂව වැඩි කර තිබෙන්නේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ඇත්ත වශයෙන්ම ගොවි ජනතාව සියයට 70ක් ඉන්න බව ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. සමස්තයක් වශයෙන් තමයි සියයට 70 ගත්තේ. නමුත් නැගෙනහිර සහ උතුර ගත්තොත් මේ රටේ වැඩි ජනතාවක් ගොවිතැන් කරන භූමි වශයෙන් ඒවා සලකන්න පුළුවන්. ඒ ප්‍රදේශවල අවුරුදු විස්සක විසිපහක තිබුණු යුද්ධය නිසා ගොවි ජනතාවට විශාල වශයෙන් මන්ද පෝෂණය, ඒ වාගේම ලේ මදිකම වාගේ රෝග ඇති වෙලා තිබෙන්න පුළුවන්. වාකරෙයි ගත්තාම අවුරුදු ගණනාවකට පසුව තමයි එහි ජනතාවට ගොවිතැන් බත් කරන්නට අවස්ථාව අද ලැබිලා තිබෙන්නේ. ත්‍රිවිධ හමුදාව විසින් ඒ ප්‍රදේශය මුදා ගත්තාට පසුව දොස්තර මහත්වරුත් සමග එහි ගිහින් සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය සෞඛ්‍ය සායනයක් කළා. ඒ පළාත්වල ජනතාවට කොටි ත්‍රස්තවාදීන්ගෙන් තිබුණු කරදර නිසා ඒ පළාත්වල ඉන්න සමස්ත ජනතාවගේම ඔය කියන ඌනතාවන් දකින්නට ලැබුණා.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

සමහර ප්‍රදේශවල තත්ත්වය පිළිබඳව ඔය කියන වාර්තාවල නැහැ. තවම ඒවා ගණන් හදලා නැහැ. ගල්ගමුවේ මොන යුද්දෙද? කඹුත්තේගම ගැන, කැතිරාව ගැන, කලාවැව ගැන බලන්න. මොන යුද්දෙද? නැහැ නේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

වාර්තා හදන්නේ නිලධාරි මහත්වරු. අපේ ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා දැන් කිව්වා, මේ රටේ වගා කර නැති ඉඩම්වල වවන්න ඕනෑය කියලා. වවන්නට හැකි ඉඩම් තිබෙනවා, රජයේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට, අමාත්‍යාංශවලට අයිති අක්කර දහස් ගණනක්. හැබැයි ඒවා වවන්නට යන කොට කියනවා. "හා, හා, මේවා වවන්න බැහැ"යි කියලා. එවැනි නිලධාරීන් ඉන්නවා. ඒ වගේම හොඳ වැඩ කරන නිලධාරීනුත් ඉන්නවා. අපි තමුන්නාන්සේලා මොනවා කථා කළත් වැඩක් නැහැ, මේවායේ වැඩ කටයුතු කෙරෙන්නේ නිලධාරීනුත් සමගයි.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)

නිලධාරීන් කියන්නේ වැඩ නොකරන නිලධාරීන්ද?

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

සමහර විට වෙන්න පුළුවන්. සමහර විට printing mistake එකක් වෙන්න පුළුවන්. සමහර විට කන ඇහෙන්නේ නැති නිසා වෙන්න පුළුවන්. ඒ නිලධාරියාගේ කන ඇහෙන්නේ නැත්නම් මොකද වෙන්නේ? කනට ඇහෙන දේ නේ ලියන්නේ. ඉතින් ඒ වාගේ දේවල් වෙන්න පුළුවන්. මම ඔබතුමා කියන්නා වූ පෙළක් කාරණාවලට එකඟයි. හැබැයි ඔබතුමා පුනපුනා කියන්න හැදුවේ, මේ අය වැයෙන් කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යාංශයට ප්‍රතිපාදන අඩුවෙනුයි දීලා තිබෙන්නේ. වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයට අඩුවෙන් දීලා තිබෙන්නේ කියලායි. රටට වැරදි picture එකක් දෙන්න හදනවා. ආණ්ඩුව කෘෂි කර්මාන්තයට සලකන්නේ නැහැ. ඒ වාගේම වාරි කර්මාන්තයට සලකන්නේ නැහැ. එහෙමත් නැත්නම් ඉඩම් අංශයට සලකන්නේ නැහැයි කියලා. එහෙම එකක් නැහැ. ගරු එස්. කේ. සුබසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා තමයි සම්බන්ධ වෙලා මහින්ද චින්තන වැඩසටහන ඉදිරිපත් කළේ. අපි ඒකට එදා සම්බන්ධ වුණේ නැහැ. නමුත් ඔබතුමන්ලා මහින්ද චින්තන වැඩසටහනෙන් ඉවත් වුණාට පසුව තමයි අපි මේ රජයත් එක්ක, ජනාධිපතිතුමාත් එක්ක එක්කාහු වෙලා මහින්ද චින්තනය ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යන්නේ. වෙන දෙයක් නොවෙයි අපි මේ ක්‍රියාත්මක කර ගෙන යන්නේ. තමුන්නාන්සේලාත්, අතිගරු ජනාධිපතිතුමාත් එදා එකට එක්කහු වෙලා හදපු මහින්ද චින්තනය තමයි මේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන් මේ අද ක්‍රියාත්මක කරන්නේ. ඉතින් ඒකට අපි මොනවා කරන්නද? අපි හොඳ දේ කරන්නට ඕනෑ. ඒක හොඳයි කියලා හිතුණ නිසා අපි අද ඒක ක්‍රියාත්මක කරනවා.

අද පාර්ලිමේන්තු නිලධාරි කුටියේ ඉන්නවා, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරිතුමන්ලා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ නිලධාරිතුමන්ලා, ඒ වාගේම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරිතුමන්ලා. මේ නිලධාරිතුමන්ලාත් මේක අහ ගෙන ඉන්න එක හොඳයි. මොකද, මම කියන්නේ කරුණු සාධක ඇතුව. නැගෙනහිර පළාතේ අපි වැඩ කරන කොට යම් යම් බාධාවන් විශාල වශයෙන් මේ වන කොට ඇති වෙලා තිබෙනවා. මොනවාද, බාධාවන්? අද ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා කිව්වා, ඉඩමක් වවන්නේ නැත්නම්, ඒ වවන්නේ නැති ඉඩම පවරා ගන්නට නීතියෙන් කටයුතු කරලාත් තිබෙනවා. තවදුරටත් කටයුතු කරන්නට යනවා කියලා. අතිගරු ජනාධිපතිතුමා ඇවිත් කියනවා, මේ රටේ බඩ ඉරිඟු වවන්න ඕනෑ, ඒ වගේම සෝයා වවන්න ඕනෑ, ඒවගේම කිරි නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑයි කියලා හැබැයි, මේවා කරන්න යන කොට බොහෝ අමාත්‍යාංශවල අපේ නිලධාරි මහත්වරුන්ගේ කන ඇහෙන්නේ නැහැ; අත පය වැඩ කරන්නේ නැහැ. ඒ ගොල්ලන් නිතරම බලන්නේ තමන්ගේ "පෙන්ෂන්" එක බේරා ගෙන ඉන්න ඕනෑ කියන ප්‍රතිපත්තියෙනුයි. "පෙන්ෂන්" එක බේරා ගෙන ඉන්න ඕනෑ නම් රජයේ වැඩ කරන්නේ නැතුව ගෙදරට වෙලා ඉන්න පුළුවන්. එහෙම නිලධාරීන් ඉන්නවා නම් මම කියන්නේ කරුණාකරලා රජයේ අමාත්‍යාංශවල ලේකම් තනතුරු වාගේ දේවල් ගන්න ඕනෑ නැහැ කියලායි. ගෙදරට වෙලා තමන්ගේ "පෙන්ෂන්" එක බේරා ගෙන දූලා පුතාලා එක්ක ඉන්න පුළුවන්. එහෙම අය ඉන්නමා නම් කරුණාකරලා ඒ විධියට ඉන්න.

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

මේ රටේ අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කරන්නට අපට ඒ අවස්ථාව ලබා දෙන්න. ඒක විශේෂයෙන්ම ප්‍රකාශ කරන්නට ඕනෑ. තොප්පිය ගැළපෙන කට්ටිය තොප්පිය දා ගත්තාට කමක් නැහැ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
ඇමතිතුමාට කියන්න බැරි ටික අපට කියනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
නැහැ, නැහැ.

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon . S. K. Subasinghe)
නිලධාරි සම්බන්ධයෙන් කිව්ව ටික.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

නැහැ, නැහැ. කියන්න ඕනෑ එක කියන්න ඕනෑ. මේක වෙන කොහේ ගිහින් කියන්නද? අපි කියයන්න භය නැහැ. අපි මේ ප්‍රකාශ කරන්නේ ඇත්ත. අපි කවුරුත් මෙ වැඩ කරන්නේ අපේ ගෙවල්වලට අරගෙන යන්න නොවෙයි. අපි කරන්නේ මහින්ද චින්තනය ක්‍රියාත්මක කිරීමයි. මහින්ද චින්තනයේ කියා ඇති පරිදි, අහිංසක දුප්පත් වැසියන්නට ලැබෙන්නා වූ වරප්‍රසාද ලැබෙන්නට ඕනෑ. ගරු සුබසිංහ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ ප්‍රදේශවල අහිංසක දෙමාපියන්ගේ දුවා දරුවන් තමයි අද මුලතිව් කැලේ, ඒ වාගේම කිලිනොච්චි කැලේ, ඒ වාගේම අපේ පාර්ලිමේන්තුවෙත් මේ රටේත් ආරක්ෂාව වෙනුවෙන් සිය ජීවිතය කැප කරන්නේ. ඒ ප්‍රදේශවල ගමක, තමුන්නාන්සේලාගේ ගමක වැවක් හදන්නේ නැත්නම්, ඒ ගමේ පාර හදන්නේ නැත්නම්, ඒ ගමට විදුලිය දෙන්නේ නැත්නම් එවැනි දේවල්වලින් බාධා කරන නිලධාරීතුමන්ලා ඉන්නවා නම් තව මොනවාද මේ කථා? එහෙම නම් ඒ අය තීන්දුවක් ගන්න ඕනෑ. එක්කෝ රජයත් එක්ක වැඩ කරන්න ඕනෑ; එහෙම නැත්නම් "පෙන්ෂන්" එක බේරා ගෙන ගෙදර ඉන්න ඕනෑය කියලා. අතිගරු ජනාධිපතිතුමා එදා එතුමාගේ අය වැය කථාවේදී ප්‍රකාශ කළා, මේ රටේ ත්‍රිවිධ හමුදාවේ රණ විරුවන්ට අප සලකන්න ඕනෑය කියා. රණ විරුවන්ට සලසන්න ඕනෑ ඒ විධියට. ඒක අපේ යුතුකමක්. එහෙම නැතුව රණ විරුවන් යම් කිසි කරදරයකට පත් වුණාට පස්සේ ගෙදරට කීයක් හරි යවන එක එහෙම නැත්නම් වෙනත් සහයෝගයක් දෙන එක නොවෙයි කළ යුත්තේ. රණ විරුවන් ජීවතුන් අතර සිටින විට තමන්ගේ දෙමව්පියන්ට - අහිංසක මව්වරුන්ට, පියවරුන්ට - සලකන එක, තමන්ගේ නැඟණියට කුප්පි ලාම්පු එළියෙන් ඉගෙන ගන්න බැරිව සිටින විට ඒ අයට ඒ පහසුකම් ලබා දීම වැනි දේවල් කරනවා නම් තමයි කැළයේ සිටින රණ විරුවන්ට ඒකේ සන්තෝෂය ලැබිලා ඒ රාජකාරිය හරිහැටි කරන්න පුළුවන් වන්නේ. අන්න ඒ නිසා තමයි විශේෂයෙන්ම මම එතුමාගේ සමහර කාරණාවලට කැමති. එතුමා කිව්වා, කාර්යක්ෂමතාව, වුවමනාව, ඒ වාගේම කැප කිරීම නැහැ කියලා. එවැනි කැප කිරීම් නැති නිලධාරී මහත්වරුන් මේකේ ඉන්නවා. මම කියන්නේ හැම දෙනාම නොවෙයි. ඒ තොප්පිය හරි කට්ටිය දමා ගන්න පුළුවන්. විශේෂයෙන්ම මම එහෙම කියන්නේ මොකද? අපිට අද තිබෙන ප්‍රශ්නය තමයි මේ රටේ ත්‍රස්තවාදය නැති කිරීම. අවුරුදු විසි ගණනත් තිබුණු ත්‍රස්තවාදය නිසා ඒ ත්‍රස්තවාදීන් අල්ලා ගෙන සිටි ප්‍රදේශවල නිෂ්පාදනයන් අපට ලැබුණේ නැහැ. විශේෂයෙන්ම මන්නාරම ගත්තොත් මන්නාරමේ තිබුණේ කෘෂි ආර්ථිකයක්. ඒ කියන්නේ වී නිෂ්පාදනය වැඩිම ප්‍රදේශ. අම්පාර ගත්තොත්, මඩකලපුව ගත්තොත්, ත්‍රිකුණාමලය ගත්තොත් තනිකර මේ රටේ වැඩිම ප්‍රමාණයක් වී නිෂ්පාදනය වන ප්‍රදේශ. ඒ ප්‍රදේශත් ඒ වාගේම අනිකුත් කෘෂි භෝග වර්ග නිෂ්පාදනය වන ප්‍රදේශත් තමයි ත්‍රස්තවාදීන් අල්ලා ගෙන සිටියේ. අද තමයි ත්‍රිවිධ හමුදාව ප්‍රමුඛ රජය ත්‍රස්තවාදය තුරන් කර ඒ ප්‍රදේශවල වෙසෙන්නා වූ අහිංසක සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනතාවට නැවත ඒ අයගේ භූමිවල වැඩ කිරීමේ අවස්ථාව ලබා දී තිබෙන්නේ. ඒ භූමිවල කෘෂි කර්මාන්තය කරන්න අවස්ථාව ලබා දුන්නාට පස්සේ, ධීවර කටයුතු කරන්න අවස්ථාව ලබා දුන්නාට පස්සේ එහෙම නැත්නම් කිරි ගොවියාට ඒ කර්මාන්තය කරන්න අවස්ථාව ලබා දුන්නාට පස්සේ අද තමයි ඒ නිෂ්පාදනයන් ක්‍රමානුකූලවම අපේ අනෙක් ප්‍රදේශවලට ලැබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි ඇත්ත ඇති සැටියෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ වෙලාව අවසානයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව පැයක් නොවෙයි, පැය දෙකක් වුණත් කථා කරන්න පුළුවන්. නමුත් කාලය අවසන් නිසා මගේ මේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් ගත කිරීම සඳහා **සභාගත*** කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled :*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝක ආර්ථිකයේ සිදුව ඇති බිඳ වැටීම බොර තෙල් මිලෙහි සිදු වූ සීඝ්‍ර වැඩි වීම, දේශීයව ඇති වූ විවිධ ආර්ථික පසුබෑම් හේතු කොට ගෙන අපේ රටේ ආර්ථිකයට බරපතළ ගැටලුවලට මුහුණ දීමට සිදු වුණා. එම තත්ත්වය හමුවේ අපගේ විදේශ වත්කම් පහත වැටීමක් ද සිදු වුණා. ඒ වගේම අපනයන කටයුතු වර්ධනය කර ගන්නට ද යම් යම් බාධා මතු වුණා. එවැනි අසීරුතාවන් මත වුනක් මහින්ද චින්තන සැලැස්ම අනුව ක්‍රියාත්මක වන දස අවුරුදු සංවර්ධන සැලැස්මට අනුව අපගේ ආර්ථිකය ඉදිරියට ගෙන යාමට අපට හැකියාව ලැබුණා. ඒ බව ඒක පුද්ගල ආදායම දිහා බලන කොට පෙනී යනවා. රටක සංවර්ධනය මනින එකම දර්ශකය මෙය නොවන බව මා පිළිගන්නවා. නැඟෙනහිර ආසියාතික සංවර්ධනය වෙමින් පවතින රටක් විධියට සලකා බලන කොට අපේ රටේ ආර්ථිකය කළමනාරණය නිසි ලෙස සිදු කිරීමට හැකියාව ලැබුණු බව අපට පෙනී යනවා. ඒ වගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙවර අය වැය තුළින් අය වැය හිඟය පෙර වසරවල්වලට වඩා අඩු කර ගැනීමට අපට හැකියාව ලැබිලා තියෙනවා. එසේම රාජ්‍ය ආයෝජන වියදම් ගිය වසරට වඩා ඉහළ නංවන්නට අපට හැකියාව ලැබිලා තියෙනවා. යුද්ධය වාගේම ආර්ථික සංවර්ධනයත් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයට කරන්න පුළුවන් බව පෙනී යනවා. එසේම ජාතික ආර්ථිකය ගොඩ නැංවීම මූලික තේමාව කර ගනිමින් ඉදිරිපත් කළ මෙවර අය වැය තුළින් කෘෂි කර්මාන්ත අංශයට බරපතළ වග කීමක් පැවරිලා තියෙනවා. ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල් සලකා බලන කොට ජාතික ආර්ථික වැඩ පිළිවෙළක් පිළිබඳව විශ්වාසය තබා සැලසුම් ක්‍රියාත්මක කොට තිබෙන බව හඳුනා ගන්න පුළුවන්. එහිදී කෘෂි කර්මාන්තයට ප්‍රබල භූමිකාවක් හිමි වෙලා තිබෙනවා. එංගලන්තයේ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය තුළ එරට දේශීය කර්මාන්තවලට හා කෘෂි කර්මාන්තයට ප්‍රබල වග කීමක් පැවරී තිබුණ බව පෙන්වා දෙන්න පුළුවන්. ඒ වාගේම යුරෝපාකරයේ බොහෝ රටවල් වාගේම පෙරදිග කලාපයේ දියුණු රටවල් ලෙස සැලකෙන චීනය, ඉන්දියාව, ජපානය වැනි රටවලත් තත්ත්වය එසේමයි.

ලිබරල්වාදී ආර්ථික සංකල්පවලට අනුගතව ආර්ථිකය විවෘත කරමින් සීමාවකින් තොරව විදේශ භාණ්ඩ වෙළෙඳ පොළට සේන්දු කරවීම තුළ කාර්මික අංශයේ වර්ධනය පමණක් අපේක්ෂා කළා. නමුත් එහි දිගු කාලීන ප්‍රතිඵලය වුණේ අපේ රටේ අහිංසක දුප්පත් ජනතාවට, විදේශ ණය ප්‍රමාණය ඉහළ නංවා ගැනීම නිසි ඇති වුණු ප්‍රතිවිපාකවලට මුහුණ දෙන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බැංකු වාර්තා පෙන්වා දෙන අන්දමට ශ්‍රී ලංකාවේ එක්දහස් නවසිය අනූව දශකයේ මැද භාගය සලකලා බලන කොට, ආර්ථික වර්ධන වේගය සියයට පහයි දශම එකක් ලෙස වාර්තා වුණත්, කෘෂි කර්මාන්තයේ වර්ධන වේගය වාර්තා වුණේ සියයට එකයි දශම නවයක් වැනි සුළු ප්‍රමාණයකින් බව ද, එය ආසියානු රටවල වර්ධන වේගයන්ට සාපේක්ෂව සලකා බලන කොට තිබුණු අඩුම වර්ධන වේගය බවද සඳහන් කරන්න පුළුවන්.

මෙම තත්ත්වය ඉතා කනගාටුදායකයි. මන්ද අපේ ආනයන වියදම ඉහළ යන්න, විදේශ වත්කම් හීන වෙන්න, රට අභ්‍යන්තරයේ උද්ධමනකාරී තත්ත්වයක් වර්ධනය වෙන්න, දේශීය කෘෂි කර්මාන්තය බිඳ වැටීමට වාගේම ඒ හරහා සෘජු හා වක්‍ර රැකියා දස දහස් ගණනක් අහිමි වී යන්න හේතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දේශීය ආර්ථිකයේ හදවතෙහි නාඩි වැටෙන ආකාරය තේරුම් ගන්න පුළුවන්, ගොවියාගේ දුක් කම්කටොලු දහදිය සුවඳ හඳුනන ජන නායකයෙකු ලෙස අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා එක්ව ගෙන යන ආර්ථික වැඩ සටහන තුළ මෙතෙක් නොවූ විරූ ආකාරයේ කෘෂි කර්මාන්තයේ පිබිදීමක් ඇති කරන්නට සමත්ව ඇති බව පෙන්වා දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ සඳහා කදිම සාක්ෂියක් මහ බැංකුව මෙවර නිකුත් කළ වාර්තාවෙන් පෙන්වා දෙන්න පුළුවන්. 2007 අවුරුද්දේ පළමු කාර්තුව තුළදී කෘෂි කර්මාන්තයේ වර්ධනය සියයට 2ක් පමණ වුවද, 2008 පළමු කාර්තුව තුළ එම ප්‍රමාණය සියයට හයයි දශම හයක් දක්වා මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ සියයට හතරයි දශම හයකින් වර්ධනය කර ගන්නට දූරදර්ශී මහින්ද චින්තන ආර්ථික සැලැස්මප හැකියාව ලැබිලා තියෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම සාර්ථකත්වය අත් පත් කර ගන්නට මෙරට ජනතාව අපට විශාල ශක්තියක් වුණා. ඔවුන්ට මාගේ ගෞරවය පුද කරන්නටත් මේ අවස්ථාව යොදා ගන්න කැමැතියි.

අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා ලෙස අය වැය කථාවේ සඳහන් කළ ආකාරයට රුපියල් මිලියන 25,000ක් නැඟෙනහිර කලාපය මුදා ගැනීමෙන් අනතුරුව සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා වැය කොට තිබෙනවා. එසේම දිළිඳු සහනාධාර වාගේම පොහොර සහනාධාර ද අප ලබා දීලා තිබෙනවා. මෙම තත්ත්වය තුළින් අපට ඉහත සඳහන් කළ ආකාරයේ කෘෂි කර්මාන්තය නඟා සිටු වීමට හැකියාව ලැබීම ගැන අප සතුටු විය යුතුය.

නැඟෙනහිර කලාපය මුදා ගැනීමෙන් අනතුරුව කෘෂි කර්මාන්ත අංශයේ වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. කෘෂි කර්මාන්ත අමාත්‍යාංශය නැඟෙනහිර කලාපය තුළ විශේෂ වැඩ කොටසක් සිදු කොට තිබෙනවා. අප එය අගය කළ යුතුයි. සමස්ත වී වගාව සලකා බලන කොට එහි වර්ධනයක් ඇති වෙලා විවිධ බාධක උපද්‍රව හේතු කොට ගෙන වී වගාවෙන් අපේක්ෂිත මට්ටමේ ප්‍රතිඵල ලබා ගන්න බැරි වුණත්, වී වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය ඉහළ යාම හේතු කොට ගෙන සාර්ථක වී අස්වැන්නක් ලබා ගැනීමට අපට හැකි වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දේශීය කෘෂි කර්මාන්තය නඟා සිටු වන්නට මෙවර අය වැය තුළ විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඇතැම් අය විවේචනය කරනවා බදු අය කර ගත්තත් දේශීය කර්මාන්තය නඟා සිටු වන්නට වැඩ පිළිවෙළක් නැහැ කියලා. එය මා පිළිගන්නේ නැහැ. මොකද, වැඩ පිළිවෙළක් තිබුණත් ඵලක් නැහැ ඒ සඳහා මුදල් නැති නම් අපට අපේ කෘෂිකර්මාන්තය නංවන්න එය දේශීය වශයෙන් මතු විය යුතුයි. මුලින්ම කළ යුත්තේ එම වැඩ පිළිවෙළට අවශ්‍ය මුදල් ලබා ගැනීමයි. මහින්ද චින්තන වැඩ පිළිවෙළේ දස වසරක සැලැස්මක් තිබෙනවා. එම සැලැස්ම තුළයි අප ක්‍රියාත්මක වන්නේ.

තවත් අය තර්ක කරන්නේ දේශීය ආර්ථික වැඩ සටහන කලින් පටන් ගන්න තිබුණාය කියලායි. දේශීය ආර්ථිකය හදන්න කලින් විසඳන්න අපේ රජයට තිබුණා බරපතළ ප්‍රශ්නයක්. ඒක තමයි වර්ගවාදී පටු ආකල්පවලින් ක්‍රියාත්මක වන එල්ටීටීඊයෙන් මේ රට මුදා ගන්න එක. අපගේ වීරෝදාර රණවිරුවන් ඊළාම් සිහිනය බොඳ කරන කොට දකුණු ජනතාවගේ සිහිනය අප ඉටු කරන්න ඕනෑ. අපට ඒකට ඉඩකඩ ලැබිලා තිබෙනවා. දැන් එම තත්ත්වය අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැය තුළින් හොඳින් හඳුනා ගෙන තිබෙනවා.

එසේම ගිය වර අය වැය තුළින් දේශීය කිරි නිෂ්පාදනය වැඩි කරන්න, කිරි ගවයින් ආනයනය කරන්න, උතුරු මැද, වයඹ, නැඟෙනහිර, ඌව ලෙස මුළු රට පුරාම කිරි ගවයන් ඇති කරන්න ගව පට්ටි ඇති කරන්න යෝජනා කළා. ඒ විතරක් නොවෙයි, කිරිගවයින් ඝාතනය කරන එක සීමා කරන්නත් කටයුතු කළා.

"අපි වවමු - රට නඟමු" තේමාව යටතේ දේශීය කෘෂි කර්මාන්තය නඟා සිටු වන්නට විශාල වැඩ කොටසක් ඉකුත් වසර තුළ සිදු කර තිබෙනවා. ගිය වසරේ අය වැය යෝජනාව සලකා බලන විට එහි සඳහන් වෙනවා කිරි පිටි, සීනි, පලතුරු, තිරිඟු වැනි ද්‍රව්‍ය ආනයනය කරන්න රුපියල් කෝටි 300ක ආනයන වියදමක් යන බව. එය වළක්වා ගන්න කෘෂි නවෝදය යටතේ දේශීය ගොවීන්ට සහනදායී ණය ක්‍රමයක් යෝජනා කළා. "අපි වවමු - රට නඟමු" තේමාව යටතේ පුද්ගලික ගොවියා පමණක් නොව රජයේ මැති ඇමතිවරයා පටන් සුළු සේවකයා දක්වා පෙලඹවීමකට ලක්කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පොහොර සහනාධාරය දෙන්න ගිය වර තීරණය කරලා ගොවීන්ට පොහොර සහන මිලට ලබා දෙන්න පියවර ගත්තා. එම තත්ත්වය තුළ කරුණු කාරණා කිහිපයක් සඳහන් කරන්න පුළුවන්. ඉන් පළමු වැන්න තමයි, අතිගරු ජනාධිපතිවරයා ක්‍රමානුකූල සැලැස්මකට දේශීය ආර්ථිකය නංවාලන වැඩ පිළිවෙළකට අදියරින් අදියර ක්‍රියාත්මක වන බව. දෙ වැන්න, මෙවර සෙස් බද්ද අය කරන්නේ ඉකුත් වසරේ දේශිය කෘෂි ආර්ථිකය නංවන්නට දැමූ පදනම මත කෘෂි කර්මාන්ත නංවාලීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට බව පැහැදිළිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට සලකා බලන්න පුලුවන් මෙවර අය වැය තුළින් ජාතික ආර්ථිකයක් කරා යන ගමනට මොන වගේ යෝජනාද ඉදිරිපත් වෙලා තියෙන්නේ කියලා. එක යෝජනාවක් තියෙනවා. තිරිඟු පිටි ගෙන්වීම අධෛර්යමත් කරන්න, ආනයන බද්ද වැඩ කරන බවට එහෙම කරන්නේ දේශීය සහල් ආශ්‍රිත පිටි කර්මාන්තය වාගේම මුං ඇට, කව්පී, කුරහන්, තල වැනි වගා කටයුතු නංවන්න.

ඒත් එක්ක නැඟෙනහිර කලාපයේ දැනට දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනයෙන් සියයට 25ක් වගා කළත් දේශීය පරිභෝජනයට අවශ්‍ය බඩ ඉරිඟු ප්‍රමාණය වගා කරන්න අවශ්‍ය භූමිය, තාක්ෂණය හැකියාව අපට තියෙනවා. එම තත්ත්වය තේරුම් අරගෙන අතිගරු ජනාධිපතිතුමා බඩ ඉරිඟු වගා භූමි ප්‍රමාණය අක්කර හැත්තෑදාහ දක්වා වගා කරන්නට ලබන වසර තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව අය වැයේ සඳහන් වෙලා තියෙනවා. එය යුද්ධය හේතු කොට ගෙන ආර්ථික ජීවිතය කඩා වැටුණු නැඟෙනහිර ජනතාවට වගේම කෙටි කාලයකින් වැඩි ආදායමක් ලබා ගන්න කටයුතු කරන දකුණේ ජනතාවට ද ඉතා වැදගත් වේ යැයි මා විශ්වාස කරනවා.

බඩ ඉරිඟු වගා කටයුතු වාගේම රජයේ තීරණය කරන විවිධ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය සේවකයාගේ පාර්ශ්වයෙන් ලැබෙන සහයෝගය අසතුටුදායක බව මා සඳහන් කරන්න කැමතියි. ඒ තත්ත්වය තුළ ආයෝජකයෝ නැවත හැරී යනවා. අපි අය වැයෙන් බලාපොරොත්තු වන ප්‍රතිලාභ අහිංසක ජනතාවට ලබා දෙන්න එය බරපතල විධිහට බලපානවා.

මා ඉහත සඳහන් කළා වාගේ දේශීය කර්මාන්ත නංවන්න මෙවර අය වැයෙන් තීරණය කරලා තියෙනවා. එය ඉතා වැදගත්. දැනට දේශීය පරිභෝජන අවශ්‍යතාවෙන් සියයට විසිපහක් පමණ විවිධ බාධක දුෂ්කරතා මධ්‍යයේ කිරි ගොවියන් නිෂ්පාදනය කළ ද, ඔවුන් එතැනින් නතර වෙනවා. මොකද, ආනයනය කරනු ලබන කිරි පිටි වෙළඳ පොළ තුළ බහුල නිසා. එවැනි තත්ත්වයක් තුළ එම කර්මාන්තය නඟා සිටුවන්න බැහැ. ඒ නිසා ආනයනය කරනු ලබන කිරි පිටි මත බද්දක් පනවන්න ගත්ත තීරණය මා අගය කරනවා. ඒ වගේම කිරි පරිභෝජනය දිරි ගන්වන්න දිළිඳු පවුල්වලට රුපියල් දෙසීයක මාසික සහනාධාරයක් දෙන්න අය වැයෙන් ගත් තීරණය නැවත වටයකින් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට බලපෑමක් වන බව මා විශ්වාස කරනවා.

මෙවර අය වැයෙන් සීනි කර්මාන්තය නඟා සිටු වන්නට පියවර ගෙ තිබීම ගැන ඇතැම් අය බොරුවට කලබල වෙලා. එක පාරටම මොකද කියලා අහනවා. මේ ගමන එක වර ආපු ගමනක් නොවේ. ගිය වර අය වැයෙන් දැමූ පදනම තවත් ශක්තිමත් කිරීමක් විතරයි. මේ වන විට හිඟුරාන සීනි කර්මාන්තයේ නිෂ්පාදන කටයුතුවලට අවශ්‍ය බොහෝ පියවර අරන් අවසන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යැපුම් කෘෂි කර්මාන්ත මට්ටමින් නොනැවතී විදේශීය වෙළෙඳ පොළ තරගකාරී ලෙස හැසිරෙන්න ඕනෑ. තරගය තුළින් ඇති වන වාසිය වන්නේ පාරිභෝගිකයාට ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ පරිභෝජනය කිරීමට ලැබීම පමණක් නොවේ. දේශීයව ඒ සඳහා විශේෂිකරණය වූ නිෂ්පාදන කලාප නිර්මාණය වීම සිදු වෙනවා. මෙයට අනුව යම් කෘෂි නිෂ්පාදනයන් මුල් කරගෙන අපනයන ඉලක්ක කර ගනිමින් ගම්මාන බිහි කරන්නට මෙවර අය වැය තුළ විශාල ඉඩක් ලැබිලා තිබෙනවා. එම තත්ත්වය ශක්තිමත් දේශීය ආර්ථිකයක් තහවුරු කරන්නට හොඳ පෙලඹවීමක්. බොහෝ නිෂ්පාදන වලට සාපේක්ෂව කෘෂි නිෂ්පාදනය තුළ විශාල අවධානයක් පවතිනවා. මන්ද නිෂ්පාදන ජීව කාලය අලෙවි කර ගැනීමට පවතින උපරිම කාල සීමාව මෙවැනි තත්ත්ව නිෂ්පාදනයට අලුතින් එකතුවන නව නිෂ්පාදකයා අධෛර්වත් කරන්නට හේතුවක්. නමුත් ඒ සඳහා නිශ්චිත වෙළෙඳ පොළක් හොඳ මිලක් ලැබෙනවා නම් නිෂ්පාදකයා දිරිමත් වෙනවා. ඉදිරි වෙළඳ ගිවිසුම වැනි තීන්දු මේ ප්‍රශ්නයට ඉදිරිපත් කළ විසඳුම් අතර වෙනවා. මෙවර අය වැය තුළ දේශීය වෙළඳ පොළ පුළුල් කරන්න ආනයනය කරනු ලබන කෘෂි නිෂ්පාදන මත බද්දක් තීරණය කරලා තිබෙනවා. මේකෙන් වෙන්නේ ආනයනය දුර්වල වෙලා දේශීය කෘෂි කර්මාන්තය වර්ධනය වීමක්.

අපනයන කෘෂි කර්මාන්තය සලකා බලන විට තේ, පොල්, රබර් යන සුළු අපනයන බෝග දිරි ගැන්වෙන සැලසුමක් ලෙස මෙවර අය වැය හඳුන්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රට සංවර්ධනය කරන කොට විවිධ ප්‍රශ්න ගැටලු මතු වන්නට පුළුවන්. අප කළ යුත්තේ ඒවා විවේචනය කරන එක නොවේ. යමක් කොතැනින් හෝ ආරම්භ කිරීමයි. අප නැඟෙනහිර කලාපයේ

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

අලුතින් අක්කර ලක්ෂයක් වගා කරන වැඩ පිළිවෙලට යොමු වෙලා තියෙනවා. නව බෝග වගා ඇති කරන්න කටයුතු කරලා තියෙනවා. උදාහරණයක් වශයෙන් නැඟෙනහිර කලාපයේ දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිද්දෙන් හෙක්ටයාර් එකසිය විස්සක් සෝයා බෝංචි වගාකරන්න කටයුතු කරලා තියෙනවා. කෘෂි කර්මාන්තයට කෙළින්ම බලපාන ප්‍රදේශයේ වාරිමාර්ග පද්ධති හා මංමාවත් සංවර්ධනය කරන්න කටයුතු කරලා තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙරට විද්වතුන් කළ අධ්‍යයන වලින් හෙළි කළ කරුණු වලට අනුව අප රටේ අනාගතය සාර්ථක කර ගන්න කටයුතු කළ යුතු බව මා විශ්වාස කරනවා. අපේ රටේ කෘෂි නිෂ්පාදන ඇතුළු සමස්ථ නිෂ්පාදන වලට සෙතක් සැලසෙන්නට නම් වෙළඳ පොළ අතර සබඳතාවත් ඇති කරන්න ඕනෑ කියලා මා විශ්වාස කරනවා. ඒකට අපිට වැඩ පිළිවෙළක් අවශ්‍යයි. එවිට අපට ඒකාධිකාරී වෙළඳපොළ බිඳ දමන්නට හැකියාව ලැබෙනවා. ඒ වාසිය මෙරට අහිංසක ජනතාවට අත් විඳින්නට හැකියාව ලැබෙනවා. කෘෂි කර්මාන්තයේ තාක්ෂණික පැත්තද දියුණු කරන්න ඕනෑ. අපනයන සැකසුම් කලාප වාගේම අය වැය තුළ යෝජනා කළ අපනයන ගම්මාන තව තවත් වැඩි කරන්න ඕනෑ. තෝරාගත් විශේෂිත ඉලක්ක වෙළඳ පොළ කරා අපි යොමු වෙන්න ඕනෑ. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු සඳහා බුද්ධිමතුන්ගේ දායකත්වය තවදුරටත් වැඩි කර ගන්න ඕනෑ. වැඩි අස්වැන්න වගේම වැඩි ප්‍රතිඵලදායී බෝග වගා දිරි ගන්වන්න ඕනෑ. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ බිහිවන රැකියාවන්හි සුරක්ෂිතභාවය තහවුරු කරන වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එසේම කෘෂි නිෂ්පාදන වලට අගය එකතු කිරීම කරනු ලබන වැඩ සටහන්වලට යන්න ඕනෑ. ඒවාගේම දේශීය ආයෝජකයන්ට බාධා කරන සාම්ප්‍රදායික රාජ්‍ය සේවයෙන් ඉවත්වී අලුතින් හිතන්න රාජ්‍ය සේවකයා පුරුදු වෙන්න ඕනෑ කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාට මා සඳහන් කළ යෝජනා සලකා බලන්න කියලා මා ඉල්ලා සිටින අතරම, ගරු ඇමතිතුමා ඇතුළු එම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සිදු කරන කාර්යයන් පිළිබඳව මා විශේෂයෙන් ස්තූති කරන්නත් මෙය අවස්ථාවක් කර ගන්නවා.

[பி. ப. 12.47]

**ගරු එම්. ටී. හසන් අලි මහතා**
(மாண்புமிகு எம். ரி. ஹசன் அலி)
(The Hon. M. T. Hasen Ali)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த மூன்று தசாப்தங்களாக இந்த நாட்டில் வேரூன்றிப்போயுள்ள இனப்பிரச்சினைக்கான தீர்வை எட்டுவதற்கு யுத்தம் ஒன்றுதான் சிறந்த வழி என்ற பிடிவாதமான நிலையில் இந்த நாட்டை ஆட்சி செய்யும் அரசாங்கம் செயற்பட்டுக்கொண்டிருக்கும் வேளையில், யுத்தத்தின் ஒரு பங்காளியாக இல்லாமலேயே அதன் பக்கவிளைவு களினால் சிறுகச்சிறுக அழிந்துகொண்டிருக்கும் வடக்கு, கிழக்கு முஸ்லிம் சமூகத்தின் குரலாக ஒரு சில விடயங்களை இங்கு கூறலாம் என எழுந்து நிற்கின்றேன்.

வடக்கு, கிழக்கு முஸ்லிம்களின் இருப்பைக் கேள்விக் குறியாக்கும் பல நிகழ்வுகள் மிகவும் கச்சிதமாகவும் காட்டமாகவும் பல்வேறு பரிமாணங்களில் எமது பிரதேசங்களில் தற்பொழுது அரங்கேற்றப்பட்டு வருகின்றன. "கிழக்கு மண்ணை மீட்டு கிழக்கில் வாழும் மக்களுக்கு நிம்மதியையும் நிரந்தர அமைதியையும் தருவோம்" என்ற கோஷத்துடன் நடைபெற்ற கிழக்கு மாகாண சபைத் தேர்தலும்கூட அங்கு வாழ்கின்ற ஒவ்வொரு முஸ்லிம் சகோதரனின் எதிர்காலத்திலும் பல கேள்விக்குறிகளை வரைந்து விட்டுச் சென்றுள்ளது. கிழக்கு மாகாண சபையின் உத்தியோக பூர்வ கொடியில் முஸ்லிம்களின் இருப்பு கேள்விக்குறியாக்கப்பட்ட சம்பவத்துடன் ஆரம்பமாகிய இந்த அவலம், இன்று பல விதமான வடிவில், குறிப்பாக அவ்வப்போது அறிவிக்கப்படும், அவசரமாக அரைகுறையாகச் செயற்படுத்தப்படும் அபிவிருத்தித் திட்டங்கள், புனித பூமிகளை அடையாளமிடும் கோடுகள், சூழல் மாசடை வதைத் தடுக்கும் தயாள சிந்தனைகள், மற்றும் வன வளங்களைக் காக்கும் பரோபகாரங்கள், பொருளாதார அபிவிருத்தியைப் பலப்படுத்தும் பெருந்தன்மைகள், உயர்கல்வியை ஊக்குவிக்கும் உள்ளார்ந்த திணிப்புக்கள், சுற்றுலாத்துறையைப் பெருக்கும் உயர்ந்த எண்ணங்கள் போன்ற இன்னோரன்ன திட்டங்களி னூடாக மர்மமான முறையில் ஊர்ந்துவந்து எமது பிரதேசங்களில் படிகின்றது. இந்த உண்மைகளை நன்கு உணர்ந்துகொண்ட பின்னரும் உணர்வற்ற ஜடங்களாகவும் பேசமுடியாத ஊமை களாகவும் கேட்க முடியாத செவிடர்களாகவும் நாம் இருக்க வேண்டுமென எதிர்பார்க்கும் நிர்வாகம் இப்பொழுது எமது பிரதேசங்களில் எம்மை ஆக்கிரமித்துக் கொண்டுள்ளது.

வடக்கிலுள்ள முஸ்லிம்களுக்கு அன்று ஏற்பட்ட துரதிஷ்ட நிலைமை இந்தச் சபையும், இந்த நாடும் நன்கு அறிந்த தொன்றாகும். எதிர்பாராத ஒரு நாளில் திடீரென அவர்களுக்கு நடந்து முடிந்த அந்த அவலம் இன்று கிழக்கிலுள்ள முஸ்லிம் களையும் நோக்கி மெல்லென ஊர்ந்து வந்து கொண்டிருக்கின்றது. முஸ்லிம் சமூகத்தினர் இந்நாட்டில் பல நூற்றாண்டு காலமாக வாழ்ந்துவருகின்ற வரலாறுகள் தெளிவாக இருந்தும், இந்த நாட்டை அந்நியர்கள் ஆட்கொள்ள முயன்ற போதெல்லாம் ஆட்சிபுரிந்த மன்னர்களுக்கு உதவி ஒத்தாசைகள் புரிந்து ஆக்கிரமிப்பிலிருந்து நாட்டைக் காப்பாற்றிய வரலாறுகள் தெட்டத்தெளிவாகத் தெரிந்திருந்தும், இன்று அந்த வரலாற்று ஏடுகள் எல்லாம் கிழித்தெறியப்பட்டு, எமது சமூகம் வெறுமையான தெனக் கொச்சைப்படுத்தப்படுவதை எண்ணி நாம் வேதனைப்பட வேண்டியிருக்கின்றது.

இனவாதச் சிந்தனை என்ற நச்சு விதைகள் அரசியல் இலாபங்களை இலகுவாகப் பெற்றுக்கொள்வதற்கான ஒரு சாதனமாக அன்றைய தலைமைத்துவங்களால் விதைக்கப்பட்ட மிகவும் கொடூரமான காலகட்டத்தில்கூட கொச்சைப்படுத்தப்படாத எமது சமூகம், இன்று ஏன் இவ்வாறு இலக்கு வைக்கப்படுகின்றது என்பதனை எம்மால் புரிந்துகொள்ள முடியாமல் இருக்கின்றது. எம்மை நோக்கி வீசப்படும் கணைகளுக்கு இந்த அரசில் உள்ள பொறுப்புவாய்ந்த, ஆட்சியின் மையக்கருவில் கொலுவீற்றிருக் கின்றவர்கள் பதில் கொடுக்காமல் மௌனம் சாதித்து வருவது என்பது எமக்கு பெரும் ஆச்சரியமாக இருக்கின்றது. பட்டும் படாமலும் தொட்டும் தொடாமலும் அதிகார வட்டத்தின் எல்லையில் சுற்றிவரும் ஒரு சிலர் தமக்கு இட்ட கட்டளையை நிறைவேற்றுவதுபோல், சில ஆறுதல் வசனங்களைப் பேசுவத னால் எமது சமூகத்தின் ஆதங்கத்தை அடக்கிவிடமுடியாது. இந்நாட்டின் அரசியல்சாசனத்தில் எல்லா சமூகத்தினருக்கும் சம அந்தஸ்தும் கௌரவமும் உறுதிப்படுத்தப்பட்டிருப்பதனால்தான் நாம் எமது அந்தஸ்தையும் கௌரவத்தையும் பாதிப்படையாது காப்பதற்காக அவ்வப்போது குரல் கொடுத்துக் கொண்டு வருகின்றோம். அரசியல்சாசனத்தில் இல்லாததொன்றை நாம் தட்டிப்பறிக்க என்றுமே துணியவில்லை. இந்நாட்டு அரசியல் சாசனத்தில் இங்கு ஒரே ஒரு சமூகம்தான் சகல உரிமையுடனும் வாழ முடியும் என்றும் ஏனையவர்கள் வந்தான்வரத்தான்களும் வியாபாரிகளும்தான் என்று குறிப்பிடப்பட்டிருந்தால், எமது மூதாதையர்கள் இந்த மண்ணை மறந்து என்றோ இந்த நாட்டைவிட்டு வெளியேறியிருப்பார்கள். நாமும் வேறு நாட்டின் பிரஜைகளாகப் பிறந்திருப்போம். பல நூற்றாண்டுகளாக இந்நாட்டை ஆண்ட மன்னர்களும், சுதந்திரம் கிடைப்பதற்கு முன்பு இந்நாட்டை ஆக்கிரமித்திருந்த வெள்ளையர்களும் சுதந்திரம் பெற்ற பின்பு தோன்றிய தலைவர்களும் வாழ்ந்த காலங்களில் எல்லாம் இல்லாதிருந்த ஒரு கெடுபிடி இன்றைய காலகட்டத்தில் இங்கு மையம் கொண்டிருப்பதென்பது இலகுவாகத் தட்டிக்கழிக் கக்கூடிய விடயமல்ல. சிறுபான்மைச் சமூகத்தினருக்கெதிராகக் கருக்கொள்ளும் தீய எண்ணங்கள் களையப்படுவதற்கான திட்டங்களுக்கு இந்த வரவு - செலவுத்திட்டத்தில் முன்னுரிமை வழங்கப்படவில்லை. வெறுமனே கட்டிடங்களை எழுப்புவதால் மட்டும் இனப்பிரச்சினைக்குத் தீர்வுகாண முடியாது. மனித மனங்களுக்கிடையில் புரிந்துணர்வுகளை வளர்ப்பதற்கான திட்டங் களுக்கு முன்னுரிமை கொடுக்கப்பட வேண்டும்.

வடக்கில் நடைபெறும் யுத்தம் முடிந்துவிட்டால், இந்த நாட்டை இதுவரை ஆட்கொண்டிருந்த பிரச்சினைகள் எல்லாவற்றுக்கும் தீர்வு வந்துவிடாது. இதனை நாம் புரிந்துகொள்ள வேண்டும். சென்றவாரம் பூநகரி வெற்றிகொள்ளப்பட்டதை அறிவிக்கும் வகையில் இந்தச் சபைக்கு நமது நாட்டின் தேசியக் கொடியைக்

கொண்டுவந்தார்கள். தேசியக் கொடி என்பது இந்த நாட்டின் சகல பிரஜைகளுக்கும் புனிதமான தொன்றாகும். எதிர்க்கட்சி ஆசனங்களில் இருப்பவர்களும் இந்நாட்டின் பிரஜைகள்தான் என்ற மனோபாவம் ஆளும் தரப்புக்கு ஏற்பட வேண்டும். அவ்வாறான ஒரு பரந்த மனப்பாங்கு அவர்களிடம் இருந்திருந்தால் இவ்வாறான நிகழ்வுகள் ஏற்பட்டிருக்க முடியாது. நாட்டின் தேசியக்கொடி என்பது ஆட்சிசெய்யும் அரசாங்கத்துக்கு மட்டுமே சொந்தம் என்ற ஒரு தவறான சிந்தனை இன்று இந்நாட்டின் பெரும்பான்மை மக்களின் மனதில் விதைக்கப்பட்டு வருகின்றது. இந்நாட்டு யுத்தத்தில் இறப்பவர்கள் எல்லோரும் தேசியக் கொடிக்கு உடைமையாளர்கள்தான். இந்த உண்மையை உணர்ந்து அதனை வலுப்பெறச் செய்யும் வகையில் இந்த வரவு-செலவுத்திட்டத்தில் பாதுகாப்புக்காக ஒதுக்கப்பட்டுள்ள நிதி செலவிடப்பட வேண்டும். அதன் மூலந்தான் இந்த நாட்டை எம்மால் கட்டியெழுப்ப முடியும்.

கிழக்கு மாகாணம் மீட்கப்பட்டதாகக் கூறப்பட்டதற்குப் பின்பு அம்மாறை, திருகோணமலை, மட்டக்களப்பு மாவட்டங்களில் அவசர குடியேற்றத் திட்டங்கள் மறைமுகமாக நடைபெற்று வருகின்றன. இதன் காரணமாக இன்று அம்பாறை மாவட்டத்திலே ஒலுவில், பொத்துவில், செங்காமம், சாஸ்திரவெளி, சம்மாந்துறை, இஸ்மாயில் புரம் மற்றும் திருகோணமலை மாவட்டத்திலே மூதூர், அறபா நகர், கிராந்தியமலை, புல்மோட்டை போன்ற முஸ்லிம் பிரதேசங்களிலும் வாழ்கின்ற முஸ்லிம் மக்கள் அச்சத்துடன் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அதேநேரம் மட்டக்களப்பு மாவட்டத்திலே புலிகளிடமிருந்து விடுவிக்கப்பட்ட ஏ-5 பாதையின் ஊடான முஸ்லிம்களின் காணிகளும் இன்று இந்தக் குடியேற்றத் திட்டங்களுக்குள் உட்படுத்தப்பட்டிருப்பதாக மக்கள் புலம்பிக் கொண்டிருக்கின்றார்கள். இம்மாவட்டங்களில் கடந்த காலங்களில் அமுல்செய்யப்பட்டு வந்த பாரிய அபிவிருத்தித் திட்டங்களின் பின்னணியிலே தங்கள் காணிகளை இழந்த அனுபவங்களின் காரணமாகவே இவர்கள் இன்று இவ்வாறு அச்சப்படுகின்றார்கள்.

அதேநேரம் அம்பாறையிலே கல்லோயா அபிவிருத்தித் திட்டம், பன்னல் ஓயாத் திட்டம், அம்பலம் ஓயாத் திட்டம் போன்ற நீர்ப்பாசனத் திட்டங்களின்போதும் சீனிக் கூட்டுத்தாபனம் போன்ற பொருளாதார மேம்பாட்டுத் திட்டங்களின்போதும் முஸ்லிம் மக்கள் தங்களது காணிகளை இழந்துள்ளனர். பின்னர் அவற்றில் சில திட்டங்கள் கைவிடப்பட்டிருந்தபோதிலும் அந்தக் காணிகள் அவர்களிடம் மீளளிக்கப்படவில்லை. இதேபோன்று 1954 இலும் திருமலை முஸ்லிம் மக்களின் சுமார் நாலாயிரம் ஏக்கர் காணிகள் பறிபோயின. 1967 இல் வானாறு திட்டம் நடைமுறைப் படுத்தப்பட்டபோது மட்டும் அவர்கள் அங்கு சுமார் மூவாயிரம் ஏக்கர் காணிகளை இழந்தார்கள். அதுமட்டுமல்ல, 1976 இல் புதிய தேர்தல் தொகுதிகள் ஏற்படுத்தப்பட்டுப் புதிய நிர்வாக எல்லைகள் வகுக்கப்பட்டபோது, முஸ்லிம்கள் கணிசமான அளவு பாதிக்கப் பட்டுள்ளனர். அதேவேளை கந்தளாய், அல்லை, மொறவெவ, மதளிக்குளம், பதவிய, மஹாதிவுலுவெவ ஆகிய திட்டங்கள்மூலம் பெரும்பான்மைக் குடியேற்றங்கள் மேற்கொள்ளப்பட்டு மாவட்ட சனப் பரம்பல் விகிதாசாரம் மாற்றியமைக்கப்பட்டது. கிழக்கில் துரித மகாவலித் திட்டத்தின்கீழ் மட்டும் 390,000 ஏக்கர் நிலத்தில் குடியேற்றம் செய்யப்பட்டது. அம்பாறையில் 29,000 ஏக்கரிலும் மட்டக்களப்பில் 75,000 ஏக்கரிலும் திருமலையில் 55,000 ஏக்கரிலும் குடியேற்றம் செய்யப்பட்டது. அப்போதும்கூட அந்தந்த மாவட்டங்களில் வாழ்ந்த முஸ்லிம் மக்களின் விகிதாசாரத்திற் கேற்ப அவர்களுக்குக் காணிகள் வழங்கப்படவில்லை. மாறாக இந்தத் திட்டங்களுக்குள் அகப்பட்டுக்கொண்ட அவர்களின் சொந்த நிலங்களும் ஆக்கிரமிக்கப்பட்டிருக்கின்றன. அதுமட்டு மல்ல, 1861 ஆம் ஆண்டு புதிய மாநகர சபை எல்லைகளும் மற்றும் DRO பிரிவுகளும் ஏற்படுத்தப்பட்டபோதும், 1987 இல் பிரதேச சபை எல்லைகள் வகுக்கப்பட்டபோதும்கூட குறித்த முஸ்லிம் கிராமங்களும் அவர்களுக்குரிய வயல் நிலங்களும் மிக மோசமாகப் பாதிக்கப்பட்டன. அன்று எல்லைகளைப் பிரித்தவர்கள் அந்த மக்களிடமிருந்து எவ்விதமான ஆலோசனைகளையும் பெறாமல் எதேச்சாதிகாரமாக நடந்துகொண்டனர். குறித்த முஸ்லிம் மக்கள் இன்னும் அந்தத் தாக்கத்திலிருந்து விடுபட முடியாமல் தவிக்கின்றார்கள். அதுமட்டுமல்ல, இன்றும்கூட அங்குள்ள பல பிரதேச சபைகளுக்கிடையே எல்லைப் பிரச்சினைகள் உயிர் வாழ்ந்து கொண்டிருக்கின்றன. அதேபோன்று அங்குள்ள பிரதேசச் செயலாளர் பிரிவுகளுக்கிடையிலும் எல்லைப் பிரச்சினைகள் தொடர்ந்து கொண்டிருக்கின்றன.

தற்போதுள்ள பொத்துவில் மற்றும் லகுகலப் பிரதேச சபைகள் பாணமைப்பற்று என்ற பெயரிலே ஒன்றாக இருந்தபோது, அது 472 சதுர மைல் பரப்பளவு பிரதேசத்தைக் கொண்டிருந்தது. ஆனால், அது இரண்டாகப் பிரிக்கப்பட்டபோது பெரும்பான்மைச் சமூகத்தினர் வசிக்கும் 7,085 பேர் சனத்தொகையைக் கொண்ட லகுகல பிரதேச சபைக்கு 368.2 சதுர மைல் பிரதேசம் வழங்கப்பட்ட அதேவேளை, தமிழ்பேசும் மக்கள் வசிக்கும் 19,831 பேர் சனத்தொகையைக் கொண்ட பொத்துவில் பிரதேச சபைக்கு 103.9 சதுர மைல் பிரதேசம் மட்டுமே பிரித்துக் கொடுக்கப்பட்டது. அதேபோன்று 359 சதுர மைல் பரப்பளவைக் கொண்டிருந்த சம்மாந்துறைப்பற்று இரண்டாகப் பிரிக்கப்பட்டபோது, பெரும்பான்மை சமூகத்தினர் வசிக்கும் 6,585 பேர் சனத் தொகையைக் கொண்ட வேவகம்பற்றுக்கு 260 சதுர மைல் பரப்பளவு பிரதேசம் கொடுக்கப்பட்ட அதேவேளை, தமிழ்பேசும் மக்கள் வசிக்கும் 40,704 பேருள்ள சனத்தொகையைக் கொண்ட சம்மாந்துறைப்பற்றுக்கு 99 சதுர மைல் பிரதேசம் மட்டுமே பிரித்துக் கொடுக்கப்பட்டது. இதனால் இன்றும்கூட இந்த இரு பிரதேசச் சபைகளுக்குமிடையில் எல்லைத் தகராறுகள் தொடர்ந்து கொண்டுதானிருக்கின்றன.

தற்பொழுது அம்பாறை மாவட்டத்திலே 36 வீதமாக இருக்கின்ற பெரும்பான்மைச் சமூகத்தினர் 66 வீதமான நிலப் பரப்பையும், திருமலையில் 34 வீதமாக இருக்கின்ற பெரும்பான்மைச் சமூகத்தினர் 70 வீதமான நிலப்பரப்பையும் கொண்டிருக்கின்றனர். ஆனால், தற்பொழுது கிழக்கு மாகாணத்திலுள்ள இவ்வாறான காணிப் பிரச்சினைகளுக்குத் தீர்வு காணாமலேயே அண்மையிலே கிழக்கு மாகாண சபைக் காணி ஆணையாளர் காணி இல்லாதவர்களுக்குக் காணி வழங்குவதற்கானதொரு பத்திரிகை விளம்பரத்தைச் செய்துள்ளார். கடந்த மார்ச் மாதம் 21 ஆந் திகதிய அமைச்சரவைத் தீர்மானத்துக்கு அமைவாகவே இந்த விளம்பரம் வெளியிடப்பட்டுள்ளது. அதில் குறிப்பிடப்பட்டுள்ள நிபந்தனைகளையும் மற்றும் விதிகளையும் பார்க்கின்றபோது வடக்கு, கிழக்கிலுள்ள முஸ்லிம்களை இலக்காக வைத்தே இந்த விளம்பரம் செய்யப்பட்டுள்ளதாக எண்ணத் தோன்றுகின்றது. கடந்த 30 வருடங்களாக இனப் பிரச்சினையின் பல்வேறு தாக்கத்தினாலும் யுத்தத்தினாலும் இடம்பெயர்ந்தவர்கள், திட்டமிட்ட குடியேற்றங்களால் தாங்கள் வாழ்ந்த காணிகளிலிருந்து விரட்டப்பட்டவர்கள், நீதிமன்றங்களில் விமோசனம் பெற்றும் தங்களது காணிகளை மீளப்பெற முடியாதவர்கள் போன்றோர் இந்த புதிய விளம்பரத்தினால் பாதிக்கப்பட்டுள்ளனர். தங்களது பிரதேச செயலாளர் பிரிவுகளில் அரச நிலம் ஒரு சதுர அங்குலமாவது இல்லாத காத்தான்குடி, நிந்தவூர், சாய்ந்தமருது, கல்முனை போன்ற பல முஸ்லிம் பிரதேசங்களில் வாழ்பவர்கள் மறைமுகமாக ஓரங்கட்டப்பட்டுள்ளார்கள். தங்களது மத, கலாசார விழுமியங்களுக்கமைவாக கூட்டுக் குடும்பங்களாக வாழ்பவர்கள் தண்டிக்கப்பட்டுள்ளார்கள். அதிலுள்ள இன்னும் பல நிபந்தனை களும் விதிகளும் முஸ்லிம்களின் எதிர்கால இருப்பைக் கேள்விக்குறியாக்கியுள்ளது.

சென்ற மாதம் 20 ஆம் திகதி அம்பாறை கச்சேரியில் நடைபெற்ற DCC எனப்படும் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தின்பொழுது, இந்த விளம்பர விடயத்தை நான் பிரஸ்தாபித்து அந்த குறிப்பிட்ட விளம்பரத்திலிருந்த குறைபாடுகளைப் பற்றி விளக்கமளித்ததன் பின்னர், விண்ணப் பிப்பதற்கான கால எல்லையை 31.11.2008 இலிருந்து மூன்று மாதங்களுக்கு நீடித்துத்தர வேண்டுமென்றும், அதன் பின்னர் குறிப்பிட்ட விளம்பரத்திலுள்ள தவறுகளைத் திருத்தி ஒரு புதிய விளம்பரத்தை மீண்டும் வெளியிட வேண்டுமென்றும் கோரிக்கை விடுத்திருந்தேன். அந்த ஒருங்கிணைப்புக் கூட்டத்துக்குத்

[ගරු එම්. ටී. හසන් අලි මහතා]

தலைமைதாங்கிய அமைச்சர் திருமதி பேரியல் அஷ்ரஃப், கௌரவ ஆளுநர், முதலமைச்சர் சந்திரகாந்தன் ஆகிய எல்லோரும் அதற்கு இணக்கம் தெரிவித்தனர். எனது நண்பர் சகோதரர் நவுசாட் அவர்களும் அந்தக் கூட்டத்திலே சமுகமளித்திருந்தார். அத்துடன், அந்த விளம்பரத்திலுள்ள குறைபாடுகளும் அவற்றை எவ்வாறு திருத்தியமைக்க வேண்டுமென்ற ஆலோசனைகளும் அடங்கிய ஓர் ஆவணமும் அங்கு என்னால் சமர்ப்பிக்கப்பட்டது. இந்தக் காணிகள் சம்பந்தமான விளம்பரம் பற்றியும், அதனால் முஸ்லிம்களுக்கு ஏற்படவுள்ள தீங்குகள் பற்றியும் முஸ்லிம்களுக்கான சமாதான செயலகம் தெளிவான விளக்கமடங்கிய ஒரு கைந்நூலை வெளியிட்டுள்ளது. அதன் சுருக்கமான ஆங்கில பிரதியினை *ஹன்சாட்*டில் சேர்த்துக் கொள்வதற்காக இங்க *சமர்ப்பிக்கின்றேன். தயவுசெய்து இதனை ஆவணப்படுத்தி உதவுமாறு உங்களை வேண்டிக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்தில் நடைபெற்ற அன்றைய கூட்டத்தில் எடுக்கப்பட்ட முடிவுகள் இன்றும் நிறைவேற்றப்படவில்லை என்பதனை மிக்க மனவருத்தத்துடன் நான் தெரிவித்துக் கொள்கின்றேன். தற்பொழுது கிராம சேவை உத்தியோகத்தர்கள் பிழையான நிபந்தனைகள் அடங்கியுள்ள அந்த விளம்பரத்திற்கு அமைவாக விண்ணப்பங்களைச் சேகரித்து வருவதாக எமக்கு முறைப்பாடுகள் வந்துகொண்டிருக்கின்றன. இதுபற்றி அம்பாறை அரசாங்க அதிபரிடம் நான் வினவியபோது, மாவட்ட ஒருங்கிணைப்புக் கூட்டத்தின்போது அளிக்கப்பட்ட வாக்குறுதி இன்றும் நிறைவேற்றப்படவில்லை என்பது தெளிவாகின்றது. என்னால் அந்தக் கூட்டத்தில் பிரஸ்தாபிக்கப்பட்ட விடயங்களை அரசாங்கத்தில் அங்கம் வகிக்கும் அமைச்சர்களும் பிரதி அமைச்சர்களும் முதலமைச்சரும் ஆளுநரும் ஏற்றுக்கொண்ட போதிலும்கூட இவர்களுக்கெல்லாம் மேலே உள்ள சக்திகள் எமது சமூகத்தினருக்கு எதிராகக் காய்களை நகர்த்துவதை எம்மால் உணர முடிகின்றது. கிழக்கு மாகாணத்தில் உள்ள முஸ்லிம்கள் சம்பந்தப்பட்ட காணிப் பிரச்சினைகள் எல்லாம் இவ்வாறுதான் ஒவ்வொரு காலகட்டத்திலும் கிடப்பில் போடப்படுகின்றன. இதேபோன்று பொத்துவில் பிரதேசத்திலுள்ள கரங்கோவா காணி விடயமும் அந்த மாவட்ட ஒருங்கிணைப்புக் கூட்டத்தின்போது என்னாலும், பிரதி அமைச்சர் மயோன் முஸ்தபாவினாலும் பிரஸ்தாபிக்கப்பட்டது.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු එම්. ටී. හසන් අලි මහතා**
(மாண்புமிகு எம். ரி. ஹசன் அலி)
(The Hon. Hassen Ali)
Give me two more minutes, please.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Okey, only two minutes.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு எம். ரி. ஹசன் அலி)
(The Hon. Hassen Ali)
அம்பாறை ஒருங்கிணைப்புக் கூட்ட மட்டத்தில் இவ்விடயம் பலமுறை ஆராயப்பட்டு, அக்குழுவின் தலைவியாக இருக்கின்ற அமைச்சர் பேரியல் அஷ்ரஃப் அவர்கள் நேரடியாக அந்த வயற்காணிக்குச் சென்று பார்வையிட்டு வந்த பின்னரும்கூட 'முஸ்லிம்களுக்கான காணி விவகாரம்' என்ற ஒரே காரணத்துக்காக இந்த விடயம் இன்னும் இழுத்தடிக்கப்பட்டு வருகின்றது. அன்றைய கூட்டத்தின்போது குறிப்பிட்ட இடத்திற்குச் சென்று இறுதியாக மீண்டும் ஒருமுறை பார்வையிடுவதற்கான ஒரு குழுவும் அமைக்கப்பட்டது. அந்தக் குழு தீர்மானித்த திகதியில் பார்வையிடச் செல்ல முயற்சித்தபோது மீண்டும் எமக்கு எதிராகக் காய்கள் நகர்த்தப்பட்டன. அம்பாறையில் நடைபெறும் ஒருங்கிணைப்புக் கூட்டம் வெறும் கண்துடைப்பாகவும், அரசாங்கத்தின் சில திட்டங்களை சிறுபான்மையினர்மீது திணிப்பதன்மூலம் அவர்களின் அடிப்படைப் பிரச்சினைகளைத் தட்டிக்கழிக்கும் சாக்கடைக் கூட்டமாகவும் மாறிவிட்டிருக்கின்றது. மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் மக்களின் பிரச்சினைகளுக்காகத் தீர்வைத் தேடி அங்கு செல்வதை ஓர் அலட்சியப்போக்குடன்தான் அக்கூட்டம் நோக்குகின்றது. இதுபற்றி அரசாங்கத்தின் அங்கமாகவுள்ள அமைச்சர்களும், பிரதி அமைச்சர்களும்கூட விசனப்பட்டுக் கொள்கின்றார்கள். ஆனால், அவர்களால் ஒரு குறிப்பிட்ட படிகளை மஇட்டுந்தான் தாண்ட முடியுமென்பது தெளிவாகின்து.

நான் கிழக்கு மாகாண சபையின் ஒரேயொரு அமர்வில் கலந்து கொண்டு உரையாற்றியபொழுது, அந்த மாகாணக் கொடியில் முஸ்லிம்களின் இருப்பை உறுதிசெய்யும்வகையில் மாற்றம் கொண்டுவரவேண்டுமென்று தெரிவித்தவேளையில், ஏற்னெவே அன்று காலையிலேயே இது சம்பந்தமாக ஆலோசித்து நடைமுறைப்படுத்துவதற்கான ஒரு குழுவை அமைப்பதற்கான தீர்மானம் எடுக்கப்பட்டுள்ளதாகவும் ஒரு மாத காலத்துக்குள் அந்தக்கொடியில் மாற்றத்தை ஏற்படுத்தித் தருவதாகவும் குறிப்பிட்டார்கள். ஆனால், நான்கு மாதங்கள் கடந்த நிலையில் இன்றுவரையில் எவ்விதமான நடவடிக்கையும் மேற்கொள்ளப்பட வில்லை. இவ்வாறு எமது சமூகம் சம்பந்தப்பட்ட பல விடயங்கள் திட்டமிட்டுக் கிடப்பிலே போடப்படுவதென்பது இப்பொழுது எமது நாட்டிலே ஒரு சம்பிரதாயமாக மாறியிருக்கின்றது.

அம்பாறை மாவட்டத்திலே மிகவும் பெரும்பான்மையாக வாழ்கின்ற தமிழ்பேசும் மக்கள் தமது பிரதேசத்தின் நிர்வாக நடவடிக்கைகளைத் தமது தாய்மொழியிலேயே மேற்கொள் வதற்கான வாய்ப்புக்களை யதார்த்தமான முறையில் ஏற்படுத்திக் கொடுக்க இந்த அரசு முன்வரவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් ගත කරන්න.

**ගරු එම්. ටී. හසන් අලි මහතා**
(மாண்புமிகு எம். ரி. ஹசன் அலி)
(The Hon. Hassen Ali)
I will wind up now.

அந்த மாவட்டத்தில் தமிழ்பேசும் மக்கள் வாழ்கின்ற மூன்று தேர்தல் தொகுதிகளையும் இணைத்து ஒரு புதிய மாவட்டத்தை உடனடியாக உருவாக்குவதன்மூலம் மட்டும்தான் எதிர்காலத்தில் அவர்களுடைய நிருவாக நடவடிக்கைகள் யாவற்றையும் இழுத்தடிப்புக்கள், கிடப்பில் போடல்கள், காய் நகர்த்தல்கள் போன்றவற்றிலிருந்து காப்பாற்றிக்கொள்ள முடியும். இவ்விடயத்தில் தமிழ் சமூகம் அதனது நிலைப்பாட்டைத் தெளிவுபடுத்த வேண்டுமென நாம் எதிர்பார்க்கின்றோம். எமது உரிமைகளைப்பற்றி நாம் பேசும் பொழுது எம்மைப் பிரிவினை வாதிகள் என்றோ அல்லது பயங்கரவாதிகள் என்றோ நீங்கள் முத்திரை குத்தவேண்டாம். இந்த நாடு பிரிவுபடுவதை எமது சமூகம் என்றுமே ஏற்றுக்கொள்ளப்போவதில்லை. அதேநேரத்தில் எமது உரிமைகளைப் பெறுவதற்காக எவ்விதமான வன்முறைகளையும்

---
***** **කථාව අවසානයේ පළ කර ඇත**
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

நாம் பிரயோகிக்கப்போவதுமில்லை. ஆயுதக் கலாசாரத்துக்குள் மாட்டிக்கொண்ட முஸ்லிம் இளைஞர்களை மீட்டெடுத்து, எமது உரிமைகளை ஜனநாயக வழியிலே பெற்றுக்கொள்வதற்காகத்தான் எமது மறைந்த தலைவர் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் 'ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ்' என்னும் எமது கட்சியை ஆரம்பித்தார். அந்தக் கோட்பாட்டிலிருந்து முஸ்லிம் காங்கிரஸ் ஒருபொழுதும் மாறுபடவில்லை என்பதை உறுதியாகக் கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

*සභා මේසය මත තබන ලද ලියවිල්ල :
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
*Document tabled:*

**Peace Secretariat for Muslims**

Comments on the procedures devised by the Land Commissioner General to implement the Government policy on control of encroachment and alienation of State Land

(Edited version)
Compiled by M. H. M. Salman

General

On the 21st March 2008 he cabinet of Ministers approved a set of new policies with a view to control of encroachment of state land and the proper management & administration thereof.

**Issues arising out of provisions of the circular**

**1. Unjust Eligibility criteria**

(*a*) Denial of right to individuals who have constructed a permanent house and live therein (on land owned by parents)

In Sri Lanka, as a general rule, children tend to live with parents. More often than not children continue to live with parents even after marriage or securing employment. Some of others live with parents due to poverty. Construction of a permanent house on land owned by parents is not conclusive proof or indicative of such individual own land or not in need of state land for himself. In the North and East majority live in community or together due to the conflict and for safety reasons.

**(*b*) Denial of right to individuals who own land**

Circular identifies three categories of land owners. They are land owners, individual owning land in other divisions and individuals who own "Some extent" of land for residential, agricultural or commercial purposes.

Individuals own land in varying extent. In the absence of a definition to the phrase "own land" it is open to interpretation. Individuals who own one perches of land to hundreds of acres are treated similarly. Purpose of the government is to address landlessness; if that is no individuals owning small piece of land should not be deprived.

**(*c*) Denial or right to individuals who is likely to inherit land**

In legal terms inheritance is something an individual may receive in the future upon the death of somebody. A person may likely to inherit land from parents, relatives or even from anybody for that matter. Inheritance is not a certain thing and cannot be accurately predicted. An individual who is likely to or legally entitled to inherit might not eventually inherit due to a supervening incident.

**2. Clarity of the word "eligible citizen"**

The circular does not interpret or describe who is eligible to apply. No upper or lower age limit is set. It is also not clear whether the spouse and/or children of an eligible individual are also entitled to apply on their own right?

**3. Powers granted to Land ministers**

Wide ranging powers have been conferred on Land Ministers at the center and the provinces to determine the extent of land alienated to an individual under the new scheme. Conflict of interest, prejudice or even political bias may well prevail over rational decision making based on reasonable criteria.

**4. Deletion of name from divisional register**

Specific provision is made in the circular to delete the name of an applicant from the register in certain circumstances. That is in the event of refusal to accept land offered to him from an adjacent division in situations where no sufficient state land is available in a division where applicant resides.

**5. Pending applications**

Implementation of the circular instructions may have an adverse impact on the applications for land alienation and regularization of encroachments that are pending at different stages of approval. The circular set a deadline for finalization of pending cases; however no clear procedure is spelled out to dispose of pending applications. Further complications are bound to surface due to the strict application of section 20A of the Land Development Ordinance.

**Other issues**

**1. Displaced persons and registration**

The circular has not considered the presence of displaced individuals in many parts of the country. Displacements have taken place due to the conflict, tsunami and other natural and man made disasters. Muslims of the Northern Province are living out side of their homes for the last 18 years. Commencement of registration will definitely affect their interest and cause them irreparable loss. Land and property issues of displaced have already posed serious concern to the victims as well as policy makers.

**2. Secondary occupation of land and legal impediments**

Due to the conflict large numbers of individuals have abandoned their land and houses and live in other areas. In some instances third party have been occupying such land (Secondary occupation). The situation is acute in the Northern Province where Muslims have been forced out 18 years ago. Though legal remedies are available the continuing conflict environment and other difficulties have prevented from institution of actions to recover properties.

**3. Demarcation of divisional boundaries and boundary disputes**

In certain districts the divisional boundaries are not property determined and gazetted. Due to this certain villages are subjected to counter claims by two divisions. Some of these disputes and counter claims are not resolved for long periods of time.

More often than not divisions are created for political expediency than on a rational basis and on needs. Divisions are sometimes created in haste without proper assessment of resources and demography. As a result divisions are created with little or no land availability for population expansion or development. This problem is very acute in the Eastern Province.

**4. Problems associated with small divisions**

*Ad hoc* creation of divisions has resulted in geographically small divisions (in terms of land area). Common feature among these divisions is the high density of population and non availability of land for alienation or for essential development activities. Communities and individuals in these divisions compete for land and other resources sometimes leading to conflicts and straining of relationship. In these divisions more people enjoy less land whilst in others divisions less people enjoy more land.

**5. Land ownership after Tsunami**

Tsunami also created special category of landless persons. As a direct result of Tsunami a large extent of land was lost and subsequent declaration of buffer zone also deprived large number of people of their land. In addition due to the declaration certain individuals were left with small pieces of land.

**6. Ambiguity of language**

Circulars issued by the Secretary, Ministry of Land and Land Development and the Land Commissioner General are inconsistent on one important point.

According to the Ministry circular the extent of land that will be alienated in future will be determined by the Land Minister in Colombo in consultation with the respective provincial land ministers. Whereas the circular issued by the Commissioner states that the government and the provincial council will determine the extent of land.

The Government and the Provincial Councils are distinct entities vis-à-vis the cabinet and provincial Ministers. Divisional level officers will face difficulties in the implementation if this ambiguity continues.

**Recommendation** — Clear and uniform instructions should be issued to avoid confusion

**7. Usurpation of powers of provincial Councils**

The question is whether the circulars have the effect of taking away powers of Provincial Councils in respect of land. Is the consent of Land ministers of the provinces is sufficient to implement far reaching policy decisions touching on devolved subjects?

**8. Legality of the circular**

Circular issued by the Land Commissioner General has express provision varying and amending regulations issued under the Land Development Ordinance and Land Grant Ordinance.

Is the Land Commissioner General is empowered to amend or vary regulations framed under Ordinances through circular?

[අ. භා. 1.06]

**ගරු ජීවන් කුමාරණතුංග මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Jeewan Kumaranatunga—Minister of Land and Land Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අප රටට ඵලදායි විෂයන් කිහිපයක් පිළිබඳව කෘෂිකර්ම, වාරි මාර්ග සහ ඉඩම් යන විෂයයන් පිළිබඳව- සාකච්ඡා කරන මේ මොහොතේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා හැටියට අදහස් දක්වන්නට ඉඩකඩ ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මා හිතන හැටියට මේ විවාදයේදී ඉඩම් ප්‍රශ්න සම්බන්ධයෙන් ඒ තරම් ගැටලු මතු වුණේ නැහැ. කෙසේ වෙතත් සිවශක්ති මන්ත්‍රීතුමා 1995න් පස්සේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල අනවසරයෙන් පදිංචි වුණු අයට බලපත්‍ර ලබා දීම පිළිබඳව ඉල්ලීමක් කළා. ඇත්ත වශයෙන්ම ඉඩම් කච්චේරි පැවැත්වීම හරහා ඒ අවශ්‍ය ඉඩම් බලපත්‍ර ලබා දෙන්නට අප මේ වන විටත් උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් කොමසාරිස්වරුන්ට උපදෙස් දීලා තිබෙනවා. ඒ වාගේම එතුමා යෝජනා කළා, ඒ ඉඩම් දීමනා පත්‍ර උකස් කරන්නට එහෙම නැත්නම් දැවැද්දක් වගේ එහෙම අවශ්‍ය මොහොතකදී ප්‍රධානය කරන්නට අවශ්‍ය පසු බිම සකස් කළ යුතුයි කියලා. අපි ඒ සඳහාත් මේ වන විට කටයුතු කර තිබෙනවා. ඒ ඉඩම් සංවර්ධන පනත සංශෝධනය කරන්නට පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පනත් කෙටුම්පත සම්මත වූ වහාම අපට හැකියාව ලැබෙනවා, ඒ පනත තුළ තිබෙන ඒ කොන්දේසි අවම කිරීම හරහා ඒ පහසුකම් ලබා දෙන්නට.

ඒ වාගේම ගරු සුබසිංහ මන්ත්‍රීතුමා කුඹුරු ඉඩම්වල ප්‍රමාණය අක්කර එක හමාරකට වඩා අඩු කිරීම පිළිබඳව යෝජනාවක් තළා. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නයත් ඉඩම් ජනාවාස මෙහෙයුම් කමිටුවේ සාකච්ඡාවට භාජන වෙමින් තිබෙනවා. එම කමිටුවේ නිරීක්ෂණ ලැබුණු වහාම ඒ ආකාරයට කටයුතු කරන්නට අපට හැකි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්ත වශයෙන්ම ඉඩම් විෂයය පිළිබඳව කථා කරනවා නම්, මා හිතන්නේ රටක් හැටියට බොහොම සීමිත ඉඩම් සම්පතක් අපට තිබෙන්නේ. මේ ඉඩම් සම්පත අපි මේ රටටත්, මේ රටේ ජනතාවටත් ඵලදායී විධියට පරිහරණය කිරීම තුළ රටක් හැටියට විශාල ඉදිරි ගමනක් යන්නට අපට හැකියාව ලැබෙනවා. කෘෂි කාර්මික රටක් හැටියට එදා 1970-77 කාලයේ, - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ - ක්‍රියාත්මක වුණු කෘෂි ආර්ථික වැඩ පිළිවෙළ පිළිබඳව අදත් මේ රටේ ජනතාව බොහොම ප්‍රසාදයෙන් කථා කරනවා. ඒ වැඩ පිළිවෙළේ විවිධ අඩු පාඩුකම් තිබෙන්නට ඇති. නමුත් අපි 1977න් පස්සේ ඒ අඩු පාඩුකම් හදා ගෙන ක්‍රමවත් විධියට කෘෂි කාර්මික වශයෙන් අපේ රට ස්වයංපෝෂිත කරමින්, ඒ වාගේම විවෘත ආර්ථිකයේ ඵලදායී තත්ත්වයන් අපේ ආර්ථිකයට යොමු කර ගනිමින් කටයුතු කරන්නේ නැතිව, සම්පූර්ණයෙන්ම ඒ ආර්ථික ක්‍රමය වෙනස් කිරීම නිසා ඇත්ත වශයෙන්ම අද මේ වන කොට අපි අර්බුද ගණනාවකට මුහුණ දී තිබෙනවා. අද ලෝක ආර්ථිකය විශාල පසු බෑමකට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම ලෝකයේ විවිධ රටවල් මුහුණ දීපු යම් යම් ආහාර අර්බුද නිසා පසු ගිය කාලය තුළ අපේ රටට විශාල බලපෑමක් ඇති වුණා. අපේ රටට විවිධ බලපෑම් ඒ හරහා එල්ල වෙලා තිබෙනවා. අපි දකිනවා, මේ ආහාර අර්බුදයේදී ජනතාව වීථි බහිද්දී ලෝකයේ විවිධ රටවල්, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු පූජ්‍ය උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේ මුලසුන ගන්නවා ඇති.

***අනතුරුව ගරු රේණුකා හේරත් මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ரேணுகா ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வண.) உடவத்தே நந்த தேரர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) RENUKA HERATH *left the Chair, and* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *took the Chair..* LOKUBANDARA] in the Chair.

**ගරු ජීවන් කුමාරණතුංග මහතා**

(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க )

(The Hon. Jeewan Kumaranatunga)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මා කියමින් සිටියේ ලෝක ආහාර අර්බුදය හමුවේ අපට එල්ල වී තිබෙන විවිධ බලපෑම් පිළිබඳවයි. ඒ රටවල ඇති වුණු ආහාර අර්බුද හමුවේ ඒ රටවල ජනතාව නැඟිටිද්දී, විරෝධතාවන් පිකටිං පවත්වමින් වීථි බහිද්දී සමහර අවස්ථාවල ඒ රජයන්ට ඒවා පාලනය කර ගන්නට වෙඩි තබන ලෙස අණ කරන්නට සිද්ධ වුණා. මේ වාගේ තත්ත්වයන් තුළ ඒ රටවල අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යන් අපනයනය කිරීම වහාම නවත්වා දැම්මා. මේ අවස්ථාවේ දී අපට ප්‍රශ්නයක් මතු වුණා. පසු ගිය කාලය තුළ දී අපට පාලනය කර ගන්නට බැරි විදියට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ ගියා. මොකද, වසර ගණනාවක් තිස්සේ විවෘත ආර්ථිකය තුළ අප හුරු වෙලා හිටියේ ලාබෙට බඩ පුරවා ගන්නයි. අත්‍යවශ්‍ය ආහාර නැව් වරායට එන තුරු බලා ගෙන සිටින්නට අපට පුරුදු කළා. ඒ තුළින් ලාබෙට බඩ පුරවා ගන්න ක්‍රමයකුයි අපට හුරු කර තිබුනේ. නමුත් වර්තමාන ජනාධිපතිතුමාත්, රජයත් මේ තත්ත්වයන් බොහොම සැලකිල්ලට අරගෙන ආරම්භයේ පටන්ම මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වාගේම කෘෂි ආර්ථිකය ශක්තිමත් කරන්නට අපේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රට තුළ නිෂ්පාදනය කර ගැනීම පිළිබඳව එතුමා සහ රජය විශේෂ අවධානය යොමු කර තිබෙනවා. එම නිසයි මේ අය වැය යෝජනාවලිය තුළින් විවිධ බදු පැන වීම් කළේ. විපක්ෂය අද කථා කරන්නේ මේබදු පැන වීම්වල තිබෙන අඩු පාඩුකම් පිළිබඳවයි. අය වැය යෝජනාවලියක් ඉදිරිපත් කර ඊට පසුව දා මේකේ ප්‍රතිපල බලාපොරොත්තු වෙනවා නම් ඒක විහිළුවක්. ඇත්ත වශයෙන්ම මේ යෝජනාවලිය සජීවි එකක් බවට පත් කරන්නට අපට විශාල වැඩ කොටසක් ඉදිරියේදී කරන්නට තිබෙනවා. ඒ සඳහා වූ වගකීම තිබෙන්නේ රජයට විතරක් නොවෙයි. විපක්ෂයටත් මේ සඳහා විශාල කාර්ය භාරයක් පැවරෙනවා. මේ මොහොතේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු කිසිවෙක් මේ ගරු සභාවේ නැහැ. එක මන්ත්‍රීවරියක් විතරක් ඉන්නවා. විපක්ෂය හැම දාම හුරු වෙලා තිබෙන්නේ සාම්ප්‍රදායික විධියට

විවේචනය කිරීමට මිසක් මේ රටේ ජනතාවට සැබෑ පණිවුඩය දී ජනතාව උනන්දු කරවා මේ පවතින අඩු පාඩුකම් සකස් කර ගෙන රටේ ජනතාව සංවිධානය කර රටක් හැටියට නැඟිටින්නට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නට නොවෙයි. විපක්ෂයටත් මෙහිදී විශාල වගකීමක් පැවරෙනවා. නමුත් අවසානාවකට අද විපක්ෂයෙන් ඒ වගකීම ඉටු වන්නේ නැහැ. අඩු පාඩු පමණක් විවේචනය කරමින් රජයට ඇඟිල්ල දික් කිරීමයි අද විපක්ෂයෙන් සිද්ධ වන්නේ. එම නිසා ආණ්ඩු පක්ෂයේ මහජන නියෝජිතයන්ට මේ කාර්යයට නායකත්වය දෙන්නට විශාල කාර්ය භාරයක් පැවරෙනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒ වාගේම රටක් හැටියට නැඟිටින්නට පුරවැසියන්ගේ පැත්තෙනුත් අපට විශාල වග කීමක් පැවරෙනවා. ආණ්ඩුවට විතරක් වුවමනාව තිබූ පළියට මේ රට නඟා සිට වන්නට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, රජය පිළිබඳව කවර අර්ථකථන දැක් වුවත්, එහි භූමිය පිළිබඳව සාධකය අතිශයින්ම වැදගත් වෙනවා. අද නැගෙනහිර මුදා ගැනීම පිළිබඳව අප සන්තෝෂ වෙනවා. ඒ වාගේම වන්නියේ විශාල භූමි ප්‍රදේශයක බලය තහවුරු කර ගැනීම පිළිබඳව අප සතුටු වෙනවා. ඒ වාගේම ඒ ජයග්‍රහණ පිළිබඳව අපේක්ෂාවෙනුයි අප සිටින්නේ. කෙසේ වෙතත්, මෙහි අවසාන ජයග්‍රහණය වන්නේ රාජ්‍යයෙහි ස්වාධිපත්‍යය, ස්වාධීනත්වය, නිදහස හා භෞමික අඛණ්ඩතාව අප මාතෘ භූමිය තුළ නිර්මාණය කිරීමයි. එබැවින් රටේ භෞමික අඛණ්ඩතාව සපථ වූ අපගේ මාතෘ භූමියට වග කියන ප්‍රධානතම අමාත්‍යාංශයක් ලෙස අප ඉඩම් අමාත්‍යාංශය දකිනවා. අඛණ්ඩ භූමියක, නිදහස් වූ භූමියක, නිවහල් වූ භූමියක, සිංහ ධජය ඔසවන නිමේෂයේ දී එම භූමිය මනාව කළමනාකරණය කර, මනාව ශික්ෂණය කර අනාගත ලාංකික ශිෂ්ටාචාරය ගොඩ නැඟීමේ වගකීම සියලු දෙනා සතු අභියෝගයක් බව අප පිළිගත යුතු වෙනවා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අපේ මව් බිම කොතරම් සාරවත්ද, මේ මව් බිම තුළ කොතරම් ඛනිජ සම්පත් සැඟ වී තිබෙනවාද කියා සලකා බැලුවොත්, පුල්මුඩේ සිට කිරින්ද වෙරළ දක්වාත්, රට මැදට යන භූමි භාගයන් තුළත්, ඒ වාගේම සාගර පතුළ තුළත් බොහෝ ඛනිජ සම්පත් ව්‍යාප්ත වී තිබෙනවා.

අප රජය ''අපි වවමු - රට නඟමු'' වැනි දැවැන්ත කෘෂි නිෂ්පාදන වැඩ පිළිවෙළකට අවතීර්ණ වුයේ මෙන්න මේ ඉඩම් සංවර්ධනය විය යුතු දිශාව පිළිබඳව මනා අවබෝධකිනුයි. බහු ජාතික සමාගම්වලට මේ භූමියේ සාරය උරා බීමේ මාර්ගය නිර්මාණය කිරීම අපගේ ඉඩම් ප්‍රතිපත්තිය නොවේ. විදේශිකයින්ට මේ රටේ ඉඩම් සින්නක්කරව ලියා දීමේ ද්‍රෝහී ප්‍රතිපත්තිය හා ක්‍රියා මාර්ග අද අපි හකුළා දමා තිබෙනවා. දහස් ගණනින් මව් බීමේ විරුවන් සටන් කර රැක ගත් අපගේ භූමිය බන්දේසියක තබා පුද දීමට ඒ දැරූ උත්සාහයන් අපි මේ වන විටත් ව්‍යර්ථ කර තිබෙනවා. ඒ වෙනුවට අප රජයේ ප්‍රතිපත්තිය වී ඇත්තේ ඒ මාතෘ භූමියේ අයිතිය මෙරට ස්වදේශික ජනයා වෙත පවරා දීමයි. ඒ අනුව මහින්ද චින්තන වැඩ පිළිවෙළ හරහා මේ පෝෂිත වූ අපගේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන විෂයට අදාළව ඒ විෂය තුළ අද ඒ ප්‍රගතිය කරා යන්නට පියවර රාශියක් ගෙන තිබෙන බව මා මේ අවස්ථාවේදී සතුටින් සිහිපත් කරන්නට ඕනෑ. ඒ සඳහා ඉඩමේ අයිතිය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා හිමිකම් සහතික ලබා දීමේ වැඩ සටහන ඒ වාගේම රජය මඟින් බෙදා දුන් ඉඩම්වල කොන්දේසි ඉවත් කර පූර්ණ අයිතිය ජනතාවට ලබා දීම, ඉඩම් කැබලි ලක්ෂයක් බෙදා දීමේ වැඩසටහන, මහජනතාවට ඉඩම් බෙදා දීමේ දී විනිවිදභාවයකින් කටයුතු කිරීම සඳහා ඉඩම් කච්චේරි පවත්වා එවැනි ක්‍රම වේදයන් හඳුන්වා දීම වාගේම අනවසරයෙන් ඉඩම් අල්ලා ගැනීම වළක්වා ගැනීම සඳහාත් අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. මොකද අපි දන්නවා, පසු ගිය කාලය පුරාම මේ රජයේ ඉඩම් අනවසරයෙන්, ඇගේ හයියට අල්ලා ගෙන පසුව දේශපාලනඥයින් හරහා ගිහිල්ලා මේවා බලපත්‍ර සකස් කර ගැනීම කැලෑ නීතියක් බවට පත් වෙලා තිබුණු බව. නමුත් මේ තුළින් නීතිගරුක ජනතාවට විශාල අසාධාරණයක් වනවා. ඒ නිසා මේ සඳහා අපි අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඉදිරියේ දී මේ අනවසර අල්ලා ගැනීම් කිසිසේත්ම ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට සුදුසුකමක් නොවන ආකාරයට කටයුතු කරන්න අපි අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි අඩ පණ වී තිබූ ඒ ඉඩම්වල ආදායම් ලබා ගැනීමේ ක්‍රමය නැවත අපි ස්ථාපිත කරලා තබෙනවා. ඒ වාගේම බෞද්ධ විහාරස්ථානවලට අවශ්‍ය කරන ඉඩම් බලපත්‍ර ලබා දීම සිදු කර තබෙනවා. මොකද, අපට විශාල වශයෙන් විහාරස්ථානවලින් මේ සම්බන්ධව පැමිණිලි ඉදිරිපත් වුණා. ඒ බලපත්‍ර නොලැබීම නිසා විශේෂයෙන් රජයේ ඉඩම්වල තිබෙන විහාරස්ථානවලට ඒ බලපත්‍ර ලබා දීමේ ක්‍රමය තුළ යම් යම් අසාධාරණකම් සිද්ධ වෙනවාය කියලා ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගෙන් අපට පැමිණිලි ඉදිරිපත් වුණා. මේ සම්බන්ධව ගන්නා ක්‍රියා මාර්ගය පිළිබඳව අපි මහා නායක ස්වාමීන් වහන්සේලාගෙන් එකඟත්වය ලබා ගත්තා. උන්වහන්සේලා අපට පූර්ණ ආශීර්වාදය පළ කළා. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබිලා අප ඒ අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

වසර විස්සකට පසු ජාතික සිතියම් සංග්‍රහය එළි දැක්වීම, ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සම්මත කර ගැනීම වගේම එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය පසු බිම සකස් කිරීම, රන්බිම ගෙවතු සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සංවර්ධන යෝජනා ක්‍රම සඳහා පෞද්ගලික ඉඩම් අත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා ක්‍රමවත් වන්දි ගෙවීමක් සකස් කිරීම සිදු කළා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, පසු ගිය කාලය තුළ අපි රටේ යම් කිසි සංවර්ධන කටයුත්තකට ඉඩම් පවරා ගැනීමක් කළොත් ඒ අය හුරු වෙලා තිබෙන්නේ මේ රජයේ ඉඩම් පවරා ගැනීම හරහා ඒ ගොල්ලන්ට සාධාරණ වන්දියක් ලැබෙන්නේ නැහැයි කියන තත්ත්වය තුළ ඔවුන් සියලු දෙනා නඩු මාර්ගයට යන්න කටයුතු කිරීමයි. ඒ නිසා අපේ ඒ සංවර්ධනය වැඩ කටයුතු විශාල වශයෙන් ප්‍රමාද වනවා. අපි මේ වන විට බොහොම සාධාරණ වන්දි ක්‍රමයක් යෝජනා කරලා සැප්තැම්බර් මාසයේ පළමු වැනි දා ඉඳන් ඒ ආකාරයටයි අපි වන්දි ගෙවන්නේ. ඒ කියන්නේ අපි යම් කිසි භූමියක්, නිවසක් පවරා ගත්තොත් ඉදිරි අනාගතයේදීත් ඒ පවුලට මේ භූමියෙන් මොන ආකාරයට ප්‍රයෝජන ගත හැකි ද කියන මට්ටමටත් තක්සේරු කරන්නට අවශ්‍ය නීති රීති සකස් කරලා තිබෙනවා.

කෙසේ වෙතත් මෙවැනි සංවර්ධන ක්‍රියා දාමයක් ක්ෂේත්‍රයේ සිදු කරන මොහොතේ ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් යොදා ගැනීමේ ගැටලුවකට අපි - 2008 වර්ෂයේ දී - මුහුණ දී සිටිනවා. ඒ අනුව මැනුම් නිලධාරින්ගේ හිඟය මඟ හරවා ගැනීමට කඩිනම් මිනුම් කටයුතු සඳහා බලයලත් මිනින්දෝරුවන්ගේ සහාය ලබා ගැනීමට සිදු වූ අතර, අතිරේක මිනින්දෝරුවන්ගේ සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා අපි මේ වන විටත් විශ්වවිද්‍යාල කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරමින්, ඒ අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා. තවද, ඉඩම් අමාත්‍යාංශය හා ඒ හා බැඳි ආයතන සඳහා ''තරුණ අරුණ'' වැඩසටහන යටතේ අපි මේ වන විටත් උපාධිධාරින් 140ක් බඳවා ගන්නට අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට වෙන් කළ වෙලාව අවසානයි.

**ගරු ජීවන් කුමාරතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமனரணதுங்க)
(The Hon. Jeewan Kumaranatunga)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, එහෙම නම් මගේ කථාවේ ඉතිරි කොටස මා සභාගත* කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස මා ඔබ වහන්සේගෙන් ඉල්ලා සිටිනවා.

*සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled:*

මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස 1935 දී නීතිගත කළ ඉඩම් සංවර්ධන අංඥා පනත යටතේ මේ වන විට අක්කර ලක්ෂ 30ක් පමණ මෙරට ස්වදේශික ජනයා අතට බෙදා දී ඇත.

තවද, එම ආඥා පනත යටතේ නිකුත් කරන බලපත්‍ර සහ දීමනා පත්‍ර සඳහා යොදා ඇති අනු බෙදීම් කිරීමට ඇති සීමාවන් පිළිබඳ කොන්දේසි ඉවත් කිරීම සඳහා මහජනයා හා විවිධ සංවිධාන ආදියෙන් ලැබුණු ඉල්ලීම් සලකා බලා පදිංචිය සඳහා දී ඇති ගොඩ ඉඩම්වල අදාළ කොන්දේසි ඉවත් කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති අතර, ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥාපනතේ සංශෝධිත කෙටුම්පත සභාගත කිරීම සඳහා මෙම ගරු පාර්ලිමේන්තු වෙත භාර දී ඇත.

මේ පනත සංශෝධනය මගින් පවුල් ලක්ෂ 15කට පමණ තම පදිංචි ඉඩම්වලට පූර්ණ අයිතිය කිසිදු බැඳීමකින් තොරව ලබා දීමේ ප්‍රගතිශීලී පියවරකට අප සේන්දු වී ඇත.

මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස, මා මුලින් සඳහන් කළ පරිදි වගා කටයුතු දිරිමත් කිරීම සඳහා වගා ඉඩම් ප්‍රතිපත්ති යටතේ වගා ඉඩම් ලක්ෂය වැඩසටහනේ ඉලක්කයෙන් සියයට 80ක් සපුරා ඇත්තෙමු.

තවද, පසුගිය වකවානුව තුළ අක්‍රියව පැවති ඉඩම් කච්චේරි ක්‍රමය නැවත සක්‍රිය කිරීම මඟින් ජනතාව වෙත ඇති ඉඩමේ හිමිකම් පිළිබඳව ඇති බොහෝ ගැටළු විසඳා ලීමට අද අපට හැකියාව ලැබී ඇත.

මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස, මේ රටේ බෞද්ධ විහාරස්ථාන සඳහා රජය සතු ඉඩම් ලබා දී තිබෙන අතර, ඒවා එම විහරස්ථානවල අයිතියට පත් කිරීම පිළිබඳව ගැටළු පැවතුනි.

විශේෂයෙන්ම මෙම ඉඩම්වල භාරකාරත්වය සඳහා පත් කළ භාරකාර මණ්ඩලය ක්‍රියාත්මක නොවීම මේ සඳහා ප්‍රධාන ගැටළුවක්ව පැවතුණ. එහෙත් එම තත්ත්වය සලකා බලා සංවර්ධනය කර ඇති විහාරස්ථාන සඳහා සෘජුවම දීමනා පත්‍ර ලබා දීම ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලාගේ ආශිර්වාදය සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස, රජය බෙදා දෙන ඉඩම් සඳහා බදු මුදල් අය කර ගැනීම පිළිබඳව පැහැදිලි ප්‍රගතියක් මේ වන විට අප දක්වා ඇත. 2007 වර්ෂයේ ඇස්තමේන්තු කළ බදු ආදායම වන මිලියන 333 ඉක්මවා මිලියන 361ක් අයකර ගැනීමට අපට හැකි වී තිබේ.

මෙහිදී විශේෂයෙන්ම පළාත් සභා හා ප්‍රාදේශීය සභා බදු මුදල් අය කර ගැනීම පිළිබඳව උනන්දු කරවීමේ තීරණ රාශියක් මේ වන විට ගෙන ඇති අතර, 2008 වර්ෂයේ ඇස්තමේන්තු කළ ඉඩම් බදු ආදායම සපුරා ලීමටද කටයුතු කෙරේ.

එලෙසම ඉඩම් අමාත්‍යාංශය යටතේ සාර්ථකව ක්‍රියාත්මක වූ බිම් සවිය ඉඩම් හිමිකම් පවරා දීමේ වැඩසටහන සඳහා 2008 වර්ෂයේදී මිලියන 500ක් පමණ මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් අතර එහි ඉදිරි කටයුතු සඳහා ද මිලියන 500ක් 2009 වර්ෂයට වෙන් කර තිබීම ප්‍රශංසනීය වේ.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වඩාත් කාර්යක්ෂම කරනු වස් එහි යටිතල පහසුකම් දියුණු කිරීමේ සමස්ත වැඩ පිළිවෙළක එක් පියවරක් ලෙස මහල් තුනකින් යුත් ගොඩනැගිල්ලක් ඒ සඳහා ඉදි කිරීමට අවශ්‍ය කටයුතු බත්තරමුල්ල ප්‍රදේශයේ අප ආරම්භ කර ඇත.

මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස, සියළු ඉඩම් සංවර්ධන කටයුතුවලදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව සිදු කරන කාර්යභාරය අති මහත් අතර, වසර 20කට පසුව 2008 වර්ෂයේදී ලංකා සිතියම් සංග්‍රහය නව සංස්කරණය ප්‍රසිද්ධියට පත් කිරීම අප ලද විශේෂ ජයග්‍රහණයක් ලෙස සලකමු.

තවද, විධිමත් කෘෂිකාර්මික වගාවන්ට ඉඩකඩක් නැති නාගරික ප්‍රාදේශවල ගෙවතු වගා කිරීම සඳහා අවශ්‍ය දිරිමත් කිරීමේ වැඩසටහනක් ලෙස "රන්බිම" ව්‍යාපෘතිය කොළඹ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව අප ආරම්භ කර ඇත. මෙහි දී අප අමාත්‍යාංශයේ ඉඩම් පරිහරණ සැලසුම් අංශය මඟින් අවශ්‍ය උපදෙස්, බීජ සහ පොහොර ප්‍රතිලාභීන් වෙත ලබා දෙන අතර, මෙම වැඩසටහන සඳහා මේ වන විට ගෙවතු ලාභීන් 12,150ක් පමණ ඉතා උනන්දුවෙන් දායක වී ඇත.

මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස, මෙලෙස ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මෙරට සංවර්ධන ක්‍රියාවලි උදෙසා සක්‍රියව දායකත්වය ලබා දෙන මොහොතේ ඒ සඳහා මා සමඟ කටයුතු කරන ගරු නියෝජ්‍ය අමාත්‍ය චන්ද්‍රසිරි සූර්යආරච්චි මැතිතුමා සහ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයත්, අමාත්‍යාංශයට අයත් ආයතනවල ප්‍රධානීන් සහ ඒවායේ කාර්ය මණ්ඩලයත් සිදු කරන කාර්යභාරය මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරමි.

මෙරට ජනයාගේ සුබසෙත උදෙසා අප මව්බිමේ භූමි සම්පත මනාව කළමණාකරණය කර අනාගත දැක්මකට මෙහෙය වීමේ කාර්යභාරයට අප සියළු දෙනාම අත්වැල් බැඳගෙන පෙරමුණ ගැනීමේ අවශ්‍යතාව සිහිපත් කරමින් මම මාගේ වචන ස්වල්පය අවසන් කරමි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ගරු වීරකුමාර දිසානායක මන්ත්‍රීතුමා

[අ. භා. 1. 22]

**ගරු පී. වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு பீ. வீரகுமார திஸாநாயக்க)
(The Hon. P. Weerakumara Dissanayake)
මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස, අද දින විශේෂයෙන්ම කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් පැවැත්වෙන මේ විවාදයේ දී කරුණු ඉදිරිපත් කරද්දී මූලිකව ඉදිරිපත් වුණු කරුණක් අපි දැක්කා. අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේ දී පොදුවේ මේ සමස්ත අය වැයට අදාළව ගොඩ නැඟුණු සංකල්පය තමයි, පසු ගිය කාල සීමාවේ අපේ රටේ අපි ලබපු අත් දැකීම්. විශේෂයෙන්ම 1977න් පසුව අපේ කෘෂි කර්මාන්තය විශාල පරිහානියකට ලක් වුණු බව අපි දන්වා. කෘෂි ජීවන රටාව බිඳ වැටුණා. ඒ විතරක් නොවෙයි, නැවත 2000 වර්ෂය වන කොට "Regaining Sri Lanka" වැඩ පිළිවෙළ යටතේ තවත් සෝදා පාළුවකට -

**ගරු දි. මු. ජයරත්න මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ. எம். ஜயரத்ன - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. D. M. Jayaratne - Minister of Plantation Industries)
2000 අවුරුද්දේ දී සහල් මෙට්‍රික් ටොන් 2,000ක් පිට රටත් යැව්වා.

**ගරු පී. වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு பீ. வீரகுமார திஸாநாயக்க)
(The Hon. P. Weerakumara Dissanayake)
ඔබතුමාගේ කාලයේ නොවෙයි.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ. எம். ஜயரத்ன )
(The Hon. D. M. Jayaratne )
භාරලක්ෂ තිස්දාහක කුඹුරු අක්කර ප්‍රමාණයක් වපුරලා -

**ගරු පී. වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு பீ. வீரகுமார திஸாநாயக்க)
(The Hon. P. Weerakumara Dissanayake)
"Regaining Sri Lanka" ගෙනාවේ ඔබතුමන්ලාද? 2001 වර්ෂයේ "Regaining Sri Lanka" වැඩ පිළිවෙළ යටතේ නැවත වටයකට කෘෂිකර්මය බිඳ වැටීම වීමේ බරපතල සැත්කමක් ආවා. මේ රට එතැනින් එහාට නැවත නඟා සිටුවීමේ වුවමනාවක් මුළුමහත් ජාතියක් විධියට අපට තිබුණා. කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් අවධානයක් මේ රටේ ගොඩ නැඟුණේ එතැන ඉඳලායි. අද වන කොට අපට අපේ ජාතික ආර්ථිකයක් ගැන කල්පනා කරන්නට සිදු වෙලා තිබෙනවා; ජාතික ආර්ථිකයක් ගැන කථා කරන්නට සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ හැම අවස්ථාවකම ජාතික ආර්ථිකයේ මූලික සැකැස්ම, පදනම සකස් වන්නේ, එහි අත්තිවාරම වැටෙන්නේ කෘෂි කර්මාන්තයත් එක්කයි. ඒක අපි කවුරුත් අවිවාදයෙන් පිළිගන්නා කරුණක්. ඒ නිසාම එක පැත්තකින් අපේ රටේ සමහර ව්‍යාපෘති සඳහා යොදවන මුදල් ප්‍රමාණයට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් කෘෂිකර්ම

අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කෘෂි කර්මාන්තය සඳහාත්, එහි විවිධ ක්ෂේත්‍ර සඳහාත් යොදවන්නට අපට පුළුවන් වුණා නම් එහි නියම ඵල ප්‍රයෝජන ජාතියට ලබා දෙන්න, රටට පලබා දෙන්න අපට පුළුවන්කම ලැබෙනවා. මොකද, හැම විටම අපේ ආර්ථිකයේ පදනම සකස් වෙලා තිබෙන්නේ, අපේ ආර්ථික සංවර්ධනයේ මූලික අත්තිවාරම වැටිලා තිබෙන්නේ කෘෂිකර්මය හරහා නිසා. මේ අය වැය එතැනට අදාළව පියවරක් තැබුවාට මෙන්න මේ මූලික කරුණු හරියට හඳුනා ගෙන , මිට අදාළ මුල්‍යා වෙන් කිරීම ඒ නියම බරෙන් කර ගන්න බැරි වුණු ආකාරයක් අපි දකිනවා. පොදුවේ මෙන්න මෙතැනට අදාළව තිබෙන ජාතික ආර්ථිකයකට අපි මේ රට හරවන්න ඕනෑ. නමුත් එතැන දී කෘෂි කර්මාන්තයට හිමි වන ප්‍රමාණය කොපමණද කියන වෙන් කිරීම කර ගත්තේ නැහැ.

පසු ගිය කාල සීමාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දැවැන්ත සංවර්ධනයක් අත්පත් කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. නමුත් සමහර අක්‍රමිකතා විශාල ප්‍රමාණයකට අපි මුහුණ දුන්නා. විවිධ ක්ෂේත්‍රවල ගැටළු ඇති වුණා. සමහර වෙලාවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සමහර නීති, අණපනත් විවිධ බෝග වගාවන්වල දී ගොවියාට - සමහර පැතිවලින් - හරස් වුණා. ඒ වාගේ විවිධ ක්ෂේත්‍රවල සමහර අණපනත්, සමහර පැතිවලින් ගැටුම් නීතිමය රාමු - ඉතා සරල දේ - ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඉඳලා එතැනින් උඩට එන විට සමහර වෙලාවට ගොවියාට බලපාපු තැන් තිබුණා. සමහර ගොවි සමිතිවල තිබෙන අරමුදල සමහර වෙලාවකට ගොවියාට පාවිච්චි කරන්න බැහැ. සමහර නීති, රීති, අණපනත් ඒවාට හිරවෙලා තිබෙනවා. ඒ නිසා ඒ විධියේ දැවැන්ත විද්‍යාත්මක කරුණු මත විතරක් නොවෙයි, ප්‍රායෝගික කරුණු මත හිර වුණු තැන් ගොවියාට ඕනෑ තරම් තිබෙනවා.

කෘෂි කර්මාන්තය දියුණු කරන්න අපට විද්‍යාවේ, තාක්ෂණයේ විවිධ පැති ඕනෑය කියා අපි හිතනවා. සමහර වෙලාවට ඉඩම් නැති ප්‍රශ්න තිබෙනවා. මේවා මහා බරපතළ කරුණු නොවෙයි. ගොවි ජනතාව මුහුණ දෙන ඉතා සරල කරුණු විශාල ප්‍රමාණයක් තිබුණා. ඒ නිසා අපි මුදල් කොයි තරම් යෙදෙව්වත් මෙන්න මේ සරල කරුණු නිසා ඒ මුදල්වලින් ගන්න පුළුවන් විපුල ඵල ප්‍රයෝජන ගන්න බැරි වනවා. විශේෂයෙන්ම පොහොර සංස්ථාව ගත්තොත් පසු ගිය කාලයේ එය දැවැන්ත පාඩු ලැබුවා විතරක් නොවෙයි, පොහොර බෙදා හැරීමේ දී වංචා, දූෂණ විශාල ප්‍රමාණයක් සිද්ධ වුණා. සමහර වෙලාවට පොහොර ලොරි ගණන් අතුරුදහන් වුණු අවස්ථා තිබුණා. ගොවිජන සේවා අංශය හරහා පහළට යන පොහොර ටික ගොවියාට ලැබෙන්නේ නැහැ. එහෙම වුණු අවස්ථා තිබුණා; එවැනි අක්‍රමිකතා ප්‍රමාණයක් සිද්ධ වුණා. මා හිතන විධියට දැන් යම් ප්‍රමාණයකට ඒවා විධිමත් වෙලා යනවා; ඒ සඳහා විධිමත් වැඩසටහනක් හදලා තිබෙනවා. මා කියන්නේ ඒ විධියට සාර්ථක මෙහෙයුමක් හැම ක්ෂේත්‍රයකම යනවා නම් හොඳයි කියලායි. ගොවියාට වැව් ටික ඕනෑ; පොහොර ටික ඕනෑ. ඒක රාශී කරපු වැහි වතුර ටික හරියට බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් ඕනෑ. ඒ වාගේම ඔහු අර විවිධ බන්ධනයන්ගෙන් නිදහස් කරන්න ඕනෑ.

සමිති සමාගම් ගත්තොත් අපි ඒවා හදා තිබෙන්නේ මේවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ, අවශ්‍ය පණිවුඩය යවන්නයි; අවශ්‍ය නීතිමය රාමුව සකස් කර ගන්නයි. නමුත් ඒවාම සමහර වෙලාවට ගැටලු වෙලා ගොවියා හිර වන තැන් තිබෙනවා. විශේෂයෙන්ම මට මතකයි, මම පුත්තලම දිස්ත්‍රික්කයේ ඉන්න විට වෙච්ච සිද්ධියක්. පොම්පාගාරයේ පොම්පය දැදුරු ඔය අයිනේ හයි කර තිබෙනවා, උස්සාන යෝජනා ක්‍රමයට. පොම්පයෙන් ඒ වතුර ටික ගන්න ඕනෑ. වැස්සට පොම්පාගාරය දැදුරු ඔයට කඩා ගෙන යනවා. කඩා ගෙන වැටිලා සතියයි, දෙකකයි මා එතැනට ගියා. ඒ ගොවි සමිතියේ ලක්ෂ තුන හතරක මුදලක් හිර වෙලා තිබෙනවා. ඒක නිදහස් කරන්නේ නැහැ. අර ගොවි මහත්වරුන්ට පොම්පාගාරය මෙහාට කරලා හදලා පොම්පය මෙහාට ගන්න. අන්තිමට පොම්පයයි ඔක්කොම එහාට යනවා. උස්සාන යෝජනා ක්‍රමය යටතේ වචනවා. මේ වාගේ සරල තාක්ෂණික ක්‍රමවලින් කන්න දෙකම හොඳට මේ රටේ කෘෂිකර්මයේ නියැලෙන ගොවි ජනතාව සියලු දෙනාටම මෙහෙම ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා.

අද අපි කථා කරනවා, යුද්ධයේ අවසානය ගැන. යුද්ධයේ අවසාන ජයග්‍රහණය එනවා. නැගෙනහිර පළාතේ ගොවි බිම් ටික සංවර්ධනය කරන්න අපි පියවර තියන්න ඕනෑ. හරි නම් මේ අය වැය වැඩි බරකින් අපි කියන්න ඕනෑ උතුර පළාතටයි. ආරක්ෂක හමුදාව කිලිනොච්චිය දක්වා යන මෙහෙයුම අද ක්‍රියාත්මක වෙනවා. එහි පිටුපසින් නැගෙනහිරට, උතුරට කෘෂි කාර්මික සංවර්ධනය එනවා. අපට මේ අය වැයේ ඉලක්ක කියන්න පුළුවන් වෙන්න ඕනෑ එහෙමයි. යුද්ධයේ මෙහෙයුම ඒ පැත්තෙන් යන්න ඕනෑ. ආර්ථික සංවර්ධනයේ මෙහෙයුම් මේ පැත්තෙන් යන්න ඕනෑ. සමහර වෙලාවට අප දේශපාලන විසඳුම් ගැන කියනවා. යුද මෙහෙයුම කළාට පස්සේ එන්න ඕනෑ දේශපාලන විසඳුම තමයි ආර්ථික විසඳුම. ඒ දක්වා මේ මෙහෙයුම ඉදිරියට ගෙන යන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු පී. වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு பீ. வீரகுமார திஸாநாயக்க)
(The Hon. P. Weerakumara Dissanayake)
අවසර, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, යුද මෙහෙයුම ඒ පැත්තෙන් යන කොට ආර්ථික මෙහෙයුම මේ පැත්තෙන් යන්න ඕනෑ. ආරක්ෂක හමුදාව යුද්ධය සැලසුම් කරද්දී කොහොමද අප නැගෙනහිර සංවර්ධනය කරන්නේ, කොහොමද අප උතුර සංවර්ධනය කරන්නේ, මෙහේ තිබෙන අලුත් තාක්ෂණය කොහොමද එහේට ගෙන යන්නේ යනාදිය පිළිබඳව අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරී මහත්වරුන් සැලසුම් කරන්න ඕනෑ.

අප දුටුවා ප්‍රභාකරන් වැව් බැම් හාරලා තිබෙනවා. වැව් බැම් හාරපු භූමියකුයි අපට හම්බ වෙන්නේ. කෙහොමද එතැනට අලුත් තාක්ෂණය ගෙන යන්නේ? ඒ ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කරනවා වාගේම කොහොමද ඒ ජනතාවට අවශ්‍ය කරන පහසුකම් හදන්නේ? මේවාට විසඳුම් සපයන විධියේ සැලැස්මක් බවට මේ අය වැය පත් විය යුතුව තිබුණා. සමහර ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඊට අදාළ හොඳම සැලැස්මකට අනුව අප කටයුතු කරන්නේ නැහැ.

සැලසුම්කරණය මුළු රටටම අදාළයි. ඒ සැලසුම්කරණය ඇතුළේ පහළ ගොවි සමිතියේ ඉඳලා, ගොවියාගේ ඉඳලා, ඊට පසුව ඩී. ඕ. කොට්ඨාසයේ ඉඳලා වැව දක්වා හැම පැත්තකටම ව්‍යාප්ත වන අන්තර් සම්බන්ධයක් හදන්න ඕනෑකම තිබෙනවා. ඒ වාගේම රටේ තිබෙන මූලික දේශපාලන අර්බුද කොහොමද ආර්ථිකයට බලපාන්නේ, අප කොහොමද මේ වුවමනාවන් සම්පූර්ණ කරන්නේ, යුද්ධය කොහොමද කෘෂි කර්මාන්තයට බලපාන්නේ ආදී වශයෙන් හිතලා සමහර සැලසුම් හදන්නට අපට සිද්ධ වෙනවා. එහෙම හැම පැත්තක් ගැනම හිතලා සැලසුම් හැදුවොත් තමයි අපට ජාතික ආර්ථිකය කියන එකට පණ දෙන්න කෘෂි කර්මාන්තය හරියට දායක කර ගන්න පුළුවන් වන්නේ.

රටේ සහල් අවශ්‍යතාවට කොහොමද නිෂ්පාදනය කරන්නේ, ඊට අදාළ වතුර ටික කොහොමද දෙන්නේ ආදී වශයෙන් එකින් එක, එකින් එක බැඳුණු සැලැස්මක් හදන්න ඕනෑ. ඉඩම් අවශ්‍යතාව තිබෙනවා. රටේ සහල් අවශ්‍යතාව සපුරන්න ඕනෑ. ඊට අදාළ වතුර ටික, ඊට අදාළ පොහොර ටික ලබා දෙන්න ඕනෑ. මෙන්න මේ කාරණා සඳහා එක ශතයක්වත් අපතේ නොයන්න, ගොවියාට මෙයින් උපරිම ප්‍රයෝජනය අර ගෙන දීම සඳහා සැලසුම් සහගත ක්‍රමයකට මේ මුදල් ටික යොද වන්නේ කොහොමද? එවැනි සැලැස්මක් සහිත ගමනකට අපේ රට ආ යුතුව තිබෙනවා. සමහර වෙලාවට අප පොහොර ප්‍රශ්නය වෙනම ගන්නවා. ඉඩම් ප්‍රශ්නය තව පැත්තකින් ගන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි.

**ගරු පී. වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு பீ. வீரகுமார திஸாநாயக்க)
(The Hon. P. Weerakumara Dissanayake)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මට තවත් විනාඩියක් දෙන්න. වතුර ප්‍රශ්නය තවත් පැත්තකින් ගන්නවා. එවැනි අවිධිමත්භාවයක් පසු ගිය කාලය තුළ තිබුණා. එහෙම එක් එක් ප්‍රශ්න එක් එක් පැතිවලින් ගත්තාට මේ ප්‍රශ්න තුන හතරම බලපාන්නේ එක පුද්ගලයාට; ගොවියාට. ඒ නිසා අප විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. මේ අවිධිමත්භාවය මහ හැරලා, මේ හැම ක්ෂේත්‍රයක්ම එකට සම්බන්ධ කරපු ඒකාබද්ධ වැඩසටහනකට එන්නය කියා. සමහර ක්ෂේත්‍රවල සිටින සමහර නිලධාරින්ගේ තිබෙන සැලසුම් සහගත බව අගය කරනවා වාගේම, සමහර පැතිවල තිබෙන අඩුපාඩුකම් නිවැරදිව කර ගන්නය කියන ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු අමරා පියසීලි රත්නායක මන්ත්‍රීතුමිය.

[අ. භා. 1.34]

**ගරු අමරා පියසීලි රත්නායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அமரா பியசீலி ரத்நாயக்க)
(The Hon. (Mrs.) Amara Piyaseeli Ratnayake)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම ඔබවහන්සේට ස්තුතිවන්ත වෙනවා. දේශ ගුණය, පරිසරය, පස අපේ රටේ සම්පත් හැටියට සලකනවා. ඒ අනුව බලද්දී වාරි මාර්ග, කෘෂිකර්ම, ඉඩම් කියන මේ හැම එකක්ම අපේ රටේ සම්පත් බවට අද පත් වෙලා තිබෙනවා. මේ සම්පත්වලින් අපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහාත්, ඒ වගේම රටේ සංවර්ධනය සඳහාත් කෘෂිකර්මය ඉතාම වැදගත් වෙනවා. ඒත් එක්කම කෘෂිකර්මය නංවන්නට ඉඩම් සහ වාරි මාර්ග කටයුතු ප්‍රයෝජනවත් වෙනවා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා 1977 න් පස්සේ කෘෂිකර්මය අඩාළ වුණාය කියා. එහෙම නම් මා එතුමාගෙන් අහන්න කැමැතියි ජලය නැතිව, වාරි මාර්ග ක්‍රම නැතිව කෘෂිකර්මය කරන්න පුළුවන්ද කියා. මේ රටේ විශාලම වාරි මාර්ග ක්‍රමය වන මහවැලි වාරි මාර්ග ක්‍රමය 1977 න් පස්සේ නොවෙයිද දියත් කළේ කියන එක මා එතුමාගෙන් අහන්න කැමැතියි. ඒත් එක්කම එතුමා නැවත ඇඟිල්ල දිගු කළා, 2001න් පසුව 2002 වැඩ පිළිවෙළ යටතේ ආයෙත් කෘෂිකර්මය අඩාළ වුණාය කියා. එහෙම නම් මා එතුමාට කියනවා "යළි පුබුදුමු ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ රුපියල් කෝටි හතළිස්පත් දහසකින් යටිතල පහසුකම් ඇති කරලා ව්‍යාපෘති හැටදෙකක්, - යෝජනා හැටදෙකක් - ක්‍රියාත්මක කරන්න එදා සැලසුම් කර තිබුණු බව. ඒ අනුව තමයි, විශේෂයෙන් වයඹ පළාතට ප්‍රයෝජනවත් වන දැදුරු ඔය ජලාශ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්නට කටයුතු කළේ, සැලසුම් කළේ. එදා වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යවරයාව සිටි ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා දැදුරු ඔය ජලාශ යෝජනා ක්‍රමයේ සියලු මැනුම් කටයුතු කරලා, ඒ වාගේම වන්දි ගෙවන්නට අවශ්‍ය සියලු වැඩ පිළිවෙළවල් සකස් කරලා, හැම දෙයක්ම අවසන් කරලායි තිබුණේ. ඒවාට අවශ්‍ය විදේශ ආධාර සොයා ගෙනයි තිබුණේ. ඒ නිසා මන්ත්‍රීතුමාගේ කියමන මා පළමුවෙන්ම ප්‍රතික්ෂේප කරන්න කැමැතියි. දැදුරු ඔය යෝජනා ක්‍රමයේ සැලසුම් සකස් කරලා ගෙන ගිය ඒ වැඩ පිළිවෙළ දිගටම ගෙන යන්නට අද වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා ගෙන තිබෙන පියවර පිළිබඳ ඇත්තෙන්ම මා ප්‍රශංසා කරනවා. ඇයි? රජයක් බලයට පත් වෙලා වැඩ කොටසක් ආරම්භ කරලා, ඒ වැඩ කොටස කර ගන්න බැරි වුණාම ඇතැම් දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ ඒ වැඩ කොටස වෙනත් පැත්තකට හරවනවා; එහෙම නැත්නම් ඒක නොකර සිටිනවා. නමුත් මෙතුමා දැදුරු ඔය ජලාශ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්න කටයුතු කිරීම මා අගය කරනවා වාගේම විශේෂයෙන් මා ඉල්ලා සිටිනවා, ජලාශය හැදෙන අවට ප්‍රදේශවල පදිංචි අයට වන්දි ගෙවීමේ කටයුතු පුළුවන් තරම් ඉක්මන් කරන්නය කියලා. මා හිතන හැටියට ඒක විශේෂයෙන් අවශ්‍ය දෙයක්.

ඒ වාගේම මා මතක් කරන්න ඕනෑ, දැදුරු ඔය ජලාශයෙන් ලැබෙන ජලය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලට පමණක් ගෙන යන්නට එදා සැලසුම් කළත්, අපි සාකච්ඡා කරලා ජලාශය නිසා ඉඩම් යට වන මැතිවරණ කොට්ඨාසවලටත් ප්‍රයෝජනවත් වන හැටියට එය ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙන බව.

ඒත් එක්කම, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කරන කොට, වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මුදල් යෙදවීමේදී තිබෙන පරස්පර විරෝධීතාව පිළිබඳව මතක් කළ යුතුව තිබෙනවා. "ගම නැඟුම" වැඩසටහන යටතේ වැව් ගැඹුරු කිරීම් කර ගෙන යනවා. මේ වායේ ඇස්තමේන්තු සකස් කළේ කවුද, කොහොමද? මොකක්ද මේකට තිබෙන සැලසුම? ඒක ප්‍රශ්නයක්. මට පෙනෙන හැටියට වාරි මාර්ග නිලධාරීන්ටත් නොවෙයි; වෙන කාට හෝ ඕනෑ විධියට මේ ඇස්තමේන්තු පිළියෙල කළාද කියා හිතනෙවා. ඒ ගැන අධීක්ෂණයක් තිබෙනවාද කියලා අහන්න සිද්ධ වනවා.

විශේෂයෙන් නිදර්ශනයක්, දෙකක් මා ප්‍රකාශ කරන්නම්. වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෙට්ටිගෙදර වැවේ ප්‍රමාණය අක්කර එකයි. ඒක ගැඹුරු කරන්න වියදම රුපියල් 3,74,350යි. පුබ්බෝව වැවේ ප්‍රමාණය අක්කර අටහමාරයි. ඒක ගැඹුරු කරන්න 3,75,000යි. පලාපත්වල වැවේ ප්‍රමාණය අක්කර තුනයි. ඒක ගැඹුරු කරන්නත් රුපියල් 3,75,000යි. සුන්දරගම වැවේ ප්‍රමාණය අක්කර එකහමාරයි. ඒක ගැඹුරු කරන්නත් රුපියල් 3,75,000යි. පානවගෙදර වැවේ ප්‍රමාණය අක්කර හතයි. ඒක ගැඹුරු කරන්නත් රුපියල් 3,75,000යි. ඉහළවෙල වැවේ ප්‍රමාණය අක්කර නවයයි. ඒකේ සොරොව්ව, වාන, බැම්ම සකස් කරන්නත් රුපියල් 3,75,000යි. මෙන්න මේ විධියට එකම මුදලක්. යොදා ගෙන තිබෙනවා. මොන ප්‍රමිතීන් යටතේ මේවා ඇස්තමේන්තු කළාද කියා අපට හිතා ගන්න අමාරුයි. ඒ නිසා මා හිතන හැටියට, ඒවා ප්‍රාදේශීය මට්ටමින් කෙරෙන වැඩ කටයුතු වුණත්, ඒ පිළිබඳව අපේ ඇමතිතුමාගේ විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

අනික් එක, මේ වැව් ගැඹුරු කිරීම පිළිබඳව කථා කරන කොට අපි දන්නවා, අවුරුදු ගණනක් තිස්සේ මේ වැව්වල රොන් මඩ එකතු වෙලා තට්ටුවක් හැදිලා තිබෙන බව. ඒ තට්ටුව ස්වාභාවිකවයි හැදිලා තිබෙන්නේ. ඒකෙන් මේ ජලය පතුලට කාන්දු වීම වළක්වනවා; ඉබේටම ඒ දේ සිද්ධ වනවා. නමුත් මේ වැව් ගැඹුරු කිරීම නිසා මොකද වන්නේ? ජලය පතුලට කාන්දු වන එක නැවතත් වැඩි වනවා; වතුර රඳා සිටින්නේ නැහැ. සමහර විට වැව් ප්‍රතිසංස්කරණය කරනවාය කියා දැනට ප්‍රබෝධයක් ඇති වෙයි. නමුත් අනාගතයේ ප්‍රතිඵල ඉතාමත් කනගාටුදායකයි. එහෙම නම් මෙච්චර මුදල් සම්භාරයක් වියදම් කරලා කරන වැඩ කටයුතුවල සාර්ථකත්වයක් තිබෙනවාද කියා අපට අහන්න සිද්ධ වනවා. ගණන් මිනුම් වශයෙන් තවත් ප්‍රකාශ කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ.

තවත් වැඩසටහනක් තමයි පුනර්ජීවන අරමුදල. පුනර්ජීවන අරමුදල යටතේ වැව් ප්‍රතිසංස්කරණය කරනවා; වැව් හාරනවා. ඒවායේ විශාල වෙනසක් තිබෙනවා. මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ කොන්ත්‍රාත්කාරයන්ට ඕනෑ විධියටද, වෙන

මොකක්වත් ක්‍රමයක් නිසාද කියන එක මා දන්නේ නැහැ. ඒ ගැන අපට හුඟක් දුරට හිතන්න සිද්ධ වෙයි. පුනර්ජීවන අරමුදලින් කරන්නේත් වැව් හැරීම පමණමයි. මා හිතන්නේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අනුව අක්කරයකට නිශ්චිත මුදලක් තිබෙනවා. සමහර අවස්ථාවල ඒක ඉක්මවා ගිහින් තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් මතක් කරන්න ඕනෑ.

ඒ එක්කම ඇළ වේලි ප්‍රතිසංස්කරණය ගැනත් කියන්න ඕනෑ. වැවකින් වැවකට, වැවකින් කුඹුරකට ජලය ගෙන යනවා. ඒ වාගේම තවත් වැවකට ජලය ගෙන යන ඇළ වේලි තිබෙනවා. අද මේ ඇළ වේලි ප්‍රතිසංස්කරණය කිරීමක් කෙරෙන්නේ නැහැ. ඒ නිසා ජල කළමනාකරණයක් කරන්න විධියක් නැතුව තිබෙනවා. ඒ ප්‍රතිසංස්කරණයන් හුඟක් දුරට අසාර්ථක වෙලා තිබෙනවා. ඒ එක්කම අසාර්ථක වෙච්ච මහා පරිමාණ යෝජනා ක්‍රම ගැනත් කියන්න ඕනෑ. දැදුරු ඔයෙන් වතුර ගන්න ආසියානු සංවර්ධන යෝජනා ක්‍රමයෙන් ලක්ෂ 350ක් වියදම් කරලා සෙංගල් ඔය ව්‍යාපාරය ක්‍රියාත්මක කළා. මා හිතන්නේ ඒ, 1994 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියගේ කාලයේදීයි. නමුත් අපේක්ෂිත විධියට වතුර ලබා දෙන්නට බැරි වුණා. ඊට පසු ලක්ෂ 200ක් වියදම් කරලා නැවතත් හැදුවා. දැදුරු ඔයේ වැලි හාරලා ගැඹුරු වැඩි වූ නිසා ඒකත් කර ගන්න බැරි වුණා, ඒකත් අසාර්ථකයි. තවම ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. ඒ වාගේම දැන් නැවතත් මුදල් වියදම් කරන්න සූදානමින් ඉන්නවා. ඒකවත් සාර්ථකව ඉෂ්ට කරන්නටය කියා මා ඉල්ලා සිටිනවා. අපේ ඇමතිතුමා නම් මේ සභාවේ නැහැ. ඒ වුණත් එතුමා දැන ගනීවි. ඒ නිසා ඒකවත් සාර්ථකව කරන්නය කියා මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

අනික් කාරණය තමයි පොඩි වැව් සංවර්ධනය. වයඹ පළාතේ විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේත්, වාරියපොල, පඬුවස්නුවර වැනි මැතිවරණ කොට්ඨාසවල වැඩියෙන් තිබෙන්නේ කුඩා වැව්. මහා පරිමාණයේ වැව්වලට වඩා කුඩා වැව් තමයි තිබෙන්නේ. අක්කර එකේ වැව් වෙන්න පුළුවන්. සමහර වෙලාවට අක්කර දෙකේ වැව් වෙන්න පුළුවන්. ගම නැඟුමෙන් ඒවා ප්‍රතිසංස්කරණය කර ගෙන යනවා. ඊට පසුව නැවතත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙනුත් ඒවා ප්‍රතිසංස්කරණය කරනවා. වාරිමාර්ග අමාත්‍යාංශයෙනුත් ප්‍රතිසංස්කරණය කරනවා. රාජ්‍ය නොවන සංවිධානවලිනුත් ප්‍රතිසංස්කරණය කරනවා. මේ සම්බන්ධයෙන් කිසිම මූලික පරීක්ෂණයක් කෙරෙන්නේ නැහැ. කිසිම සම්බන්ධීකරණයක් නැහැ. රජයේ මුදල් අපරාදේ වියදම් වෙනවා. මේක ප්‍රතිසංස්කරණයකට සුදුසුද නැද්ද කියා පෙර විමසුමක් නැතුවයි මේ වැඩ කටයුතු කරන්නේ. ඒ නිසා ඇත්තෙන්ම අපට කනගාටු හිතෙනවා. ඒ වාගේම ගරු කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා ඇමතිතුමා මොරගහකන්ද ජලාශය ගැන ප්‍රකාශ කළා. මොරගහකන්ද ජලාශයෙන් ගල්ගමුව, යාපහුව, නිකවැරටිය කියන මැතිවරණ කොට්ඨාසවලට ජලය ලබා ගන්න අපේ කාලයේදී සැලසුම් කරලා තිබුණා. ඒක ඒ විධියටම ක්‍රියාත්මක වෙනවාද දන්නේ නැහැ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වියළි කලාපයේ පිහිටි ඒ මැතිවරණ කොට්ඨාසවල මහා පරිමාණයේ වැව් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවාට ජලය ලබා දෙනවාය කියන්නේ රට නිකම්ම ස්වයංපෝෂිත වෙනවාය කියන එකයි. ඒ නිසා මොරගහකන්ද ජලාශයෙන් ගල්ගමුව, යාපහුව මැතිවරණ කොට්ඨාසවලට ජලය ලබා දෙනවාද කියන එක අහන්න සිද්ධ වෙනවා. මම ඒ පිළිබඳවත් මතක් කරන්න කැමැතියි. අපට පෙනෙන හැටියට මේ වැඩ කටයුතු කරද්දී මුදල් ප්‍රමාද වී ලැබෙනවා. අපට දැනෙන හැටියට ගෙවීම් වලට මුදල් ලැබිලා නැහැ. ඒ වාගේම ඊයේ අලුතින් චක්‍ර ලේඛයක් ඇවිල්ලා තිබෙනවා, වැඩ පටන් ගන්න එපාය; ගිවිසුම් අත්සන් කරන්න එපාය කියා. එහෙම චක්‍රලේඛයක් ඇවිල්ලා තිබෙනවාය කියා අපට දැන ගන්න ලැබී තිබෙනවා. සමහර විට අවුරුද්ද අවසානය නිසාද එහෙම නැත්නම් මුදල් නොමැතිකමද දන්නේ නැහැ. කොහෙම හරි ඒ ගැන අපට දැන ගන්න ලැබී තිබෙනවා.

ඒ එක්කම වාරිමාර්ග යටතේ කථා කරද්දී, වාරිමාර්ග ක්‍රමය හරහා ඇළ වේලි ශුද්ධ කරන්නේ හෝ වැව් ප්‍රතිසංස්කරණය කරන්නේ විශේෂයෙන්ම කුඹුරුවලට ජලය ලබා ගන්නටයි. මගේ මැතිවරණ කොට්ඨාසයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නෙල්ලිය ග්‍රාම නිලධාරි වසමේ හිරිවැව කියලා රජයේ වැවක් තිබෙනවා. මේ වැවේ වේල්ල අවහිර කරලා. ඒ වේල්ළ අවහිර කළේ කවුද? ඒ ප්‍රදේශයේ පලිපාන කියලා වත්තක් තිබෙනවා; මේ ළඟ දී ඒ වත්ත මිලයට ගත්තා වෛද්‍ය අනුර විජේවර්ධන කියලා කෙනෙක්. ඒ වැවෙන් කුඹුරුවලට වතුර ලැබෙන වේල්ල අවහිර කරලා, නීති විරෝධී ලෙස ඒ වේල්ල වසා දමන්න කටයුතු කර තිබෙනවා. කොච්චර පැමිණිලි කළත් සාධාරණ විසඳුමක් ලැබිලා නැහැ. ජනාධිපතිතුමාටත් පැමිණිලි කර තිබෙනවා. ඒ වගේම ගරු කථානායකතුමාට, කෘෂිකර්ම ඇමතිතුමාට, ග්‍රාමීය කර්මාන්ත, ස්වයං රැකියා ඇමතිතුමාට, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කොමසාරිස්, ගරු දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමා කියන මේ අයට පැමිණිලි කර තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමා යම් කිසි වැඩ පිළිවෙළක් යෙදුවා. මේ වැඩේ කරන්න එපා කියලා 2008.11.12 වැනි දින තහනම් කර තිබෙනවා. එහෙත් හදිසියේ -

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanaylakkara)
මොකක්ද වැව?

**ගරු අමරා පියසීලි රත්නායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அமரா பியசீலி ரத்னாயக்க)
(The Hon. (Mrs.) Amara Piyaseeli Ratnayake)
හිරිවැව.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanaylakkara)
මට ඒ ලිපියේ පිටපතක් දෙන්න පුළුවන්ද?

**ගරු අමරා පියසීලි රත්නායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அமரா பியசீலி ரத்னாயக்க)
(The Hon. (Mrs.) Amara Piyaseeli Ratnayake)
මම දෙන්නම්. විස්තර ටික ඔක්කොම දෙන්නම්.

ඒ විතරක් නොවෙයි. තවත් කියනවා ජනාධිපතිතුමාගේ පවුලේ වෛද්‍යවරයෙක්ය කියලා. නියෝජ්‍ය කොමසාරිස්, ඩී. ඕ. ප්‍රාදේශීය නිලධාරි මේ හැම දෙනාම බිය වද්දලා එයාගේ අභිමතය පරිදි තමයි මේ වැඩ කටයුතු කර ගෙන යන්නේ. අද ගොවීන් අසරණ වෙලා තිබෙනවා. දැන් පැළ ගොයම් තිබෙන්නේ. ඒවාට වතුර ලබා ගන්න විධියක් නැතිව තිබෙනවා. දෙවියන්ගේ නාමයට ඊයේ පෙරේදා වැහැපු නිසා සමහර විට ගොයම්වලට නම් හානියක් නැති වෙයි. නමුත් මේ ක්‍රියාදාමය පිළිබඳව සොයා බලන හැටියට මම විශේෂයෙන්ම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්න කැමැතියි.

ඒ කොහොම වුණත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය නම් අඩු වෙලා තිබෙන බව අපට කියන්න පුළුවන්. 2008 වර්ෂයේ ප්‍රගතිය සෑහෙන්න අඩු වෙලා තිබෙනවා. ඒකට එක හේතුවක් තිබෙනවා. මොකක්ද? වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරින් හැටියට ඉංජිනේරු සහකාරවරුන්ගේ වෘත්තිය ක්‍රියාමාර්ගය දික් ගැස්සීම තමයි ඒකට හේතු වෙලා තිබෙන්නේ. ඒ අයගේ සේවා ගැටලු කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ඒවා විසඳා ගන්න හැකියාවක් ලැබිලා නැහැ. ඒ වාගේම දෙපාර්තමේන්තුවේ ඒ අය යටතේ සේවය කරන කාර්මික නිලධාරිනුත් ඒ අයත් එක හා සමානව සලකා තිබීම ගැනත් ඒ අය විරෝධතා ඉදිරිපත් කරනවා. ඒ වාගේම මේ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ වැටුප් විෂමතා සකස් කර දීලා නැහැ. ඒ වාගේම වරප්‍රසාද නොලැබීම ආදී මේ හැම දේම පිළිබඳ තිබෙන ප්‍රමාදය නිසා ඒ අයගේ වැඩ පිළිවෙළ හුඟක් දුරට මන්දගාමීව කර ගෙන යනවාය කියන එකත්, ඒක සංවර්ධනයට බලපානවාය කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

[ගරු අමරා පියසීලි රත්නායක මහත්මිය]

ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව කථා කරනවා නම් "අපි වවමු - රට නහමු" කියන තේමාව යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය හුඟක් වැඩ කටයුතු කර ගෙන යනවා. 2007 කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ගෙවතු වගා තරඟයක් සූදානම් කළා, "දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007 - 2010 - ජාතික ගෙවතු වගා මහ තරඟය" කියා. මෙන් මේ තරගය පවත්වන ක්ෂේත්‍ර හතක් සඳහන් කර තිබෙනවා. පෞද්ගලික ගෙවතු, කෘෂිකර්ම හා පර්යේෂණ, රාජ්‍ය අංශයේ කාර්යාල ගෙවතු ආදර්ශන, පාසල් ගෙවතු ආදර්ශන, පාසල් ළමුන්ගේ ගෙවතු, රාජ්‍ය අංශයේ නිලධාරින්ගේ පෞද්ගලික ගෙවතු හා නිල නිවාස ගෙවතු, මහජන නියෝජිතයන්ගේ ගෙවතු. කොන්දේසි ගණනාවක් දමා මෙන්න මේ විධියට මේ තරඟය පවත්වන්න කටයුතු යෙදුවා. ඒ වාගේම තරඟය පැවැත්වුවා. කොහොම හරි මේ ක්ෂේත්‍ර හතට පාසල් ගෙවතු තරඟයක් ඇතුළත් වෙලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ හොඳයි. ඒ හරහා ජයග්‍රහණය ලබන්න ඇත්තෙන්ම පාසල් යන ළමයි උනන්දු වෙයි. නිකම් ඉන්න අයත් උනන්දු වෙයි. ඊළඟ වර්ෂයට එය ආදර්ශයක් වෙයි. ඒ පිළිබඳව සැකයක් නැහැ. නමුත් 2008 දෙසැම්බර් මාසයේ මාකඳුර කෘෂිකර්ම මධ්‍යස්ථානයේදී අනෙක් ක්ෂේත්‍ර සියල්ලම සඳහා ත්‍යාග සුළු ත්‍යාග ලබා දී තිබෙනවා. නමුත් පාසල් තරඟයෙන් ජයග්‍රහණය කරපු අයගේ ලකුණු නිකවැරටියේ කෘෂි අධ්‍යාපන අධ්‍යක්ෂ හරහා දිසාපති වෙත යවා තිබෙනවා. පාසල් හා පාසල් ශිෂ්‍ය ක්ෂේත්‍රයට අයත් අයගේ ගෙවතු පිළිබඳව අධීක්ෂණයක් කර නැහැ. අධීක්ෂණයක් කළාට ඒ අයට අඩු තරමින් ප්‍රාදේශීය මට්ටමින් වත් දිස්ත්‍රික් මට්ටමින්වත් පළාත් මට්ටමිනවත් සහතිකයක් පමණක්වත් ලැබිලා නැහැ. ඒක විශාල අඩුවක්. අපි ඒ උදවිය දිරිමත් කරන් ඕනෑ. ඒත් එක්කම 100 දෙනෙක් රට යවනවා කියා තිබුණා. නමුත් ඒ කිසිම දෙයක් ඉෂ්ට වෙලා නැති බව මම අවධාරණයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

පොහොර පිළිබඳව ගනිමු. පොහොර ගැන කථා කරද්දී කාබනික පොහොර පිළිබඳව අපේ අමාත්‍යතුමා සඳහන් කළා. ඇත්තෙන්ම අපි අගය කරනවා, කාබනික පොහොර පිළිබඳව දැඩි අවධානය යොමු කිරීම. කාබනික පොහොර ව්‍යාප්ත වීම පරිසරයටත් වැදගත් වෙනවා. ඒ වාගේම සෞඛ්‍යයටත් වැදගත් වෙනවා. ඒ නිසා අපි අනුමත කරනවා. නමුත් රසායනික පොහොර යෙදීමත් අනිවාර්යයෙන් සිද්ධ වෙනවා. මේ පොහොර නියම වෙලාවට බෙදෙන්නේ නැහැ. ඒක අපේ අමැතිතුමන්ලාත් අවිවාදයෙන් පිළිගන්නවා වෙන්න පුළුවන්. වී ඉහින කොට පොහොර දමන්න තිබෙනවා. ඒ පොහොර යෙදෙන්නේ නැහැ. ඒවා වෙලාවට හම්බ වෙන්නෙත් නැහැ. පොහොර බෙදීම ගොවිජන සේවා නිලධාරීන්ගේ, කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරීන්ගේ ඒකාධිකාරයක් වෙලා තිබෙනවා. පොහොර බෙදීමට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ පිළිබඳව එක මන්ත්‍රීවරයෙකුත් සඳහන් කරනවා මට ඇහුණා. පසු ගිය කන්නවලදී නොයෙකුත් විධියේ අක්‍රමිකතා සිද්ධ වුණා. මම එයින් එකක් දෙකක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් හැම තැනම ඒ වාගේ දේවල් සිද්ධ වුණා. මේ වැඩ පිළිවෙළ සාර්ථකව, අවංකව කෙරෙන්න නම් ගොවි හැඳුනුම් පත් නිකුත් කර ප්‍රසිද්ධියේ පොහොර බෙදා දීමේ ක්‍රමයක් ඇති කරන්න ඕනෑ කියා මම විශේෂයෙන්ම සඳහන් කරනවා. ඒත් එක්කම කාබනික පොහොර වැඩසටහනත් ව්‍යාප්ත කරමු කියන එකත් මා යෝජනා කරන්න කැමැතියි.

කෘමිනාශක භාවිතය ගනිමු. ඒක විශාල ප්‍රශ්නයක්. වෙළෙඳ පොළෙන් ආහාර ද්‍රව්‍ය ලබා ගන්නා බව අපි දන්නවා. නුසුදුසු විධියේ රසායනික ද්‍රව්‍ය එළවලු වර්ගවලට යොදනවා. අද බලන්න, දහ දෙනෙක් ගත්තොත් එක් කෙනෙකුට පිළිකා රෝගය, දියවැඩියාව, අධික රුධිර පීඩනය තිබෙනවා. මෙහෙම වෙන්නේ කෘෂිරසායනික යෙදීම නිසායි. එදා වාගේ නොවෙයි අද නගරයේත් තිබ්බටු විකුණන්න තිබෙනවා. මේවාට දමන්නේ මොනවාද ? කුරේට. කුරේට කියන්නේ මිනී මරන කෘෂිනාශකයක්. මේවා ගහට ඇවිල්ලා ගෙඩියට එනවා. ගහ ආරක්ෂා කරන්න ගෙඩි ආරක්ෂා කරන්න ඕනෑ තරම් ක්‍රම තිබෙනවා. මගේ වත්තෙත් තිබ්බටු ගස් තිබෙනවා. අපි කවදාවත් ඒවාට කෘෂිරසායනික ද්‍රව්‍ය ඉසින්නේ නැහැ. ඒ ගස් හැදලා නොවෙයි, ඉබේට හැදිලා. නමුත් ගෙඩි කනවා. මේක ගොවියෝ මුදල් ලබා ගැනීමට කරන දෙයක් වෙන්න පුළුවන්. කෙසෙල් වැඩි දෙනකු භාවිතා කරන පලතුරක්. දැන් දැන් කෙසෙල් ගෙඩියක් කන්නත් භය තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. කෙසෙල්වලටත් කුරේට යොදනවා කියලා අපට දැන ගන්නට ලැබී තිබෙනවා. මේ නිසා ජීවිත අකාලයේ විනාශ වෙනවාය කියන එක තමයි අපට කියන්නට තිබෙන්නේ. උඩ රට පැත්තේ බෝංචි වාගේ හැම එළවලුවලුවකටම කෘෂිරසායනික ද්‍රව්‍ය ඉහිනවා. මුලට තැන්පත් වනවා කියන්නේ වඩාත් වැඩියෙන් ඵලයට ඇද ගන්නවා කියන එකයි. ඒ නිසා මා විශේෂයෙන් ඉල්ලා සිටින්නට කැමැතියි, කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වීමෙන් අපේ කෘෂිකර්ම ඇමතිතුමාත් මෙය අනුමත කරනවා වෙන්න පුළුවන් - කරුණාකර කුරේට වගේ විෂ කෘමිනාශක ආනයනය සම්පූර්ණයෙන් නතර කරන්න කියා. ඒවායේ බදු වැඩි කරන්න ඕනෑ නැහැ, ඒවා ආනයනය සම්පූර්ණයෙන් නතර කළ හොත් මම හිතනවා, මේ රටේ ජනතාව ආරක්ෂා කරන්න අපට පුළුවන් වෙයි, සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ඇති කර ගන්න අපට පුළුවන් වෙයි කියලා. එළවලු කන්න එපා, පලතුරු කන්න එපා කියලා කාටවත් කියන්න අපට බැහැ. අපි දන්නවා, ආනයනික පලතුරුවලට ඒවා කල් තියා ගන්න නොයෙකුත් බෙහෙත් වර්ග ඉහින බව. ඒක අපි විවේචනයට ලක් කරනවා. නමුත් අපේ රටේ ඒ කෙරෙන දේ වළක්වන්න ක්‍රමයක් යොදන්නේ නැහැ. ඒ නිසා මේ අනර්ථකාරී කෘමිනාශක ආනයනය නවත්වන්න කියා විශේෂයෙන් මම රජයෙන් ඉල්ලන්න කැමැතියි.

අපි වවමු - රට නහමු වැඩසටහනට අයත් තවත් වැඩසටහනක් තමයි සත්ව කිරි නිෂ්පාදනය. එහෙම නේද ඇමතිතුමා ?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
ඒකට සමගාමීව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියට විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු අමරා පියසීලි රත්නායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அமரா பியசீலி ரத்நாயக்க)
(The Hon. (Mrs.) Amara Piyaseeli Ratnayake)
ආනයනික කිරි පිටිවල බද්ද වැඩි කර තිබෙනවා. මම හිතන්නේ ඒ, හරක් ආනයනය කරන්නත් ඉස්සරයි. කිරි හරකුන් වැඩි කරලා කිරි ලැබෙන කොටයි කිරි පිටි ගෙන්වීම සීමා කරලා බද්ද වැඩි කරන්න අවශ්‍ය වන්නේ. ඒ දේ කෙරෙන්නේ නැහැ.

ඊටත් වඩා මේ රටේ ලොකුම ගොවි පොළ තමයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන රිදියගම ගොවි පොළ. එය ලංකාවේ ලොකුම ගොවි පොළයි. අක්කර තුන්දහස් ගණනක් විශාලයි. හරක් ඉන්නේ 300ක් විතරයි. මම හිතන්නේ කිරි පිටි බද්ද වැඩි කරනවාට වැඩිය හොඳයි, ඒ ගොවි පොළට හරක් විශාල සංඛ්‍යාවක් ලබා දෙන එක. මම දන්නවා, නිකවැරටිය ගොවි පොළටත් අද ඒ තත්ත්වය බොහොම දුරට උදා වෙලා තිබෙන බව. විශේෂයෙන්ම කුරහන්, කව්පි වගේ දේවල් බද්ද වැඩි කළාට අපි විරුද්ධ වෙන්නේ නැහැ. මොකද, ඒවා අද අඳම වගා කරන්නට පුළුවන්. නමුත් මේ වාගේ කිරි පිටිවල බද්ද වැඩි කිරීම තුළින් මා හිතනවා, කිරි නිෂ්පාදනය වැඩි වෙන්නේ නැහැයි කියලා. හරකුන් බෝ කිරීම වැඩි කරලා, කිරි නිෂ්පාදනය වැඩි කරලා ඒ බද්ද වැඩි කරනවා නම් වැඩි කළාට කමක් නැහැ කියන එක මා මතක් කරනවා.

ඉඩම් පිළිබඳව කථා කරන්නටයි මා ඊළඟට සූදානම් වුණේ. ඒකට මට වෙලාවක් නැති බව අපේ මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමින් වහන්සේ සඳහන් කරනවා. ඒ කොහොම වුණත් රජයේ ඉඩම්වල - ගරු ඇමතිතුමා කියනවා මම අහගෙන හිටියා - බලෙන්

පදිංචි වුණු අයට නම් ඉඩම් බලපත්‍ර දෙන්නේ නැහැයි කිව්වා. නමු.ත් රජයෙන් බෙදාදුන්නු ඉඩම්වල ඉන්න සමහර අයට ඒවාට බලපත්‍ර ලබා දී තිබෙනවා. සමහර අයට සින්නක්කර ඔප්පු දීලාත් තිබෙනවා. සමහර අයට ලබා දී නැහැ. මේ එකම අවස්ථාවකදී බෙදලා දුන්නු ඉඩම්. සමහර වේලාවට දේශපාලන හේතුන් මත සමහර අයට ඔප්පු දෙන්නේ නැහැ, සමහර අයට ඔප්පු දීලා තිබෙනවා. මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. මේ රටේ ජනතාව හැම දෙනාටම මේ මහ පොළොව අයිතියි. මේ හැමෝගේම පොළොවයි. එහෙම නම් කාටත් පුළුවන් හැටියට ඉඩම් නැති අයට ඉඩම් බෙදා දීම විශේෂයෙන් අවංකව සිද්ධ කරන ලෙස මා ඉල්ලා සිටිනවා. කරුණු තිබුණා වුණත් මම මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඔබ වහන්සේට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 2. 00]

**ගරු සිරිපාල ගම්ලත් මහතා (ගොවිජන සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சிறிபால கம்லத் - கமநல சேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. Siripala Gamlath - Deputy Minister of Agrarian Services)

මූලාසනාරූඪ ගෞරවනීය ස්වාමීන් වහන්සේගෙන් අවසරයි. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේත්, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේත්, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව විවාදයට ගැනෙන මේ අවස්ථාවේදී අදහස් කිපයක් ඒක රාශි කරන්නට ලැබීම ගැන මම පළමුවෙන්ම ඉතාම සතුටට පත් වෙනවා.

පළමුවෙන්ම අපේ අමරා පියසීලී රත්නායක මන්ත්‍රීතුමිය පොහොර බෙදා හැරීම පිළිබඳව කළ ප්‍රකාශයට මම උත්තරයක් දෙන්න ඕනෑ. 2008/2009 මහ කන්නය සඳහා අවශ්‍ය සියලු පොහොර තොග මේ වන විට අපේ රට තුළ තිබෙනවා. ඒ විගේම සෑම දිස්ත්‍රික්කයකම ඒ පොහොර බෙදා හැරීමේ වැඩ පිළිවෙළ ක්‍රමවත්ව ක්‍රියාත්මක වෙනවා. අපිට නම් කිසිම පැමිණිල්ලක් ලැබී නැහැ. පොහොර අසවල් ප්‍රදේශයට නැහැ කියා. [බාධා කිරීමක්] දැන් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා මේ වැඩ පිළිවෙළ ගොවි මහත්මයාට -

**ගරු අමරා පියසීලී රත්නායක මහත්මිය**

(மாண்புமிகு (திருமதி) அமரா பியசீலி ரத்நாயக்க)

(The Hon. (Mrs.) Amara Piyaseeli Ratnayake)

එහෙම තමයි ඉස්සරත් කළේ. නමුත් ඒ දවස්වල ඕනෑ තරම් අක්‍රමිකතා සිද්ධ වුණා. මම කිව්වේ ඒකයි, ගොවි හැඳුනුම් පත් දීලා ප්‍රසිද්ධියේ ඒක කරන්න කියලා.

**ගරු සිරිපාල ගම්ලත් මහතා**

(மாண்புமிகு சிறிபால கம்லத்)

(The Hon. Siripala Gamlath)

ගොවි නාම ලේඛන හරහා බෙදා හැරීමේ දි මේ පිළිබඳව අපහසුතාවක් ඇති වෙලා තිබෙනවාය කියා මම හිතන්නේ නැහැ. විශේෂයෙන්ම සෑම ගොවි මහත්මයකුටම තමන් වගා කරන කුඹුරට අවශ්‍ය පොහොර තොගය බෙදා දීමේ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක වෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

අද අපි සාකච්ඡා කරන්නේ අතිගරු ජනාධිපතිතුමන් ඉදිරිපත් කළ හතර වන අය වැයේ කාරක සභා අවස්ථාවයි. අවුරුදු 3ක කාර්ය භාරයක් අවසාන කර කෘෂිකර්ම ක්ෂේත්‍රය වෙනුවෙන් අද අදහස් ප්‍රකාශ කරන අවස්ථාවේදී මෙවර අය වැය කෘෂිකර්ම ක්ෂේත්‍රය තවත් ඉදිරියට ගෙන යන්න, දිරි ගන්වන්න ඉදිරිපත් වුණු අය වැයක් විධියට තමයි මම දකින්නේ. පළමු වෙනි අය වැයෙන් පටන් ගත්ත පොහොර සහනාධාරය එනම් එදා වී මිල රුපියල් 15ට 16ට තිබෙන අවස්ථාවේ, ඒ වාගේම පොහොර මිටිය රුපියල් 1,500ට විතර අඩුව තිබෙන අවස්ථාවේදී රුපියල් 350ට දෙන්න පටන් ගත්ත පොහොර මිටිය අද රුපියල් 6,000ක් වුණත් ඒ වාගේම අද වී කිලෝ එකක් රුපියල් 32ට වැඩි වුණත් එදා ප්‍රශ්න විධියටම ඒ පොහොර මිටිය ගොවි මහත්මයාට ලබා දෙන්න මේ අය වැයේත් යෝජනා කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 25,000ක් ඇස්තමේන්තු කර තිබෙනවා. ගිය වර පොහොර දීම සඳහා රුපියල් මිලියන 26,950කට වැඩි මුදලක් අපට අවශ්‍ය වුණා. මේ වැඩ පිළිවෙළ නිසා 2008 වර්ෂයේදී මේ රටේ අවුරුද්දක් තුළ නිපදවුණු වැඩිම වී අස්වැන්න වන මෙට්‍රික් ටොන් මිලියන 3.8ක් ලබා ගන්න අපට හැකියාව ලැබුණා.

අද උදේ අදහස් ප්‍රකාශ කළ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා අපෙන් ඇසූ ප්‍රශ්නයක් තමයි පාන් හදන්න සියයට 100ක් ම හාල් පිටි යොදා ගන්නවාද කියන එක. මම පැහැදිලිවම කියන්න ඕනෑ, තවමත් අපි අපේ රටට අවශ්‍ය සහල් නිෂ්පාදනයෙන් සියයට 100ක් ස්වයංපෝෂිත නැහැ කියන එක. 2009 වසරේදී අපි මෙට්‍රික් ටොන් මිලියන 4.2ක වාර්තාගත අස්වැන්නක් බලාපොරොත්තු වෙනවා. හැබැයි අතිරික්තයක් නැති නිසා අපි හාල් ටික පිටි කරන්න ගියොත් ඉතා ඉක්මනින් අපට තවත් හාල් අවශ්‍ය වෙනවා. අපි පාන්වලට සියයට 100ක් හාල් පිටි යොදා ගත්තේ නැති වුණත් අද දේශීය ආහාර විධියට ඉඳි ආප්ප, ඒ වාගේම පිට්ටු වැනි දේවල් හදලා සියයට 100ක්ම හාල් පිටි පාවිච්චිය මේ රටේ ජනතාවට හුරු කරමින් පරිභෝජනයේ වෙනසක් ඇති කරමින් යනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මීට වඩා අඩු වී නිෂ්පාදනයක් තිබුණ අවස්ථාවේදී මේ රටේ වී අතිරික්තයක් තිබෙනවාය කියා විවලට ලැබෙන්න ඕනෑ මිල ලැබුණේ නැහැ. ඒ නිසා පසු ගිය කාලයේ මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය, ඒවාගේම වී වගාව අතහැර දමා තිබුණා. නමුත් අද සෑම ප්‍රදේශයකම පුරන් කුඹුරු සියයට සියයක්ම අස්වැද්දෙනවා. එයින් සියයට 85කට වැඩි ප්‍රගතියක් මේ වන කොට අපි ලබා ගෙන තිබෙනවා. ඒ වාගේම සෑම දිස්ත්‍රික්කයකම වගා කරන්න පුළුවන් හැම බිම් අඟලක්ම වගා කරනවා. විශේෂයෙන්ම අනෙකුත් අතිරේක බෝගවලට වැඩිය වී වගාව සඳහා ගොවි මහත්වරු විශේෂ උනන්දුවක් දක්වනවා. මඩ ඉඩම්වල වාගේම ගොඩ ඉඩම්වලත් වී වගා කරන්නට අද ඔවුන් උනන්දු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය යල් කන්නය ගත්තාම ඉතාම වාර්තාගත අස්වැන්නක් ලබා ගෙන තිබෙනවා. සියයට 45ක ප්‍රගතියක් ලබා ගන්නට අපට පුළුවන්කමක් ලැබී තිබෙනවා. මම විශේෂයෙන් මේ කාරණය කියන්න ඕනෑ. මීට ඉස්සර වී වගාවට තිබුණු එකම ගැටලුව වුණේ අප විදේශ ගොවියා මත බලාපොරොත්තු තබා ගෙන සිටීමයි; විශ්වාසය තබා ගෙන සිටීමයි. අපට අඩු මුදලකට පිට රටින් සහල් ගෙන්වන්නට පුළුවන් නම් අපි වැඩි වියදමක් දරා ගෙන වගා කරන්නේ ඇයි? තමන් වියදම් කරන මුදලට සරිලන ලාභයක් ලැබෙන්නේ නැති නිසා ගොවි මහත්වරු අකර්මන්‍ය වුණා. ඒ වාගේම හැම තැනකම උද්ඝෝෂණ කරන්නට පටන් ගත්තා. නමුත් අද අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය තුළ කටයුතු කරමින් මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමාත්, ඒ වාගේම හේමකුමාර නානායක්කාර අමාත්‍යතුමාත් "අපි වවමු - රට නගමු" කියන දේශීය නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කර ගෙන යනවා.

පසු ගිය කාලයේ හැම කෙනෙක්ම කථා කළේ සහල් මිල ගැනයි. සහල් මිල රුපියල් 100 දක්වා වැඩි වෙනවාය කිව්වා. දැන් සහල්වලට පාලන මිලක් නියම කර තිබෙනවා. අද සාමාන්‍ය ජනතාවට හොඳ වර්ගයේ සම්බා සහල් කිලෝ එකක් රුපියල් 70කට ලබා ගන්නට පුළුවන්කමක් තිබෙනවා. අද හොඳ වර්ගයේ සහල් කිලෝ එකක උපරිම සිල්ලර මිල රුපියල් 70යි. නාඩු සහල් කිලෝ එකක උපරිම සිල්ලර මිල රුපියල් 65යි. අද ගොවි මහත්මයකුට සම්බා වී කිලෝ එකක් රුපියල් 38කට විකුණා ගන්නට පුළුවන්. අද සම්බා වී කිලෝ එකක මිල රුපියල් 38යි. නාඩු වී කිලෝ එකක මිල රුපියල් 33ක් 34ක් පමණ වෙනවා. එහෙම නම් අද ගොවි මහත්මයාත්, පාරිභෝගිකයාත් සතුටු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේ කෘෂිකර්ම වැඩ පිළිවෙළ තුළ මේ රටේ නිෂ්පාදනයන් දිරි ගැන්වීම සඳහා තමයි පිට රටින් ගෙන්වන බඩුවලට-විශේෂයෙන්ම අපට වගා කරන්න පුළුවන් දේවලට-පන වන සෙස් බද්ද වැඩි කර තිබෙන්නේ. විශේෂයෙන්ම තිරිඟු පිටි මත පැන වෙන තීරු බද්ද සියයට 6 සිට 10 දක්වා වැඩි කර තිබෙනවා.

[ගරු සිරිපාල ගම්ලත් මහතා]

අපේ දේශීය නිෂ්පාදන දිරි ගන්වන්නට, සහල් පිටි, කුරක්කන් පිටි වැනි දේශීය පිටි නිෂ්පාදන දිරි ගන්වන්ට ආනයනය කරන තිරිඟු පිටි සඳහා සියයට 5ක බද්දක් පනවා තිබෙනවා. ඒ වාගේම කුරක්කන්, කව්පි, මුං ඇට වැනි දේශීය කෘෂි නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා ආනයනය කරන එවැනි නිෂ්පාදන සඳහා සියයට 15ක සෙස් බද්දක් පැන වීමට යෝජනා කර තිබෙනවා. අපේ රටට අවශ්‍ය පළතුරු සහ එළවලු අපේ රටේ තිබුණත් පිට රටින් අඩු මුදලකට ගෙන්වන්න පුළුවන් කියලා සමහර අවස්ථාවලදී අප ඒවා පිට රටින් ගෙන්වනවා. එසේ පිටරටින් එළවලු සහ පලතුරු ගෙන්වපු නිසා අපේ ගොවියා අකාර්යක්ෂම වුණා. ඒ නිසා පිට රටින් ගෙන්වනු ලබන සියලුම එළවලු සහ පලතුරු සඳහා සෙස් බදු වැඩි කිරීමට යෝජනා කර තිබෙනවා.

මෙවර පොහොර සහනාධාරය දෙනවා වාගේම අපේ කාබනික පොහොර,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු සිරිපාල ගම්ලත් මහතා**
( மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamlath)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මෙවර රුපියල් මිලියන 750ක් වෙන් කරලා තිබෙනවා. කාබනික පොහොර හා පිදුරු වැනි ද්‍රව්‍ය භාවිත කරන සියලුම ගොවි මහත්වරුන්ට අක්කරයකට පොහොර මිටි තුනක් ගොවි සමිතිවල ඇප මත සැපයීමට යෝජනා කර තිබෙනවා. ඒ ගොවි මහත්වරුන් අස්වැන්න නෙළා ගත් පසු තමන් ලබා ගත් පොහොර වෙනුවට වී ලබා ගැනීමේ ක්‍රමවේදයක් මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. අප දන්නවා, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිරත වෙලා සිටින ගොවි මහත්වරුන්ට තමන්ගේ ආදායම හරියට කළමනාකරණය කර ගන්නට බැරි බව. එම නිසා කුඹුරු වැඩ කරන කොට රුපියල් 3250ක් වාගේ ඉතාම පොඩි මුදලක් වුණත් ඔවුන්ට සොයා ගන්නට බැරි නිසා ඔවුන් ඉතාම අපහසුතාවට පත් වෙනවා. ඒ නිසා ඔවුන් තමන් සතු දේවල් උකස් කර මුදල් ලබා ගන්නට පෙලඹෙනවා. පොහොර සඳහා වී පදනම යටතේ අත්තිකාරම් ක්‍රමයකට පොහොර ලබා දීමේ වැඩ පිළිවෙළ නිසා ඔවුන්ට පොහොර මිල දී ගැනීමේදී ඇති වන මූල්‍ය දුෂ්කරතාවන් මඟ හැරෙනවා. ඒ නිසා ඔවුන් සතු දේවල් උකස් තියා මුදල් ගන්නට අවශ්‍ය වන්නේ නැති ඒවා ආරක්ෂා වෙනවා. මේ සඳහා දීර්ඝ වශයෙන් කථා කරන්න වෙලාව ප්‍රමාණවත් නොවුණත් මේ අවස්ථාවේදී මා මගේ ස්තුතිය පුද කළ යුතු වෙනවා.

අතිගරු ජනාධිපතිතුමා මේ අය වැය ඉදිරිපත් කරමින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට දෙන දායකත්වය සහ ඒ ශක්තිය නිසා අපට අවුරුදු තුනකින් දේශීය නිෂ්පාදන දිරි ගැන්වීමේ වැඩසටහන යටතේ පිට රටින් ආනයනය කරන භෝග වර්ග තිස්හයෙන් විශේෂයෙන් භෝග වර්ග විසිතුනක් අවුරුදු තුනකින් ගෙන්වීම නවත්වන්නට බලාපොරොත්තු වැඩ පිළිවෙළ ඒ අවුරුදු තුන යන්න කලින් සාර්ථක කර ගන්න පුළුවන් වෙනවා.

එම නිසා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ටත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා ඇතුළු සියලුම නිලධාරීන්ටත් මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාටත්, ගරු හේමකුමාර නානායක්කාර ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. අපට සහයෝගය දෙන වාරිමාර්ග අමාත්‍යාංශයේ සියලුම ඇමතිවරුන් ඇතුළු ඒ නිලධාරීන්ටත් ස්තුතිවන්ත වෙනවා. අපට දෙන සහයෝගය වාගේම මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්නට දෙන දායකත්වයට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමන්ලා ඇතුළු ඒ සියලු නිලධාරීන්ටත් මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමාට බොහොම ස්තුතියි.

ගරු තිස්ස කරල්ලියද්ද අමාත්‍යතුමා.

[අ. භා. 2.12]

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ජනතාවගේ අදහස් කැටි කර ගත් මහින්ද චින්තනය නැමැති පොතේ පිංවේත් මේ වැඩසටහන සම්බන්ධයෙන් කෙටියෙන් සඳහන් වෙලා තිබෙනවා. එහි වැව් දස දහසේ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන්නට කටයුතු කිරීම ගැන සඳහන් වෙනවා. ඇත්ත වශයෙන්ම මෙය කෘෂි කර්මාන්තයට, වී ගොවිතැනට අත්‍යවශ්‍ය කාරණයක්. ඊට අමතරව මහා දැවැන්ත මොරගහකන්ද ජලාශය අපට සිහිනයක් වෙලා තිබුණා. එදා සිටි වාරිමාර්ග අමාත්‍ය දිවංගත මෛත්‍රීපාල සේනානායක මැතිතුමාත් මේ යෝජනාව ක්‍රියාත්මක කරන්නට උත්සාහ ගත්තා. මෙදා ගරු මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා එය ආරම්භ කිරීම ගැන අප සතුටු වෙනවා; එතුමන්ලට ස්තුතිවන්ත වෙනවා. උමා ඔය, දැදුරු ඔය, මැණික් ගඟ, රඹුක්කන් ඔය, හැඩ ඔය, කිරම ඔය සහ ඌරාව ගඟ වැනි යෝජනා ක්‍රම ද ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නට තිබෙනවා. මෙයින් සමහරක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ජනතාවගේ බලාපොරොත්තු සිහින බොඳ වන අවස්ථා තිබෙනවා. මොරගහකන්ද ජලාශ යෝජනා ක්‍රමයේ උතුරු මැද ඇළ කියා එකක් සඳහන් වෙලා තිබුණා. ඒ ඇළ හරහා උතුරුකරයේ මැදවච්චිය ආසනය හරහා පදවිය මහ වැවටත් ඒ වාගේම මාගේ මතකයේ හැටියට උතුරුකරයේ කිලිනොච්චිය ආසන්නයට යන තුරුත් ජලය ගෙන යන සැලැස්මක් තිබුණා. ඒ සැලැස්ම මෙදා ඇතුළත් වෙලා නැහැ. මා හිතන විධියට ප්‍රායෝගිකව ප්‍රශ්නයක් තිබෙන නිසා වන්නට ඇති. ගරු අමාත්‍යතුමනි, මා උපදේශක කාරක සභාවේදීත් මගේ අදහසක් හැටියට මෙය ඉදිරිපත් කළා. ලබුගම සිට කොළඹට ජලය ගෙන එන විශාල බට පද්ධතියක් තිබෙනවා. ඒ ආකාරයෙන්වත් මැදවච්චියේ ඒ කපිරිග්ගම වැවට ජලය එක්කාසු කර එතැනින් පදවියේ මහ වැවට ජලය ගෙන යන්න පුළුවන් ද? විය හියදම්-වැය වන මුදල් ප්‍රමාණය -විශාල වන්නට පුළුවන්. නමුත් ජලය අපතේ යාමක්, සොරා ගැනීමක් වාගේ දෙයක් සිදු වන්නේ නැහැ. මගේ දැනුමේ හැටියට ඇළ වේලි නිතර දෙවේලේ ප්‍රතිසංස්කරණය කිරීමක් වාගේ දෙයක් අවශ්‍ය වන්නේත් නැහැ. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් තවදුරටත් කල්පනා කළොත් හොඳයි කියන එකයි මා මේ අවස්ථාවේදී මතක් කරන්නේ. සැතපුම් 110ක් පමණ දිවෙන යෝධ ඇළ උපයෝගී කර ගන්නට බලාපොරොත්තු වුණේ. උතුරේ කනකරායන්කුලම් පාලි ආරු කියන වැව්වලට ජලය සපයන්නත් එදා සැලැස්මක් තිබුණා. නමුත් කඩිනම් මහවැලි සැලැස්මක් ක්‍රියාත්මක වූ නිසයි මා හිතන විධියට මොරගහකන්ද දෙ වැනියට වැටුනේ. එදා අපේ ගරු ඇමතිතුමාගේ අදහසක් තිබුණා, යාන් ඔය ව්‍යාපෘතිය අහවර කරන්න මත්තෙන් මොරගහකන්ද යෝජනා ක්‍රමය ආරම්භ කරන්න. කෙසේ නමුත් මහවැලිය සම්බන්ධයෙන් අප දොස් පෙන්වනවා නොවෙයි, මේ වැඩ සටහන අපට ක්‍රියාත්මක කරන්න තිබුණා, මූලාසනාරූඪ අපේ ගරු හාමුදුරුවනේ, 1977 සමඟි පෙරමුණ ආණ්ඩුව පරාජයට පත් වුණේ නැත්නම්. ඒ රජයෙත් අඩුපාඩු තිබුණා. පරාජයට පත්වුනේ නැත්නම් මේ මොරගහකන්ද යෝජනා ක්‍රමය තමයි දෙවනුව ක්‍රියාත්මක වෙන්න තිබුණේ. එහෙම නම් රටේ ආර්ථික

තත්ත්වයත් මීට වඩා වෙනස් වෙන්නට තිබුණා. මොරගහකන්ද යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් සිහිපත් කරන කොට, අපි නැවත වතාවක් අපේ ස්තූතිය ගරු මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමාට පුද කරන්නට ඕනෑ.

අනෙක් කාරණාව තමයි යාන් ඔය ව්‍යාපාරය. මෙහිදී මා සතුටු වෙනවා වාගේම, ගරු චමල් රාජපක්ෂ අමාත්‍යතුමාටත්, ඒ වාගේම ඒ නිලධාරි මහත්වරුන්ටත් ස්තූතිවන්ත වනවා, මේ යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කිරීම පිළිබඳව. සීගිරියෙන් ආරම්භ වන මේ ඇළ, පදවිය හරහා ගිහිල්ලා, පදවිය ආසන්නය ඉස්මත්තෙන් ගිහින් පුල්මුඩෙන් මහ මුහුදට වැටෙනවා. ඒ නිසා යාන් ඔය මහා විශාල ජලාශයක් බවට පත් වෙනවා, පගුරුගස්වැවත්, මහරත්මල්ගහ වැවත් ඒක රාශි කරලා හදපුවාම. ඒ වාගේම මේ යාන් ඔය ජලාශය ඉදි වුණාම පදවිය වැවත් සමඟ යා කරන්නත් පුළුවන් වෙයි කියලා හිතෙනවා; බළලු වැවයි, කලා වැවයි වාගේ. මෙහිදී විශාල ජලාශයක් ඉදි වන නිසා විශාල ඉඩම් ප්‍රමාණයක් අස්වද්දන්නට පුළුවන්. ඒ සම්බන්ධයෙන් අපේ ගෞරවණීය ස්තූතිය පුද කරන්නට ඕනෑ, ගරු අමාත්‍යතුමාට.

අනෙක් කාරණාව, මහපට්ටිගල කියලා විශාල වැවක් තිබුණා, ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක් වුණු කැබිතිගොල්ලෑව බල ප්‍රදේශයේ, ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක් වුණු ගම්මානවලට ඔබ්බෙන් අපේ ඉල්ලීමක් මත අන්න ඒ වැව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු වෙලා ඒ යෝජනා ක්‍රමයත් ක්‍රියාත්මක කරන්න සැලසුම් කරලා තිබෙන එකගැන අප ස්තූතිවන්ත වන්නට ඕනෑ.

අනෙක් කාරණාව මේකයි. ඉඩම් සම්බන්ධයෙන් ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කිරීමට සැලසුම් කරන බවත්, අපේ ගරු ඇමතිතුමා කිව්වා වාගේ වගා නොකරන හැම බිමක්ම ඒ සඳහා යොද වන බවත් මහින්ද චින්තනයේ සඳහන් වනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, ගම්මාන ආශ්‍රිතව තිබුණු කැලෑ රොදවල් අද විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා යම් ක්‍රමයක් ඇති කර, ඒ විනාශ වුණු කැලෑවල නැවත වගා කිරීම ඉතාම වැදගත් වෙනවා. ඒ ගම්වල පරිසරය අද එහෙම පිටින්ම වෙනස් වෙලා තිබෙනවා. සමහර අය කැමැතියි, නැවත වගා කටයුතුවලට යන්න. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්නට ඕනෑ.

ඒ වාගේම, "ගොවි ජනපද හා මහවැලි යෝජනා ක්‍රමවල පසු පරම්පරාවේ සියලුම ගොවීන්ට ඉඩම් ලබා දෙන්නෙමි" කියා මහින්ද චින්තනයේ සඳහන් වෙනවා. ඒ දෙ වැනි, තුන් වැනි පරම්පරාවට අවශ්‍ය ඉඩම් ලබා දෙන්නට පුළුවන් වන්නේ මහා දැවැන්ත වාරි යෝජනා ක්‍රම ක්‍රියාත්මක වුණොත් පමණයි. ඒ නිසා අනාගතයේ ක්‍රියාත්මක වන ඒ යෝජනා ක්‍රම ආශ්‍රිතව ඉඩම් ලබා දීමක් කරන්නට පුළුවන් වෙනවා අනාගතයේදී. ඒ වාගේම ඉඩම් සම්බන්ධයෙන් කථා කිරීමේදී තවත් කරුණක් කියන්ට ඕනෑ. අපේ කැබිතිගොල්ලෑවේ තිබෙනවා වාහල්කඩ වැව. දිවංගත මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමා ආරම්භ කරපු අන්න ඒ වාහල්කඩ වැව ඉස්මත්තේ අනවසර ඉදි කිරීමක් කෙරෙනවාය කියලා අප දැන් දැනුවත් වුණා. ඒ ගැනත් පොඩ්ඩක් හොයලා බලන්නය කියලා අපේ නිලධාරි මහත්වරුන්ට කියන්නට ඕනෑ.

ඒ වාගේම වගා නොකරන ඉඩම්වල හේන් ගොවිතැනට අවස්ථාවක් දෙන්නට ඕනෑ, තල, අබ, මුං වාගේ දේවල් වවන්න. ඒ වාගේ කලාපයකුත් අප ඉතිරි කර ගන්නට ඕනෑ, ඉඩම් වගා කිරීමේදී. ඒ වාගේම ගරු ඇමතිතුමනි, බීජ සම්බන්ධයෙන් ඔබතුමා ආරම්භ කරපු වැඩසටහනේදී අපට මතකයි බීජ පැකට් මදි වුණා. ඒ සම්බන්ධයෙන් අධීක්ෂණය කරන්නය කියලා ඔබතුමා මාවත් පත් කළා එක්තරා කමිටුවකට. ඒ අවස්ථාවේදී බීජ පැකට් මදි වුණා. නාගරික පරිසරයේ ඉන්න ඇත්තොත් බීජ හෙව්වා, වගා කටයුතු ආරම්භ කරන්න. මල් පෝච්චියේ හෝ මොනවා හරි හිටුවා ගන්න ඕනෑය කියන තැනකට ජනතාව තල්ලු වී ගෙන ආවා. ඒකේ සාර්ථක ප්‍රතිඵල අප දැන් භුක්ති විඳිනවා. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී තව විශාල වැඩ කොටසක් තිබෙනවා.

ඒ වාගේම මුලාසනාරූඪ අපේ ගරු හාමුදුරුවන් දන්නවා ඇති, කාමරංගා කියලා ජාතියක් තිබෙනවාද කියා. අද සිටින මේ තරුණ පරම්පරාවට කාමරංගා ගෙඩියක්වත් දකින්න නැහැ. දඹ, වීර, පළු වාගේ දේවල් අද ළමයින්ට දකින්න නැහැ. ඉතින් මේ වාගේ දේවල් මහා පරිමාණයෙන් වගා සැලසුම් යටතේ නැවත වතාවක් වගා කරන්නට ඕනෑ. අභාවයට ගිහින් තිබෙන අපේ ගම්වල තිබුණු එළවලු වර්ග, පලතුරු වර්ග නැවත වගා කරන්නට ඕනෑ. කෘෂි කර්මාන්තයේ හා වැවිලි කර්මාන්තයේ නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම, කෘෂිකර්මාන්තයේ යෙදී සිටින ගොවීන් දිරිමත් කිරීම සඳහාත් පොහොර කිලෝ 50ක් රුපියල් 350ක මිලට ලබා දීම ඇත්ත වශයෙන්ම ඉතාමත් වැදගත් කාරණයක් වෙනවා. අනෙක් කාරණාව තමයි, රසායනික පොහොර භාවිතය. මා මගේ අමාත්‍යාංශය යටතේ 2000 වර්ෂයේ දී ඔසු ගොවි වගාව පටන් ගත්තා. ඒ සඳහා කොම්පෝස්ට් පොහොර භාවිතා කළා. දැනටත් ඖෂධ වගාව සඳහා කොම්පෝස්ට් පොහොර තමයි භාවිතා කරන්නේ. කිසිම කෘත්‍රිම පොහොර වර්ගයක් හෝ කෘමි නාශකයක් පාවිච්චි කරන්නේ නැහැ. ශරීරවලට හානි නොවන ආකාරයට පැරණි විධියට හදා ගත් කෘමි නාශක තමයි අපි භාවිත කරන්නේ. ඒ නිසා මේකත් ඉතාමත්ම වැදගත් කටයුත්තක් බව මා කියන්නට ඕනෑ.

අනෙක් කාරණාව තමයි, ගොවියෙකුට උපන්නේකට නොලැබුණු මිලක් දැන් වී සඳහා ලැබෙන එක. ඒ ගැනත් අපි සතුටු වන්නට ඕනෑ. ගොවි ජනතාව දැන් ගොවිතැන් කිරීම සඳහා වඩ වඩාත් උනන්දු වන්නේ ඒකයි. ඒ වාගේම නැඟෙනහිර මුදා ගත් ප්‍රදේශවල ගොවීන්ට තමන්ගේ කෘෂි කර්මාන්ත කටයුතු නැවත ආරම්භ කිරීමේ වාසනාව උදා වෙලා තිබෙනවා.

මා තවත් විශේෂ වැදගත් සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටිනවා. එනම්, අර කලාප අනුව වගා කිරීමයි. දියුණු රටවල්වලත් වගාවන් කෙරෙන්නේ කලාප අනුවයි. නමුත් අපි මිරිස් වවන්න ගත්තාම ලංකාව පුරා මිරිස් වවනවා. තවත් මොනවා හරි භෝගයකට වෙළෙඳ පොළක් ඇති වුණාම ලංකාව පුරාම එය වවනවා. අවසානයේ වෙළෙඳ පොළකුත් නැහැ, එයින් ගොවියාට ඇති වුණු වාසියකුත් නැහැ. ඒ නිසා කලාප තෝරා ගෙන ගොවිතැන් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේගේ ඉරියව්වලින් මට තේරෙනවා. මට කථා කරන්නට ලැබිලා තිබෙන කාලය අවසන් බව.මට තව විනාඩියක් දෙකක් දෙන්න. 1971 අංක 14 දරන පනතෙන් ආරම්භ කළ, පසුව වසා දමා තිබුණු වී අලෙවි මණ්ඩලය නැවත ස්ථාපිත කර තිබෙනවා. ඒක හරි වැදගත්. අද අපිට උපදෙස් දෙන විපක්ෂයේ ඇත්තොලා තමයි එදා වී අලෙවි මණ්ඩලයේ එම ගබඩා කර්මාන්ත ශාලා ඉදි කරන්නට පෞද්ගලික අංශයට විකුණුවේ. නමුත් විපක්ෂයට ගියාම මේ විධියට කියනවා. මේ රට පාලනය කරපු අය තමයි මේ ගරු සභාවේ දෙපැත්තේ සිටින්නේ. ඒක එක කාරණාවක්.

ඒ වාගේම අපේ ගරු අමරා පියසීලි රත්නායක මන්ත්‍රීතුමිය කිව්වා, වැව් ගොඩ වෙන එක ගැන. ඒක ඇත්ත. ඇයි වැව් ගොඩ වෙන්නේ? අද විශේෂයෙන් වැව් ගොඩ වෙන්නේ වැව් ඉස්මත්තේ ගොවිතැන් කිරීම නිසයි. නීතිය උල්ලංඝනය කරලා වැව ඉස්මත්තේ ගොවිතැන් කිරීම නිසාත් වැව් ගොඩ වෙනවා. [බාධා කිරීමක්] තවමත් වැව් ඉස්මත්තේ ගොවිතැන් කරනවා. එතකොට වැව් හාරන ක්‍රමයක් තිබෙනවා. වැව් තාවලුවල ගොවිතැන් කරනවා. ඒකට තමයි කුඹුක් වාගේ පැළ ඒ කාලයේ හිටෙව්වේ. අපි දන්නා හැටියට කිව්වා, ඒ ක්‍රම අනුගමනය කරමු; එම පැළ වර්ග සිටවමු කියලා. අනෙක් කාරණාව, වැව් හාරන ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමයට වැව් හාරපුවාම කිසි හානියක් සිදු වන්නේ නැහැ. මා ඉංජිනේරුවෙක් නොවෙයි. නමුත් ඒ ගැන අවබෝධයක් තිබෙන නිසයි කියන්නේ. අනෙක් කාරණාව, ඒ කාලයේ අපි කට්ටි කැපුවා. කුඩා වැව් කට්ටි කපන ක්‍රමයට ගෙන ගියත්, ඒකත් සාර්ථක නැහැ. මොකද, මිනිස්සු අද ඒවාට කැමති නැහැ.

මට තව අදහස් ප්‍රකාශ කරන්නට තිබුණත් කාල වේලාව නැහැ. මගේ කථාවේ ඉතිරි කොටස් ටික **සභාගත*** කරනවා. එය හැන්සාඩගත කරන්නය කියලා මා ඉල්ලනවා. බොහොම ස්තූතියි.

***සභා මේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி :*
*Rest of the speech tabled:*

**මොරගහකන්ද ව්‍යාපාරය**

අඹන්ගගේ ඇලහැර අමුණට මදක් පහළින් වේල්ලක් ඉදි කොට මොරගහකන්ද ජලාශය නිර්මාණය කිරීමත්, එයින් ඇරඹෙන උතුරු මැද යෝධ ඇළ නමින් හඳුන්වන සැතපුම් 106ක් දිග යෝධ ඇළ මාර්ගයක් ඔස්සේ ගෙන යන ජල ප්‍රවාහයෙන් එතෙක් ජල පහසුව නොලත් රජරට කෙත් බිම් දෙකන්නයේ සරු කිරීමත් මොරගහකන්ද ව්‍යාපාරයේ අරමුණ විය.

මොරගහකන්ද ව්‍යාපාරය මෛත්‍රීපාල සේනානායක මැතිඳුන් විසින් බෙහෙවින්ම අගය කරන ලද ව්‍යාපෘතිය වූ බව නිසැකය. තමාගේ ඇප කැප වීම නිසාම ඉදි කරන ලද පදවිය හා වාහල්කඩ වැනි වැව්වලට පමණක් නොව අනුරාධපුරයෙන් උතුරු කරයේ කිළිනොච්චිය දක්වා ජල හිඟය දුරලීමට උතුරු මැද මහ ඇළ ජය ගහක් වන බව හේ විශ්වාස කළේය.

මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමා උතුරු මැද මහ ඇළ පිළිබඳව තිබූ අපේක්ෂාවන් එතුමා විසින් තබන ලද පහත දැක්වෙන සටහනෙන්ම පැහැදිලි වෙයි.

" මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදි කැරෙන මොරගහකන්ද ජලාශ යෝජනා ක්‍රමය යටතේ ද හුරුළු වැවට මහවැලි ජලය සැපයෙනු ඇත.

මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධානතම පරමාර්ථය වන්නේ ඇලහැර අසල තැනෙන මොරගහකන්ද ජලාශයෙන් ඇරඹී දිවයිනේ උතුරු දෙසට මහවැලි ජලය ගෙන යන සැතපුම් සියයක් පමණ දිග යෝධ ඇළයි. මෙම ඇළ හුරුළු වැව, මානන්කට්ටිය වැව, කපිරික්හම (යෝජිත) මහකනදරාව, පදවිය, වාහල්කඩ, පාවක්කුලම, යාන් ඔය (යෝජිත) මුකුණු වැව (යෝජිත) කිතුල්ගල (යෝජිත) කනගරායන් ආරු, පලි ආරු යන වැව් හා ජලාශවලට දියවර සැපයීමට අනුරාධපුර (නැගෙනහිර) හා මැදවච්චිය යන මැතිවරණ කොට්ඨාසය මැදින් ගලා යනු ඇත."

තමා උපන් පෙදෙස් වැසි, සියල්ලන්ම ඥාතීන් වූ නිරන්තරයෙන් දැඩි ඉඩෝරයෙන් අතවරයට පත් කුංචුට්ටු කෝරළයට මොරගහකන්ද ව්‍යාපාරය ක්‍රියාත්මක කොට කෘතවේදීත්වය දැක්වීම මෛත්‍රීපාල සේනානායක මැතිඳුන්ගේ පරම අධිෂ්ඨානය විය. එහෙත් දේශයේ, වෙසෙසින්ම රජරට ජනතාවගේ අවාසනාවට එය ක්‍රියාත්මක නොවීය. ඒ එසේ වූයේ, 1977 මහ මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය පරදවා නව රජයක් බලයට පත් වීම නිසාය.

යම් හෙයකින් 1977 මහමැතිවරණයෙන් පැවති රජයම බලයට පත් වී නම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ, පොල්ගොල්ල - බෝවතැන්න ව්‍යාපෘතීන්ගෙන් පසු ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය මොරගහකන්ද වන බව ස්ථිරය. එතුමා එදා කළ සැලසුම ක්‍රියාත්මක වූයේ නම් මුළු රජරට මහවැලි ජලයෙන් සරු වන එකම කෙත් යායක් වීම නිසැකය.

**යාන් ඔය ජලාශය**

මොරගහකන්ද ජලාශය ඉදි කොට උතුරු මැද ඇළ මඟින් පදවිය, මහකනදරාව, හුරුළුවැව වැනි ප්‍රදේශයේ විශාල වැව් මහවැලි දියවරින් පෝෂණය කිරීම පමණක් නොව, නැගෙනහිර, අනුරාධපුර, මැදවච්චිය, කැබිතිගොල්ලෑව වැනි ප්‍රදේශවලටද ජලය සැපයීම මෛත්‍රීපාල සේනානානායක ඇමතිතුමාගේ පරම අභිලාෂය විය.

එහෙත් 1977 මැතිවරණයෙන් පසු එම යෝජනාව පසෙක ලා කඩිනම් මහවැලි යෝජනාව ක්‍රියාත්මක වූ හෙයින් එයින් තිස් වසරකට පසු අදත් එම ප්‍රදේශ ජල හිඟයෙන් පෙළේ.

වර්තමාන රජය විසින් මොරගහකන්ද යෝජනා ක්‍රමය අරඹා ඇතත්, එහි මුල් අදියරේදී උතුරු මැද ඇළ ඉදි නොකෙරෙන නිසා මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමා අදහස් කර තිබූ අන්දමට මහවැලි ජලය පදවිය දක්වා ගෙන යාමට ඉඩ කඩක් නොලැබේ.

දැනට යෝජිත මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ මහවැලි ජලය සුළු ප්‍රමාණයක් යාන් ඔය දිගේ හුරුළු වැව දක්වා මුදා හැරීමට සැලසුම් කර ඇතත්, එම ජලය පදවිය දක්වා ගෙන යෑමේ හැකියාවක් නැත.

එහෙයින් පදවිය ජනපදයේ ජල හිඟයට ඇති එකම විසඳුම යාන් ඔය ජලාශය ඉදි කර එහි සිට ඇළ මාර්ගයක් මඟින් ජයන්ති වැව දක්වා ජලය සැපයීමයි. එම ඇළ මාර්ගය මහරත්මගහ වැව පෝෂණය කරමින් ගලා යන බැවින් ඒ අවට ඇති ගම් වැව් බොහෝ ගණනාවකට ජල පහසුව සැලසෙනු ඇත.

යාන් ඔය, සීගිරිය ප්‍රදේශයේ සිට කිලෝ මීටර් 122ක් දුර ගලා ගොස් පුල්මුඩේ ප්‍රදේශයේදී මුහුදට එක් වේ. එහි ජල ධාරා ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 1,500ක් වේ. දැනටමත් යාන් ඔය හරහා ජල ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක වන අතර, ඒ සියල්ලම පිහිටා ඇත්තේ යෝජිත ජලාශයට ඉහළිනි. එම ව්‍යාපෘති අතර විශාලතම ජල ව්‍යාපෘතිය හුරුළුවැව ජලාශය යි.

හුරුළු වැව ජලාශයේ සිට යෝජිත යාන් ඔය ජලාශය දක්වා දුර ප්‍රමාණය කිලෝ මීටර් 90ක් පමණ වේ. යෝජිත ජලාශය ඉදි කරන ප්‍රදේශය හා හුරුළු වැව අතර ඇති එම විශාල භූමි ප්‍රදේශයට වර්ෂාවෙන් ලැබෙන ජල ප්‍රමාණය ඇළ මාර්ග ඔස්සේ යාන් ඔයට එකතු වී මුහුදට ගලා යාම අද පවතින තත්ත්වයයි. එහෙත් හුරුළු වැව සිට, යාන් ඔය හරහා යෝජිත ජලාශය දක්වා ජලය ගෙන ඒමේදී ජලය අපතේ යාමක් සිදු වන හෙයින් එම ප්‍රදේශයට ලැබෙන වර්ෂා ජලයෙන් පමණක් වුවත් යෝජිත ජලාශය පෝෂණය කළ හැක.

යාන් ඔය ජලාශය ඉදි වන්නේ අතුරු ඇළ මාර්ග කිහිපයකින් යාන් ඔය වඩාත් ජලයෙන් පෝෂණය වන ත්‍රිකුණාමල දිස්ත්‍රික් මායිමේ යාන් ඔය ද්‍රෝණියට වැටෙන පගුරුගස් වැව ප්‍රදේශයේදීය. මෙය වාහල්කඩ ව්‍යාපාරයට ඉතා ආසන්න වේ. යාන් ඔය ජලාශයේ ඉහළ ජල රැඳවුම් ප්‍රදේශය වාහල්කඩ වැවේ ඉහත්තාවට ඉතා සමීපව පිහිටා ඇති බැවින් යාන් ඔය ජලාශය ඉදි වූ පසු එම ජලාශ දෙකම කලා, බළලු වැව් මෙන් එකට එකතු වී මහා ජලාශයක් බවට පරිවර්තනය වීමට බොහෝ විට ඉඩ කඩ ඇත. එසේ වුවහොත් වාහල්කඩ ව්‍යාපාරය යටතේ තවත් විශාල භූමි ප්‍රදේශයකට ජලය සැපයීමේ හැකියාව උදා වනු ඇත. ජලය අක්කර අඩි දෙලක්ෂයක පමණ ධාරිතාවකින් යුත් යෝජිත ජලාශයෙන් ජයන්ති වැව, පහළ යාන් ඔය අමුණ, මී ඔය, වාහල්කඩ ව්‍යාපාරය යෝජිත ජලාශයේ වම් හා දකුණු ඉවුරු ලෙසින් අක්කර දොළොස් දහසකට වැඩි ප්‍රදේශයක් පෝෂණය වනු ඇත.

යාන් ඔය ජලාශය පිළිබඳ යෝජනාව මෑතකදී කරන ලද යෝජනාවක් නොවේ. ඇත්තෙන්ම ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් 1970 දශකයේ මුල් භාගයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කරවන ලද්දේ මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමා විසින්මය. එහෙත් ඊට වඩා විපුල ප්‍රයෝජන ලැබෙන මොරගහකන්ද හා උතුරු මැද ඇළ මාර්ගයේ කටයුතු ඉක්මනින් නිම කිරීමට එකල එතුමා සැලසුම් කරමින් සිටි නිසා මෙම යාන් ඔය ජලාශ යෝජනාව පසුව ක්‍රියාත්මක කිරීමට තීරණය කෙරිණි. නමුත් එතුමා යෝජනා කළ පරිදි මොරගහකන්ද ව්‍යාපාරය ක්‍රියාත්මක නොවූ නිසාත්, ඉදිරියේදීත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක නොවන නිසාත්, යාන් ඔය ජලාශය ඉදි කිරීමේ වැදගත්කම දැන් වඩාත් ඉස්මතුව තිබේ.

යාන් ඔය ජලාශය පිළිබඳ මැනුම් කටයුතු කිරීමට මෙතෙක් කල් විශාල බාධාවක්ව තිබුණේ එම ප්‍රදේශය කොටි අණසකට යටත්ව තිබුණු හෙයිනි. එහෙත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ නායකත්වය යටතේ අපේ වීරෝදාර රණ විරුවන් විසින් නැගෙනහිර පළාත, විශේෂයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය දැනට ත්‍රස්තවාදී උවදුරින් මුදා ගෙන ඇති හෙයින් මෙම ජලාශයේ මැනුම් කටයුතු ආරක්ෂක හමුදාවන්ගේ ආධාරයද ඇතිව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව දැන් උදා වී ඇත.

ඒ පිළිබඳව සාකච්ඡාවක් වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි මාගේ ප්‍රධානත්වයෙන් නොබෝදා වාරිමාර්ග හා ජල කළමණාකරණ අමාත්‍යාංශයේදී පැවැත්විණ. එහිදී හෙළි වූ වැදගත්ම කරුණ වන්නේ මෙම යෝජනා ක්‍රමයේ මැනුම් කටයුතු අවසන් වූ වහාම ඉදි කිරීම් කටයුතු ආරම්භ කළ හැකි අතර, සම්පූර්ණ ව්‍යාපෘතිය වසර තුනකින් පමණ අවසන් කළ හැකි බවයි.

මහවැලි දියවර රජරටට ගෙන ආ මෛත්‍රීපාල සේනානායක මැතිතුමාගේ අභාවයට වසර දහයක් පිරෙන මේ අවස්ථාවේදී මෙම යාන් ඔය ජලාශ යෝජනා ක්‍රමයේ කටයුතු කඩිනම් කිරීම එතුමන් රජරට ජනතාවගේ පිපාසය නිවීම සඳහා ඉටු කළ අනුපමේය සේවයට උපහාරයක් වනු ඇත.

[பி.ப. 2.24]

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

சபைக்குத் தலைமைதாங்கும் வணக்கத்துக்குரிய தேரர் அவர்களே, எனக்கு இந்தச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு நான் சந்தோசம் அடைகின்றேன். இருந்தாலும், இன்றைய தினம் எனக்கு மிகவும் சோகமான தினமாகும். ஏனென்றால், நேற்று மாத்திரம் என்னுடைய மாவட்டத்திலே சாதாரண பொதுமக்கள் - civilians - ஒன்பது பேர் கொலை செய்யப்பட்டிருக்கின்றார்கள். இவர்களில் என்னுடைய கிராமத்தைச் சேர்ந்த புருஷன், மனைவி, இரண்டு பிள்ளைகள் என ஒரே குடும்ப உறுப்பினர்கள் நால்வரும், எனது பக்கத்து கிராமத்தைச் சேர்ந்த 80 வயதான ஒரு தாயார், அவரது மகன் மற்றும் இன்னொருவர் என மூன்று பேரும் அடங்குகின்றார்கள். இதுபற்றி இன்று அதிகாலையிலிருந்தே பலர் என்னுடன் தொலைபேசியிலே தொடர்புகொண்டு கவலைப்பட்ட

வண்ணமிருக்கிறார்கள். இதற்கு என்ன பதில் சொல்வதென்றே எனக்குத் தெரியவில்லை. இப்படியான ஒரு சூழ்நிலையில்தான் மட்டக்களப்பிலே மக்கள் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். நாங்கள் அறிந்தவரையிலே மட்டக்களப்பு மாவட்டம் அரசாங்கத்தின் கட்டுப்பாட்டில்தான் இருக்கின்றது. அங்கு அரச படையினர் எல்லா இடங்களிலும் இருக்கின்றார்கள். இருந்தாலும், இப்படியான துக்ககரமான சம்பவங்கள் நடைபெறுவது எங்களுக்கு மிகவும் மனவேதனையைத் தருகின்றது. சபைக்குத் தலைமை தாங்கும் வணக்கத்துக்குரிய தேரர் அவர்களே, இதற்கு யார் பொறுப்புச் சொல்லவேண்டும்? இந்த அரசாங்கம்தான் இதற்குப் பொறுப்புச் சொல்லவேண்டும். ஏனென்றால், இந்த அரசாங்கம் தான் எங்களை ஆளுகின்றது. மட்டக்களப்பும் இந்த அரசாங்கத்தினரின் ஆட்சியின் கீழ்தானே இருக்கின்றது. எனவே, இந்தச் சந்தர்ப்பத்தில் மிகவும் துக்ககரமான இந்தச் செய்தியை இந்தச் சபையிலே நான் சொல்ல வேண்டியவனாக இருக்கின்றேன்.

நான் இன்றைய குழுநிலை விவாதத்திலே பல விடயங்களைப் பேச எண்ணியிருந்தும், எனக்கேற்பட்ட இந்த மனத்தாங்கலால் எதைப் பேசுவதென்றே தெரியாமல் இருக்கின்றது. இங்கே நான் பேசுகின்ற விடயங்களை இந்த அரசாங்கம் கவனத்திலெடுக்குமோ, இல்லையோ என்பதும் எனக்குத் தெரியாது. நிச்சயமாக - [இடையீடு]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, පොඩි බාධා කිරීමක් කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා රජයෙන් මඩකලපුව ප්‍රදේශයේ මිනිස් ඝාතන සිදු වෙනවාය කියා. මා අහනවා ගරු මන්ත්‍රීතුමාගෙන් මිනී මරු ප්‍රභාකරන්ගේ කාලයේ මිනිසුන් මැරුණේ නැද්ද කියලා. රජය අහිංසක ද්‍රවිඩ ජනතාව බේරා ගන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

Please, do not take my time. Also, I cannot understand what you say. Do not take my time. I cannot answer your question because I do not want to spend even a minute from my time. - [*Interruption.*] Pardon? What do you want to know from me?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

There is no terrorism in the Batticaloa area. It is an untruth.

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

No, I am not telling an untruth. What I say is hundred per cent truth. This is what happened yesterday. You cannot just deny that. I am not blaming anybody. But, who is to be blamed? You tell me who is to be blamed - [*Interruption.*] Please, -

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගෞරවණීය ස්වාමීන් වහන්ස, ඒ කාලයේ අපේ මිනිසුන් ඕනෑ තරම් මැරුණා, අපේ හමුදාවේ සොල්දාදුවන් මැරුණා, අපේ අහිංසක මිනිසුන් මැරුණා. [බාධා කිරීමක්]

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

Do not talk about those days and these days. I am not worried about what happened in the past or what is going to happen in the future.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

That was also terrorism.

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

Venerable Presiding Member, I want to speak. Please, ask him to sit down. I do not want to lose my time.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්]

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

No. வட, கிழக்கு பற்றி விவசாய நிலைமை பற்றி நான் இங்கே பேசப்போகின்றேன். ஒரு காலத்திலே யாழ்ப்பாணத்திலிருந்து மாம்பழங்கள், மிகளாய், உருளைக்கிழங்கு, நிலக்கடலை என்பன அதிகளவில் இங்கே வந்துகொண்டிருந்தன. இப்பொழுது அவைகள் வருவதில்லை. இலங்கையிலே நாங்கள் உருளைக் கிழங்கை மலிவு விலையில் வாங்கிச் சாப்பிட்ட ஒரு காலம் இருந்தது; யாழ்ப்பாணத்திலே சறுவடை செய்கின்ற காலம்தான் அது. அதேபோல், என்னுடைய மாவட்டம் நெல்லுற்பத்திக்குப் பிரபல்யமான ஒரு மாவட்டமாகும். ஆனால், எங்களுக்கு நீர்ப்பாசனம் மிகவும் குறைவாக உள்ளது. எங்களுடைய மாவட்டத்துக்கு அண்மையிலுள்ள அம்பாறை மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள 65 சதவீதமான வயல் நிலங்களுக்கு நீர்ப்பாசனம் இருக்கின்றது; பொலனறுவையை எடுத்துக்கொண்டால் 85 வீதமான வயல்களுக்கு நீர்ப்பாசனம் இருக்கின்றது; எங்களுடைய மாவட்டத்தில் வெறுமனே அது 35 சதவீதமாகத்தான் இருக்கின்றது. இது ஏன்? அங்கு ஆறுகள் இல்லையா? காடுகள் இல்லையா? வாய்க்கால்கள் இல்லையா, எல்லாம் இருக்கின்றன. ஆனால், தொடர்ந்து 75 - 100 வருடங்களாக இந்த நீர்ப்பாசனத்துறை எங்களுடைய பகுதிகளிலே புறக்கணிக்கப்பட்டு வந்த காரணத்தினால்தான் இன்று எங்களுக்கு நீர்ப்பாசன வசதி இல்லை. நீர் இல்லாமல் நெல் வேளாண்மை செய்ய முடியாது. எனவே, எமது விவசாயிகள் நம்பிக்கையுடன் முதலீடு செய்ய முடியாது. நான் இங்கு சொல்வதை எல்லாம் அரசாங்கம் செய்து தரும் என்று நம்பவில்லை. ஆனாலும், ஆகக்குறைந்தது எமது இந்தக் கோரிக்கைகள் ஆவணப்படுத்தப்பட வேண்டும். மற்றவர்களுக்குத் தெரியப்படுத்தப்படவேண்டும், பதியப்படவேண்டும் என்பதற்காகவாவது நான் இவற்றைச் சொல்ல வேண்டும்.

நான் மட்டக்களப்பிலே நவகிரி பகுதியிலே வசிக்கின்றேன். அங்குள்ள நீர்ப்பாசன அலுவலகத்தில் நல்ல வாகனங்கள் இல்லை. உடைந்து தகர்ற் து போன பனழயய சரகணங்கள் தரன் கிரக்கின்றன் நான் அரசாங்கம அதிபரிடம் இதுபற்றிச் சொல்லி எடுத்துக் கொடுத்த ஒரு பழைய வாகனம்தான்அங்கு பாவனையில் இருக்கின்றது. அங்கு பராமரிப்புத் தொழிலாளர்கள் 80 பேர் தேவைப்படுகின்றார்கள். ஆனால், அந்த நியமனங்கள் வழங்கப்பட வில்லை. அங்கு அவர்கள் இல்லாமல் எப்படி வாய்க்கால்

[ගරු ටී. කනගසබෙයි මහතා]

வடிச்சல்களைச் செவ்வனே பராமரிக்க முடியும்? எங்கள் மாவட்டத்திலுள்ள பெரிய குளம் உன்னிச்சைக் குளமாகும். நான் அறிந்த காலத்தில் அது புனரமைப்புச் செய்யப்பட்டது கிடையாது. இப்பொழுதுதான் அதன் அணைக்கட்டை ஆறு அடிக்கு உயர்த்திச் சிறிது புனரமைத்து வருகின்றார்கள் எதற்காக? கரையோர மக்களுக்குக் குடிநீர் வழங்குவதற்காக! குடிநீர் வழங்குவதை நான் குறை சொல்லவில்லை. குடிநீர் மிகவும் முக்கியம். ஆனால், விவசாயம் செய்வதற்காகவே இந்தக் குளம் கட்டப்பட்டது. அதனால் அங்குள்ள வாய்க்கால் வடிச்சல் மற்றும் துருசு 'கேற்' முதலியன பராமரிக்கப்பட்டு விவசாயத்துக்கான நீர்ப்பாசனத்துக்கும் வழிவகை செய்யப்பட வேண்டும். ஆனால், அதற்கு ஒரு சதக் காசுகூட ஒதுக்கப்படுவதில்லை. இதனை ஆறு அடி உயர்த்துவது பற்றி நீர்ப்பாசன இலாகா சிந்தித்ததா, இல்லையா என்று எனக்குத் தெரியாது. ஆனால் இந்தக் குடிநீர்த் திட்டத்துக்குச் செலவழிப்பது நீர்ப்பாசன இலாகா அல்ல, Asian Development Bank.

மட்டக்களப்பு மாவட்டம் ஒரு விவசாயப் பிரதேசமாகும். விவசாயம் முன்னேறுகின்றபோதுதான் மக்கள் முன்னேறுவார்கள். மக்கள் முன்னேறினால்தான் வர்த்தக நடவடிக்கைகள் மற்றும் தொழிற்றுறைகள் ஆகிய சகலதும் முன்னேறும். எனக்குக் கடைசியாக கிடைத்த புள்ளிவிபரங்களின்படி மட்டக்களப்பு மாவட்டத்தினுடைய per capita income - ஒருவருடைய வருடாந்த வருமானம் - நுவரெலியா மாவட்டத்தைவிட சற்று அதிகப்படியானதாக, அதாவது நுவரெலியா மாவட்டத்திற்கு 25 வது இடம் என்றால் மட்டக்களப்பு மாவட்டத்திற்கு 23 வது இடம் என்ற வகையில்தான் இருக்கின்றது. அவர்களுடைய வருமானம் அந்தளவுக்குக் குறைவு. ஏனெனில் அங்கு பெரிய தொழிற்சாலைகள் இல்லை. அங்கு படிப்பறிவுள்ளவர்களும் குறைவு, சுகாதார சேவையும் குறைவு. எனவே, அபிவிருத்தி தேவையான இடத்துக்குத்தான் முக்கியத்துவம் கொடுக்கப்பட வேண்டும். ஆனால், இங்கு அவ்வாறு நடை பெறுவதில்லை.

அடுத்து, நான் கமநலச் சேவைகள் திணைக்களத்தை - Department of Agrarian Services - பற்றிச் சொல்ல வேண்டும். இப்பொழுது விவசாய அபிவிருத்தி, பசளை விநியோகம் மற்றும் அதில் இடம்பெறுகின்ற களவு, இலஞ்சம் ஆகியவை பற்றி எல்லாம் பேசப்படுகின்றது. மட்டக்களப்பு மாவட்டத்திலே ஓர் இலட்சத்து இருபத்தையாயிரம் ஏக்கர்களுக்கு மேல் விவசாயக் காணிகள் இருக்கின்றன. அதன்படி பார்த்தால், அங்கு 19 Divisional Officers - பெரும்பாக உத்தியோகத்தர்கள் - இருக்கவேண்டும். ஆனால், தற்பொழுது இருக்கின்றவர்கள் ஒன்பது பேர் மட்டுமே. மட்டக்களப்பிலே பதினையாயிரம் ஏக்கர்களுக்கு ஒரு பெரும்பாக உத்தியோகத்தர் இருக்கின்றார். சிங்களப் பகுதிகளிலே ஐயாயிரம் - எட்டாயிரம் ஏக்கர்களுக்கு ஓர் உத்தியோகத்தர் வீதம் இருக்கின்றார்கள். மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரை ஆகக்குறைந்தது 25 பெரும்பாக உத்தியோகத்தர்கள் இருந்தால்தான் இந்தப் பசளை விநியோகத்தை முறையாகச் செய்து நேரகாலத்தோடு அவர்களுக்கு அதனைக் கொடுத்து முடிக்க முடியும். எமது பிரதேசத்தில் பசளையைக் களஞ்சியப்படுத்தக்கூடிய களஞ்சிய வசதி இல்லை. நான் அது பற்றிக் கேட்டால் களஞ்சியத்துக்கு அத்திவாரம் அமைப்பதற்குக் காசு ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனால், அது இன்னமும் எமக்கு வந்து சேராமையால் கட்டட வேலைகள் ஆரம்பிக்கப்படவில்லை என்று சொல்கின்றார்கள். இந்தப் பெரும்பாக உத்தியோகத்தர் களை நியமிக்க கௌரவ அமைச்சர் அவர்களால் முடியாவிட்டால் நான் வேறு என்ன சொல்வது? அந்தப் பசளையைப் பெற்றுக் கொள்வதற்காக எத்தனையோ ஆயிரம் விவசாயிகள் அங்குமிங்கும் ஓடித் திரிகின்றார்கள். இந்தப் பசளை விநியோகத்திலே ஊழல்கள் இருப்பது பற்றிக் கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களும் அறிந்திருப்பார் என்று நான் நம்புகின்றேன். ஆகவே, இந்தப் பெரும்பாக உத்தியோகத்தர்களை நியமித்து அந்த விவசாயிகளுக்கு உதவி செய்யுங்கள் என்று அமைச்சரவர்களிடம் கேட்டுக் கொள் கின்றேன்.

அதுபோல் Assistant Agricultural Research and Productivity Officers ஒவ்வொரு கிராம உத்தியோகத்தர் பிரிவிலும் நியமிக்கப்பட்டிருக்கின்றார்கள். ஆனால், எங்களுடைய பகுதியிலே இதுவரை ஒருவர்கூட நியமிக்கப்படவில்லை. அது ஏன்? இது நியாயமானதா? எங்களுடைய பகுதியிலே விவசாயம் செய்வதில்லையா? நானும் பல சந்தர்ப்பங்களிலே அமைச்சின் ஆலோசனைக் குழுக் கூட்டங்களிலும் இந்தச் சபையிலும் இதைப் பற்றிப் பேசிக்கொண்டுதான் வருகின்றேன். நீங்கள் அந்த வெற்றிடங்களுக்கு உத்தியோகத்தர்களை நியமனம் செய்தாலும் சரி, அல்லது செய்யாவிட்டாலும் சரி, நான் தொடர்ந்தும் இது பற்றிப்பேசிக்கொண்டேதான் இருப்பேன். கௌரவ அமைச்சர் அவர்கள் இதற்கு உரிய பதில் ஒன்றை எனக்கு அளித்தால் நான் மிகவும் சந்தோஷப்படுவேன். எமது மாவட்டத்திலே இதேபோன்று இன்னும் பலவிதமான புறக்கணிப்புகள் நடந்துகொண்டிருக்கின்றன.

எமது மாவட்டத்திலே இப்பொழுது சிறுசிறு நீர்ப்பாசன வேலைகள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அவை துரிதப்படுத்தப்பட வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன். நீர்ப்பாசன இலாகாவில் technical officers - தொழில்நுட்ப உத்தியோகத்தர்கள் மற்றும் chief engineer பற்றாக்குறை நிலவுவதாகத் தெரிவிக்கின்றார்கள். நான் முன்பு குறிப்பிட்டதுபோன்று அங்கு 80 சிற்றூழியர்களுக்கான வெற்றிடங்கள் காணப்படுவதாகவும், சாரதிகள் இல்லை எனவும் தெரிவிக்கின்றார்கள். எனவே, இந்த உத்தியோகத்தர்களுக்குரிய வெற்றிடங்கள் யாவும் நிரப்பப்பட்டு, நீர்ப்பாசன இலாகா துரிதமாகவும் நல்ல முறையிலும் இயங்கினால்தான் அங்குள்ள விவசாயிகளுக்கு உரிய நேரத்தில் போதிய அளவுநீர் கிடைக்கும்.

கௌரவ அமைச்சர் அவர்களால் மேற்கொள்ளப்பட்ட திட்டத்தின் பயனாக அங்குள்ள விவசாயிகள் இந்த வருடம் abandoned lands களிலே மிகவும் கஷ்டப்பட்டு விவசாயம் செய்திருக்கிறார்கள். ஆனால், ஒரு மாத காலமாக அப்பிரதேசங்களிலே மழை பெய்யவில்லை. நெல் வேளாண்மை செய்யும் பொழுது வயலிலே மழை நீரைச் சேகரித்துவைத்து நெற்பயிருக்கு தண்ணீர் கட்டவேண்டும். ஆனால், அந்த ஒரு மாதமும் மழை பெய்யாததனால், நெற்பயிர்களை நனைப்பதற்குக்கூட தண்ணீர் போதாமையினால, நெல் வேளாண்மை பெரிதும் பாதிக்கப்பட்டுள்ளது; ஒரு பகுதி வேளாண்மை முற்றாக அழிந்துவிட்டது. சில பகுதிகளில் நெற்பயிர்கள் அழியாவிட்டாலும், தண்ணீர் பற்றாக்குறை காரணமாக பயிர்கள் வளர்ச்சிகுன்றிக் காணப்படுகின்றன.

நான் மேலும் சில விடயங்களை ஆங்கிலத்திலே குறிப்பிட விரும்புகிறேன். I would like to bring to the notice of the Hon. Minister, about the filling of vacancies in the Department of Irrigation and Water Management. There are about eight vacancies in that Department for minor employees including maintenance labourers.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, please wind up.

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

Okay, thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට ස්තුතියි. මීළඟට ගරු සාලින්ද දිසානායක ඇමතිතුමා.

[අ. භා. 2.36]

**ගරු සාලින්ද දිසානායක මහතා (පොල් සංවර්ධන අමාත්‍යතුමා සහ ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**

(மாண்புமிகு சாலிந்த திஸாநாயக்க - தெங்கு அபிவிருத்தி அமைச்சரும் தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சரும்)

(The Hon. Salinda Dissanayake - Minister of Coconut Development and Minister of Nation Building)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කියා සිටියේ උතුරු ප්‍රදේශවල සංවර්ධනය සිදු වුණේ නැහැ කියන කාරණයයි. පසු ගිය වසර තිහක පමණ කාලයක් ප්‍රභාකරන් විසින් ඒ ප්‍රදේශයේ සංවර්ධනය කරනු ලැබුවේ ත්‍රස්තවාදයයි. ත්‍රස්තවාදය නිසා ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීමේ කටයුතු කරන්නට බැරි වුණාය කියන එක අපි කවුරුත් දන්නා කාරණයක්.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, වාරිමාර්ග හා ජල කළමනාකරණ, ඉඩම් හා ඉඩම් සංවර්ධන, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ විවාදය පවත්වන මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න මා කැමැතියි. වියළි කලාපයට වතුර නැති නිසා අපි වියළි කලාපයේ වාරි මාර්ග ක්‍රම සකස් කරනවා වාගේම තෙත් කලාපයේ වතුර වැඩි නිසා වතුර පාලනය කිරීම සඳහා වාරි මාර්ග ක්‍රම අවශ්‍යයි කියන එක මේ අවස්ථාවේ දී මතක් කරනවා.

විශේෂයෙන්ම කෘෂිකර්මය පිළිබඳව වචන කිහිපයක් කථා කරන්නටයි මා දැන් බලාපොරොත්තු වන්නේ. පසු ගිය කාලයේ අපේ රට ඉදිරියේ, ජනතාව ඉදිරියේ, අපේ ආණ්ඩුව ඉදිරියේ තිබුණු එක් ප්‍රධාන අභියෝගයක් වුයේ ආහාර පිළිබඳ ප්‍රශ්නය බව අපි දන්නවා. එය ඉතා මැනවින් විසඳීම සඳහා අපේ ගරු අමාත්‍යතුමා "අපි වවමු - රට නඟමු" වැඩසටහන ඉතාම සාර්ථකව ක්‍රියාවට නඟලා ආහාර පිළිබඳ ප්‍රශ්නය මේ රටට දැනෙන්නට ඉඩ දුන්නේ නැහැ. ලෝකයේ රටවල් හතළිස්හතක් පමණ ආහාර ඉල්ලලා පෙළපාළි යනවා. ලෝකයේ රටවල් විසිඑකක් පමණ කන්න දෙන්නය කියා කෑගලි ගහනවා. නමුත් අපේ රටට එවැනි තත්ත්වයකට පත් වන්න ඉඩ නොදී මේ අමාත්‍යාංශය හරහා කරන ලද විශිෂ්ට සේවාව අපි මේ අවස්ථාවේ දී අගය කරනවා. ඒ වාගේම අපේ රජය පොහොර සහනාධාරය ලබා දෙනවා. අපි සහනාධාර ක්‍රමයට රුපියල් තුන්සිය පනහට පොහොර දෙනවාය කියා කිව්වාට යූරියා හොණ්ඩරයකට රුපියල් හාරදහස් පන්සියයකට එහා වැය වනවා. අපි පොහොර රුපියල් තුන්සිය පනහට දුන්නාට එයින් ගොවියාට ලැබෙන සහනාධාරය රුපියල් හාරදහස් එකසිය පනහක් පමණ වනවා. ඒ අනුව මඩ පොහොර හොණ්ඩරයකට ලැබෙන සහනාධාරය රුපියල් හාරදහස් හයසිය පනහක් පමණ වනවා. බණ්ඩි පොහොර හොණ්ඩරයකට ලැබෙන සහනාධාරය රුපියල් හයදහස් එකසිය පනහක් පමණ වනවා. ඒ අනුව හෙක්ටෙයාරයක් සඳහා ගොවියකුට එක කන්නයකට අපි ලබා දෙන සහනාධාරය රුපියල් පනස්දාහ ඉක්ම වනවා. එවැනි සහනාධාරයක් තමයි අපි ලබා දෙන්නේ. රුපියල් තුන්සිය පනහ නොවෙයි, හෙක්ටෙයාරයක් සඳහා රුපියල් පනස්දාහකට වැඩි සහනාධාරයක් මේ රජය ලබා දෙනවාය කියන එක මා මතක් කරන්න කැමැතියි. අපේ රටේ ජනගහනයෙන් සියයට හැත්තෑහයක් කරන්නේ ගොවිතැනයි. එයින් සියයට පනස්හයක් වී ගොවිතැන කරනවා. ඒ වී ගොවිතැන සඳහා දෙන පොහොර සහනාධාරය පිළිබඳව තමයි මා කිව්වේ.

දැන් මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ හරිත විප්ලවය යනු කුමක්ද යන්න පිළිබඳවයි. දෙ වන ලෝක යුද්ධයෙන් පස්සේ රසායන විද්‍යාව ලෝකයේ දියුණු වුණා. ඒ වාගේම ජාන තාක්ෂණ විද්‍යාව ලෝකයේ දියුණු වුණා. ඒ නිසා තුන් වන ලෝකයේ ඉරිඟු, තිරිඟු, වී වගා කරන ගොවීන්ගේ ලාභය ලබා ගන්නට තමයි හරිත විප්ලවය බිහි වුණේ. බහු ජාතික සමාගම්වලට අවශ්‍ය වුණා මේ ලාභය ගන්න. ඒකට ක්‍රමයක් හැදුවා, ඒක තමයි හරිත විප්ලවය. හරිත විප්ලවයේ ආකර්ෂණීය දෙයක් තිබුණා. ඒ තමයි විශාල අස්වැන්නක් ලබා ගැනීමට පුළුවන් වීම. අපේ පැරණි ක්‍රම අනුව අපේ පැරණි බීජවලින් ලබා ගැනීමට පුළුවන් වූ අස්වැන්න අක්කරයකට වී බුසල් තිහක්, හතළිහක් පමණයි. නමුත් හරිත විප්ලවයෙන් අක්කරයකට වී බුසල් අසූවක් ලබා ගන්නට පුළුවන්කම ලැබුණා. ඒ කියන්නේ දෙගුණයක් අස්වැන්න ලබා ගන්නට පුළුවන්කම ලැබුණා. ඒ අවස්ථාවේ දී මෙය හඳුන්වා දෙන විට තෙල් සහ පොහොර නොමිලේ වාගෙයි දුන්නේ. ඒ බහු ජාතික සමාගම්වල උපායට අපි හසු වුණා.

අපේ රටේ විද්‍යාඥයන් දෙදෙනකු එකතු වෙලා ඒ ජාන තාක්ෂණය භාවිත කරලා අපේ රටේත් වී වර්ගයක් හැදුවා. ඒ වී වර්ගයට කියනවා "එච් 4" කියා. "එච් 4" කියන්නේ ඉතාම ශක්තිමත් ජාන එකතු කරලා හදපු අලුත් බීජයක්. ඒකට ලෙඩ රෝග හැදෙන්නේ නැහැ. බොහොම ඉහළ මට්ටමේ ගුණාංග තිබෙන බීජයක්. ගොයම් කපන කොට වී ඇටය වැටෙන්නේ නැහැ. නමුත් ඒ විද්‍යාඥයන්ට ඉන් එහාට යන්න දුන්නේ නැහැ. එතැනින් එය නතර කළා. ඊට පස්සේ අපිට ඒ හරිත විප්ලවය හරහා ලැබුණේ මා කලින් කී පරිදි බහු ජාතික සමාගම්වල වුවමනාවක් මත ලාභය ගන්න පුළුවන් බීජ වර්ගයි. ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය - IRRI - අපේ රටේ පැරණි වී වර්ග පිලිපීනයට අර ගෙන ගිහිල්ලා අර කියපු ජාන තාක්ෂණය භාවිත කරලා දෙමුහුන් වී වර්ගයක් හදලා දුන්නා. ඒවා තමයි දැන් අපි වගා කර ගෙන යන්නේ. මේවා ලෙඩ රෝගවලට ඔරොත්තු දෙන්නේ නැහැ. වර්ෂයක් වර්ෂයක් පාසා අලුතෙන් ලෙඩ රෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ වර්ෂයේ ගහන බෙහෙත් වර්ගය නොවෙයි, ඊළඟ වර්ෂයේ ගහන්නේ අලුත් බෙහෙත් වර්ග හදලා එවනවා. ඒ නිසා අපි මේ බෙහෙත් වර්ගවලට හුරු වෙලා තිබෙනවා. පුළුවන් තරම් තෙල් වර්ග භාවිත කරනවා. ඒ නිසා අපේ රටේ ජනතාව රෝගීන් බවට පත් වෙලා තිබෙනවා. පිළිකා රෝග වැඩියෙන් හැදෙන්න පටන් අරන් තිබෙනවා. දියවැඩියාව ලෙහෙසියෙන් වැළඳෙනවා. මේ තෙල් සහ පොහොර නිසා හෘද රෝග, ඒ වාගේම නිල් දරු උපත්, වකුගඩු රෝග බලවත් විධියට අපේ රටේ වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ ගොවියෝ හරිත විප්ලවයේ වහලුන් බවට පත් වෙලා සිටිනවා. විශාල තෙල් සහ පොහොර උගුලකට මේ රටේ ගොවියා ඇද දමලා තිබෙනවා. මේකේ දීර්ඝ කාලීන ප්‍රතිඵලය මොකක්ද? අද අපේ පොළොව මරලා. ජීවත් වන පොළොවක නොවෙයි අද අපි ගොවිතැන් කරන්නේ. අපි විසින්ම මරපු පොළොවක තමයි අපි ගොවිතැන් කරන්නේ. අද පොළොවේ උත්පාදන ශක්තිය හොඳටම හීන වෙලා. නැවත ජීවත් වන පොළොවක් හදන්න අද පටන් ගත්තොත් අපට ඒ සඳහා තව අවුරුදු තුනක් විතර ගත වනවා.

අද අපි ගහන රසායනික පොහොරවලින් සියයට තිහක් පමණ තමයි මේ ශාකවලට උරා ගන්නේ. ඉතිරි සියයට හැත්තෑවම අපතේ යනවා. කාබනික පරිසරයක් කුඹුරේ නැති නිසා මේ පොහොර සම්පූර්ණයෙන් උරා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා සියයට හැත්තෑවක් අපතේ යන පොහොරවලින් නැවතත් පොළොව මැරීමේ කටයුත්තට දායක වනවා. ගොයම් ගහ ගැන හරිත විප්ලවයෙන් අපට කියා දුන්නේ ගොයම් ගහ ජලජ ශාකයක් කියලායි. ඒ නිසා ගොයම් පැළය හිටවලා අපට කිව්වා "වතුර බැඳපල්ලා" කියා. අපි වතුර බැන්දා. වල් පැළෑටි මර්දනය කරන්න අපි අනුගමනය කරපු හොඳම කම්මැලි ක්‍රමය තමයි වතුර බඳින එක. වතුර බැන්දාම වල් පැළ මතු වන්නේ නැහැ. හැබැයි, ගොයම් ගහ විපර්යාසයට ලක් වුණා. එතකොට ගොයම් ගහට ඕනෑ කරන අම්ලකර වායුව ලබා ගන්න බැහැ. ඒ නිසා අම්ලකර වායුව ලබා ගන්න වතුරෙන් උඩට මුල ගැටිතිවලට එන්න සිදු වුණා. ඒ නිසා වතුර බැන්දාම මුල පද්ධතිය පොළොව යටට ගියේ නැහැ. හරි විධියට නම් ගොයම් ගහේ මුල පද්ධතිය අඟල් නවයක් පොළොව යටට යන්න අවශ්‍යයි. එතකොට තමයි ගහට ඕනෑ කරන පෝෂ්‍ය පදාර්ථ උරා ගන්න පුළුවන් වන්නේ. නමුත් වතුර බැඳපු නිසා මුල පද්ධතිය පොළොව යටට ගියේ නැහැ. ඒ නිසා ගහට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ උරා ගන්න විධියක් තිබුණේ නැහැ. ඉතින් අපට කිව්වා, "උඹලා පොහොර ගහපල්ලා" කියා. ඒ නිසා අප එතැනදී තමයි පොහොර උගුලට අහු වුණේ.

අපේ ගොවිතැනෙන් ලාභය ගන්නේ කවුද? අපේ ගොවියා පොහොසතෙක් වන්නේ නැත්තේ ඇයි? අපේ ගොවීන්ගේ ලාභය ගන්නේ තෙල් සහ පොහොර කොම්පැනිකාරයෝ; බහු ජාතික

[ගරු සාලින්ද දිසානායක මහතා ]

සමාගම්; අපේ ගොවීන්ගේ ලාභය ගන්නේ අතර මැදියෝ. මේ ගොවිතැනේ ලාභය ගොවීන්ට දෙන්න නම් අතර මැදියනුත්, තෙල් සහ පොහොර කොම්පැනිකාරයනුත් ඉවත් කරන්න සිද්ධ වනවා. ඒක කරන්න පුළුවන්. ඒක කරන්න පුළුවන් නම් ඒක ජීවනෝපාය සංවර්ධනයක් හැටියට පත් වෙනවා. ගොවිතැන පමණක් නොවෙයි අනික් හැම දේමත් එහෙම තමයි. ලාභ ගන්න පුළුවන්කමක් නැහැ. පිටුපසින් සිටින්නේ වෙනත් බලවේග. කුකුළු කොටුවක් දැම්මොත් ඒකේ ලාභ ගන්නේ ප්‍රීමා කොම්පැනිය. බහු ජාතික සමාගමක්. කුකුළු කොටුව හදන එක් කෙනාට ප්‍රීමා කොම්පැනිය විසින් කුකුළු කොටුව බලා ගන්න කෙනෙක් පත් කළ බව තේරෙන්නේ නැහැ. කිරි නිෂ්පාදනය කළත් ලාභය ගන්නේ නෙස්ලේ සමාගම. බිත්තර වී හදලා ලාභ ගන්නේ CIC සමාගම. මේ රටේ ගොවියාගේ ගොවිතැන සමාගම් විසින් උදුරා ගෙන ගොවියෝ වහලුන් ලෙස තබා ගෙන තිබෙනවා. ඒ නිසා අප දැන්වත් මේ ගොවිතැනේ අයිතිය ගොවියාට දෙන්න අවශ්‍යයි. එතකොට තමයි ගොවියෝ පොහොසත් වන්න පටන් ගන්නේ. "අපි වවමු - රට නඟමු" වැඩසටහනට මේ ක්‍රියාවත් ඇතුළත් වන්න අවශ්‍යයි.

දැන්වත් අපේ කෘෂි විද්‍යාඥයෝ අපට ඇත්ත කියන්න ඕනෑ. හරිත විප්ලවයේ බොරුව අපට දැන් කියා දෙන්න අවශ්‍යයි. හරිත විප්ලවයට විකල්ප වී ගොවිතැන් ක්‍රමයක් අද ලෝකයේ පිළිගෙන තිබෙනවා. ඒ ගොවිතැන් ක්‍රමයෙන් තෙල් සහ පොහොර කොම්පැනිකාරයෝ ඉවත් වනවා. ඒ ක්‍රමයෙන් හරිත විප්ලවයට වඩා විශාල අස්වැන්නක් ගන්න පුළුවන්. වස විසවලින් තොරයි. එයට කියනවා, "කාබනික ක්‍රමයට වී වගාව" කියා. මෙයට කියනවා "SRI" කියා; "එස්ආර්අයි" ක්‍රමය කියා. එස්ආර්අයි කියා කියන්නේ System of Rice Intensification. සූක්ෂම වී වගා ක්‍රමය කියාත් කියනවා. ලෝකයේ ශීඝ්‍රයෙන් මේ වගාව ඉස්සරහට එනවා. ඉන්දියාවේ තමිල්නාඩුවේ විද්‍යාඥයන් දෙදෙනෙක් ඇවිත් මේ ක්‍රමය අපෙන් ඉගෙන ගෙන ගියා. අද මේ කන්නය වන විට තමිල්නාඩුවේ අක්කර හත් ලක්ෂයක "SRI" වී වගාව කර තිබෙනවා. මේ වන විට ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් "SRI" වී වගාවට ඇවිත් තිබෙනවා. අපේ ගොවිතැනේ තිබෙන මූලික ප්‍රශ්නවලට අවශ්‍ය විසඳුම් "SRI" වී වගාවෙන් ලැබෙනවා. අපේ ගොවිතැනේ තිබෙන පස පිළිබඳ ප්‍රශ්නය, ඉඩම පිළිබඳ ප්‍රශ්නය, ජලය පිළිබඳ ප්‍රශ්නය, බීජ පිළිබඳ ප්‍රශ්නය, පොහොර පිළිබඳ ප්‍රශ්නය, නිෂ්පාදන වියදම අඩු කිරීම පිළිබඳ ප්‍රශ්නය, නිෂ්පාදන ධාරිතාව - අස්වැන්න - වැඩි කිරීම පිළිබඳ ප්‍රශ්නය, ඉතා ඉහළ ප්‍රමිතියට නිෂ්පාදනය කිරීම පිළිබඳ ප්‍රශ්නය - අලෙවිය පිළිබඳ අපට ප්‍රශ්නයක් තිබුණා. නමුත් දැන් ඒ ප්‍රශ්නය නැහැ. - ලාභය පිළිබඳ ප්‍රශ්නය ආදී ප්‍රශ්නවලට විසඳුම් මේ "SRI" ක්‍රමයෙන් අපට ලැබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

**ගරු සාලින්ද දිසානායක මහතා**
(மாண்புமிகு சாலிந்த திஸாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ අපේ හාමුදුරුවනේ. බිත්තර වී ටිකට් අවශ්‍ය වන්නේ. අක්කරයකට වී කිලෝ හතරක් පමණයි අවශ්‍ය වන්නේ. වතුර අවශ්‍ය වන්නේ සියයට 35ක් පමණයි. වැවක් යටතේ ගොවිතැන් කළොත් වැවේ වතුර සියයට 65ක් ඉතිරි කර ගන්න පුළුවන්. එක තැන එක පැළයයි අපි සිටුවන්නේ. මේ ක්‍රමයේ දී අපි perch එකක පැළ 144ක් සිටු වනවා. එක පැළයකින් පැළ 100කට ආසන්න පැළ සංඛ්‍යාවක් එනවා. ඒ නිසා පැළ 144න් වී හුණ්ඩු 144ක් ගන්න පුළුවන්. අවුරුදු තුන හතරක් යන කොට අපේ පස ජීවත් වන පොළොවක් හැටියට පරිවර්තනය කර ගත්තාම අක්කරයට වී බුසල් 400ක් පමණ ගන්නට පුළුවන්කම තිබෙනවා. දැනට දිස්ත්‍රික්ක 18ක පමණ මා මේ වගාව කර ගෙන යනවා. ගොවියෝ 30,000ක් පමණ සිටිනවා. මා උපරිම අස්වැන්නක් ලබා ගෙන තිබෙනවා. අක්කරයට වී බුසල් 357 1/2 ක් ලබා ගෙන තිබෙනවා. අස්වනු සමීක්ෂණය කරලා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් මට ඒ සහතිකය ලබා දීලා තිබෙනවා. මා ඉල්ලීමක් කරනවා, මේ රටේ මේ වී ගොවිතැන සාර්ථක කර ගැනීමට කටයුතු කරන්නට අවස්ථාව සකස් කරන්නය කියලා.

[අ. භා. 2.48]

**ගරු ඒ. එම්. එම්. නවුෂාඩ් මහතා**
(மாண்புமிகு ஏ. எம். எம். நவுஷாத்)
(The Hon. A. M. M. Naoshaad)

Bismillahir Rahmanir Raheem.

Venerable Presiding Member, I am happy that I have been given an opportunity to speak on the Votes of three key Ministries that form the backbone of my district's economy and the Government's " Api Wawamu Rata Nagamu" programme. I believe, the Digamadulla District is the largest contributor to the granary right now and I will participate in this Discussion taking the subjects in the order of irrigation, land and agriculture.

I have known the Ministre of Irrigation and Water Management, the Hon. Chamal Rajapaksa, since 1980 when we both worked together, and despite our political differences I must admit, that he is someone who can get things done. Having said that, I am disappointed that though there is an increase in Recurrent Expenditure and a huge leap in Capital Expenditure, there is very little coming in the direction of the Eastern Province except, of course, a token vote for the Heda Oya Project, by way of Capital Expenditure. This is despite all the noise being made about the re-awakening of the East under the "Negenahira Udanaya."

Venerable Presiding Member, agriculture is the backbone of my people, and water is the blood that feeds it and it is very critical that enough attention is paid to our region to improve the irrigation facilities and maintain the same. I spend most of time in my electorate meeting farmer organizations along with officials so that I can better understand their problems and highlight deficiencies without having to be relying only on information that is fed to me.

We have this "Gal Oya Navodaya" scheme that was inaugurated, I believe in 2007, when Marhoom Anver Ismail was the subject Minister, This was to have an interministerial steering committee and also a project office in Ampara. I am not sure whether this objective has been realized to-date. There was an original allocation of almost Rs. 1,260,000 made for this project. I am aware that an allocation of Rs. 50 million was made for the year 2008 and later revised to Rs. 30 million, but as at today only Rs. 15 million has been spent on one anicut in my area, the Kandanveli Anicut, and it would be interesting to know what has happened to the balance Rs. 15 million of the revised allocation, when there is only one month to go in the year. This is the state of affairs when we should be really accelerating development efforts in the Eastern Province.

The river division of Gal-Oya with its tributaries such as Moravil, Pattampiti, Kurunal Kanji, Udanga, Thiraimadu and Sengappadai has been in existence long before the building of the Senanayake Samudra and was irrigating the fertile lands opened up by the hard labour of my ancestors, which fact most of the present generation do not have an innate understanding of.

It is only after the construction of the Senanayake Samudra in the 1950s that the Sinhala population of the district increased from a mere 2 per cent to what it is today. If not for the foresight of Marhoom Gate Mudaliyar Kariapper and the tireless work of engineers like Marhoom M. M. Ismail, Marhoom M. A. M. Mirza and the political leadership of that day like Marhoom A. M. Merza, Alhaj M. A. Abdual Majeed, Marhoom M. H. M. Ashraff, Marhoom U. L. M. Mohideen and Marhoom Anver Ismail who all took a very keen interest in the Irrigation and agricultural sector, we are not in this position today. It must be said that other Ministers too have been showing interest in this vital sector. I will fail in my duty if I do not mention the name of the Hon. P. Dayaratna who has done yeoman service to the development of the Gal-Oya valley in general. It is in this rich tradition of ethnic harmony that we need to develop the infrastructure of this district and not leave room for elements who are trying to bring about friction among the communities who live here and love the land which they call their own.

I would like now, to specifically take up some issues pertaining to the office of the Irrigation Engineer, Samanthurai set up by Marhoom Anver Ismail which I took up at the Consultative Committee Meeting as well. This office covers an area of approximately 9.761 hectares and maintains, six field offices, 12 kilometers of main rivers, 30 kilometers of subrivers, two storage tanks, 4.81 kilometers of feeder channels, 5.8 kilometers of main channels, 78.2 kilometers of branch channels and 173.2 kilometers of distributory channels. It also maintains 18 main anicuts, 39 medium anicuts, 496 channel structures, 42 kilometers of irrigation roads, 171 kilometers of agricultural roads and 13 kilometers of drainage channels. All this is covered by one engineer, three engineering assistants and three supervisors. I request the Hon. Minister to increase this cadre by two engineering assistants, four work supervisors and at least 26 labourers so that we can work with this office to fulfil our needs.

The main problem we have in the rivers division which is approximately 30 kilometers, is the lack of maintenance. The rivers need to be dredged to remove silt that has gathered over the years. Main channels and distributory channels need to be concreted at the head and maintained for proper utilization of the presious water resource. I made a request that approximately 4.8 kilometers of Malwatta-Samanthurai Channel, opening at the Weergoda Tank be concreted to prevent the growth of algae and I am sure the Hon. Minister will accede to it. Some of the anicuts in our area have been built in the eighteenth century by burnt bricks. One of those, the Veerayadi Anicut, was renovated recently at a cost of almost Rs. 88 million on the efforts taken by Minister, Marhoom Anvar Ismail. In the same way, we need to look at Kandanveli Anicut, Sampumadu Anicut and Fernando Anicut which need urgent repairs.

You will be surprised to hear that this office which has so much of work to do, thought it has indicated an expense of Rs. 10.8 million for flood damage work, has not received a red cent as at date. I am disappointed because I met the Secretary personally and I was assured of this money but yet it has not reached that office. I know that everything cannot be done by the State and I am one who firmly believes that farmer contribution is very essential; labour alone is not sufficient, machinery is required as well. I request that each of the irrigation offices at Samanthurai, Ampara, Akkaraipattu and Kalmunai be given the required machinery such as, crawler excavators, front-end loaders and backhoes so that we can get the farmer organization to use them, even the tractors, and contribute towards the fuel cost to reduce the burden on the state.

Another major issue is the agricultural roads. Right now the width of the agricultural roads is three metres. Now, with the advent of modern harvesting machinery, this needs to be widened to at least four metres. Otherwise, when we go through another two seasons, we will not have any roads left to maintain.

The other issue which I would like to take up is with regard to the wooden planks used to store up water in anicuts. This is a method that has been practiced over the years. With this resource diminishing, we need to find a way to protect them for longer use. I would suggest that these planks either be coated with fiberglass or plastic so that they can be used many times.

The next subject that I would like to take up is lands. With regard to the Vote on Land, we see an increase in Recurrent Expenditure and a drop in Capital Expenditure. Land is the most important natural resource which is the basis if all human, biological and environmental needs. Efficient management of land resource is very critical due to population pressure and competition among nationalities. Now, how do we do this? Recently, there was a circular issued by the Land Commissioner-General. I know that the Hon. M. T. Hasen Ali took up this issue and also tabled a document that had been prepared by the Peace Secretariat for Muslims which had elaborated on the issue. What I would like to take up is the legal aspect of this issue because I am told that there is an ambiguity of the language that is used there. The document prepared by the Peace Secretariat for Muslims states :

> "……the circulars issued by the Secretary, Ministry of Land and Land Development and the Land Commissioner General are inconsistent on one important point.

> The Ministry circular says the extent of land alienated in future will be determined by the Land Minister in Colombo in consultation with respective provincial land ministers, while the circular issued by the Land Commissioner says the government and the provincial council will determine the extent of land."

The Government and the provincial councils, we all know, are distinct entities vis-à-vis the Cabinet and the provincial ministers. Divisional level officers will face difficulties in the implementation if this ambiguity continues. There is also a question whether there is usurpation of powers of provincial councils, whether the circulars have the effect of taking away powers of provincial councils in respect of lands. Are the provincial council land ministers empowered to grant consent to implement far-reaching policy decisions touching on devolved subjects? Because, item No. 1:3 of Appendix II of the Constitution states:

> " Alienation or disposition of the State land within a Province to any citizen or to any organization shall be by the President, on the advice of the relevant Provincial Council, in accordance with the laws governing the matter."

I think, this is something that has to be definitely looked at.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Please wind up.

**ගරු ඒ. එම්. එම්. නවුෂාඩ් මහතා**
(மாண்புமிகு ஏ. எம். எம். நவுஷாத் )
(The Hon. A. M. M. Naoshaad)

Please give me one minute more.

I will just touch on agriculture. The Government is now working towards an increase in the paddy production and other pulses. I would urge the Minister, that to do this in our district we need soil testing facilities. The agriculture research institution opened in Samanthurai in 2001 which is now in a dilapidated condition and all the agrarian service centers have to be refurbished. I would also request that a new agrarian service centre be opened in Samanthurai for Block J which covers approximately 6000 acres.

Thank you.

[අ. භා. 3.03]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද දිනයේදී මම සතුටු වෙනවා, විශේෂයෙන්ම කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේත්, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යංශයේත්, වැය ශීර්ෂ පිළිබඳව ජාතික හෙළ උරුමය හැටියට අපේ අදහස් කිහිපයක් මේ සභාව හමුවේ තබන්නට හැකි වීම ගැන. මට ලැබී තිබෙන සීමිත කාලය තුළ කෙටියෙන් කරුණු පැහැදිලි කරන්නට මා බලාපොරොත්තු වනවා. 1962 දී පමණ විද්‍යා තාක්ෂණයේ දියුණුවත් සමඟම ලෝකයේ හරිත විප්ලවය ඇති වුණා. මේ හරිත විප්ලවය නිසා පිලිපීනයේ සහල් පර්යේෂණ ආයතනය - IRRI ආයතනය - ස්ථාපිත කරනු ලැබුවා. ඒ අනුව ලෝකය පුරාම සාම්ප්‍රදායික බීජ වර්ග වෙනස් කරමින් තෙල්, පොහොර භාවිතාව මුල් කර ගත් නව කෘෂි කර්මාන්තයක් සඳහා දිරි ගැන්වීමක් කරනු ලැබුවා. 1950 වන විට අප සතුව වී වර්ග 1,666ක් තිබුණු බව සංගණනය කරලා තිබුණා. අද වන කොට බතලගොඩ සහ අනිකුත් ජාන පර්යේෂණ ආයතනවල ඉතිරිව ඇති අපේ වී වර්ග ගණන තුන්සිය පනස් ගණනක් බව අනාවරණය වෙලා තිබෙනවා. මේ අනුව වී ගොවිතැනට අදාළ වූ අපේ පාරම්පරික බීජ වර්ග බොහොමයක් සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙන බව පෙනෙනවා. එච් 4, අයිආර්. බීජී 11 ඇතුළු අනේක විධ වී වර්ග අපේ කුඹුරුවලට හඳුන්වා දුන්නා. ඉතා ඉක්මනින් අත්වනු ලැබෙනවාය; කෙටි කාලයකින් වී ලබා ගන්න පුළුවන්ය; කරල් බර වෙනවාය; රට ස්වයංපෝෂිත කරන්න පුළුවන්ය කියා තමයි මේ හැම බීජයක්ම හඳුන්වා දීමේදී ප්‍රකාශයට පත් කළේ. 1970 මුල් වකවානුවේ සෑම විශ්වවිද්‍යාලයකම මහාචාර්යවරුන් සඳහා විවිධ විශ්වවිද්‍යාලවල ශිෂ්‍යත්ව ලබා දුන්නා. ඒ ශිෂ්‍යත්ව මඟින් සම්පූර්ණයෙන්ම නව තාක්ෂණික වී ගොවිතැන පිළිබඳව, බහු ජාතික සමාගම්වලට අවශ්‍ය කරන විධියට මොළ සෝදා හරින ලද බුද්ධිමතුන් පිරිසක් විශ්වවිද්‍යාලවලින් බිහි කළා. ඒ වාගේම ලංකාවේ සියලුම කෘෂිකර්ම පීඨවල ඊට අනුකූල පාඨමාලා සකස් කරනු ලැබුවා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, එහි ප්‍රතිඵලයක් හැටියට අද සිදු වෙලා තිබෙන දෙය පිළිබඳව මේ අය වැයේදී අවධානය යොමු කළාය කියා හෝ ඒ බරපතල අනතුර තේරුම් ගත්තාය කියා හෝ මා හිතන්නේ නැහැ. ඒක තේරුම් ගන්නත් අමාරුයි. ඒ වාගේම තේරුම් ගත්තත් ක්‍රියාවට නංවන්න අමාරුයි. මොකද, ඒකට යම් කිසි සංක්‍රමණීය කාලයක්, දිගු කාලයක් ගත වන නිසායි. සරල උදාහරණයක් හැටියට ගත්තොත් මහින්ද චින්තනයේදී කලින් ඉදිරිපත් කරපු විධියට ජනතාවට පොහොර සහනාධාරයක් දෙන බව මෙවර අය වැයේදීත් කිව්වා. රුපියල් 900ක් පමණ වන පොහොර උරයක් රුපියන් 350ටයි ජනතාවට ලබා දෙන්නේ. නමුත් ප්‍රතිශතයක් විධියට ගත්තොත් මෙය සියයට 96ක් තරම් වන බව මේ පොහොර සහනාධාරය ලබා දීමේදී පැහැදිලි කර තිබෙනවා. අපි කවුරුත් දන්නවා, යූරියා යෙදවුම කියන්නේ තෙල්වල අතුරු නිෂ්පාදනයක් බව. ඒ වාගේම අපි කවුරුත් දන්නවා තෙල් කියන්නේ මොනවාද කියා. ඉතිහාසයේ මේ පෘථිවි තලයේ පොයිලගත වූ ගස් කොළන්, කැලෑ තමයි අද අපට ඉන්ධන හැටියට ලැබෙන්න පටන් අර ගෙන තිබෙන්නේ. පොයිලගත වූ ඉන්ධන ලබා ගැනීමේදී එහි අතුරු නිෂ්පාදනයක් හැටියට ලැබෙන යූරියා සහනාධාරයක් හැටියට ලංකාව පුරා ලබා දෙන්නට පටන් අර ගෙන තිබෙනවා. මෙහිදී කරුණු කිහිපයක් අවධානය යොමු කරන්න අපි කැමැතියි. මුළු කෘෂි කර්මාන්තයම අද සම්පූර්ණයෙන්ම අනික් පැත්තට හරවලායි තිබෙන්නේ. අපේ රටේ දේශීය පාරම්පරික ගොවිතැන පිළිබඳව, අපේ දේශීය බීජ පිළිබඳව යම් කෙනෙක් කතා කරනවා නම් පසු ගිය වකවානුව තුළ ඒවා විහිළුවට ලක් කළා, ඒවා කරන්න බැරි දේවල් බවට ප්‍රකාශයට පත් කළා. නමුත් අපි කිසිම වෙලාවක ඉන්දියාව, චීනය, කියුබාව වාගේ රටවල සිදු වෙච්ච, සිදු කර ගෙන යන වෙනස්කම් පිළිබඳව කිසිම අවධානයක් යොමු කළේ නැහැ. විශේෂයෙන්ම චීනය, ඒ වාගේම අසල්වැසි ඉන්දියාව වැනි රටවල් කාබනික පොහොර යෙදවීම පිළිබඳව අතිවිශාල ලෙස කල්පනා කරලා තිබෙනවා. ඒ වාගේම කෘතිම පොහොර යෙදීම සැලකිය යුතු තරමකට පාලනය කිරීමේ නව උපාය මාර්ග පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. ඔවුන්ගෙෙ සාම්ප්‍රදායික ක්‍රම වේදයක් ආරක්ෂා කර ගනිමින් විද්‍යා තාක්ෂනය යොදමින් ඒවා නවීකරණය කරනු ලැබුවා. උදාහරණයක් හැටියට සාමාන්‍ය ගෘහස්ථ මට්ටමේ සිද්ධ වෙච්ච තමන්ගේ ගෙදර එකතු වන කුණු ටික ගහක් මුලකට දැමීම වෙනුවට විද්‍යා තාක්ෂණය යොදා නාගරික පොහොර ප්‍රතිචක්‍රීයකරණ දැවැන්ත වැඩසටහන් චීනය, ජපානය, ඉන්දියාව වාගේ රටවල් නාගරිකව පටන් අර ගෙන තිබෙනවා. නමුත් මේ කිසිවක් ගැන සලකන්නේ නැතුව අද අපි දිගින් දිගටම කෘත්‍රිම කෘෂි යෙදවුම් සඳහා ගමන් කර තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට අපේ සාම්ප්‍රදායික බීජ වර්ග අපට අහිමි වෙලා තිබෙනවා. රසයෙන් අඩු, ගුණයෙන් අඩු, ඒ වාගේම අපේ මහ පොළොව නිසරු කරන කෘත්‍රිම පොහොර කරා ගමන් කිරීම නිසා දැවැන්ත අභියෝගයක් අද අපේ මහ පොළොවට, අපේ පරිසරයට, අපේ සොබා දහමට එල්ල වෙලා තිබෙනවා.

අද මේ රටේ තිබෙන ඇත්ත ප්‍රශ්නය කොටි ත්‍රස්තවාදය හෝ වෙනත් ප්‍රශ්නයක් නොවෙයි. අපේ රටේ ඇත්ත ප්‍රශ්නය තමයි මේ බහු ජාතික සමාගම් විසින් අපේ මහ පොළොවට එල්ල කර තිබෙන දැවැන්ත අභියෝගය. අවාසනාවකට වගේ සිංහල සමාජයේත්, දෙමළ සමාජයේත්, මුස්ලිම් සමාජයේත් මේ පිළිබඳව කිසිම කථිකාවතක් නැහැ. අපි ත්‍රස්තවාදය ගැන කථා කරද්දී, ඒ සඳහා අපි යොමු වෙලා තිබෙද්දී අපේ රටේ මුළු මහ පොළවම ඉතා කෘත්‍රිම විධියට විනාශ කර තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට භයානක අනතුරු රාශියකට අද අපි මුහුණ දී සිටිනවා. උදාහරණයක් ගත්තොත්, අද අපේ වාරි ජලය ලවණකරණය වීමේ මහා තර්ජනයකට මුහුණ දී තිබෙනවා. ඒ වාගේම අපේ වාරි පද්ධතිය තුළ ජලය විශාල වශයෙන් වස විෂ සහිත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල වගේ දිස්ත්‍රික්කවල අති විශාල ප්‍රමාණයක් වකුගඩු රෝගීන් බවට පත් වෙලා තිබෙනවා. අපට තිබෙන එකම විකල්පය බවට පත් වෙලා තිබෙන්නේ වකුගඩු රෝගීන් සඳහා විදේශ ආධාර ලබා ගෙන රෝහල් ඉදි කිරීම පමණයි. ඒ වෙනුවට අපට හොඳටම හැකියාව තිබෙනවා, වකුගඩු රෝගීන් ඇති වීමේ ප්‍රධාන කාරකය කෘමිනාශක පාවිච්චි කිරීමයි. කියලා ජනතාව දැනුවත් කරන්න අපි තවමත් නිශ්චිතව පැහැදිලි කරලා ඒක මේ රටට ඉදිරිපත් කරලා නැහැ. නමුත් බොහෝ විද්‍යාඥයන් ඒ පිළිබඳව පර්යේෂණ කරලා ස්වාධීනව තමන්ගේ අදහස් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ අනුව අපට වස විෂෙන් තොර ගොවිතැනක් කරා යන්න පුළුවන්කම තිබෙනවා. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී ගෞරවයක් හැටියට කියන්න ඕනෑ. එන්. එස්. කුලසිංහයන් ජීවත වන තෙක්ම එතුමාගේ ඉංජිනේරු තාක්ෂණයේ නව සොයා ගැනීම් පිළිබඳව අපි ජාතියක් විධියට කිසිම සැලකිල්ලක් කළේ නැති බව. ඒ වාගේම උපවංශ මහත්මයා කෘෂිකර්මය පිළිබඳ විදේශීය උපාධි ලබා ගෙන ඒ ක්ෂේත්‍රයේ වැඩ කරලා අද ඉතාම වයෝවෘද්ධව ඉන්නවා. එතුමා දීර්ඝ වශයෙන් පර්යේෂණ ගනනාවක් කර තිබෙනවා. එකක් තමයි අපේ කුඹුරු බහු විධ ක්‍රමයට ගෙන යන්නේ කොහොමද කියන එක. කාලය බලලා, හෝරාවත් බලලා, ගොවිතැන් කරන්නේ කොහොමද, පණු රෝග වළක්වන්නේ කොහොම ද කියන ස්වාභාවික රීති පද්ධතියක් පාරම්පරික ඥානයෙන් සොයා ගෙන ඔහු අපේ ජාතියට දායාද කර තිබෙනවා. අඩු ගනනේ අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපේ පර්යේෂණ ආයතන ඒ මිනිසුන්ට ඇහුම්කන් දෙනවා තබා කථා කරන්නවත් සූදානම් නැති තත්ත්වයකට පත් වීම ගැන අපි කනගාටු වෙනවා. උපවංශ මහත්මයා ගැන අද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දන්නවාද? පසු ගිය වකවානුවක විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් ස්වාධීනව මේ සඳහා යොමු වුණා. විශ්වවිද්‍යාලවල මහාචාර්යවරුන් කිව්වේ ස්වාධීනව දේශීය කෘෂි කර්මාන්තය පිළිබඳව, දේශීය බීජ පිළිබඳව යම් කිසි ශිෂ්‍යකු සොයනවා නම්, ඔහුට විශ්ව විද්‍යාල උපාධියේදී ලකුණු කපන බවයි. එවැනි මහාචාර්යවරුන් ඉන්න රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා; අපේ විශ්වවිද්‍යාල පත් වෙලා තිබෙනවා. නමුත් මෙහි ප්‍රතිපලය මොකක්ද? මේ ගැන රට දන්නේ නැහැ. අපි කවුරුවත් කථා කරන්නේ නැහැ. මේක තමයි අද ඇති වෙලා තිබෙන ඇත්ත තත්ත්වය. නමුත් වාසනාවකට වාගේ දැන් මේ පිළිබඳව ස්වාධීන උනන්දුවක් ඇති වෙලා තිබෙනවා. මේ ගැන ගවේෂණයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී අපි අදාළ ඇමතිවරු සමඟත් සාකච්ඡා කරනවා. මේ පිළිබඳව අවබෝධයක් තිබෙන ඇමතිවරු දෙදෙනෙක් අපට ඉන්නවා. එතුමන්ලා ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා කටයුතු කරාවිය කියලා මම හිතනවා.

මෙහිදී මා මේ සමස්ත කරුණු සාරාංශගත කරමින් කෙටියෙන් කියන්න කැමැතියි. මේ පිළිබඳව රාජ්‍ය නොවන සංවිධාන හැටියට, ස්වාධීන බුද්ධිමතුන් හැටියට, ඒ වාගේම මේ ගැන අත් දැකීම් බහුල විශ්‍රාමික පුද්ගලයන් හැටියට කල්පනා කල යුතුයි. ඒ වාගේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ "ශ්‍රී" ක්‍රමය බහුල ව ක්‍රියාවට නඟන දිසානායක ඇමතිතුමා-එතුමා මේ පිළිබඳව කළ කථාව මම බාගෙටයි ඇහුවේ. එතුමා මේ විෂය පිළිබඳ මනා දැනුමක් තිබෙන ප්‍රායෝගික බුද්ධිමතෙක්. කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා දැවැන්ත කැප වීමක් කරන ඇමතිවරයෙක්. -ඔහු වගේ අයට අඩු ගණනේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළවත් මේ කාරණය විප්ලවීය විදියට අතට අර ගෙන ක්‍රියාවට නඟන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. එතුමා එක්ක එකතු වෙලා ප්‍රායෝගිකව මේ කටයුත්ත සිද්ධ කරන්න අපි කල්පනා කරනවා.

ඒ වාගේම මේ අවස්ථාවේදී අපි පළමුවෙන්ම කළ යුතු කාරණය නම් මේ අමාතයාංශවලට, ඒ වාගේම කෘෂි පර්යේෂණ ආයතනවලට අරක් ගෙන සිටින, අවුරුදු 30ක් 40ක් තුල පුහුණු කල පුද්ගලයන් වෙනුවට මේ රටට ආදරය කරන, සොබා දහමට ආදරය කරන මිනිසුන්ගේ එකතුවක් ඇති කරලා, විශේෂයෙන්ම ආයතන ප්‍රධානින් හා විද්වතුන් එකතු කරලා කළ හැකි චිරස්ථායි කෘෂි කර්මාන්තයක් ආරම්භ කළ යුතුය කියා. ඒ පිළිබඳව වන යෝජනාවක් මම කරනවා. අපි අය වැයේදීත් එය ඉදිරිපත් කළා. නමුත් ඒක ප්‍රායෝගිකව ක්‍රියාවට නඟන්න නම් මුලින්ම අපි ඒක ආරම්භ කළ යුතු වෙනවා. ඒ ආරම්භ කිරීම කළ හැක්කේ කොහොම ද? ඉස්සර වෙලාම මේ විසිරී සිටින සියලු දෙනාගෙන්ම සැදුම්ලත් මණ්ඩලයක් පත් කරලා, ඒ පිළිබඳව ස්වාධීන කොමිටියකින් පර්යේෂණාත්මක සාකච්ඡාවක්, ඒ කියන්නේ අපේ අත් දැකීම් බෙදා ගත හැකි සාකච්ඡාවක් අපි ආරම්භ කළ යුතුය කියා මා මුලින්ම යෝජනා කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද අපි කල්පනා කර බැලුවොත් අපේ මහ පොළොවට තව අවුරුදු දහයක් මේ යූරියා පොහොර යෙදුවොත් අපේ පොළොවෙන් කිසිම කාර්යයක් කර ගන්න බැරි තත්ත්වයකට පත් වෙන්න ඉඩ කඩ තිබෙනවා. ඒ අනතුර දැනටමත් ඇති වෙලා තිබෙනවා. අපි භාවිත කරන කෘෂි යෙදවුම් එන්න එන්නම, එන්න එන්නම වැඩි කරන්න ඕනෑ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම සී සෑමේ පටන් සෑම දෙයකම අවිද්‍යාත්මක මඟක අපි පසු ගිය කාලය පුරාම ගමන් කර තිබෙනවා. විශේෂයෙන් පසු ගිය අවුරුදු 15 තුළ ඇති වුණු කථිකාවත තමයි, කෘෂි කර්මාන්තය කියන්නේ වැඩකට නැති එකක්ය; මේක පාඩු ලබන එකක්ය කියන එක. කෘෂි කර්මාන්තය කියන්නේ දුර්වල එකක්; මේකෙන් අපට ජාතියක් නඟා සිටු වන්න බැහැ; ඒ නිසා වෙළෙඳ බෝග වගා කරන්න; ගර්කින්, වටානා, මෙනන්, දුම්කොල වාග් වාණිජ බෝග කරා යන්න ඕනෑ; ඒවා දිරි ගන්වන්න ඕනෑ කියා විශේෂයෙන්ම "Regaining Sri Lanka" එකේ යෝජනා කරලා තිබුණා. වාසනාවකට වාගේ මෙවර අය වැයේදීත්, ගිය වර අය වැයේදීත් එවැනි යෝජනා එකක්වත් තිබුණේ නැහැ. නමුත් සාධනීය දිසාවට යන්න, චිරස්ථායී වැඩ පිළිවෙළකට යන්න මහ පෙන්වීමක් තවමත් හැදිලා නැති එක ගැන එක පැත්තකින් අපි කනගාටු වන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට නියමිත කාලය අවසානයි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු ස්වාමීන් වහන්ස, මට තව විනාඩියක් ලබා දෙන්න පුළුවන් නේද? ගරු ඇමතිතුමනි, කාගෙන් හෝ මට එක විනාඩියක්, විනාඩි දෙකක් විතර දෙනවාද?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)

මටත් විනාඩි 15යි තිබෙන්නේ. විනාඩියක් ගන්න, ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

හොඳයි, මේ සියලු ආයතන ඒකාබද්ධ කරලා යම් කිසි වැඩ පිළිවෙළක් කරන්න පුළුවන් කියා මා කල්පනා කරනවා. මේ අය වැයේදී විශේෂයෙන් කාබනික පොහොර සඳහා යම් කිසි දිරිමත් කිරීමක් කරලා තිබෙනවා. ඒ වාගේම පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ යම් කිසි වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා. ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන සඳහා වෙනත් කිසිම වර්ෂයකට වඩා වැඩි මුදලක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. අපි හිතනවා, එය අර අපි දකින අර්බුදය සුබ පැත්තට හැර වීම සඳහා දරපු උත්සාහක් හැටියට.

පොහොර සහනාධාරය වෙනත් විකල්ප ක්‍රම මඟින් ජනතාවට ලබා දෙන්න ඕනෑ. එනම් ජනතාව ක්‍රියාවට නැංවීමෙන් ජනතාව සක්‍රිය කිරීමෙන් මේ සඳහා විකල්ප උපාය මාර්ගයක් හදා ගත යුතුයි කියන එකයි අපේ විශ්වාසය. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. ගරු ස්වාමීන් වහන්ස, ඊළඟට ගරු ජයන්ත විජේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10යි තිබෙන්නේ.

[අ. භා. 3.14]

**ගරු ජයන්ත විජේසේකර මහතා**
(மாண்புமிகு ஜயந்த விஜேசேகர)
(The Hon. Jayantha Wijesekara)

විනාඩි 12ක් විතර දෙන්න, ස්වාමීන් වහන්ස.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, වාරිමාර්ග හා ජල කළමනාකරණ, ඉඩම් හා ඉඩම් සංවර්ධන, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ රටේ ඉතිහාසය වාරි කර්මාන්තයක් එක්ක බැඳුණු නිසා අපි ලෝකයේ ශ්‍රේෂ්ඨ ජාතියක් විධියට විරුදාවලියක් ලැබූ බව. නමුත් ඒක වර්තමානය තුළ ළඟා කර ගන්නවා නම්, පවත්වා ගෙන යනවා නම් අපිට අභියෝග කිහිපයක් ජයග්‍රහණය කරන්න තිබෙනවා. කෙසේ වෙතත් මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, එක උදාහරණයකින් සතුටු වෙන්න පුළුවන් කරුණක් තිබෙනවා. වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ වෙහෙරගල ව්‍යාපෘතිය වෙන් කළ කාල සීමාව තුළ, ලැබුණු මුදල් ප්‍රමාණය අනුව වැඩ කටයුතු ඉතා හොඳින් අධීක්ෂණය කරලා ඒ ව්‍යාපෘතිය ආදර්ශයක් හැටියට ලංකාවේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ කාර්ය භාරය සම්බන්ධව අභියෝගයක් තිබෙනවා. ලබන අය වැය වන කොට වාරිමාර්ග දෙපාර්තමේන්තුට, ඒ වාගේම වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයට යම් අභියෝගයක් තිබෙනවා. ප්‍රයෝජනයට ගත හැකි ජලයෙන් අපි දැනට පාවිච්චියට අර ගෙන තිබෙන්නේ සියයට 30ක් විතර ප්‍රමාණයක්. ඒ නිසා ඊළඟ අය වැය වන කොට අපේ රටේ ඇතුළත ලැබෙන ජල ප්‍රමාණයෙන් සියයට කීයක් වැඩි කරන්න පුළුවන් වෙනවාද කියන එක ජාතියක් විධියට අපිට අභියෝගයක් හැටියට තිබෙනවා. අන්න ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියා වාරිමාර්ග අමාත්‍යාංශයෙනුත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙනුත් ඉල්ලා සිටිනවා. දැනටමත් අපි මේ ජල ප්‍රශ්නයට මුහුණ දී තිබෙනවා. උදාහරණ ලෙස කියනවා නම්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පදවි ශ්‍රීපුර ගම්මානයේ අනුරාධපුරයට අයත්ව තිබෙන පදවි වැව අක්කර අඩි 80,000ක ධාරිතාවක් තියෙන්න පුළුවන්. නමුත් අවාසනාවන්තකමක මහත. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මාස් කන්නයටත් මේ වැවේ ධාරිතාව නිසි ලෙස නැත්නම් අක්කර 14,000ක් වගා කරන්න බැරි වෙනවා. හැබැයි අපි අවුරුදු ගණනක් මොරගහකන්ද ජලාශය ගැන කථා කළා. මේ වන කොටත් මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා මොරගහකන්ද ජලාශයේ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. නමුත් පදවිය වැවට මොරගහකන්ද ජලාශයේ ජලය ගෙන යන්න පුළුවන්ද නැද්ද කියන එක ගැටලු සහගත තත්ත්වයක තිබෙනවාය කියා මම විශ්වාස කරනවා. කෙසේ වෙතත් දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හැටියට යෝජනා කරන යාන් ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා ඉතා ඉක්මනින් අවසන් කර දෙන්න. පදවි ශ්‍රීපුර ජයන්ති වැවට වතුර දැම්මොත් අක්කර 7,000ක් විතර වගා කරන්න පුළුවන්. ඒක ඉතාමත් සාර්ථක ව්‍යාපෘතියක් හැටියට තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙන්න මේ ගැන අවධානය යොමු කළොත් ඉතාමත් හොඳයි කියා මම කියනවා. ඒ වාගේම පදවිය ව්‍යාපාරය මහා වාරිමාර්ග ව්‍යාපාරයක්. අවුරුදු 40කින් විතර ප්‍රතිසංස්කරණ කටයුතු කෙරිලා නැහැ. මේ සම්බන්ධවත් අවධානය යොමු කරන්න වෙලා තිබෙනවා. ඒ වාගේම යාන් ඔය ඊළඟ අදියර ලෙස යාන් ඔය ව්‍යාපෘතිය මේ පොතේ සඳහන් කර තිබෙනවා. නමුත් මොරවැව, ගෝමරන්කඩවල කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකත් ඇතුළුව ඇතාබැඳි ඔය කියන ස්ථානයෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න තිබෙනවා. මෙන්න මේකටත් පළමුවෙන් අවධානය යොමු කළොත් ඉතාමත් හොඳයි කියන එකයි මගේ අදහස වන්නේ.

විශේෂයෙන් කන්තලේ මතක් කරන්න ඕනෑ. කන්තලේ ගත්තොත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව අවුරුදු ගණනක් සැලසුම් හදලා 2004 සන්ධාන ආණ්ඩුව බලයට ආවට පසුව කළු ගඟ ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව අවසන් කළා. නමුත් අක්කර අඩි 30,000ක ජලය රඳවන්න පුළුවන් මේ කළු ගඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න දැන් අවුරුදු දෙකක් ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියන ආයතනවල නිලධාරීන් ඉතාමත් දක්ෂ ලෙස ඉතා කෙටි කාලයක් ඇතුළත අවසන් කරපු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළොත් සිංහල, මුස්ලිම් හා දෙමළ ජනතාවට කින්නියා දක්වා අක්කර 15,000ක් වගා කරන්න පුළුවන්. නමුත් මේකට අයිති වන ඉඩම් ටික කොල්ල කා ගැනීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. කෙහෙල් වගා කිරීමේ ඒ ක්‍රියා මාර්ගය නවත්වන්න - ඉඩම් මංකොල්ලය නවත්වන්න - මැදිහත් වීම ගැන මම ඉඩම් අමාත්‍යාංශයට ස්තුතිවන්ත වෙනවා. කෙසේ නමුත් වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයට තව අඩු පාඩුවක් පෙන්වා දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. මාර්තු මාසයේ කන්තලේ ජනරංජන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම මගේ පැත්තෙන් මතක් කළා. නමුත් මේ පොතේ කියනවා ජනවාරි ඉඳලා සැප්තැම්බර් දක්වා මිලියන දශම 82ක් විතර මුදල් වියදම් කර තිබෙනවා කියා. ඒකට හේතුව මාර්තු මාසයේ පෙන්වා දුන්නත්, අමාත්‍යාංශය කෙළින් හිටියත්, අධ්‍යක්ෂ ජනරාල්තුමා කෙළින් හිටියත්, එතැනින් පහළ ඉන්න නිලධාරි මහත්වරුන්ගේ අඩු පාඩුවක් තිබෙනවා කියා මේකෙන් ඔප්පු වෙනවා. ඒ වැඩය ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා. අද වැස්ස ඇවිල්ලා ඒ ක්‍රියා මාර්ගය හරියටම අවසන් කරන්න බැරි වෙලා තිබෙනවා. මේක කනගාටුදායක කාරණයක්. ඒ වාගේම කින්නියා දක්වා ජලය ගෙන යන්න පුළුවන් මේ ජනරංජන ව්‍යාපෘතිය වාගේම කන්තලේ වැවේ ඉඳලා තඹලගමුව දෙසට ජලය අර ගෙන ගිහින් - ගල්මිටියාව උතුර, ගල්මැටියාව දකුණ, පුලිත්තුකුලම් - තඹලගමුව එහා පැත්ත සිංහපුර දක්වා ජලය ගෙන යන්න පුළුවන් මාර්ගයක් තිබෙනවා. මේකේ ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර තිබෙනවා. නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේකට මුදල් වියදම් කරලා වැඩ කටයුතු ආරම්භ කිරීම තවමත් සිද්ධ වෙලා නැහැ. මේ ගැනත් අවධානය යොමු කරන්න කියා මගේ පැත්තෙන් පෙන්වා දෙනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, සේරුවිල ව්‍යාපාරය මහා වාරි මාර්ග ව්‍යාපාරයක්. මෙන්න මේ සේරුවිල මහා වාරි මාර්ග ව්‍යාපාරයේ නියාම වැඩසටහන මඟින් වැඩ කිහිපයක් ක්‍රියාත්මක වෙනවා. නමුත් ඒක ඉතාමත් වේගවත් වන්නේ නැහැ. ප්‍රායෝගිකත්වය බලලා මේ වැඩ ටික ඉතා ඉක්මනින් අවසන් කළොත් මේ ව්‍යාපෘතියට ලැබී තිබෙන මුදල් නිසි ලෙස ප්‍රයෝජනයට ගන්න පුළුවන් වෙයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් මෙන්න මේ වැඩ ටික මම උපදේශක කාරක සභාවලදී පෙන්වා දී තිබෙනවා.

කාල වේලාව ඉතාමත් සීමිතව තිබෙනවා වුවත් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය ගැනත් කෙටියෙන් හෝ කරුණු ටිකක් මම කියන්නට ඕනෑ. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරී මණ්ඩලයටත් විශේෂයෙන් ඇමතිතුමාටත්, මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ ඉඩම් අක්කර 15,000ක තනිකර සදාහරිත වනාන්තරයක් කපලා පිලිපීන සමාගමකට කෙහෙල් හිටවන්න දෙන්න කථා කරපු ඇමතිවරු මේ ආණ්ඩුවේ ඉන්නවා. හැබැයි ඒ ආණ්ඩුවේම ඉතා වැදගත් නිලධාරී මහත්වරු ටිකක් ඒ ඉඩම් මංකොල්ලය නැවැත් වුවා. ඒ නිසා ඒ ඇමතිතුමාටත්, ඒ අදාළ නිලධාරීන්ටත් ස්තුතිවන්ත වෙනවා. හෙට දවසේ ඉඩම් මංකොල්ල කා ගෙන විදේශිකයන්ට දීලා අක්කර පහළොස් දහසේ කැලි එළි කරන්න පිඹුරු පත් හදන්න ආවොත් අපි අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන්ට කියලා ඉතිහාසයේ වාගේම වර්තමානයේදීත් අනාගතයේදීත් ඍජුව - කෙළින් - හිට ගන්නවා. ඒකට භය වෙන්න එපා. ඒක අනිවාර්යයෙන් නවත්වන්න ඕනෑ කාරණයක් වෙලා තිබෙනවා.

මහවැලි අමාත්‍යාංශයට යටත්ව තිබෙන ජනරංජන වැව ව්‍යාපෘතිය ගැනත් කියන්න ඕනෑ. "නිල් දියවර කෙත්යායට" කියන මේ පොතේ සඳහන්ව තිබෙනවා, ජනරංජන වැව ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට රුපියල් මිලියන 53ක් වෙන් කර තිබෙන බව. ඒ වාගේම මහවැලි අමාත්‍යාංශයට අයත් ඒ ඉඩම් ටික තිබෙනවා. මේ පොතේම කියනවා, හෙක්ටයාර් 325ක් වාර්මාර්ග දෙපාර්තමේන්තුවට අදාළව තිබෙනවායි කියලා. වාර්මාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයත්, මහවැලි අමාත්‍යාංශයත් දෙකම ඒකාබද්ධ වෙලා, සිංහ වැව, ජනරංජන වැව යටතේ වගා කෙරෙන සූරියපුර, කන්තලේ අවට තිබෙන ගම්මානවල ඒ ගොවි ජනතාවගේ ඉඩම් ටික වාර්මාර්ග දෙපාර්තමේන්තුවට නිදහස් කර දීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කරන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයට අවශ්‍ය මැදිහත් වීම කරන්නයි කියලා මම ඉල්ලීමක් කරනවා.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට අදාළව මගේ පැත්තෙන් කියන්න තිබෙන කරුණු මා ඉදිරිපත් කරන කොට අපි කවුරුත් දන්නවා, ගිය අය වැයේදීත් මා මතක් කර දුන්නු පරිදි 1953 කන්තලේ ගොවිජන ව්‍යාපාරය ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ආරම්භ කළ බව. ඊට පසුව රජයේ ඉඩම් ආඥාපනත යටතේත් 1991 නාගරික සංවර්ධන අධිකාරිය යටතේත් කන්තලේ නගර වාසීන්ට ඉඩම් ඔප්පු දෙන කොට දැන් රුපියල් ලක්ෂ දෙකක්, තුනක්, පහක් එහෙම නැත්නම් ලක්ෂ 10ක් වැනි මුදලක් බලපත්‍ර ලබා දීම සඳහා අය කරන්නට තීන්දු කරලා තිබෙනවා. මේක ඉතාමත් අසාධාරණයි, ත්‍රස්තවාදී ගැටලුව මත අවුරුදු විසිපහක් තිහක් තිස්සේ නැඟෙනහිර පළාතේ ජීවත් වන මේ ජනතාවට යම් සහනයක් දෙන්න අවශ්‍යයි. ඉඩම් සංවර්ධන ආඥාපනත 1953 ආරම්භ කරන කොට 1935 නීතිය නම් පාවිච්චි කළේ මේ 2004, 2005 හා 2008 කාල සීමාව තුළදී මේ මුදල් අය කරන එක වහාම නවත්වන්න කියලා කිව්වාම, ඒකට එකඟ වුණා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් මට ගිය අය වැයේදිත් එදාම පිළිතුරු ලිපියක් දුන්නා. නමුත් මේ අය වැය වන කොට අවුරුද්දක් ගත වෙලා තිබුණත් අපට තවමත් ඒ වැඩ අවසන් කර ගන්නට බැරි වුණා. රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කාර්ය සංග්‍රහයේම මේ සම්බන්ධයෙන් සඳහන් කොට තිබෙනවා, අදාළ විෂය භාර ඇමතිවරයාටත්, ජනාධිපතිවරයාටත් විශේෂ තත්ත්වයක් යටතේ මෙය කළ හැකි බව. විශේෂයෙන් මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට අයත්ව තිබෙන පොළොන්නරු දිස්ත්‍රික්කය, මේ පැත්තෙන් අනුරාධපුරය, ඒ වාගේම ඉඩම් ඇමතිතුමාගේ මොරටුව ප්‍රදේශය, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය වැනි ගොවිජන ව්‍යාපාර ඇති කළ ප්‍රදේශත් අනෙකුත් ප්‍රදේශවලත් ඉඩම් ඔප්පු ලබා දෙන කොට පැවතුණු තත්ත්වයන් සලකා බලන්න ඕනෑ. ඒක ප්‍රමාද වුණේ ත්‍රස්තවාදී ගැටලුව නිසා නම් ඒකට වන්දි ගෙවන්න මුදල් නැති නිසා විධියක් නැති නම් ඒ ජනතාවට ඒවා භුක්ති විඳීම සඳහා පැවරීමට ඉඩම් කාර්ය සංග්‍රහයේ තිබෙන නීති ප්‍රතිපාදන යටතේ විශේෂ බලයක් විෂය භාර ඇමතිවරයාටත්, ජනාධිපතිවරයාටත් තිබෙන නිසා කැබිනට් අනුමැතියකින් හෝ ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට ඒ ඉඩම් ටික ලබා දෙන්න, නිදහස් ඔප්පු ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ත්‍රිකුණාමලය නගරයේත් ඉතා විශාල ගැටලුවක් තිබෙනවා. ත්‍රිකුණාමලය කච්චේරිය ඒ පැවති තත්ත්වයන් යටතේ දැනට අවුරුදු විස්සකට ඉහත ගිනි තිබ්බා. ත්‍රිකුණාමල කච්චේරිය ගිනි ගත්තාට පසුව ත්‍රිකුණාමල නගරයේ ඉන්න ජනතාවට ඉඩම් ඔප්පු ලබා ගැනීම සඳහා ඉතාමත් ගැටලු සහගත තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. මෙන්න මේ කාරණා ගැනත් හිතලා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉතා ඉක්මන් මැදිහත් වීමක් කරන්න අවශ්‍යයි. ඉතා ඉක්මනින් මේ වැඩය අවසන් කරලා දෙනවාය කියලා සූරියආරච්චි නියෝජ්‍ය ඇමතිතුමා මට පොරොන්දු වුණා. මම එතුමාගේ කථාවේදී හෝ බලාපොරොත්තු වෙනවා -

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු ජයන්ත විජේසේකර මහතා**
(மாண்புமிகு ஜயந்த விஜேசெகர )
(The Hon. Jayantha Wijesekara)
ඔබතුමාට විනාඩියක් දෙනවා, කියන්න.

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කන්තලේ නගරය ගැන කථා කළා. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේ ඉල්ලීමක් කළා. මොකද, හේතුව, ඇත්තෙන්ම එකඟ වුණේ නැහැ. ඒ වර්ෂය කීය කියලාද කිව්වේ?

**ගරු ජයන්ත විජේසේකර මහතා**
(மாண்புமிகு ஜயந்த விஜேசெகர )
(The Hon. Jayantha Wijesekara)
1953 දී ගොවිජන ව්‍යාපාර පිහිටෙව්වේ 1935 ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ.

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)
1953 වර්ෂයට තක්සේරු කරලා ඉඩම් ඔප්පු ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු ජයන්ත විජේසේකර මහතා**
(மாண்புமிகு ஜயந்த விஜேசெகர )
(The Hon. Jayantha Wijesekara)
බොහොම ස්තුතියි. ත්‍රිකුණාමල නගරයේ තිබෙන ඉඩම්වලටත් මේ මැදිහත් වීම කරන්නයි කියන ඉල්ලීම කරනවා.

කෘෂිකර්මය පැත්තෙන් ගත්තොත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන පාලනය කරන්න ඉන්න ගොවිජන සේවා සහකාර කොමසාරිස්තුමියගේ තිබෙන යම් යම් අඩු පාඩු නිසා ප්‍රදේශයේ ගොවි ජනතාවට යම් කිසි ගැටලු සහගත තත්ත්වයන් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන් පදවි ශ්‍රී පුර, මොරවැව, කින්නියාව, ඒ වාගේම අග්බෝපුර, කන්තලේ, තඹලගමුව වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථානවල පහසුකම් ඉතාමත් අඩුයි; නිලධාරීන් ඉතාමත් අඩුයි. ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට "අපි වවමු - රට නඟමු" කියලා කිව්වාට අලුතින් ඉඩම් අස්වද්දන්නට වගා කරන්නට ඔවුන්ට විධියක් නැතිව ඉන්නවා. විශේෂයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ සඳහා මැදිහත් වෙනවා නම් හොඳයි. ඔවුන්ට අඩුම තරමින් මීට පෙර තිබුණු ආකාරයට සී සෑමේ කටයුතු කරන්නට ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් ට්‍රැක්ටර් ලබා දීම කෙරෙහි ඒ වාගේම අඩු අදායම් තත්ත්වය හේතුවෙන් බිත්තර වී ලබා ගන්නට නොහැකි නිසා ඒ සඳහා සහනයක් ලබා දීම කෙරෙහි විශේෂයෙන් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා.

[ගරු ජයන්ත විජේසේකර මහතා]

ඉඩම් තිබෙනවා; මිනිස්සු ඉන්නවා; වගා කරන්න කියලා කියනවා. නමුත් අපි තවමත් විදේශ රටවලින් බොහෝ දේවල් ගෙන්වනවා. මේ අය වැයෙන් සෙස් බදු ගහලා තිබෙනවා හැබැයි ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන විධියක් පෙනෙන්න නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් ගිය අවුරුද්දට වැඩිය මේ අවුරුද්දට වෙන් කර තිබෙන්නේ සියයට 10යි කිව්වා. උදාහරණයක් කියනවා නම් දේශීය සීනි කර්මාන්තය නඟා සිටු වන්න ආණ්ඩුව කොතරම් සෙස් බදු ගැහුවත් වැඩක් නැහැ. සීනි කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම සඳහා හෝ තිබෙන එකක් පවත්වාගෙන යාම සඳහා හෝ ආණ්ඩුවේ වැඩ පිළිවෙළක් නැති නිසා මෙන්න මේ කිව්ව කරුණු සැලකිල්ලට අරගෙන ප්‍රායෝගිකව කටයුතු කළ යුතුව තිබෙනවා. මිනිස්සු ඉන්නවා. ඉඩම් තිබෙනවා. ජලය තිබෙනවා. හැබැයි ලැබෙන ජලයෙන් අපි ප්‍රයෝජනයට අරගෙන තිබෙන්නේ සියයට 30යි නම් මෙන්න මේවා විධිමත් ලෙස කළමනාකරණය කරන්න ඕනෑ. මේවා තේරුම් අරගෙන විවේචන කරන එක වැරදි පෙන්වා දෙන එක විපක්ෂයක කාර්ය භාරයක්. හැබැයි ආණ්ඩුවේ කාර්ය භාරය විය යුත්තේ විපක්ෂය කියන දේවල් ප්‍රතික්ෂේප කිරීම නොවෙයි. හොඳ දේවල් අරගෙන ජාතියක් විධියට අපට හෙට දවසේ නැඟිටින්න පුළුවන් විධියට කටයුතු කිරීමයි. මා කිව්ව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිබෙන තත්ත්වයත්, රට ඇතුළේ ඇති වෙලා තිබෙන තත්ත්වයත්, ලෝක ආර්ථික අර්බුදයත් ජය ගැනීම සඳහා අපි හැම දෙනාම සමගියෙන් වැඩ කරමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 3.26]

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

( மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி - காணி, காணி அபிவிருத்திப் பிரதி அமைச்சர்)

(The Hon. C. A. Suriyaarachchi-Deputy Minister of Lands and Land Development)

ගරුතර ස්වාමීන් වහන්සේගෙන් අවසරයි. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට වාරිමාර්ග හා ජල කළමනාකරන අමාත්‍යාංශයේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුව මගේ ස්තුතිය පුද කරනවා.

ගරුතර ස්වාමීන් වහන්ස, වර්තමාන ලෝකයේම ජනතාව මුහුණ දී ඇති ප්‍රධානතම තර්ජනයක් වන්නේ ආහාර පිළිබඳ අවිනිශ්චිතතාවයි. එම අවිනිශ්චිතතාව ජය ගැනීමට නම් ආහාර නිෂ්පාදනයට වැදගත්ම සාධකය වන භූමිය නිසි පරිදි කළමනාකරණය කළ යුතුව තිබෙනවා. එම නිසා ඉඩම් අමාත්‍යාංශයට පෙර කිසි දා නොවූ විරූ කාර්ය භාරයක් සඳහා උර දීමට සිදුව තිබෙන බව මාගේ හැඟීමයි. මේ නිසා සීමිත සම්පතක් වූ ඉඩම් කළමනාකරණය විද්‍යාත්මක වූත්, පරිසර හිතකාමී වූත් ක්‍රමයක් මඟින් ජනතාවට හිතකර පරිදි කල යුතුව තිබෙනවා. අප මෙතෙක් කල් ඉඩම් භාවිත කළේ නිෂ්පාදන සාධකයක් සේම තමාගේ සමාජ තත්වය විදහා පාන හා වත්කම් පෙන්වීමේ සාධකයක් ලෙසිනුයි. එහෙත් වර්තමානයේ එය ඊට වඩා වැදගත් නිෂ්පාදන සාධකයක් මෙන්ම මූලධනය ලබා ගැනීම සඳහා ඇපකරයක් වශයෙන් ඉහළ අගයක් ලබා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මෙන්න මේ තත්ත්වය යටතේ තමයි අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තනය මගින් ඉඩම් සම්පත කළමනාකරණය කළ යුතු ප්‍රතිපත්ති මාලාව මහජනතාව ඉදිරියට ගෙන ගියේ. එම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අපගේ අමාතයාංශය දැනට ආරම්භ කළ වැඩ සටහන් රාශියක් තිබෙනවා. ඒවා මෙසේයි:

1. ඉඩමේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා හිමිකම් සහතික ලබා දීම.
2. රජයෙන් ගොවි ජනතාවට බෙදා දුන් ඉඩම්වලට අදාළ කොන්දේසි ඉවත් කර පූර්ණ අයිතිය ලබා දීම.
3. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදා දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
4. සැලසුමකින් තොරව ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම වැළැක්වීමට ක්‍රියා කිරීම.
5. විනිවිදභාවයකින් යුතු ක්‍රමයක් මගින් මහජනතාවට අවශ්‍ය ඉඩම් බෙදා දීම.
6. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් එළි දැක්වීම.
7. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියට නීතිමය පසු බිම සැකසීම සඳහා පනතක් සම්මත කර ගැනීම.
8. සංවර්ධන යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය ඉඩම් අත් කර දීම කඩිනම් කිරීම හා ඒවායේ මිණුම් කටයුතු විධිමත්ව කිරීමට කටයුතු කිරීම.
9. පෞද්ගලික ඉඩම් අත් කර ගැනීමේදී වඩාත් යථාර්ථවාදී වන්දි ක්‍රමයක් හඳුන්වා දීම.

ඉහත සඳහන් ව්‍යාපෘති අපගේ වැඩ සටහන් අතුරින් ඉහළම ප්‍රමුඛත්වයක් ලබා දුන් ව්‍යාපෘති ලෙස සඳහන් කරන්න කැමැතියි.

ලෝකයේ දියුණු රටවල් සෑම එකක්ම වාගේ දැනට අනුගමනය කරන්නේ හිමිකම් සහතික ලියාපදිංචි කිරීමේ ක්‍රමයයි. ඉඩම්වලට ඔප්පු ලිවීමේ ක්‍රමය තුළ ඇති අඩු පාඩු, අනාරක්ෂිත බව, වංචා සිදු කළ හැකි වීම වැනි හේතූන් නිසා ඒ වෙනුවටයි බිම් සවිය වැඩ සටහන මගින් ඉඩම් හිමිකම් සහතික ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙළ හඳුන්වා දුන්නේ. බටහිර බොහෝ රටවල් වාගේම නැගෙනහිර ආසියාතික රටවල් ද මෙම හිමිකම් සහතික ලියාපදිංචි කිරීමේ ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක කර තිබෙනවා. දැනට අපි මෙම වැඩ සටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18 ක ක්‍රියාත්මක කර තිබෙන අතර, ඉදිරියේදී සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ආරම්භ කිරීමට සැලසුම් කර තිබෙනවා. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් පිළිබඳව අවුල් සහගත තත්ත්වයක් ඇත්තේ නම් අධිකරණමය ක්‍රියා මාර්ගයකට නොගොස් පොදු එකඟතාවන් මත නිලධාරි මට්ටමින් විසඳා ගැනීමට අවස්ථාව සලසා තිබෙනවා. එමගින් කෙටි කලකින් ගැටලු නිරාකරණය කර ගත හැකි වන අතර, මුදල් වැය කිරීමක් අවශ්‍ය වන්නේම නැහැ. දැනට වැඩ ආරම්භ කර ඇති කොට්ඨාස 18හි මේ වන විට හිමිකම් සහතික 40,000කට ආසන්න ප්‍රමාණයක් නිකුත් කිරීමට හැකි වී තිබෙනවා. කෙසේ නමුත් මෙම වැඩ සටහන කඩිනමින් කිරීමට ප්‍රධාන බාධකයක්ව ඇත්තේ පවතින මිනින්දෝරු හිඟයයි. ඊට පිළියමක් වශයෙන් බලය ලත් මිනින්දෝරුවන්ගේ සහාය ලබා ගැනීමට දැනටමත් කටයුතු කර තිබෙනවා.

ඊට අතිරේකව මිනින්දොරු උපාධිධාරින් සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග සාකච්ඡා පවත්වමින් සිටිනවා. මෙම වැඩ සටහන ඉඩම් නිරවුල් කිරීමේ හා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් දෙපාර්තමේන්තුවත්, ඉඩම් අමාත්‍යාංශයේ බිම් සවිය අංශයත් ඒකාබද්ධවයි ක්‍රියාත්මක කරන්නේ.

මෙම වසරේදී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට විශේෂිත වැඩ කොටසක් ඉටු කිරීමට හැකියාව ලැබී තිබෙනවා. ඒ අනුව 1935 නීතිගත කළ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ මේ වන විට අක්කර ලක්ෂ 30ක් පමණ බෙදා දී තිබෙනවා. මෙම පනත යටතේ ලබා දුන් ඉඩම්වලට රජයෙන් පළමුව බලපත්‍රයක් ද ඉන් පසුව දීමනා පත්‍රයක් ද ලබා දෙනවා. නමුත් ඒ බලපත්‍ර හා දීමනා පත්‍ර නිකුත් කරන්නේ රජයෙන් පැන වූ පනත් කොන්දේසි මතයි. ඉන් ප්‍රධානතම කොන්දේසිය වනනේ ඉඩම් අනු බෙදීම් කිරීමට කර ඇති සීමාවන් හා ඉඩමේ උරුමය හිමි වන ආකාරය ගැන සඳහන් සීමාවන්ය. මෙම කොන්දේසි ඉවත් කරන ලෙස පසු ගිය වසර ගණනාවක් තුළ මහජනතාවගෙන් හා සංවිධාන ආදියෙන් ඉල්ලීම් ලැබුණු අතර, දශක දෙකකටත් වැඩි කාලයක් මෙම ඉල්ලීම් ගැන සලකා බලා පදිංචිය සඳහා දී ඇති ගොඩ ඉඩම්වලට අදාළ බලපත්‍ර හා දීමනා පත්‍රවල කොන්දේසි ඉවත් කිරීමට රජය

ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන ඇත. මේ අනුව ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය සඳහා වූ කෙටුම්පත සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. එම පනත් කෙටුම්පත සම්මත වූ පසු පවුල් ලක්ෂ 15කට පමණ තමන් පදිංචි ඉඩම්වලට, කිසිදු බැඳීමකින් තොරව පූර්ණ අයිතිය ලබා ගන්නට පුළුවන් වෙනවා.

"වගාවට ඉඩම් ප්‍රතිපත්තිය" යටතේ ඉඩම් කැබලි ලක්ෂයක් බෙදා දීමේ වැඩ සටහන මඟින් මේ වන විට ඉඩම් කැබලි 80,898ක් බෙදා දී තිබෙනවා. ලක්ෂයක ඉලක්කය ඉක්මවා යාමට හැකි වන සේ මෙසේ බෙදා දීමට හැකි යයි හඳුනා ගත් ඉඩම් කැබලි 2,59,000ක් පිළිබඳ වාර්තා දැනට අප සතුව තිබෙනවා.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ඉතා පැරණි වැදගත් වටිනා ලියවිලි රාශියක් සංරක්ෂණය කරන දෙපාර්තමේන්තුවක්. එහෙත් 1935 සිට අද දක්වා කාර්යාලය තිබෙන්නේ කුලියට ගත් ගොඩනැඟිලිවලයි. මේ නිසා වසර ගණනාවක් කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයක් ලෙස මහල් තුනකින් යුත් ගොඩනැගිල්ල අමාත්‍යාංශයට යාබද ඉඩම් ඉදි කිරීමට මෙම වසරේ දී ආරම්භ කිරීමට හැකි වීම අප ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකියි.

එමෙන්ම රටේ පසු ගිය දශක තුනක පමණ කාලයක් තිස්සේ රජයේ ඉඩම් ශීඝ්‍රයෙන් අනවසරයෙන් අල්ලා ගැනීමක් සිදු වෙමින් පැවතුණා. මේ නිසා ඉඩම් කච්චේරි ක්‍රමය ක්‍රියාත්මක නොවන තත්ත්වයකට පත් වීම නිසා නීති ගරුක පුරවැසියන්ට ඉඩම් කොටසක් ලබා ගැනීමට නොහැකි වාතාවරණයක් උදා වී තිබුණා. මෙයට විකල්පයක් ලෙස එම තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර නව ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කරන ලද නිර්දේශ අනුමත වීම නිසා එම නව ක්‍රමය ක්‍රියාත්මක කිරීම දැන් ආරම්භ කර තිබෙනවා. අනවසර ඉඩම් නියමානුකූල කිරීම නවතා දැමීමටත්, ඒ වෙනුවට ඉඩම් ඉල්ලුම්කරුවන් ලේඛනගත කර ඔවුන් අතරින් සුදුස්සන්ට ඉඩම් ලබා දීමටත් නව ක්‍රමය යටතේ පියවර ගැනෙනවා.

අප අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන සියලුම වැඩසටහන්වලදී අනිවාර්යයෙන්ම මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහාය අවශ්‍ය වෙනවා. නමුත් පසු ගිය කාලය තුළ මිනින්දෝරුවන් බඳවා ගැනීමට තිබූ අපහසුතාවනුත්, රටේ මිනින්දෝරු වෘත්තීය සඳහා වාර්ෂිකව සුදුසුකම් ලබන සංඛ්‍යාව සීමිත වීමත් නිසා ඉතා බැරෑරුම් තත්ත්වයක් උද්ගතව තිබෙනවා. විශේෂයෙන් කැමැත්තෙන් විශ්‍රාම යාමට මිනින්දෝරුවන්ට අවස්ථාව ලබා දීම නිසා මේ තත්ත්වය වඩාත් උග්‍ර අතට හැරුණා. මෙම තත්ත්වය නිසා කෙටි කාලීන විසඳුමක් ලෙස හිමිකම් වැඩසටහන සඳහා අවශ්‍ය මිනින්දෝරුවන් සඳහා බලයලත් මිනින්දෝරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කළා. එසේම සබරගමුව විශ්වවිද්‍යාලයෙන් වාර්ෂිකව බිහි කරන මිනින්දෝරුවන් සංඛ්‍යාව 60 දක්වා වැඩි කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනට කටයුතු කරමින් සිටිනවා.

මෙවැනි දුෂ්කර තත්ත්වයක් යටතේ වුවද වසර 20කට පසු මෙම වසරේදී ලංකා සිතියම් සංග්‍රහයේ නව ප්‍රතිසංස්කරණ ප්‍රසිද්ධියට පත් කිරීමට හැකි වීම අප ලද තවත් ජයග්‍රහණයක් ලෙස සලකන්නට පුළුවන්.

අපගේ අමාත්‍යාංශයේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය නිහඬව විශාල කාර්ය භාරයක් ඉටු කරනවා. එම අංශය මඟින් දීර්ඝ අධ්‍යයනයකින් පසු සකස් කරන ලද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය දැනට ධවල පත්‍රිකාවක් ලෙස ක්‍රියාත්මක වෙනවා. එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය පසු බිමක් අවශ්‍යයි. ඒ සඳහා පනත් කෙටුම්පතක් සැකසීමටත්, මෙම අංශය වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කිරීමටත් දැනට අප ක්‍රියා කරමින් සිටිනවා. එසේම ඉඩම් අමාත්‍යාංශය මඟින් දිවයිනේ සිදු කරන මහා පරිමාණ සියලු ව්‍යාපෘතීන් සඳහාත් දායකත්වයක් ලබා දෙනවා. එක් අතකින් එවැනි ව්‍යාපෘති සඳහා අවශ්‍ය රජයේ ඉඩම් නොමැති අවස්ථාවලදී පෞද්ගලික ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ ඉඩම් අත් කර දීමට ක්‍රියා කරන අතර, එම ඉඩම් මැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහාය ලබා දෙනවා.

ඉඩම් සංවර්ධන විෂයය සමඟ බැඳී පවතින කෘෂි වගා කටයුතු සම්බන්ධයෙන් ද වචනයක් සඳහන් කළ යුතුයි. 2010 දේශීය ආහාර භෝග වැඩසටහන් යටතේ, මේ වන විටත් විශාල ඉඩම් ප්‍රමාණයක වගා කටයුතු ආරම්භ වී තිබෙනවා. මෙම තත්ත්වය මහින්ද චින්තනය ලබන තවත් විශාල ජයග්‍රහණයක්. කෘෂිකර්ම සංවර්ධන අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ සඳහා ලබා දෙන නායකත්වය මෙහිදී සිහිපත් කළ යුතුයි. එතුමා නොසිටින්නට මෙවැනි ජනතා ක්‍රියාවලියක් අපට උදා නොවන්නට ඉඩ තිබුණා. මේ වැඩ පිළිවෙළ සඳහා මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාටත්, හේමකුමාර නානායක්කාර ඇමතිතුමාටත්, සිරිපාල ගම්ලත් නියෝජ්‍ය ඇමතිතුමාටත් අතිගරු ජනාධිපතිතුමාගේ පූර්ණ සහාය ලැබී තිබෙනවා. රටේ නිෂ්පාදනය කළ හැකි එහෙත් දැනට පිට රටින් ආනයනය කරනු ලබන ආහාර වර්ග රැසක් 2010 වන විට අප රට තුළම නිපදවා ගැනීමට මේ තුළින් හැකි වෙනවා. ඒ අනුව "අපි වවමු-රට නඟමු" වැඩසටහන වර්තමානයේ යථාර්ථයක් බවට පත් වෙමින් තිබෙනවා. මෙවර අය වැයෙන් ආනයනික ආහාර ද්‍රව්‍ය බදු පැන වීම තුළින් දේශීය ආහාර භෝග වගාව වැඩිදියුණු කිරීමටත්, එයින් දේශීය ගොවියා ශක්තිමත් කිරීමටත් හැකි වෙනවා. එය මේ රටේ ගොවි ජනතාව පමණක් ලබන ජයග්‍රහණයක් නොව සමස්ත රටම ලබන ජයග්‍රහණයක්.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, පුරන් කුඹුරු අක්කර ලක්ෂයක් යළි අස්වැද්දීමේ වැඩසටහන මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. කොටි ත්‍රස්තවාදීන්ගෙන් නැඟෙනහිර නිදහස් කර ගැනීමට හැකි වීම නිසා අත හැර දමා තිබුණු ඉඩම්වල කෘෂි කර්මාන්තය යළි මල් පල දරා තිබෙනවා. එදා ත්‍රස්තවාදීන්ට බියෙන් පොළොන්නරු දිස්ත්‍රික්කයේ වැලිකන්ද, මාදුරුඔය, මැදිරිගිරිය ඇතුළු අවට ප්‍රදේශවල ගොවීන් කුඹුරු ගොවිතැනට ආයුබෝවන් කියන තත්ත්වයට පත්ව සිටියා. ඒත් අද තත්ත්වය වෙනස් වී තිබෙනවා. පැහැදිලි ලෙස වර්තමානයේ නැඟෙනහිර පළාත තුළ මෙන්ම උතුරු මැද පළාතේත් වී අස්වැන්න සියයට 15%කින් ඉහළ ගොස් තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අත හැර දමා තිබුණු ඉඩම් විශාල ප්‍රමාණයක වගා කටයුතු ඇරඹීම විශේෂත්වයක්.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ගොවීන් යළිත් තමන්ගේ කෘෂිකාර්මික කටයුතුවල නිරත වෙමින් අනාගතයක් පිළිබඳව අපේක්ෂාවෙන් ක්‍රියා කිරීමේ දී රටට බත සපයන කෘෂි කාර්මික ප්‍රදේශයක් නියෝජනය කරන කෙනකු ලෙස ගොවීන් ලබන සතුට මට ද දැනෙනවා. මහ පොළොවත් එක්ක පොර බදන පොළොන්නරුව ගොවීන් එදා කොටි ත්‍රස්තවාදීන් නිසා ජීවිතය පිළිබඳව බලාපොරොත්තු අත් හැර දමා සිටි යුගයක් තිබුණා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නිවැරදි සෘජු තීරණ හේතුවෙන් එම තත්ත්වය වෙනස් වී තිබෙනවා. නැඟෙනහිර පළාත ත්‍රස්තවාදයෙන් නිදහස් කර ගැනීම සම්බන්ධයෙන් වැඩියෙන්ම සතුටු වන්නේ පොළොන්නරුවේ ජනතාවයි. ඒකට හේතුව නැඟෙනහිර පළාතේ ත්‍රස්තවාදය වැඩි වශයෙන් බලපා තිබුණේ පොළොන්නරුව අවට ප්‍රදේශවලට වීමයි. ඒ සමඟම පොහොර සහනාධාරය ක්‍රියාත්මක වීමෙන් ගොවීන් මෙරට ඉතිහාසයේ වැඩිම වරප්‍රසාදයට හිමිකම් ලැබුවා. අද ආණ්ඩුව පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන සිය දහස් ගණනක් වැය කරමින් සිටිනවා. පොළොන්නරුවේ වී ගොවියා දීර්ඝ කාලයක් තිස්සේ මුහුණ දුන් අර්බුදයක් වූයේ තමන්ගේ අස්වැන්නට නිසි වෙළෙඳපොළක් නොමැතිකමයි. වර්තමානයේ වී කිලෝවක ගැනුම් මිල ස්ථාවර මට්ටමකට පත් වෙලා තිබෙනවා. මෙතෙක් බලයට පත් වුණු කිසිදු ආණ්ඩුවකට කළ නොහැකි වුණු ඒ ක්‍රියාදාමය ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මඟ පෙන්වීමෙන් විසඳුමකට පත් වෙලා තිබෙනවා. ගොවියා රජකමටත් සුදුසුයි කියන එක යථාර්ථයක් බවට පත් කළේ වත්මන් රජයයි. ගොවියා රැක ගැනීම පමණක් නොව,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි මූලාසනයෙන් ඉවත් වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා [ගරු පියංකර ජයරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (வண.) உடவத்தே நந்த தேரர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு பியங்கர ஜயரத்ன ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. PIYANKARA JAYARATNE] *took the Chair.*

**ගරු සී. ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ. ஏ. சூரியஆரச்சி)
(The Hon. C. A. Suriyaarachchi)

ගරු සභාපතිතුමනි, ගොවියා රැක ගැනීමට පමණක් නොව, ඔහු සිංහාසනාරූඪ කරවීමයි වත්මන් ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ රජයේ අරමුණ කියන එක පැහැදිලිව කිව යුතුයි.

ගරු සභාපතිතුමනි, ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කළා, මහවැලි "ජී" කලාපයට අයත් නොවන ප්‍රදේශයක් වන අත්තගල්ලෑව, කිරි ඔය, මිණිපුරගම ඇතුළත් ඇලහැර නගර ප්‍රදේශය මොරගහකන්ද ව්‍යාපෘතියට සම්බන්ධ කර දෙන්නටය කියා. මගේ යෝජනාව ක්‍රියාත්මක කර එම ප්‍රදේශය මොරගහකන්ද කලාපය බවට පත් කර එම ප්‍රදේශය සංවර්ධනය කිරීමට කටයුතු කිරීම පිළිබඳව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට මා මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මහවැලි අමාත්‍යාංශයේ සියලු දෙනාටමත් මගේ ගෞරවණීය ස්තුතිය පොළොන්නරු දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, 2008 වර්ෂය තුළ දී අපගේ අමාත්‍යාංශයට මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාවේ සඳහන් ඉඩම් විෂයයට අදාළ කරුණු රාශියක් ඉටු කිරීමට හැකි වූ බව ඉතාම සතුටින් ප්‍රකාශ කරන්න පුළුවනි. මෙම කාර්ය භාරයේ දී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයාට හිමි භූමිකාව ක්‍රියාත්මක කිරීමේ දී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ගරු ජීවන් කුමාරණතුංග අමාත්‍යතුමා මට දක්වන සහාය හා මඟ පෙන්වීම මේ අවස්ථාවේදී විශේෂයෙන් සිහිපත් කරමින් එතුමාට මගේ ප්‍රණාමය පළ කිරීමත් යුතුකමක් ලෙස සලකනවා.

ගරු සභාපතිතුමනි, එසේම අපගේ කාර්ය භාරය සාර්ථකව ඉටු කිරීමට අත හිත දෙමින් කටයුතු කරන පළාත් සභා ඉඩම් අමාත්‍යතුමන්ලා, අමාත්‍යාංශයේ ලේකම්තුමා, ගරු අමාත්‍යතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකතුමා, අතිරේක ලේකම්වරුන් ප්‍රමුඛ සියලුම කාර්ය මණ්ඩලවලටත්, ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා, මිනුම්පතිතුමා හා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්තුමා, ඉඩම් පරිහරණ හා සැලසුම් අධ්‍යක්ෂතුමිය, පළාත් ඉඩම් කොමසාරිස්තුමන්ලා ඇතුළු එම ආයතනවල සියලුම කාර්ය මණ්ඩලවලටත් මාගේ ස්තුතිය මේ අවස්ථාවේ පිරිනමනවා.

ඒ වගේම උතුරු නැඟෙනහිර යුද්ධය අවසාන කර සාමයක් ඇති වුණාට පසුව අපේ අමාත්‍යාංශයෙන් ඉටු විය යුතු ඒ කාර්යයන් නොපිරිහෙලා ඉටු කිරීමට අපි කටයුතු කරනවාය කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

බොහොම ස්තුතියි. ඊළඟට ගරු එස්. විනෝ මන්ත්‍රීතුමා.

[பி. ப. 3. 39]

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

கௌரவ தவிசாளர் அவர்களே, கமத்தொழில் அபிவிருத்தி, காணி அபிவிருத்தி மற்றும் நீர்ப்பாசனத்துறை சம்பந்தப்பட்ட அமைச்சுக்களின் மீதான வரவு - செலவுத்திட்டக் குழுநிலை விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி கூறுகின்றேன். மிகப் பெரும் யுத்த ஆக்கிரமிப்புக்குள் அகப்பட்டிருக்கின்ற வன்னியிலுள்ள எமது விவசாயிகள் இவ்வேளையிலே இயற்கை அனர்த்தங்களுக்கும் முகங்கொடுத்துக் கொண்டு மிகவும் சொல்லொணாத் துன்பங்களை அனுபவித்துக் கொண்டிருக்கின்றார்கள். குறிப்பாக வன்னியிலே, அதாவது நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மன்னார், வவுனியா, முல்லைத்தீவுப் பகுதிகளிலே தற்பொழுது பெய்துவருகின்ற அடை மழை காரணமாக ஆயிரக்கணக்கான குடும்பங்கள் இடம்பெயர்ந்து பாடசாலைகள் மற்றும் கோயில்கள் போன்ற பொது இடங்களிலே தஞ்சமடைந்திருக்கின்றன. எமது மக்கள் யுத்த அரக்கனின் பிடியில் சிக்கிக் கொல்லப்படுவது ஒருபுறமும் இயற்கை அனர்த்தங்களில் சிக்கி மென்மேலும் துன்பப்படுகின்ற சூழ்நிலை மறுபுறமமாக அவல வாழ்வு வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். எனவே, அனர்த்த நிவாரண சேவைகளுக்குப் பொறுப்பான அமைச்சு அல்லது சம்பந்தப்பட்ட அதிகாரிகள் இயற்கை அனர்த்தம் காரண மாகத் தற்காலிக இடம்பெயர்வுகளுக்குள்ளான இந்த மக்களின் கஷ்டங்களைப் போக்குவதற்கு உரிய நடவடிக்கை எடுக்க வேண்டும் என்றும் அவர்களுக்குப் போதிய நிவாரணம் வழங்க வேண்டும் என்றும் அம்மக்களின் பிரதிநிதி என்கின்ற வகையிலே இச்சபையிலே நான் உங்களிடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

குறிப்பாக மன்னார் மற்றும் வவுனியாவிலே ஒவ்வொரு பயிர்ச்செய்கைக் காலத்திலும் பெரும் போக்குவரத்துப் பிரச்சினை களின் மத்தியில் கிருமிநாசினி மற்றும் விவசாயப் பொருட்கள் முதலிய விவசாய உள்ளீடுகளைக் கொண்டு செல்கின்ற விவசாயிகள் உடற்சோதனை உட்படப் பல்வேறு சோதனைக் கெடுபிடிகளுக்கு உட்படுத்தப்படுகின்றார்கள். இது சம்பந்தமாக நாங்கள் உங்களிடம் பல தடவைகள் சுட்டிக்காட்டியும்கூட மதவாச்சி மற்றும் பறையனாலங்குளத்திலுள்ள சோதனைச் சாவடி களிலே அவர்கள் மிகவும் சிரமத்திற்குள்ளாக்கப்பட்டு வருகின் றார்கள். எனவே, நீங்கள் இந்தப் பிரச்சினையையும் தீர்த்து வைக்க வேண்டும். அத்துடன் அந்த மக்களும் இந்நாட்டு மக்கள் என்கின்ற அடிப்படையிலே அவர்களின் விவசாய நடவடிக்கைகளையும் ஊக்குவிக்க வேண்டும்.

இன்று யுத்தம் காரணமாக வன்னியிலிருந்து இடம்பெயர்ந்து வவுனியாவிலுள்ள செட்டிக்குளம் 'மெனிக் பாம்' முகாமிலே தற்காலிகமாகத் தங்கவைக்கப்பட்டுள்ள நூற்றுக்கும் மேற்பட்ட மக்களைச் சென்று பார்வையிடுவதற்கு இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு உறுப்பினர்கள்கூட மறுக்கப்பட்டிருக் கிறார்கள். ஏற்கனவே அங்கிருந்து இடம்பெயர்ந்த சுமார் 600க்கும் மேற்பட்ட குடும்பங்களைச் சேர்ந்தவர்கள் இன்று மன்னாரிலே சிறை வாழ்க்கை வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அவர்கள் அங்கு தங்கள் உறவினர்களைப் பார்ப்பதற்கோ அல்லது வெளியில் செல்வதற்கோ அனுமதி மறுக்கப்படுகின்றது. இந்த நிலையில் இந்த மக்களும் இன்று ஏதோ ஒரு காரணத்திற்காகக் கட்டுப்பாட்டுப் பிரதேசமான வவுனியாவிற்குள்ளே வந்திருக்கின் றார்கள். இடம்பெயர்ந்து மன்னாருக்கு வந்திருக்கும் மக்கள் அவஸ்தைகளுக்கு உள்ளாக்கப்படுவதனை நேரில் சென்று பார்வை யிடுவதற்கு மனித உரிமை ஆணைக்குழுவினர் மறுக்கப்பட்டுள்ள தன் பின்னணியிலே, இன்று வன்னியிலிருந்து இடம்பெயர்ந்து வவுனியாவுக்கு வந்திருக்கின்ற மக்களும் எதிர்காலத்தில் அதேபோன்ற சிரமத்தையே எதிர்கொளள்ள வேண்டிய நிலைமை உருவாகும் என்பதை நாங்கள் அவதானிக்கக் கூடியதாக விருக்கின்றது. நீங்கள் எதிர்பார்ப்பது போன்று அங்கிருக்கின்ற இலட்சக்கணக்கான மக்கள் அனைவரும் இடம்பெயர்ந்து இங்கு கட்டுப்பாட்டுப் பிரதேசத்துக்கு வந்தால் நீங்கள் எவ்வாறு அவர்களைப் பராமரிக்கப்போகின்றீர்கள்? அந்த மக்களுடைய அனைத்துத் தேவைகளையும் உங்களால் எப்படிப் பூர்த்திசெய்ய முடியும்? என்ற கேள்விக்கான விடைகளை நாங்கள் சந்தேகத்துடன் பார்க்கவேண்டியிருக்கின்றது. ஆகவே, அங்கிருந்து இடம்பெயர்ந்து இங்கு வருபவர்களுக்கு அரச சார்பற்ற நிறுவனங்கள் உதவி செய்வதற்கும், அவர்களுடைய உறவினர்கள் மற்றும் ஏனைய பொதுமக்கள் அவர்களைச் சென்று பார்வையிட்டு உதவி

செய்வதற்கும் ஏற்றவாறான வசதிகளைச் செய்து கொடுக்க வேண்டுமென்று நான் இந்த நேரத்திலே உங்களைக் கேட்டுக் கொள்கின்றேன். அவ்வாறான ஏற்பாடுகளைச் செய்து கொடுக்கா விடில் வவுனியாவுக்குள் வந்திருக்கின்ற மக்கள் வன்னிப் பகுதிக்குள் உள்ள தமது உறவினரை அழைப்பதற்கும் வன்னிப் பகுதிக்குள் இருக்கின்ற ஏனைய மக்கள் வவுனியாவுக்குச் செல்வதற்கும் நிச்சயமாகத் தயக்கம் காட்டுவார்கள் என்பதை உங்களுக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இலங்கை ஒரு விவசாய நாடு என்று இன்று தமிழ் நாட்டில் சொல்லப்படுகின்றது. கிழக்கு மாகாண மக்களைப் போன்று வன்னி மாவட்ட மக்களும் விவசாயத்தில் தன்னிறைவு கண்டவர்கள். ஆனால், இன்று இன்னொரு நாட்டினுடைய நிவாரணப் பொருட்களை எதிர்பார்த்துக் காத்திருக்க வேண்டிய துர்ப்பாக்கிய நிலைமைக்கு நீங்கள் அவர்களைத் தள்ளியுள்ளீர்கள். இந்த யுத்தம் காரணமாகத்தான் அவர்கள் தமிழ் நாட்டின் நிவாரணப் பொருட்களுக்காகக் காத்திருக்கவேண்டிய துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கிறது. நிச்சயமாக இந்த அரசாங்கம் வெட்கித் தலைகுனிய வேண்டிய விடயம் இது. "நாங்கள் வன்னியிலுள்ள எங்களுடைய மக்களுக்குக் கிரமமாகப் போதிய அளவில் உணவுப் பொருட்களை அனுப்பிக் கொண்டிருக்கின்றோம்; அவர்களுக்கு எந்தவிதமான குறைபாடுகளும் இல்லை" என நீங்கள் வேறு நாடுகளுக்குப் பிரச்சாரம் செய்துகொண்டும், உங்களுடைய அதிகாரிகள் மூலமாகச் சொல்லிக்கொண்டும் இருக்கின்றீர்கள். வன்னிப் பிரதேச மக்களுக்குத் தேவையான உணவுப் பொருட்கள் இருந்திருந்தால், தமிழ் நாட்டு அரசாங்கம் வன்னிப் பிரதேச மக்களுக்கு அனுப்பியுள்ள உணவுப் பொருட்களை நீங்கள் எதற்காக அங்கு அனுப்பிக்கொண்டிருக்கின்றீர்கள்? என்று கேட்க விரும்புகின்றேன். நீங்கள் அந்த வன்னிப் பிரதேச மக்களை உங்களுடைய மக்கள் என்று கருதி அவர்களுக்குப் போதிய அளவிலான உணவுப் பொருட்களை அனுப்பாமல்விட்டதன் காரணத்தினாலும் உங்களுடைய இயலாமையின் காரணத் தினாலும்தான் தமிழ் நாட்டு மக்கள் அனுப்பிய நிவாரணப் பொருட்களை வன்னிப் பிரதேச மக்களுக்கு அனுப்பவேண்டிய சூழ்நிலை ஏற்பட்டது. இந்த நிலை தொடருமாயின், தமிழ் நாட்டு மக்கள் அங்கிருந்து வன்னிப் பிரதேச மக்களுக்குத் தொடர்ந்தும் அனுப்பிக்கொண்டிருக்க வேண்டிய சூழ்நிலைதான் ஏற்படும் என்பதையும் நாங்கள் இச்சமயத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றோம். இந்த அரசாங்கம், தனது சொந்த நாட்டு மக்களையே - எந்த நேரத்திலும் கையேந்திப் பிச்சை எடுக்க விரும்பாத எங்களுடைய தமிழ் இனத்தையே - இன்னொரு நாட்டிடமிருந்து நிவாரணப் பொருட் களைப் பெறவேண்டிய சூழ்நிலைக்குத் தள்ளிவிட்டிருக்கின்றது.

இன்று தமிழ் நாட்டிலுள்ள தமிழ் மக்கள் கொந்தளித்து நிற்கிறார்கள். தமிழ் நாட்டிலுள்ள சினிமாத் துறையினர், அரசியல் கட்சியினர் மட்டுமன்றி அங்குள்ள அனைத்துச் சமூகத்தினரும் இலங்கையில் யுத்த நிறுத்தம் மேற்கொள்ளப்பட்டு இலங்கைத் தமிழ் மக்களுடைய பிரச்சினை தீர்க்கப்படவேண்டும் என்ற ஒருமித்த கருத்துடன் ஒட்டுமொத்தமாகத் தமது உணர்வுகளை வெளிப்படுத்திக்கொண்டிருக்கின்றார்கள். இதுவரையில் எக்காலத் திலும் ஏற்பட்டிருக்காத நிலைமை இன்று தமிழ் நாட்டில் ஏற்பட்டிருக்கிறது. இந்த நாட்டில் இப்பிரச்சினைக்கு ஒரு தீர்வு கிடைக்கும்வரையில் அங்குள்ள மக்களுடைய எழுச்சி தொடர்ந்து கொண்டுதான் இருக்கப்போகின்றது. அந்த எழுச்சியை உங்களால் அடக்கமுடியாது. இந்த நாட்டிலுள்ள மக்களாகிய நாங்கள் கிளர்ந்தெழுந்தால் நீங்கள் எங்களைச் சுட்டுத்தள்ளலாம், கொலை செய்யலாம், கடத்தலாம் அல்லது எங்களுடைய கருத்துச் சுதந்திரத்துக்கு உலைவைக்கலாம், எங்களுக்குக் கட்டுப்பாடு போடலாம். ஆனால் தமிழக மக்களுடைய உணர்வுகளை உங்களால் எச்சந்தர்ப்பத்திலும் எக்காலத்திலும் கட்டுப்படுத்த முடியாது. அவர்களுடைய உணர்வுகளுக்கு இந்திய மத்திய அரசாங்கம் நிச்சயமாகத் தலைசாய்க்கின்ற காலம் மிக நெருங்கிக் கொண்டிருக்கின்றதென்பதை நீங்கள் அவதானத்தில் கொள்ள வேண்டும். இந்திய அரசாங்கம் உறுதிமொழி தந்தால் யுத்த நிறுத்தத்துக்கு அரசாங்கத்தை இட்டுச்செல்வதற்குத் தாங்கள் தயாராக இருப்பதாக 'ஜாதிக ஹெல உறுமய' கட்சியினர் கூறுகின்ற அளவுக்கு இன்று நிலைமைகள் மாற்றம் பெற்றிருக்கின்றன. எனவே, இந்திய அரசாங்கம் தமிழ் நாட்டு மக்களுடைய நிர்ப்பந்தத்தின் காரணமாக, அவர்களுடைய தற்போதைய எழுச்சியின் காரணமாக, அவர்களுடைய உணர்வுகள் கிளர்ந்தெழும்பியிருப்பதன் காரணமாக நிச்சயமாக ஒரு தீர்க்கமான முடிவை எடுக்கத்தான் போகின்றது. எதிர்வரும் 4ஆம் திகதி தமிழகத்தைச் சேர்ந்த அரசியல் கட்சிகளுடைய பிரதிநிதிகள் மத்திய அரசின் முக்கியஸ்தர்களையும் பிரதம அமைச்சர் அவர்களையும் சந்தித்து, ஒரு தீர்க்கமான முடிவெடுக்கும்படி தமிழ் நாட்டிலுள்ள ஆறு கோடி மக்களின் சார்பாக கேட்கப்போகின்றார்கள். அந்த நிலைமை, இங்கே ஒரு நிரந்தர யுத்த நிறுத்தத்தை ஏற்படுத்துவதற்கும் எங்கள் மக்களுடைய பிரச்சினைகள் தீர்க்கப்படுவதற்கும் நிச்சயமாக வழிவகுக்கும். அதுவரை தமிழ் நாட்டு மக்கள் தொடர்ந்தும் அழுத்தத்தைக் கொடுத்துக் கொண்டிருப்பார்கள். அந்த அழுத்தத்தின் காரணமாக தங்களுடைய அயல் நாடான இந்திய நாட்டின் மத்திய அரசாங்கம் இந்தப் பிரச்சினைக்கு ஒரு தீர்வு தரும் என்ற நம்பிக்கையிலேதான் வன்னியிலே இடப்பெயர்வுகளுக்கும் பல்வேறு துயரங்களுக்கும் மத்தியிலும் அல்லல்பட்டுக்கொண்டிருக்கின்ற அந்த மக்கள் இன்னமும் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். ஆகவே, அரசாங்கம் உடனடியாக யுத்தத்தை நிறுத்த வேண்டும்.

இன்று நீங்கள் கிழக்கிலே ஜனநாயகத்தைக் கொண்டுவந்து விட்டதாகக் கூறுகின்றீர்கள்; மார்தட்டுகின்றீர்கள். ஆனால், கிழக்கிலே அன்றாடம் கொலைகள் நடந்துகொண்டிருக்கின்றன. நேற்று மட்டும் ஒன்பது பேர் கொல்லப்பட்டிருக்கின்றார் களென்றால் அதுவா உங்களுடைய ஜனநாயகம் என்று கேட்க விரும்புகின்றேன். அதுபோலத்தானா நீங்கள் வடக்கையும் மீட்கப் போகின்றீர்கள்?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

Sir, please give me one more minute.

அதேபோல்தான் வடக்கிலேயும் நீங்கள் இந்த யுத்தத்தை முடித்துவிட்டு ஜனநாயகத்தைக் கொண்டுவருவதாகச் சொல்கிறீர் கள். நாளாந்தம் இப்படி மக்களைக் கொல்வதற்கான அந்த ஜனநாயகத்தையா வடக்கிலுள்ள மக்கள் உங்களிடமிருந்து எதிர்பார்க்கின்றார்கள்? என்று நான் உங்களிடம் கேட்க விரும்புகின்றேன். எனவே, உண்மையான ஜனநாயகம் ஏற்படுத்தப் படவேண்டும். மட்டக்களப்பிலே ஆயுதக் குழுக்களுடைய அட்டகாசத்தினால் இவை நடைபெறுகின்றன. விடுதலைப் புலிகளை அழித்தவிட்டதாக நீங்கள் கூறிக்கொண்டிருக்கும்போது அங்கே தினந்தோறும் கொலைகளைச் செய்பவர்கள் யார்? யார் அங்கே ஆயுதம் வைத்திருக்கின்றார்கள்? அண்மையிலே அங்கு சிங்கள வைத்தியர் ஒருவர் கொலை செய்யப்பட்டது சம்பந்தமாக 'பி.பி.சி. சந்தேஷய'வுக்கு பேட்டியளித்த வைத்தியரொருவர், தங்களால் வெளியே கூறமுடியாதளவுக்கு அங்கே ஆயுதக் குழுக்களுடைய அட்டகாசம் மிகவும் அதிகரித்துவிட்டதாகவும் தங்களால் ஒன்றுமே செய்ய முடியவில்லையென்றும் கைத்துப் பாக்கியை கொண்டுவந்து தலையிலே வைப்பதாகவும் அப்படியான பீதியான ஒரு நிலைமையிலேதான் அவர்கள் வாழ்ந்துகொண்டிருப் பதாகவும் கூறினார். அதுபற்றி தாங்கள் சம்பந்தப்பட்ட பாதுகாப்புத் தரப்பினரிடம் கூறியிருந்தும்கூட, எந்த முடிவும் எடுக்கப்படவில்லையென்றும் அதனால் தங்களுக்கு அங்கே சென்று வேலைசெய்ய முடியாத நிலைமை இருப்பதாகவும் அவர் சொன்னார்.

அதேபோல்தான் இன்று வவுனியாவிலும் மன்னாரிலும் கப்பம்பெறும் சம்பவங்கள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. சாதாரண வர்த்தகர்கள், ஆசிரியர்கள், அதிபர்கள், அரசாங்க

[ගරු. එස්. විනෝ මහතා]

உத்தியோகத்தர்கள் என எல்லோரிடமும் கப்பம் பெறுகின்ற நிலைமை! எந்தப் பொதுமகனாவது வெளிநாட்டிலிருந்தால் இங்கு அவர்களின் உறவினர்களிடம் கப்பம் கேட்கின்றார்கள். ஐரோப்பிய நாடு என்றால் அதற்கு ஒரு குறிப்பிட்ட தொகை; மத்திய கிழக்கு நாடுகளிலே வேலை செய்பவர்கள் என்றால் அதற்கு இன்னொரு குறிப்பிட்ட தொகை. இப்படியாக அங்கே ஆயுதக் குழுக்களினால் கப்பம் பெறுகின்ற நிலைமை தொடர்ந்துகொண்டிருக்கின்றது. இவற்றைப்பற்றி நாங்கள் தொடர்ந்தும் இந்தப் பாராளுமன் றத்திலே கூறிக்கொண்டிருக்கின்றோம். ஆனால், வன்னியிலோ அல்லது யாழ்ப்பாணத்திலோ அல்லது மட்டக்களப்பிலோ உள்ள ஆயுதக் குழுக்கள் சம்பந்தமாக உங்களால் எந்தவித முடிவுக்கும் வர முடியவில்லை. தினந்தோறும் அங்கே கப்பம் கோரப்படுகின்றது. இப்படியானவர்களால் கோடிக்கணக்கான ரூபாய் பணம் பெறப்படு கின்றது. தொலைபேசி இருந்தால் போதும். ஆயுதக் குழுக்கள் மட்டுமல்ல, ஆயுதக் குழுக்களைச் சாட்டி வேறு தனிப்பட்டவர்களும் தொலைபேசி ஊடாக மக்களை மிரட்டி கப்பம் கேட்கின்றார்கள். மிரட்டப்படுபவர்களும் உயிருக்கு அஞ்சி, பயத்திலே வேறு வழியில்லாமல் தங்களது உயிரைப் பாதுகாக்க வேண்டு மென்பதற்காக இருபதாயிரமோ அல்லது இருபது இலட்சமோ கொடுத்துக்கொண்டே இருக்கின்றார்கள். அவர்களுக்கு வேறு வழியில்லை. குறிப்பாக வவுனியா, மன்னார் பிரதேசங்களில் இப்படியாக கோடிக்கணக்கான தொகை மக்களிடமிருந்து பெறப்பட்டிருக்கின்றது. இவற்றுக்கு அரசாங்கம் உடனடியாகத் தீர்வு காணவேண்டுமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ. භා. 3.54]

**ගරු හේමකුමාර නානායක්කාර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Hemakumara Nanayakkara - Minister of Agriculture)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්නට ඉස්සර වෙලා අපේ මිත්‍ර එස්. විනෝ මන්ත්‍රීතුමාගේ කථාවට මා පිළිතුරක් දෙන්නට ඕනෑ. ආයුධ සන්නද්ධ පිරිස් ලක්ෂ ගණනින් කප්පම් ලබා ගන්නවා. ඒ කොටි සංවිධානය නිසායි. අපේ සහෝදර දෙමළ ජනතාව මේ යුද්ධය නිසා අවතැන් වෙලා සිටිනවා. ඒ කොටි සංවිධානය නිසායි. කෘෂි කර්මාන්තය කර ගන්නට බැරිව උතුරු පළාතේ ජනතාව දුක් විඳින්නේ කොටි සංවිධානය නිසායි. මේ කොටි සංවිධානයට සේවය කරන ගැත්තෝ කවුද? එස්. විනෝ මන්ත්‍රීතුමා, රාජවරෝදයම් සම්පන්දන් මන්ත්‍රීතුමා ඇතුළු මේ ද්‍රවිඩ සන්ධානයේ මන්ත්‍රීවරුනුයි. ද්‍රවිඩ ජනතාවගේ අවුරුදු දහස් ගණනක් පැරණි ඉතිහාසයට, සංස්කෘතියට හතුරුකම් කරපු පරම හතුරා තමයි වේළුපිල්ලේ ප්‍රභාකරන්. ඒ ප්‍රභාකරන්ට දර දිය අදින තමුන්නාන්සේලාට මින් අනතුරුව උතුරු පළාතේ මැතිවරණයකින්වත් ජනතාවගේ කරුණාව ලැබෙන්නේ නැහැ.

මං කොල්ල කන, ජනතාවගේ සල්ලි ගසා කන ආයුධ සන්නද්ධ කණ්ඩායම් ගැන කිව්වා. ඒ, තමුන්නාන්සේලා සේවය කරන කොටි සංවිධානය. හතර විලි ලජ්ජා නැතිව මෙතැන ජනතාව නොමඟ යවන්නට කථා කරනවා. අවුරුද්දකට දෙකකට ඉස්සර වෙලා අර කජේන්ද්‍රන් කියන මන්ත්‍රීතුමා කිව්වා, මිනී පෙට්ටි 21,000ක් එක්ක හමුදාවට උතුරට එන්නය කියලා. මොකද, මිනී පෙට්ටියෙන් එවන්න. අපි එදත් පිළිතුරු දුන්නා; අදත් පිළිතුරු දෙනවා. යුද්ධයෙන් පස්ස බිම ඇනුණු ප්‍රභාකරන්ව බේරා ගන්න සටන් විරාමයක් ගැන කථා කරමින් ඉන්දියාව අවුස්සන්ට දැන් කටයුතු කරනවා. ඉන්දියාව මේ ද්‍රවිඩ සන්ධානය තරම් මෝඩ නැහැ. දකුණු ඉන්දියාවේ බුද්ධිමත් දේශපාලනඥයනුයි සිටින්නේ. ඒ රටේ නායකයාව සිටි රජීව් ගාන්ධි මරා දමපු කාලකණ්ණි ප්‍රභාකරන්ගේ කණ්ඩායමට තමුන්නාන්සේලා කත් ඇද්දාට, දකුණු ඉන්දියාව කත් අදින්නේ නැහැ. දේශපාලන තොප්පි දමාගත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කිහිප දෙනකු සිටිනවා.

ගරු සභාපතිතුමනි, මා දැන් කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කරනවා. කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ කැබිනට් ඇමතිවරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාත්, කැබිනට් නොවන කෘෂිකර්ම ඇමතිවරයා හැටියට මමත්, අපේ ගොවිජන සේවා නියෝජ්‍ය අමාතය සිරිපාල ගම්ලත් මැතිතුමාත්, අපේ ලේකම්තුමියගේ ඉඳලා සියලුම අතිරේක ලේකම්වරු, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු, අධ්‍යක්ෂවරු ඇතුළු සියලුම නිලධාරිනුත් ඒ වාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ හාඩි ආයතනය, ඒ වාගේම පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණික ආයතනය, CARP වැනි ආයතන මේ සියල්ල එකතු වෙලා මහා යෝධ වැඩ පිළිවෙළක් මේ රටේ කෘෂි කාර්මික සංවර්ධනය උදෙසා කර ගෙන යනවා. මා නම් වශයෙන් කියන්නේ නැහැ. මේ පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් කෙරෙන මෙන්න මේ වැඩ ගැන සොයා බැලීමක් නැතිව, මේ වාර්තාවල තිබෙන කරුණු කියවන්නේ නැතිව, කිසිම වාරයක් නැතිව අවලාද නඟන්නටත්, අපහාස උපහාස කරන්නටත් විපක්ෂය සූදානම් වෙලා සිටිනවා. විපක්ෂයේ ඉඳ ගෙන විලිලජ්ජා නැතිව තමන්ගේ නොහැකියාව වහ ගන්නට උත්සාහ කරන්නේ රජයට දොස් පවරමිනුයි; අපහාස උපහාස කරමිනුයි.

ගරු සභාපතිතුමනි, මා මේ කරුණු ටික ඔබතුමා ඉදිරියේ තබන්නට කල්පනා කරනවා.

Let us cultivate and uplift the nation. There is a National Campaign to motivate domestic food production. For that, Rs. 286 million was initially allocated but an additional Rs. 300 million was proposed by the Budget. There has been an expenditure of Rs. 97.4 million up to end of October, 2008. Have we not done something for agriculture? Have we not done something substantial for agriculture? I am ashamed to look at the JVP. They said this year's allocation is only a 10 per cent increase from what we allocated last year. We have done very well in the field of agriculture.

The main activities in 2008 are as follows: a Presidential Task Force was established. Then, 36 crop-specialists were appointed to achieve the productivity increases in respect of 36 crops including crops targeted for reduction in imports. Crop Development Committees have been established. Awareness programmes, field programmes and mass media programmes are under way. Agricultural implements such as mammoties, tractors, other filling equipment et cetera, have been distributed among the farmers. High quality seed and planting material have also been distributed free of charge to the farmers in this country. Especially, in the Eastern Province we have done a massive programme providing the farmers with seed paddy, agricultural implements and other seed and planting material under the "Negenahira Navodaya". At least, the Opposition should be more responsible in making their allegations about the Ministry of Agriculture.

Home gardening competitions were held during 2007 and 2008 and the entire country has been set on a new trend today. If you go to the villages, if you come to the

city areas, agriculture has become the norm of the day. You could see urban agriculture; you could see balcony agriculture; in the villages; in schools; everywhere-wherever you go-agricultural development is visible. No one can challenge that.

Special projects have been launched to cultivate abandoned paddy lands in the wet zone. We planned to cultivate 1,200 hectares of fallow paddy lands in eight districts, including Gampaha, Kalutara and Colombo during the 2007 and 2008 Maha seasons. Progress achieved of that project is 88 per cent. The total investment of this project is around Rs. 10 million. Some people were talking about filling up paddy lands to build mega cities; to build fun cities. But, we have put a halt to that. Hon. Rajakaruna, we want to cultivate each and every inch of land. I am saying this for your information. Someone said that paddy lands should be filled and mega cities should be developed in and around Colombo. But, we have put a halt to that. We are cultivating all the fallow paddy lands including those in your area, the Gampaha District.

The school garden development programme has really achieved its targets. Inputs such as seeds and the provision of fertilizer for commercial cultivation of maize, kurakkan, green gram, soya beans and onions have been done. Three threshing machines and Thapolin sheets have been given at a 50 per cent subsidy. Even the packing materials, plastic crates have been distributed among the farmers with a 50 per cent subsidy.

Which government has done this before? If anyone wants to comment I will give one minute for them to comment. Maybe the Hon. John Amaratunga would like to comment on that - on agricultural development. [*Interruption.*] Very good. So, Hon. John Amaratunga, I welcome your good comments.

**ගරු සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
(மாண்புமிகு சரத்சந்திர ராஜகருணா)
(The Hon. Sarathchandra Rajakaruna)
ගරු ඇමතිතුමනි, මට මිනිත්තුවක් දෙනවාද?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
දෙන්නම්.

**ගරු සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
(மாண்புமிகு சரத்சந்திர ராஜகருணா)
(The Hon. Sarathchandra Rajakaruna)
දැන් තිබෙන පලතුරු එක ගෙඩියක්වත් කන්න බැහැ.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
ඇයි ඒ?

**ගරු සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
(மாண்புமிகு சரத்சந்திர ராஜகருணா)
(The Hon. Sarathchandra Rajakaruna)
බාගෙට පැහිච්ච ඒවා කඩලා, මොනවාද බෙහෙත් වර්ගයක් දමලා ඉදවලා, වෙළෙඳ පොළට දමනවා. කරුණාකර මේ පිළිබඳව මොකක් හරි ක්‍රියා මාර්ගයක් ගන්න.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
ගරු රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක මා පිළිගන්නවා. කාබයිඩ් යෙදීමෙන් ඇති වන ප්‍රශ්න ගැනයි ඔය කියන්නේ. කාබයිඩ් යෙදීම ගැන මත දෙකක් තිබෙනවා. පලතුරක් ඉදෙන කොට නිකුත් වන්නේ එතිලීන් වායුවයි. කාබයිඩ්වලින් නිකුත් වෙන්නේත් එතිලීන් වායුවයි. මේ ගැන පරීක්ෂණ පවත්වන්න කියලා අපි දැන් විද්‍යාඥයන්ට කියා තිබෙනවා. එතිලීන් වායුව කෘත්‍රිමව ලබා දී පලතුරු ඉදවීම මඟින් ශරීරයට හානියක් වෙනවාද කියන එක ගැන දැන් පරීක්ෂණ පවත්වා ගෙන යනවා. ඔබතුමාගේ අදහසට මා ගරු කරනවා. පිට රටින් ගෙනැල්ලා, අපි කන හැම ඇපල් ගෙඩියක්ම, හැම දොඩම් ගෙඩියක්ම, හැම මිදි ගෙඩියක්ම මෙන්න මේ එතිලීන් වායුකාරකයන්ට හසු වෙලා තිබෙනවා පමණක් නොවෙයි, පොලිරාම් කියන භයානක කෘෂි රසායනික ද්‍රව්‍යයේ ගිල්වලායි ඒවා ගෙනෙන්නේ. අපේ රටේ ඒ තත්ත්වය තවම ආවේ නැහැ. එන්න දෙන්නේත් නැහැ. ඔබතුමාගේ යෝජනාව මා ගෞරවයෙන් සැලකිල්ලට ගන්නවා.

ඌව පළාතේ ගම්මාන 18ක මී පැණි නිෂ්පාදනය කළා. මේ මී පැණි නිෂ්පාදනය අලෙවි කර ගැනීමේ ගැටලුවක් මතු වුණා. ඒ වෙලාවේ ඒ පළාත් අධ්‍යක්ෂවරයා පෞද්ගලික සමාගමක් එක්ක කථා කරලා කෘෂි නිෂ්පාදන ගම්මානවල හැදෙන මී පැණි බෝතල් කරලා වෙළෙඳ සැල්වලට දමලා තිබෙනවා. මේවා කෘෂිකර්මයේ සංවර්ධනය නොවෙයිද? මේ සඳහා තමයි අපි වෙහෙසෙන්නේ. ඔබතුමන්ලාගේ හොඳ යෝජනා අපි ගෞරවයෙන් පිළිගන්නට සූදානම්.

Farmer-women groups have been formed for promotion of home gardening and provided with marketing and entrepreneurship opportunities. Eleven *"Krushi Piyasa"s* have been established. Model agro-technology parks are maintained for dissemination of modern agricultural technology and knowledge. Nearly 30,570 persons have visited the agro-technology park at Gannoruwa and 35,860 persons visited the agro-technology park at Bataatha. I invite you Gentlemen to join us and pay a visit to these places and see what our Ministry is involved in; what our task is and how far we have fulfilled it.

**ගරු මොහමඩ් ෂෆීක් රාජබ්දීන් මහතා**
(மாண்புமிகு மொகமட் ஷபீக் ரஜாப்தீன்)
(The Hon. Mohamed Shafeek Rajabdeen)
You must send us invitations.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
Yes, very gladly, I will send you an invitation. Not only an invitation, we will provide you transportation; we will provide you a companion to come and visit our parks. If you wish to have a male companion, I would do so and if you want have another gender, that also could be looked into.- [*Interruption.*] Hon. John Amaratunga, I knew that you will get excited. When I came to the Discussion, you were not here, you were elsewhere getting you muscles relaxed. Do not let me discuss about that matter anymore.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා මට විනාඩියක් දෙන්න.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
මගේ කාලය තමුන්නාන්සේ ගන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ දැන් "lankadissent. com" website එකේ ප්‍රවෘත්තියක් දමලා තිබුණා. අපේ වීරෝදාර රණ විරුවන් කිලිනොච්චිය ජයග්‍රහණය කර තිබෙනවා කියලා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා දැන් ජාතිය අමතන්න හදනවාය කියන එක. අපි ඒක ඉතාම ගෞරවයෙන් මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමතියි. මේ දැන් "lankadissent. com" website එකේ මේ සම්බන්ධව පළ වෙලා තිබුණා. මා අහනවා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඉන්න නිසා මේ පුවත,-

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
අනේ, මගේ කාලය. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ සුබවාදී ආරංචියට අපි ස්තුති කරන අතරේ,-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekera)
නැත්නම් මොකද දන්නවාද? වෙන වෙන කට්ටියත් ඇවිත් මේ වාගේ -

**ගරු හේමකුමාර නානායක්කාර**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon. Hemakumara Nanayakkara)
ගරු සභාපතිතුමනි, "බල සුබ නිමිති පෙර මඟ නැකතටත් වැඩී" ඔය සුබ නිමිති. අට වැනිදා වන විට මේ පැත්තට ආගමනයේ සුබ නිමිති. මගේ මිත්‍රයාට බොහොම ස්තූතියි.

There is " Govi Sahana Sarana Service", a toll - free telephone service through which farmers are advised on farming problems. If you dial 1920, you will get the toll-free facility to contact Gannoruwa Agro Technology Park in order to find solutions for your agricultural problems. But, Hon. Dayasiri Jayasekara, for your dating this number will not be helpful - hope he did not hear it. Just now I mentioned about the Govi Sahana Sarana Service. Under the Crop Regionalization Programme, farmers are trained and provided with improved varieties of planting material to establish crop zones.Strengthening of small farmer entrepreneurship groups through "Gama Naguma" programme is done. Workshops for district level officers have been conducted for formulating development plans in selected villages and 390 farmer - groups have already been selected for implementation of such projects.

On minimization of losses of post - harvest and agro - processing, 52 training programmes have been conducted in Anuradhapura, Polonnaruwa, Ampara, Kalutara, Gampaha, Nuwara Eliya, Badulla, Matale and Hambantota Districts. Though the IPHT is located in Anuradhapura, post - harvest technology programmes have not only been conducted in Anuradhapura but we also have outreach programmes. We have gone to different districts, remote areas and trained the farmers on post - harvest technology. There is a programme focused on improving productivity and productin through the production and provision of good quality seeds, planting materials, improving farming skills and cultivating all cultivable lands, including the lands owned by the Department of Agriculture.

A massive programmes have been implemented under the Agriculture Development Division, such as the Programme for Promotion of Production and Utilization of Organic Fertilizer for which large sums of monies have been allocated and a special unit has been established in the Postgraduate Institute of Agriculture of the University of Peradeniya in order to carry out research and to encourage expansion of organic agriculture, Furthermore, an Organic Standards and Certification programme has been carried out, procurement of micro-water supply systems is in progress, rainwater harvesting tanks have been constructed and sums have been allocated to implement the provisions of Soil Conservation Act and Felling of Trees (Control) Act and Sustainable Water Support management Project by this division.

I am just trying to make my speech very brief. ගරු සභාපතිතුමනි, මගේ විනාඩි පහළොව සහ අපේ එස්. එම්. චන්ද්‍රසේන ඇමතිතුමාගේ විනාඩි දහයත් මට ලැබෙනවා. එම නිසා මගේ කාලය ලෙස විනාඩි 25ක් වශයෙන් ගෞරවයෙන් ඔබතුමා සටහන් කර ගන්න.

Under the Crop Forecast programme, a sum of Rs. 4.6 million has been allocated and the expenditure up to end of October is Rs. 2.2 million. Distribution of data collection forms and training programme for 2007/2008 Maha and 2008 Yala has been completed as crop forecasting activities. Coming on to Japanese Assistance, a 2KR Programme, Second Kennedy Round Programme - මොකක්ද මේ Second Kennedy Round Programme කියන්නේ? ඒක තමයි, අපේ රජය ජපානයත් එක්ක සාකච්ඡා කරලා මේ රටට අවශ්‍ය රෝද දෙකේ ට්‍රැක්ටර්, රෝද හතරේ ට්‍රැක්ටර්, අනිකුත් කෘෂි යන්ත්‍රෝපකරණ නොමිලේ මේ රටට ලබා ගැනීමේ වැඩ පිළිවෙළ. මේවා ඉස්සර කාලයේ වාගේ පොස්ටර් ගහපු අයට, දේශපාලන වේදිකා ගහපු අයට බෙදෙන්නේ නැහැ. ගොවි සංවිධානවලින් නිර්දේශ කරනු ලබන, තෝරා ගත් දක්ෂ ගොවීන්ට පමණයි මේවා බෙදා දෙන්නේ. මෙන්න මේ පිළිබඳව විපක්ෂය විශාල අවබෝධයකින්, අවධානයකින් කටයුතු කළොත් හොඳයි කියා මා කල්පනා කරනවා.

So many programmes have been implemented under the Planning and Project Division, such as, Dry Zone Livelihood Support and Partnership Programme, Capacity Development for Decentralized Poverty Reduction in Uva Wellassa Dry Zone Programme and we have signed many MoUs, Memorandum of Understandings, with Brazil, Phillippines, and also with China and Chile in order to bring in money to the country to develop agriculture in Sri Lanka.

Coming on to the achievements of the Department of Agriculture in 2008, it has released two new varieties of rice, Ld 365, a three and a half-month red short grain

variety and At 308, a three-month variety with higher resistance to major pests and diseases. Seven cultivars of salt tolerant rice have also been identified. ලවණ ගතියෙන් අධික වූ ප්‍රදේශවල වගා කිරීම සඳහා අපට විවිධ වී වර්ගවල ඌනතාවක්, හිඟතාවක් තිබුණා. අපේ බතලගොඩ වී පර්යේෂණ ආයතනය ජාන තාක්ෂණ විද්‍යාවේ මූලධර්මවලට අනුව අලුතෙන් වී ප්‍රභේද හතක් හොයා ගෙන දැන් ඒවා ගොවීන් වෙත ලබා දී තිබෙනවා. නැඟෙනහිර පළාතේ අවුරුදු විසි ගණනකින් කුඹුරු වගා නොකිරීමේ හේතුවත්, ඒ පස්වලට ආවේණික වුණු තවත් හේතූන් නිසා ලවණතාව ඉස්මතු වන්න පටන් ගත්තා. මා පෞද්ගලිකවම බතලගොඩ වී පර්යේෂණ ආයතනයට කථා කරලා එහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා යැව්වා, අවශ්‍ය පර්යේෂණ කරලා අවශ්‍ය නිර්දේශ ටික කරන්නය කියලා. දැන් නැඟෙනහිර පළාතේ ලවණ අධික ගොවි පොළවල්වල මේ අලුත් වි ප්‍රභේද හත වගා කිරීමේ වාසනාව ලැබී තිබෙනවා. විපක්ෂයේ දැන ගැනීම පිණිසයි යළිත් වරක් මා මෙය සඳහන් කළේ. Development of rice varieties to water stress is in progress, mapping of agro-ecological information of rice growing areas has been completed in Kurunegala and Polonnaruwa Districts, and a soil test kit has been developed for recommendation of fertilizer. ගොයම් ගහේ පත්‍රයේ වර්ණයට අනුව, ඒ පත්‍රයේ වර්ණ වෙනස් වීමට අනුව ඒ ගොයම් පැළයට අවශ්‍ය පොහොර ප්‍රමාණය කොපමණද කියා නිර්දේහය ලබා ගැනීම උදෙසා පස් පරීක්ෂා කරන කට්ටලයක් දැන් අපේ පර්යේෂණ ආයතන විසින් හඳුන්වා දි තිබෙනවා.

Development of organic package for rice is being completed, development of improved vegetable and fruit varieties and hybrid seed has been completed. පිට රටින් ආනයනය කරන්නා වූ ඕනෑම දෙමුහුන් බඩ ඉරිඟු වර්ගයක් එක්ක කරට කර තියලා තරග කරන්න පුළුවන් "සම්පත්" කියන දෙමුහුන් බීජ වර්ගය අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිෂ්පාදනය කර තිබෙනවා. මෑතක් වන තුරු කුරහන්වල එක ප්‍රභේදයයි මිනිසුන් හඳුනා ගෙන සිටියේ. මෙතෙක් පාරම්පරිකව ආපු ප්‍රභේදය ගැන කථා කළේ "හේන් කුරක්කන්" කියා. "රවි" සහ "රාවණා" කියන ප්‍රභේද අප කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හඳුන්වා දීලා තිබෙනවා. "තරිඳු" හා "රජිත" වැනි අලුත් තක්කාලි ප්‍රභේද හඳන්වා දී තිබෙනවා. "අමන්දා" වැනි හොඳ වම්බටු ප්‍රශේද අපි හඳුන්වා දි තිබෙනවා. මේ තිබෙන වාර්තා, පොත් පත් කියවන්නේ නැතිව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, කෘෂිකර්ම අමාත්‍යාංශයට ඇඟිලි දික් කරලා චෝදනා කරන්න එපා. ඒක මා මේ විපක්ෂයේ උගත් මන්ත්‍රීතුමන්ලාගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටින කාරණයක්.

කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මේ ආදී අපේ අමාත්‍යාංශයට අනුබද්ධ සියලු ආයතන මොනවාද කරන්නේ කියා ටිකක් කියවලා බලන්න. මම රාජබ්දින් මන්ත්‍රීතුමාට ආරාධනා කරලා, ප්‍රවාහන පහසුකම් සහ අවශ්‍ය සෙසු පහසුකම් සලසන්න බලාපොරොත්තු වනවා එතුමාට මේ තැන් බලන්න යන්න. [*Interruption*] - That is very welcome. If you want one companion, I would provide one. But if you request me to provide seven, I would do that as well.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

We did not know that you have started a new business

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon Hemakumara Nanayakkara)

I learnt this business from you. I do not charge commission. But, Hon. John Amaratunga, I said about a companion. The Hon. John Amaratunga was very clever in collecting commission from all sorts of nefarious houses in the areas of Hendala, Wattala, and Ja-ela, and was capable enough to visit at three of these places a day. We knew that from the very beginning. Do not get entangled with me. Everyone knows about your business and why you dissolved that special unit of police which was raiding all these bad places. Anyway, let me not get entangled with you. You are my old Friend and I respect you, I say "Sir" to you, because you are a senior politician in this House. But, when you make statements be careful especially with Hemakumara Nanayakkara who is from Galle, the other side of the Bentota River. [*Interruption.*] - No, I said about companions, but your vulgar mind went haywire. What can I do? I said about companions, but if your vulgarity is surfacing up, what can I do Hon. John Amaratunga?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Are you trying to provide seven?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon Hemakumara Nanayakkara)

Seven or maybe more. If you want fourteen or multiplied by some number that you wish to have, that I would do. Let me continue with my speech. Please bear with me.

As regards reducing post-harvest losses, training of small-scale entrepreneurs has been done and 860 plastic have been distributed among the farmers in the Vanni area.

Let me also tell you about some of the other work that has been carried out by the Department of Export Agriculture. By the Establishment of new plantations, the smallholders have been encouraged; they have been given good seed and planting material for cultivation Under the Productivity Improvement Programme, growers are assisted shade management, soil and water management practices, pruning and filling vacancies; free planting materials are supplied for filling the vacancies. I have been reading about all these things. But, my good Friend, the Hon. John Amaratunga, just heard only one word out of everything that I stated Anyway- [*Interruption.*] Kandalama is a lovely place. You will not go to Kandalama. You would go to "Samara" in Wattala.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

It is a respectable place not like Kandalama?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார)
(The Hon Hemakumara Nanayakkara)

I know. It is a respectable place which will give you a lot of commissions; which will help you to maintain so many people.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க )
(The Hon. John Amaratunga)
Why are speaking so angrily about Kandalama?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)
No, I am not. Why should I get angry? I go to Kandalama very often. Even after the Budget, I will be going there with my family. But there is a small difference. I go with my family but you go with-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An hon. Member)
Whom?

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)
Please fill in the blanks as you wish. I do not wish to fill in the blanks.

Then I will come to research. Identification of control measures for cardamom thrips problem is the most important achievement during this year. Selection of high-yielding and superior quality pepper varieties - there is a special pepper variety, Hon. John Amaratunga, called "Galle Kolu''. But do not tell your Leader about this "Galle Kolu''. There is special pepper variety called, "Galle Kolu'' in Matale but do not mention this to your Leader.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩියකට වඩා කාලය නැහැ.

**ගරු හේමකුමාර නානායක්කාර මහතා**
(மாண்புமிகு ஹேமகுமார நாணாயக்கார )
(The Hon Hemakumara Nanayakkara)
ගරු සභාපතිතුමනි, මා කථාව අවසාන කරන්නම්. මගේ මිත්‍ර ජෝන් අමරතුංග මැතිතුමා කොයි ආකාරයෙන් හෝ මගේ කාලය ගෙවී යන්න සැලැස්සුවා.

The Institute of Post Harvest Technology has done and is doing a lot of work. It has its outreach programmes which are not done only in Anuradhapura but it goes to the different districts and trains the farmers.

The Hector Kobbekaduwa Agrarian Research and Training Institute does a lot of research work and provides all the information to the different departments and also to the Ministry.

The Hadabima Authority of Sri Lanka is doing exemplary work for the farmers as far as wasteland management and watershed management are concerned.

The Sri Lanka Council for Agricultural Research Policy (CARP) is giving the right direction of research to all our departments and other related institutions. The CARP, in other words, or if I may state the entire name, Sri Lanka Council for Agricultural Research Policy, has given the proper research direction to all the research institutions.

The Department of Agrarian Development has been doing a lot of work as far as minor irrigation works are concerned. Minor irrigation works have been restored by the Department of Agrarian Development and 711 tanks and anicuts have been repaired covering 25 districts. It is planned to be done in 2009. Construction of fertilizer warehouses will be carried out this year with the money allocated by the Budget. Two thousand two hundred and ninety hectares of new agricultural lands are to be brought under cultivation benefiting 22,000 farmer families. Then, there is going to be cultivation of 7,000 acres of fallow paddy lands extending from Puttalam to Hambantota. Classification of agricultural lands, identification of crop zones based on ecological conditions, classification and surveying of paddy lands, so on and so forth will also be carried out.

ඊළඟට කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය - Agricultural and Agrarian Insurance Board - මඟින් ගොවියා ස්වාභාවික විපත්වලින් ආරක්ෂා කර ගන්නට අවශ්‍ය රක්ෂණය ලබා දීම සහ ගොවීන්ට විශ්‍රාම වැටුප් ලබා දීම කෙරෙනවා ශ්‍රී ලංකා සා ගිනි නිවීමේ මණ්ඩලය - Sri Lanka Freedom from Hunger Campaign Board - නව නැම්මකින් යුතුව ගෙවතු වගා කිරීමේ, විශේෂයෙන්ම ගෘහිණියන් සම්බන්ධ කර ගෙන ගෙවතු වගා කිරීමේ යෝධ වැඩ පිළිවෙළක නිරත වී ඉන්නවා. වී අලෙවි මණ්ඩලය, ඒ වාගේම පොහොර මහ ලේකම් කාර්යාලය කෘෂිකර්මය වෙනුවෙන් අතිවිශාල මෙහෙයක් කරනවා.

සමා වන්න, මට මහවැලිය ගැන කථා කරන්න අද ඉඩ කඩ නැහැ ගරු සභාපතිතුමනි, ඒ සඳහා කාලය මදි. කෘෂිකර්මය වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් කළ මුදලත්, ගිය අය වැයෙන් වෙන් කළ මුදලත් ශත පහක්වත් අපතේ යවන්නේ නැතිව ගොවි ජනතාවගේ යහපත උදෙසා යොදවා තිබෙනවා. මේ රටේ ජීවත් වන මුළු ජනගහනයෙන් සියයට හැත්තෑවකට වඩා වක්‍රව හෝ සෘජුව හෝ ගොවිතැනින් යැපෙන අයයි. ඔවුන්ගේ යහපත උදෙසා ඒ මුදල් යොදවා තිබෙනවා. ජෝන් අමරතුංග මැතිතුමනි, එදා ඩී. එස්. සේනානායක මැතිතුමා ගිය ගමන් මාර්ගයේ මෙදා යන්නේ ඔබතුමා ඉන්න යූඑන්පී එක නොවෙයි, මෙදා මා ඉන්න අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ සන්ධාන රජයයි කියමින් මගේ කථාව අවසන් කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ස්තුතියි. මීළඟට ගරු නිමල් ප්‍රේමවංශ ජයසිංහ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දොළහක් තිබෙනවා.

(අ. භා. 4.22)

**ගරු එන්. ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා**
(மாண்புமிகு என். டி. நிமல் பிரேமவன்ச ஜயசிங்க)
(The Hon. N. D. Nimal Premawansa Jayasinghe)
ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ සඳහා අද දවසේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් කරන මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් ජාතික නිදහස් පෙරමුණේ අදහස් දැක්වීම සඳහා ලැබුණු මේ අවස්ථාවේ විශේෂ කාරණා කිහිපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට මා කැමැතියි.

මේ රටේ අති බහුතරයක් වූ ජනතාව 2004 පාර්ලිමේන්තු මහා මැතිවරණයේදීත්, ඒ වාගේම 2005 ජනාධිපතිවරණයේදීත් තමන්ගේ මතය, තමන්ගේ වුවමනාව, එහෙම නැත්නම් තමන්ගේ අභිලාෂය ප්‍රකාශයට පත් කරමින් මේ රටේ පාලනයේ වග කීම මේ ආණ්ඩුවට පැවැරූ බව අප දන්නවා. අති විශාල අභිලාෂයන් ප්‍රමාණයක් තමන්ගේ සිත් තුළ දරා ගෙනතමයි ඔවුන් ඒ කාර්යය කළේ. ඒ අනුව ඊට පරෙ පැවැති එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව බලයෙන් ඉවත් කරමින් ඒ වෙනුවට සන්ධාන රජය නිර්මාණය කළේ, දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට ඒ දේශීය ආර්ථිකය තුළ කෘෂි ආර්ථිකයේ පංගුව වඩා හොඳින් නියෝජනය කිරීමට සහ ඊ් අදාළ දායකත්වය සැපයීමට අවශ්‍ය කටයුතු සන්ධාන රජය තුළ සිදු වේවිය කියන විශ්වාසය මතයි. ඒ වන විට පැවැති රජය මේ රටේ කෘෂි ආර්ථිකය නංවාලීමේ දිහාවට ගමන් කරනවා වෙනුවටෙ, මේ රටට උරුම වූ ක්‍රියාමාර්ගය අනුගමනය කරනවා වෙනුවට ඊට පටහැනිව වෙනත් ආකාරයකට. එහෙම නැත්නම් බහු ජාතික සමාගම්වල, වෙනත් විදේශ රටවල ඕනෑ එපාකම් අනුව මේ රටේ කෘෂි ආර්ථිකය මෙහෙයවීමට අදාළ කටයුතු සිද්ධ කළා. එය වෙනස් කරමින් ඒ වෙනුවට ශ්‍රී ලංකාවට, අපේ මව් පොළොවට උරුම වූ ක්‍රියාවලියට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න 2004 ජන මතය සමත් වුණා. අප ඒ සම්බන්ධයෙන් සතුටු වෙනවා.

එදා සිට ගතවූ අවුරුදු හතර දෙස ආපසු හැරී බැලුවොත්, අය වැය ගණනාවක් ඉදිරිපත් වෙලා මේ වන විට ඒ ක්‍රියාවලිය තුළ කොතරම් ඉදිරියට ගියාද කියන කාරණය මේ රටේ ජනතාව දන්නවා. ඒ අභිලාෂයන් ඒ ආකාරයෙන්ම ඉටු නොවුණා වුණත් ඊට අවශ්‍ය ප්‍රවේශයන් ගැනීම පසු ගිය කාලය තුළ සිදු වෙලා තිබෙන බව අප කියන්නට ඕනෑ. මෙහිදී නුවර එළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයකු විධියට මා විශේෂයෙන් අවධාරණය කරන්නේ මේ රටේ දේශීය ආර්ථිකය නංවාලීමේදී, ඊට කෘෂි ආර්ථිකය දායක කර ගැනීම සඳහා මෙවර අය වැය මඟින් රජය අනුගමනය කරන්නට අපේක්ෂා කරන වැඩ පිළිවෙළ තුළ උඩ රට ගොවියා කොයි ආකාරයට නියෝජනය කර ගන්න සූදානම්ද කියන කාරණයයි.

ගරු සභාපතිතුමනි, මේ අය වැය තුළ කෘෂි ආර්ථිකය නංවාලීම සඳහා විවිධ ක්‍රියාවලීන් අනුගමනය කර තිබෙනවා. විශේෂයෙන්ම කෘෂි අපනයන කලාප නිර්මාණය කරන්න. "එක් ගමක්-එක් වගාවක්" කියන සංකල්පය තුළ ක්‍රියාවලියක් ආරම්භ කරන්න, කෘෂි කර්මාන්තයට අදාළ නව පර්යේෂණ නිර්මාණය කරන්න, පසු ගිය කාලයේ පවත්වා ගෙන ආපු පොහොර සහනාධාරය තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන යෑමට, රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර හඳුන්වා දෙමින් ඊට ගැළපෙන ක්‍රියාවලියක් නිර්මාණය කරන්න මේ තුළ උත්සාහ කරමින් ඉන්නවා. නමුත් මා කියන්නට ඕනෑ, මෙන්න මේ තත්ත්වය තුළ විශේෂයෙන්ම උඩ රට එළවලු ගොවියා සම්බන්ධයෙන් ඉතාම අඩු මට්ටමක අවධානයක් තමයි යොමු කර තිබෙන්නේ කියා.

වී ගොවියා සඳහා පොහොර සහනාධාරය ලබා දීමට රජය අතිවිශාල වැයක් දරන අතර, මෙවර තව ඉදිරියට ගිහින් තේ ගොවියා සඳහා පවා මේ පොහොර සහනාධාරය ලබා දීමට රජය ඉදිරි පියවරක් තබා තිබෙනවා අපි දැක්කා. හැබැයි, තේ ගොවියා සඳහා රජයේ අවධානය යොමු වුණාට, අනික් පැත්තෙන් උඩ රට එළවලු ගොවියා ගැන රජයේ අවධානය ඒ ආකාරයෙන්ම නොතිබීම සම්බන්ධව උඩ රට එළවලු ගොවීන් නියෝජනය කරන, ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මා මගේ කනගාටුව ප්‍රකාශ කරන්නට ඕනෑ. මෙවර අය වැය ඉදිරිපත් කරන විට නුවරඑළිය, වැලිමඩ, බදුල්ල වාගේ ප්‍රදේශවල - උඩරට ප්‍රදේශවල - එළවලු ගොවීන්ගේ අවශ්‍යතාව සපුරා ලීම සඳහා, ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා විශේෂයෙන්ම පොහොර සහනාධාරය පැත්තෙන් යම් ඉඩකඩක් ඔවුන් සඳහා වෙන් වෙයි කියලා අපි බලාපොරොත්තු වුණා. මොකද, 2007 වසරේ යල කන්නයේදී වී ගොවීන් 5,50,000කට වැඩි සංඛ්‍යාවකට තමුන්නාන්සේලා පොහොර සහනාධාරය - රුපියල් 350හේ පොහොර සහනය - ලබා දීලා තිබෙන බව අපට දකින්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. මාස් කන්නයේදී ලක්ෂ අටහමාරකට වැඩි ගොවීන් පිරිසකට ඒ සහනාධාරය ලබා දෙන්න සූදානම් කරලා තිබෙනවා. හැබැයි අපි කියන්නට ඕනෑ. විශේෂයෙන්ම නුවරඑළියේ හා වැලිමඩ උඩ කොටසේ වී වගා නොකරන ප්‍රදේශවල මුළුමනින්ම එළවලු පමණක් වගා කරන ගොවීන් අතිවිශාල ප්‍රමාණයක් ඉන්නවාය කියලා. ඔවුන්ගේ සංඛ්‍යාව ගත්තොත්, 15,000කට 20,000කට ආසන්න සංඛ්‍යාවක් වෙනවා. ලක්ෂ අටහමාරකට හෝ දස ලක්ෂයකට ආසන්න පිරිසකට වී සඳහා සහනාධාරය ලබා දෙන තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලා සිටිනවා, පොහොර සහනාධාරය නොලැබෙන, 15,000ක්, 20,000ක් පමණ එළවලු ගොවීන් සඳහා කිසියම් ක්‍රියාවලියක් මෙවර අය වැය තුළින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිද්ධ කරන ලෙස. ඒ විශ්වාසය, බලාපොරොත්තුව අපට තිබෙනවා.

තමුන්නාන්සේලාගේ පැත්තෙන් අවධාරණය කළා, රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර ගොවීන්ට ලබා දීම සඳහා වැඩි ඉඩකඩක්, වැඩි අවස්ථාවක් නිර්මාණය කර ගැනීම සඳහා ප්‍රවේශයන් ගනිමින් සිටින බව. ඒ සම්බන්ධව අප සතුටු වනවා. රසායනික පොහොර භාවිතය අඩු කරමින්, ඒ වෙනුවට කාබනික පොහොර නිෂ්පාදනයට සහ භාවිතයට නුවර එළිය වාගේ ප්‍රදේශවල ජනතාව වඩවඩාත් යොමු කරනවා නම්, සමහර විට අපට මේ පොහොර සහනාධාරය තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්න සිද්ධ වන්නේ නැහැ. පසු ගිය කාලයේ සිට පොහොර සහනාධාරය ලබා දීම දිගටම සිද්ධ වුණා. රුපියල් 350 පොහොර ලබා දීම කාලයක් තිස්සේ සිදුවුණා. හැබැයි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන්ට ඒ දෙය නොලැබීම නිසාම, අද දවස වන කොට ඔවුන් තමන්ගේ ගොවිබිම් වලින් ඉවත් වීමට අවශ්‍ය කටයුතු සිද්ධ කරමින් ඉන්නවා. ඒ මොකද, මේ වන කොටත් නුවරඑළිය ප්‍රදේශයේ යූරියා කිලෝග්‍රෑම් 50ක පොහොර මිටියක් රුපියල් 6,000කටත් වඩා වැඩියි. ඒ වාගේම අනිකුත් පොහොර වර්ග සියල්ලම රුපියල් 6,000ක්, 7,000ක් වැනි වැඩි මිල ගණන්වලටයි තිබෙන්නේ.

එක පැත්තකින්, බත සපයන ගොවියාට සහනාධාර සපයද්දී, අනික් පැත්තෙන්, ඒ බතට අවශ්‍ය එළවලු ටික සපයන ගොවියා ඒ හා සමානවම ආරක්ෂා කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. ඔවුන් වෙනුවෙන් අපේ අවධානය යොමු කළ යුතුයි. හැබැයි, අපි විශ්වාස කරන්නේ නැහැ, ඔවුන් දිගින් දිගටම මේ රසායනික පොහොර භාවිතය කර ගෙන යා යුතුයි කියලා. ඔවුන් ක්‍රමානුකූලව දැනුවත් කළ යුතු වෙනවා. ඒ දැනුවත් කිරීම තුළ රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිත කරන්න ඔවුන් වෙනස් කර ගත යුතු වෙනවා. මොකද, මධ්‍යම කඳුකරය තුළ රසායනික පොහොර වැඩිවැඩියෙන් භාවිත කිරීම නිසා සිද්ධ වන්නා වූ පාරිසරික හානි විශාල සංඛ්‍යාවක් තිබෙනවා. නමුත් අද ජනතාව ඉන්න තැන ඉඳලා පටන් ගත්තොත් ක්‍රමානුකූලව ඔවුන් වෙනස් කරන්න පුළුවන්. ඒ ගොවීන් සඳහා තමුන්නාන්සේලාගේ ආයතන සක්‍රිය මට්ටමින් යොදා ගත යුතු වනවා. මොකද අද භාවිතයේදී අපි දකිනවා, අතිවිශාල නිලධාරීන් පිරිසක් ඒ ප්‍රදේශ නියෝජනය කරමින් ඒ ගොවීන්ට අවශ්‍ය සේවාවන් සැපයීමට කටයුතු කළත්, ඔවුන්ගෙන් ඒ සේවාව ඒ ආකාරයට සිද්ධ වන්නේ නැහැයි කියන එක. මේ නිසාම සමහර විට අක්කරයකට අවශ්‍ය කරන පොහොර ප්‍රමාණට වඩා දෙතුන් ගුණයක් පාවිච්චි කරන ගොවීන් පිරිසක් තමයි අප දකින්නේ. සමහර විට පොහොර හොණ්ඩරය පාවිච්චි කරන්න ඕනෑ අවස්ථාවල හොණ්ඩර දෙක, තුන පාවිච්චි කරන තත්ත්වයක් තිබෙනවා. ඒකට හේතුව මේ ඉන්න නිලධාරීන් විසින් ගොවීන් දැනුවත් කරලා නැතිකමයි. ඒ නිසා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, මේ නිලධාරීන් නිසියාකාරයෙන් කළමනාකරණය කරලා රසායනික පොහොර භාවිතයේදී ඇති වන පාරිසරික හානි ගැන දැනුවත් කරමින් වඩාත් ඵලදායී විධියට එහෙම නැත්නම් යෝග්‍ය අකාරයෙන් රසායනික පොහොර භාවිත කරන්නේ කොහොමද, ඊට ගැළපෙන පොහොර භාවිත කරන්නේ කොහොමද කියන එක ගැන ගොවීන්ට අවශ්‍ය දැනුම ලබා දෙන්න කටයුතු කරන ලෙසට. විශේෂයෙන්ම මධ්‍යම කඳුකරයේ නුවර එළිය වාගේ ප්‍රදේශ සඳහා කාබනික පෙහොර භෘවිතය අත්‍යවශ්‍ය වෙල තිබෙනවා. මේ වන කොටත් ඔවුන් යම් මට්ටමකින් රසායනික පොහොරවලට අමතරව කාබනික පොහොර භාවිත කරනවා. හැබැයි ඒ කාබනික පොහොර

[ගරු එන්. ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා]

භාවිතාවේදීත් ඔවුන්ට ගැටලු තිබෙනවා. අප විශ්වාස කරනවා, තමුන්නාන්සේලා මෙවර කරනු ලබන මේ ක්‍රියාවලිය තුළ - එහෙම නැත්නම් කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය තුළ - නුවර එළිය ගොවීන් ඉලක්ක කර ගෙන යම් යම් ක්‍රම වේදයන්ට ගමන් කරාවිය කියා.

මෙවර අය වැයේදී නුවර එළිය එළවලු ගොවීන් ගැන බලන විට සතුටු වන එක කාරණයක් තිබෙනවා. ඒ තමයි යම් යම් ආනයනික කාෂි භාණ්ඩ මත සෙස් බද්ද පැන වීම. පසු ගිය කාලව නුවර එළිය, වැලිමඩ ප්‍රදේශවල ගොවීන් අර්තාපල් නිෂ්පාදනය කරද්දී ඒ අවස්ථාවල සිටි වෙළඳ අමාත්‍යවරු විශාල වශයෙන් අර්තාපල් ආනයනය කළා. එසේ අර්තාපල් ආනයනය කිරීම තුළ ඒ ප්‍රදේශවල ගොවීන් අතිවිශාල දුෂ්කරතාවන්ට පත් වුණා. අද වන කොට අර්තාපල් කිලෝවක් සඳහා නිෂ්පාදන පිරිවැය රුපියල් 55ක් 60ක් වනවා. හැබැයි අර විධියේ ආනයනයක් සිද්ධ වෙච්ච හැටියේම ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගන්න වෙලා තිබෙන්නේ කිලෝවක් රුපියල් 30ක් 40ක් වාගේ මිලකටයි. ඒ, අතිවිශාල පාඩුවක දරා ගෙනයි. මෙන්න මේ තත්ත්වය නිසා අද වන කොට නුවර එළිය ප්‍රදේශයේ, වැලිමඩ ප්‍රදේශයේ එහෙම නැත්නම් උඩ රට ප්‍රදේශයේ එළවලු ගොවීන් තමන්ගේ ගොවි බිම්වලින් ඉවත් වෙමින් වෙනත් රැකියා සොයා ගෙන යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඊට හේතුව ඔවුන්ට තමන්ගේ ගොවිතැන කර ගෙන යාමේදී විශ්වාසයක් නැති කමයි. හැබැයි මෙවර සෙස් බද්ද පැන වීම තුළින් මේ ගොවීන් ආරක්ෂා කර ගැනීමේ කිසියම් ක්‍රියාවලියක් සිද්ධ වෙයි කියා අප සිතනවා. 2007 අවුරුද්දේ අර්තාපල් කිලෝ අටකෝටි පනස්නවලක්ෂ විසිඅටදාස් අටසිය අසූහතක් ගෙන්වා තිබෙනවා. මේ සඳහා රුපියල් මිලියන 2,210කට වඩා වැය කර තිබෙනවා. අර්තාපල් ගෙන්වීම සඳහාම පමණක් රුපියල් මිලියන 2,210කට වැඩි මුදලක් පිට රටවලට යවා තිබෙනවා. හැබැයි රජය මේ ගැන හරි හැටි කල්පනා කරලා සැලසුම් සහගතව මේ සඳහා මැදිහත් වෙනවා නම් මේ කිසිදු මුදලක් විදේශයන්ට යන්න නොදී රටේ සමස්ත පරිභෝජනය සඳහා අවශ්‍ය අර්තාපල් ප්‍රමාණය දෙන්න මේ රටේ ගොවියාට පුළුවන්ය කියා අප විශ්වාස කරනවා. ඒ වාගේම ඒ ප්‍රදේශවල ගොවීන් ඒ සඳහා සූදානම්ය කියන නාරණයත් අප කියන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. 2007 අවුරුද්දේ මෙරටට ආනයනය කර තිබෙන එළවලු වර්ග ගැන බැලුවොත් ලීක්ස් පවා ආනයනය කරලා තිබෙන බව අපට පෙනෙනවා. නිශ්චිත සැලැස්මක් නැතිකම නිසා ඒ වාගේම රජය ඒ සඳහා සැලසුම් සහගතව මැදිහත් නොවීම නිසාම ඇතැම් අවස්ථාවල එළවලු පවා ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. සමහර විට අධි නිෂ්පාදනයක් සිද්ධ වන අවස්ථා තිබෙනවා. තක්කාලි, ලීක්ස් වාගේ දේවල් සමහර අවස්ථාවලදී අධි නිෂ්පාදනයක් පෙන්නුම් කරනවා. ඒ අවස්ථාවල ගොවීන් අතිවිශාල පාඩු ලබමින් තමයි ඒ වගාවන්හි නියුක්ත වන්නේ. හැබැයි ඔවුන්ගේ නිෂ්පාදනයට ඒ වෙලාවේ මිලක් නොදුන්නත් ඔවුන්ට කිසියම් අකාරයක දැනුවත් කිරීමක් කරන්න-එහෙම නැත්නම් ඒ ඒ කාලවලදී රටේ පාරිභෝගිකයාගේ අවශ්‍යතාව කොතරම්ද කියා සොයා බලා ඒ අවශ්‍යතාව අනුව ඒ ඒ වගාවන් සඳහා ගොවීන් යෙද වීමේ හැකියාව සොයා බැලීමට-තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු හරහා නිලධාරීන් යොද වන්න පුළුවන් නම් ඒ ගොවීන්ට සිදු වන පාඩු වළක්වන්න පුළුවන් වෙයි කියා අප විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි අවධාරණය කරන්න ඕනෑ මේ වන කොට කෘෂි යෙදවුම්වල මිල අතිවිශාල ලෙස ඉහළ ගොස් තිබෙන බව. එක පැත්තකින් ආනයනික භාණ්ඩ මත, එහෙම නැත්නම් අර්තාපල් වාගේ දේවල් මත සෙස් බද්ද පැන වීමේදී ඒ තුළින් දේශීය ගොවියා ආරක්ෂා වුණත් අනෙක් පැත්තෙන් කෘෂි යෙදවුම් මේ රටට ගෙන්වා ගැනීමේදී ඒ මිල ගොවියාට වක්‍රාකාරයෙන් බලපෑමක් වෙන්න පුළුවන් කෘෂි යෙදවුම්වලට සෙස් බද්ද පැන වීම තුළ නැවත මේ කෘෂි යෙදවුම්වල මිල ඉහළ යාම, ගොවියාගේ පිරිවැය ඉහළ යාමට සෘජුවම බලපානවා. ඒ නිසා එක පැත්තකින් සෙස් බද්දෙන් ගොවියාට යම් සහනයක් ලැබෙනවා වාගේම අනෙක් පැත්තෙන් ගොවියාගේ පිරිවැය ඉහළ යාම කෙරේ සෙස් බද්ද බලපානවා. ඒ නිසා මම තමුන්නාන්සේලාගේ විශේෂ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටින්නේ ගොවීන්ගේ කෘෂි යෙදවුම්, ඒ වාගේම ඔවුන්ට ඕනෑ කරන අනෙකුත් නිෂ්පාදන උපකරණ ඔවුන්ට සැපයීමේදී දෙපාර්තමේන්තු මට්ටමෙන් තමුන්නාන්සේලාගේ වැඩි මැදිහත් වීමක් කරන ලෙසයි. ඔවුන්ට යම කිසි සහනයක් අවශ්‍ය වෙනවා. ඒ නිසා රජයට විශේෂයෙන්ම සිපෙට්කෝ ආයතනය හරහා ගොවීන්ට අවශ්‍ය කරන පළිබෝධ නාශක ටික සපයන්න පුළුවන් නම්, බහු ජාතික සමාගම්වලින් ඉවත් කර ගෙන රජයට සිපෙට්කෝ ආයතනය හරහා සපයන්න පුළුවන් නම්, ඒ වාගේම රජයේ බීජ ගොවි පොළවල් හරහා බීජ ටික සපයන්න පුළුවන් නම්, ඒ වාගේම කෘෂි උපකරණ මේ රටේ වෙනත් කර්මාන්තශාලා හරහා නිෂ්පාදනය කර ගන්න පුළුවන් නම් ගොවීන්ට ඉතාම අඩු පිරිවැයකින් තම නිෂ්පාදන කර ගෙන යන්න පුළුවන් වෙයි කියා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අවධානය කළ යුතු තවත් ප්‍රධාන කාරණයක් තිබෙනවා. අපි දන්නවා මේ වන කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ පමණක් රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයිති ගොවි පොළවල් ගණනාවක් තිබෙන බව. පසු ගිය කාලයේ කෘෂිකර්ම අමාත්‍යතුමන්ලා මේ ගොවි පොළවල් සම්බන්ධයෙන් දක්වපු මැදිහත් වීම ඉතාම කනගාටුදායකයි. අද වන විට මේ ගොවි පොළවල් විශාල කැලෑ ප්‍රදේශ බවට පත් වෙලා තිබෙනවා. එහෙම නැත්නම් මේවායේ නිසි ප්‍රයෝජනයක් නොගන්නා නිසා ඒවා අත් හරින, එහෙම නැත්නම් වෙනත් කටයුතු සඳහා යොද වන අවස්ථා තිබෙනවා. ඒ නිසා අප විශේෂයෙන්ම අවධාරණය කරන්න ඕනෑ මීපිලිමාන තිබෙන රජය සතු ගොවි පොළ අද වන විට ඊජේ ඉන්ටර්නැෂනල් වාගේ වෙනත් බහු ජාතික සමාගම්වලට බදු දෙමින් තිබෙන බව. රජයේ කෘෂිකාර්මික කටයුතුවලට, එහෙම නැත්නම් ගොවීන්ගේ වුවමනාවට අදාළ ගොවි පර්යේෂණ කටයුතු, ගොවි පොළවල කටයුතු සිද්ධ කරනවා වෙනුවට ක්‍රමානුකූලව මේවා බදු දෙන, එහෙම නැත්නම් රජයෙන් ඉවත් කරන දිසාවට අවශ්‍ය කටයුතු සිද්ධ කරමිනුයි තිබෙන්නේ. ඒ නිසා මා විශේෂයෙන්ම කියා සිටිනවා, කෘෂි ආර්ථිකය තුළින් මේ රටේ දේශීය ආර්ථිකයට අවශ්‍ය දායකත්වය ඉහළින්ම ලබා ගැනීමට-දායක කර ගැනීමට - තමුන්නාන්සේලා කල්පනා කරනවා නම් මෙන්න මේ ගොවි පොළවල් ටික හරියට කළමනාකරණය කරලා ඒ තුළින් ලබා ගත හැකි නිසි ඵල ප්‍රයෝජන ජාතික ආර්ථිකයට දායක කර ගැනීම තමුන්නාන්සේලාගේ වගකීම වන බව. විශේෂයෙන්ම පසු ගිය කාලාන්තරයක් තිස්සේ මේ ගොවි පොළවල් නඩත්තු නොකිරීම නිසා අද ඒවා නිසරු වෙලා තිබෙනවා. ඒ නිසාම නිසරු වෙච්ච ගොවි පොළවල් නැවත නඟා සිටු වීම සඳහා තමුන්නාන්සේලාට විශාල කාර්ය භාරයක් කරන්න සිද්ධ වෙනවාය කියා මා විශ්වාස කරනවා.

තමුන්නාන්සේලාගේ අවධානය යොමු කළ යුතු අනෙක් කාරණය තමයි සීතා එළිය බීජ පර්යේෂණාගාරය. සීතා එළිය බීජ පර්යේෂණාගාරය බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාවලිය සඳහා තමයි ස්ථාපිත කර තිබෙන්නේ. හැබැයි අදත් අපි දකිනවා විශාල වශයෙන් විදේශවලින් බීජ අර්තාපල් ආනයනය කරන බව. අපේ රටේ මහා ධනයක් වැය කරමින්, ඒ සඳහා විශාල බුද්ධිමතුන් ප්‍රමාණයක් නියෝජනය කරමින් බීජ පර්යේෂණාගාරය පවත්වා ගෙන ගියා. නමුත් එයින් නිසි ප්‍රයෝජන ගන්නවාද කියන ප්‍රශ්නය අපට රජයෙන් අහන්න වෙනවා. මොකද, සීතා එළිය බීජ පර්යේෂණාගාරය කාලාන්තරයක් තිස්සේ පවත්වා ගෙන එන්නේ ඉතාම දුෂ්කර තත්ත්වයක් තුළයි. ඒ සඳහා රජයේ අවධානය තිබෙන්නේ ඉතාම අල්ප මට්ටමින්ය කියන කාරණය අවධාරණය කරන්න ඕනෑ. ඊයේ පෙරේදා මම ඒ ස්ථාන භාර නිලධාරිතුමියගෙන් ඒ පිළිබඳව විමසා බැලීමේදී ඇය ප්‍රකාශ කළේ තමුන්නාන්සේලා නොවැම්බර් මාසයේ 11 වැනිදා ගෙනාපු භාණ්ඩාගාර චක්‍රලේඛය නිසා පසු ගිය කාලයේ ඒ ආයතනය අත ගසා තිබුණු සංවර්ධන කටයුතු ගණනාවක් අත හරින්න සිද්ධ වෙලා තිබෙන බවයි. මේ බීජ පර්යේෂණාගාර නිර්මාණය කළේ, එහෙම නැත්නම් සමාජයට දායාද කළේ මේ රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය දායකත්වය ලබා ගැනීම සඳහායි. හුදෙක් වාර්ෂිකව පුනරාවර්තන වියදම් ඒ සඳහා යොදවමින් ඒ ආයතන නඩත්තු කිරීම පමණයි සිද්ධ වෙන්නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු එන්. ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා**
(மாண்புமிகு என். டி. நிமல் பிரேமவன்ச ஜயசிங்க)
(The Hon. N. D. Nimal Premawansa Jayasinghe)
ඒ නිසා අවසන් වශයෙන් ගරු සභාපතිතුමනි, බීජ පර්යේෂණාගාර ඵලදායී විධියට පවත්වාගෙන යාමට අවශ්‍ය මැදිහත්වීමට රජයේ අවධානය යොමු වෙන්න ඕනෑ කියා මම ඉල්ලා සිටිනවා. ලක්ෂ 10කට ආසන්න ගොවින්ට පොහොර සහනාධාරය දෙනවා වාගේම, 15,000කට ආසන්න පිරිසක් ඉන්න නුවර එළිය ප්‍රදේශයේ ගොවීන් සඳහාත් තමුන්නාන්සේලාගේ පොහොර සහනාධාර වැඩ පිළිවෙළ ව්‍යාප්ත කරන්නය කියා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 4.43]

**ගරු ජයතිස්ස රණවීර මහතා (වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர - நீர்ப்பாசனத்துறை அமைச்சர்)
(The Hon. Jayatissa Ranaweera-Minister of Irrigation)
ගරු සභාපතිතුමනි, අද දින කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයෙත්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් වැය ශීර්ෂ විවාද කරනවා. ගරු සභාපතිතුමනි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ වෙනුවෙන් ඉදිරිපත්වුණු කාරණා කිහිපයකට මම පිළිතුරු සපයමින් අපේ අමාත්‍යාංශය පිළිබඳව කෙටි විග්‍රහයක් කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම අද දින විවාදයේදී වාරිමාර්ග අමාත්‍යාංශය පිළිබඳව එතරම් විවේචන හා අලුත් යෝජනා කිසිවක් ඉදිරිපත් වුණේ නැති නිසා මගේ ගරු අමාත්‍ය, ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, අපේ අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු අපි පසු ගිය කාලය තුළ මේ රටේ කරපු කාර්ය භාරය පිළිබඳව විපක්ෂය සෑහීමකට පත් වෙලා තිබෙනවා වාගේම අපේ රටේ ජනතාවත් සෑහීමකට පත් වෙලා ඇතැයි කියා අපි විශ්වාස කරනවා. අපේ අමාත්‍යාංශය 2007 වර්ෂයේදී වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය කියා නව අමාත්‍යාංශයක් ඇති කරලා අපි සැලසුම් හදලා තිබෙනවා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ දස අවුරුදු සැලසුම් සකස් කරලා අවුරුදු 10ක් තුළ මේ රට වාරි කර්මාන්තයෙන් ස්වයංපෝෂිත කරන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව සැලසුම් සහගත වැඩ පිළිවෙළක් තමයි අපේ අමාත්‍යාංශයෙන් අපි ඉදිරියට ගෙන යන්නේ. ඒ අනුව අපි මේ වන කොට මහා වාරිමාර්ග ක්‍රම යටතේ විශාල ව්‍යාපෘති රාශියක් ආරම්භ කරමින්, වැඩ නිම කරමින් ඉදිරියට යන බව තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම වෙහෙරගල ජලාශය කඩිනමින් ඉදි කිරීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ ජයන්ත මන්ත්‍රීතුමා අපිට ස්තුති කළා. ඒ පිළිබඳව එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. වෙහෙරගල ජලාශය තව මාස කිහිපයකින් ජනතා අයිතියට පත් කරන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා. පසු ගිය කාලය තුළ අපිට වළක්වන්න බැරි කාරණා නිසා වෙහෙරගල ජලාශයේ කටයුතු මාස කිහිපයක් ප්‍රමාද වුණා මිසක් අපේ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අඩු පාඩුවකින් ප්‍රමාද නොවුණු බව අපි මතක් කරන අතර, ඉතා මෑතකදී එම ව්‍යාපෘතිය අවසන් කරන්න පුළුවන් බව අපි තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
වැරදි තොරතුරු සටහන් වෙලා තිබෙනවා. වාර්තාවේ සමහර තැන්වල ප්‍රගතිය පිළිබඳවත්, මුදල් පිළිබඳවත් අඩු පාඩුකම් තිබෙනවා.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
එතැන පොඩි අඩු පාඩුවක් තිබුණත් තමුන්නාන්සේලාට අපි වග කීමෙන් කියනවා තව මාස කිහිපයක් ඇතුළත එම ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කරන්න පුළුවන්කම තිබෙනවාය කියා. පසු ගිය දවස්වල යම් කාරණා කිහිපයක් නිසා එම කටයුතු පස්සට ගියත් එය ගැටලුවක් කර ගන්න එපා. එය ළඟදීම,-

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
වැඩිය හොඳට කරපු නිලධාරීන් අගය කිරීමක් වශයෙන් ඔවුන්ට යම් දීමනාවක් ගෙවන්න ක්‍රමයක් තමුන්නාන්සේලා යෝජනා කළාද?

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
බොහොම හොඳයි. ඒ ගැන අපේ ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒක හොඳ යෝජනාවක්. ඒක අපි හොඳට කළාය කියා ඔබතුමන්ලා පිළිගන්නවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
ඔබතුමාට වැඩිය නිලධාරීන්.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
මම කථා කරන්නේ එතුමන්ලා වෙනුවෙන්. [බාධා කිරීමක්] නැහැ. අපේ ගෞරවය දෙන්න සූදානම්. ඒ ගැන ගැටලුවක් නැහැ. ඒ වාගේම රඹුක්කන් ඔය ජලාශයේ ඉදි කිරීම් කටයුතු කෙරෙමින් පවතිනවා. මේ වන කොට හැඩඔය ජලාශයේ ඉදි කිරීම් කටයුතු කෙරෙමින් පවතිනවා.අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ මහා වාරි මාර්ගයක් වශයෙන් යාන් ඔය ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. තව මාස කීපයකින් අපට පුළුවන් වෙයි, ඒ ප්‍රදේශයේ තත්ත්වය අනුව එය ආරම්භ කරන්න. ඒ වාගේම පහළ ඌව ව්‍යාපෘතිය, ලුණුගම් වෙහෙර බින්දු ජල ව්‍යාපෘතිය, මහ ගෝනාවැව ව්‍යාපෘතිය, ඇල්ල පොතාන අමුණ ව්‍යාපෘතිය, ගල්ඔය නවෝදය වාරි ව්‍යාපෘතිය වාගේම වාරි පුබුදු වැඩසටහන යටතේ අනුරාධපුර, කුරුණෑගල දිස්ත්‍රික්කවල අවුරුදු සිය දහස් ගණන් පැරණි වැව් අමුණු නැවත පුනරුත්ථාපනය කරලා, ගොවි ජනතාවට අවශ්‍ය ජලය ලබා දීමේ වැඩසටහනත් අප මේ වන කොට ක්‍රියාත්මක කරමින් පවතිනවා. එම වැඩසටහන ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන බව මේ ගරු සභාවට මතක් කරන්න මම කැමැතියි.

අපේ ගරු බන්දුල බස්නායක ඇමතිතුමාගේ ප්‍රදේශයේත් PEACE Project එක ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන වැඩසටහනක් බව මේ ගරු සභාවට මතක් කරන්න මම කැමැතියි. ඒ වාගේම සුළු වාරිමාර්ගයක් හැටියට වාහල්කඩ වැව දියුණු කරනවා, ඒ වාගේම මිනිපේ ප්‍රධාන වාරි මාර්ගය දියුණු කරනවා. ගල්ඔය නවෝදය වාගේ පුනරුත්ථාපන වැඩසටහන් කෙරෙනවා. කන්දේ පිටවල වැව, මහහල්මිල්ලෑව වැව, දඹුළු ඔය අමුණ, මුතුකෙළියාව අමුණ, වැමැඩිල්ල ජලාශය, කැකිරිඕබඩ ජලාශය, ජනරංජන වැව වගේ විශාල වැව් රාශියක් සම්බන්ධයෙන්ද සංවර්ධන කටයුතු කෙරෙනවා. ඒ වාගේම හේකිත්ත ගංවතුර පාලන ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා. මේ සියල්ලම නම් වශයෙන් ඉදිරිපත් කරන්න මට අපහසුයි. මොකද, අද මම අසනීප තත්ත්වයෙනුයි පසු වන්නේ. මේ විවාදයට සම්බන්ධ වෙන්න ඕනෑ නිසා මම අද පැමිණියා. ඒ වාගේ සුළු වාරි මාර්ග රාශියක් සම්බන්ධයෙන් මේ වැඩසටහන යටතේ විශාල සංවර්ධනයක් කරන බව තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

[ගරු ජයතිස්ස රණවීර මහතා]

ඒ වාගේම මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි, නාගරික ජල සැපයුම හා ගංවතුර පාලනය කිරීමේ කැලණි ගඟ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය, ඒ වාගේම සබරගමුව පළාතේ, රත්නපුර කළු ගඟ ව්‍යාපෘතිය, ඒ වාගේම නිල්වලා ව්‍යාපෘතිය - දකුණු දිග වියළි ප්‍රදේශවලට වතුර සැපයීමේ වැඩසටහන - ඒ වාගේම මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති රාශියක් දස අවුරුදු සැලැස්ම තුළ ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වන බව. ඒ වාගේම මේ දස අවුරුදු සැලසුම තුළ යාන් ඔය, හැඩ ඔය, නිල්වලා ගඟ ව්‍යාපෘති වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ කරන්න අපි බලපොරොත්තු වෙනවා.

අපි මතක් කරන්නට ඕනෑ, අතිගරු ජනාධිපතිතුමාගේ සහ මගේ අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු අයගේ මහ පෙන්වීම තුළ ඉරාන රජයේ ආධාර යටතේ උමා ඔය ව්‍යාපාරය ආරම්භ කරන්න අපි මේ වන කොට කටයුතු කර තිබෙන බව. මේ රටේ වාරි කර්මාන්තයට විශාල සංවර්ධනයක් ගෙන දෙමින් විදුලිය උත්පාදනය කරන්නට පුළුවන් විශාල ව්‍යාපෘතියක් බවට මෙම උමා ඔය ව්‍යාපෘතිය පත් වෙනවා.

ඒ වාගේම මේ සාකච්ඡාවේදී මතු වුණු කාරණා කීපයක් පිළිබඳව ගරු සභාවට පිළිතුරු සපයන්න මා බලාපොරොත්තු වෙනවා. පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගරු එස්. කේ. සුබසිංහ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මින්නේරිය වැවේ ජල පෝෂිත ප්‍රදේශවල ගොඩනැඟිලි වගයක් ඉදි කිරීම පිළිබඳව. අප ඒ ගැන සොයා බැලුවා. ඒ ඉදි කිරීම් කටයුතු කරන්නේ මින්නේරිය වැවේ ඒ ජල පෝෂිත ප්‍රදේශයෙන් එහා වනජීවී දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල මිසක් වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් ඉඩම්වල නොවන බව අප මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි. එම ඉදි කිරීම් කරන්නේ වනජීවී දෙපාර්තමේන්තුව මඟින් බව අප මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි. ඒ වගේම අම්පාර හා මඩකළපුව දිස්ත්‍රික්ක නියෝජනය කරමින් කථා කළ ගරු මන්ත්‍රීතුමා, මඩකළපුව දිස්ත්‍රික්කය තුළ වාරිමාර්ග අමාත්‍යාංශයෙන් කරන වැඩ කටයුතු ප්‍රමාණවත් නොවන බවත්, ඒ ප්‍රදේශයේ නිලධාරීන්ගේ ප්‍රශ්නයක් පිළිබඳවත් කිව්වා. මා එම ගරු මන්ත්‍රීතුමාගේ සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ දැන ගැනීම සඳහා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට කැමැතියි, දැනට මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා උනිච්චි වැව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව. රුපියල් මිලියන 440ක් වියදම් කරලා එහි අඩි හයක් විතර ප්‍රමාණයේ බැම් ශක්තිමත්ව ඉදි කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මේ වන කොට සැලසුම් සකස් කරලා තිබෙනවා. ඊට අමතරව රුපියල් මිලියන 25ක් වියදමින් ඇළ වේලි මාර්ග පද්ධති සකස් කිරීමටත් අපි කටයුතු කරනවා. රුපියල් මිලියන 340ක් වියදමින් රුගම්බෙ වැව ව්‍යාපෘතියේ පුනරුත්ථාපන කටයුතු කරමින් පවතිනවා. ඒ වාගේම පලුගන්නාව වැව රුපියල් මිලියන 260ක් වෙන් කර පුනරුත්ථාපනය කරනු ලබනවා. එය පළාත් සභාවේ කටයුත්තක් වශයෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම සම්මන්තුරේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම ගැන එතුමා කථා කළා. එම නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට මේ වන විට අපි සැලසුම් කර තිබුණත් එය ඉදිරියේදී කිරීමට ටිකක් අපහසුයි. මොකද, නිලධාරීන්ගේ පොඩි හිඟයක් තිබෙනවා. ඉදිරියේදී එය පිරවීමට අවශ්‍ය කටයුතු අපි සකස් කරනවා.

ගල්ඔය නවෝදය සඳහා මුළු ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 1,260ක් වෙනවා. 2008 වර්ෂයේ මිලියන 30ක් වශයෙන් එක එක වර්ෂයට වෙන් කර අපි ඒ මිලියන 1,260ක මුළු මුදලින් ගල්ඔය නවෝදය පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්ක තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනවා. මීට අමතරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව හැටියට වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආධාර යටතේ නැඟෙනහිර නවෝදයත් සමඟ මඩකලපුව, ත්‍රිකුණාමල හා අම්පාර දිස්ත්‍රික්කවල වාරිමාර්ග කටයුතුත් අපි කරගෙන යනවා, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වශයෙන්, මේ රටේ සෑම බිම් අඟලක් සඳහාම අවශ්‍ය වාරි පහසුකම් ලබා දීමට දස අවුරුදු සැලැස්ම තුළ අපි බලාපොරොත්තු වෙනවා. අපේ මන්ත්‍රීතුමා කිව්වා, වාරි කර්මාන්තය සඳහා අපි ප්‍රයෝජනයට ගන්නේ මේ රටේ ජලයෙන් සියයට 30ක් පමණ ප්‍රමාණයක්ය කියලා. අපි කර තිබෙන සැලසුම් අනුව මහින්ද චින්තන දස අවුරුදු සැලැස්ම තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ අපි බලාපොරොත්තු වෙනවා, සෑම බිම් අඟලක්ම වගා කරන්න පුළුවන් සෑම වාරි කර්මාන්තයක්ම සකස් කරන්න. ඒ අනුව ඔබතුමන්ලා ඉදිරිපත් කළ කාරණාවලට පිළිතුරු ලැබෙයි කියා අපි විශ්වාස කරනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ වැව හා ජනරංජන වැව ඇතුළු ප්‍රදේශය ගැන කථා කළා. අපි පසු ගිය දවස්වල ඒ ප්‍රදේශයේ කළ සංචාරවලදී අපි දැක්කා, හොඳ ප්‍රගතියක් තිබෙන බව. ඒ ප්‍රදේශයේ වාරි කර්මාන්තයේ යෙදී සිටින නිලධාරීන්ගේ අඩු පාඩු කියන්න එපා. ඒ ප්‍රදේශයේ තිබෙන පසුබිමත් සමඟ ඉතා කැපවීමෙන් ඔවුන් මේ කාර්යය කරනවාය කියා මම ඇස් දෙකට දැක්කා. ඒ නිසා මේ වන විට මාවිල් ආරු වැව තිබෙන ප්‍රදේශයේ පවා ප්‍රතිසංස්කරණ වැඩ අපි ආරම්භ කර තිබෙනවා. ඒ වැවේ අවශ්‍ය ප්‍රතිසංස්කරණ මේ වන විට නිම වෙමින් පවතිනවා. ඒක ඔබතුමා දන්නවා. ඒ නිසා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉතා හොඳ වාරි කර්මාන්තයක් තව අවුරුද්දක් දෙකක් ඇතුළත තමුන්නාන්සේලාට ලැබෙනවා. ජනරංජන වැවේ වැඩ කටයුතුත් තව නොබෝ දිනකින් අවසන් කරන්න පුළුවන් වෙයි කියා අප විශ්වාස කරනවා.

අපේ අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. පළමුවෙන්ම මගේ අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු අපි දෙදෙනාගේම ස්තුතිය වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමාට, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ අතිරේක සහකාර ලේකම්තුමිය ඇතුළු අපේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට, ඒ වාගේම දිස්ත්‍රික් මට්ටමේ හා අනිකුත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට, අපේ අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ට පිරිනමනවා. බිම් තලයේ අපේ වැයේ සිටින කම්කරුවාට පවා අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි මේ වාරි කර්මාන්තයේ වැඩ කටයුතු කරන විට අපට වර්ෂාව හවස් වෙනවා. නියමිත ඉලක්කවලට කටයුතු කිරීමට අපහසු වෙනවා. ස්වාභාවික දේශ ගුණික තත්ත්වයන් අනුව. ඒ නිසා යම් යම් ව්‍යාපෘතිවල ප්‍රගතිය සාමාන්‍ය වශයෙන් පසු බැස්සත් අපේ සියලුම නිලධාරි මහත්වරුන් ඉතා හොඳට වැඩ කටයුතු කිරීම පිළිබඳව ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමාගේත්, මගේත් ගෞරවණීය ස්තුතිය අපේ අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවේ හා අනිකුත් ආයතනවල සියලුම ඉහළම නිලධාරීන් සිට පහළම නිලධාරීන්ට පිරිනමමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**"152 වන ශීර්ෂයෙහි 01 වනවැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 6,53,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

**152 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 1,53,45,000

**"152 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,53,45,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

**152 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 11,83,70,000

**''152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 11,80,70,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

**152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 846,40,50,000

"152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.846,40,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

282 වන ශීර්ෂය.– වාරිමාර්ග දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු.29,36,00,000

"282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.29,36,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩ සටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 3,77,50,000

"282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,77,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 86,26,55,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 86,26,55,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 229,63,30,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.229,63,30,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 6,53,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,53,45,000

"தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,53,45,000

அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 11,83,70,000

"தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 11,83,70,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு
ரூபா 846,40,50,000

"தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 846,40,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 282 .- நீர்ப்பாசனத் திணைக்களம்**

நிகழ்ச்சித் திட்டம் 01 - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ்
செலவு ரூபா 29,36,00,000

"தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 29,36,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01 - செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு
ரூபா 3,77,50,000

"தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 3,77,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ்
செலவு ரூபா 86,26,55,000

"தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 86,26,55,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 2 - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு
ரூபா 229,63,30,000

"தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 229,63,30,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 65,300,000 for Head 152, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 152, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs .15,345,000

Question, "That the sum of Rs.15,345,000 for Head 152, Programme 01, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 152, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 118,370,000

Question, "That the sum of Rs. 118,370,000 for Head 152, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 152, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 8,464,050,000

Question, "That the sum of Rs. 8,464,050,000 for Head 152, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 152, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 282. - DEPARTMENT OF IRRIGATION

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 293,600,000

Question, "That the sum of Rs .293,600,000 for Head 282, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 37,750,000

Question, "That the sum of Rs. 37,750,000 for Head 282, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 282, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 862,655,000

Question,, "That the sum of Rs. 862,655,000 for Head 282, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure Rs. 2,296,330,000

Question, "That the sum of Rs. 2,296,330,000 for Head 282, Programme 02, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 282, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"153 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 10,96,38,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

153 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 1,16,50,000

"153 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,16,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

153 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 12,18,35,000

''153 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 12,18,35,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

153 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 152,54,70,000

"153 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.152,54,70,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

153 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 286 වන ශීර්ෂය.- ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු.15,75,25,000

''286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 15,75,25,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 30,47,50,000

''286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 30,47,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 287 වන ශීර්ෂය.- ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 7,07,35,000

''287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 7,07,35,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන, වියදම
රු. 33,50,000

''287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.33,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 288 වන ශීර්ෂය.- මැනුම් දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 13,94,10,000

''288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 13,94,10,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම රු.2,35,80,000

''288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.2,35,80,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 134,56,01,000

''288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 134,56,01,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 6,01,50,000

''288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 6,01,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 10,96,38,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,16,50,000

"தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,16,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 12,18,35,000

"தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 12,18,35,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 152,54,70,000

"தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 152,54,70,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 153, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 286 .- காணி ஆணையாளர் திணைக்களம்**

நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 15,75,25,000

"தலைப்பு 286, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 15,75,25,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 286, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 30,47,50,000

"தலைப்பு 286, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 30,47,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 286, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 287 .- காணி உரிமை நிர்ணயத் திணைக்களம்**

நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 7,05,35,000

"தலைப்பு 287, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 7,05,35,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 287, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 33,50,000

"தலைப்பு 287, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 33,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 287, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 288 .- நில அளவைத் திணைக்களம்**

நிகழ்ச்சித் திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 13,94,10,000

"தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 13,94,10,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,35,80,000

"தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 2,35,80,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 134,56,01,000

"தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 134,56,01,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 6,01,50,000

"தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 6,01,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 109,638,000 for Head 153, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 153, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs .11,650.000

Question, "That the sum of Rs.11,650,000 for Head 153, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 153, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure Rs. 121,835,000

Question, "That the sum of Rs. 121,835,000 for Head 153, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 153, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure Rs. 1,525,470,000

Question, "That the sum of Rs. 1,525,470,000 for Head 153, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 153, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 286. - DEPARTMENT OF LAND COMMISSIONER

Programme 02. - Development Activities - Recurrent Expenditure Rs. 157,525,000

Question, "That the sum of Rs. 157,525,000 for Head 286, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 286, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure Rs. 304,750,000

Question,, "That the sum of Rs. 304,750,000 for Head 286, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 286, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 287. - DEPARTMENT OF LAND SETTLEMENT

Programme 02. - Development Activities - Recurrent Expenditure Rs. 70,735,000

Question, "That the sum of Rs. 70,735,000 for Head 287, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 287, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure Rs. 3,350,000

Question,, "That the sum of Rs. 3,350,000 for Head 287, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 287, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 288. - DEPARTMENT OF SURVEYOR GENERAL

Programme 01. - Operational Activities - Recurrent Expenditure Rs. 139,410,000

Question, "That the sum of Rs. 139,410,000 for Head 288, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 288, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure Rs. 23,580,000

Question, "That the sum of Rs. 23,580,000 for Head 288, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 288, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure Rs. 1,345,601,000

Question,, "That the sum of Rs. 1,345,601,000 for Head 288, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 288, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure Rs. 60,150,000

Question, "That the sum of Rs. 60,150,000 for Head 288, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 288, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 25,77,05,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 2,09,50,000

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,09,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 2,742,96,25,000

''118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රුරු. 2,742,96,25,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 25,77,05,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01 - செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,09,50,000

"தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 2,09,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 2,742,96,25,000

"தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 2,742,96,25,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 257,705,000, for Head 118, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs .20,950,000

Question, "That the sum of Rs .20,950,000 for Head 118, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 118, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure Rs. 27,429,625,000

Question, "That the sum of Rs. 27,429,625,000 for Head 118, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 118, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 999,80,85,000
நிகழ்ச்சித் திட்டம் 02. - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 999,80,85,000
Programme 02 - Development Activities - Capital Expenditure Rs. 999,80,85,000

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - சுகாதார நலத்துறை, போசணை அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Healthcare and Nutrition and Leader of the House of Parliament)

ගරු සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත 2009 කාරක සභා අවස්ථාවේදී 118 වන වැය ශීර්ෂයේ 02 වන වැඩ සටහන සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ පිළිබඳව සභාවේ එකඟත්වය?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන - මූලධන වියදම් සඳහා ප්‍රතිපාදනය රු. 1,029,80,85,000 දක්වා වැඩිකිරීමෙන් සංශෝධනය කළ යුතු ය.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගේ මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ මෙම වැඩසටහනේ මූලධන වියදම් සඳහා ප්‍රතිපාදනය රු. 30,00,00,000කින් වැඩි කිරීමය.)

ව්‍යාපෘතිය 03 - කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි මූලධන වියදම් වැඩිකළ යුතු ය .

උප ව්‍යාපෘතිය 23 - එක් ගමක් එක් වගාවක් වැඩ සටහන
වැය විෂයය 2502 - වෙනත් ආයෝජන සඳහා රු. 30,00,00,000"

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 1,029,80,85,000 වැඩි කරන ලද මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபா 1,029,80,85,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 10,298,085,000 for Head 118, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 118, Programme 02, Capital Expenditure, as amended ordered to stand part of the Schedule.

## 281 වන ශීර්ෂය.- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන, වියදම රු. 16,18,10,000

**''281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 16,18,10,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

**281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

01 වන වැඩ සටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 3,85,00,000

**''281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.3,85,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

**281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 239,92,00,000

**''281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 239,92,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

**281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

02 වන වැඩ සටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම රු.24,55,00,000

**''281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.24,55,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

**281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

## 285 වන ශීර්ෂය.- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන, වියදම
රු. 19,40,80,000

''285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 19,40,80,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩ සටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 1,77,50,000

''285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,77,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 140,83,40,000

''285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 140,83,40,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 37,73,00,000

“285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 37,73,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 289 වන ශීර්ෂය.- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 23,10,57,000

“289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 23,10,57,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 33,68,00,000

“289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 33,68,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### தலைப்பு 281 .- கமநல அபிவிருத்தித் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 01 - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 16,18,10,000

“தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 16,18,10,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01 - செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 3,85,00,000

“தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 3,85,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 239,92,00,000

“தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 239,92,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 24,55,00,000

“தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 24,55,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

### தலைப்பு 285 .- கமத்தொழில் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 01 - செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 19,40,80,000

“தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 19,40,80,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 01 - செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,77,50,000

“தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,77,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 140,83,40,000

“தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 140,83,40,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 37,73,00,000

“தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 37,73,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

### தலைப்பு 289.- விவசாய ஏற்றுமதித் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 23,10,57,000

“தலைப்பு 289, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 23,10,57,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 289, நிகழ்ச்சித் திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித் திட்டம் 02 - அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு
ரூபா 33,68,00,000

"தலைப்பு 289, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 33,68,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 289, நிகழ்ச்சித் திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 281.– DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 161,810,000

Question, "That the sum of Rs. 161,810,000 for Head 281, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 38,500,000

Question, "That the sum of Rs. 38,500,000, for Head 281, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 2,399,200,000

Question, "That the sum of Rs. 2,399,200,000, for Head 281, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 245,500,000

Question, "That the sum of Rs. 245,500,000 for Head 281, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 285.– DEPARTMENT OF AGRICULTURE

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 194,080,000

Question, "That the sum of Rs. 194,080,000 for Head 285, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 17,750,000

Question, "That the sum of Rs. 17,750,000 for Head 285, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 1,408,340,000

Question, "That the sum of Rs. 1,408,340,000, for Head 285, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 377,300,000

Question, "That the sum of Rs. 377,300,000 for Head 285, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 289.– DEPARTMENT OF EXPORT AGRICULTURE

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 231,057,000

Question, "That the sum of Rs. 231,057,000 for Head 289, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 289, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 336,800,000

Question, "That the sum of Rs. 336,800,000 for Head 289, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 289, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
( மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"ගරු සභාපතිතුමනි, කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය." යිද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ. භා. 4.57ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***
***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2008 නොවැම්බර් මස 27 වන බ්‍රහස්පතින්දා.***

*பி. ப. 4. 57க்கு குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2008 நவம்பர் 27, வியாழக்கிழமை.*

*At 4.57 p.m. the Chairman left the Chair to report Progress.*
*Committee report Progress; to sit again on Thursday, 27th November, 2008.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question Proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම ගරු දයාසිරි ජයසේකර මහතා.

## නිල ඇඳුම් රෙදි මිල දී ගැනීමේ දී සිදුව ඇති මූල්‍ය අක්‍රමිකතා
### சீருடைத் துணிகள் கொள்வனவிலான நிதிசார் முறைகேடுகள்
### FINANCIAL IRREGULARITIES IN PURECHASING UNIFORM MATERIALS

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

2008 වර්ෂයේ ත්‍රිවිධ හමුදාවේ, පොලිසිය හා සිවිල් ආරක්ෂක ඒකකයේ රෙදිපිළි මිල දී ගැනීම්වලදී සහ 2009 වර්ෂයේ පාසල් නිල ඇඳුම් රෙදි ඇණවුම් ලබා දීමේදී, - (බාධා කිරීමක්)

මොකක්ද මේ වෙලා තිබෙන්නේ? (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ යෝජනාව ඉදිරිපත් කරන්න ඉඩ දෙන්නේ නැහැ නේ. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර සභාව නිශ්ශබ්ද කරවන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekera)
"2008 වර්ෂයේ ත්‍රිවිධ හමුදාවේ, පොලිසිය හා සිවිල් ආරක්ෂක ඒකකයේ රෙදිපිළි මිල දී ගැනීම්වලදී සහ 2009 වර්ෂයේ පාසල් නිල ඇඳුම් රෙදි ඇණවුම් ලබා දීමේදී විනිවිදභාවය සහ සුපරීක්ෂාකාරී බවකින් තොරව කටයුතු කිරීම නිසාවෙන් විශාල මූල්‍ය අක්‍රමිකතාවකට මඟ පාදා ඇත.

2005 වර්ෂයේදී මුදල්අමාත්‍යාංශ චක්‍රලේඛ අංක PF/413 යටතේ රාජ්‍ය ආයතනවල නිල ඇඳුම් හා රෙදි පිළි අවශ්‍යතාව දේශීය වශයෙන් සපයා දීම සොයා බැලීම සඳහා පාවෙන ටෙන්ඩර් ක්‍රමය යටතේ රෙදි පිළි පංගු මණ්ඩලයට බලය ලබා දුනි. 2008 වර්ෂයේදී ආරක්ෂක අංශයේ රෙදි පිළි මිල දී ගැනීම්වලදී විශාල මූල්‍ය අක්‍රමිකතාවන් ගණනාවක් හා තත්ත්වයෙන් පහත් රෙදි පිළි ලබා දීමක් ද සිදුව ඇත. එමෙන්ම 2009 වර්ෂයේ පාසල් නිල ඇඳුම් ඇණවුම් කිරීමේ දී ද මෙවැනි අක්‍රමිකතා සිදුව ඇත. දේශීය කර්මාන්ත සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය යැයි පැවසූ මහින්ද චින්තන වැඩ පිළිවෙළ හරහා හොර රහසේ විදේශීය රටවලින් රෙදි පිළි ආනයනය කර වැඩි මිල ගණන්වලට රාජ්‍ය ආයතනවලට සැපයීම, විනිවිදභාවය, ටෙන්ඩර් පටිපාටිය වැනි අත්‍යවශ්‍ය ක්‍රමවේදයන් තබා මිල තීරණය කිරීම මිල දී ගන්නා රාජ්‍ය ආයතනයට ලබා දීම පවා නොසලකා හැර තම හිතවත් කර්මාන්ත ආයතනවලට කොන්ත්‍රාත් ලබා දීම හරහා මෙරට රාජ්‍ය දෙපාර්තමේන්තු ගණනාවක මුදල් කොල්ල කෑම් සිදු කර ඇත. මෙලෙස සිදු කර තිබෙන මූල්‍ය වංචාවන් පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේදී විවාදයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.''

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නිරූපමා රාජපක්ෂ මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මේ අවස්ථාවේදී ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය මූලාසනය ගත යුතුය''යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, பிரதித் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) நிரூபமா ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair,* and THE HON. (MRS.) NIRUPAMA RAJAPAKSA *tool the Chair*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සම්බන්ධයෙන් මා වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට කැමතියි.

අද දින සභාව කල් තබන අවස්ථාවේදී මේ යෝජනාව මා සාකච්ඡාවට ඉදිරිපත් කළේ ඇයි කියන කාරණය පැහැදිලි කරන්නට ඕනෑ. අපේ රටේ තිබුණු quota ක්‍රමය නැත්නම් බහු කෙඳි සම්බන්ධව තිබුණු ගිවිසුම 2004.12.31 වන දා අහෝසි වුණා. ඒක අහෝසි වීමේ ප්‍රතිඵලයක් විධියට වර්ෂ 2004න් පස්සේ free quota era නැත්නම් quota වලින් තොර යුගයක් නිර්මාණය වෙලා තිබුණා. එතැනින් පස්සේ ලංකාවේ රෙදි පිළි කර්මාන්තයේ ලොකු ප්‍රශ්නයක් ඇති වී තිබුණා. අපේ රටේ රෙදි පිළි නිමි ඇඳුම් නිෂ්පාදනය කරන කර්මාන්තශාලා අටසියයක් විතර හදලා තිබුණා. මේ quota ක්‍රමය කඩා වැටීමත් එක්ක ලංකාවේ නිමි ඇඳුම් කර්මාන්තය දැවැන්ත අර්බුදයකට ලක් වේය කියන අභියෝගයක් ඇති වුණා. විශේෂයෙන් මේ සම්බන්ධව ඒ කාලයේ දී සාකච්ඡා කළ මූලික කාරණයක් තිබුණා. ලොකු කර්මාන්ත ටික දිය වෙලා තිබෙද්දී කුඩා කර්මාන්ත ටික කඩා වැටීමේ දැවැන්ත අර්බුදයක් මතු වෙමින් ආ වාතාවරණයක් තුළ ඒ කාලයේ වැඩ පිළිවෙළක් සකස් කළා. ලංකාවට ආනයනය කරනු ලබන විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවට, පොලිසියට, ඒ වාගේම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට, හෙද හෙදියන්ට, අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය කරන රෙදි පිළි ලංකාවේ නිපද වීමේ වැඩ පිළිවෙළක් හරහා ඉදිරි පෙළ කර්මාන්තත් පසු පෙළ කර්මාන්තත් වැඩිදියුණු කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කළා. මෙහිදී මූලික වශයෙන් අරමුණු කර ගත්තේ ලංකාවට යාන් ගෙන්වා, ඒවා තවදුරටත් වර්ධනය කර, රෙදි පිළි නිෂ්පාදනය කරලා ඒ රෙදි පිළි අවශ්‍ය විධියට නිමි ඇඳුම් බවට පත් කරමින් මේ කර්මාන්තය ඉදිරියට ගෙන යන්නයි. එසේ වූ විට ඉදිරි පෙළ කර්මාන්ත විධියට ලංකාවේ සේවා කර්මාන්තය වර්ධනය වෙනව. අනෙක් පැත්තෙන් පසු පෙළ කර්මාන්තය විදියට ෂර්ට් එකට අල්ලන collar එක, button එක, zip එක පවා මේ සියල්ල ලංකාව තුළ නිපදවෙනවා ලංකාවේ කර්මාන්ත කඩා වැටීමේ අවදානම නැති කිරීමේ වැඩ පිළිවෙළක් විධියටයි මේ වැඩ

පිළිවෙළ ගෙනාවේ. අත්තටම පී. බී. ජයසුන්දර මහත්මයා කළ හොඳ වැඩක් ගැනත් කියන්න ඕනෑ නිසා මෙතැන දී මා මේ කාරණය කියන්න කැමතියි. 2005හේ පෙබරවාරි 18 වන දා - අංක PF/413 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛනය - මේ සම්බන්ධව පළමු වන චක්‍රලේඛය - එතුමා සියලුම ලේකම්වරුන්ට යැව්වා. එතුමා සියලුම ලේකම්වරුන්ට මේ චක්‍රලේඛනය යවමින් මෙවැනි කථාවක් කියනවා.

"The Government has decided to procure all government taxtile requirements of armed forces, police, health service, prisons and other government Agencies including materials for school uniforms form the local manufacturers."

මේ අයට අවශ්‍ය කරන්නා වූ මේ රෙදි පිළි ලංකාවේම නිෂ්පාදනයින්ගෙන් ලබා ගැනීමේ වැඩ පිළිවෙළකුයි මෙයින් අදහස් වෙලා තිබුණේ. අවුරුද්දකට අවශ්‍ය වන රෙදි පිළි ප්‍රමාණය - annual textile requirement එක - මෙම ආයතනවලින් රෙදි පංගු මණ්ඩලයට - Textile Quota Board එකට - ලබා දුන්නාම ඒවා පිළිබඳව සමීක්ෂණයක් කර ඒ අවශ්‍ය කාරණා ටික කරන්න රෙදි පිළි පංගු මණ්ඩලයට බලය දීමක් මෙයින් කෙරෙනවා. එය ඒකේ බොහොම පැහැදිලිව කියනවා. එයින් පස්සේ 2005 ජූනි 20 දිනැති අංක PF/416 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛනයේ - Public Finance Circular No. PF/416 - බොහොම පැහැදිලිව කියන්නේ මොකක්ද? ඒ අනුව මේ රෙදි පිළි පංගු මණ්ඩලයට රජයේ ආයතනවල රෙදි පිළි අවශ්‍යතාවන් දැනුම් දිය යුතුයි. ඒවාගේම Domestic Textile Allocation Committee - DTAC - කියන එකට බලය දෙනවා. - රෙදි පිළි අභ්‍යාස හා සේවා ආයතනය විධියට මේ සම්බන්ධව අවශ්‍ය කාරණා ටික කරන්න. මේ සම්බන්ධව තවදුරටත් ඉදිරියට ගිහින් මේ රෙදි පිළි පංගු මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සඳහා ඒ කාලයේ විද්‍යානපතිරණ මහතා අනුර බණ්ඩාරනායක අමාත්‍යතුමා හරහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඒ කියන්නේ ඒකේ තිබෙන වැඩ පිළිවෙළ තවදුරටත් විධිමත් කිරීම සඳහා 2005 මාර්තු 07 වන දා Cabinet Memorandum එක දමනවා. මෙම කැබිනට් පත්‍රිකාවේ කාරණා තුනක් බොහොම පැහැදිලිව කියනවා. පළමු වන කාරණය restructure කරන එක නැත්නම් ප්‍රතිව්‍යුහගත කිරීම විධියට; "To act as a focal point …" මේ සියලු කාරණා එකට ඒක රාශි කරන ස්ථානයක් විධියට මේ ආයතනය හදන්නේ, ඒ වාගේම දෙවන කාරණය වශයෙන් "Administration of the simplified VTA application system proposed in the 2005 Budget." 2005 වර්ෂයේ අය වැය ලේඛනය අනුව සරල කරන ලද බදු අධීක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නිරන්තරයෙන් වාර්තා කිරීමේ වැඩ පිළිවෙළත්, තුන්වන කාරණය වශයෙන් "To act as facilitator for the procurement of textile requirements of the Ministry of Education, armed forces. Police health services prison and other government institutions from local textile manufacturers." සඳහන් වෙනවා. මේ සියල්ල කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට වහාම මේ Act එක නැත්නම් පනත සංශෝධනය කරන්නය කියා මේ Cabinet Memorandum එකේ බොහොම පැහැදිලිව කියනවා. ඒක මේ විධියට සඳහන් වෙනවා;

Amend the Textile Quota Board Act No. 33 of 1996 to incorporate the new functions and responsibilities assigned to the TQB"

මේ දී තිබෙන බලතල ටික අලුත් පනත් කෙටුම්පතක් විධියට වහාම ඉදිරිපත් කරන්නට කියා කියනවා. එතකොට 2006.05.31 වෙනි දා මේක නීති කෙටුම්පත් සම්පාදකට යවනවා, මේ ිඅවශ්‍ය කාරණා ටික කරන්නය කියලා. 2006 ඉඳලා මේ වන විට කොට අවුරුදු දෙකකුත් අවසාන වෙේගෙනයි යන්නේ. දැනට මොකක්ද මේකෙන් සිදු වෙේගෙන යන්නේ? දැවැන්ත ප්‍රශ්නයක් මේකේ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියෙනි, ඔබතුමියට මා පැහැදිලි කර දෙන්නට කැමැතියි, විශේෂයෙන්ම අපි මේ සඳහන් කරන DTAC කියන කමිටුවට කර්මාන්ත අමාත්‍යාංශයෙන් නියෝජිතයෙක් රෙදි පිළි කර්මාන්ත පුහුණු කිරීමේ ආයතනයෙන් නියෝජිතයෙක්, ශ්‍රී ලංකා රේගුවෙන් නියෝජිතයෙක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නියෝජිතයෙක්, ආරක්ෂක අමාත්‍යාංශයෙන් නියෝජිතයෙක්, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයෙන් නියෝජිතයෙක් හා දේශීය රෙදි පිළි නිෂ්පාදකයන්ගේ නියෝජිතයෙක් ඇතුළත් විය යුතු බව. බොහොම පැහැදිලිව මේ වැඩ පිළිවෙළ තුළ එය ඉදිරිපත් කර තිබෙනවා. දැන් මේ DTAC කොමිටි එකට අවශ්‍ය කරන කාරණා ටික, අර රෙදි පිළි පංගු මණ්ඩලයට දෙන්නය කියන බලතල සඳහා අවශ්‍ය කරන පනත් කෙටුම්පත හදන්නේ නැතිව සිදු වෙනවා. රෙදි පිළි පංගු මණ්ඩලයෙන් අර focal point එකේ වැඩ, ඒ කියන්නේ සියලු කාරණා එකතු කිරීමේ වැඩෙත්, එතැනින් පසුව දෙ වැනි විධියට මේ බදු සරල කිරීමේ වැඩ පිළිවෙළ යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ කරන වැඩ කටයුතු ටික කරන්නත් අවශ්‍ය බලය පනත් කෙටුම්පත සම්පාදනය නොකරම ඔවුන් ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒකට බලය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තුන් වන කාරණය - ඉතාම වැදගත් කාරණය මොකක්ද? මේ රෙදි පිළි පංගු මණ්ඩලය හරහා යන්නේ නැතිව මේ කොමිටිය හරහා ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලය තමයි, අද වන කොට දැවැන්ත අර්බුදයකට ලක් වෙලා තිබීම. ඒ අනුව දැන් මෙතැන දී විශේෂයෙන් අවශ්‍ය කරන කාරණයක් තිබෙනවා. මා අර කිව්වා වාගේ මේ ලංකාවට අවශ්‍ය වන්නා වූ, විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවට, පොලීසියට අවශ්‍ය රෙදි පිළි ටික, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට, අධ්‍යාපන අමාත්‍යාංශයට, බන්ධනාගාරයට අවශ්‍ය වන රෙදි පිළි ටික මෙහිම මසා නිම කිරීම තුළින් දැවැන්ත කර්මාන්ත නිෂ්පාදනයක් ආරම්භ කරන්නට අවශ්‍ය හැකියාව තිබෙනවා.

මහින්ද චින්තනයේ බොහොම පැහැදිලිව කියනවා, ලිබරල් ආර්ථිකය වෙනුවට දේශීය ආර්ථිකයක් හදන්න අවශ්‍ය කටයුතු ටික ලැස්ති කරනවාය කියලා 2005 ඉඳලා මේ වැඩ පිළිවෙළ තවමත් යනවා. මේකෙදී අතිගරු ජනාධිපතිතුමාව රවටනවාද, වෙන කවුරුවත් රයටනවාද කියලා කියන්න මා දන්නේ නැහැ. සිදු වෙමින් තිබෙනතේ, මේ ක්‍රියා දාමය තවමත් එලෙසම පැවතීමයි. දේශීය ආර්ථිකය වෙනුවට, "සිරිලක සේ සිරි සැප දේ" කියන ප්‍රතිපත්තිය වෙනුවට පිට රටින් බඩු ටික ගෙනැල්ලා, මෙහි සිටින ජාවාරම්කරුවන් කිහිප දෙනෙකු මේ නිලධාරීන් කිහිප දෙනකු සමග එකතු වෙලා ගසා ගෙන කන වැඩ පිළිවෙළකට තමයි මේක අද තල්ලුවෙලා තිබෙන්නේ. මේක තමයි මේකේ තිබෙන ප්‍රධානම කාර්ය භාරය.

මා කියන්නට කැමැතියි, - විශේෂයෙන්ම පළමු වන කාරණය විධියට - මෙමඟින් සෘජු රැකියා ප්‍රමාණයක් ඇති වන බව. විදේශ විනිමය ඉතිරි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මා ඔබතුමියට කියන්නට කැමැතියි, 2009 වසරේ පාසල් නිල ඇඳුම් සහ රෙදි සඳහා - වැට් නොමැතිව-රුපියල් මිලියන 1,010ක් සැපයුම් කරුවන්ට ගෙවන්නට අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට සිදු වෙලා තිබෙන බව. ඒ කියන්නේ රුපියල් කෝටි 110කට වැඩි ප්‍රමාණයක් ගෙවන්නට සිදු වෙලා තිබෙනවා. එතකොට බලන්න, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සිවිල් ආරක්ෂකයන් සඳහා මිල දී ගැනීමට සිදු වෙලා තිබෙන රෙදිවල වටිනාකම රුපියල් මිලියන 1,538යි, නැත්නම් කෝටි 153.8ක් විතර වෙනවා. එතකොට මේ දෙකේම එකතුව විතරක් බලපුවාම රුපියල් මිලියන 2,548ත් වෙනවා; රුපියල් කෝටි 254.8ක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රමාණය මා ඔබතුමියට කියන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, නැත්නම් සෞඛ්‍ය හෙද හෙදියන් සඳහා මිල දී ගැනීමට සිදු වෙලා තිබෙන රෙදිවල වටිනාකම නැතිවයි. එතකොට බලන්න, අපි මේ රටේ ජාතික ආදායමෙන් කොච්චර ප්‍රමාණයක් මේ සඳහා වියදම් කරනවාද කියලා. මේ රටේ දේශීය

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ආර්ථිකය හදන්නට උත්සාහ කරන ආණ්ඩුවක් නම් කළ යුතු පළමු වැනි කාරණය තමයි, වහාම මේ බිල් පත නිවැරදි කරලා, අවශ්‍ය කාරණා ටික ක්‍රියාත්මක කිරීම. දේශීය ආර්ථිකය ශක්තිමත් කරන්නට පුළුවන්, කර්මාන්තශාලා අලුතෙන් හදන්නට පුළුවන්. අපේ කුමාර වෙල්ගම මැතිතුමාගේ "නව නිපැයුම්" නැත්නම් "ගමට කර්මාන්ත" ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත 300ක් හදා ගෙන යනවා. මේවා තවත් දියුණු කරන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවා. මේ බව ඇමතිවරු නොදැන සිටිනවාද නැත්නම් මේ නිලධාරින්ට හසු වෙලා සිටිනවාද, එහෙමත් නැත්නම් නිලධාරින් විසින් මෙය පාලනය කරනවාද කියන එක මා දන්නේ නැහැ. ඉතින් එහි අවසාන ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ විශේෂයෙන් දැවැන්ත අර්බුදයකට ලක් වීමයි.

සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් කලට වෙලාවට මේ නිල ඇඳුම් ටික දී ගන්න බැරි වුණොත් කාටද බණින්නේ? බණින්නේ අධ්‍යාපන අමාත්‍යාංශයටයි; ඇමතිවරයාටයි. හැබැයි මේවා ගෙන්වන පුද්ගලයෝ කොහේ හෝ පිට රටක ඉඳලා මේ බඩු ටික අරගෙන එනවා. නමුත් වෙලාවට දෙන්නේ නැහැ. මම කථා කර ගෙන යන විට තව විස්තර ඉදිරිපත් කරන්නම්. හමුදාවට ගෙන්වපු රෙදි මාසයක් දෙකක් අඳින විට ඉරෙනවා. ඒ තරමම බාල වර්ගයේ රෙදි තමයි ගෙන්වලා දීලා තිබෙන්නේ. ඒවායේ පාට යනවා. ඉතින් මේක තමයි ඇත්ත කථාව. අපි අහන්නේ මේකයි. කවුද මේකෙන් හම්බ කරන්නේ? අපේ දේශීය නිෂ්පාදනවලට මොකක්ද සිද්ධ වන්නේ? අපි අලුත් නිෂ්පාදන කරන්නේ නැද්ද? මේවාට යට වෙලා අපි තවදුරටත් මේ වැඩ කටයුතු ටික කර ගෙන යයනවාද, නැද්ද කියන එක තමයි මට මෙතැනදී අහන්න තිබෙන මූලික කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහිදී රෙදි පිළි නිෂ්පාදකයා සහ රෙදි පිළි අවශ්‍යතාව තිබෙන පුද්ගලයන් අතර යම් කිසි සාකච්ඡාවක් කරලා, ප්‍රසිද්ධ දැන්වීමක් දමලා, ටෙන්ඩර් කැඳවලා, ඒ ටෙන්ඩර් අනුව යම් කිසි මුදලකට මේක හදලා, මේක සාධාරණ විධියට බෙදී යන ක්‍රමයක් හදා දෙන්න ඕනෑ. නමුත් පසු ගිය කාල වකවානුවේ මේ DTAC කියන කම්ටුවෙන් දුන්නේ StarTextile කියන ආයතනයටත්, Pathma Weaving කියන ආයතනයටත්, Texpro Industries කියන ආයතනයටත් විතරයි. බලන්න 2009 වසරේ පාසල් නිල ඇඳුම් නිෂ්පාදනය කිරීම සඳහා ලබා දී ඇති ආයතන. සුපර්ටැබ් ටෙක්ස් ආයතනය, ඒකට 1,63,80,000ක්. වැන්ගාඩ් ඉන්ඩස්ට්‍රීස් එකට 1,62,39,792ක්. පත්මා ඩිස්ට්‍රිබියුටර්ස් එකට 2,66,50,000ක්. ප්‍රභා ටෙක්ස් ඉන්ඩස්ට්‍රීස් එකට 9,03,50,000ක්. ඕෂන් ටෙක්ස් එකට 6,61,91,792ක්. මේ වාගේ දිගින් දිගටම -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, යෝජනාව ස්ථිර කරන්නත් ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekera)
හොඳයි මා මේ කාරණා කිව්වේ මේ නිසායි. අපේ රටේ කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත් එක් කෙනෙකුට, දෙදෙනකුට සීමා වුණු මේ ක්‍රමය වහාම නතර කළ යුතුයි. ඒ නිසා අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? දේශීයව යාරය රුපියල් 64ට මිල දී ගන්න පුළුවන් එක අද රුපියල් 104ට ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමන්ලාට ඒකට සල්ලි ගෙවන්න වෙලා තිබෙනවා. මෙහෙන් අපට විදේශ විනිමය නැතිව ඉන්නවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව වහාම වැඩ පිළිවෙළක් සකස් කරලා මේ අසාධාරණය අහෝසි කරලා රටේ කර්මාන්ත නඟා සිටු වීමේ වැඩ පිළිවෙළකට සහයෝගය දෙන්න අවශ්‍ය කටයුතු ටික කරන්නය කියා ඉල්ලා සිටිමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නවරත්න බණ්ඩා මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කරන්න.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y. M. Navaratne Banda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන ලද අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින් ඒ පිළිබඳව කරුණු දෙක තුනක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම මේ යෝජනාවේ අන්තර්ගතය හොඳින් පරීක්ෂා කර බැලුවාම අපට පෙනෙන කාරණා දෙක තුනක් තිබෙනවා. අපට පෙනෙන ප්‍රධානතම කාරණාවක් තමයි ත්‍රිවිධ හමුදාවට, පොලීසියට, සිවිල් ආරක්ෂක බලකායට, ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයට, සෞඛ්‍ය ක්ෂේත්‍රයට, බන්ධනාගාර ක්ෂේත්‍රයට — මේ සියලු ක්ෂේත්‍ර උදෙසා - අවශ්‍ය නිල ඇඳුම් ලබා දීමේ දී අනුගමනය කරල ලද ක්‍රියා පටිපාටිය විශේෂයෙන්ම ඒවා ආනයනය කිරීමේ දී අනුගමනය කළ යුතු මූල්‍ය ක්‍රියා පටිපාටිය නිසියාකාරයෙන් සිද්ධ වෙලා නැති බව. ඒ නිසාම විශාල මූල්‍ය අක්‍රමිකතාවක් සිද්ධ වෙලා තිබෙනවාය කියන කාරණාව අපි දකිනවා. ඒ නිසා අපි මේ කාරණය ඒ විෂයය භාර අමාත්‍යවරුන්ගේ අවධානයට ලක් කරවනවා. මූල්‍ය අක්‍රමිකතාවක් සිද්ධ වෙලා තිබෙනවාය කියන කාරණාව මේ යෝජනාවේ අන්තර්ගතය තුළින් පැහැදිලි වනවා.

ඊළඟ කාරණය මේකයි. මේ පේශ කර්මාන්තය කියා කියන්නේ අපේ රටේ දීර්ඝ ඉතිහාසයක සිට පැවත ගෙන එන කර්මාන්තයක්. මේක අපේ රටේ වාගේම මුළු ලෝකයේමත් මුලින්ම ආරම්භ වුණු කර්මාන්තයක්. පේශ කර්මාන්තය සම්බන්ධයෙන් අපට දිගු කාලීන ඉතිහාසයක් තිබෙනවා. විශේෂයෙන්ම අත් යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තය, බලවේග පේශ කර්මාන්තය විශාල වර්ධනයක් අත් පත් කර ගන්න ඉතිහාසයක් අපේ රටේ තිබුණා. ඒ නිසා එහෙම හැකියාවක් තිබෙන, ඒ වාගේම මේ ආණ්ඩුවේ දැක්ම තුළ ජාතික ආර්ථිකයක් ගොඩ නැඟිය යුතුය කියන වහා සෝෂාව, හඬ නඟන අතරතුර තමයි මේ දේශීය කර්මාන්තවලට අවශ්‍ය කරන මැදිහත් වීම නොකර, ඒවා දියුණු කරන්නේ නැතිව විදේශවල සහාය පතමින්. අපේ රටේ කර්මාන්ත විනාශ වන්න ඇරලා, විදේශවලින් ආනයනය කරමින් මේ කරන කටයුත්ත සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ජාතික නිෂ්පාදිතය ශක්තිමක් කිරීම සඳහා දායක කර ගත හැකි පේශ කර්මාන්තය ඒ සඳහා දායක කර ගන්නේ නැහැ කියන කාරණාව අප දෙවනුව දකිනවා. ඒ වාගේම මේ මොහොත ලෝක පරිමාණයෙනුත්. අපේ රට තුළත් දැඩි මූල්‍ය අර්බුදයක් නිර්මාණය වී තිබෙන මොහොතක්. ඒ නිසාම රටේ ආර්ථිකය මුහුන දී තිබෙන ඒ ගැටලුවට හොඳින් මුහුන දීම සඳහා, ඒ අභියෝගය ජය ගැනීම සඳහා ශක්තිමත් විදේශ විනිමය සංචිතයක් අප සතුව තිබෙන්නට ඕනෑ, රට සතුව තිබෙන්නට ඕනෑ. රටේ වුවමනාවට තබා ගත යුතු විදේශ විනිමය තමයි විශාල වශයෙන් මේ සඳහා වැය කරන්නේ. ඒ නිසා මෙයත් විශාල මූල්‍ය ශක්තියක් රටට ඉතිරි කර ගන්නට පුළුවන් අවස්ථාවක්. එය මඟ හැර තිබෙනවා. ඒ කරුණ අප අදාළ අමාත්‍යවරුන්ගේ අවධානයට යොමු කරනවනවා. විශේෂයෙන්ම පේශ කර්මාන්තය භාරව මීට කලින් හිටපු ජයතිස්ස රණවීර ඇමතිතුමා තමන්ගේ පාලන කාලය තුළ දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ පේශ කර්මාන්තය නඟා සිටු වන්න යම් උත්සාහයක් ගත්තා. නමුත් ඒ උත්සාහය මේ වන විට අසාර්ථක වෙලා තිබෙනවා. ඒ උත්සාහය හරියට ක්‍රියාවට නඟන්න බැරි වුණා. එතුමාගේ උත්සාහයක් තිබුණා ආනයනය කරන රෙදි පිළි සීමා කරලා දේශීය අත් යන්ත්‍ර පේශ කර්මාන්තය, බලවේග පේශ කර්මාන්තය නඟා සිටු වන්න. නමුත් ඒ උත්සාහය අද වන විට අසාර්ථක වෙලා තිබෙනවාය කියා අප විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඉතිහාසය අනුව අප අසා තිබෙනවා විජය රජතුමා අපේ රටට එන කොට, තම්බපන්නියට - තම්මැන්නාවට - ගොඩ බහින කොට අපේ රටේ හිටපු කුවේණිය කපු කටිමින් සිටියාය කියා. ඒ ඉතිහාසය තුළින් කියන්නේ, අපේ රටේ පේශ කර්මාන්තය දීර්ඝ කාලීන ඉතිහාසයක් ඇති

කර්මාන්තයක් බවයි. කුවේණියට අයිතිව තිබුණු කර්මාන්තය තමයි අද මහින්ද රත්නතිලක ඇමතිතුමාට භාර දීලා තිබෙන්නේ. ඉතින් අප විශ්වාස කරනවා, ඒ ඉතිහාස අත් දැකීම් හොඳින් උකහා ගෙන, අධ්‍යයනය කරලා ඇමතිතුමා කටයුතු කරාවිය කියා. අපේ රටේ මේ ක්ෂේත්‍රයේ නියැලී සිටින විශාල පිරිසක් ඉන්නවා. අවුරුදු පනහ, හැට, හැත්තෑව වයසට ගිය බොහෝ උදවිය දේශීය පේශ කර්මාන්තය නඟා සිටුවීම සඳහා කිසිදු හච්චරණක් නැතිව වුණත් - ඉතාම සොච්චම් මුදලකුයි ඔවුනට හම්බ වෙන්නේ - අදටත් විශාල දායකත්වයක් ලබා දෙනවා. ඒ නිසා මුල්‍ය අක්‍රමිකතාව, විදේශ විනිමය රැක ගැනීම ආදී කරුණු කාරණා සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුයි. ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට නම් පේශ කර්මාන්තය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය කියන කාරණය අදාළ අමාත්‍යවරුන්ගේ අවධානයට යොමු කරවමින් මේ යෝජනාව නැවතත් ස්ථිර කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)
(The Hon. A. D. Susil Premajayantha - Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රෙදි අධ්‍යාපන අමාත්‍යාංශයටත් ලබා දී ඇති බැවින් මා ඉතාම කෙටියෙන් මේ ගැන යමක් සඳහන් කළ යුතුයි. 2008 ජූලි මාසයේ 30 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, 2009 වසරට අවශ්‍ය කරනු ලබන රෙදි මීටර් 10.45ක ප්‍රමාණයක් දේශීය නිෂ්පාදකයන්ගේ දේශීය රෙදි විවීමේ ක්‍රියවලිය හරහා පේශ කර්ම සංවර්ධන අමාත්‍යාංශය මඟින් මිල දී ගැනීම සඳහායි අනුමැතිය ලබා දී තිබෙන්නේ. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය පේශ කර්ම සංවර්ධන අමාත්‍යාංශයට ලියලා, ඒ සම්පූර්ණ රෙදි මීටර් මිලියන 10.45ක ප්‍රමාණය දේශීය වශයෙන් රෙදි විවීමේ කටයුතු කරන අයගෙන් සහ නිෂ්පාදකයන්ගෙන් පේශ කර්ම සංවර්ධන අමාත්‍යාංශය හරහා අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු තමයි කර තිබෙන්නේ. මේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩබ්ලිව්. ඩී. ජයසිංහ කියන මහත්මයා අවස්ථා දෙකකදී මේ සම්බන්ධයෙන් අපට ලිපි දෙකක් එවා තිබෙනවා. පළමු වැනි එක, "Procurement of school uniform material from local manufacturers - 2009, weeven process: local category" කියන ලියුම DTAC– Domestic Textile Allocation Committee කියන එකෙන් තමයි, ඒ පංගු මණ්ඩලය මඟින් තමයි වෙන් කර දී තිබෙන්නේ. ඒ වාගේම "Procurement of school uniform material from local manufacturers - 2009, import and process." කියලා 2008.06.27 වන දින පේෂකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩබ්ලිව්. ඩී. ජයසිංහ මහතා අත්සන් කරලා ඊ ළඟ ලියුම එවා තිබෙනවා. ඒ අනුව 2009 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය රෙදි මීටර් මිලියන 10.45 ක ප්‍රමාණය ඒ පංගු මණ්ඩල මඟින් නිර්දේශ කරලා, ඒවා ලබා ගැනීමේ කාර්යය පවරා තිබුණේ පේෂකර්ම සංවර්ධන අමාත්‍යාංශයටයි. එහි නිර්දේශ අනුව තමයි, අධ්‍යාපන අමාත්‍යාංශය ඒ මුදල් ගෙවීම් සහ අනික් කටයුතු කරගෙන ගියේ.

දැනට අපට සපයා තිබෙන රෙදි ප්‍රමාණ අනුව හම්බන්තොට, මොනරාගල, පොළොන්නරුව, අම්පාර සහ යාපනය යන ඉතාම දුෂ්කර දිස්ත්‍රික්ක 5 ක බෙදා හැරීම් කටයුතු මේ වන විට අවසන් කර තිබෙනවා. සීමාසහිත ලංකා සළුසල මඟින් තමයි මේ බෙදා හැරීමේ කටයුතු සම්පූර්ණයෙන් සිදු කරන්නේ. රාජ්‍ය ආයතන හැටියට ඒ ආයතනවලට තමයි භාර දීලා තිබෙන්නේ. මා මේ කරුණු ටික ඉදිරිපත් කළේ අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ නිල ඇඳුම් සැපයීමත් මෙකට සම්බන්ධ වී තිබුණු නිසා අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවරය සහ අප ගත් ක්‍රියාමාර්ගය පැහැදිලි කිරීම සඳහායි. [බාධා කිරීමක්] අපි දුන්නු ඇණවුම් අනුව බෙදා හැරීම කරන්නේ සීමාසහිත ලංකා සළුසල ආයතනය මඟිනුයි. මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයට යවා තිබෙනවා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

වලස්මුල්ල කලාප කාර්යාලයට යවන රෙදි පිළි ටික ගබඩා කර ගන්න, බෙදා හරින්න -

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ඔව්, ගරු මන්ත්‍රීතුමනි, මේ කර්තව්‍ය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කෙරෙන්නේ ප්‍රාදේශීය වශයෙන් පළාත් මට්ටමේ තිබෙන කොට්ඨාස අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේයි. හැම අවුරුද්දකම කෙරෙන්නේ එහෙමයි. කොට්ඨාස අධ්‍යක්ෂ මඟින් ඒ කර්තව්‍ය සංවිධානය කර ගන්න ඕනෑ. ඒ සඳහා අපි මුදලකුත් ගෙවනවා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

අතිකාල කරන අයට තමයි -

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ඔව්. ඒක හරි. කොහොමත් මුදල ගෙවනවා නේ. වග කීම දරන අය ඒවා පාසල්වලට බෙදන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මහින්ද රත්නතිලක ඇමතිතුමා.

**ගරු මහින්ද රත්නතිලක මහතා (පේෂකර්ම සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ரத்னதிலக - தெசவுக் கைத்தெகுழில் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Mahinda Ratnatilaka - Minister Textile Industry Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව අපේ අධ්‍යාපන ඇමති ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා - පාසල් නිල ඇඳුම් බෙදා හැරීම සම්බන්ධව - එතුමාගේ කථාවේදී කරුණු දැක්වූවා. පාසල් සහ රජයේ ත්‍රිවිධ හමුදා, පොලීසිය, බන්ධනාගාරය ඇතුළු අනිකුත් ආරක්ෂක අංශ සියල්ලටම අවශ්‍ය රෙදි පිළි පේෂකර්ම සංවර්ධන අමාත්‍යාංශය හරහා ලබා ගන්නට කියලා මහා භාණ්ඩාගාරයේ ලේකම් පී. බී. ජයසුන්දර මහතා 2005 වසරේ චක්‍රලේඛනයක් නිකුත් කර තිබෙනවා. ඒ අනුව ඒ අයට අවශ්‍ය ඇණවුම්, ඉල්ලීම් සියල්ලම පේෂකර්ම සංවර්ධන අමාත්‍යාංශයට තමයි එවන්නේ. පේෂකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ DTAC කියන කමිටුවේ සාමාජිකයෝ 10 දෙනෙක් ඉන්නවා. මේ සාමාජිකයන් 10 දෙනා නියෝජනය වන්නේ, ඒ රෙදිපිළි ඉල්ලීම් කර තිබෙන අමාත්‍යාංශවල නිලධාරින්ගෙන්. පේෂකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජයසිංහ මහත්මයා තමයි ඒ කමිටුවේ සභාපති. ඔහුගේ සභාපතිත්වයෙන් තමයි මේ කමිටුව පැවැත්වෙන්නේ. මේ කමිටුව තමයි, මේ ඉල්ලන සියලුම රෙදි වර්ග සඳහා මිල ගණන් - ටෙන්ඩර් - කැඳවන්නේ, අපේ අමාත්‍යාංශයේ ලියා පදිංචි වුණු දේශීය කර්මාන්තශාලා හිමියන්ගෙන්. ඒ ටෙන්ඩර් ලැබුණාට පසුව ඒ ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කර බලා අඩුම ටෙන්ඩරය ඉදිරිපත් කර තිබෙන පුද්ගලයාගේ මිල ගණන පිළිබඳව ටෙන්ඩර් ඉදිරිපත් කර තිබෙන සියලු දෙනා සමඟ සාකච්ඡා කරලා, ඒ ටෙන්ඩර් මිලටත් වඩා අඩු මිලක් අර නිලධාරි කණ්ඩායම විසින් යෝජනා කරලා, ඒ මිලට

[ගරු මහින්ද රත්නතිලක මහතා ]

එකඟ වුණාට පසුව තමයි ටෙන්ඩර් ඉදිරිපත් කර තිබෙන සියලු දෙනාටම බෙදා දෙන්නේ. මොකද, මේ ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය එක කර්මාන්ත හිමියකුට සපයන්නට බැහැ. ඉල්ලීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ කර්මාන්තශාලාවල තිබෙන machines ප්‍රමාණය හා සේවක ප්‍රමාණය අනුව කර්මාන්තශාලා දෙක, තුනකට මේ ඉල්ලීම් සපයන්න බැහැ. රත්මලානේ තිබෙනවා, රෙදි පිළි අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානයක්. මේ ටෙන්ඩරය භාර දෙන්න කලින් ඒ මධ්‍යස්ථානයේ ඉන්න නිලධාරීන් කර්මාන්තශාලාවට ගිහින් පරීක්ෂා කර බලනවා, මේ අයට මාසයකට කොපමණ රෙදි නිෂ්පාදනය කරන්නට පුළුවන්ද කියලා. ඒ වාර්තාව අනුව තමයි, අර ටෙන්ඩර් බෙදා හැරීම කෙරෙන්නේ. මේ ටෙන්ඩර් බෙදා හැරීම කෙරෙන තැන අසාධාරණයක් වෙලා තිබෙනවා. මා ඒක පිළිගන්නවා. මොකද, මේ කමිටුවේ ඉන්නට ඕනෑ, රෙදි පිළි පිළිබඳව දැනුම තිබෙන නිලධාරීන්. මෙතෙක් මේ කමිටුවේ එහෙම නිලධාරීන් කවුරුවත් ඉඳලා නැහැ. ඒ කියන්නේ අතිරේක ලේකම්වරයාට අවශ්‍ය නිලධාරීන් තමයි මේ කමිටුවට නියෝජනය වෙලා තිබෙන්නේ. හමුදාවට රෙදි සැපයීම පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ. අතිරේක ලේකම්වරයා ලිපියක් එවා තිබෙනවා. "2007 වසරේ යුද හමුදාව විසින් මිලදී ගන්නා ලද රෙදි මීටර් දහ හතර ලක්ෂ පහළොස් දාහ අතරින් මීටර් අනූදාහක වර්ණයන් වෙනස් වීමක් සිදු වී ඇති බව නිරීක්ෂණය කරන ලද අතර ඒ වෙනුවට නියමිත වර්ණයන්ගෙන් යුත් රෙදි පිළි 2008 දෙසැම්බර් 5 වැනි දාට පෙර ලබා දීමට අදාළ සැපයුම්කරු එකඟ වී ඇති බවත් එයට අමතරව රෙදි පිළි මිල දී ගැනීම සම්බන්ධව අක්‍රමිකතාවක් හෝ වෙනත් වංචාවක් සිදු වී නොමැති බව යුද හමුදාපති විසින් වාර්තා කර ඇති බව කාරුණිකව දන්වා සිටින අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය වංචාවක් සිදු ව ඇති බවට මෙම අමාත්‍යාංශයට වාර්තා වී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි." යනුවෙන් ඒ ලිපියේ තිබෙනවා.

ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ මේ ලිපිය මා පිළිගන්නේ නැහැ. මොකද, හෙට්ටිආරච්චි කියන මේ අතිරේක ලේකම්වරයාත් මේ කමිටුවේ ඉන්නවා. කමිටුවේ ඉන්න අතිරේක ලේකම්වරයාම තමයි, හමුදාපතිවරයා කියනවාය කියා මේ ලිපිය එවා තිබෙන්නේ. හමුදාපතිවරයා රෙදි පරීක්ෂා කරන්නේ නැහැ. මේ වාගේ අසාධාරණ කිහිපයක් වෙලා තිබෙන නිසා මම අද උදේ රහස් පොලීසියට ගිහින් අපේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාට විරුද්ධව පැමිණිල්ලක් කළා, පරීක්ෂණයක් කරන්නය කියා. ඒ වාගේම ජනාධිපති විමර්ශන අංශයටත් ගිහින් පැමිණිල්ලක් කළා. මොකද, මහජන මුදල්වලින් සේවයක් ලබා දෙනවා නම් අපි ඒක අවංකවම ලබා දෙන්න ඕනෑ. නිලධාරීන් යම්කිසි දූෂණයක් කරලා චෝදනාවකට ලක් වෙනවා නම් ඒවා අපට භාර ගන්න බැහැ. අපි නිදොස් වෙන්න ඕනෑ. ඒ නිසා තමයි මම ගිහින් අද පැමිණිලි කළේ, මේ DTAC කමිටුවෙන් සපයන රෙදි පිළිබඳව පරීක්ෂණයක් කරන්න ඕනෑය කියා. ඒ වාගේම මේ ජයසිංහ කියන ලේකම්වරයා අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන පංගු මණ්ඩලයේ - Quota Board එකේ - සභාපතිවරයායි. අපේ ගරු ජයතිස්ස රණවීර ඇමතිතුමා ඒ අමාත්‍යාංශයේ සිටි කාලයේදී 2006 අප්‍රේල් මාසයේ 3 වැනිදා එතුමා පංගු මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කර තිබෙන්නේ එක් වසරක් සඳහායි. 2007 හතර වැනි මාසයේ 3 වැනිදා වන කොට ඔහුගේ කාල සීමාව අවසන් වෙනවා. නමුත් 2008 දහ වැනි මාසය වන තෙක් ඔහු ඒ අමාත්‍යාංශයෙන් දීමනා ලබා ගෙන තිබෙනවා. ඒ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවේ සභාපතිත්වය දරා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

කොහොමද එහෙම කරලා තිබෙන්නේ ?

**ගරු මහින්ද රත්නතිලක මහතා**
(மாண்புமிகு மஹிந்த ரத்னதிலக)
(The Hon. Mahinda Ratnatilaka)

එහෙම නම් වහංගු කරලා තමයි එතුමා මේක කරලා තිබෙන්නේ. අමාත්‍යාංශයේ ලේකම්තුමා එතුමාගේ කාලය දීර්ඝ කර ගෙන නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා නොවෙයි කරලා තිබෙන්නේ ඒ ලේකම්වරයායි ඒක නිසා තමයි අපි මේ ඇත්ත කියන්නේ. මේවා හංගන්න දේවල් නොවෙයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

කවුද ඒ ලේකම්වරයා පත් කරලා තිබෙන්නේ ?

**ගරු මහින්ද රත්නතිලක මහතා**
(மாண்புமிகு மஹிந்த ரத்னதிலக)
(The Hon. Mahinda Ratnatilaka)

ලේකම්වරයා මේ ආණ්ඩුවෙන් පත් කරපු කෙනෙක් නොවෙයි. මේ ලේකම්වරයා දිගටම හිටපු ලේකම්වරයෙක්. ගරු ජයතිස්ස රණවීර ඇමතිතුමාගේ කාලයේ ඉඳලා තිබෙන්නෙත් මේ ලේකම්වරයායි. අවුරුද්දක කාලයකට තමයි මෙතුමා ඒ ලේකම්වරයා මේ board එකට පත් කරලා තිබෙන්නේ. නීත්‍යානුකූලව අමාත්‍යාංශයේ ලේකම්වරයා තමයි. Board එකේ සභාපති. ඒක කවුරුවත් පත් කරන්න ඕනෑ නැහැ. DTAC කමිටුවේ සභාපතිවරයා ඒ ලේකම්වරයා. සේවා කාලය අවසන් වුණාට පසුවත් එතුමා රුපියල් හයලක්ෂ තිස් පන්දහස් අටසිය අනූදෙකක මුදලක් ලබා ගෙන තිබෙනවා, ඉන්ධන වියදම් සහ දීමනා වශයෙන්. ඒ නිසා අද මා ගිහින් රහස් පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. ඒ වාගේම ජනාධිපති විමර්ශන අංශයටත් පැමිණිල්ලක් ඉදිරිපත් කළා. ජනාධිපති ලේකම්තුමාට ලිඛිතව දැනුම් දීමක් කළා, වහාම මේ පුද්ගලයා මේ අමාත්‍යාංශයෙන් ඉවත් කරන්න කියලා. මේ වාගේ දේවල් වෙන්න ඉඩ දෙන්න බැරි නිසා. අපි අවංකවම බලන්නේ, මහින්ද චින්තනය යටතේ මේ දේශීය කර්මාන්ත අංශය නගා සිටුවන්නයි. එහෙම නගා සිටුවා මේ රටේ සියලුම ජනතාවට දේශීය රෙදි සපයන්න ඕනෑ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් විදේශ රටවලින් ආනයනය කරන රෙදි පිළි සඳහා සෙස් බද්ද සියයට 50කින් වැඩි කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ස්තුතියි ගරු ඇමතිතුමනි.

***එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව 2008 නොවැම්බර් මස 14 වන දින සභා සම්මුතිය අනුව, 2008 නොවැම්බර් 27 වන බ්‍රහස්පතින් පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி, பாராளுமன்றம், அதனது 2008 நவம்பர் 14 ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2008 நவம்பர் 27, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப் பட்டது.*

*It being 5.30 p. m.* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 9.30 a.m. on Thursday, 27th November, 2008, pursuant to the Resolution of Parliament of 14th November, 2008.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---


| | | |
|---|---|---|
| **Contents of Proceedings** | **:** | **From 9.30 a.m. to 5.30 p.m. on 26.11.2008** |
| **Final set of manuscripts Received from Parliament** | **:** | **5.15 p.m. on 09.01.2009** |
| **Printed copies dispatched** | **:** | **18.01.2009 Morning** |

දායක මුදල්: පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු.2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය
නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 5, කිරුළපන, මායා මාවත. අංක 132
රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30දා ට ප්‍රථම
දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය.
නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற்
செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 132,
மாயா அவெனியு, கிருளப்பனை, கொழும்பு 5** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப்
பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப் பணம்
அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள்
ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for
Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the
SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 132, Maya Avenue,
Kirulapone, Colombo 5. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.